326 වන කාණ්ඩය - 10 වන කලාපය
தொகுதி 326 - இல. 10
Volume 326 - No. 10

2026 මැයි 20වන බදාදා
2026 மே 20, புதன்கிழமை
Wednesday, 20th May, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් [තීරුව 1779]

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේ ක්‍රියා පටිපාටිය [තීරුව 1779]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** ]තීරු 1786-1824]

**කල්තැබීමේ යෝජනාව:**

2025 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ආර්ථික සමාලෝචන වාර්තාව [තීරු 1836-1959]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 1959-1990]

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**

பணம் தூய்தாக்கல் தடை (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு [ப: 1779]

வாய்மூல விடைக்கான வினாக்களை ஒழுங்குப் பத்திரத்தில் உள்ளடக்கும் நடைமுறை [ப: 1779]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1786-1824]

**ஒத்திவைப்புப் பிரேரணை:**

2025ஆம் ஆண்டுக்கான இலங்கை மத்திய வங்கியின் வருடாந்த பொருளாதார மீளாய்வு அறிக்கை [ப: 1836-1959]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 1959-1990]

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Prevention of Money Laundering (Amendment) Bill: Petition to the Supreme Court [Col. 1779]

Procedure Adopted in Scheduling Questions for Oral Answers in Order Paper [Col. 1779]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1786-1824]

ADJOURNMENT MOTION:

Annual Economic Review, Report of the Central Bank of Sri Lanka for the year 2025 [Cols. 1836-1959]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 1959-1990]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 මැයි 20වන බදාදා***
*2026 மே 20, புதன்கிழமை*
*Wednesday, 20th May, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
### பணம் தூய்தாக்கல் தடை (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
### PREVENTION OF MONEY LAUNDERING (AMENDMENT) BILL: PETITION TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026 මැයි 19 දිනැති මාගේ නිවේදනයෙහි සඳහන් පෙත්සමට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සමක පිටපතක්, මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

## II

### වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේ ක්‍රියා පටිපාටිය
### வாய்மூல விடைக்கான வினாக்களை ஒழுங்குப் பத்திரத்தில் உள்ளடக்கும் நடைமுறை
### PROCEDURE ADOPTED IN SCHEDULING QUESTIONS FOR ORAL ANSWERS IN ORDER PAPER

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා දින නියම කොට න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේදී දැනට අනුගමනය කරනු ලබන ක්‍රියා පටිපාටිය පිළිබඳ ඇතැම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් මතු කරනු ලැබූ කරුණු සැලකිල්ලට ගෙන 2025.11.27 දින පැවැති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එළඹි තීරණය පරිදි, "වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා දින නියම කොට න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේ වත්මන් ක්‍රියා පටිපාටිය" පිළිබඳ පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය විසින් සවිස්තරාත්මක වාර්තාවක් පිළියෙළ කරන ලදී.

2026.01.14 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී මෙකී වාර්තාව සලකා බැලීමෙන් අනතුරුව ඊට එකඟ වූ කාරක සභාව, මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරනු ලැබූ හා උනන්දුවක් දක්වනු ලැබූ මන්ත්‍රීවරයන්ගේ අදහස් ද ලබා ගෙන, මීට අදාළව පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාවේ නිර්දේශ ලබා ගැනීම සුදුසු බවට වැඩිදුරටත් තීරණය කරන ලදී.

ඒ අනුව, 2026.03.04 දින පැවති පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභා රැස්වීමේදී මේ සම්බන්ධව අදාළ මන්ත්‍රීවරයන්ගේද සහභාගිත්වයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය විසින් පිළියෙළ කරන ලද වාර්තාවේ ඇතුළත් දැනට අනුගමනය කරනු ලබන ක්‍රියා පටිපාටිය එලෙසින්ම ක්‍රියාත්මක කිරීමට එකඟතාව පළ කරන ලද අතර, ඒ සම්බන්ධයෙන් වූ පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාවේ වාර්තාව 2026.05.08 දින පැවැති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී සලකා බලන ලද අතර, එයට එකඟ වූ කාරක සභාව ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතු බවට කරන ලද තීරණය ප්‍රකාරව ඉහත කරුණු මෙම ගරු සභාවේ මන්ත්‍රීවරයන්ගේ කාරුණික අවධානයට යොමු කිරීමට කැමැත්තෙමි.

ඒ අනුව, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා දින නියම කිරීමේ හා න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේ වර්තමාන ක්‍රියා පටිපාටියට පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව මෙන්ම පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව එකඟ වූ බැවින්, එම ක්‍රියා පටිපාටිය ඉදිරියේදීද එලෙසින්ම ක්‍රියාත්මක කරනු ලබන බවත් වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව, දැනට ක්‍රියාත්මක වන මෙම ක්‍රියා පටිපාටිය මත පදනම්ව ඉදිරියේදී කටයුතු කිරීම සම්බන්ධයෙන් ඔබගේ සහයෝගය උදක්ම අපේක්ෂා කරමි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මට මේක කියන්න අවස්ථාව දෙන්න. ඔය පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව නියෝජනය කරන්න මම ගියා. මම ඒකට එකඟ වුණේ නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. මේක බහුතරයකගේ -

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 28 (ළ) යටතේ මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ මේකයි. ඔබතුමා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒක කරන්න එපා. අපි වීඩියෝ කරලා තිබෙන්නේ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මම ළඟ වීඩියෝ එක තිබෙනවා. ඕනෑ නම් මම පෙන්වන්නම්. එතුමා ඔළුව හොල්ලනකොට- *[බාධා කිරීම්]* මට අවස්ථාව දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ලිපි ලේඛනාදිය පිළිගැන්වීම.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Point of Order එක කියන්න ඉඩදෙන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මගේ මතය කියන්න ඉඩ දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුවේ පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කමිටුවේදී මෙම වාර්තාව පිළිබඳව එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. කරුණාකර වාඩි වෙන්න, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]*

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම යටතේ, ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ සබරගමුව පළාත් සභාව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේ කාරණය වැදගත්. වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න යටතේ අද මගේ ප්‍රශ්නයකුත් තිබෙනවා. එය දෙවැනි වතාවටත් අහන ප්‍රශ්නයක්. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා,-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
පොඩ්ඩක් ඉන්න. මට මේ කාරණය කියන්න දෙන්න.

ගරු කථානායකතුමනි, මෙතුමා මතු කරන්න හැදුවේ වෙන කාරණයක් නොවෙයි. සාමාන්‍යයෙන් අපි ඉදිරිපත් කරන ප්‍රශ්නයකට උත්තරයක් දෙන්නේ නැති වුණාම, ආයෙත් අපේ ප්‍රශ්නයක් න්‍යාය පත්‍රයට එන්න මාසයක පමණ කාලයක් ගත වෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
එහෙම එන්නේත් නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්, එහෙම එන්නේත් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කමිටුවේ වාර්තාවක් - *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා අපි මේ කියන දේ අහන්නකෝ. මේ ගැන අපිට - *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මේක ඔබතුමන්ලා කමිටුවේ කථා කළ යුතු කාරණාවක් මිසක් මෙතැන කථා කළ යුතු කාරණාවක් නොවෙයි. *[බාධා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 28 (ඊ) යටතේ වරප්‍රසාද පිළිබඳ කාරණාවක් ගැන යෝජනාව ඉදිරිපත් කිරීමේ අවස්ථාව ඉල්ලන්නේ නීත්‍යනුකූලවයි. *[බාධා කිරීම්]* මෙහි තිබෙන බරපතළ ප්‍රශ්නය මේකයි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා point of Order එක කියන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න යටතේ ඊයේ දිනයේ න්‍යාය පත්‍රයට ඇතුළත් වී තිබූ මගේ ප්‍රශ්නයට පිළිතුර ලබා දීමට මාසයක කාලයක් ගත්තා. එහෙම ගන්න පුළුවන්, වැරදි නැහැ. හැබැයි, ප්‍රශ්නය වන්නේ මාසයක් කිව්වාට, පාර්ලිමේන්තුවේදී මාස තුනක් වීමයි. ඒ මාස තුන යනකල් මගේ අලුත් ප්‍රශ්නයක් න්‍යාය පත්‍රයට එකතු වෙන්නේ නැති එක වැරැද්දක් නොවෙයිද, ඒක මට කරන අගතියක් නොවෙයිද, ගරු කථානායකතුමනි? ඒක නිසා ඔබතුමා කියන්න, ඒක නිවැරැදි කරන්න කියලා. ඒක නිවැරැදි කරලා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි නැවතත් ලිපිලේඛනාදිය පිළිගැන්වීමට යොමුවෙමු.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ඇමතිතුමා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ කම්කරු අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)
ගරු කථානායකතුමනි, 2017 වර්ෂය සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මම, 2017 වර්ෂය සඳහා සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

[ගරු බිමල් රත්නායක මහතා]

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා**
(மாண்புமிகு வசந்த புஷ்ப குமார)
(The Hon. Wasantha Pushpa Kumara)

ගරු කථානායකතුමනි, බෙලිහුල්ඔය, මුත්තෙට්ටුවේගම, මහතැන්න, අංක 28/3 යන ලිපිනයෙහි පදිංචි පී. තිලකරත්න ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

ගරු කථානායකතුමනි, මහ ඉඳුරුව, පොකුණුගම, නෙළුව, අංක 73 යන ලිපිනයෙහි පදිංචි ටී.ඒ. විජය කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)

ගරු කථානායකතුමනි, රත්නපුර, මල්වල හන්දිය, මීහිටිය, සුබිත යන ලිපිනයෙහි පදිංචි එන්.කේ. වක්කුඹුර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)

ගරු කථානායකතුමනි, බොරළුවගේ අයින, බුත්කන්ද, කොලොන්න වත්ත, අංක 702 යන ලිපිනයෙහි පදිංචි එච්. ජෝතිපාල මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)

ගරු කථානායකතුමනි, කොළඹ 05, උද්‍යාන පාර, ඇන්ඩර්සන් මහල් නිවාස, අංක ජේ/6 යන ලිපිනයෙහි පදිංචි දොන් දම්ශ්‍රී ලසන්ත කෝරලේවිදානගේ මහතා සහ වෙනත් දහනව දෙනෙකුගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය: පළාත්බද රජයේ ප්‍රධාන අභිචෝදක කාර්යාල පිහිටුවීමේ පොරොන්දුව
### 'வளமான நாடு - அழகான வாழ்க்கை' கொள்கைப் பிரகடனம்: மாகாண அரசாங்கப் பிரதான குற்றப்பகர்வு அலுவலகங்களை நிறுவுவதற்கான வாக்குறுதி
### "A THRIVING NATION- A BEAUTIFUL LIFE" MANIFESTO: PLEDGE TO ESTABLISH PROVINCIAL DIRECTORATES OF PUBLIC PROSECUTION

230/2024

**1. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) රජය වෙනුවෙන් නඩු කටයුතු මෙහෙයවීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවෙන් පරිබාහිරව පළාත්බද රජයේ ප්‍රධාන අභිචෝදක කාර්යාල (Provincial Directorates of Public Prosecution) ස්ථාපිත කරන බව 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් පොරොන්දු වී තිබේද;

(ii) ඉහත කී ප්‍රතිපත්තිය නිවැරදි බව පිළිගන්නේද;

(iii) එසේ නම්, ඉහත පොරොන්දුව ප්‍රකාරව නීතිපති දෙපාර්තමේන්තුවෙන් පරිබාහිරව ශ්‍රී ලංකාවේ එක් එක් පළාත සඳහා පළාත්බද රජයේ ප්‍රධාන අභිචෝදක කාර්යාල මේ වනතෙක් ස්ථාපිත නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சட்டத்துறை தலைமை அதிபதி திணைக்களத்துக்கு வெளியே அரசாங்கம் சார்பாக வழக்கு நடவடிக்கைகளை முன்னெடுப்பதற்காக, மாகாண அரசாங்கப் பிரதான குற்றப்பகர்வு அலுவலகங்கள் (Provincial Directorate of Public Prosecution) நிறுவப்படுமென 'வளமான நாடு - அழகான வாழ்க்கை' கொள்கைப் பிரகடனத்தில் வாக்குறுதி அளிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) மேற்படி கொள்கை சரியானதென ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iii) அவ்வாறாயின், மேற்படி வாக்குறுதியின் பிரகாரம் சட்டத்துறை தலைமையதிபதி திணைக்களத்துக்கு வெளியே இலங்கையின் ஒவ்வொரு மாகாணத்துக்கும் மாகாண அரசாங்கப் பிரதான குற்றப்பகர்வு அலுவலகங்கள் இதுவரையில் நிறுவப் படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House -

(i) whether a pledge has been made through the Manifesto "A Thriving Nation - A Beautiful Life" to establish Provincial Directorates of Public Prosecution external to the Attorney-General's Department to undertake prosecution matters on behalf of the Government;

(ii) whether it is acknowledged that the above policy is correct; and

(iii) if so, the reasons for not establishing Provincial Directorates of Public Prosecution for each Province of Sri Lanka outside the Attorney-General's Department, as per the above pledge, so far?

(b) If not, why?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) එකී රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව නීතිපති දෙපාර්තමේන්තුවෙන් පරිබාහිරව ස්වාධීන රජයේ ප්‍රධාන අභිචෝදක කාර්යාලය පිහිටුවීම සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීම සඳහා ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙකුගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පිහිටුවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ කටයුතු කර ඇත. එකී කමිටුව විසින් ලබා දෙනු ලබන නිර්දේශ මත රජයේ ප්‍රධාන අභිචෝදක කාර්යාලය පිහිටුවීම හා ඒ අනුව පළාත්බද රජයේ කාර්යාල පිහිටුවීම පිළිබඳව අමාත්‍ය මණ්ඩල තීරණ මත කටයුතු සිදු කෙරෙනු ඇත. එකී කමිටුව විසින් මේ සම්බන්ධයෙන් සලකා බලමින් සිටිනු ලබන හෙයින් මේ සම්බන්ධයෙන් අවසන් තීරණයක් මේ දක්වා ගෙන නොමැත.

(ආ) පැන නොනඟී.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, නීතිපති දෙපාර්තමේන්තුවේ ව්‍යුහය කාර්යක්ෂම කිරීම, ආයතනය ස්වාධීන කිරීම, විශේෂයෙන්ම නඩු මෙහෙයවීමේදී නඩු මෙහෙයවන රජයේ අධිනීතිඥයන් සහ පොදුවේ නීතිපතිවරයා මත ඇති වන දේශපාලන බලපෑම අවම කිරීම සඳහා ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් දෙකම පිළිගත්තා ස්වාධීන අභිචෝදක කාර්යාලයක් පිහිටුවීම අවශ්‍යයි කියලා. ඒ ප්‍රතිපත්තිය ගැන වාදයක් නැහැ. එසේ තිබියදී මේ කමිටුව පත් කරලා දැනට වසරකට වඩා වැඩියි, ගරු කථානායකතුමනි. මේ වාගේ සරල පරිපාලන ව්‍යුහයක් වෙනස් කර ගන්න අවුරුද්දක් ගත වෙනවා නම්, මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරනවා වාගේ බරපතළ දෙයක් කරන්න අවුරුදු 100ක් විතර ගනීවි. මෙය ඉතාම කනගාටුදායක තත්ත්වයක්. මෙය අත්‍යවශ්‍ය, පොදුවේ ප්‍රතිපත්තිමය වශයෙන් ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් එකඟ වන කාරණයක්. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් මේ යෝජනාවම තිබුණා. එවැනි පොදු එකඟතාවක් තිබෙන ස්වාධීන අභිචෝදක කාර්යාලය පිහිටුවීම වාගේ දෙයක්, මෙවැනි සංශෝධනයක්, පරිපාලන ව්‍යුහයේ මෙවැනි වෙනස්කමක් කරන්න අසමත් වෙනවා නම්, ඒක ඉතාම කනගාටුදායක දෙයක්, ගරු කථානායකතුමනි. ගරු ඇමතිතුමාගෙන් මම දැන ගන්න කැමැතියි, එය මෙච්චර ප්‍රමාද ඇයි කියලා. මොකද, දැනට වසරකට වැඩි කාලයක් ගතවෙලා තිබෙනවා. පරිපාලන ව්‍යුහයේ මෙවැනි වෙනසක් කර ගන්න මෙතරම් ප්‍රමාදයක් ඇති වන්නේ ඇයි?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාට පැටලුණු එක තැනක් තිබෙනවා. ඒක සරල ව්‍යුහාත්මක වෙනසක් කියලායි එතුමා කියන්නේ. ඒක පොඩ්ඩක්වත් සරල නැහැ. මක් නිසාද, අවුරුදු 150ක්, 200ක් පැවැතුණු නීතිපති දෙපාර්තමේන්තුවේ සහ අපරාධ නඩු විධාන සංග්‍රහයේ බලතල වෙන් කරන්නට ඕනෑ. මොකද, නීතිපතිවරයා කාර්යක්ෂම කිරීම සහ අභිචෝදක කාර්යාල පිහිටුවීම කියන දෙක කතන්දර දෙකක්. අපි මේක දාලා තිබුණේ අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අප කරන දෙයක් හැටියටයි. ඒකයි අප බලයට ආපු ගමන් මේ කමිටුව පත් කළේ. මේ වන විටත් මෙම කමිටුවේ වැඩ නැවතිලා නැහැ, Justice Yasantha Kodagoda යටතේ වැඩ කරගෙන යනවා. එකම දේ මේකයි. මේ සම්බන්ධයෙන් නීතිඥ සංගමයෙනුත්, ඒ වාගේම Law Commission එකෙනුත් observations කැඳවා තිබෙනවා. ඒවා ලැබුණාම ඒවා අරගෙන කටයුතු කරනවා. මේක පොඩ්ඩක්වත් සරල නැහැ. නමුත් කළ යුතු දෙයක් වශයෙන් අපි ඒක හඳුනාගෙන කරනවා. මේ කටයුත්ත නැවතිලාත් නැහැ. මේ කාර්යයට යම් කාලයක් ගතවෙන බව හැබැව. මේක නිවැරදි ලෙස කරන්න ඕනෑ නිසායි ඒ කාලය යන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, රටේ යුක්තිය පසිඳලීම කාර්යක්ෂම කිරීම, සිවිල්, අපරාධ කියන කාරණා දෙකේදීම ඉතාම වැදගත් බව. ඒ වාගේම රටේ උත්තරීතර උපරිමාධිකරණයේ - ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය - කාර්යක්ෂමතාවට විනිශ්චයකාරවරුන් පත් කිරීම ඉතාම වැදගත්, ගරු කථානායකතුමනි. මම මේ පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේත්, ඔබතුමාගේත් අවධානය යොමු කළා. මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයේ පුරප්පාඩු පහක් තිබෙනවා. අභියාචනාධිකරණයේ පුරප්පාඩු තුනක් තිබෙනවා. පසුගිය සතියේ මේ රටේ ප්‍රධාන පුවත්පත්වල ප්‍රධාන ප්‍රවෘත්තිය වුණේ, මේ අධිකරණ දෙකේ පවතින පුරප්පාඩු පුරවලා නැති නිසා යුක්තිය පසිඳලීමට ඇති වෙලා තිබෙන බරපතළ ප්‍රමාදය ගැන. මේ වගකීම තිබෙන්නේ ගරු ජනාධිපතිතුමාට. ජනාධිපතිතුමා නම් කරන තෙක් ඒ ගැන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට සලකා බලන්න පුළුවන්කමක් නැහැ. පුරප්පාඩු අටක් තිබෙනවා කියන්නේ බරපතළ තත්ත්වයක්. ගරු කථානායකතුමනි, අභියාචනාධිකරණයේ ඉන්න දක්ෂ, පළපුරුදු විනිශ්චයකාරතුමන්ලා විශ්‍රාම යනවා. ගෞරවනීය විනිශ්චයකාරවරයෙකුටත් විශ්‍රාම යන්න වුණා, මේ ප්‍රමාදය නිසා. ඒ, ගනේපොල විනිශ්චයකාරතුමාට. ඇත්ත වශයෙන් මේක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. මෙවැනි බරපතළ තත්ත්වයක්, පුරප්පාඩු අටක් පවත්වාගෙන යන්න කිසිම හේතුවක් නැහැ.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

සමහර පුරප්පාඩු මාස හයකටත් වැඩියි. ඒකට කිසිම සාධාරණ හේතුවක් නැහැ. ගරු අධිකරණ ඇමතිතුමනි, මෙවැනි තත්ත්වයක් තුළ ගරු ජනාධිපතිතුමා මුණගැහිලා, කථා කරලා මේ පුරප්පාඩු පිරවීම ඉක්මනින් සිදුකරලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ඒ යෝජනා ඉදිරිපත් කරන්න ඔබතුමා මැදිහත් වෙනවාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහන මේ අතුරු ප්‍රශ්නය ඔබතුමා අහපු වාචික ප්‍රශ්නයට අදාළ ප්‍රශ්නයක් නොවෙයි. *[බාධා කිරීමක්]* අදාළ නැහැ කියලා නැහැ. ගරු මන්ත්‍රීතුමා, අදාළයි. මතක තියාගන්න. *[බාධා කිරීමක්]* ඔබතුමාට Standing Orders violate කරන්න බැහැ.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒක ඉල්ලා අස්කරගන්න ඕනෑ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, ඔබතුමා මෙම ප්‍රශ්නයට මැදිහත් වීම නිසායි මම ඒ පිළිතුර දුන්නේ. ඒකෙන් ඔබතුමාගේ හිත රිදුණා නම් මම ඒ ගැන කනගාටු වෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේත් මේ ගැන කියලා, අනෙක් තැන්වලත් මේ ගැන කියලා බැරිම තැන තමයි මේක කියන්නේ. මේ රටේ අධිකරණයට විනිශ්චයකාරවරුන් පත් කිරීම,- ඒ ප්‍රශ්නය මතු කිරීම ගැන අපි කනගාටු වෙන්නේ නැහැ. මේ ප්‍රශ්නය විසඳන්නේ නැති එක ගැනයි අපි කනගාටු වෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඒ ගැන විවාදයට ආපු වෙලාවක කථා කරන්න පුළුවන්.

ගරු අමාත්‍යතුමා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 33(1)ට අවධානය යොමු කරමින්, මෙම ප්‍රශ්නයට පිළිතුරු දීමට මා බැඳී නැති බව සඳහන් කරනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ලජ්ජයි!

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ලජ්ජා නැහැ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වාගේ ප්‍රශ්න අහන්න එපා. *[බාධා කිරීම්]*

## අත්‍යවශ්‍ය/ ජීවිතාරක්ෂක ඖෂධ සැපයීම: සැපයුම්කරුවන් ඉවත් කිරීම
## அத்தியாவசிய/ உயிர்காக்கும் மருந்து விநியோகம்: வழங்குநர்களை நீக்குதல்
## SUPPLY OF ESSENTIAL/ LIFE-SAVING DRUGS: REMOVAL OF SUPPLIERS

460/2025

**2.** **ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ප්‍රධාන ඖෂධ නිෂ්පාදන කිහිපයක් සම්බන්ධයෙන් ගුණාත්මක අසාර්ථක බවක් හිතාමතා නිර්මාණය කිරීමෙන් අත්‍යවශ්‍ය ඖෂධ සැපයුම්කරුවන් අපකීර්තියට පත් කිරීම සහ සැපයුම්වලින් ඉවත් කිරීම වැනි තත්ත්ව උද්ගතවී තිබේද;

(ii) පසුගිය වසර 05 තුළ, විවිධ හේතු මත 2-8 °C අතර උෂ්ණත්වයක ගබඩා කළ යුතු ජීවිතාරක්ෂක/මිල අධික ඖෂධ භාවිතයෙන් ඉවත් කිරීමට සිදුවූ අවස්ථා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඖෂධවල ගුණාත්මක ගැටලු ඇති කිරීම මඟින් දිගු කාලීන සැපයුම්කරුවන් ඉවත් කිරීම ප්‍රාදේශීය රෝහල් මට්ටමින්ද සිදු වන බවත්;

(ii) මේ හේතුවෙන් ඔවුන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ටෙන්ඩර් සඳහා ඇස්තමේන්තු ලබාදීම ප්‍රතික්ෂේප කරන බවත්;

(iii) ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ඉවත් කර ඇති ඖෂධ සංඛ්‍යාව, කාණ්ඩ ආපසු ගැනීම් හෝ නිෂ්පාදන ආපසු ගැනීම් පිළිබඳවත්;

එතුමා දන්නේද?

(ඇ) (i) එම ඉවත් කළ ඖෂධ පෞද්ගලික වෙළඳපොළ තුළ අළෙවි කරන බව දන්නේද;

(ii) එවැනි අක්‍රමිකතා සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කළ හැකි අංශයක් තිබේද;

(iii) එසේ නම්, 2024 වර්ෂයේ ලැබුණු එවැනි පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பிரதான சில மருந்து உற்பத்திப் பொருட்களின் தரம் தொடர்பில் வேண்டுமென்றே சர்ச்சைகளை உருவாக்குவதன்மூலம் அத்தியாவசிய மருந்து வழங்குநர்களை அபகீர்த்திக்கு உள்ளாக்குவது மற்றும் மருந்துப்பொருள் விநியோகத்திலிருந்து அவர்களை அகற்றுவது போன்ற நிலைமைகள் ஏற்பட்டுள்ளதா என்பதையும்;

(ii) கடந்த 05 ஆண்டுகளில், பல்வேறு காரணங்களால் 2-8°C வெப்பநிலையில் களஞ்சியப்படுத்த வேண்டிய உயிர்காக்கும்/விலை உயர்ந்த மருந்துகளை பயன்பாட்டிலிருந்து நீக்க வேண்டிய நிலை ஏற்பட்ட சந்தர்ப்பங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மருந்துப் பொருட்களின் தரம் சார்ந்த பிரச்சினைகளை ஏற்படுத்துவதன்மூலம் நீண்டகால வழங்குநர்களை அகற்றும் செயற்பாடு பிரதேச வைத்தியசாலைகள் மட்டத்திலும் இடம்பெறுகின்றன என்பதையும்;

(ii) இதன் காரணமாக அவர்கள் அரச மருந்தாக்கல் கூட்டுத்தாபனத்தின் கேள்விப்பத்திரங்களுக்கு மதிப்பீடுகளை வழங்குவதை நிராகரிக்கிறார்கள் என்பதையும்;

(iii) தேசிய ஔடதங்கள் ஒழுங்குபடுத்தல் அதிகாரசபையால் அகற்றப்பட்டுள்ள மருந்துப் பொருட்களின் எண்ணிக்கை, தொகுதிகளைத் திரும்பப் பெறுதல் அல்லது உற்பத்திகளை திரும்பப் பெறுதல் குறித்தும்;

அவர் அறிவாரா?

(இ) (i) மேற்படி அகற்றப்பட்ட மருந்துகள் தனியார் சந்தையில் விற்பனை செய்யப்படுவதை அறிவாரா;

(ii) இத்தகைய முறைகேடுகள் தொடர்பில் முறைப்பாடுகளை முன்வைக்கக்கூடிய ஏதேனும் பிரிவு உள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், 2024ஆம் ஆண்டில் கிடைக்கப்பெற்ற இத்தகைய முறைப்பாடுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) whether situations have arisen in which essential drug suppliers are being discredited and removed from supply by deliberate creation of quality failures in relation to several major pharmaceutical products; and

(ii) the occasions where life-saving/expensive drugs that are required to be stored at a temperature between 2-8°C have been withdrawn from use due to various reasons during last five years?

(b) Is he aware -

(i) that the removal of long-term suppliers through the creation of quality problems in drugs is also taking place at the regional hospital level;

(ii) that those suppliers refuse to submit estimates for tenders of the State Pharmaceuticals Corporation due to the said reason; and

(iii) the number of drugs removed, batch withdrawals or product withdrawals done by the National Medicines Regulatory Authority?

(c) Will he also inform this House -

(i) whether he is aware that those removed drugs are being sold in the private market;

(ii) whether there is a separate Division to lodge complaints regarding such irregularities; and

(iii) if so, the number of such complaints received in the year 2024?

(d) If not, why?

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதார பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) යම් ඖෂධයක ගුණාත්මක අසාර්ථකතාව තීරණය කරන්නේ අදාළ ඖෂධය රසායනාගාර පරීක්ෂාවට ලක් කර ලැබෙන ප්‍රතිඵල මතයි. ජාතික ඖෂධ නියාමන අධිකාරියට එබඳු තත්ත්ව අසමත්වීම් හිතාමතා නිර්මාණය කළ නොහැක.

එසේම ජාතික ඖෂධ නියාමන අධිකාරියට එවැනි සිතාමතා ඇති කළ සිදුවීම් පිළිබඳ තොරතුරු වාර්තා වී නොමැත.

(ii) පසුගිය වසර 5 තුළ විවිධ හේතු මත 2-8°C අතර උෂ්ණත්වයක ගබඩා කළ යුතු ජීවිතාරක්ෂක vital/මිල අධික ඖෂධ අතරින් Teneteplase Injection 40mg යන ඖෂධයේ TNV1B24A08 හා TNV1B24E07 යන කාණ්ඩ දෙකක් පමණක් ජාතික ඖෂධ නියාමන අධිකාරියෙන් තීරණයක් ලැබෙනතුරු භාවිතය තාවකාලිකව නවතා ඇත.

(ආ) (i) යම් ඖෂධයක අහිතකර ප්‍රතික්‍රියා පිළිබඳව සහ ප්‍රමිතිය ඇතුළු ගැටලු පිළිබඳව වාර්තා කරන්නේ බොහෝ විට රෝහල් මඟිනි. එබඳු අවස්ථාවලදී ඖෂධ භාවිතය අත්හිටුවීම, භාවිතයෙන් ඉවත් කිරීම වැනි කරුණු තීරණය කරන්නේ රසායනාගාර පරීක්ෂණ වාර්තා ඇතුළු කරුණු මත පදනම්ව ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසිනි. එය රෝහල් මට්ටමින් ගන්නා තීරණයක් නොවේ.

(ii) ප්‍රාදේශීය රෝහල් මට්ටමින් වාර්තා වන ඖෂධවල ගුණාත්මක ගැටලු සම්බන්ධයෙන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව දැනුවත් නමුත්, ටෙන්ඩර් ප්‍රදානය කිරීමේදී සලකා බලනුයේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය මඟින් නිර්දේශ කර ඇති product withdrawal/batch withdrawal හෝ reject පමණි. Product withdrawals වාර්තා වන අවස්ථාවලදී ටෙන්ඩර් ප්‍රදානය සිදු නොකරන අතර, ඉහත සඳහන් අනෙකුත් අවස්ථාවලදී කොන්දේසිවලට යටත්ව (පූර්ව නැව්ගත කිරීමේ සාම්පල පරීක්ෂාව, වෛද්‍ය සැපයුම් අංශය මඟින් ලබා ගන්නා ලද පළමු තොගය සඳහා කාර්ය සාධන වාර්තා) ටෙන්ඩර් ප්‍රදානය සඳහා නිර්දේශ කිරීම සිදු වේ.

[ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා]

(iii) 2025 වසරේ සහ 2026 වසරේ මේ දක්වා නියාමන තීරණ අනුව භාවිතය අත්හිටුවා ඇති, භාවිතයෙන් ඉවත් කර ඇති සහ ආපසු කැඳවා ඇති ඖෂධ කාණ්ඩ සහ ඖෂධ - ඖෂධයේ සියලුම කාණ්ඩ ඇතුළත් වන සේ මුළු ඖෂධයම - පිළිබඳ සියලු තොරතුරු ඇමුණුමෙහි දක්වා ඇත.

ඇමුණුම

| | කාණ්ඩ / නිෂ්පාදන භාවිතය අත්හිටුවීමට තීරණ | | කාණ්ඩ / නිෂ්පාදන භාවිතය ඉවත් කර ගැනීමේ තීරණ | | නිෂ්පාදකයා / දේශීය නියෝජිතයා විසින් ස්වේච්ඡාවෙන් ඉවත් කර ගැනීම | | නැවත සලකා බැලීමෙන් පසු, කලින් ගනු ලැබූ නියාමන තීරණ අවලංගු කිරීම |
|---|---|---|---|---|---|---|---|
| | කාණ්ඩ | නිෂ්පාදන | කාණ්ඩ | නිෂ්පාදන | කාණ්ඩ | නිෂ්පාදන | |
| Jan-25 | 02 | 01 | 06 | - | - | - | 03 |
| Feb-25 | - | - | 01 | 01 | - | - | 02 |
| Mar-25 | 04 | 01 | 01 | - | - | - | - |
| Apr-25 | 06 | 02 | 01 | - | - | - | 01 |
| May-25 | - | - | - | - | - | - | - |
| Jun-25 | - | - | - | - | - | - | 02 |
| Jul-25 | 06 | - | 02 | 01 | - | - | 11 |
| Aug-25 | 01 | - | - | - | - | 01 | - |
| Sep-25 | 06 | - | - | - | - | - | - |
| Oct-25 | 01 | - | 01 | - | 02 | 01 | 04 |
| Nov-25 | - | - | - | - | - | - | - |
| Dec-25 | 02 | 04 | 03 | - | - | - | - |
| Jan-26 | - | - | - | - | - | - | - |
| Feb-26 | - | - | 03 | 01 | - | - | 01 |
| මුළු ගණන | 28 | 08 | 18 | 03 | 02 | 02 | 24 |

(ඇ) (i) ජාතික ඖෂධ නියාමන අධිකාරිය මඟින් ඉවත් කර ඇති ඖෂධ පෞද්ගලික වෙළෙඳ පොළ තුළ අලෙවි කිරීම සම්බන්ධයෙන් තොරතුරු මේ වන තෙක් වාර්තා වී නොමැත.

(ii) එවැනි අක්‍රමිකතා සම්බන්ධයෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වෙළෙඳ පොළ නිරීක්ෂණ සහ පාලන අංශය වෙත පැමිණිලි ඉදිරිපත් කළ හැක.

(iii) 2024 වර්ෂය තුළ එවැනි පැමිණිලි වාර්තා වී නොමැත.

(ඈ) පැන නොනඟී.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඇත්තටම අතුරු ප්‍රශ්න අහන්න මම බලාපොරොත්තු වුණේ නැහැ. නමුත් ඔබතුමා දන්නවා, 2024 වර්ෂයේදී ලංකාවට ඕනෑ තරම් බාල බෙහෙත් ගෙනැල්ලා, මිනිසුන් මැරිලා, මිනිසුන්ගේ ඇස් පෙනීම නැති වෙච්ච යුගයක් තිබුණු බව. එතකොට පැමිණිලි අංශයට ඒ සම්බන්ධයෙන් එක පැමිණිල්ලක්වත් ලැබුණේ නැති එකේ තේරුම, එහෙම පැමිණිලි අංශයක් තිබෙනවාය කියලා ජනතාව තුළ දැනුවත්භාවයක් නොමැති වීම. ඉතින් මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, එම පැමිණිලි අංශය contact කර ගන්න පුළුවන් number එක මොකක්ද කියලා ප්‍රසිද්ධියට පත් කරන්න කියලා.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

ඔව්, අපි ඇත්තටම ඒක ප්‍රසිද්ධියට පත් කරලා තිබෙනවා. ඔබතුමාගේ ඉල්ලීම අනුව නැවත ඒක ප්‍රසිද්ධියට පත් කරන්නම්, ජනතාවගේ දැන ගැනීම සඳහා.

## මාර්ග සහ අධිවේගී මාර්ග: ඉදිකිරීම් සහ නඩත්තු වියදම්

## வீதிகள் மற்றும் அதிவேக நெடுஞ்சாலைகள்: நிர்மாணம் மற்றும் பேணுகைச் செலவுகள்

## ROADS AND EXPRESSWAYS: CONSTRUCTION AND MAINTENANCE COSTS

468/2025

**3. ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරියේ මේ වනවිට කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) මධ්‍යම රජය සහ පළාත් සභා යටතේ ඇති මාර්ගවල මුළු දුර වෙන් වෙන් වශයෙන් කිලෝමීටරවලින් කොපමණද;

(iii) පසුගිය වසර 05 තුළ එම මාර්ගවල නඩත්තු කටයුතු සඳහා වාර්ෂිකව දරන ලද පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) නව මාර්ග ඉදිකිරීම සඳහා කිලෝමීටරයකට දරන පිරිවැය කොපමණද;

(v) එවැනි ඉදිකිරීම් කටයුතු පෞද්ගලික සමාගම්වලට ලබාදුන් විට කිලෝමීටරයකට දරන පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මේ වනවිට ක්‍රියාත්මක වන අධිවේගී මාර්ග සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) ඉහත (i)හි සඳහන් අධිවේගී මාර්ගවල මුළු දුර සහ වාර්ෂික නඩත්තු පිරිවැය කොපමණද;

(iii) එම අධිවේගී මාර්ගවලින් රජයට ලැබෙන මුළු ආදායම කොපමණද;

(iv) එම එක් එක් අධිවේගී මාර්ගය සඳහා ආයෝජන මත ප්‍රතිලාභය කොපමණද;

(v) දැනට ඉදිවෙමින් පවතින සහ ඉදිරියේදී ඉදිකිරීමට සැලසුම් කර ඇති අධිවේගී මාර්ගවල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வீதி அபிவிருத்தி அதிகாரசபையில் தற்பொழுது பணியாற்றும் பணியாட்டொகுதி உறுப்பினர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) நாட்டில் மத்திய அரசாங்கத்தின்கீழ் மற்றும் மாகாண சபைகளின்கீழ் உள்ள வீதிகளின் மொத்த நீளத்தை வெவ்வேறாக கிலோமீற்றரில் எவ்வளவு என்பதையும்;

(iii) கடந்த 05 ஆண்டுகளின்போது ஒவ்வோர் ஆண்டிலும் அவற்றின் பேணுகைக்காக ஏற்பட்ட வருடாந்தச் செலவினம் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) புதிய வீதிகளின் நிர்மாணிப்புக்காக ஒரு கிலோமீற்றருக்கான செலவினம் எவ்வளவு என்பதையும்;

(v) தனியார் கம்பனிகளுக்கு ஒப்பந்தம் வழங்கப்படுகையில், இவ்வாறான நிர்மாண வேலைகளின் ஒரு கிலோமீற்றருக்கான செலவினம் எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) (i) தற்போது பயன்பாட்டிலுள்ள அதிவேக நெடுஞ்சாலைகளின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி வினா(i)இல் எடுத்துக்காட்டப்பட்ட அதிவேக நெடுஞ்சாலைகளின் மொத்த நீளம் மற்றும் வருடாந்தப் பேணுகைச் செலவினம் எவ்வளவு என்பதையும்;

(iii) அந்த அதிவேக நெடுஞ்சாலைகளில் இருந்து அரசாங்கத்துக்குக் கிடைக்கும் மொத்த வருமானம் எவ்வளவு என்பதையும்;

(iv) அந்த அதிவேக நெடுஞ்சாலைகள் ஒவ்வொன்றுக்குமான முதலீட்டின் மீதான வருமானம் எவ்வளவு என்பதையும்;

(v) தற்போது நிர்மாணிக்கப்படும் புதிய அதிவேக நெடுஞ்சாலைகளின் மற்றும் எதிர்காலத்தில் நிர்மாணிக்கத் திட்டமிடப்பட்டிருக்கும் அதிவேக நெடுஞ்சாலைகளின் பெயர்கள் யாவை என்பதை வெவ்வேறாகவும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House the -

(i) number of staff members currently employed at the Road Development Authority;

(ii) total distance of roads in the country, under the Central Government and the provincial councils, separately in kilometres;

(iii) annual cost incurred for the maintenance of roads during the last five years, separately;

(iv) cost per kilometre in constructing new roads; and

(v) cost per kilometre, when such construction work is tendered out to private companies?

(b) Will he also inform this House the -

(i) number and names of the expressways currently in operation;

(ii) distance and annual maintenance cost of the expressways referred to in (i) above;

(iii) total revenue for the Government from these expressways;

(iv) return on investment for each of these expressways; and

(v) names of the new expressways currently under construction and those planned for construction in future, separately?

(c) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) සම්පූර්ණ සේවක සංඛ්‍යාව - 8,332

(ස්ථිර 8079+කොන්ත්‍රාත් 253)

(ii) ➢ මධ්‍යම රජය යටතේ ඇති මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මහාමාර්ගවල දුර ප්‍රමාණය

- A ශ්‍රේණියේ මාර්ග (කිලෝමීටර) - 4,217.42
- B ශ්‍රේණියේ මාර්ග (කිලෝමීටර) - 8,045.42
- මුළු එකතුව (කිලෝමීටර) - 12,262.84

➢ පළාත් සභා යටතේ ඇති මාර්ග සම්බන්ධ තොරතුරු මාර්ග සංවර්ධන අධිකාරිය සතුව නොමැත.

(iii) ➢ මධ්‍යම රජය යටතේ ඇති මාර්ගවල වසර අවසානය වන විට මුළු වියදම

- 2021 වර්ෂය - රුපියල් මිලියන 4,606.02
- 2022 වර්ෂය - රුපියල් මිලියන 2,504.01
- 2023 වර්ෂය - රුපියල් මිලියන 6,039.22
- 2024 වර්ෂය - රුපියල් මිලියන 11,249.81
- 2025 වර්ෂය - රුපියල් මිලියන 14,591.16

➢ පළාත් සභා යටතේ ඇති මාර්ග සම්බන්ධ තොරතුරු මාර්ග සංවර්ධන අධිකාරිය සතුව නොමැත.

(iv) A ශ්‍රේණිය හා B ශ්‍රේණිය මාර්ග සඳහා:

➢ නිර්මිත ද්විත්ව මංතීරු මාර්ගයක කිලෝමීටර 1 නව ඉදිකිරීම සඳහා - රුපියල් මිලියන 300 - රුපියල් මිලියන 450 පමණ වන අතර, එහි

[ගරු බිමල් රත්නායක මහතා]

අඩංගු අයිතම මත විචල්‍ය වේ. තවද පුනරුත්ථාපන ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 200 සිට 250 පමණ වේ.

- නිර්මිත මංතීරු 4න් යුතු මාර්ගයක කිලෝමීටර 1 නව ඉදිකිරීම සඳහා - රුපියල් මිලියන 800 - රුපියල් මිලියන 1,000 පමණ වන අතර, එහි අඩංගු අයිතම මත විචල්‍ය වේ. තවද පුනරුත්ථාපන ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 200 සිට 250 පමණ වේ.

(v) පසුගිය ටෙන්ඩර්වලට අනුව ඉහත පිරිවැය සියයට සෘණ 25 සිට සියයට ධන 25 දක්වා පරාසයක මාර්ගය පවතින භූමියේ පවතින ස්වභාවය අනුව හා අයිතම මත විචලනය වී ඇත.

(ආ) (i)
- E01 - දක්ෂිණ අධිවේගී මාර්ගය (කොට්ටාව - මත්තල) - කිලෝමීටර 200.45
- E02 - පිටත වටරවුම් මාර්ගය (කොට්ටාව - කෙරවලපිටිය) - කිලෝමීටර 28.86
- E03 - කොළඹ කටුනායක අධිවේගී මාර්ගය (පෑලියගොඩ - සීදූව) -කිලෝමීටර 25.8
- E04 - මධ්‍යම අධිවේගී මාර්ගය (මීරිගම - කුරුණෑගල/යග්ගපිටිය) - කිලෝමීටර 40.91
- E05 - දක්ෂිණ අධිවේගී මාර්ගය දිගුව - (අන්දරවැව - හම්බන්තොට) - කිලෝමීටර 16.55

මුළු දුර - කිලෝමීටර 312.57

(ii)
- මුළු දුර - කිලෝමීටර 312.57
- වාර්ෂික නඩත්තු පිරිවැය - රුපියල් මිලියන 5,180.90
  - E01 - රුපියල් මිලියන 2024.50
  - E02 - රුපියල් මිලියන 767.60
  - E03 - රුපියල් මිලියන 834.10
  - E04 - රුපියල් මිලියන 532.00
  - E05 - රුපියල් මිලියන 1022.70

මම මේ breakdown එක කියන්නේ, ගරු මන්ත්‍රීතුමා.

(iii)
- 2025.12.31 දිනට ආදායම (රුපියල් මිලියන)
  - දක්ෂිණ අධිවේගී මාර්ගය - 5,031.28
  - පිටත වටරවුම් මාර්ගය - 4,347.32
  - කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය - 3,355.12
  - දක්ෂිණ අධිවේගී මාර්ගය දිගුව - 2,019.45
  - මධ්‍යම අධිවේගී මාර්ගය - 1,576.97
  - එකතුව - 16,330.14

(iv) මෙම ප්‍රශ්නයෙන් ඔබතුමා අහන්නේ ආයෝජන මත ප්‍රතිලාභය කොපමණද කියන එක. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, පාරකින් එන ප්‍රතිලාභය සම්බන්ධයෙන් හුදු ගණනය කිරීම ඉතාම සංකීර්ණ ක්‍රමවේදයක් බව. ඒකෙන් ලැබෙන සමාජ ප්‍රතිලාභ, ඒ කියන්නේ logisticsවලට, transportවලට, economy එකට විතරක් නොවෙයි, environment එකට එකතු වන දේවල් එක්ක එතැන විශාල කාරණා ප්‍රමාණයක් තිබෙනවා. ඉතින් ඒ නිසා ඒ ආකාරයේ ගණනය කිරීමක් RDA එක දැනට කරලා නැහැ. ඉතින් ඔබතුමා ආයෝජන මත ප්‍රතිලාභය බලනවා නම්, එහෙම පුළුල් formula එකකට ගිහිල්ලා එය බලන්න ඕනෑ. එහෙම එකක් දැනට නැහැ කියන එක තමයි කියන්න තිබෙන්නේ. අවශ්‍යම නම් විතරක් හොයලා දෙන්න පුළුවන්, කොච්චර වියදම් කළාද, toll gatesවලින් කොච්චර එකතු කරලා තිබෙනවාද කියලා. මම හිතන විධියට, ඒක එච්චර හොඳ අදහසක් වෙන්නේ නැහැ, ඒකෙදි.

(v) ඔබතුමා මේ ප්‍රශ්නයෙන් අහන්නේ අධිවේගී මාර්ගවල ඉදිරි සැලසුම් ගැන. සැලසුම් තිබෙන්නේ මේ විධියටයි, ගරු මන්ත්‍රීතුමනි.

- මධ්‍යම අධිවේගී මාර්ගය අදියර 01 - (කඩවත සිට මීරිගම)
- මධ්‍යම අධිවේගී මාර්ගය අදියර 03 - (පොතුහැර සිට රඹුක්කන) දැන් ඉදිකිරීම් සිදුකරගෙන යනවා. කඩවත-මීරිගම කොටසේ ඉදිකිරීම් ද අපි කරගෙන යනවා. ඊළඟට රඹුක්කන සිට ගලගෙදර දක්වා වූ කොටසේ වැඩ බොහෝදුරට මේ මාසයේ අග හෝ ලබන මාසයේ මුල අපි ආරම්භ කරනවා.
- මධ්‍යම අධිවේගී මාර්ගය අදියර 04 - (කුරුණෑගල සිට දඹුල්ල) මේ වසර අග හෝ ලබන වසරේ මුල ආරම්භ කරනවා.
- රුවන්පුර අධිවේගී මාර්ගය - (කහතුඩුව සිට ඉංගිරිය) මේ වසර අග හෝ ලබන වසර මුල කාර්තුවේදී ආරම්භ කරන්න අපි බලාපොරොත්තු වනවා.

(ඇ) අදාළ නොවේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, බොහොම සවිස්තර පිළිතුරක් ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ඔබතුමා අන්තිම ප්‍රශ්නයට ලබා දුන් පිළිතුර තුළින් පිළිබිඹු වන කරුණක් තමයි, OCH එකේ මීටර 500යි, කිලෝමීටර 39 වන MCC එකෙන් ලබා ගන්න තිබෙන construction part එකයි, පොතුහැර-ගලගෙදර කිලෝමීටර 12යි පෞද්ගලික අංශයේ participation එකට දීලා තිබෙන බව. ඔබතුමා මගේ පළමුවැනි ප්‍රශ්නයට දීපු පිළිතුර අනුව ඒ සම්බන්ධයෙන් අපට දරන්න සිදු වන වියදම රුපියල් බිලියනයක් විතර වනවා. හැබැයි, MCC එකේ කිලෝමීටර 39 හදන්න රුපියල් බිලියන 345ක් යනවා කියලා අපි කථා කළාට, දැන් කරන්න තිබෙන වියදම් අනුව ඒක රුපියල් බිලියන 425 දක්වා වැඩි වෙලා තිබෙනවා. කරුණාකරලා අපට කියන්න, ඔබතුමා කියපු රඹුක්කන සිට ගලගෙදර දක්වා වූ කොටස එහෙම දීලා තිබෙන්නේ ටෙන්ඩර් තුළින්ද, එහෙම නැත්නම් ඒකත් පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන්ද කරන්නේ කියලා. මොකද, ඒක හොඳ දිශාවකටයි ගමන් කරන්නේ. ඒක දීලා තිබෙන්නේ කොයි ආකාරයෙන්ද? මොකද, පිටරටින් ණය ගත්තාම ඒකට dollar loan එකකුත් එනවා, මෙහේ cost escalation එකකුත් එනවා. දේශීය වශයෙන් ගත්තොත් ඒක

වෙන්නේ නැහැ. ඔබතුමාගේ අමාත්‍යාංශය වැඩ කරන අමාත්‍යාංශයක් නිසා කරුණාකරලා මට මේ සම්බන්ධයෙන් අංග සම්පූර්ණ උත්තරයක් ලබා දෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුර මේකයි. අපි අධිවේගී මාර්ගත්, අනෙක් මාර්ගත් සියල්ල දීලා තිබෙන්නේ විවෘත ටෙන්ඩර් මත පමණයි. ඒ හැර වෙනත් කිසිදු ක්‍රමයකට දීලා නැහැ. ඒක තමයි එතුමාගේ ප්‍රශ්නයට එක පිළිතුරක් වෙන්නේ.

සැලසුම් කළ වියදම් වෙනස්වීම කියන එක තීරණය වෙලා තිබුණා, හේතු ගණනාවක් මත. එකක් තමයි, මේ ආර්ථික අර්බුදය හේතුවෙන් මේ කටයුතු ප්‍රමාදවීම නිසා අපට ගෙවන්න තිබෙන ප්‍රමාද ගාස්තුව රුපියල් බිලියන 60කට වැඩි වීම, මධ්‍යම අධිවේගී මාර්ගයේ විතරක්. මම මේ කියන්නේ දෙවෙනි loan එක අත්සන් කරන වෙලාවේ තිබුණු ඉලක්කම්. සමහර විට ඒක අද rate එකට දාලා බැලුවොත් තව වෙනස් වෙයි. ඒ අනුව ප්‍රමාද ගාස්තුව එලෙස එකතු වෙලා තිබෙනවා.

දෙවැනි කාරණය මේකයි. Exchange rate එක කොහොමත් වැඩි වෙලා තිබෙන්නේ. ඒ අනුව මේ ගණන් තවත් වෙනස් වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ සමහර ව්‍යාපෘති plan කරලා තිබුණාට හරියට design කරලා නැති වුණාම වියදම අනපේක්ෂිත ලෙස වැඩි වෙනවා. ඉතා ඉක්මනින් මම එක උදාහරණයක් කියන්නම්. පොතුහැර-රඹුක්කන කොටසේ සාමාන්‍යයෙන් කිලෝමීටරයකට වියදම Rs. 800 million to Rs. 1 billion වාගේ වුණාට, ඒකේ අන්තිම කොටසේ අඩි 400ක් විතර ගැඹුරට විශාල rock එකක් තිබෙනවා. ඒක කඩා ඉවත් කරන්න යන වියදම මුලික සැලැස්මේ නැහැ. මොකද, ඒක plan කරලා තිබුණාට හරියට soil testingවලට ගිහිල්ලා, boreholes ගහලා නැහැ. ඒ නිසා design එකට කලින් දන්නේ නැහැ, එතැන විශාල rock එකක් තිබෙනවා කියලා. ඒ නිසා, වැඩ කරගෙන යනකොට තමයි ඒ අතිවිශාල වියදම එකතු වෙන්නේ. ඒ නිසා පාරවල් plan කරනවාට එහා ගිහින්, හරියට design නොකළාම ඔබතුමා කියනවා වාගේ වියදම් වැඩි වෙනවා, variations එනවා. ඊට පස්සේ ආණ්ඩුව ඒවාට කොටු වෙනවා. ඒවා වළක්වාගෙන තමයි අපි දැන් කටයුතු කරන්නේ. ඒ අනුව වියදම් වැඩිවීමට බලපෑ හේතු කිහිපයක් තිබෙනවා. ඒකෙන් තුනක් තමයි මම දැන් ඔබතුමාට කිව්වේ. ඒ නිසා වියදම් වෙනස් වෙලා ඇති.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒවා සම්බන්ධයෙන් ඇස්තමේන්තු කරන්න බැරිද, ගරු ඇමතිතුමනි? මොකද, ඒකේ වටිනාකමක් තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඔව්. ඒ ඇති වුණු ආර්ථික අර්බුදය, වංචා හා දූෂණ, ප්‍රමාදය, exchange rate fluctuations, design කළ එකෙන් ඇති වෙලා තිබෙන ප්‍රශ්න, සමහර කොන්ත්‍රාත්කරුවන්ගේ ප්‍රමාද කියන ඒ සියල්ලම රටට වැය බරක් විධියට එකතු වනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒවා වෙන වෙනම calculate කරලාත් අපි සාකච්ඡා කරලා තිබෙනවා. එය වෙනම අභ්‍යාසයක්. ඔබතුමාට එහෙම අභ්‍යාසයක් කර ගැනීමට අවශ්‍ය නම් අපට එය සකස් කරලා, ඉදිරි අය වැය පවත්වන කාලයේදී වාගේ ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Ministerial Consultative Committee on Transport, Highways and Urban Development එකෙන් ගන්න පුළුවන්. මොකද, දත්ත තිබෙනවා.

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මෑතකදී RDA එකේ රුපියල් මිලියන 380ක duplicate payment එකක් සිදු වෙලා තිබෙනවාය කියනවා. ඒ වාගේම රුපියල් මිලියන 4,614ක් සම්බන්ධව audit query එකක් තිබෙනවා. Expressway එකෙන් කාර් ඇතුළු වෙලා තිබෙනවා. නමුත්, පිටවීමේදී ගෙවලා නැහැ. එහි පරතරය Audit Report එකේ තිබෙනවා, රුපියල් මිලියන 4,614ක් කියලා. ඒ කාරණා දෙක සම්බන්ධයෙන් මොන වාගේ විගණනයක්ද සිදු වන්නේ? මොකද, verification process එකක් නැහැ, මේ දෙවැනි කාරණාව සම්බන්ධයෙන්. ඒක ගෙවලා තිබෙන්නේ Bank of Ceylon එක. ඒ සම්බන්ධයෙන් අද තිබෙන සැබෑ තත්ත්වය මොකක්ද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු මන්ත්‍රීතුමනි, එම බොරු චෝදනාව කළ නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීවරයාට විරුද්ධව RDA එක පොලිසියේ පැමිණිල්ලක් කර තිබෙනවා. RDA එකේ ගිණුමෙන් රුපියලක්වත්,- *[බාධා කිරීමක්]* මම ප්‍රශ්නයට උත්තර දෙන්නම්. *[බාධා කිරීමක්]* එතුමා තමයි. *[බාධා කිරීමක්]* එතුමා තමයි ප්‍රකාශ කළේ RDA එක විසින් කොන්ත්‍රාත්කරුවන්ට රුපියල් මිලියන 380ක මුදලක් දෙවතාවක් ගෙවලා තිබෙනවාය කියලා. RDA එක අපේ ගරු ප්‍රසන්න ගුණසේන නියෝජ්‍ය ඇමතිතුමාත් එක්ක එකතු වෙලා කරුණු සහිතව එය ප්‍රතික්ෂේප කරමින් මාධ්‍ය සාකච්ඡාවක් කළා. ඔහු කිසිම පදනමකින් තොරව විවේචනයක් ලෙස තමයි ඉදිරිපත් කළේ අපිවත් සම්බන්ධ කරලා. දැනට ඒ සම්බන්ධයෙන් RDA එක පොලිසියට පැමිණිලි කරලා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමා මතු කරන අනෙක් කරුණ මේ ප්‍රශ්නයට සෘජුව සම්බන්ධ නැති නිසා මම තොරතුරු හොයලා ඒ ගැන කියන්නම්. Audit queries එහෙම,- *[බාධා කිරීමක්]* Audit queries ඇති. Audit queries මේ ප්‍රශ්නයට සෘජුව සම්බන්ධ නැහැ නේ. හැබැයි, ඒ ගැන හොයලා කියන්න පුළුවන්. නමුත්, ඒක හේතු කිහිපයක් නිසා වෙන්න පුළුවන්. එක හේතුවක් තමයි, මේ toll gatesවලින් අවශ්‍ය කරන tellers නැති නිසා සමහර විට ඇතුළු වුණාට exit එකේ කෙනෙක් නැති අවස්ථා තිබීම. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. මම දෙවන අතුරු ප්‍රශ්නයට උත්තර දෙන්නම්. ඔබතුමාගේ උපක්‍රමයට මම අහු වෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ඒ, හිඟය නිසා වෙන්න පුළුවන්. ඒ වාගේම toll gatesවල පැහැදිලිවම ඒ වංචාව වුණා, විවිධ ක්‍රමවලට. ඒවා නිසාත් ඕක වෙන්න පුළුවන්. ඕක audit query එකක් නේ. ඕක ඔප්පු වෙලා නැහැ නේ, audit එකෙන්. ඒකට උත්තර දෙන්න ඕනෑ. මම හිතන විධියට, ඉදිරියේදී RDA එක Audit එකට පිළිතුරු දීමේදී තමයි සම්පූර්ණ උත්තර හොයා ගන්න වෙන්නේ. නමුත්, පැහැදිලි leakage එකක් exits සහ entrancesවලදී තිබිලා තිබෙනවා. සමහර විට දැනුත් ඒක සිදු වෙනවා වෙන්න පුළුවන්. නමුත්, අපි ඒක අවම කරගෙන යනවා. *[බාධා කිරීමක්]* ETC එක කරගෙන යනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4, ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
මට ගරු මහාමාර්ග ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
මට වැදගත්, ඒක.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ඇමතිතුමාගෙන් අහලා එතුමා කැමැති නම් අවස්ථාව දෙන්න පුළුවන්. එහෙම එකක් තිබෙනවා,.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කොහේද තිබෙන්නේ? කොහේවත් එහෙම එකක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමන්ලාට ඕනෑ විධියට නීති නවන්න බැහැ. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු ඇමතිතුමා ප්‍රශ්නය අහනවාට කැමැතිද? සභානායකතුමා කැමැති නම් ඒ ප්‍රශ්නය අහන්න අවස්ථාව,- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -553/2025- (2), ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමා ප්‍රශ්නය අහනවාද? *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, වාඩි වෙන්න. ඔබතුමාට Standing Ordersවල කියන දේ මොකක්ද කියලා තේරෙන්නේ නැහැ නේ. මේ වාගේ කෘතහස්ත දේශපාලනඥයෝ- *[බාධා කිරීමක්]* කියලා වැඩක් නැහැ. සභාව හැල්ලුවට ලක් කිරීමක් කරන්නේ. ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, වාඩි වෙන්න. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අසා තිබෙන ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට ආරක්ෂක ඇමතිතුමා වෙනුවෙන් මම තව මාස දෙකක කාලයක් ඉල්ලනවා. මොකද, මේක අවුරුදු 30කට වැඩි කාලයක් වන කාරණයක්. ඉතින්, විස්තර හොයන්න තිබෙන නිසා පිළිතුරු දෙන්න තව මාස දෙකක කාලයක් ඉල්ලනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ දෙවැනි වතාවට. මේකට පිළිතුරු දීම නැවතත් මාස කිහිපයකට කල් ගියා. මේක රෝහණ විජේවීර මැතිතුමා ගැන අහන ප්‍රශ්නයක්. *[බාධා කිරීමක්]* මට විනාඩියක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point එකක් නොවෙයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, කථාවකට නොවෙයි. මම අහන්න කැමැතියි මේ කාරණය. ආයෙත් කවදාද මට,-*[බාධා කිරීම්]* මේ ප්‍රශ්නය තව මාසයක් විතර යනවා. එතෙක් මට ප්‍රශ්නයක් අහන්න බැහැ, ගරු කථානායකතුමනි. ඒකයි කියන්නේ. *[බාධා කිරීම්]*

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## මහවැලි "H" කලාපය: උඳු වගාව
### மகாவலி "H" வலயம்: உளுந்துப் பயிர்ச்செய்கை
### MAHAWELI "H" ZONE: BLACK GRAM CULTIVATION

643/2025

**5. ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මෙවර මහවැලි "H" කලාපයේ උඳු වගා කර ඇති භූමි ප්‍රමාණය කොපමණද;

(ii) එසේ උඳු වගා කර ඇති ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ගොවීන්ට තම නිෂ්පාදන සාධාරණ මිලකට අලෙවි කර ගැනීම සම්බන්ධයෙන් ගැටලුවක් පවතින බව දන්නේද;

(iv) එසේ නම්, එම ගැටලුව විසඳීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இம்முறை மகாவலி "H" வலயத்தில் உளுந்து பயிர்செய்யப்பட்டுள்ள நிலப்பரப்பு யாது;

(ii) அவ்வாறு உளுந்து பயிரிட்டுள்ள விவசாயிகளின் எண்ணிக்கை யாது;

(iii) மேற்படி விவசாயிகள் தமது உற்பத்திகளை நியாயமான விலைக்கு விற்பனை செய்வதில் பிரச்சினைகளுக்கு முகம்கொடுத்துள்ளனர் என்பதை அவர் அறிவாரா;

(iv) ஆமெனில், மேற்படி பிரச்சினைகளைத் தீர்ப்ப தற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the extent of land under cultivation of black gram in the Mahaweli "H" zone this season;

(ii) the number of farmers who have so cultivated black gram, as is mentioned above;

(iii) whether he is aware that these farmers are facing difficulties in selling their produce at a fair market price; and

(iv) the measures that will be taken to resolve the aforesaid problem?

(b) If not, why?

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා අහන ප්‍රශ්නය ඉතාම වැදගත් ප්‍රශ්නයක්. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) මහවැලි "එච්" කලාපයේ උඳු වගා කර ඇති භූමි ප්‍රමාණය 2025/26 මහ කන්නයේ හෙක්ටෙයාර 11.53ක් වන අතර, 2026 යල කන්නය සඳහා වගාව තවමත් ආරම්භ කර නොමැත.

(ii) "එච්" කලාපයේ උඳු වගා කරන ලද ගොවීන් ප්‍රමාණය (2025/26 මහ කන්නය සඳහා) 48කි.

(iii) 2025/26 මහ කන්නයේදී මෙවැනි ප්‍රශ්නයක් පැන නැඟී නොමැත.

(iv) ඉහත පිළිතුර අනුව අදාළ නොවේ.

(ආ) ඉහත පිළිතුර අනුව අදාළ නොවේ.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපේ රටේ උඳු අවශ්‍යතාව මෙට්‍රික් ටොන් 25,000ක් වාගේ ප්‍රමාණයක් වනවා. වගා කරන භූමි ප්‍රමාණය හෙක්ටෙයාර 9,710ක්. ඒ වාගේම, අපි සියයට 12ත්, 15ත් අතර ප්‍රමාණයක් ආනයනය කරනවා. මගේ ප්‍රශ්නය මෙයයි. මේ උඳු වගා කරන ගොවීන්ට ප්‍රමාණවත් පෝෂිත ඉඩම් නැහැ. ඒ අය හේන් වගාව කරන්නේ, අනවසර ඉඩම්වල. උඳු අවශ්‍යතාවෙන් සියයට 15ක් විතර ආනයනය කරන එක අපට නවත්වා ගන්න පුළුවන්, ඒ අයට නිසි ඉඩම් ටික ලබා දීලා, අවශ්‍ය කරන පොහොර ටික ලබා දුන්නා නම්. ගොවියාට නම් පොහොර සහනාධාරයත් තවම ලැබිලා නැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඒ වාගේ කරන්නේ නැතුව මේ උඳු ගොවියාට නිශ්චිත ඉඩම් ටික ලබා දෙන්න මහවැලිය විධියට ඔබතුමන්ලාගේ විශේෂ වැඩ පිළිවෙළක් තිබෙනවාද? ඒ අයට ඉඩම් ටික ලබාදෙන්න පුළුවන්ද?

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු කථානායකතුමනි, රටක් විධියට අපට අවශ්‍ය උඳු ප්‍රමාණය තවම අපට සම්පූර්ණ වශයෙන් සපයා ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසාම අපි - මහවැලියත්, කෘෂිකර්ම අමාත්‍යාංශයත් - මේ පිළිබඳ අවධානය යොමු කරලා සැලසුම් සකස් කරමින් තිබෙනවා, අවිධිමත්ව බැහැර කර ඇති ඉඩම්වල වගා කරන ගොවීන් විධිමත් ක්‍රමවේද යටතේ, සැලසුම්සහගත වැඩ පිළිවෙළක් ඔස්සේ මේකට සම්බන්ධ කරගන්න.

ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉතාම වැදගත්. හැබැයි, ඉතිහාසය පුරාම මහවැලිය හරි වෙනත් ආයතන හරි ඉඩම් බැහැර කර තිබෙන්නේ මෙවැනි ජාතික ඉලක්කයකට නොවෙයි, විවිධ දේශපාලන හිතවතුන්ගේ වුවමනා මත. ඒ නිසා මහවැලි අධිකාරිය විධියට අපි දැනට යම් අධ්‍යයනයක් කරගෙන යනවා, මේ ගොවීන් සඳහා විධිමත්ව ඉඩම් ලබා දෙන්න පුළුවන් කලාප, භූමි ප්‍රමාණයන් හඳුනා ගනිමින් තිබෙනවා. මේක සංකීර්ණ ප්‍රශ්නයක්. හැබැයි අපි ආණ්ඩුවක් විධියට සැලැස්මක් ක්‍රියාත්මක කරමින් තිබෙනවා, උඳු වගාව වැඩි කරන්නත්, ඒ ගොවීන්ට අවශ්‍ය ඉඩම් ලබා දිම සඳහාත්.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, යල කන්නයේ වැඩ කටයුතු දැන් ආරම්භ කර තිබෙනවා. පසුගිය අප්‍රේල් මාසයේ 20වැනි දා තමයි මඩ ගොවිතැන් වැඩ කරන්න ගොවීන්ට වතුර ලබා දුන්නේ. රජය විසින් පොහොර සහනාධාරය විධියට හෙක්ටෙයාරයකට රුපියල් 25,000ක් ලබා දෙනවාය කිව්වා. ඒ වාගේම, මේ යල කන්නයේදී තව රුපියල් 5,000ක් එකතු කරලා හෙක්ටෙයාරයකට රුපියල් 30,000ක් ලබා දෙනවාය කිව්වා. නමුත් යල කන්නයේ මේ වෙනකම් ගොවියාට ඒ පොහොර සහනාධාරය ලබා දී නැහැ. ඒ වාගේම, රජය විසින් කියනවා, හෙක්ටෙයාරයකට යූරියා පොහොර මිටි 5ක් දෙනවා කියලා. හැබැයි දැන් ආයෙත් කියනවා, ඒක ලබා දෙන්න විධියක් නැහැ කියලා. යූරියා මිටි දෙකහමාරක් දෙනවා කියලා අප්‍රේල් මාසයේ 10වැනි දා ගොවි සංවිධාන හරහා රුපියල් 25,875ක් සෑම ගොවියෙකුගෙන්ම එකතු කර තිබෙනවා. හැබැයි මේ වෙනතුරු ගොවියාට ලබා දෙනවා කියපු ඒ පොහොර මිටි දෙකහමාර ලබා දී නැහැ. මේ වනවිට ජලය ලබා දීලා තිබෙනවා. ගොවීන් කොහෙන් හරි - එළියෙන් හෝ - පොහොර

[ගරු කිංස් නෙල්සන් මහතා]

හොයා ගෙන ඒ වැඩ කටයුතු කරගෙන යනවා. හැබැයි, නිශ්චිත වෙලාවට පොහොර සහනාධාරය ලැබී නැහැ. එක පැත්තකින්, මඩ වැඩ පටන් ගනිද්දී MOP පොහොර ලබා දුන්නේ නැහැ. දැන් යූරියා අවශ්‍ය වෙලාවේ එය ලබා දෙන්නේත් නැහැ. අදාළ බලධාරින් සහ ගොවිජන සංවර්ධන නිලධාරින් කියනවා, "දැන් පොහොර මිල අධිකයි. ඒ නිසා රුපියල් 25,875ක් එකතු කළාට, මේ ගණනට පොහොර දෙන්න බැහැ" කියලා. ඒගොල්ලන් මේ කාරණය කැබිනට් මණ්ඩලයට යොමු කර approval එකක් අරගෙන දෙනවාද, නැද්ද කියලා හිත හිතා ඉන්නවා. ඒ විධියට පොහොර ලබා දෙනකොට, මේ යල කන්නය විනාශ වෙලා ඉවරයි.

ඔබතුමන්ලා කිව්වා, හාල් පිට රටින් ආනයනය කරන්නේ නැහැ කියලා. නමුත් මේ යන විධියට මම හිතන්නේ මේ තල්ලු වෙන්නේ පිට රටින් හාල් ගෙන්වන්න තමයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලා මේ කාරණයට මැදිහත් වෙන්න. මේකේ කැබිනට් මණ්ඩලයට යොමු කරන්න දෙයක් නැහැ. සල්ලි එකතු කර තිබෙනවා නම්, දෙනවා කියපු පොහොර ටික ගොවියාට ලබා දෙනවාද?

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ අතුරු ප්‍රශ්නය මේ මොහොත වනවිට ගොවීන් සහ අමාත්‍යාංශය වැඩිම අවධානය යොමු කරපු ප්‍රශ්නයක්. ගරු මන්ත්‍රීතුමා, මේ ඇති වෙලා තිබෙන්නේ ඇත්තටම රට අභ්‍යන්තරයේ ඇති වුණු ගැටලුවක් නිසා පැන නැඟුණු ප්‍රශ්නයක් නොවෙයි. ජාත්‍යන්තර වශයෙන්, ගෝලීය වශයෙන් ඇති වුණු යුද්මය තත්ත්වයත් එක්ක සමහර රටවල් පොහොර අපනයනය කිරීම නතර කර තිබෙනවා. ඒ තත්ත්වය මත තමයි ක්ෂණිකව රට ඇතුළේ සහ ලෝක පරිමාණයෙන් පොහොර හිඟයක් ඇති වුණේ. ඒක අපේ රටටත් බලපා තිබෙනවා. හැබැයි, අපි ආණ්ඩුවක් විධියට පොහොර සමාගම්, නිලධාරින් සහ ගොවි නායකයන් එක්ක කථා කරලා මේ කන්නයට අදාළව යම් නිශ්චිත වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර තිබෙනවා. වෙනදා වාගේ සරලව, පහසුවෙන් මේ සියල්ල සපයා ගන්න බැරි වෙයි. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා පොහොර අවශ්‍යතාවෙන් සියයට 65ක් ලබා දෙන්න අපි රජය විධියට සැලසුම් කර තිබෙනවා. මුදල් එකතු කර තිබෙනවා කියලා ඔබතුමා කිව්වේ, ඒ පිළිබඳව තමයි. ඒ වාගේම සියයට 35ක් පොහොර සමාගම් හරහා - විවෘත වෙළෙඳ පොළ තුළ ඔවුන්ගේ ව්‍යාපාර ස්ථානවලට බෙදා හැර - ලබා ගැනීමේ අවස්ථාව අපි හදා තිබෙනවා.

පොළොන්නරුව ගත්තාම, ඒක ගරු මන්ත්‍රීතුමාගේ දිස්ත්‍රික්කය. ඒ වාගේම ගොවීන් විශාල ප්‍රමාණයක් ඉන්නා දිස්ත්‍රික්කයක්. පොළොන්නරුවේ මෙවර කන්නය ටිකක් ප්‍රමාද වුණා. අපි ප්‍රමුඛතාව හදා වගා කරන පියවරට අනුව තමයි පොහොර ලබා දීමේ කටයුත්ත සැලසුම් කර තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුරක් විධියට සඳහන් කරනවා නම්, මේ මොහොතේ පවතින තත්ත්වයත් එක්ක ගොවියාට මේ සියල්ල සම්බන්ධව සාධාරණයක් කරන්න අපි සැලසුම් කර තිබෙනවා. මෙතැනදී මතක් කළ යුතුම කාරණය තමයි මේක යුද්මය තත්ත්වයත් එක්ක ඇති වුණු තත්ත්වයක්ය කියන එක. යල කන්නයේ මෙහෙම කිසිදු ගැටලුවක් ඇති වුණේ නැහැ. මේ කන්නයේ මෙවැනි තත්ත්වයක් ඇති වුණේ පැහැදිලිවම මේ යුද්මය තත්ත්වය නිසායි. හැබැයි, අපි ගොවි නායකයන් එක්ක එකඟ වෙලා, ඔවුන් එක්ක සාකච්ඡා කර තිබෙනවා. මෙහෙම නොවෙයි, මේක වෙන්න තිබුණේ. ඇත්තටම විශාල වශයෙන් පොහොර මිල වැඩි වෙලා, ගොවීන්ට සාමාන්‍ය, සාධාරණ ක්‍රමවේදයකට පොහොර ගන්නම බැරි මට්ටමක් තිබුණේ. ඒ තත්ත්වය තුළ අපි පොහොර සමාගම් එක්ක කථා කළා. ඊට පසුව ආණ්ඩුව යම් ප්‍රතිපත්තිමය එකඟතාවක් අරගෙන ක්ෂණිකව පොහොර සහනාධාරය වැඩි කළා. සැලැස්මක් ක්‍රියාත්මක කර තිබෙනවා. බෙදා හැරීමේදී යම් යම් අඩුපාඩු වෙලා තිබෙන්න පුළුවන්. හැබැයි, ගොවීන්ගේ අවශ්‍යතා සඳහා පොහොර ලබා දෙන්න අපි නිශ්චිත වැඩ පිළිවෙළක් මේ වෙනකොට සකස් කර තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 6 -673/2025- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 7 -886/2025- (1), ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ: ක්‍රියාත්මක කිරීම
### உத்தேச புதிய கல்விச் சீர்திருத்தம்: நடைமுறைப்படுத்தல்
### PROPOSED NEW EDUCATIONAL REFORMS: IMPLEMENTATION

1248/2025

**8. ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහන 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන්නේද;

(ii) එහි අන්තර්ගත ප්‍රධාන පියවර කවරේද;

(iii) එම වැඩසටහනේ වැදගත් අංගයක් වන විදුහල්පතිවරුන්, ගුරුවරුන් හා අධ්‍යාපන නිලධාරින් පුහුණු කිරීම, පළමුව සිදු කළ යුතු බව පිළිගන්නේද;

(iv) එම වැඩසටහන සඳහා ගුරුවරුන්ගේ, විදුහල්පතිවරුන්ගේ හා නිලධාරින්ගේ දායකත්වය, කාර්යක්ෂමව හා ඵලදායීව ලබා ගැනීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(v) එම වැඩසටහනේ ඇති මොඩියුල ක්‍රමවේදය හේතුවෙන් ගුරුවරුන්ට විෂයන් කිහිපයක් ඉගැන්වීමට සිදු වන බව පිළිගන්නේද;

(vi) එසේ නම්, මොඩියුල ක්‍රමවේදය පාසල් පද්ධතියේ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන ආකාරය කවරේද;

(vii) වෘත්තීය අධ්‍යාපන විෂය ධාරාව, නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සමඟ පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක කිරීමට නිපුණතාවය සහිත ගුරුවරුන් සපුරා ගන්නා ආකාරය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහන ආරම්භ කළ දිස්ත්‍රික්ක කවරේද;

(ii) එම එක් එක් දිස්ත්‍රික්කයෙන් තෝරා ගෙන ඇති පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පාසල් කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) உத்தேச புதிய கல்விச் சீர்திருத்த நிகழ்ச்சித் திட்டம் 2026ஆம் ஆண்டு தொடக்கம் செயற்படுத்தப்படுமா என்பதையும்;

(ii) அதில் உள்ளடங்கியுள்ள பிரதான படிநிலைகள் யாவை என்பதையும்;

(iii) அந்நிகழ்ச்சித்திட்டத்தின் முக்கிய அங்கமாகக் காணப்படும் அதிபர்கள், ஆசிரியர்கள் மற்றும் கல்வி உத்தியோகத்தர்களைப் பயிற்றுவிக்கும் செயற்பாட்டை முதலில் மேற்கொள்ள வேண்டும் என்பதை அவர் ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iv) அந்நிகழ்ச்சித்திட்டத்துக்கு ஆசிரியர்கள், அதிபர்கள் மற்றும் உத்தியோகத்தர்களின் பங்களிப்பை வினைத்திறன் மிக்கதாகவும் பயனுடையதாகவும் பெற்றுக்கொள்வதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(v) அந்நிகழ்ச்சித்திட்டத்திலுள்ள மொடியூல் முறை காரணமாக பல பாடங்களைக் கற்பிக்க வேண்டிய நிலை ஆசிரியர்களுக்கு ஏற்படுவதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(vi) அவ்வாறெனில், மொடியூல் முறையை பாடசாலைக் கட்டமைப்பில் நடைமுறை ரீதியாகச் செயற்படுத்தும் முறை யாது என்பதையும்;

(vii) தொழிற்கல்வி கலைத் திட்டத்தை புதிய கல்விச் சீர்திருத்தங்களுடன் பாடசாலைக் கட்டமைப்பில் செயற்படுத்துவதற்கு அவசியமானதாக அமையும் தேர்ச்சி மிக்க ஆசிரியர்களுக்கான தேவையைப் பூர்த்திசெய்துகொள்ளும் வழிமுறை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) புதிய கல்விச் சீர்திருத்த நிகழ்ச்சித்திட்டம் ஆரம்பிக்கப்பட்ட மாவட்டங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு மாவட்டத்திலிருந்தும் தெரிவுசெய்யப்பட்டுள்ள பாடசாலைகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) அந்தப் பாடசாலைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether the proposed new educational reforms will be implemented from 2026;

(ii) the main steps incorporated in this programme;

(iii) whether she accepts that the training of principals, teachers and education officers, which is a vital component of this programme, should be conducted first;

(iv) the measures that will be taken to secure the contribution of teachers, principals and officers to this programme efficiently and effectively;

(v) whether she accepts that, due to the module system incorporated in this programme, teachers are expected to teach several subjects;

(vi) if so, how the module system will be practically implemented in the school system; and

(vii) the method for recruiting competent teachers to implement the Vocational Education stream within the school system in line with the new educational reforms?

(b) Will she also inform this House the -

(i) districts in which the new educational reforms programme has been initiated;

(ii) number of schools that have been selected from each of these districts separately; and

(iii) names of such selected schools?

(c) If not, why?

**ගරු නලින් හේවගේ මහතා (වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு நலின் ஹேவகே - தொழிற்கல்விப் பிரதி அமைச்சர்)

(The Hon. Nalin Hewage - Deputy Minister of Vocational Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහන 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මකව පවතී.

(ii) ප්‍රාථමික අධ්‍යාපනය, කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය හා ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය යන සාමාන්‍ය අධ්‍යාපනයට අදාළ ප්‍රධාන කුලුනු ලෙස විෂයමාලා ප්‍රතිසංස්කරණ ද, ඊට අමතරව මානව සම්පත් සංවර්ධනය, ඇගයීම් හා තක්සේරුකරණය, අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ හා යටිතල පහසුකම් සංවර්ධනය, මහජනතාව දැනුවත් කිරීම් හා ප්‍රවර්ධනය යන කුලුනු යටතේ එකිනෙකට සමෝධානිත ක්‍රියාවලියක් වශයෙන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වේ.

2026 වර්ෂයේදී පාසල්වල 1වන ශ්‍රේණියට ක්‍රියාකාරකම් පාදක -Activity Based- විෂයමාලා ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වේ. 2027 වර්ෂයේදී, 2 ශ්‍රේණිය සඳහා ක්‍රියාකාරකම් පාදකවද -Activity Based-, 6 ශ්‍රේණිය සඳහා මොඩියුල පාදකවද - Module Based- විෂයමාලා ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වේ. ඉන්පසු ඉදිරි වර්ෂවල ක්‍රමානුකූලව සෙසු ශ්‍රේණිවලට විෂයමාලා ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කෙරෙනු ඇත. ඊට සමගාමීව සහායක කාර්යයන් ඉහත දක්වා ඇති සෙසු කුලුනු ඔස්සේ ක්‍රියාත්මක වනු ඇත.

(iii) විදුහල්පතිවරුන්, ගුරුවරුන් හා අධ්‍යාපන නිලධාරීන්ට නිසි පුහුණුවක් ලබා දීම පළමුව සිදු කළ යුතු කාර්යයක් ලෙස පිළිගන්නා අතර, ඒ සඳහා ප්‍රමුඛතාව ලබා දෙමින් මේ වන විට ද කටයුතු කර ඇත.

(iv) 2025 වර්ෂයේ දී, 1වන ශ්‍රේණියේ සහ 6වන ශ්‍රේණියේ පළමු වාරය සඳහා ප්‍රධාන පුහුණුකරුවන් ලෙස තෝරා ගන්නා ලද

[ගරු නලින් හේවගේ මහතා]

නිලධාරින් ජාතික අධ්‍යාපන ආයතනය විසින් පුහුණු කර ඇත. තවද, පාසල්වල 1වන සහ 6වන ශ්‍රේණිවලට ඉගැන්වීම් සිදු කරනු ලබන සියලු ගුරුවරුන් පළමු වන වාරයට අදාළ ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පුහුණු කිරීමට කටයුතු කර ඇත. මේ වන විට 1වන ශ්‍රේණියේ, 2වන සහ 3වන වාර සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන අවසන් කර ඇත. 1වන ශ්‍රේණියේ 2වන සහ 3වන වාරය සඳහා වන ගුරු පුහුණුව 2026.05.15 වන දින වන විට අවසන් කර ඇත. 2027 වර්ෂයේ ආරම්භ කිරීමට යෝජිත 6වන ශ්‍රේණිය සඳහා වන විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ එහි 2වන සහ 3වන වාරවලට අදාළ ප්‍රධාන පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන 2026 ජූලි සහ අගෝස්තු මාසවල දී සිදු කිරීමට සැලසුම් කර ඇත.

ඉන් අනතුරුව එහි ගුරු පුහුණුව පැවැත්වේ. 2027 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත 2වන ශ්‍රේණියේ විෂය මාලාවට අදාළ පුහුණුකරුවන් පුහුණු කිරීම හා ගුරු පුහුණුව 2026 ජූලි මස ආරම්භ කර දෙසැම්බර් මාසයේදී අවසන් කිරීමට නියමිතය. විදුහල්පතිවරුන් හා පළාත් මට්ටමේ නිලධාරීන් පුහුණුව හා දැනුවත් කිරීම 2025 වර්ෂයේදී ආරම්භ කළ අතර, මෙම වර්ෂයේදී අඛණ්ඩව පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීමට නියමිත ය.

(v) නැත.

පැරණි විෂය නිර්දේශය ක්‍රියාත්මක වීමේදී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ඇතැම් ගුරු භවතුන් සඳහා තම විෂයයට අදාළව නියමිත කාලච්ඡේද පාසල තුළ ප්‍රමාණවත් පරිදි නොමැති අවස්ථාවන්හිදී හා ඇතැම් විෂයයන් සඳහා ගුරු භවතුන් ඌන වන විට එම විෂයයන් ආවරණය කිරීමට විෂයයන් කිහිපයක් ඉගැන්වීමට සිදු වේ. මෙය ඔවුන් උගත් විෂයයන් හා විෂය ප්‍රවීණතාව මත රඳා පවතී. පාසල්වල එම විෂයයන්හි ප්‍රවීණතාව සහිත ගුරු භවතුන් ඇසුරින් එම විෂයයන් කළමනාකරණය කර ගනු ඇත. මෙය නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ මොඩියුල ක්‍රමවේදය හඳුන්වා දීම මත සිදු වූවක් නොවේ.

(vi) මෙයට අදාළ ගුරුවරුන් බඳවා ගැනීමේ නිර්ණායක සැකසීම, පුහුණුව, පාසල් පද්ධතිය සවිබලගැන්වීම පිළිබඳ අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වෘත්තීය අධ්‍යාපන අංශය, සාමාන්‍ය අධ්‍යාපන අංශයේ සැමට අධ්‍යාපන ශාඛාව හා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අංශය මේ වන විට අදාළ කටයුතු සිදු කරයි. මෙය 2026 වර්ෂයේ සිදු නොවන අතර නව ප්‍රතිසංස්කරණ යටතේ 10 ශ්‍රේණියට විෂය මාලා ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමේදී ඉදිරියේදී සිදු වීමට නියමිත ය.

(vii) මෙයට අදාළ ගුරුවරුන් බඳවා ගැනීමේ නිර්ණායක සැකසීම, පුහුණුව, පාසල් පද්ධතිය සවිබලගැන්වීම පිළිබඳ අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වෘත්තීය අධ්‍යාපන අංශය, සාමාන්‍ය අධ්‍යාපන අංශයේ සැමට අධ්‍යාපන ශාඛාව හා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අංශය මේ වන විට අදාළ කටයුතු සිදු කරයි. මෙය 2026 වර්ෂයේ සිදු නොවන අතර නව ප්‍රතිසංස්කරණ යටතේ 10 ශ්‍රේණියට විෂය මාලා ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමේදී ඉදිරියේදී සිදු වීමට නියමිත ය.

(ආ) (i) නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය දිවයිනේ එක් දිස්ත්‍රික්කයක් හෝ දිස්ත්‍රික්ක කීපයක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක වන්නක් නොවේ. 2026 වර්ෂය ආරම්භයේදී, පාසල්වල 1වන ශ්‍රේණියට අදාළ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ද මේ වන විට ආරම්භ කර ඇත්තේ සමස්ත දිවයින ආවරණය වන පරිදි ය.

(ii) නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සඳහා, ඉහත (ආ) (i) හි ද දක්වා ඇති පරිදි එක් එක් දිස්ත්‍රික්කයෙන් යම් පාසල් සංඛ්‍යාවක් තෝරා ගෙන නැත. අදාළ ශ්‍රේණි සහිත රජයේ සියලු පාසල්වලට අදාළ වන පරිදි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වේ.

(iii) ඉහත (ආ) (i) හා (ii) පිළිතුරු අනුව අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

දිස්ත්‍රික් මට්ටමේ වාගේම කලාප මට්ටමේ තොරතුරු සොයා බලන කොට අපට වාර්තා වෙනවා, මේ වනකොටත් සමහර තැන්වල පාසල් තෝරාගෙන තිබෙනවා කියලා. මේ වසරේත්, ලබන වසරේත් විශේෂයෙන්ම ප්‍රමුඛතාව අනුව ප්‍රාථමික පාසල් තෝරා බේරාගෙන, ඒ පාසල්වල තිබෙන අඩුපාඩු සම්පූර්ණ කරමින්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණත් එක්ක ඉදිරියට යන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් ඔබතුමා හොඳ පැහැදිලි කිරීමක් කළා. මේ වන විට එම පාසල් ලැයිස්තුගත කරලා, අවම වශයෙන් කොට්ඨාසයකින් එක් පාසලක් හෝ නම් කරලා තෝරා බේරාගෙන තිබෙනවාද කියා මම අහන්න කැමැතියි.

**ගරු නලින් හේවගේ මහතා**
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම අපේ කුලුනු 5න් එක කුලුනක් වන්නේ භෞතික සම්පත් සංවර්ධනයයි. 2024 අය වැයෙන් ඒ සඳහා වෙන් කරලා තිබුණේ දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 1.8යි. හැබැයි, වත්මන් රජයේ පළමු අය වැයෙන්ම එය සියයට 1.9 දක්වා වැඩි කළා. දෙවැනි අය වැයෙන් එය සියයට 2.04ක් දක්වා වැඩි කළා. පාසල්වලට ලබා දෙන මුදල් ප්‍රමාණය වැඩි කරලා, එම පාසල්වලට භෞතික පහසුකම් ලබා දී තිබෙනවා වාගේම, යම් පාසල් ප්‍රමාණයක් එකට එකතු කිරීමට අදාළ කටයුතු මේ වනකොට සිදු වෙමින් පවතිනවා. එම නිසා, මේ අවුරුද්ද ඇතුළත යම් පාසල් ප්‍රමාණයක් විශේෂිත පාසල් හැටියට නම් කරලා, ඒ පාසල්වලට වැඩි මුදල් ප්‍රමාණයක් වෙන් කරලා සංවර්ධනය කරන්න පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා. මේ වනකොටත් අදාළ මුදල් වෙන් කරලා තිබෙනවා.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අපි දන්නවා, මේ වසරේ තමයි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ආරම්භ කරන්න සූදානම් වුණේ කියලා. ඒ, 1 වසර සහ 6 වසර පන්ති සඳහා. පසුගිය කාලයේ අප ඒ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ආරම්භ කරන කොට විපක්ෂය විසින් මහා ඝෝෂාවක් නැඟුවා; ඒකට ලොකු විරෝධයක් පැවා. ඒ නිසා 6 වසර සඳහා වූ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ආරම්භ කරන්න බැරි වුණා. එම නිසා, 6 වසරේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා තිබෙන සූදානම මොකක්ද, එය ආරම්භ කරන්නේ කොයි කාලයේද කියන එක දැනගන්න කැමැතියි.

**ගරු නලින් හේවගේ මහතා**
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)

ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ අධ්‍යාපන ක්‍රමය බරක් වෙච්ච නිසා මේ රටේ දෙමව්පියෝ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කෙරෙහි විශාල බලාපොරොත්තුවක් සහිතවයි සිටියේ. ඒ අනුව, 2026 වර්ෂයේදී පළමු වසරටත්, 6වන වසරටත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගේන්න නියමිතව තිබුණත්, මේ විපක්ෂය සඳහන් කළා, විශේෂයෙන්ම විපක්ෂ නායකතුමා පවා පාර්ලිමේන්තුවේදී සඳහන් කළා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල තිබෙන ධර්ම චක්‍රය පවා වැරදියි කියලා. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට මතක ඇති, අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට ඇතුළත් කර තිබෙන ධර්ම චක්‍රය වැරදියි කියලා ඔබතුමා ඉතා පැහැදිලිව කිව්වා. එම ධර්ම චක්‍රය අපට හඳුන්වා දුන්නේ සංක්ෂිප්ත ත්‍රිපිටක බල මණ්ඩලය විසින්. අතිපූජ්‍ය බලංගොඩ සෝරත නායක හාමුදුරුවන් වහන්සේ තමයි එහි සභාපති විධියට කටයුතු කරන්නේ. අතිපූජ්‍ය ත්‍රිකුණාමලයේ ආනන්ද නායක හාමුදුරුවන් වහන්සේ වාගේ සංඝ පිතෘන් වහන්සේලා විසින් තෝරා දෙන ලද ධර්ම චක්‍රය තමයි මෙතුමන්ලා අභියෝගයට ලක් කළේ. කරුණු කාරණා නොදැන ඉතා පහත් විධියට මෙතුමන්ලා කටයුතු කළා.

ඒ විතරක් නොවෙයි, ඒ වෙලාවේ අපි දැක්කා ගරු අගමැතිතුමියට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගේන්නත් උත්සාහ කළ ආකාරය. එහෙම ලොකු සද්දයක් දැම්මා. ඒකත් එක්ක රටේ යම් කැලඹිල්ලක් ඇති වුණා. ඉතින් අපි අධ්‍යාපන අමාත්‍යාංශය හැටියට, රජය හැටියට තීරණය කළා, අධ්‍යාපනය වාගේ ඉතා සංවේදී විෂයයකට අදාළ ප්‍රතිසංස්කරණ සුළු හෝ අඩුපාඩුවක් තියාගෙන ගෙනෙන එක හොඳ නැහැ කියලා. ඒක නිසා තමයි අපි ඒකට අවුරුද්දක් කල් ගත්තේ. ඒ දරුවන්ට ඒ අධ්‍යාපනය අහිමි කිරීමේ සම්පූර්ණ ශාපය විපක්ෂ නායකවරයා ප්‍රමුඛ විපක්ෂය පිටින් යන්න ඕනෑ කියලා තමයි අප විශ්වාස කරන්නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාගේ point of Order මොකක්ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ස්ථාවර නියෝග 92- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා බාධා කරනවා නේ. *[බාධා කිරීම්]*

ප්‍රශ්න අංක 9 -1633/2025- (1), ගරු චාමර සම්පත් දසනායක මහතා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ලංකා ධීවර සංස්ථාව: මූල්‍ය අක්‍රමිකතා
## இலங்கை கடற்றொழில் கூட்டுத்தாபனம்: நிதி மோசடிகள்
## CEYLON FISHERIES CORPORATION: FINANCIAL IRREGULARITIES

1936/2026

**10. ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ලංකා ධීවර සංස්ථාව ධීවර ජනතාවට මෙන්ම පාරිභෝගිකයන්ටද සේවා සපයන ආයතනයක් බවත්;

(ii) පසුගිය පාලන කාලය තුළ සංස්ථාවේ කාර්යභාරය බිඳ වැටී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ලංකා ධීවර සංස්ථාවේ මූල්‍ය අක්‍රමිකතා සිදු වී තිබේද;

(ii) සංස්ථාවට අයත් අයිස් යන්ත්‍රාගාර සංඛ්‍යාව කොපමණද;

(iii) එම යන්ත්‍රාගාරයන්හි යන්ත්‍ර සූත්‍රවල ක්‍රියාකාරිත්වය කවරේද;

(iv) සංස්ථාව සංවර්ධනය කිරීම සඳහා වැඩ පිළිවෙළක් තිබේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை கடற்றொழில் கூட்டுத்தாபனம் மீனவர்களுக்கு மாத்திரமன்றி நுகர்வோருக்கும் சேவை வழங்கும் நிறுவனமாகவும் உள்ளது என்பதையும்;

(ii) கடந்த ஆட்சிக் காலத்தின்போது கூட்டுத்தாபனத்தின் பணிப்பொறுப்புகள் வீழ்ச்சியடைந்தன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இலங்கை கடற்றொழில் கூட்டுத்தாபனத்தில் நிதி மோசடிகள் இடம்பெற்றுள்ளனவா என்பதையும்;

(ii) மேற்படி கூட்டுத்தாபனத்துக்குச் சொந்தமான ஐஸ் இயந்திர கூடங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

[ගරු අජිත් ගිහාන් මහතා]

(iii) அவ்வியந்திர கூடத்திலுள்ள இயந்திரங்களின் தொழிற்படு நிலை யாது என்பதையும்;

(vi) மேற்படி கூட்டுத்தாபனத்தை அபிவிருத்தி செய்வதற்கான வேலைத்திட்டமொன்று உள்ளதா என்பதையும்;

(v) ஆமெனில், அதன் தற்போதைய முன்னேற்றம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries, Aquatic and Ocean Resources:

(a) Is he aware that the -

(i) Ceylon Fisheries Corporation is an institution that provides services to both the fishing community and the consumers; and

(ii) functions of the Corporation have been impaired during the previous regime?

(b) Will he inform this House-

(i) whether any financial irregularities have occurred in the Ceylon Fisheries Corporation;

(ii) the number of ice plants belonging to the Corporation;

(iii) the current operational status of the machinery in those ice plants;

(iv) whether there is a plan for the development of the Corporation; and

(v) if so, the current progress achieved in that regard?

(c) If not, why?

**ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)

ගරු කථානායකතුමනි, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

- 1957 අංක 49 දරන ලංකා කාර්මික නීතිගත පනත යටතේ ලංකා ධීවර සංස්ථාව ස්ථාපිත කිරීමට අදාළ ප්‍රධාන අරමුණු අතර, ගුණාත්මක තත්ත්වයෙන් උසස් මසුන් සහනදායි මිල ගණන් යටතේ ශ්‍රී ලාංකික පාරිභෝගික ජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතාව සපුරාලීම ප්‍රමුඛ අරමුණක් වූ අතර, ඒ අනුව ලංකා ධීවර සංස්ථාව දිවයින පුරා සිල්ලර අළෙවි සැල් ජාලයක් මඟින් ගුණාත්මක තත්ත්වයෙන් උසස් මසුන් සහනදායි මිල ගණන් යටතේ අළෙවි කිරීම සිදු කරනු ලබයි. ඉහත අරමුණු සපුරාලීම සඳහා ලංකා ධීවර සංස්ථාව ශීතාගාර පවත්වාගෙන යාම, අයිස් නිෂ්පාදනයට දායක වීම සිදු කරනු ලබයි.

- ධීවර ජනතාව වෙනුවෙන් සෘජුවම ඔවුන්ගේ මසුන් අස්වැන්න සාධාරණ මිලකට මිල දී ගැනීම දෛනිකව සිදු කරනු ලබන අතර, රට තුළ පැන නඟින අර්බුදකාරී අවස්ථාවලදී ධීවරයන්ට සහන සැලසීමේ මෙවලමක් ලෙස ලංකා ධීවර සංස්ථාව කටයුතු කරනු ලබයි. උදාහරණයක් වශයෙන්, කොවිඩ් වසංගතය සමයේ අළෙවි කර ගැනීමට නොහැකි වූ අවස්ථාවේ පාලන මිලක් නියම කොට ඔවුන්ගේ මසුන් අස්වැන්න රජයේ මැදිහත් වීමද සහිතව ලංකා ධීවර සංස්ථාව මඟින් මිල දී ගැනීම.

(ii) ඔව්.

- 2010 වර්ෂයේ සිට මේ දක්වා ලංකා ධීවර සංස්ථාව මූල්‍ය අර්බුදයකට ලක් වී ඇති අතර, ඒ හේතුවෙන් සේවකයන්ගේ ව්‍යවස්ථාපිත ගෙවීම් පැහැර හැරීම, මසුන් සැපයුම්කරුවන්ගේ ගෙවීම් ප්‍රමාද වීම හා බැංකු සඳහා පොලී සහ අයිරා පහසුකම් සඳහා වන ගෙවීම් පැහැර හැරීම සිදු වී ඇත. මෙම හේතු මත ධීවර ජනතාවට මෙන්ම පාරිභෝගික ජනතාව වෙත ප්‍රශස්ත සේවාවක් ලබා දීමට ධීවර සංස්ථාවට දුෂ්කර විය.

(ආ) (i) ඔව්. ඇමුණුමෙහි දක්වා ඇත.

ගරු කථානායකතුමනි, ඇමුණුමෙහි සඳහන් වෙනවා, පසුගිය කාලය තුළ සිදු වුණු මූල්‍ය අක්‍රමිකතා සහ ඒවාට අදාළ ක්‍රියාත්මක කිරීම් පිළිබඳව. ඒ වාගේම, 2024 හා 2025 වර්ෂවල සංස්ථා මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව. 1 සිට 10 දක්වා අක්‍රමිකතා සම්බන්ධව අපි ගත් ක්‍රියාමාර්ග ඇමුණුමෙහි දක්වා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. මා එම ඇමුණුම **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමනි, මේ වසර දෙකක කාලය තුළ ලංකා ධීවර සංස්ථාවේ සිදු වෙච්ච මූල්‍ය අක්‍රමිකතා පිළිබඳව ගණනයක් කරලා තිබෙනවා. ඒ අනුව, රුපියල් මිලියන 20ක මූල්‍ය අක්‍රමිකතාවලට අදාළව මේ වන විටත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මඟින් ඔවුන්ව අත්අඩංගුවට අරගෙන ඇප තබා මුදා හැර තිබෙනවා. තවත් කොටසකට විනය පරීක්ෂණ පවත්වා කරුණු තහවුරු කරගෙන ඒ අය සේවයෙන් ඉවත් කර තිබෙනවා. ඊට අමතරව තවමත් විධිමත් විනය පරීක්ෂණ කටයුතුවල නියැළීම් තිබෙනවා. ඊට අමතරව, චෝදනා පත්‍ර නිකුත් කර තිබෙනවා. මේ ආදී වශයෙන් ලංකා ධීවර සංස්ථාවේ සිදු වුණු මූල්‍ය අක්‍රමිකතා 10ක් පිළිබඳව අපේ රජය බලයට පත් වුණාට පස්සේ විමර්ශනය කර තිබෙනවා. දළ වශයෙන් රුපියල් මිලියන 20ක පමණ වටිනාකම්වලට අදාළ තරම් ප්‍රමාණයක් විමර්ශනය කර තිබෙනවා.

(ii) අයිස් යන්ත්‍රාගාර 9කි.

1. පේසාලය අයිස් යන්ත්‍රාගාරය
2. ගුරුනගර් අයිස් යන්ත්‍රාගාරය
3. හම්බන්තොට අයිස් යන්ත්‍රාගාරය

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

4. ගාල්ල අයිස් යන්ත්‍රාගාරය
5. අනුරාධපුරය අයිස් යන්ත්‍රාගාරය
6. මින්නේරිය අයිස් යන්ත්‍රාගාරය
7. පුත්තලම පාලවිය අයිස් යන්ත්‍රාගාරය
8. රත්නපුර විධායකයේ පිහිටි අයිස් යන්ත්‍රාගාරය
9. මඩකලපුව කල්අඩි පාලම අසල පිහිටි අයිස් යන්ත්‍රාගාරය

(iii) ඉහත සඳහන් යන්ත්‍රාගාරවලින් යන්ත්‍රාගාර 5ක් පමණක් ක්‍රියාකාරි තත්ත්වයේ පවතින නමුත් අනුරාධපුර විධායකයේ පවතින අයිස් යන්ත්‍රාගාරය පමණක් සෘජුව සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන නමුත්, 2016 සිට 2023 දක්වා කාල සීමාව තුළ යන්ත්‍රාගාර 4ක් බාහිර පාර්ශ්ව වෙත බදු පදනමින් ලබා දී ඇති අතර, යන්ත්‍රාගාර 4ක් යන්ත්‍ර සූත්‍ර නොමැතිව අක්‍රිය වී, මේ වන විට ගොඩනැඟිලි පමණක් ඉතිරි වී ඇත.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුර ඒක. මේ ප්‍රශ්නයටම අදාළ විස්තරාත්මක පිළිතුරක් තව තිබෙනවා.

| | යන්ත්‍රාගාරය | ක්‍රියාකාරිත්වය | බදු ගත් පාර්ශ්වය | බදු කාලසීමාව | මාසික බදු කුලිය |
|---|---|---|---|---|---|
| 01 | පේසාලය | ක්‍රියාකාරි | හැන්ඩ් සී ෆුඩ් පුද්ගලික සමාගම | වසර 10 (2021.12.14 - 2031.12.13) | රු.243,080.00 |
| 02 | ගුරුනගර් | ක්‍රියාකාරි | ලංකා නෝර්ත් ඊස්ට් අයිස් කම්පැනි | වසර 15 (2011.05.30 - 2026.05.31) | රු.150,000.00 |
| 03 | හම්බන්තොට | ක්‍රියාකාරි | නෙහාරා සී ෆුඩ් ආයතනය | වසර 05 (2020.06.22 - 2025.06.21) | රු.139,755.00 |
| 04 | ගාල්ල | ක්‍රියාකාරි | රිවර් සයිඩ් අයිස් කොම්පැනි පුද්ගලික සමාගම | වසර 10 (2023.04.28 - 2032.10.05) | රු.1,320,000.00 |
| 05 | අනුරාධපුරය | ක්‍රියාකාරි | ලංකා ධීවර සංස්ථා අනුරාධපුර විධායකය විසින් අයිස් නිෂ්පාදනය කරනු ලබයි | - | - |
| 06 | මින්නේරිය | අක්‍රිය | ගොඩනැඟිලි පමණක් ඇත | - | - |
| 07 | පුත්තලම පාලවිය | අක්‍රිය | ගොඩනැඟිලි පමණක් ඇත | - | - |
| 08 | රත්නපුරය | අක්‍රිය | ගොඩනැඟිලි පමණක් ඇත | - | - |
| 09 | මඩකලපුව | අක්‍රිය | ගොඩනැඟිලි පමණක් ඇත | | |

ගරු මන්ත්‍රීතුමනි, මින්නේරිය, පුත්තලම පාලවිය, රත්නපුරය සහ මඩකලපුව කියන ස්ථානවල ඉතිරි වෙලා තිබෙන්නේ ගොඩනැඟිලි විතරයි. ඒවායේ යන්ත්‍ර සූත්‍ර ඇත්තේ නැහැ. පසුගිය කාලයේ තුළ ඒවාත් විකුණාගෙන කාලා තිබෙන්නේ.

(iv) ඔව්.

(v) ඔව්. විස්තර පහත සඳහන් වේ.

- 2026 වර්ෂය සඳහා ආදායම් ලෙස රුපියල් මිලියන 6,400ක් (පසුගිය වසරේ රුපියල් මිලියන 5,508ක්) ඉලක්ක කොට ආයතනික ක්‍රියාකාරි සැලැස්ම සකස් කොට පූර්ණ කාලීන ක්‍රියාකාරි අධ්‍යක්ෂ මණ්ඩලයක් හරහා නව කළමනාකරණය යටතේ සාධනීය ප්‍රගතියක් ප්‍රථම කාර්තුවේදීම අත් කර ගැනීමට සමත් වී ඇත. එමෙන්ම, මෙම වසරේ ඉදිරි කාර්තුවල මෙහි ප්‍රගතිය වඩාත් ඉහළ මට්ටමකට පත් කිරීම සඳහා අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ කටයුතු සිදු කරමින් පවතී. ඒ අතර මෙම කටයුතු සාර්ථකව බාධාවකින් තොරව ඉටු කරගෙන යෑම සඳහා ජපන් ආධාර යටතේ නව ශීතකරණ ට්‍රක් රථ 6ක් ලංකා ධීවර සංස්ථාව වෙත ප්‍රදානයක් ලෙස හිමි වී ඇත. තවද, ධීවර සංස්ථා ප්‍රධාන කාර්යාලයේ පවතින අධි ශීතාගාර අලුත්වැඩියා කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මේ වන විට ආරම්භ කර ඇත.
- ලංකා ධීවර සංස්ථාව සතුව හිමිකම් ලේඛන නොමැති නමුත්, සංස්ථාවේ දේපළ කිහිපයක් පෞද්ගලික පාර්ශ්ව විසින් පරිහරණය කරන අතර, එම දේපළවලින් කිහිපයක් වත්මන් සභාපති/අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංස්ථාව වෙත පවරා ගැනීමට සමත් වී ඇත.

ගරු කථානායකතුමනි, ධීවර සංස්ථා අළෙවි සැල් බොහොමයක් තිබුණේ පෞද්ගලික පාර්ශ්ව යටතේ. ඔවුන් බදු නොගෙවා තමයි ඒ කටයුතු කළේ. මේ වෙනකොට ඒවා ඉවත් කරලා, නීතිමය කටයුතු කරලා අළෙවි සැල් ගණනාවක් නැවත සංස්ථාව යටතට පත් කර තිබෙනවා.

- එමෙන්ම, ධීවර සංස්ථාව සතු දේපළක් වන මන්නාරම පේසාලේ පිහිටි අක්කර 20ක් වූ ඉඩමෙන් අක්කර 12කට ආසන්න ප්‍රමාණයක් ශ්‍රී ලංකා යුද හමුදාවේ 543 බල සේනාංකය භුක්ති විඳිනු ලැබේ. තවද, හිමිකම් ලේඛන පවතින ආයතනය සතුව ඇති ඉඩකඩම් හා දේපළ ආයෝජනය කිරීම ආරම්භ කර, සාර්ථක ප්‍රගතියක් අත් කරගෙන ඇත.
- වසර ගණනාවක සිට සංස්ථාව වෙත අය කර ගැනීමට නොහැකිව පැවති සංස්ථා ණයගැති ශේෂය වන රුපියල් මිලියන 350ක මුදලින් රුපියල් මිලියන 66ක මුදලක් පළමු කාර්තුවේදීම අය කර ගැනීමට සමත් වූ අතර, ණය හිමි ශේෂය වන රුපියල් මිලියන 600ක මුදල අවම කිරීමේ ක්‍රියාවලියක නිරත වී ඇත. නව ගනුදෙනුකරුවන් සොයා ගොස් ඔවුන් සමඟ ගිවිසුම් ගත වී මිලදී ගැනීම් තුළින් අළෙවිය ඉහළ දැමීම හා නව ව්‍යාපාර අවස්ථා අත්හදා බලමින් අළෙවි ජාලය පුළුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
- මෙම වසරේ ඉලක්කගත සියලු කාර්යයන් සාර්ථක කර ගනිමින් පසුගිය වසරේ රුපියල් මිලියන 39ක් වූ ශුද්ධ ලාභය 2026 වසර තුළ රුපියල් මිලියන 190ක් දක්වා වර්ධනය කර ගැනීම සංස්ථාවේ කාර්යභාරය වී ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඔබතුමා කිව්වා වාගේම ධීවර සංස්ථාව කියන්නේ, අපේ රටේ ජනතාවගේ මත්ස්‍ය පරිභෝජනයට, ප්‍රෝටීන අවශ්‍යතාව සැපිරීමට මැදිහත්වීමක් කරන රජයේ ආයතනයක්. මේ රට කෘෂිකාර්මික රටක් වුණත්, ධීවර ක්ෂේත්‍රයට විශාල ඉඩක් තිබෙන දූපතක්. ඒ නිසා ධීවර සංස්ථාවට ලොකු කාර්යභාරයක් තිබෙනවා. එකක් තමයි, ධීවරයාගෙන් ලබා ගන්නා මත්ස්‍ය සම්පතට සාධාරණ මිලක් ලබා දීම. ඒක, ධීවර සංස්ථාවේ වගකීමක්. ඒ වාගේම ධීවරයන්ගෙන් ලබා ගන්නා මත්ස්‍ය සම්පත රට පුරා සිටින පාරිභෝගික ජනතාවට සාධාරණ මිලකට ලබා දෙන්න ඕනෑ. එහෙම නැත්නම් අතරමැදියන් මැදිහත්වෙලා ධීවරයා අල්ලන මත්ස්‍ය සම්පත වැඩි මිලකට විකුණනවා. ඒ අතරමැදියන් වෙළඳ සැල් - outlets - දමලා ඒවා නඩත්තු කරනවා වාගේම, අපනයන ක්ෂේත්‍රයේ මත්ස්‍ය සම්පත ප්‍රවර්ධනය කරනවා. නමුත් පසුගිය කාලය පුරාම මේ ක්ෂේත්‍රය කඩා බිඳ දමා තිබෙනවා. මම දැක තිබෙනවා, මේ පාර්ලිමේන්තුව තුළත් හිටපු ධීවර අමාත්‍යවරු, නියෝජ්‍ය අමාත්‍යවරු කෑ ගහලා කථා කරපු ආකාරය.

අපි 2024 සැප්තැම්බර් 24වැනි දා මේ ආණ්ඩුව ලබා ගන්නකොට මේ ආයතනය බිඳ වැටිලා, ණය වෙලා තිබුණේ, ඒ ණය දරාගන්න බැරි තරමට පත්වෙලා තිබුණේ. ඒ තරමටම මේ ආයතනය කඩා වට්ටවලා තිබුණේ. මේ මහා සම්පත කඩා බිඳ වට්ටපු පසුගිය ආණ්ඩුවල හිටපු අයට ගන්නා නීතිමය ක්‍රියාමාර්ගය කුමක්ද, ඔවුන්ට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය නැද්ද කියන එක මම ඔබතුමාගෙන් අහනවා. මේ තිබෙන සංඛ්‍යාලේඛන අනුව පෙනී යනවා, ඔබතුමන්ලා මේ ආයතනය ඉදිරියට ගෙනැල්ලා තිබෙනවා කියලා. නමුත් පසුගිය පාලන කාලය තුළ මේ ආයතනය බිඳ වැට්ටවීම, කඩා වැට්ටවීම, ඒ වාගේම සිදුකරපු ඒ වංචා, දූෂණ සම්බන්ධව දැඩි ක්‍රියාමාර්ග ගන්නවාද කියන එක තමයි මම අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු රත්න ගමගේ මහතා**
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)

ගරු මන්ත්‍රීතුමනි, අපි ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය වශයෙන් පසුගිය කාලසීමාව තුළ අපේ ආයතන තුළ සිදුවෙච්ච අක්‍රමිකතා සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග මේ වනවිට ගනිමින් ඉන්නවා. ඊයේත් ධීවර වරාය නීතිගත සංස්ථාවේ සභාපතිතුමා විසින් ත්‍රිකුණාමලය වරායේ කළමනාකරුවන් ඇතුළු වගකිව යුතු නිලධාරින් ස්ථාන මාරු කළා, මූල්‍ය අක්‍රමිකතාවක් හෙළිවීම නිසා.

ගරු අජිත් ගිහාන් මන්ත්‍රීතුමා යොමු කළ ප්‍රශ්නය ගත්තොත්, මා මීට පෙර සඳහන් කළ විධියට පසුගිය වසර දෙකක කාලය තුළ මේ ආයතනය තුළ දූෂණ, වංචා කරපු පුද්ගලයන්ට විරුද්ධව අපි නීතිමය කටයුතු ක්‍රියාත්මක කරනවා. ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ විධියට, ලංකා ධීවර සංස්ථාවට මේ තත්ත්වය උදා වුණේ දේශපාලන අතපෙවීම් නිසායි. සංස්ථාවේ සභාපති ධුරයට, top management එකට පත් කර ගත්තේ, "දේශපාලනය" පමණක් සුදුසුකමක් කර ගත්ත අය. දේශපාලනය කළත් කමක් නැහැ, අඩු ගණනේ expert කෙනෙක්, ක්ෂේත්‍රයට - field - එකට අදාළ ප්‍රවීණයෙක් පත් කර ගත්තා නම්, Board of Directors පත් කර ගත්තා නම් ගැටලුවක් නැහැ. ඒ සියලුදෙනා පත් කර ගත්තේ, තමන්ගේ දේශපාලන වුවමනාවට. දේශපාලන වුවමනාව පදනම් කර ගත්ත අය ඊළඟට ගියේත්, තමන්ගේ අභිලාෂය, පෞද්ගලික වුවමනාව වෙනුවෙන්. ඒ අයට මාළු ටික ගන්න outlet එක හදා ගත්තා, ගේ ළඟ. ඒකයි වුණේ. අපේ රජය බලයට පත් වුණාට පස්සේ අපි outlet එකක් පවා ස්ථාපිත කරන්නේ, feasibility study එකක් කරලා. ශක්‍යතා අධ්‍යයන වාර්තාවකින් තොරව අපි අළෙවිසැලක්වත් ස්ථාපිත කරන්නේ නැහැ. පසුගිය කාලයේ දමපු අළෙවිසැල් සාතිශය බහුතරයක් වැසී ගියා. දැන් අපට අලුතින් දමන්න සිද්ධ වෙලා තිබෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, කෝට්ටේ, රාජගිරියේ තැනක් තිබෙනවා, මාළු අළෙවිසැලක්. ඒක පෞද්ගලිකව භාවිත කළා. දැන් ඒක වසා දමලා තිබෙන්නේ. නමුත් අධිකරණමය ක්‍රියාමාර්ගයකට ගිහිල්ලා, නැවත අපේ සංස්ථාවට එය අත්පත් කර ගත්තා. කොළඹ නගරයේ මාළු අළෙවිසැල් විශාල ප්‍රමාණයක් නැවත අපි සංස්ථාවට අත්පත් කරගෙන නිවැරදිව ඒ කටයුත්ත කරගෙන යනවා. ඒ නිසා දැන් කළමනාකාරිත්වය නිවැරදියි. වැඩ පිළිවෙළක් තිබෙනවා. ඉලක්කසහගත වැඩ පිළිවෙළක් තිබෙනවා. අපේ රජයෙන් ලංකා ධීවර සංස්ථාව ගොඩනඟන්න උදව් කරනවා. අපි ආණ්ඩුව භාර ගත්තාට පසුව, පසුගිය වසරේ රුපියල් මිලියන 59ක ලාභයක් ලැබුවා. මේ වතාවේ අපේක්ෂිත ලාභය රුපියල් මිලියන 190ක් දක්වා ගෙන යන්න අපි කටයුතු කරනවා.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

2025 කෝප් කමිටු වාර්තාවේ පෙන්වා දීලා තිබෙනවා, මේ ආයතනයේ අතිරික්ත සේවක සංඛ්‍යාවක් ඉන්නවා කියලා. 200කට ආසන්න සේවක සංඛ්‍යාවක් ඉන්නවා කියලා පෙන්වා දීලා තිබෙනවා. ඒ වාගේම ඒ සේවකයන්ගේ EPF, ETF ලබා දීම සම්බන්ධ ගැටලුවක් තිබුණා. ඒවා ලබා දීලා නැහැ. ඇත්තටම ගෙවීම් විශාල ප්‍රමාණයක් කරන්න තිබුණා. ඔබතුමන්ලා ඒ ගෙවීම් කිරීම සඳහා කටයුතු කරලා තිබෙනවාද, යම් ප්‍රමාණයක් ගෙවලා තිබෙනවාද, ඒ ප්‍රමාණය කොපමණද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු රත්න ගමගේ මහතා**
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)

ගරු කථානායකතුමනි, 2026 රාජ්‍ය අය වැය ඉදිරිපත් කරන අවස්ථාවේ ගරු ජනාධිපතිතුමා රුපියල් මිලියන 5,000ක් වෙන් කළා, පසුගිය ආණ්ඩු කාලයේ පාඩු ලබපු ආයතන 7ක් සඳහා. පාඩු ලැබුවාය කියන්නේ, සේවකයන්ගේ EPF, ETF, gratuityවත් දීලා නැහැ. උදාහරණයක් වශයෙන් කිව්වොත්, ලංකා ධීවර සංස්ථාව. ලංකා ධීවර සංස්ථාවේ සේවක මණ්ඩලයේ EPF, ETF, gratuity සඳහා රුපියල් මිලියන 900ක් දීලා නැහැ.

ඒ වාගේම නෝර්ත් සී ආයතනයට රුපියල් මිලියන 100ක් දීලා නැහැ. සේවකයින් දුක් මහන්සියෙන් හම්බ කරලා මේ රටට ලබා දෙන ආදායමට සාධාරණයක් ඉෂ්ට නොකරපු පසුගිය රජයන් විසින් මේ කටයුත්ත පැහැර හැරියා. නමුත්, ජනාධිපතිතුමා විසින් සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ඇල්කඩුව වැවිලි සමාගම, ලංකා ධීවර සංස්ථාව, නෝර්ත් සී ආයතනය, ලංකා පිහන් සංස්ථාව යන මේ සියල්ලටම රුපියල් මිලියන 5,235ක් ගිය වතාවේ අය වැයෙන් වෙන් කරලා තිබුණා. පසුගිය රජයන් විසින් පැහැර හැරපු දේවල් අපේ රජය අය වැයෙන් ලබා දුන්නා. ගරු මන්ත්‍රීතුමනි, ලංකා ධීවර සංස්ථාවට මේ වන විට රුපියල් මිලියන 707ක් ලබා දී තිබෙනවා; කම්කරු ජනතාවට - වැඩ කරන ජනතාවට - මේ දීමනාව ලබා දීම සඳහා අපේ රජයෙන් රුපියල් මිලියන 707ක් සේවක අර්ථසාධක අරමුදලට, සේවක භාර අරමුදලට, පාරිතෝෂික මුදලට වෙන් කරලා තිබෙනවා. මම හිතන විධියට, ඒක මේ රටේ ජනතාවට හොඳ පණිවුඩයක්. ජාතික ජන බලවේගයේ රජයට කතිරය ගහපු මේ රටේ ජනතාවට ඒක

වාසියක්. තමන්ට ලැබෙන ප්‍රතිලාභයක්. ලංකා ධීවර සංස්ථාවේ සේවකයින්ට මේ වන විට EPF, ETF, gratuity සඳහා මුදල් ලබා දෙමින් පවතිනවා. ගරු මන්ත්‍රීතුමනි, පාඩු ලබපු මේ ආයතනයේ EPF, ETF, gratuity නොලබපු සේවකයින්ට මසක් යන විට ඒ සියල්ලම ගෙවා අවසන් කරන බව මම ප්‍රකාශ කරන්න කැමැතියි. ලංකා ධීවර සංස්ථාව වාගේම අපේ අමාත්‍යාංශය යටතේ නෝර්ත් සී ආයතනයත් තිබෙනවා. නෝර්ත් සී ආයතනයටත් රුපියල් මිලියන 82.9ක මුදලක් වෙන් කරලා තිබෙනවා. මේ මොහොත වන විට ඒ මුදල එහි සේවකයන්ටත් ගෙවමින් පවතිනවා. මේ, තමුන්නාන්සේලාගේ ආණ්ඩුවලින් පාඩු ලබපු ආයතන. වැඩ කරන ජනතාවට හිමි සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාර අරමුදල්, පාරිතෝෂික මුදල් - ඔවුන්ගේ මහන්සියෙන් හම්බ කළ දේවල් - තමුන්නාන්සේලාගේ රජය විසින් නොගෙවපු නිසා, අපේ රජයෙන් වන්දි ගෙවන්න සිද්ධ වුණා. අපි සතුටු වෙනවා, මේ රටේ ජනතාවට මෙම ප්‍රවෘත්තිය ඉතාම අස්වැසිල්ලක් වෙයි. ඒ අනුව ලංකා ධීවර සංස්ථාවේ සේවකයින් ඇතුළු - නෝර්ත් සී ආයතනය විතරක් නොවෙයි - මම මුලින් කියපු ආයතන හතේම සේවක පිරිසට තව මසක් යන විට, මේ මුදල් ලැබෙන විට හොඳ අස්වැසිල්ලක් ලැබෙයි කියලාත්, ජනාධිපතිතුමාගේ අය වැය යථාර්ථයක් බවට පත් වුණා කියලාත් මම මේ මොහොතේ ප්‍රකාශ කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 6 - 673/2025- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 91 (ඉ) යටතේ තිබෙනවා, මන්ත්‍රීවරුන්ට අයුතු ආරෝපිත චෝදනා නොකළ යුතුයි කියන එක. ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්න අසන අවස්ථාවේදී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් අධ්‍යාපනය සම්බන්ධව ඇහුවා. එතැනදී උත්තරය දුන්නා, නියෝජ්‍ය ඇමති. එතුමා, - *[බාධා කිරීමක්]* ඔව්,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීමක්] ඔව්,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ගරු නියෝජ්‍ය ඇමතිතුමා. *[බාධා කිරීම්]* හේවගේ, හේවගේ. *[බාධා කිරීම්]* - සමාවෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා එතැනත් කථා කරන්නේ අපහාසාත්මකව. *[බාධා කිරීම්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
සමාවෙන්න, සමාවෙන්න. *[බාධා කිරීම්]* ඒකයි, මම වැරදුණා කියලා කිව්වේ. ඇත්තටම මේ මන්ත්‍රීතුමා කියපු එක මම repeat කළා. ඒකට සමාවෙන්න. *[බාධා කිරීම්]*

මම වැරදියි. මම ඒක නොදැන කිව්වේ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාද, දයාසිරි මන්ත්‍රීතුමාද කිව්වේ? - *[බාධා කිරීම්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම නොදැන කිව්වේ. *[බාධා කිරීම්]*

සමාවෙන්න, සමාවෙන්න. මම ඒක ගැන සමාව ඉල්ලනවා නේ. සමාවෙන්න. මම ඇත්තටම නොදැන කිව්වේ. මම එහෙම කාටවත් අපහාස කරන මන්ත්‍රීවරයෙක් නොවෙයි. *[බාධා කිරීම්]* ප්‍රශ්නය ඇවිල්ලා, - *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක කියන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මගේ point of Order එක ස්ථාවර නියෝග 91 (ඉ) යටතේ ඉදිරිපත් කරනවා. එතුමා විපක්ෂ නායකතුමාටයි, විපක්ෂයටයි, අයුතු ආරෝපිත චෝදනාවක් කළා. විශේෂයෙන්ම එතුමා උත්තර දෙන අවස්ථාවේදී පළමුවැනි වසර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නවත්වන්න සිද්ධ වුණු එක ගැන අපට චෝදනා කළා. ගරු කථානායකතුමනි, 1 වසර ප්‍රතිසංස්කරණ සහ 6 වසර ප්‍රතිසංස්කරණ නතර කළේ පැහැදිලිවම ජනාධිපතිවරයා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතැන point of Order එකක් නැහැ, මන්ත්‍රීතුමා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඒක point of Order එකක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. *[බාධා කිරීම්]* අයුතු ආරෝපණ චෝදනා -*[බාධා කිරීම්]* චෝදනා කරන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමා. චෝදනාව - *[බාධා කිරීම්]* නම ප්‍රකාශ කිරීම.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අපි මතු කළේ වෙන කාරණයක් නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා තමයි අර නියෝජ්‍ය ඇමතිතුමාට,-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක මට වැරදිලා කියැවුණේ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම අහගෙන හිටියේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට වැරදීමක් ඒ වුණේ. මම ඔබතුමාට කියන්නේ මේ නම පාවිච්චි කරලා,- *[බාධා කිරීම්]* ඒ ප්‍රශ්නයට උත්තර දෙන එක වෙනම කාරණයක්. හැබැයි, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නැති වුණේ විපක්ෂය සහ විපක්ෂ නායකතුමා නිසාය කියන එක වැරැදියි. එහෙම අයුතු ආරෝපණයක් කරන්න බැහැ. ඒක සම්පූර්ණ වැරැදියි. ඒ කටයුත්ත කළේ ජනාධිපතිතුමා.

**ගරු නලින් හේවගේ මහතා**
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)

**නැඟී සිටියේය.**
எழுந்தார்.
rose.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු නලින් හේවගේ මහතා**
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)
ගරු කථානායකතුමනි, පළමුවෙන්ම, මන්ත්‍රීවරුන්ට අපහාස කරලා කථා කරන එක නතර කරන්න ඕනෑ. *[බාධා කිරීම්]* මේ පාර්ලිමේන්තුවේ ඔය කියන නමින් මන්ත්‍රීවරයෙක් නැහැ. ඒ නිසා ඒක වහාම ඉල්ලා අස්කර ගන්න ඕනෑ. එය වහාම හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න ඕනෑ. වහාම ඉල්ලා අස්කර ගන්න ඕනෑ. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වහාම ඉල්ලා අස්කර ගන්න. *[බාධා කිරීම්]*

**ගරු නලින් හේවගේ මහතා**
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)
එළියේ ගිහිල්ලා කරන දෙකයි පනහේ කථා පාර්ලිමේන්තුවේ කරන්න බැහැ. ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමා, ධර්ම චක්‍රය විකෘති කරනවා කියලා ඉතා පැහැදිලිව කිව්වා. අගමැතිතුමියට විරුද්ධව විශ්වාස භංග යෝජනාව ගේනවාය කිව්වා. *[බාධා කිරීම්]* එළියේ පොඩි දෙයක් ඇති වෙනකොට එහෙම තමයි ගිනි තියන්න හැදුවේ.

ඒක නිසා, - *[බාධා කිරීම්]* උත්තරය දුන්නේ ඉතා පැහැදිලිව. පැහැදිලි උත්තරයක් දුන්නේ. විපක්ෂ නායකවරයා මේ පාර්ලිමේන්තුවේදීම ඉතා පැහැදිලිව කිව්වා ධර්ම චක්‍රය විකෘති කරනවා කියලා. ඒක නැවත නැවතත් කිව්වා. ඒක නිසා තමයි ඒක ගියේ. ඒ නිසා උත්තර දීමේ අයිතිය ඔය මන්ත්‍රීතුමාට වෙනස් කරන්න බැහැ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා, 6 වන ප්‍රශ්නය අහන්න. *[බාධා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, එතුමා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

නම් කථා කරන්න දෙන්න.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

නොවෙයි නම් වාඩිවෙන්න කියන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ඕක අවසන් කරලා ඉන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විනයක් ඇතිව ඉඳගන්න, ගරු මන්ත්‍රීතුමන්ලා. *[බාධා කිරීම්]* ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, 6වන ප්‍රශ්නය අහන්න. *[බාධා කිරීම්]*

## පාකිස්තාන-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම: විස්තර

පாகிஸ்தான் - இலங்கை சுதந்திர வர்த்தக ஒப்பந்தம்: விபரம்

PAKISTAN-SRI LANKA FREE TRADE AGREEMENT: DETAILS

673/2025

**6. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு நலின் பண்டார ஜயமஹ சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of Hon. Nalin Bandara Jayamaha)
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාව සහ පාකිස්තානය අතර නිදහස් වෙළෙඳ ගිවිසුමක් අත්සන් කරන ලද දිනය කවරේද;

(ii) එම ගිවිසුම අත්සන් කිරීමේ අරමුණු කවරේද;

(iii) වර්ෂ 2020 සිට 2024 දක්වා එම ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් සිදු කරන ලද ආනයනවල හා අපනයනවල වටිනාකම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ගිවිසුම නැවත සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைக்கும் பாகிஸ்தானுக்கும் இடையில் சுதந்திர வர்த்தக ஒப்பந்தம் கைச்சாத்திடப்பட்ட திகதி யாது என்பதையும்;

(ii) அந்த ஒப்பந்தம் கைச்சாத்திடப்பட்டமைக்கான நோக்கங்கள் யாவை என்பதையும்;

(iii) 2020ஆம் ஆண்டு தொடக்கம் 2024ஆம் ஆண்டு வரை அந்த ஒப்பந்தத்தின்கீழ், இலங்கையால் மேற்கொள்ளப்பட்ட இறக்குமதிகள் மற்றும் ஏற்றுமதிகளின் பெறுமதி ஆண்டு வாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) அந்த ஒப்பந்தத்தை மீண்டும் மீளாய்வு செய்தல் தொடர்பில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House the -

(i) date on which the Free Trade Agreement between Sri Lanka and Pakistan was signed;

(ii) objectives of signing the said Agreement;

(iii) respective values of imports and exports made by Sri Lanka under the above Agreement in each year from 2020 to 2024, separately; and

(iv) measures that will be taken to review this Agreement?

(b) If not, why?

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)

(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) පාකිස්තාන-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම -Pakistan-Sri Lanka Free Trade Agreement - PSFTA- 2002 අගෝස්තු 01වන දින අත්සන් කරන ලද අතර එම ගිවිසුම 2005 ජූනි 12වන දින සිට ක්‍රියාත්මක/බලාත්මක විය. මෙම ගිවිසුම භාණ්ඩ සඳහා පමණක් සීමා වන අතර, ශ්‍රී ලංකාව විසින් ඇතුළත් වන ලද දෙවන ද්විපාර්ශ්වික නිදහස් වෙළෙඳ ගිවිසුමයි.

(ii) • භාණ්ඩ සහ සේවාවන්හි වෙළෙඳාම පුළුල් කිරීම මඟින් පාකිස්තානය සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික සබඳතාවල සමගාමී සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.

• පාකිස්තානය සහ ශ්‍රී ලංකාව අතර භාණ්ඩ හා සේවා වෙළෙඳාම සඳහා සාධාරණ තරගකාරී කොන්දේසි සැපයීම.

• භාණ්ඩ සහ සේවා වෙළෙඳාමට ඇති බාධක ඉවත් කිරීම මඟින්, දෙරට අතර මෙන්ම ලෝක වෙළෙඳාමේද සමගාමී සංවර්ධනය සහ ව්‍යාප්තියට දායක වීම.

(iii)

| වර්ෂය | පාකිස්තාන-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ අපනයන | පාකිස්තාන-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ ආනයන | ශ්‍රී ලංකාවේ පාකිස්තානය වෙත අපනයන | ශ්‍රී ලංකාවේ පාකිස්තානයෙන් ආනයන |
|---|---|---|---|---|
| 2020 | 52.96 | 10.81 | 74.27 | 324.26 |
| 2021 | 62.25 | 12.32 | 91.86 | 394.34 |
| 2022 | 55.26 | 12.06 | 77.84 | 342.32 |
| 2023 | 45.87 | 10.59 | 132.98 | 323.00 |
| 2024 | 46.22 | 24.15 | 76.25 | 456.66 |
| 2025 | 47.52 | 18.06 | 74.77 | 351.17 |

(iv) කැබිනට් මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ නිදහස් සහ වරණීය වෙළඳ ගිවිසුම් සමාලෝචනය කිරීම සහ අනාගත වෙළඳ සාකච්ඡා සහ වෙළෙඳ ගිවිසුම් සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ඉහළ මට්ටමේ කමිටුවක් මෑතකදී පත් කර ඇත. මෙම කමිටුවේ සභාපතිත්වය දරනු ලබන්නේ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසිනි. මෙම ගිවිසුම් පිළිබඳ සවිස්තරාත්මක සමාලෝචනයක් මේ වන විට සිදු වෙමින් පවතින අතර, අවසන් වාර්තාව 2026 ජූනි මාසයේදී කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම සමාලෝචනය අවසන්වීමෙන් පසුව, පාකිස්තාන-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම ඇතුළු ශ්‍රී ලංකාවේ සියලු වෙළෙඳ ගිවිසුම්වල අනාගත දිශානතිය තීරණය කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ප්‍රශ්න අංක 7 -886/2025- (1), ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க)

(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු අරවින්ද සෙනරත් මහතා**

(மாண்புமிகு அரவிந்த செனரத்)

(The Hon. Aravinda Senarath)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***

*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා, ගරු සභානායකතුමා. *[බාධා කිරීම්]*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, -

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමනි, මට මේ යෝජනාව ඉදිරිපත් කරන්න දෙනවාද? මේකට විනාඩියයි යන්නේ. ඊට පස්සේ ඔබතුමාගේ ප්‍රශ්නය කියන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා, යෝජනාව ඉදිරිපත් කරන්න.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point එක මොකක්ද?

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, මගේ point එක මේකයි. මම ඊයේ ඔබතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක් භාර දුන්නා. මට ඒ වරප්‍රසාද ප්‍රශ්නය අද ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න කියන ඉල්ලීමයි මම කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලේකම් මණ්ඩලය විසින් ඊට පිළිතුරක් ලබා දුන්නා නේද? *[බාධා කිරීම්]*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
නැහැ, නැහැ. මගේ වරප්‍රසාද ප්‍රශ්නයට අවස්ථාව දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කරුණාකරලා ඔබතුමාගේ අසුනට යන්න. *[බාධා කිරීම්]* ඔබතුමාගේ අසුනට යන්න. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order. ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 29 යටතේ මේක අහන්නේ. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එක එක ස්ථාවර නියෝග අංක කිය කියා අවස්ථාව ඉල්ලනවා. ස්ථාවර නියෝග 29හි තිබෙන්නේ some collective,- *[බාධා කිරීම්]* ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න තිබෙනවා නම් ඒක ඉදිරිපත් කරන්න දෙන එක ගරු කථානායකතුමාගේ වගකීම. නමුත් ස්ථාවර නියෝගවලට පිටින් මේ පාර්ලිමේන්තුව කරගෙන යන්න දෙන්න එපා. මම කියන්නේ එච්චරයි. *[බාධා කිරීම්]*

මෙතැනදී විපක්ෂයේ සංවිධායකවරුන්ටත් වගකීමක් තිබෙනවා. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ අදහස කියන්නකෝ, ඔය වරප්‍රසාද ප්‍රශ්නය සම්බන්ධව. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point එක කියන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, මම ඊයේ දවල් ඇවිල්ලා ඔබතුමාට ලිපියක් දුන්නා. ඔබතුමා මාව එළවා ගත්තා, ඔබතුමාට බාධා කළා කියලා. ඒකට කමක් නැහැ. ඔබතුමාගේ ප්‍රශ්න, ඇතුළේ කාමරයේ - *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා මගේ කාමරයට ආවේ කිසිම අවසරයකින් තොරව. *[බාධා කිරීම්]*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, මම ඊයේ සභානායකතුමාටත්, අධිකරණ ඇමතිතුමාටත්, මහ ලේකම්තුමියටත් කිව්වා, මේකෙදි වරප්‍රසාද කඩවෙලා තිබෙනවා කියලා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ ප්‍රශ්නය කියන්නකෝ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස වරප්‍රසාද උල්ලංඝනය වීම සම්බන්ධවයි.

බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාවගේ ඡන්දයෙන් තේරී පත් වී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දසවන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කරන මා, මහජන චීන සමූහාණ්ඩුවේ වාණිජ අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් සඳහා පවත්වන වැඩමුළුවක් සඳහා තෝරා පත් කරගෙන ඇත. ඒ සඳහා 2026.05.25 සිට 2026.06.05 දක්වා විදේශගතවීමට අවශ්‍යව ඇත. නමුත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම මඟින් මහෙස්ත්‍රාත් අධිකරණයේ පවරා ඇති 42359, 42360 සහ 42361 දරන නඩු හේතුවෙන් මාගේ විදේශ ගමන් බලපත්‍රය අලුත්කඩේ අංක 01 මහෙස්ත්‍රාත් අධිකරණයේ රඳවාගෙන තිබේ. ඒ නිසා නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස මහතා මෝසමක් මඟින් පාර්ලිමේන්තු මහ ලේකම්තුමියගේ ලිපිය හා චීන ජනරජයේ ආරාධනා පත්‍රය සමඟ ගරු අධිකරණයට ඉදිරිපත් කරන ලදී. එහිදී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරින් විසින් දිගින් දිගටම විරුද්ධවීම හේතුවෙන් ගරු කථානායකතුමනි නැවත රුපියල් ලක්ෂ 10ක ශරීර ඇපයක් සමඟ ගමන් බලපත්‍රය - *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 91(ඊ) යටතේ තිබෙනවා, කිසිම මන්ත්‍රීවරයකු විසින් යම් යෝජනාවක දී හෝ විවාදයක දී අධිකරණයේ විනිශ්චයට භාජන වෙමින් පවතින හෝ අධිකරණයේ තීන්දුව දීමට නියමිතව තිබෙන කාරණයක් පිළිබඳව සඳහන් කරන්න බැහැ කියලා. ඔබතුමා විසින් ලිපියේ සඳහන් කර තිබෙනවා, "අධිකරණය විසින් දන්වා තිබෙනවා" කියලා. එම නිසා මෙය ගරු අධිකරණය විසින් දන්වා තිබෙන කාරණයකට සම්බන්ධ දෙයක් බැවින් සහ මේ සම්බන්ධව අධිකරණය තීන්දුවක් ලබා දී තිබෙන බැවින් මේ පිළිබඳව නැවත පාර්ලිමේන්තුවේ කථා කිරීමට අයිතියක් නැහැ.

[බාධා කිරීම්] සභාව කල් තැබීම, ගරු සභානායකතුමා. [බාධා කිරීම්]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු සභානායකතුමනි, මේ ලිපියේ තව පොඩ්ඩයි තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා. *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීතුමා, උසාවිය විසින් නියෝගයක් ලබා දී තිබෙනවා. එම නියෝගයට අනුව ඔබතුමා කටයුතු කළ යුතු බැවින් - *[බාධා කිරීම්]*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව - *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාම සඳහන් කර තිබෙනවා, උසාවිය විසින් - *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමා, මෙහෙමයි- *[බාධා කිරීම්]*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු සභානායකතුමනි, අපි ඔක්කෝම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඉතින්, ඔබතුමා කියන්න දෙන්නේ නැහැ නේ. *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමාට ගරු කථානායකතුමා - *[බාධා කිරීම්]*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මේ, මහ ලේකම්තුමියගේ ලියුම පිළිගන්නේ නැත්නම් - *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ, මෙහෙමයි. මම පැහැදිලිව කියන්නම්. ඔබතුමා මේ ප්‍රශ්නය ගැන ඊයේ අපිත් එක්ක කථා කළා. මේක වරප්‍රසාද ප්‍රශ්නයක් නොවන බව අපි පැහැදිලිවම දන්නවා. ඒ වාගේම අධිකරණයෙන් දීලා තිබෙන නියෝගයක්. නමුත්, මන්ත්‍රීවරයෙක් වශයෙන් ඔබතුමා යම්කිසි වේදනාවකට පත් වෙලා තිබෙන බව අපට තේරුණු නිසා තමයි මමත් පෞද්ගලිකව හිතුවේ වරප්‍රසාද ප්‍රශ්නයක් නොවුණත්, විශේෂ තත්ත්වයක් යටතේ මෙය කියවන්න දිය යුතුයි කියලා. ඔබතුමාට ඒ සඳහා ගරු කථානායකතුමා අවස්ථාව දුන්නා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
සම්පූර්ණයෙන් කියෙව්වේ නැහැ නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
සම්පූර්ණයෙන් කියවන්න ඕනෑ නැහැ. *[බාධා කිරීම්]* ඔබතුමාගේ කාරණය රීති විරෝධියි. *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කියන එක රීති විරෝධියි. *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීතුමනි, මම කරුණාවෙන් කියනවා, ඔබතුමාගේ දුක්ගැනවිල්ල දේශපාලන වශයෙන් මේ අනාථ වෙච්ච අයට ගසා කන්න දෙන්න එපා කියලා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ජනවාරි 09වන දා මා විසින් Ruling එකක් ලබා දීලා තිබෙනවා. කරුණාකර එය කියවන්න. අධිකරණ කටයුතු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ මැදිහත්වීමක් නැහැ; එහෙම කරන්න බැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ගරු කථානායකතුමා අවස්ථාව දුන්නා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
දුන්නා. නමුත්, සම්පූර්ණයෙන් - *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමාට එහෙම බලයක් නැහැ. ඔබතුමා නඩුවක විත්තිකරුවෙක්.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඒක වෙනම කාරණයක්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔව්, ඒක වෙනම කාරණයක්. *[බාධා කිරීම්]*ගරු මන්ත්‍රීතුමා, ඇහුම්කන් දෙන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
එහෙම නම් මොකටද මහ ලේකම්තුමියගේ ලියුම යැව්වේ?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මහ ලේකම්ගේ නොවෙයි, ඊට වඩා ලොකුයි අධිකරණය. මහ ලේකම්ගේ ලියුම නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අධිකරණය ලොකුයි. අධිකරණය තීන්දුවක් ලබා දීලා තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමා, අධිකරණයෙන් දුන් නියෝගයක් තිබෙනවා. ඔබතුමාම එම අධිකරණ නියෝගය ගැන මෙතැන කථා කරනවා. ඒක වැරදියි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
අධිකරණයේ වැරැද්දක් නොවෙයි. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමා, මහ ලේකම්ම තමයි ඔබතුමාට දුන්නේ ඕක වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි කියලා. *[ඝෝෂා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ මේ රීති විරෝධී අපහාසාත්මක හැසිරීම කරුණාකර,-*[ඝෝෂා කිරීම්]* ගරු සභානායකතුමා.

***[මෙම අවස්ථාවේදී ගරු චාමර සම්පත් දසනායක මහතා සභා ගර්භය මැදට පැමිණ ඝෝෂා කරන්නට වූයේය.]***

*[இச்சந்தர்ப்பத்தில் மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க அவர்கள் சபாமண்டபத்தின் மத்திக்கு வந்து கோஷமெழுப்பினார்.]*

*[At this stage, the Hon. Chamara Sampath Dasanayake walked into the Well of the House and made an uproar.]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි,- *[ඝෝෂා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමා, ඔබතුමාව මම සභා ගර්භයෙන් අයින් කරනවා.

වේත්‍රධාරීතුමනි, සභාවේ ඉදිරි වැඩ කටයුතු සඳහා වහාම,- *[ඝෝෂා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේක මහ විහිළුවක්. *[සෝෂා කිරීම්]* විත්තිකාරයා කථා කරනවා, නඩුව ගැන. *[සෝෂා කිරීම්]* දැන් මෙතැන මන්ත්‍රීවරු මේක වීඩියෝ කරනවා. මොන තුට්ටු දෙකේ වැඩ ද මේ කරන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මහ ලේකම්තුමියනි, සභාවේ ඉදිරි වැඩ කටයුතු සඳහා වහාම ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා සභා ගර්භයෙන් ඉවත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
"දොස්තර" කියලා මන්ත්‍රී කෙනෙක් ඉන්නවා;

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

දැන් වීඩියෝ කරනවා ඒක. ලජ්ජයි! මේවා වීඩියෝ කරන එක නොවෙයි නේ කරන්න තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මහ ලේකම්තුමියනි, සභාවේ ඉදිරි වැඩ කටයුතු කරගෙන යෑම සඳහා වහාම ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා පාර්ලිමේන්තු භූමියෙන් එළියට යවන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමා, ඔබතුමා මේ අවස්ථාව ගසාකන්න එපා. ඔබතුමාගේ දුක්ගැනවිල්ලට ගරු කථානායකතුමා අවසර දුන්නා, රීති විරෝධීව පවා තිබියදී. ඔබතුමා හිතනවාද, මෙතැන තර්ජනයෙන් කටයුතු කරන්න?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුව නාඩගමක් කර ගන්න එපා, ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මෙහෙම තර්ජනයෙන් කටයුතු කරන්න බැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ලණු කන්න එපා. [සෝෂා කිරීම්] ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමා, චාමර මන්ත්‍රීතුමා, චාමර මන්ත්‍රීතුමා, - [සෝෂා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමා, ඔබතුමා රීති විරෝධීවයි මෙතැන හැසිරෙන්නේ. *[සෝෂා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා බොරු චෝදනා කරන්න එපා, ගරු කථානායකතුමාට. *[සෝෂා කිරීම්]* ඒකට ගරු කථානායකතුමා අවසර දුන්නා නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකර මතක තබාගන්න, අධිකරණය හෑල්ලුවට ලක් කිරීමට ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමාට කිසිම අයිතියක් නැහැ. *[සෝෂා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒක අධිකරණයෙන් බේරාගන්න. *[සෝෂා කිරීම්]* අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම කියන්නේ වෙනම ආයතනයක්. අපි නොවෙයි එහි කටයුතු කරන්නේ. *[සෝෂා කිරීම්]* නැහැ, නැහැ. එහෙම එකක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අධිකරණය විසින් තීන්දුව ලබා දීලා තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමා. අධිකරණයට ගරු කිරීමට ලෑස්ති වෙන්න. *[සෝෂා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
චාමර මන්ත්‍රීතුමා, - *[සෝෂා කිරීම්]* ගිහිල්ලා වාඩිවෙන්න.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තමයි අවුස්සන්නේ, ඒ අහිංසක මිනිහා. *[සෝෂා කිරීම්]*

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තමයි අවුස්සන්නේ. *[සෝෂා කිරීම්]* මේගොල්ලන් තමයි අවුස්සන්නේ. *[සෝෂා කිරීම්]* ගරු කථානායකතුමනි, මම සභාව, - *[සෝෂා කිරීම්]* මේක සම්පූර්ණයෙන්ම වැරදියි. *[සෝෂා කිරීම්]* ගරු කථානායකතුමනි, දැන් ඔප්පු වෙනවා, - *[සෝෂා කිරීම්]* දැන් මේ ඇවිල්ලා උසිගන්වනවා. විත්තිකාරයා උසාවියට විරුද්ධව පාර්ලිමේන්තුවේ කථා කරනවා. *[සෝෂා කිරීම්]* විත්තිකාරයා කථා කරනවා, මේ විපක්ෂ නායකලාගේ ආශීර්වාදයෙන්. *[සෝෂා කිරීම්]* විපක්ෂයෙන් කියන්නේ මේ මන්ත්‍රීතුමාට, රීති විරෝධීව කටයුතු කරන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අධිකරණය විසින් දෙන තීන්දුවකට විරුද්ධව පාර්ලිමේන්තුවේ කථා කිරීමට අයිතියක් නැහැ. චාමර සම්පත් මන්ත්‍රීතුමා, ඔබතුමා කරුණාකර මේ සභාවෙන්, - *[සෝෂා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

චාමර සම්පත් මන්ත්‍රීතුමා, සහමුලින්ම ඔබතුමා ඔය කරන්නේ වැරැද්දක්. ඔබතුමාට බලයක් නැහැ, අධිකරණය සම්බන්ධව කථා කරන්න. *[ඝෝෂා කිරීම්]* චාමර සම්පත් මන්ත්‍රීතුමනි, ඔබතුමා දැනගන්න, ඔබතුමා සම්පූර්ණයෙන්ම රීති විරෝධීයි කියන එක. ඔබතුමා රීති විරෝධීයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මේකේ කිසිම වරප්‍රසාද කඩ වීමක් නැහැ. *[ඝෝෂා කිරීම්]* චාමර සම්පත් මන්ත්‍රීතුමනි, වූදිතයෙක් විධියට ඉන්න ඔබතුමාට බැහැ, පාර්ලිමේන්තු වරප්‍රසාද පාවිච්චි කරලා අධිකරණය හෑල්ලු කරන්නයි, උසාවියේ දීලා තිබෙන තීන්දුව හෑල්ලුවට ලක් කරන්නයි, විවේචනයට ලක් කරන්නයි, පාර්ලිමේන්තුව අභ්‍යන්තරයේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

චාමර සම්පත් මන්ත්‍රීතුමනි, ඔබතුමා රීති විරෝධීයි. එහෙම තිබියදී තමයි ගරු කථානායකතුමා අනුකම්පා කරලා ඔබතුමාට අවස්ථාව දුන්නේ. එතුමා කිව්ව නිසා තමයි මමත් බලාගෙන හිටියේ. ඔබතුමා ඕක ගසා කන්න හදන්න එපා. ඕක මේ දේශපාලන,- *[ඝෝෂා කිරීම්]*

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

Sir, I rise to a point of Order. [Interruption]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි,- *[ඝෝෂා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව කල් තැබීම, ගරු සභානායකතුමා. *[ඝෝෂා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මෙතැන අධිකරණයට විරුද්ධව එතුමාට කථා කරන්න බැහැ. *[ඝෝෂා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකරලා වාඩි වෙන්න. *[ඝෝෂා කිරීම්]* කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඒ වාගේම අපි කනගාටු වෙනවා, එතුමා ඔබතුමා සම්බන්ධව කරපු ප්‍රකාශ ගැන. *[ඝෝෂා කිරීම්]*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු සුනිල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. You have ten minutes. - *[Uproar.]*

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)

ගරු කථානායකතුමනි,-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 91(ඊ)හි බොහොම පැහැදිලිව තිබෙනවා, "...අධිකරණයේ තීන්දුව දීමට නියමිතව තිබෙන යම් කාරණයක් පිළිබඳව..." කියලා. මේක එතුමාට අධිකරණයෙන් තීන්දුවක් දෙන්න තිබෙන කාරණයක් නොවෙයි. එතුමා කථා කරන්නේ,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට,-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ඔබතුමා මට කියන්න, අධිකරණ තීන්දුවක් දෙන්නේ කුමක් සම්බන්ධයෙන්ද කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයේ අන්තිම ටික මම කියවන්නම්. "නැවත ලක්ෂ 10ක ශරීර ඇපයක් සහ ගමන් බලපත්‍රයක් ඇපයට ඉදිරිපත් කළ යුතු බව ගරු අධිකරණය විසින් දන්වන ලදී." *[ඝෝෂා කිරීම්]* අධිකරණයෙන් තීන්දුව දීලා තිබෙනවා. *[ඝෝෂා කිරීම්]*මේ නාඩගම නටන්න එපා. කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කියන්න දෙයක් නැහැ. ඔබතුමා ඒක කියෙව්වා. *[ඝෝෂා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ, එතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය. [ඝෝෂා කිරීම්] එතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය. [ඝෝෂා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමන්ලාට තේරෙන්නේ නැහැ. [ඝෝෂා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට සිංහල තේරෙන්නෙත් නැහැ. [ඝෝෂා කිරීම්]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා ඒක කියෙව්වා නේ, දැන්. [ඝෝෂා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට සිංහල තේරෙන්නේ නැහැ. [ඝෝෂා කිරීම්]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, මට තේරෙනවා. දැන් ඔබතුමා ඒක කිව්වා නේ. *[ඝෝෂා කිරීම්]* ඔබතුමා ඒක කියෙව්වා නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, දැන් මෙතැන වෙලා තිබෙන්නේ මේකයි. චාමර සම්පත් මන්ත්‍රීතුමාට වේදනාවක් තිබෙනවා. *[ඝෝෂා කිරීම්]* මෙගොල්ලන්ට ඕනෑකම තිබෙනවා, ඒ අවස්ථාව ගසා කන්න. *[ඝෝෂා කිරීම්]* එම නිසා රීති විරෝධී වැඩවලට ඔබතුමා ඉඩ දෙන්න එපා. *[ඝෝෂා කිරීම්]* මොකද, ඔබතුමාට කොහෙත්ම බලයක් නැහැ, රීති විරෝධී වැඩවලට ඉඩ දෙන්න. *[ඝෝෂා කිරීම්]* දැන් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන්න ඉඩ දෙන්න. *[ඝෝෂා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Sunil Rajapaksha. You have ten minutes - *[Uproar.]* මන්ත්‍රීතුමන්ලා කරුණාකරලා වාඩි වෙන්න. මේක නාඩගම් මඩුවක් නොවෙයි; කෝලම් මඩුවක් නොවෙයි. ඔබතුමන්ලා මේක කෝලම් මඩුවක් කරනවා. *[ඝෝෂා කිරීම්]* කරුණාකරලා මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න. *[ඝෝෂා කිරීම්]*

## 2025 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ආර්ථික සමාලෝචන වාර්තාව
### 2025ஆம் ஆண்டுக்கான இலங்கை மத்திய வங்கியின் வருடாந்த பொருளாதார மீளாய்வு அறிக்கை
### ANNUAL ECONOMIC REVIEW, REPORT OF THE CENTRAL BANK OF SRI LANKA FOR THE YEAR 2025

[පූ.භා. 11.00]

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "2022 වසරේ ඇති වූ ඉතිහාසයේ විශාලතම ආර්ථික පසුබෑමත් සමඟ මෙරට ආර්ථිකය දැඩි අවදානමකට ලක් විය. කෙසේ නමුත් 2025 වසර අවසානය වනවිට අවදානම සම්පූර්ණයෙන් පහව නොගියත්, ආර්ථිකය නිවැරදි මාවතේ ශක්තිමත්ව ඉදිරියට ගමන් කරන බවට හඳුනා ගත හැකි ප්‍රධාන සාධක ගණනාවක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද වාර්ෂික ආර්ථික විවරණය 2025 තුළින් විද්‍යමාන වේ. රජයේ නිවැරදි ආර්ථික ප්‍රතිපත්ති හමුවේ 2025 වසර පුරාවට උද්ධමනය ඉතා අඩු අගයක පාලනයකින් යුතුව පවත්වා ගැනීමට හැකි විය. එසේම ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඩොලර් බිලියන 100 ඉක්මවා ගොස් තිබේ. තවද ඒක පුද්ගල ආදායම ඩොලර් 5000 ඉක්මවා තිබේ. එසේම විදේශ ප්‍රේෂණ ලැබීමද ඉතිහාසයේ ඉහළම අගය වාර්තා කොට තිබේ. ජංගම ගිණුමේ ශේෂයද පෙර වසරවලට වඩා ඉහළ අතිරික්තයක් වාර්තා කර තිබේ. එසේම බැංකු හා මූල්‍ය පද්ධතිය ශක්තිමත් ලෙස වර්ධනය වෙමින් පවතින බව නිරීක්ෂණය වන අතර බැංකුවල අක්‍රිය ණය ප්‍රමාණය අඛණ්ඩව අඩු වෙමින් පවතින බව පැහැදිලි වේ. මේ ආකාරයෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාවලිය යම් ස්ථාවර මට්ටමකට පත් වෙමින්, වර්ධන මාවතට පිවිස ඇති පසුබිමක තවමත් බාහිර අවදානම්වලට නිරාවරණය වී ඇති බව නිරීක්ෂණය වේ.
>
> ඒ හේතුවෙන් ගෝලීය ආර්ථික අවදානම අවම කර ගනිමින් ආර්ථිකයේ ව්‍යුහාත්මක සංශෝධන තවදුරටත් සිදු කළ යුතුව ඇත. ඒ සඳහා මේ ගරු සභාවේ සියලු දෙනාගේ සහාය ලබා දිය යුතු යැයි මම යෝජනා කරමි." *[ඝෝෂා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමා, මම ඔබතුමාට කිව්වේ මේ අධිකරණ නියෝගය,- *[ඝෝෂා කිරීම්]* මම කිව්වා, ගරු සභාවට බාධා කරන චාමර සම්පත් මන්ත්‍රීතුමාව සභාවෙන් එළියට අරගෙන යන්න කියලා. ඒ නියෝගය ක්‍රියාත්මක කරන්න. *[ඝෝෂා කිරීම්]* ඔබතුමා වාඩි වෙන්නේ නැතිව ආපහු,- *[ඝෝෂා කිරීම්]* ඒ නියෝගය ක්‍රියාත්මක කරන්න. *[ඝෝෂා කිරීම්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
ගරු කථානායකතුමනි, දශක ගණනාවක් තිස්සේ නිසි සැලසුමක්, නිසි ප්‍රතිපත්තියක් නැතුව ක්‍රියාත්මක කරන ලද වැරදි ආර්ථික උපාය මාර්ග ඔස්සේ හිඳ පටවා තිබුණු,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, the Hon. Chamara Sampath is representing the NDF. - *[Interruption.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, I have given the Ruling now.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, I am on a point of Order.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අවස්ථාව දුන්නා නම් ඉවරයි නේ.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, චාමර සම්පත් මන්ත්‍රීතුමාට තත්පර 30ක් ලබා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුනිල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, you may continue. - *[බාධා කිරීම්]* ඒ සම්බන්ධව තීන්දුව දීලා ඉවරයි. කරුණාකරලා වහාම ඒ අනුව ක්‍රියාත්මක වෙන්න. *[බාධා කිරීම්]* ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා වාඩි වෙන්න. *[බාධා කිරීම්]*

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
අපි 2024 වර්ෂයේ මේ රට භාර ගන්නේ දශක ගණනාවක් තිස්සේ වැරදි ආර්ථික උපාය මාර්ග, වැරදි ආර්ථික ප්‍රතිපත්ති ඔස්සේ වැරදි ගමනක ගිහින් කඩා බිඳ වැටුන ලද ආර්ථිකයක් සමඟ, රටක් සමඟ සහ සමාජයක් සමඟ. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එතුමාගේ නඩුවක් ගැන තමයි චාමර සම්පත් මන්ත්‍රීතුමා කථා කරන්නේ.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
ගරු කථානායකතුමනි, 2024 වර්ෂයේ පළමුවැනි අය වැය මේ රටට ඉදිරිපත් කරලා, නිවැරදි ආර්ථික ප්‍රතිපත්ති සහ උපාය මාර්ග මනා කළමනාකාරිත්වයකින් යුතුව හසුරුවමින්, වසරක ආර්ථික ප්‍රගතිය අත්පත් කර ගැනීම සම්බන්ධව කථා කිරීමේ අවශ්‍යතාව මේ අවස්ථාවේදී මම මේ සභාවේ අවධාරණය කරනවා. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, මේ සභාව ඉදිරියේ මේ ඝෝෂාව කරමින් බාධා කරන වැඩි දෙනෙක් දන්නවා, ඉතාම කෙටි කාලයක් තුළ නිවැරදි මාර්ගයේ ගමන් කරමින්, නිවැරදි ආර්ථික කළමනාකාරිත්වය සිදු කරමින්, ආර්ථිකය ස්ථායීකරණය කරමින්, මේ රට නිවැරදි දිසාවට ගමන් කරන බව. *[බාධා කිරීම්]* ඒ බව 2025 වෙනුවෙන් මහ බැංකුව ප්‍රකාශයට පත් කරපු මේ වාර්තාවෙන් තවදුරටත් තහවුරු කර තිබෙනවා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකරලා ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ජාතික ලැයිස්තුවෙන් ආවේ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න. *[බාධා කිරීම්]*

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
විවිධ මාධ්‍ය පාවිච්චි කරමින්, ඇතැම් වෙලාවට අපේ ආංශික අධීක්ෂණ කාරක සභාවලට වාගේම උපදේශක කාරක සභාවලටත් ඇවිල්ලා, අපේ රජයට වියුෂන් දෙන්න, උපදෙස් දෙන්න එන අයට මම මේ අවස්ථාවේදී පොඩ්ඩක් අවධාරණය කරන්න ඕනෑ, ඔබ අමතක කරපු, ඔබ මතකයෙන් ඈත් කරපු 2022 වර්ෂය කියලා වර්ෂයක්ද තිබෙන බව. *[බාධා කිරීම්]* 2025 වර්ෂයේ අපේ ආර්ථික කටයුතු ගැන කථා කරන්න කලින් මම අන්න ඒ වර්ෂය පිළිබඳව පොඩ්ඩක් මතක් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, අපට උපදෙස් දෙන්න එන මේ ඉතාම පළපුරුදු කණ්ඩායම මැනවින් ඒ කටයුතු කරලා, 2022 අවුරුද්ද තුළ ආර්ථිකය සෘණ 8.7කින් හකුළුවා තැබූ බව අපි දන්නවා. *[බාධා කිරීම්]*

ඒ විතරක් නොවෙයි, අපේ ජාතික ආදායම 2021 වර්ෂයට සාපේක්ෂව සියයට 15.97කින් ආපස්සට ගෙන ගියා. ඊළඟට, සියයට 7.1 අගයේ තිබුණු වාර්ෂික උද්ධමනය සියයට 49.72ට ගෙන ගියා. ඒ වාගේම තමයි, ලාංකීය ඉතිහාසයේ පැවැති අඩුම විදේශ සංචිත ප්‍රමාණය වුණු ඩොලර් මිලියන 1.752ට එනකම් මේ කට්ටිය ආර්ථිකය වට්ටලා තිබුණා. ඒ වාගේම මම පොඩ්ඩක් මතක් කරන්න ඕනෑ, මේ අය - *[බාධා කිරීම්]* අපේ දළ ජාතික නිෂ්පාදිතයට සාපේක්ෂව රටේ ණය අනුපාතය සියයට 113.8ක් දක්වා වැඩි වී තිබුණා. ඒ විතරක් නොවෙයි, 2021 වර්ෂයට සාපේක්ෂව බැලුවාම ඩොලර් 3,997ක් වුණු ඒක පුද්ගල ආදායම ඩොලර් 3,354 දක්වා අඩු වෙලා තිබුණා. අන්න එවැනි ආර්ථික අත්දැකීම් ටිකකුත් එක්ක තමයි මේ ඔස්තාර්ලාට මේ රජය දමා යන්න සිද්ධ වුණේ. අන්න ඒ නිසා තමයි නිවැරදි මාවතට රට ගෙනියන්න කියලා අපිට, ජනතාවාදී රජයකට මේ රටේ ජනතාව 2024දී රට භාර දුන්නේ. *[බාධා කිරීම්]* අපි දැන් ඔප්පු කරමින් ඉන්නවා ආර්ථික දර්ශක අනුව අපි භාර ගත් රට නිවැරදිව, නිසියාකාරව, නිසි මාර්ගයේ ගෙන යන බව. මහ බැංකුව විසින් නිකුත් කරපු මේ වාර්තාව සනාථ කරනවා, 2025 වර්ෂයේ සිට අපේ රටේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය තවම අපි අඛණ්ඩව සියයට පහක මට්ටමක පවත්වා ගෙන යනවා කියලා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
ඒ, අර වෙනදා වාගේ සේවා අංශය විතරක්, නැත්නම් ආර්ථිකයේ එක අංශයක් විතරක් වර්ධනය කරලා නොවෙයි. අපි ආර්ථිකයේ හැම ක්ෂේත්‍රයකටම එම වර්ධනය බෙදා හැර තිබෙනවා. පසුගිය වර්ෂය තුළ ලංකාවේ කෘෂි අංශය සියයට 1.4කින් වර්ධනය වෙනකොට අපිට දැඩි බලාපොරොත්තුවක් තිබුණා, මේ රට නිෂ්පාදන ආර්ථිකයකට අරගෙන යන්න ඕනෑය කියලා. *[බාධා කිරීම්]* අන්න ඒ ප්‍රතිපත්තිය හොඳින්, මැනවින් පෙනෙනවා ආර්ථික දර්ශකවලින්. පසුගිය - 2025 - වර්ෂයේ අපේ රටේ කර්මාන්ත ක්ෂේත්‍රය සියයට 7.8කින් වර්ධනය වුණා. ඒ වාගේම සේවා අංශයත් සියයට 3.3කින් වර්ධනය වුණා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
ඒ නිසා අපි ආර්ථිකයේ සියලු අංශ පසුගිය වර්ෂය තුළ බොහොම නිවැරදිව ස්ථාවර කරමින්, කළමනාකරණය කරමින් ආර්ථිකය ස්ථාවර කරන්න කටයුතු කර තිබෙන බව මා මතක් කරනවා. *[බාධා කිරීම්]* ඒ වාගේම තමයි නාමික දළ දේශීය නිෂ්පාදිතය ඩොලර් මිලියන 99.6 ඉඳලා 2025 වර්ෂය වෙනකොට ඩොලර් බිලියන 1.8කට ඔසවා තබන්න අප කටයුතු කළා. එය රුපියල්වලින් ගත්තොත්, රුපියල් ට්‍රිලියන 30.0 ඉඳලා රුපියල් ට්‍රිලියන 32.8 දක්වා අපි වැඩි කරගත්තා. රුපියල් අගය මත අපේ ආර්ථිකයේ වර්ධනය ගත්තොත්, මේ විධියට සියයට 8.8ක වර්ධනයක් අපි ලබා ගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපේ නිවැරදි ආර්ථික කළමනාකාරීත්වය නිසා - අපි නිවැරදි විධියට ආර්ථිකය කළමනාකරණය කළ නිසා -, අපි නිවැරදි දිශාවට ගමන් කළ නිසා අපට පුළුවන්කම ලැබුණා, ලාංකීය ඉතිහාසයේ පළමුවෙනි වතාවට ඒක පුද්ගල ආදායම ඩොලර් 5,000 ඉක්මවන්න. මේ වෙනකොට වාර්තා වෙනවා, ලංකාවේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඩොලර් 5,003ක් බව. ඒ සතුට අපට තිබෙනවා. කඩා වැටී තිබුණු ආර්ථිකය අපි නිවැරදි දිශාවට අරගෙන ගියා කියන කාරණය ලෝකය ඉස්සරහ කියන්න, එය අපට විශ්වාස නැති අයට චෝදනා කරන අයට උත්තරයක් විධියට ලබා දෙන්න අපට හැකි වී තිබෙනවා.

ගරු කථානායකතුමනි, තවත් කාරණා ගණනාවක් තිබෙනවා. 2025 වර්ෂය වනවිට ලංකාවට පැමිණෙන සංචාරකයින්ගේ ප්‍රමාණය අපි මිලියන 2.05 සිට මිලියන 2.36 දක්වා වර්ධනය කර ගත්තා.

ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඇමෙරිකානු ඩොලර් බිලියන 6.6 ඉඳලා 8.1 දක්වා,- *[බාධා කිරීම්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I am on a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Ravi Karunanayake, what is your point of Order?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, මම මිනිත්තු 7ක් තිස්සේ අවස්ථාව ඉල්ලුවා point of Order එකක් මතු කරන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Raise your point of Order.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කවදාවත් මේ පාර්ලිමේන්තුවේ මෙහෙම වෙලා නැහැ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
This is a mess you all created among yourselves.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා අපේ පක්ෂය නියෝජනය කරනවා. එතුමා දැවැන්ත ප්‍රශ්නයක් ඉදිරිපත් කරලා තිබෙනවා, මේ අවස්ථාවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් මම මගේ- *[බාධා කිරීම්]*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ විතරක් නොවෙයි, අද උදේ පාර්ලිමේන්තුව පටන් ගන්නකොට ඩොලරයේ මිල රුපියල් 342යි. දැන් ගින්න අරගෙන රුපියල් 345- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒක point of Order එකක් නොවෙයි.

Hon. Sunil Rajapaksha, you have to wind up now. Your time is over.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
ගරු කථානායකතුමනි, දැඩි බාධා කිරීම් මධ්‍යයේයි මම කථාව කරගෙන ගියේ. මට තවත් විනාඩියක පමණ කාලයක් අවශ්‍ය වෙනවා කථාව අවසන් කිරීමට.

අපි මේ සියලු දේ ළඟා කර ගත්තේ මේ රටේ පැවැති ඉතාම දුෂ්කර තත්ත්වයන් යටතේයි, ගරු කථානායකතුමනි. එහෙම නැතිව අපිට ලැබුණේ කේක්මුමති නුවර නොවෙයි. 2025 අවුරුද්ද අවසානයේදී අපි දැඩි ස්වාභාවික ව්‍යසනයකට -"දිට්වා" සුළි කුණාටුවට - මුහුණ දුන්නා. ඊට පස්සේ මේ වන විට අපි ලෝක ආර්ථික අර්බුදයකට මුහුණ දීලා තිබෙනවා, තෙල් ප්‍රශ්නයකුත් එක්ක. මේ රටට මුහුණ දීමට සිදු වුණු ව්‍යසන අපි අපේ සාක්කු පුරවා ගන්න පාවිච්චි කළේ නැහැ, සුනාමිය අවස්ථාවේ වාගේ; කොරෝනා වසංගතය අවස්ථාවේ වාගේ. වෙනත් රජයන් නම් කළේ, ඒ ආපු සෑම ව්‍යසනයක්ම තමන්ගේ සාක්කු පුරවා ගන්න පාවිච්චි කරපු එකයි.

දැනටත් සමස්ත ලෝකය මුහුණ දෙන ලොකු ආර්ථික අර්බුදයක් තිබෙනවා, මැද පෙරදිග යුද්ධය සහ ලෝක ආර්ථික තත්ත්වයන් යටතේ. මම දැඩි විශ්වාසයෙන් කියනවා, අපි 2025දී වාගේම 2026දීත්, ඉදිරියටත් මේ ආකාරයෙන්ම ස්ථාවරව, සැලසුම් සහගතව නිවැරදි මාර්ගයේ ගමන් කරන බව. අන්න ඒ ගමනට විපක්ෂයේ ඉන්න සියලු දෙනාගේද සහාය වාගේම ආශීර්වාදය අපිට ලබා දෙන්න. ඔබත් මේ රටට ආදරෙයි නම් මේ රට නිවැරදි මාවතට ගෙන යනකොට ඒකට සහාය දෙන එක තමයි සියලු දෙනාගේම වගකීම. එහෙම නැතිව, ඒක කඩාකප්පල් කිරීම සඳහා කකුලෙන් අදින එක නොවෙයි. ඒ නිසා මේ රට නිවැරදි ආර්ථික මාර්ගයක, නිවැරදි ප්‍රතිපත්තියක, නිවැරදි ක්‍රියාදාමයක ගෙන යමින් සංවර්ධන මාවතකට පියනඟන්න සියලු දෙනාම උදව් කරන්න කියලා ඉල්ලා සිටිමින්, මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට ගරු කථානායකතුමනි, ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නවතිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
යෝජනාව ස්ථිර කිරීම, ගරු චන්දන තෙන්නකෝන් මහතා. You have 10 minutes.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මරික්කාර් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, ඉස්සෙල්ලා විවාදය යන වෙලාවේ ගරු සභානායකතුමා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට දෙපාරක්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා කථා කළා. එතුමාට පුළුවන්, පැලවත්තට ගිහිල්ලා එහෙම කථා කරන්න. එතුමාට අයිතියක් නැහැ- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔයිට වඩා වෙනත් නම් කියනවා ඇහුණා, විපක්ෂයෙන් ආණ්ඩු පක්ෂයට. *[බාධා කිරීම්]*

ගරු චන්දන තෙන්නකෝන් මන්ත්‍රීතුමා කථා කරන්න.

[පූ.භා. 11.15]

**ගරු චන්දන තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)
ගරු කථානායකතුමනි, ගරු සුනිල් රාජපක්ෂ මන්ත්‍රීතුමා අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව මා ස්ථිර කරනවා. මම සතුටු වෙනවා, මෙම කල් තැබීමේ විවාදයට අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම සම්බන්ධයෙන්.

මුලින්ම මම මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි, අපි 2025 වසරේ ආර්ථිකයේ මේ වර්ධනීය ඉලක්ක අත්පත් කර ගත්තේ කුමන යථාර්ථයක ඉඳලාද කියන එක පිළිබඳව. ගරු කථානායකතුමනි, අපි දන්නවා පසුගිය කාලයේ පැවැති ආණ්ඩු මේ රටේ ආර්ථිකයේ සියලු දර්ශක බිඳ වට්ටලා, බිමට සමතලා කරලායි තිබුණේ කියන එක. 2015දී බලයට ආපු යහ පාලන ආණ්ඩුව ඒ වෙලාවේ සියයට 5.2ක් ලෙස තිබුණු ආර්ථික වර්ධන වේගය සියයට 2.2ට වැට්ටුවා. මහ බැංකුව කොල්ල කාලා, පොතුත් ලියලා, රට මහා ණය කන්දකට හිර කරලා තමයි ඒ අය බැහැලා ගියේ. ඊට පස්සේ බලයට ආපු ගෝඨාභය, මහින්ද, නාමල් මෙහෙයවපු පොහොට්ටු ආණ්ඩුව මේ රටේ ආර්ථිකය බිමටම සමතලා කළා. අපි දන්නවා, රාජ්‍ය ආදායම බිඳ වට්ටලා පඩි ගෙවන්න, විශ්‍රාම වැටුප් ගෙවන්න දෛනිකව මුදල් අච්චු ගහමින් තමයි එදා ආර්ථිකය මෙහෙයවූයේ කියන එක. රටේ නිෂ්පාදනය කඩා වැට්ටුවා. අපනයන ආදායම බිඳ වැට්ටුවා. ණය ගෙවා ගන්න බැරි, ණය ගන්න බැරි තැනකට පත් කර රට ණය අර්බුදයක හිර කළා. ඒ වාගේම වාහන, යූරියා, බෙහෙත්, ගෑස් ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ මේ රටට ආනයනය කර ගන්න ඩොලර් නැතිව මේ රටේ මිනිස්සු මහ පාරට ඇදලා දැම්මා. අපිට මතකයි, මිනිස්සු තෙල් පෝලිම්වල, ගෑස් පෝලිම්වල දවස් ගණන්, සති ගණන් දුක් වින්ද ආකාරය. එහෙම තමයි පොහොට්ටු ආණ්ඩුව මේ රටේ ආර්ථිකය කළමනාකරණය කළේ. ඩොලර් සංචිතය බින්දුවට බැස්සුවා. හොරකම, වංචාව, දූෂණය, නාස්තිය

නිසා මේ රට කෙරෙහි ආයෝජකයන් තුළ තිබුණු විශ්වාසය බින්දුවට වැටුණා. ආයෝජකයන් කවුරුවත් ආවේ නැහැ. පටන් ගත්තු ව්‍යාපෘති ඒ ඒ තැනම නැවතිලා තිබුණා. ඒ කාලයේ එකම ව්‍යාපෘතියක්වත් මේ රටේ ක්‍රියාත්මක වුණේ නැහැ. පසුගිය වසර කිහිපය තුළ රටේ කොහේවත් - අඩුම ගණනේ ඇත ගමකවත් - ගඩොල් කැටයක් බැඳලා ඉදි කිරීමක් කරනවා අපි දැක්කේ නැහැ; පාරක් හදනවා අවුරුදු කිහිපයකින් දැක්කේ නැහැ. ඉදිකිරීම් ක්ෂේත්‍රය බිමට සමතලා කළා. එහෙම තමයි ඒ ආණ්ඩුව ආර්ථිකය කළමනාකරණය කළේ. තරුණයන්, වෘත්තිකයන් රට දාලා යන තැනට ආර්ථිකය ගෙන ගිහිල්ලා, ආර්ථිකයේ සියලු දර්ශක බිමට සමතලා කරලායි තිබුණේ. ඒ යථාර්ථය තුළ තමයි ජාතික ජන බලවේගය ආණ්ඩුවේ පාලනය යටතේ ගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් මේ රට ස්ථාවරභාවයට පත් කළේ. ඒ යථාර්ථය අමතක කරලා, අප 2025දී අත්පත් කරගත් ඉලක්ක ගැන සාකච්ඡා කරලා තේරුමක් නැහැ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ "2025 වාර්ෂික ආර්ථික විවරණය" පරිශීලනය කරලා බලන කොට අපට ප්‍රධාන කරුණු තුනක් ඒ වාර්තාව ඇතුළේ හඳුනා ගන්න පුළුවන්. විශේෂයෙන් ස්ථායීතාව නැවත ලබාගෙන ඇති බවත්, විශ්වාසය යළි ගොඩනැඟෙමින් පවතින බවත්, වර්ධනීය මාවතකට අපේ රටේ ආර්ථිකය නැවත පැමිණ තිබෙන බවත් අපට පැහැදිලිව දැක ගන්න පුළුවන්. ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම අවිනිශ්චිත හෝ තාවකාලික දෙයක් නොවෙයි. එය පැහැදිලි යථාර්ථයක් කියලා මහ බැංකුවේ මේ වාර්තාව පරිශීලනය කරන හැම කෙනෙකුටම පැහැදිලි වෙනවා. අපි කියන්න කැමැතියි, පසුගිය කාලයේ විශාල ලෙස සංකෝචනය කරලා - හකුළලා - තිබුණු අපේ රටේ ආර්ථිකය, සෘණ ආර්ථික වර්ධනයක් පෙන්නුම් කරපු අපේ රටේ ආර්ථිකය අපේක්ෂිත ඉලක්ක පහු කරලා සියයට 5ක වර්ධන වේගයක් අත්පත් කර ගන්න සමත් වෙලා තිබෙන බව. එහි විශේෂත්වය වන්නේ, මේ වර්ධනය එක අංශයකට පමණක් සීමා නොවීමයි. සෑම අංශයක්ම වර්ධනය වෙලා තිබෙනවා. ඇත්තටම ඒක බෙහෙවින් අගය කළ යුතු දෙයක් කියලා අපට පැහැදිලිව කියන්න පුළුවන්. විශේෂයෙන්ම කෘෂිකර්ම අංශය සියයට 1.4කිනුත්, කර්මාන්ත අංශය සියයට 7.8කිනුත් වර්ධනය වෙලා තිබෙනවා. ඒ වාගේම සේවා අංශය සියයට 3.3ක වර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා. වර්ධනය වැඩිම ක්ෂේත්‍රය කර්මාන්ත අංශයයි. ඒ වාගේම සේවා අංශය වඩා වේගයෙන් වර්ධනය වෙමින් යථා තත්ත්වයට පත් වන අවස්ථාවක කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රය කාලගුණික හා පිරිවැය අවදානම්වලට මුහුණ දෙමින් වුණත් වර්ධනයක් පෙන්නුම් කරමින් තිබෙනවා. එය අපේ රටේ ආර්ථිකය පසුගිය වසරක කාලයක් තුළ ලබාගත් විශිෂ්ට ජයග්‍රහණ ලෙස අපට පෙන්වා දෙන්න පුළුවන්.

ඇත්තටම මෙම වර්ධනීය මාවතට ප්‍රධාන හේතු ලෙස අපේ රටේ නිවැරැදි ආර්ථික ප්‍රතිපත්ති අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම, සාර්ව ආර්ථික ස්ථායීතාව අඛණ්ඩව පවත්වා ගැනීම, ඒ තුළින් ආර්ථිකය පිළිබඳව විශ්වසනීයත්වය තවදුරටත් ඉහළ නැංවීමට රජය විසින් කටයුතු කිරීම ආදිය දැක්විය හැකි බව මම මේ ගරු සභාවට පැහැදිලිව කියන්න කැමැතියි.

පසුගිය වසර තුළ ශ්‍රී ලංකාවේ ආර්ථිකය විශාල කඩඉම් ගණනාවක් පහු කරලා තිබෙනවා. ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඩොලර් බිලියන 100 සීමාව ඉක්මවා ඉහළට වර්ධනය වීම, ඒක පුද්ගල ආදායම ඩොලර් 5,000 ඉක්මවා වර්ධනය වීම, සමස්ත නිෂ්පාදන මට්ටම අර්බුදයට පෙර පැවැති තත්ත්වයට ළඟා වීම පසුගිය වසර තුළ අපේ ආර්ථිකයේ ඇති වුණු කැපී පෙනෙන වෙනස්කම් ලෙස අපට හඳුන්වා දෙන්න පුළුවන්.

මෙම වාර්තාව පරිශීලනය කරන විට පෙනී යන තවත් කරුණක් තමයි විදේශීය අංශයේ යහපත් වර්ධනය. විශේෂයෙන්ම සංචාරක ක්ෂේත්‍රයේ විශාල පිබිදීමක්, නැග්මක් පසුගිය වසර තුළ අපට දැක ගන්න පුළුවන් වුණා. 2024දී මිලියන 2.05ක සංචාරක පැමිණීම 2025 වනවිට මිලියන 2.36ක වර්ධනීය අගයක් දක්වා වර්ධනය කර ගන්න අපේ රජය සමත් වෙලා තිබෙනවා. ඒ වාගේම වසර 5ක කාලයක් වාහන ආනයනය නවතා තිබූ පසුබිමක් තුළ 2025 පෙබරවාරි මාසයේ වාහන ආනයනයට අවසර දීම හේතුවෙන්, අපේක්ෂා කළ වියදම් පුරෝකථනය ඉක්මවා ගියත් අප පසුගිය අවුරුද්දේ ලංකා ඉතිහාසයේ වැඩිම අපනයන ආදායම වාර්තා කිරීම නිසා එයට ඔරොත්තු දීමේ හැකියාව අපේ ආර්ථිකයට ලැබුණා. ඒ නිසා අපි වසර 5කට පස්සේ ඒ බංකොලොත් ආර්ථිකයක් සහිත යුගය අවසන් කරලා වාහන ආනයනය සීමා රහිතව කරන්න අවස්ථාව ලබා දුන්නා.

විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල වර්ධනය ගත්තාම, විදේශ අංශය තුළ සාධනීය වර්ධනයක් වාර්තා වෙනවා. 2024දී ඇමෙරිකානු ඩොලර් බිලියන 6.6ක් වූ විදේශ ප්‍රේෂණ 2025 වසරේදී ඇමෙරිකානු ඩොලර් බිලියන 8.1 දක්වා ඉතිහාසයේ වාර්තාගත වැඩිම අගය බවට පත් කරන්න අපේ රජයට හැකියාව ලැබුණා. ඇත්තටම ජාතික ජන බලවේගය ආණ්ඩුවේ වංචාවෙන්, දූෂණයෙන්, නාස්තියෙන් තොර ආදර්ශවත් දේශපාලන සංස්කෘතිය, ආදර්ශවත් නායකත්වය කෙරෙහි විදෙස්ගත ආදරණීය ශ්‍රී ලාංකිකයන් තුළ ඇති වුණු හැඟීම් තමයි විදේශ ප්‍රේෂණවල මේ කැපී පෙනෙන වර්ධනය හරහා අනෙක් පැත්තෙන් ප්‍රකාශ වන්නේ. 2025දී මේ ආර්ථිකය තුළ වැඩිම විදේශ ප්‍රේෂණ ප්‍රමාණයක් අත් පත් කර ගැනීම පසුගිය වසරක කාලය තුළ අප ලැබූ විශාල ජයග්‍රහණයක් බව අප කියන්න ඕනෑ.

2020 වසරෙන් පසු වැඩිම ණය සේවාකරණය ගෙවීමෙන් පසුවත් දළ නිල විදෙස් සංචිත ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 6.8 ඉක්මවා තිබීම රටක් ලෙස අප අත් පත් කර ගත් විශාල ජයග්‍රහණයක් ලෙස හඳුන්වා දෙන්න පුළුවන්. ඒ වාගේම, ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් සිදු කළ ශුද්ධ විදේශ විනිමය මිල දී ගැනීම ඇමෙරිකානු ඩොලර් බිලියන 2 දක්වා වර්ධනය වීමත් පසුගිය වසරක කාලය තුළ අපේ ආර්ථිකය අත් පත් කර ගත් ජයග්‍රහණයක් ලෙස මම මේ ගරු සභාවට හඳුන්වා දෙන්න කැමැතියි.

ඒ වාගේම, 2024 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් බිලියන 1.2ක් වූ ජංගම ගිණුමේ අතිරික්තය, පසුගිය වසර තුළ අප ඇමෙරිකානු ඩොලර් බිලියන 1.7 දක්වා වර්ධනය කර ගැනීමත් කැපී පෙනෙනවා. එමෙන්ම, බැංකු හා මූල්‍ය පද්ධතිය ඉතාම වේගයෙන් වර්ධනය වෙලා, ශක්තිමත් වෙලා තිබෙනවා. බැංකු අංශයේ කාර්ය සාධනය 2025 වසරේ තවදුරටත් ඉහළ යෑම, ඒ වාගේම වත්කම් හා ද්‍රවශීලතා මට්ටම් ශක්තිමත් වීම, මූල්‍ය පද්ධතිය හරහා පෞද්ගලික අංශයට ලබා දී ඇති ණය ප්‍රමාණය වැඩි වී තිබීම එයට උදාහරණ හැටියට ඉදිරිපත් කරන්න අපට පුළුවන්. විශේෂයෙන්ම 2024දී සියයට 10.7ක් වූ ණය වර්ධනය, 2025දී සියයට 25.2 දක්වා වර්ධනය වුණා. ඒ වාගේම ණය ප්‍රමාණයේ ප්‍රසාරණය ගත්තොත්, 2024දී රුපියල් බිලියන 790ක් වූ ණය ප්‍රමාණය 2025දී රුපියල් බිලියන 2,056ක් දක්වා විශාල ලෙස වර්ධනය කර ගන්න අපට හැකියාව ලැබී තිබෙනවා. රාජ්‍ය ණය ලබාගෙන ඇති ක්ෂේත්‍ර ගත්තොත්, කෘෂි කර්මාන්තය, කර්මාන්ත සහ සේවා අංශ සඳහා සමාකාරව ඒ ණය නිකුත් වෙලා තිබෙනවා. ඒ වාගේම, පසුගිය වසර පුරාවට රාජ්‍ය මූල්‍ය අංශයේ සාධනීය වර්ධනයක් දැක ගන්න පුළුවන්කම තිබෙනවා. 2024දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 13.6ක්ව තිබූ රාජ්‍ය ආදායම, 2025දී වාර්තාගත වැඩිම රාජ්‍ය ආදායම ලෙස වර්ධනය වුණා. එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 16.7ක් දක්වා වර්ධනය කර ගැනීමට අපි සමත් වෙලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is up.

**ගරු චන්දන තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)
ඒ වාගේම, 2024 වසරේදී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 6.8ක් වූ අය වැය හිඟය, 2025දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2.3 දක්වා අඩු කර ගැනීමටත් අපට හැකියාව ලැබී තිබෙනවා.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න කැමැතියි. පසුගිය වසරක කෙටි කාලය තුළ අපේ රටේ ආර්ථිකය අඛණ්ඩව වර්ධනය වෙලා තිබෙනවා; සමස්ත ආර්ථිකය ඩොලර් බිලියන 100 ඉක්මවා තිබෙනවා; ඒක පුද්ගල ආදායම ඩොලර් 5,000 ඉක්මවා තිබෙනවා; පොලී අනුපාතය ස්ථාවර වෙලා තිබෙනවා; සංචාරක කර්මාන්තය වර්ධනය වෙලා තිබෙනවා; සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ වර්ධනය වෙලා තිබෙනවා; විදේශ සංචිත වර්ධනය වෙලා තිබෙනවා; පසුගිය වසරක කාලය තුළ විනිමය අනුපාතිකය ස්ථාවර කර ගන්න සමත් වෙලා තිබෙනවා; ජංගම ගිණුමේ අතිරික්තය අඛණ්ඩව වර්ධනය වෙලා තිබෙනවා, පෞද්ගලික අංශයට ලබා දුන් ණය ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා, රාජ්‍ය ආදායම වර්ධනය වෙලා තිබෙනවා; අය වැය හිඟය අඩු වෙලා තිබෙනවා; ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් වර්ධනය වෙලා තිබෙනවා; උද්ධමනය පාලනය වෙලා තිබෙනවා. එම නිසා, ආර්ථිකය තුළ සියලු නිර්ණායක, දත්ත ස්ථාවර කරන්නත්, ඒ වාගේම එම වර්ධනය අඛණ්ඩව පවත්වාගෙන යන්නත් අපේ ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් ජාතික ජන බලවේගය ආණ්ඩුව සමත් වෙලා තිබෙන බව මේ ගරු සභාවට පවසමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. S.M. Marikkar. You have 12 minutes.

[පූ.භා. 11.26]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මගේ කථාව ආරම්භ කරන්න කලින් කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. සභානායකතුමා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා කථා කළා. ඔබතුමාත් ඒක සාධාරණීකරණ කළා. එතුමා එහෙම හැසිරෙනවා නම් මීට පස්සේ "ගරු මන්ත්‍රීවරු, ගරු ඇමතිතුමා" කියනවාද, කථානායකතුමාට "ගරු" කියලා කියනවාද කියන එකත් අපට කල්පනා කරන්න සිද්ධ වෙනවා. මොකද, මූලාසනයේ ඉන්න කථානායකවරයා විධියට ඔබතුමාට වගකීමක් තිබෙනවා, සභාවේ වැරදි වචන පාවිච්චි කළා නම් ඒවා කපා හරින්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please stick to the Debate.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
එතුමා කථා කරලා, මාරු.

ගරු කථානායකතුමනි, අනුර කුමාර දිසානායක මැතිතුමා මේ රට භාර ගනිද්දි ඩොලර් එක රුපියල් 292යි. අද ඩොලර් එක රුපියල් 343ට ගිහින් තිබෙනවා. ඒ කියන්නේ, රුපියල් 51කින් වැඩි වෙලා තිබෙනවා. දැන් ඇද වෙලා ඉන්නේ මුහුණ දෙන්න බැරුව. රුපියලකින් ඩොලරය අවප්‍රමාණ වෙනකොට ණය බර රුපියල් බිලියන 40කින් වැඩි වෙනවා. ගරු කථානායකතුමනි, අනුර කුමාර දිසානායක මැතිතුමා ජනාධිපති වුණාට පස්සේ ඩොලරය පාලනය කරගන්න බැරුව අපේ රටේ ණය බර ප්‍රමාණය රුපියල් බිලියන 2,000කින් - මිලියන 20,000කින් - වැඩි කරලා තිබෙනවා. මේ බොරු ටෝක් දුන්නාට ගමට ගිහිල්ලා බලන්න මිනිස්සු කන බොන විධිය, මිනිස්සු ජීවත් වෙන විධිය. මිනිස්සු කරන්ට් බිල් ගෙවන්නේ කොහොමද කියලා බලන්න.

ගරු කථානායකතුමනි, 76 වසරක සාපය කියලා බලය ගත්තාට, අපි මේ 76 වසරේම අහලා තිබුණේ නැහැ, මාස දෙකක් ඇතුළත කරන්ට් බිල දෙපාරක් වැඩි කළා කියලා. මේ 76 වසරේ අපි අහලා තිබුණේ නැහැ, මහ බැංකුවට හැකර්ලා ගැහුවා කියලා. මේ 76 වසරේ අපි අහලා තිබුණේ නැහැ, අස්වැසුම දෙපාරක් ගෙව්වා කියලා. මේ 76 වසරේ අපි අහලා තිබුණේ නැහැ RDA එකේ කොන්ත්‍රාත්කරුවන්ට බැංකුවේ වරදින් හරි දෙපාරක් payments කළ බවක්. ඒ වාගේම මේ 76 වසරේදී අපි අහලා තිබුණේ නැහැ, තැපැලෙන් ඇමෙරිකාවට යවපු ඩොලර් ලක්ෂ හයක් නැති වුණා කියලා. වැඩ බැරි "කයිතන්ලා" කථානායකතුමාත් බය කරගෙන බොරු ටෝක් දීලා පැනලා දුවනවා. සභානායක පැනලා දිව්වා. ඩොලර් එක රුපියල් 51කින් වැඩි වුණාම මුහුණ දීගන්න බැහැ.

ගරු කථානායකතුමනි, දැන් මොන කයිය ගැහුවත් මේගොල්ලන් රට භාර ගනිද්දි මේ රටේ සමස්ත ණය ප්‍රමාණය ඩොලර් බිලියන 93යි තිබුණේ. අද වෙනකොට සමස්ත ණය ප්‍රමාණය ඩොලර් බිලියන 107.2යි. මාස 20ක් ඇතුළත මේ රටේ ණය ප්‍රමාණය ඩොලර් බිලියන 14.2කින් වැඩි වෙලා තිබෙනවා. එහෙම නැත්නම් රුපියල් ට්‍රිලියන 28.2ට තිබුණු ණය බර ප්‍රමාණය 33.3ට ගෙනිහින් තිබෙනවා. මේ මොනවා කරලාද? Airports හදලාද? වරායවල් හදලාද? ගුවන් තොටුපොළවල් හදලාද? මේ, පිටකොටුව bus stand එකේ ඉස්සරහා පැත්ත විතරක් හදලා. ඒකත් තීන්ත ගාලා, පිටිපස්ස රෙද්දකින් වහලා. දැන් මේ තිත්ත ඇත්ත යථාර්ථය හෙළිවෙලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, පසුගිය දවස් ටිකේ බැලුවා මැද පෙරදිග යුද්ධය පිටින් දාලා මේවා වහන්න. මැද පෙරදිග යුද්ධය පිටින් දාලා වහන්නේ කොහොමද ප්‍රේෂණ ප්‍රමාණය වැඩි වෙලා තිබෙනකොට. ඩොලර් මිලියන 815කට ප්‍රේෂණ වැඩි වෙලා තිබෙනවා. වැඩ බැරිකම හින්දා සෘජු විදේශ ආයෝජන එන්නේ නැහැ. විශ්වාසය නැති හින්දා සෘජු විදේශ ආයෝජන එන්නේ නැහැ. වාමාංශික හින්දා සෘජු විදේශ ආයෝජන එන්නේ නැහැ. සෘජු විදේශ ආයෝජන ඇවිල්ලා තිබෙන්නේ කීයද? කොළඹ කොටස් වෙළෙඳ පොළට ඩොලර් මිලියන 10යි ඇවිත් තිබෙන්නේ. හැබැයි, මේගොල්ලන්ගේ වැඩ කොහොමද?

දැන් වාහන ආනයනය තහනම් කරන්නේ නැතිව - තහනම් කළා කිව්වොත් දේශපාලනිකව අවුල් වෙන නිසා - තව සියයට 50ක අධිභාරයක් දමනවා කිව්වා. ඒ තහනම් කිරීමක් තමයි. මේක ප්‍රෝඩාවක්. ගරු කථානායකතුමනි, අපට ආරංචි විධියට ජනාධිපතිතුමාට "good bugger" කියන මාලිමා ආණ්ඩුවේ අයට ටයි කෝට් මහලා දෙන සමාගම් දෙකකින් එක සමාගමක් වාහන 3,500කට, තවත් සමාගමක් වාහන 500කට මේ තහනමට කලින් දවසේ LCs විවෘත කරලා තිබෙනවා. මේ ගැන සොයලා බලන්න. ඔන්න පගාව දීම! ඔන්න තුටු පඩුරු දීම! ගරු කථානායකතුමනි, මේ වැඩ බැරි කයිතන්ලා මොන කතන්දර කිව්වත්, අද මේ රටේ ජනතාව වළපල්ලට ඇදලා දාලා තිබෙන්නේ.

අද උදේ සොයලා බලනකොට NDB බැංකුවේ ඩොලර් එක රුපියල් 342ට තිබුණේ. පැයක් යනකොට ඩොලරය රුපියලකින් වැඩි වෙලා. පැයක් යනකොට රටේ ණය බර රුපියල් බිලියන 40කින් වැඩි වෙලා. හරිද? රුපියල් බිලියන 40කින් වැඩි වෙලා. ඒ නිසා මුහුණ දීගන්න බැහැ. ඇද වෙලා දුවනවා. ඇද වෙච්ච නිසා තමයි "තමුසේ" කියලා කියැවෙන්නේ. අපි කියන්න කැමතියි, පැලවත්තට ගිහින් ඔය තමුසේ ටෝක් දෙන්න කියලා. 1988, 89 දැන් ඉවරයි. එහෙම එනවා නම් අපිත් ඒවාට ලැහැස්තියි. ගරු කථානායකතුමනි, වැඩිය ඕනෑ නැහැ. අපි අහන්නේ නැහැ, මුහුදු වතුරෙන් සල්ෆියුරික් අම්ලය හැදුවාද කියලා. අපි ඒවා අහන්නේ නැහැ.

හරිද? ඩොලර් බිලියන 41 කජ්ජක්ද? අපි ඒවාඅහන්නේ නැහැ. මාළු අල්ලන්න Apps දුන්නාද කියලා අපි අහන්නේ නැහැ. හැබැයි අපි කියනවා, අඩුම ගණනේ මේ රටේ මිනිස්සුන්ට සාධාරණ විධියට හම්බ කරන මුදලින් කන්න පුළුවන් ආර්ථිකයක් හදන්න, මේ රටේ ගොවීන්ගේ නිෂ්පාදන හදන්න පොහොර දෙන්න පුළුවන් ආර්ථිකයක් හදන්න, මේ රටේ පාරිභෝගිකයාට ගෙවන්න පුළුවන් විදුලි බිලක් හදලා දෙන්න කියලා. ඒ වාගේම, හොරා කාපු අයගේ දේවල් අය කර ගන්නවා කියලා මේ රටේ ජනතාවට පොරොන්දු වෙච්ච ඒවා ක්‍රියාත්මක කරලා පෙන්වන්න.

ගරු කථානායකතුමනි, මේ මොන කයිය ගැහුවත් ගමට ගියාම පෙනෙනවා නේ. දැන් කරලා බලන්නකෝ. අපට අභියෝග කළා ජනාධිපතිතුමා, "මයික් ඉස්සරහා කථා කරන්නේ නැතිව ජනතාව ඉස්සරහා රැස්වීම් කරන්න" කියලා. අපි කරලා පෙන්වලා තිබෙන්නේ. ලබන මාසයේ ඉඳලා ගමක් ගමක් ගාණේ ඇවිල්ලා පෙන්වනවා. පුළුවන් නම් යන්නකෝ ඔයගොල්ලන්. *[බාධා කිරීම්]* හරි, හරි. 2022 මුල් භාගයේදී වියත් මගේ කට්ටියත් හිටියේ ඔහොම තමයි. ඔහොම තමයි වියත් මගේ කට්ටියත් හිටියේ. අන්තිමට වියත් මගේ කට්ටිය කොරිඩෝ එකට ඇවිල්ලා අපට කියන්න ගත්තා, "ඉස්සරහා පේළියේ ටයි කෝට් ගහගෙන ඉන්න එවුන් හොරකම් කරනකොට අපි මොකටද ඉස්සරහට යන්නේ?" කියලා. ඒක වෙනවා. පොල් පිති, පාපිසි, පොල් ලෙලි. ඔය කට්ටියට වෙනවා ඒක. ලබන පාර පාර්ලිමේන්තු එන්න බැහැ කියලා පෙනෙනකොට පේනවා ඒක. *[බාධා කිරීම්]* තමුන්නාන්සේලා මොන කයිය ගැහුවත් මේ රටේ ජනතාව දෙවැනි පාරටත් වළ පල්ලට ඇදලා දැම්මා. ගෝඨාභයත් ඇවිල්ලා ඒක කළා. ආයෙත් ඇදලා දාලා තිබෙන්නේ. හොඳ වෙලාවට ඔබතුමන්ලා ඡන්දය දිනුවේ. ඔබතුමන්ලාගේ වැඩවල තරම, පාපිසිවල තරම, පොල් ලෙලිවල තරම, වචනවලින් රවට්ටන එකේ තරම අද කුස්සිය ඇතුළේ අත්විඳිනවා. *[බාධා කිරීම්]* ඔයගොල්ලන් එළවන්නේ කවුරුවත් නොවෙයි, මේ රටේ ගෘහිණියෝ. *[බාධා කිරීම්]* මේ රටේ ගෘහිණියන්ට YouTube එකෙනුයි, TikTok එකෙනුයි ඇවිල්ලා කිව්වා, තුනෙන් එකකින් - සියයට 33කින් - විදුලි බිල අඩු කරනවා කියලා. නමුත්, 43කින් වැඩි කරලා.

ඊළඟට කිව්වා, ආහාර, අධ්‍යාපනය, සෞඛ්‍ය ආදී ක්ෂේත්‍රවලින් VAT එක අයින් කරනවා කියලා. ගෘහිණිය හිතුවා බෙහෙත් මිල අඩු වෙයි, පෑන්, පැන්සල්, පොත්පත්වල මිල අඩු වෙයි, කෑම බීමවල මිල අඩු වෙයි කියලා. ඊළඟට කිව්වා, නැවෙන් බාන ගාණට තෙල් දෙනවා කියලා. අන්න, නූල කැඩිච්ච සරුංගලය වාගේ තෙල් මිල උඩ ගිහිල්ලා. තවම බදු ගහනවා රුපියල් 128ක්. ගරු කථානායකතුමනි, මේ රටේ ගෘහිණිය හිතුවා, අනුර කුමාර දිසානායක බලයට ආවාම, හොරකම් නතර වුණාම, කුස්සියට රුපියල් 10,000ක, 15,000ක වාසියක් ලැබෙයි කියලා. නමුත් වැඩි කරලා තිබෙනවා රුපියල් 25,000කින් විතර. එදා පිරිමි අය සජිත් ප්‍රේමදාසට ඡන්දය දෙද්දී කාන්තාව අනුර කුමාර දිසානායකට ඡන්දය දුන්නේ ඒ බලාපොරොත්තුවෙන්. ඒ නිසා, ඒ කාන්තාවන්ම තමයි ඔයගොල්ලන් එළවන්නේ. අපි මුකුත් කරන්න ඕනෑ නැහැ. *[බාධා කිරීම්]* කියව කියවා ඉන්න. *[බාධා කිරීම්]* අර ඉන්නේ. Facebook එකේ ඉන්න, "ආකාශ් නිලුපුල්" කියලා අන්වර්ථ නාමයෙන් පෙනී ඉන්න ඩෝබිලා ඉන්නවා. ඩෝබියා ඉන්නවා, "ආකාශ් නිලුපුල්" කියන. දැන් මඩ බලකායටවත් මේක නවත්වන්න බැහැ. මේ යන කාලයට ගියොත් ඩොලර් එක රුපියල් 360ට යන එක නවත්වන්න බැහැ. අපි මේ රටේ ජනතාවට කියන්න කැමැතියි, දැන්වත් තිත්ත ඇත්ත තේරුම් ගන්න කියලා. මේ වැඩ බැරි ටාසන්ලාට ආයෝජන ගෙනෙන්නත් බැහැ, ඩොලර් එක පාලනය කරන්නත් බැහැ, අලුත් ආදායම් මාර්ග හොයන්නත් බැහැ, රැකියා උත්පාදනය කරන්නත් බැහැ, පොහොර දෙන්නත් බැහැ, කරන්ට් බිල පාලනය කරන්නත් බැහැ, භාණ්ඩවල මිල පාලනය කරන්නත් බැහැ. කොටින්ම කිව්වොත්, ඒ කිසි දෙයක් පාලනය කරගන්න බැරි වුණාට තමන්ගේ ගොඩ වැඩි කරගන්න නම් පුළුවන්.

ගරු කථානායකතුමනි, මිනිස්සු හිතුවා අවුරුදු 76 තුළ තමයි හොරකම් කළේ, අවුරුදු 76 තුළ තමයි අකාර්යක්ෂම වුණේ කියලා. හැබැයි ගරු කථානායකතුමනි, මේ අවුරුදු දෙකේ, මේ මාස 20 තුළ ඇහෙන දේවල් එක්ක තමයි මිනිස්සුන්ට තේරෙන්නේ කොහොමද 76 අවුරුද්දක් වැඩ කළේ කියලා.

මැද පෙරදිග යුද්ධය ගැන කියනකොට මම මේ කාරණයත් කියන්න ඕනෑ. 1990දී ඇමෙරිකාව සදාම් හුසේන්ට ගහද්දී, කුවේට් හරහා මැද පෙරදිග යුද්ධය යද්දී රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා, අනේ යුද්ධයක් තිබෙනවා කියලා තෙල් මිල වැඩි කළේ නැහැ. එතුමා පොඩි පන්තියෙන් ආපු මිනිහෙක් විධියට ඇඟලුම් කර්මාන්තශාලා 200ක් හදලා අපේ රටට අපනයන ආදායම වැඩි කරලා තමයි තෙල් මිල පාලනය කරලා, ජන සවියත් ලබා දුන්නේ. අද IMF එකේ පස්ස පැත්ත ලෙවකනවා. එදා ප්‍රේමදාස ජනාධිපතිතුමා අතිරේක ආදායම හදපු නිසා IMF එක එතුමාගෙන් appointment එකක් ඉල්ලද්දී, "තමුසෙලා airport එකට යන ගමන් ඉරිදාට ඇවිල්ලා කෙසෙල්වත්තේදී මාව හම්බ වෙන්න" කියලා කියන්න එතුමාට කොන්දක් තිබුණා. අන්න එහෙමයි නායකයෝ. එහෙමයි ආඩම්බර වෙන්න පුළුවන් නායකයෝ කටයුතු කරන්නේ.

Double pockets දාලා, double acting දාලා, double game ගහලා, double payment කරන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඉන්නේ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඔය පුටුවේ රස බලන්න වෙන්නේ තව මාස කිහිපයයි. එම නිසා ඒ මාස කිහිපයේදී සභානායක ඔළුව වනනකොට නැවෙන්න. අවුලක් නැහැ. ඊළඟ පාර පාර්ලිමේන්තු එන්න හිතාගෙන කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you have two more minutes.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
I have two minutes. I will finish.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

සභානායකතුමා කියන විධියට නැවෙන එක ඔබතුමාට හොඳ නැහැ. ඒක ඔය පුටුවටත් හොඳ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you stick to the Debate.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, අපක්ෂපාතීව හැසිරීම, මන්ත්‍රීවරුන්ට සාධාරණය ඉෂ්ට කිරීම ඔබතුමාගේ වගකීමක්. මීට පෙරත් මේ පාර්ලිමේන්තුවේ කථානායකවරු ඉඳලා තිබෙනවා. රාජපක්ෂ සමයේ මහින්ද රාජපක්ෂගේ සොහොයුරාත් කථානායක ධුරයේ හිටියා. ඔබතුමාට වැඩිය අනීතික විධියට, අශීලාචාර විධියට හැසිරෙන්න එතුමාට හැකියාව තිබුණා. හැබැයි, එතුමා ඔබතුමාට වැඩිය හොඳට හැසිරුණා. ඒක කියන්න එපැයි. රාජපක්ෂලාට මොන වැරැද්ද තිබුණත්, මොන චෝදනාව තිබුණත් ඒ අයත් හොඳ විධියට හැසිරුණා. ඒ නිසා ඔය පුටුවේ ගෞරවය රකින්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you should stick to the Debate. Otherwise, I can stop you.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
I am speaking within my time.

ඔබතුමාගේ කථානායකකම නැති වුණාට පස්සේ ඔබතුමා දොස්තර රස්සාවට නැවත යන්න ඕනෑ. ඔබතුමා ගමේ යන්න ඕනෑ නේ. ඒකත් අවබෝධ කර ගන්න කියලා මම ඉල්ලා සිටිනවා. අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. ඔය මොන කයිය ගැහුවත්, නූල කැඩිච්ච සරුංගලය වාගේ, ඩොලර් එක වාගේ මේ ආණ්ඩුවට කොයි වෙලාවේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා දන්නේ නැහැ. ආණ්ඩුවට අබ සරණයි! ආකාශ් නිලුපුල්, ඔයාගේ මඩ බලකායත් බේරා ගන්න බැරි බව කියමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. (Dr.) Rizvie Salih. You have ten minutes.

[11.38 a.m.]

**ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. (Dr.) Rizvie Salih - Deputy Speaker and Chair of Committees)
Hon. Speaker, I rise today to speak on this Adjournment Debate on the Annual Economic Review, 2025 of the Central Bank not only with a sense of responsibility, but also with a convinced sense of hope.

When we discuss an annual economic review in this Chamber, it is easy for the debate to be filled with percentages, statistics, technical terms, fiscal indicators and economic jargon. But, behind every economic figure, there is a human story. Behind every percentage of growth, there is a family, a family struggling to recover, a business trying to survive, a young graduate searching for opportunity and an ordinary citizen hoping for a better tomorrow. That is why this Debate is important because the story of Sri Lanka's economy in 2025 is not merely a story of numbers improving, but a story of a resilient nation which refused to give up.

Sir, we all remember the dark days our country went through; those memories are still fresh in the minds of our people. We remember the long fuel queues; we remember parents wondering how they would feed their children; we remember pharmacies running short of medicines; we remember the power cuts, the uncertainty and the fear, frustration and anger of the people. I am not here to play the blame game, but to pay tribute to the ordinary citizens of this country for bearing all that during its most difficult period. The farmer continued to cultivate despite rising costs, the fisherman still went out to sea, the teacher continued educating children despite hardships and the doctor, the nurse, the public servant, the labourer and the small businessman, all of them kept this nation functioning when the situation seemed almost impossible. Therefore, before speaking about growth rates and reserves, I believe this House must first pay tribute to the resilience of the people of Sri Lanka.

Sir, against this difficult background, the economic performance in 2025 truly deserves recognition and applause. Most importantly, it means that confidence is slowly returning in this country and that the economy is on the way to recovery. And, confidence is one of the most important and valuable assets this nation could possess. When people lose confidence in their economy, they stop investing, producing and hoping. But when confidence returns, recovery begins.

Sir, the test of economic recovery is simple: does the ordinary person feel the relief? Can families live with dignity? Can people see a future in this country? Can

small businesses survive without fear? The positive answers we see today are what deserve applause and what matter most.

Sir, I must also mention the remarkable contribution made by Sri Lankans working overseas. Once again, worker remittances reached historically high levels and became a major strength for our economy. Many of our brothers and sisters work abroad under difficult conditions. They miss weddings, funerals, birthdays and the precious years of their children growing up. Some work day and night in unfamiliar lands simply to support families back in Sri Lanka. This sacrifice deserves the gratitude of this nation and it is they who display true patriotism. In many ways, our migrant workers have become silent economic heroes of Sri Lanka.

Sir, another positive development has been the strengthening of the external sector. Despite global uncertainty and the widening trade deficit, Sri Lanka continued to maintain a Current Account surplus. The Review also highlights improvements in the financial sector. Banks and financial institutions strengthened their profitability and asset quality. Liquidity and capital buffers remained above regulatory requirements.

Sir, a stable banking system means that depositors feel secure, businesses could obtain credit, entrepreneurs could expand operations and families could invest in homes, education and livelihoods. The expansion of private sector credit during 2025 reflects the gradual revival of economic activity and business confidence.

I also wish to commend the continued efforts towards modernization and reform. The promotion of digital payments, improvements in strong regulatory supervision and measures against money laundering are all necessary steps, if Sri Lanka is to compete in a rapidly changing global economy. Today, nations are judged not by roads and buildings alone, but also by institutional strength, technological readiness, financial credibility and governance standards.

However, Sir, while there is reason for optimism, there is absolutely no room and there shall not be room for complacency. The global environment remains extremely uncertain. The erratic, continued conflict in the Middle East poses risks to energy prices, global trade, tourism and financial flows. Also, climate-related disasters are becoming more frequent and more destructive. Sri Lanka is highly vulnerable to such shocks.

A rise in global oil prices affects transport, electricity, food prices and ultimately, the daily lives of our people. A climate disaster could destroy crops, livelihoods and entire communities within days. Therefore, we must continue to build economic resilience while maintaining fiscal discipline and policy consistency and that, we will certainly do. The mistakes in the past will never be repeated. One important lesson we must learn is that sustainable recovery cannot be built on short-term political popularity alone. Sound economic management, sometimes, requires difficult decisions. But, those decisions will always be accompanied by compassion and social protection. Economic reform without humanity creates resentment. At the same time, unlimited populism giveaways without responsibility destroy nations. As a popular Government, we will balance both responsibility and compassion and that balance is important when supporting vulnerable communities.

Sir, as we move forward, our focus now shifts from mere recovery towards inclusive growth. Growth must not remain concentrated only in urban centres or among a limited segment of society. The benefits of economic progress must reach every corner of this country. Every citizen - the farmer in Anuradhapura, the fisherman in Trincomalee, the plantation worker in Hatton, the trader in Pettah, the teacher in Matara, the entrepreneur in Jaffna - must feel that Sri Lanka is moving forward and moving forward together because economic division eventually becomes social division and social division weakens national unity.

Sir, I particularly wish to speak about our youth. Our young people need more than speeches; they need opportunities, skills, innovation and confidence. Confidence could build successful lives within Sri Lanka itself. If our youth lose faith in this country, no economic statistic could save us. Therefore, development must be people-centred, future-oriented and inclusive. That precisely is the intention and the path of this Government.

Sir, Sri Lanka has suffered greatly in recent years. But, this nation has also shown extraordinary resilience. And today, despite all the challenges before us, Sri Lanka is regaining stability, rebuilding confidence and restoring hope. This progress did not happen accidentally; it came through sacrifice, discipline and reforms during difficult times and above all, through the patience and endurance of the people of Sri Lanka.

Sir, therefore, let us, together, move forward with humility, wisdom and responsibility to strengthen institutions instead of weakening them, to encourage production instead of dependency, to create opportunities instead of divisions and to build a Sri Lanka where economic stability is matched by social justice and national unity.

Let us never forget that the true strength of a country is not measured only by GDP growth or foreign reserves. The true strength of a country lies in the dignity of its people, the hope of its youth, the trust of its institutions and the belief that tomorrow could be better than today. Sri Lanka has endured hardship, faced uncertainty, but is rising again.

Sir, thank you for the time allotted to me.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

The Hon. Sajith Premadasa, Leader of the Opposition. You have 10 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

*අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 11.49]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද විශේෂයෙන්ම රටේ ආර්ථිකය පිළිබඳව පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරන මේ අවස්ථාවේදී රජය පාර්ශ්වයෙන් ඉදිරිපත් කරපු ඒ කරුණු-කාරණා පිළිබඳව අපි පුදුම වෙනවා. අද වනකොට රජය නියෝජනය කරන සියලුදෙනාටම අමතක වෙලා හමාරයි, රුපියල් 9,000ක මාසික විදුලි බිල රුපියල් 6,000 කරනවා; රුපියල් 3,000ක මාසික විදුලි බිල රුපියල් 2,000 කරනවා; සියයට 33කින් විදුලි බිල අඩු කරනවා කියලා ලබා දුන් පොරොන්දු. මේ රටේ 7,500,000ක් පමණ වන විදුලි පාරිභෝගිකයින් ප්‍රමාණයක් අනාථ කරපු ආණ්ඩුවක් තමයි අද මේ රට පාලනය කරන්නේ.

වරායට ගොඩබාන මිලටම මේ රටේ ජනතාවට තෙල් ටික දෙනවා කිව්වා. ඉන්ධනවලින් ඇමතිවරයාට යන කොමිස් මුදල අයින් කරනවා කිව්වා. නිලධාරින්ට යන කොමිස් මුදල අයින් කරනවා කිව්වා. ඉන්ධනවලට අය කරන බදු ටික ඔක්කෝම ඉවත් කරනවා කිව්වා. එසේ කරලා අඩු මිලට තෙල් ටික රටේ ජනතාවට ලබා දෙනවා කියපු ආණ්ඩුව, අද මේ රටේ සමස්ත ජනතාවම බොරුවෙන් -ප්‍රෝඩාවෙන්- ඇන්දවීමෙන් රවටා තිබෙනවා. බලන්න, අද ගොවි ජනතාවට පොහොර ටික නැහැ; ලැබෙන පොහොරත් ගුණාත්මකභාවයෙන් අඩුයි. බාල පොහොර ලැබෙන්නේ. ඒ වාගේම තිබෙන පොහොර සොච්චමත් ඉතාම අධික මිලකට කළුකඩ වෙළෙඳාම හරහා ලැබෙන්නේ.

අපට මතක් වනවා, අද රජය නියෝජනය කරන ප්‍රබලයින් එදා කුඹුරට බැහැලා ගොයම් කකා කියපු දේවල්. වී කිලෝවකට රුපියල් 150ක් දෙනවා කිව්වා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද ගොවියාට පොහොර ටික නැහැ; තෙල් ටික නැහැ; වී සඳහා ස්ථාවර මිලක් නැහැ; වනඅලි-මිනිස් ගැටුමට විසඳුමක් නැහැ. ගොවි ජනතාව සම්පූර්ණයෙන්ම අනාථ වෙලා තිබෙනවා. ධීවර ප්‍රජාවට ලබා දෙනවා කිව්වා, ඉන්ධන සහනාධාරයක්. සහන ක්‍රමවේදයට උපකරණ ලබා දෙනවා කිව්වා. ඒ කියපු දේවලුත් ක්‍රියාත්මක කරලා නැහැ. ජීවන වියදම වැඩි වෙලා, ජීවන බර වැඩි වෙලා, විශ්‍රාමිකයින්ට, වැඩිහිටි ප්‍රජාවට තමන්ගේ ඉතිරිකිරීම්වලට ලැබුණු සියයට 15ක පොලී ආදායමත් -පොලී ප්‍රතිශතයත්- අද අහිමි වෙලා තිබෙනවා. අද කර්මාන්තශාලා වැහෙනවා. එදා ඇඟලුම් කම්හල් 200 වැඩසටහන තුළ මාස් හෝල්ඩින්ස්, බ්‍රැන්ඩික්ස්, හයිඩ්‍රාමනි වාගේ ආයතන හැම තැනකම කර්මාන්තශාලා හැදුවා. අද ඒ ආයතනම ලංකාවේ කර්මාන්තශාලා වහලා ඉන්දියාවට, බංග්ලාදේශයට ගිහිල්ලා ඒ කර්මාන්තශාලා විවෘත කරනවා.

අද අපේ රටේ දුප්පත්කම සියයට 30ත්-40ත් අතර අගයක් ගන්නවා. දුප්පත්කම පෙනි පෙනී මේ රජය දුප්පත් ජනතාව නොසලකා හරිනවා. දුප්පත්කම තුරන් කරන්නට ග්‍රාමීය ජනතාව, නාගරික ජනතාව, වතු ප්‍රජාව වෙනුවෙන් කිසිම පැහැදිලි වැඩසටහනක් ක්‍රියාත්මක කරලා නැහැ. අද ආහාර අනාරක්ෂිතභාවය ඇති වෙලා, ඖෂධ හිඟයක් නිර්මාණය වෙලා, රෝහල්වල උපකරණ හිඟයක් නිර්මාණය වෙලා තිබෙනවා. අද රජයේ රෝහලකින් ශල්‍යකර්මයක් කරගන්න පෝලිමේ ඉන්න ඕනෑ.

අපට ඇහුණා, රුපියල් ලක්ෂ 12කට විටිස් කාර් එකක් දෙනවාය කියපු ඇමතිවරයෙක් අපට චෝදනා කරනවා, අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අකුල් හෙළුවා කියලා. අපි අකුල් හෙළුවේ නැහැ. අපි විරුද්ධ වුණේ, මේ රජයේ ප්‍රතිපත්තිය තුළ අධ්‍යාපන විෂය නිර්දේශයට අසභ්‍ය වීඩියෝ පට ඇතුළත් කිරීම සම්බන්ධවයි. ඒකටයි අපි විරුද්ධ වුණේ. නමුත් අද අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට මොනවාද වෙලා තිබෙන්නේ? පාසල්වලට ලබා දෙන්න තිබෙන smart boards ටික ලබා දෙන්න බැරි ආණ්ඩුවක්; TV sets ටික ලබා දෙන්න බැරි ආණ්ඩුවක්; උපකරණ ලබා දෙන්න බැරි ආණ්ඩුවක්; අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන ඒ මානව සම්පතට අවශ්‍ය නිශ්චිත පුහුණුව ලබා දෙන්න බැරි ආණ්ඩුවක්.

එවන් තත්ත්වයක් තුළ අපි තරයේ විශ්වාස කරනවා, රුපියල් ලක්ෂ 12ට විටිස් කාර් එකක් දෙන්න පොරොන්දු වුණු මේ රජය බොරුකාර, වංචාකාර, ජනතාව අන්දන, රවටන රජයක් බවට දැනටමත් මේ රටේ සමස්ත ජනයා පිළිගෙන හමාරයි කියලා. එදා බලයට එන්න, රුපියල් ලක්ෂ 12ට විටිස් කාර් එකක් දෙනවා කිව්වා. නමුත් අද මොකක්ද වෙන්නේ? ආනයනික වාහනවලට සියයට 50ක අධිභාරයක් පනවනවා. එය 15වැනි දා ප්‍රකාශයට පත් කරලා, 16වැනි දා ඉඳලා බලපවත්වන බව කියනවා. හැබැයි ඒ තොරතුර රජයේ ගජ මිතුරන් කිහිපදෙනෙකුට leak වෙලා, මොකක්ද වුණේ? වාහන 4,000කට ආසන්න සංඛ්‍යාවක් සඳහා ඊට පෙර දා ණයවර ලිපි විවෘත කළා - අපේ රටට බිලියන ගණනක අලාභයක්. ඒ වාගේ බාල වැඩ කරලා තමන්ට මුදල් හොයාගෙන, තමන්ගේ ස්වකීය පෝෂණය, ස්වකීය සුබසාධනය, ස්වකීය සෞභාග්‍ය උදෙසා ලක්ෂ 220ක් වන මේ රටේ ජනතාව බිල්ලට තියන ආණ්ඩුවක් තමයි අද ක්‍රියාත්මක වෙන්නේ.

මම රජයෙන් මෙන්න මේ ප්‍රශ්නය අහන්න කැමැතියි. මහ බැංකු අධිපතිවරයා ප්‍රකාශ කර තිබෙනවා, විශේෂ පනතක් නිසා මහ බැංකුව ස්වාධීනයි, ඒ නිසා මහ බැංකුව අර ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 25 ණය වාරිකය හොර ගිණුමකට යැම පිළිබඳව වග කියන්නේ නැහැ කියලා. මහ බැංකු අධිපතිවරයාම කියනවා, එතුමා ඒකට වග කියන්නේ නැහැ, ඒකට මුදල් අමාත්‍යාංශය තමයි වග කියන්න ඕනෑ කියලා. ඒ කියන්නේ, එතුමා කෙළින්ම ඇඟිල්ල දිගු කරනවා, ජනාධිපතිවරයා ප්‍රමුඛ මුදල් අමාත්‍යාංශයට. ඒ සම්බන්ධයෙන් මොකක්ද රජයේ මතය? රජය ඒ ගැන මොකක්ද කියන්නේ? අපි අහන්න කැමතියි, මහ බැංකු අධිපතිවරයා සිදු කළ ප්‍රකාශයත් සමඟ ජනාධිපතිවරයා ප්‍රමුඛ රජය එකඟද කියලා. ඩොලර් ලක්ෂ 25ක මුදල් ගෙවීම සිදු කළේ කවුද? ඇත්තටම මේ ප්‍රශ්නය පිළිබඳව මහ බැංකුවට වගකීමක් නැද්ද? අපට මේ අවස්ථාවේදී මතක් වෙනවා, වර්තමාන ජනාධිපතිවරයා එදා මහ බැංකුව ස්වාධීන කිරීමේ පනත ගෙනෙනකොට ඒකට විරුද්ධව ඡන්දය දුන් ආකාරය. අපි අහන්න කැමතියි, ජනාධිපතිවරයා ප්‍රමුඛ රජය අදටත් ඉන්නේ ඒ මතයේමද කියලා. එදා මහ බැංකුව ස්වාධීන වෙනවාට විරුද්ධ වුණා. නමුත්, අද රජයේ පාලන තන්ත්‍රය යටතේ ඉන්න මහ බැංකු අධිපතිවරයාම කියනවා, මහ බැංකුව ස්වාධීන නිසා මේවාට වග කියන්න බැහැ කියලා.

ඒ වාගේම අපි මේ ආණ්ඩුවෙන් මේ කාරණයත් දැනගන්න කැමතියි. මහ බැංකු අධිපතිවරයා කියනවා, අපේ රට මූල්‍ය වශයෙන්, ආර්ථික වශයෙන් අමාරු අදියරක ඉන්නේ කියලා. මේකට රජයේ පාර්ශ්වයෙන් ලබා දෙන උත්තරය මොකක්ද? ජනාධිපතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව පැය 24ම රටේ ජනතාවට සුන්දර ලෝකයක් නිර්මාණය කරනවා. අදත් ඒ සුන්දර කථා අපට රාජ්‍ය පාර්ශ්වයෙන් අහන්න ලැබුණා.

නමුත් මම ඔබතුමන්ලාට කියන්න කැමතියි, ගමට යන්න, නගරයට යන්න, ජනතාව අතරට යන්න කියලා. මේ ජන සමාජයේ ඉන්න පුංචි මිනිහාගෙන් අහන්න, එදාට වඩා සුබවාදී රටක් අද නිර්මාණය වෙලා තිබෙනවාද, තමන්ට ඒ නිසි ආදායම, උසස් ජීවන මට්ටම ලැබෙනවාද කියලා. නමුත්, ඔබතුමන්ලාට ඒ ප්‍රශ්න අහන්න හැකියාවක් නැහැ. ඔබතුමන්ලාට ජනතාව අතරට යන්න හැකියාවක් නැහැ. මොකද, බලයට එන්න කියපු කිසිම දෙයක් ක්‍රියාත්මක කරන්නට අද වෙනකොට මේ රජය කටයුතු කරලා නැහැ. රජය ඒකට අපොහොසත් වෙලා තිබෙනවා.

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියලා ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ඔබතුමන්ලා බලයට එන්න ඉදිරිපත් කළා. ඒ නිසා අපි මේ අවස්ථාවේදී රජයට බල කර සිටිනවා, කරුණාකර මේ රටේ ජනතාවට බොරු කරන්නේ නැතුව, ඒ අය රවටන්නේ නැතුව, අන්දවන්නේ නැතුව ඒ පොරොන්දු ටික වහාම ඉටු කරන්න කියලා. ඒ පොරොන්දු ඉටු කරන තෙක් අපි රටේ ජනතාව සමඟ ජනතා අයිතිය වෙනුවෙන් අනිවාර්යයෙන්ම පෙළ ගැහෙනවා කියන කාරණයත් ප්‍රකාශ කරනවා. මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Dr.) Dammika Patabendi. You have 13 minutes.

[මධ්‍යාහ්න 12.00]

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 වසරේ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ආර්ථික විවරණය පදනම් කර ගනිමින් අපේ රටේ ආර්ථිකය සම්බන්ධයෙන් සුනිල් රාජපක්ෂ මැතිතුමා විසින් ඉදිරිපත් කළ සභාව කල් තැබීමේ යෝජනාව පිළිබඳව පවත්වන මේ විවාදයට සම්බන්ධ වෙන්න ලැබීම ගැන මම සතුටු වෙනවා.

2025 වසර කියන්නේ, අපේ රටට විශේෂ වසරක්. දැවැන්ත ආර්ථික අර්බුදයක් විතරක් නොවෙයි, සමාජයීය වශයෙන්, සදාචාරාත්මක වශයෙන් -හැම පැත්තකින්ම- අපේ රට කඩාගෙන වැටිලා තිබුණු මොහොතක අලුත් ආරම්භයක් ගත් වසරක් තමයි, මේ 2025 වසර කියන්නේ.

රටක් හැටියට එම වසරේදී අපි අංශ ගණනාවකින්ම ජයග්‍රහණ ලබා තිබෙනවා.

විශේෂයෙන්ම මේ විවාදයේදී අද අපි සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙන්නේ ඒ ආර්ථික ජයග්‍රහණ සම්බන්ධයෙනුයි. ශ්‍රී ලංකා මහ බැංකුව 2025 වසරේ වාර්ෂික ආර්ථික විවරණය මඟින් හෙළි කර තිබෙනවා, එම වසරේදී මොන වාගේ ආර්ථික ජයග්‍රහණද ලබා ගත්තේ කියන එක. 2025 වසරේ නොවැම්බර් 07වැනි දා තමයි මේ රටේ 82වැනි අය වැය ඉදිරිපත් වුණේ. ඒ, ජාතික ජන බලවේගයේ දෙවැනි අය වැය. 2025 වසරේදී අපට අය වැය 2ක් ඉදිරිපත් කරන්න සිද්ධ වුණා. ඒ, 2025 පෙබරවාරි 17 සහ 2025 නොවැම්බර් 07 කියන දින දෙකේදී. ඊට කලින් මේ රටේ අය වැය 80ක් ඉදිරිපත් කර තිබුණා. නමුත් 2025 වසරේදී අපි සමත් වෙලා තිබෙනවා, අපේ රටේ මෙතෙක් තිබුණු අසතුටුදායක ආර්ථික දත්ත, දර්ශක වෙනස් කරලා නව බලාපොරොත්තු සහිත අය වැයක් මේ රටට ගෙන එන්න. එම නිසා ආර්ථික වශයෙන් මේ රටට බලාපොරොත්තු ගෙන එන්න සමත් වෙච්ච වසරක් හැටියට 2025 වසර අපට සඳහන් කරන්න පුළුවන්.

විශේෂයෙන්ම 82වැනි අය වැයේදී -ජාතික ජන බලවේගය ඉදිරිපත් කරපු තමන්ගේ දෙවැනි අය වැයේදී- අපි සමත් වුණා, අය වැය හිඟය අඩු කරන්න. 2024 වසරේදී අය වැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6.8ක් වෙද්දී, 2025 වසරේදී අපි ඉදිරිපත් කරපු දෙවැනි අය වැයෙන් අය වැය පරතරය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3 දක්වා අඩු කර ගන්න අපට හැකියාව ලැබී තිබෙනවා. මේක විශේෂ සන්ධිස්ථානයක්. 1956 වසරෙන් පසුව අඩුම අය වැය හිඟය වාර්තා කරපු වසර බවට 2025 වසර පත් වෙලා තිබෙනවා.

ඒ වාගේම අපි සමත් වෙලා තිබෙනවා, එම වසරේදී ජංගම ගිණුමේ අතිරික්තයක් වාර්තා කරන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒකත් විශේෂ ජයග්‍රහණයක්. 1987න් පසුව තමයි ප්‍රථම වරට අපේ රටේ ජංගම ගිණුමේ අතිරික්තයක් වාර්තා කරන්න අපට හැකියාව ලැබී තිබෙන්නේ. මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මැතිතුමා පෙබරවාරි මාසයේ 06වැනි දා කොළඹදී පැවති දේශනයකදී මේ සම්බන්ධයෙන් අදහස් පළ කළා. කෘත්‍රිම බුද්ධිය හා ඩිජිටල් ආර්ථික වර්ධනය පිළිබඳව එතුමා සිදු කළ එම දේශනයේදී සඳහන් කළා, මේ රටේ වැඩිම ආදායමක් ඉපැයූ සහ යහපත් මූල්‍ය විනයක් තිබුණු හොඳම වසර දෙක පසුගිය වසර දෙක කියලා. ඒ නිසා 2025 වසර කියන්නේ, අපේ රට ආර්ථිකමය වශයෙන් ජයග්‍රහණ රැසක් වාර්තා කරපු වසරක්. ඉතිහාසය ගත් විට යහපත් මූල්‍ය විනයක් සහ රටේ වැඩිම ආදායමක් ඉපැයූ වසර දෙක හැටියට පසුගිය වසර දෙක වාර්තා වෙලා තිබෙනවා.

ඒ වාගේම එම දේශනයේදී මහ බැංකු අධිපතිවරයා පැවසුවා, ආර්ථික අර්බුදයට කලින් අපේ රටේ භාණ්ඩාගාරය ට්‍රිලියනයක හිඟයක් සහිත භාණ්ඩාගාරයක් බව. නමුත්, 2025 වසරේ අපේ දෙවන අය වැය - අපේ රටේ 82වැනි අය වැය - ඉදිරිපත් කරද්දී ඒක රුපියල් ට්‍රිලියනයක අතිරික්තයක් සහිත භාණ්ඩාගාරයක් බවට පත් කර තිබෙනවා. ඒ වාගේම තමයි, අපි 2025 වසරේදී අපේ රටේ වියදමට වඩා ආදායම වැඩි කරලා තිබෙනවා. මේ ආකාරයට ආර්ථිකමය ජයග්‍රහණ රැසක් 2025 වසරේදී මේ රටට ගෙන එන්න අපට හැකියාව ලැබී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ජයග්‍රහණවල වැදගත්කම කුමක්ද? මීට කලින් කථා කළ මන්ත්‍රීවරු ඒකට අදාළ ආර්ථික දත්ත, සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කළා. මම අවධානය යොමු කරන්න කැමැතියි, මෙහි ඇති සමාජයීය හා දේශපාලනික වැදගත්කම් සම්බන්ධයෙන්. මේ ජයග්‍රහණවල වැදගත්කම කුමක්ද? මෙතෙක් කල් අපේ රටේ ඉඳලා තිබෙනවා, ආර්ථිකය සම්බන්ධ විශේෂඥයන්, විද්වතුන් වාගේම ඒ සම්බන්ධයෙන් ප්‍රාමාණික දැනුමක් සහිත බුද්ධිමතුන්. ඒ සියලු දෙනා ඉඳිද්දීත් අපේ රටේ ආර්ථිය සම්බන්ධයෙන් ගොඩනගලා තිබුණේ අශුභවාදයක්. අපේ රටේ ජනතාව තුළ කවදාවත් අය වැය හිඟය අඩු කරන්න පුළුවන් කියලා විශ්වාසයක් හදලා තිබුණේ නැහැ. අපේ රටේ ජනතාව තුළ හදලා තිබුණු මතය තමයි හැමදාම අය වැය හිඟය වැඩි වෙනවා කියන එක. ඒ වාගේම අපේ රටේ ජනතාව තුළ ආර්ථිකය සම්බන්ධයෙන් හදලා තිබුණු අශුභවාදයේ තව එක පැත්තක් තමයි කවදාවත් වියදමට වඩා ආදායම වැඩි කරන්න බැහැ කියන එක. කවදාවත් භාණ්ඩාගාරය ණයකින් තොරව යන්න බැහැ කියන එක. ඒ නිසා දශක ගණනාවක් පුරා මේ ආර්ථිකය සම්බන්ධයෙන්, අය වැය සම්බන්ධයෙන් අපේ රටේ හදලා තිබුණේ අශුභවාදයක්. මෙන්න මේ අශුභවාදය දශක හතහමාරකට වඩා වැඩි කාලයක් අපේ රටේ ආර්ථිකය

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

සම්බන්ධයෙන් ගොඩ නගලා තිබුණා. ඒ අශුභවාදය වෙනස් කරපු වසර බවට 2025 වසර සනිටුහන් වෙලා තිබෙනවා. ඒක ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඓතිහාසික කාර්ය භාරයක්. අපි විශ්වාස කරනවා, ඒ මතය වෙනස් කරන්න හැකි වීම ජාතික ජන බලවේගය රජය හැටියට අපට සතුටු වෙන්න පුළුවන් අවස්ථාවක් බව. විශේෂයෙන්ම ජාතික ජන බලවේගය රජයේ පළමුවෙනි වසර තුළ මේ ආර්ථිකය සම්බන්ධයෙන් හැදිලා තිබිච්ච, රටේ හැදිලා තිබිච්ච ඒ අශුභවාදය වෙනස් කරලා ශුභවාදය සලකුණු කරන්න හැකි වීම අපි විශ්වාස කරනවා, මේ රටේ ජනතාව ලබපු ජයග්‍රහණයක් බව.

අපේ රටේ ආර්ථික විශේෂඥයෝ, ආර්ථික ඔස්තාර්ලා ඉඳලා තිබෙනවා. ඒ හැම කෙනෙක්ම කළේ මේ ආර්ථික තත්ත්වයන් විග්‍රහ කරන එක. ඔවුන් න්‍යාය පැහැදිලි කළා. හැබැයි, ඒ කිසිවෙකුටත් බැරි වුණා, ප්‍රායෝගිකව මේ ආර්ථිකය ගොඩනගන්න; ආර්ථිකය සාධනීය දෙයක් බවට පත් කරන්න; ආර්ථිකයට ජයග්‍රහණ එක් කරන්න. නමුත් ජාතික ජන බලවේගයේ රජය සමත් වෙලා තිබෙනවා, ප්‍රායෝගිකව කොහොමද ආර්ථිකයක් ගොඩනඟන්නේ, කොහොමද ආර්ථිකයක් නිවැරදිව කළමනාකරණය කරන්නේ, කොහොමද ආර්ථිකයක් සංවර්ධනය කරන්නේ, කොහොමද ආර්ථිකය සම්බන්ධයෙන් තිබිච්ච ඒ අශුභ මතවාදය වෙනස් කරන්නේ කියන එක කරලා පෙන්වන්න. ඒ පාඩම, අත්දැකීම මේ රටට එකතු කරලා තිබෙනවා. ඒක අපි විශ්වාස කරනවා, ඓතිහාසික ජයග්‍රහණයක් කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 වසරේ අපි ලබපු මේ ආර්ථික ජයග්‍රහණවල වැදගත්කම කුමක්ද? මේ ජයග්‍රහණ අපට දශක ගණනාවකදී අත්පත් කර ගන්න බැරි වෙච්ච ජයග්‍රහණ. රටක අය වැයකින්, විශේෂයෙන්ම අපේ රටේ අය වැයකින් කවදාවත් බලාපොරොත්තු විය නොහැකි, ලැබෙයි කියා විශ්වාස නොකරපු ජයග්‍රහණ අපි වසරක් තුළදී ලබා ගෙන තියෙනවා. වසරක් තුළදී ලබාගත් මේ ජයග්‍රහණ සාමාන්‍ය ආර්ථික තත්ත්වයක ඉඳලා ලබපු ජයග්‍රහණ නොවෙයි. ඒක තමයි වැදගත්කම කියලා කියන්නේ. මොකද, සාමාන්‍ය කාලයක, සාමාන්‍ය ආර්ථිකයක් මෙවැනි තත්ත්වයකට ගෙන එන එක පහසු දෙයක්. හැබැයි, අපි ජාතික ජන බලවේගය හැටියට මේ ආර්ථිකයට ජයග්‍රහණ එක් කරලා තිබෙන්නේ මොන වාගේ තත්ත්වයක ඉඳලාද? ඉතිහාසයේ අපේ රටේ නිදහසෙන් පසු අපි මුහුණ දුන්නු දැවැන්තම, බරපතළම ආර්ථික අර්බුදයක ඉඳලා, දැවැන්තම ආර්ථික කඩා වැටීමක ඉඳලා තමයි වසරක් තුළ මේ ජයග්‍රහණ ආර්ථිකයට ගේන්න පුළුවන්කම අපට ලැබිලා තිබෙන්නේ. ඒක තමයි මෙම ජයග්‍රහණවල තියෙන ඊළඟ වැදගත්කම.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ආර්ථික ජයග්‍රහණ ඇතුළේ අපි දකින ඊළඟ වැදගත්කම කුමක්ද? විශේෂයෙන්ම අපි දන්නවා, 2022 වසරේ අපේ රටේ දැවැන්ත ආර්ථික අර්බුදයක් ඇති වුණු බව. අපේ විදේශ සංචිත හිඳිලා රටට තෙල් ටික ගෙන්න ගන්න බැරුව, රටට ගෑස් ටික ගෙන්න ගන්න බැරුව දැවැන්ත ආර්ථික අර්බුදයක් මේ රට තුළ මතු වුණා. ඒ ආර්ථික අර්බුදය විසින් තමයි, 2022 වසරේ ඇති වෙච්ච දැවැන්ත ජනතා අරගළය පැන නැඟුණේ. ඒ අරගළයට හේතු වුණේ මේ ආර්ථික අර්බුදය. ඒ ආර්ථික අර්බුදය හේතුවෙන් ඇති වෙච්ච ඒ ජනතා අරගළය කෙළවර වුණේ, ජනතාව බලාපොරොත්තු නොවුණු ප්‍රතිගාමීත්වය ජයග්‍රහණය කරපු සිදුවීමකින් වුණත්, මේ රටේ ප්‍රගතිශීලී ජනතා ව්‍යාපාරයන්ට ඒ දැවැන්ත ජනතා අරගළය ජයග්‍රාහී මාවතකට හරවන්න පුළුවන්කම ලැබුණා. ඒ නිසා තමයි මේ රටේ ජනතාව ජාතික ජන බලවේගය මේ රටේ ආණ්ඩුකරණය තුළට ඔසවා තැබුවේ. ඒ නිසා ජාතික ජන බලවේගයේ රජයට කාර්ය භාරයන් දෙකක් තිබෙනවා. එකක් තමයි, අන්න ඒ ජනතා අරගළයේ අභිලාෂ ඉෂ්ට කිරීම. අපි ඒ කාර්ය භාර පිළිවෙළට, සැලසුම් සහගතව, එකින් එක ඉෂ්ට කරමින් තිබෙනවා.

අපේ රටේ ජනතාව බලාපොරොත්තු වුණා, මේ රට විනාශ කරපු ඒ වැරැදි දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න. අපි ඒක වෙනස් කරලා තිබෙනවා. අපි මේ රටට ඉතිහාසයේ අලුත් දේශපාලන සංස්කෘතියක් හඳුන්වා දීලා තිබෙනවා. ඒක අපේ රටේ ජනතාව ලබපු ජයග්‍රහණයක්. අපි දන්නවා, මේ රටේ වාමාංශික ව්‍යාපාරය 1935දී ලංකා සමසමාජ පක්ෂයේ ආරම්භයෙන් තමයි සළකුණු වුණේ කියන එක. මේ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීමේ වගකීම පැවරිලා තිබුණේ, ලංකා සමසමාජ පක්ෂය ප්‍රමුඛ ඒ වාමාංශික බලවේගයට. හැබැයි, ඔවුන් අසමත් වුණා, ඔවුන්ගේ කාර්යභාරය ඉෂ්ට කරන්න. මේ වැරැදි සහගත දේශපාලන සංස්කෘතිය වෙනස් කරනවා වෙනුවට ඔවුනුත් ඒ සංස්කෘතියේ ගොදුරු බවට පත් වෙලා, රාජ්‍ය පාලනය, දේශපාලනය, වංචාව, දූෂණය රජ කරන, නාස්තිය රජ කරන, ජනතා මුදල් මංකොල්ල කන, පාදඩ සංස්කෘතියක් බවට පත් කළා. මේ රටේ පැරැණිම වාමාංශික ව්‍යාපාරයටත් වෙනස් කරන්න බැරි වුණු ඒ දේශපාලන සංස්කෘතිය ජාතික ජන බලවේගය රජය වෙනස් කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මේ විපක්ෂයේ කණ්ඩායම් පසුගිය කාලයේ කථා කළා, නේපාලයේ වාගේ නැවත ජනතා නැඟිටීමක් මේ රටේ ඇති වෙයි කියලා. අපි කියනවා, එහෙම ජනතා නැඟිටීමක් ඇති වෙන්නේ නැහැ කියා. එහෙම ජනතා නැඟිටීමක් ඇති වෙන්නේ නැති බවට අපි සහතික වෙනවා. ඒකට හේතුව තමයි, ඒ ජනතා අරගළය ඇති වීමට ප්‍රධාන හේතුව වෙච්ච ආර්ථික අර්බුදයට අපි විසඳුම් ලබා දීලා තිබෙනවා. ජාතික ජන බලවේගයේ පළමු වසර ඇතුළත අපි ඒ ජයග්‍රහණය ගෙනැල්ලා දීලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Dammika Patabendi, could you please wind up?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩියක් ලබා දෙන්න, මම අවසන් කරනවා.

අපි මේ රට වෙනස් අදියරකට ගෙනැල්ලා තිබෙනවා. මේ රටේ ජනතාවගේ බලාපොරොත්තු, දේශපාලන සංස්කෘතියෙන්ද, මේ රටේ ආර්ථික වර්ධනයෙන්ද, සමාජයීය ගුණාංගවලින්ද, පාරිසරික වශයෙන්ද මේ හැම පැත්තකින්ම ඉටු කරන, මේ රට ගොඩනඟන සන්ධිස්ථානයක් බවට 2025 වසර පත් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආර්ථික ජයග්‍රහණවල ඊළඟ වැදගත්කම කුමක්ද? පසුගිය කාලයේ කලාපයේ රටවල් ගණනාවකම ජනතා නැඟිටීම් ඇති වුණා. නේපාලනය, බංග්ලාදේශය, ඉන්දුනීසියාව වාගේ රටවල එහෙම වුණා. හැබැයි, ඒ හැම රටකම ජනතා අරගළවලින් පස්සේ පැහැදිලි වෙනසක්, සැලකිය යුතු වෙනසක්, දේශපාලනයේවත්, ආර්ථිකයේවත් ඇති වෙලා නැහැ. එහෙම ජයග්‍රහණයක් ඒ රටවලට ගෙන එන්න තවම නොහැකි වෙලා තිබෙනවා. හැබැයි, අපේ රටේ තිබෙන

විශේෂත්වය තමයි, අපේ රටේ වසරක් ඇතුළත ජාතික ජන බලවේගයේ පාලන කාලය තුළ ඓතිහාසික වෙනසක් ඇති කරන්න, පුනරුදයක් ඇති කරන්න, අපි සමත් වෙලා තිබෙනවා. ආර්ථිකමය වශයෙන්, සමාජයීය වශයෙන් හා පාරිසරික වශයෙන් ඒ වෙනස ඇති කරලා තිබෙනවා.

අද අපි මේ කථා කරමින් ඉන්නේ, 2025 වසරේ ලබා ගත් ආර්ථික ජයග්‍රහණ සම්බන්ධයෙන්. අපි විශ්වාස කරන විධියට, 2025 වසර කියන්නේ, ආර්ථිකමය වශයෙනුත් අපේ රටේ සන්ධිස්ථානයක්. ඉතින්, ජාතික ජන බලවේගය හැටියට අපි සූදානම්, ඒක සන්ධිස්ථානයක් බවට පත් කරමින්, මේ රටේ ආර්ථිකය දියුණු කරන්න, ජනතාවගේ ආර්ථික ප්‍රශ්න විසඳලා බලාපොරොත්තු සහගත රටක් ගොඩ නඟන්න, පොහොසත් රටක් ගොඩ නඟන්න, ඒ පොහොසත් රට ඇතුළේ මේ රටේ ජනතාවට ලස්සන ජීවිතයක් ලබා දෙන්න. ඒ පණිවුඩය ලබා දෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Kathiravelu Shanmugam Kugathasan. You have eight minutes.

[பி.ப. 12.16]

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இலங்கை மத்திய வங்கியின் 2025ஆம் ஆண்டுக்கான பொருளாதார மீளாய்வு அறிக்கை தொடர்பான எனது கருத்துகளை இந்த அவையிலே எடுத்துரைக்க விழைகின்றேன்.

இலங்கை மத்திய வங்கியின் 2025ஆம் ஆண்டுக்கான பொருளாதார மீளாய்வு அறிக்கை பற்றி பேசும் இந்த வேளையிலே, கடந்த மூன்று ஆண்டுகளில் பொருளாதார அடிப்படையில் இலங்கை அடைந்துள்ள மாற்றங்களைப் பொருளாதார அபிவிருத்திச் சுட்டிகள் மற்றும் புள்ளிவிபரங்களின் அடிப்படையில் ஒப்பிட்டுப் பார்ப்பது பொருத்தமானதாக இருக்குமென நம்புகின்றேன். அந்த வகையில் பார்க்கும்பொழுது, 2023ஆம் ஆண்டில் -2.0% ஆகவிருந்த இலங்கையின் பொருளாதார வளர்ச்சி வீதமானது 2024ஆம் ஆண்டில் +5.0% ஆக உயர்ந்து, 2025ஆம் ஆண்டிலும் அதே வளர்ச்சியைப் பேணி வந்துள்ளது.

2023ஆம் ஆண்டில் 3,818 அமெரிக்க டொலராக இருந்த ஆள்வீத வருமானமானது, 2024ஆம் ஆண்டில் 4,546 ஆக உயர்ந்து, 2025ஆம் ஆண்டில் முதன்முறையாக 5,000 அமெரிக்க டொலரைத் தாண்டியுள்ளது; இது மகிழ்ச்சி தரும் செய்தியாகும். 2023ஆம் ஆண்டில் 17.4% ஆக இருந்த சராசரிப் பணவீக்கமானது, 2024ஆம் ஆண்டில் 1.2% ஆகக் குறைந்து, 2025ஆம் ஆண்டில் -0.5% என்ற பணவாட்ட நிலைக்கு மாறியுள்ளது. இது நுகர்வோருக்கு நன்மையளிப்பதாக அமைந்துள்ளது.

2023ஆம் ஆண்டில் மொத்த உள்நாட்டு உற்பத்தியில் 11.2% ஆகக் காணப்பட்ட அரச வருமானமானது, 2024ஆம் ஆண்டில் 13.6% ஆக உயர்ந்து, 2025ஆம் ஆண்டில் 16.7% ஆகப் பதிவாகியுள்ள அதேவேளையில், 2023ஆம் ஆண்டில் மொத்த உள்நாட்டு உற்பத்தியின் 19.5% ஆகக் காணப்பட்ட அரச செலவுகள் 2025ஆம் ஆண்டில் 19% ஆகக் குறைந்துள்ளமை குறிப்பிடத்தக்கது.

உள்நாட்டு இறைவரித் திணைக்களத்தின் வரி மறுசீரமைப்பின் விளைவாக 2023ஆம் ஆண்டில் 0.6% ஆக இருந்த முதன்மை மிகையானது 2024ஆம் ஆண்டில் 2.2% ஆக உயர்ந்து, 2025ஆம் ஆண்டில் 5.4% என்ற வரலாற்றுச் சாதனை அளவை எட்டியுள்ளது.

வர்த்தகப் பற்றாக்குறையானது, 2023ஆம் ஆண்டில் 4.9 பில்லியன் அமெரிக்க டொலராகவும் 2024ஆம் ஆண்டில் 6.1 பில்லியன் அமெரிக்க டொலராகவும் 2025ஆம் ஆண்டில் 7.9 பில்லியன் அமெரிக்க டொலராகவும் பதிவாகியுள்ளது. அரசின் வெளிநின்ற பொதுப் படுகடனானது, 2023ஆம் ஆண்டில் நாட்டின் மொத்த உள்நாட்டு உற்பத்தியின் 104% ஆகக் காணப்பட்டது. இது 2024ஆம் ஆண்டில் 95.5% ஆகவும் 2025ஆம் ஆண்டில் 91.6% ஆகவும் குறைந்துள்ளது.

2023ஆம் ஆண்டில் இலங்கையில் அண்ணளவாக 737 மில்லியன் அமெரிக்க டொலராக இருந்த வெளிநாட்டு நேரடி முதலீடானது, 2025ஆம் ஆண்டில் ஒரு பில்லியன் அமெரிக்க டொலர் என்ற அளவைத் தாண்டியுள்ளது. இது முதலீட்டாளர்களின் நம்பிக்கை மீண்டும் துளிர்விடத் தொடங்கியுள்ளதை எடுத்துக்காட்டுகின்றது. நாட்டின் சந்தை வட்டி வீதங்கள் 2024ஆம் ஆண்டுடன் ஒப்பிடும்பொழுது 2025ஆம் ஆண்டில் குறைந்துள்ளது. இதனால் பணப்புழக்கமும் அதன் வழி முதலீடுகளும் அதிகரிக்க வாய்ப்பு ஏற்பட்டுள்ளது.

வெளிநாடுகளில் பணிபுரியும் தொழிலாளர்கள் 2023ஆம் ஆண்டில் 5.8 பில்லியன்அமெரிக்க டொலரை இலங்கைக்கு அனுப்பியிருந்தனர். இது 2024ஆம் ஆண்டில் 6.5 பில்லியன் டொலராக உயர்ந்து, 2025ஆம் ஆண்டில் 8.1 பில்லியன் டொலராக மேலும் உயர்ந்துள்ளது. 2023ஆம் ஆண்டில் 2.07 பில்லியன் அமெரிக்க டொலராகக் காணப்பட்ட சுற்றுலாத்துறை வருமானமானது, 2024ஆம் ஆண்டில் 3.1 பில்லியன் அமெரிக்க டொலராகவும் 2025ஆம் ஆண்டில் 3.2 பில்லியன் அமெரிக்க டொலராகவும் உயர்ந்துள்ளது. மேற்படி காரணிகள் 2023ஆம் ஆண்டில் 4.3 பில்லியன் டொலராக இருந்த இலங்கையின் வெளிநாட்டு நாணயமாற்றுக் கையிருப்பை 2024ஆம் ஆண்டில் 6.1 பில்லியன் டொலராகவும் 2025ஆம் ஆண்டில் 6.8 பில்லியன் டொலராகவும் உயர்த்தியுள்ளன.

சமூகக் குறிகாட்டிகளைப் பொறுத்தவரையில், 2023ஆம் ஆண்டில் 4.7% ஆக இருந்த வேலையின்மையானது 2024ஆம் ஆண்டில் 4.4% ஆகவும் 2025ஆம் ஆண்டில் 3.9% ஆகவும் குறைந்துள்ளது. எனினும், தலைக்குரிய வறுமை வீதமானது இன்னும் 24.5% என்ற அறைகூவலான மட்டத்திலேயே காணப்படுகின்றது. மேலும் மனித மேம்பாட்டுச் சுட்டியில் இலங்கை 89ஆவது இடத்திலேயே தொடர்ந்தும் நீடிக்கிறது.

முற்கூறிய தரவுகள் மிகவும் தெளிவான ஒரு செய்தியைச் சொல்லுகின்றன. அதாவது, 2023ஆம் ஆண்டில் சுருங்கிய இலங்கையின் பொருளாதாரமானது 2024 மற்றும் 2025ஆம் ஆண்டுகளில் தொடர்ச்சியான வளர்ச்சியைப் பதிவு செய்துள்ளது. குறிப்பாக ஆள்வீத வருமானம் 5,000 அமெரிக்க டொலரைத் தாண்டியுள்ளமை இலங்கைப் பொருளாதார மீட்சியின் வலுவான அடையாளமாகும்.

2023ஆம் மற்றும் 2024ஆம் ஆண்டுகளோடு ஒப்பிடுகையில், 2025ஆம் ஆண்டில் சில முதன்மையான மாற்றங்கள் நிகழ்ந்துள்ளன. முதலாவதாக, 1995ஆம் ஆண்டிற்குப் பின்பு முதன்முறையாக 2025ஆம் ஆண்டின் முதல் எட்டு மாதங்கள் இலங்கை 'பணவாட்டச்' சூழலை எதிர்கொண்டது. இப்பணவாட்ட நிலை 2025 ஆகஸ்ட் முதல்

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

மீண்டும் நேர்மறையான பணவீக்கத்திற்கு மாறியுள்ளது. மின்கட்டண அதிகரிப்பு மற்றும் 'தித்வா' பேரிடரினால் ஏற்பட்ட பாதகமான நிலைமைகள் இதற்கு முதன்மையான காரணிகளாகும்.

இரண்டாவதாக, கடந்த ஐந்து ஆண்டு காலத் தடையின் பின்னர் 2025ஆம் ஆண்டு சனவரியில் வாகன இறக்குமதிக் கட்டுப்பாடுகள் நீக்கப்பட்டன. இதனால் அரசுக்கு 60% வரி வருமான உயர்வைத் தந்ததோடு, தனியார் துறைக்கான கொடுகடன்களையும் தூண்டியது. இதன் விளைவாக, 2024ஆம் ஆண்டில் 6.1 பில்லியன் அமெரிக்க டொலர்களாக இருந்த வர்த்தகப் பற்றாக்குறையானது, 2025ஆம் ஆண்டில் 7.9 பில்லியன் அமெரிக்க டொலர்களாக உயர்ந்துள்ளது.

மூன்றாவதாக, 2025ஆம் ஆண்டின் இறுதிவரை 95% இற்கும் அதிகமான வெளிநாட்டுக் கடன்கள், மறுசீரமைப்பு ஒப்பந்தங்கள் இறுதி செய்யப்பட்டுள்ளன. இது பன்னாட்டு அரங்கில் இலங்கையின் நற்பெயரை மீளக் கட்டியெழுப்பி உள்ளதோடு, இலங்கையின் கடன் தரப்படுத்தலை CCC+ என்ற நிலைக்கு உயர்த்தியுள்ளது.

நான்காவதாக, அரசின் திட்டங்கள் பொருளாதார உறுதித் தன்மையைப் பேணினாலும், 24.5%ஆன மக்கள் வறுமைக் கோட்டின்கீழ் வாழ்வது ஒரு கசப்பான உண்மையாகும். மத்திய வங்கியின் அறிக்கையில் சுட்டிக்காட்டப்பட்டுள்ள அறைகூவல்களை எதிர்கொள்ள, பின்வரும் பரிந்துரைகளை நான் முன்வைக்கின்றேன்:

உள்நாட்டு இறைவரித் திணைக்களம் மற்றும் சுங்கத் திணைக்களம் ஆகியவற்றை முழுமையாக எண்மிய மயமாக்குவதன் மூலம், வரி வருமானத்தை உயர்த்தலாம். 'தித்வா' சூறாவளி கற்பித்த பாடத்தின் அடிப்படையில், பேரிடர்களைத் தாங்கக்கூடிய வகையில், எமது நாட்டின் உட்கட்டமைப்புகள் மாற்றப்பட வேண்டும். இறக்குமதி எரிபொருட்களை நம்பியிருப்பதைத் தவிர்த்து, புதுப்பிக்கத்தக்க எரிசக்தி இலக்குகளை அடைய ஆவன செய்ய வேண்டும்.

தேயிலை மற்றும் ஆடை ஏற்றுமதிகளுக்கு அப்பால், பிராந்தியப் பொருளாதாரக் கூட்டாண்மை முதலிய பிராந்திய வர்த்தக உடன்படிக்கைகளில் இணைவது எமது சந்தையை விரிவுபடுத்த உதவும். 'அஸ்வெசும' திட்டத்தை மேலும் வலுப்படுத்தி, வறுமையில் வாடும் 25%ஆன மக்களுக்கு நேரடி உதவிகள் கிடைப்பதை உறுதிப்படுத்த வேண்டும்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இதுவரையில் இலங்கை மத்திய வங்கியின் 2025ஆம் ஆண்டுக்கான பொருளாதார மீளாய்வு அறிக்கையை அடிப்படையாகக் கொண்டு பொருண்மிய மேம்பாட்டில் ஏற்பட்டுள்ள நேர் மற்றும் மறையான கூறுகளைப் பார்த்தோம்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Kathiravelu Shanmugam Kugathasan, your time is up.

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
Hon. Deputy Speaker, please give me one more minute.

இங்கு ஆய்வுக்கு எடுத்துக்கொள்ளப்பட்ட 18 பொருளாதார அபிவிருத்திச் சுட்டிகளில் 15 சுட்டிகள் சாதகமான நிலையையும், மூன்று சுட்டிகள் பாதகமான நிலையையும் காட்டி நிற்கின்றன. இந்த நிலையில்,

"குணம் நாடிக் குற்றமும் நாடி அவற்றுள்
மிகை நாடி மிக்க கொளல்"

என்ற திருவள்ளுவர் வாக்குக்கு அமைய, கூடுதலான சாதகமான கூறுகள் இருப்பதைக் கருத்திற் கொள்வோம்! 2023ஆம் ஆண்டில் நிலவிய நிச்சயமற்ற தன்மை நீங்கி, இலங்கை இன்று பொருளாதாரத்தில் ஓர் உறுதியான மீட்சிப் பாதையில் பயணிக்கிறது என்பதை எண்ணி, இலங்கையர் நாம் மகிழ்ச்சி அடையலாம் எனக் கூறிக்கொண்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Shantha Pathma Kumara Subasingha. You have ten minutes.

[අ.භා. 12.24]

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තැබීම අවස්ථාවේ විවාදයට එක් වන මේ මොහොතේ විශේෂයෙන් මතක් කරන්න ඕනෑ අපි ආණ්ඩු බලය ලබා ගන්නකොට මේ රට තිබුණු තත්ත්වය, විශේෂයෙන් ආර්ථිකය තිබුණු තත්ත්වය. අපි කවුරුත් දන්නවා ඉතිහාසයේ දරුණුතම ආර්ථික අර්බුදයට රට මුහුණ දීපු අවස්ථාවක තමයි ජාතික ජන බලවේගය ආණ්ඩුව පිහිටුවනු ලබන්නේ. ඒක මොන තරම් අර්බුදයක්ද කිව්වොත් එක පැත්තකින් මිනිස්සුන්ට තුන් වේල කන්න බැරි තත්ත්වයක් තිබුණා. අනෙක් පැත්තෙන් ගෑස් පෝලිම්, තෙල් පෝලිම් තිබුණා. ඒ විතරක් නොවෙයි ගෑස් සිලින්ඩර් පුපුරලා මිනිස්සු මැරුණා, තෙල් පෝලිම්වල ඉඳලා මිනිස්සු මැරුණා. ඒ වාගේ වට පිටාවකින් පසුව තමයි අපට ආණ්ඩුව ලැබෙන්නේ.

ආර්ථික ක්ෂේත්‍රය මොන තරම් අර්බුදයකට ගිහිල්ලා තිබුණාද කියනවා නම්, ආර්ථිකයේ පදනම මොන තරම් දෙදරලා තිබුණාද කියනවා නම් හැම ක්ෂේත්‍රයක්ම, -විදෙස් අංශය වෙන්න පුළුවන්, අපනයන ක්ෂේත්‍රය වෙන්න පුළුවන්, සංචාරක අංශය වෙන්න පුළුවන්- දැඩි අර්බුදයකට ගිය මොහොතක තමයි අපි ආණ්ඩුව ලබා ගත්තේ. ඒ වෙනකොට හිටපු මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් මැතිතුමා 2022 අප්‍රේල් 12වෙනි දා මාධ්‍යයට ඇවිල්ලා කියනවා, "අපට තවදුරටත් විදෙස් ණය ගෙවා ගන්න බැහැ, ඒ නිසා අපි ණය ගෙවන එක නවත්වනවා" කියලා. ඒක ඇත්තක් කරලා 2022 අප්‍රේල් 12වෙනි දා ඉඳලා අපේ රට විදෙස් ණය ගෙවන එක නැවැත්තුවා. ඒක තමයි ඇත්ත. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි කියන්න සතුටුයි අපේ ආණ්ඩුවේ පළමුවෙනි අවුරුද්දේ 2025දී තමයි ඉතිහාසයේ පළමුවෙනි වරට වැඩිම විදෙස් ණය ප්‍රමාණයක්, බිලියන 5.5කට වැඩි විදෙස් ණය ප්‍රමාණයක් ගෙවලා දැම්මේ. ඒක තමයි ඇත්ත. මම හිතන විධියට ඒ කරුණ විතරක්ම වුණත් ප්‍රමාණවත් අපේ ආර්ථික කළමනාකරණයේ ජයග්‍රහණ ගැන කියන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අර්බුදය හමුවේ විවිධ අය විවිධ කථා කිව්වා. අපි ආණ්ඩුව ගන්න පෙර විපක්ෂයේ කණ්ඩායම් විවිධ බොරු, පව් වැපිරුවා. අරහෙම වෙයි, මෙහෙම වෙයි, අත්දැකීම් නැහැ, බුලත් විට කඩයක්වත් කරලා නැහැ

කිව්වා. ඔව්, ඒක ඇත්ත. අපි බුලත් විට කඩයක්වත් කළේ නැහැ තමයි. අපි හරි ආධුනිකයි, ගත්ත ගමන් වැටෙයි, මාසයෙන් වැටෙයි, පෝය දෙකෙන් වැටෙයි, අප්‍රේල් මාසයේ වැටෙයි වාගේ දින වකවානු කිව්වා. ඒ වාගේ පව වරුසාවක් කියලාත් වැඩේ කර ගන්න බැරි වුණා. රටේ ජනතාව අප විශ්වාස කළා. එක පැත්තකින් රටේ දේශපාලන වෙනසක් කරන්නත්, ආර්ථික කළමනාකරණය කරන්නත්, හැම පැත්තකින්ම දැනට තෝරා ගන්න තිබෙන එකම කණ්ඩායම ජාතික ජන බලවේගය කියලා හිතලා අති විශාල ජනතාවක් අපට ඡන්දය දුන්නා. ඒ ඡන්දයෙන් තමයි අපි 2024 ඉඳලා මේ දක්වා ගමන් කරන්නේ. එහි ප්‍රතිඵල මොනවාද?

අද මාතෘකාව ආර්ථිකය නිසා ඒ ආර්ථික ප්‍රතිඵල කිහිපයක් මේ ගරු සභාවට මම ඉදිරිපත් කරන්නම්. පැහැදිලිවම විදෙස් අංශය ගත්තත්, අපනයන ක්ෂේත්‍රය ගත්තත්, සංචාරක ක්ෂේත්‍රය ගත්තත් ඒ හැම පැත්තෙන්ම ඉතිහාසයේ පළමුවෙනි වතාවට වර්ධනයක් තිබෙන්නේ. දළ දේශීය නිෂ්පාදිතය ගැන කථා කළත්, වර්ධනයක් තිබෙන්නේ. විශේෂයෙන් ආර්ථික වර්ධන වේගය සියයට 5ට වඩා ඉහළ අගයක පවත්වාගෙන යන්න අප සමත් වෙලා තිබෙනවා. අපි දන්නවා, පැවැති සමහර ආණ්ඩුවලදී යම් වර්ධන වේගයක් තිබුණ බව. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වර්ධනය පෙන්නුම් කළේ සේවා අංශයෙන්. 2025 වර්ෂයේත් ජාතික ජන බලවේගයේ ආණ්ඩුව යටතේ ඒ ආර්ථික වර්ධනය සියයට 5 දක්වා ඉහළ යනවාත් එක්කම හැම ක්ෂේත්‍රයකම වර්ධනයක් පෙන්නුම් කරනවා. කෘෂිකර්ම ක්ෂේත්‍රය සියයට 1.4ක වර්ධන වේගයක් පෙන්නුම් කරනවා. විශාල වර්ධනයක් පෙන්නුම් කළේ කර්මාන්ත ක්ෂේත්‍රය. කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්ධන වේගය සියයට 7.8යි. ගරු ජනාධිපතිතුමා අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ නිෂ්පාදන ආර්ථිකයක් ගැන කථා කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රට නිෂ්පාදන ආර්ථිකයක් කරා ගමන් කරමින් සිටිනවාය කියලා පෙන්නුම් කරන දර්ශකය තමයි, 2025 වර්ෂයේ කර්මාන්ත ක්ෂේත්‍රයේ සියයට 7.8කින් වර්ධන වේගයක් පෙන්නුම් කිරීම. ඒ විතරක් නොවෙයි, සේවා අංශයේ සියයට 3.3ක වර්ධනයක් පෙන්නුම් කරනවා. ඒ ආදී වශයෙන් ආර්ථික වර්ධන වේගයක් පෙන්නුම් කරනවා විතරක් නොවෙයි, සෑම ක්ෂේත්‍රයකම වර්ධනයක් පෙන්නුම් කරන වර්ෂයක් තමයි 2025 වර්ෂය. ඒ සංක්ෂිප්ත වර්තාව තමයි ගරු සභාවට ඉදිරිපත් කරලා අද මේ විවාද කරන්නේ.

ඒ විතරක් නොවෙයි. ඉතිහාසයේ පළමු වතාවට 2024 වර්ෂයේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඇමෙරිකානු ඩොලර් 4,546 දක්වා වර්ධනය කර ගත්තා. එම අගය 2025 වර්ෂය වනකොට ඇමෙරිකානු ඩොලර් 5,003 දක්වා ඉහළ ගිහින් තිබෙනවා. ඒ කියන්නේ, ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඇමෙරිකන් ඩොලර් 5,000ට වඩා ඉහළ අගයකට ගෙනෙන්න අප 2025 වර්ෂයේ සමත් වෙලා තිබෙනවා.

ඊළඟට, සංචාරක කර්මාන්තය ගැන බලමු. සංචාරක කර්මාන්තයේ දිගටම ප්‍රශ්න තිබුණා. ආර්ථික අර්බුදයත් එක්ක අපේ සංචාරක කර්මාන්තය වේගයෙන් කඩා වැටුණා. එහිදී හැමෝම හිතුවා, අපේ රටේ සංචාරක ක්ෂේත්‍රය බිඳ වැටෙයි, නැවත ගොඩනඟන්න බැරි වෙයි කියලා. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2024 වර්ෂයේදී සංචාරකයන්ගේ පැමිණීම 2,005,000යි. 2025 වර්ෂයේදී 2,306,000යි. ඒ කියන්නේ, 2025 වර්ෂයේදී මිලියන 2.36ක් දක්වා සංචාරකයන්ගේ පැමිණීමේ වර්ධනයක් සිදු වුණා. එය ආර්ථික ප්‍රගතිය පෙන්වන තවත් සුවිශේෂී කාරණයක්.

ඊළඟට, විදේශ ප්‍රේෂණවල තත්ත්වය බලන්න. විදේශගත ශ්‍රී ලාංකිකයෝ ඉන්නවා. අපේ රටේ අයියලා, අක්කලා, මල්ලිලා, නංගිලා විදේශ රටවල සේවය කරනවා. පසුගිය කාලයේ මේ රටේ ආණ්ඩු කරපු අය සම්බන්ධව තිබුණු අවිනිශ්චිතතාව නිසා විදේශ ප්‍රේෂණවල අඩුවක් තිබුණා. ඇත්ත නේ. ඒගොල්ලෝ ඉතාම දුක් මහන්සියෙන් හම්බ කරන්නේ. කිලෝමීටර දස දහස් ගණන් දුර තිබෙන විදෙස් රටවලට ගිහින් කකා බිබී නොවෙයි, නොකා නොබී හම්බ කරලා ඒ මිනිස්සු එවපු ඩොලර් ටිකටත් විදපු ආණ්ඩු තිබුණේ. එම නිසාම ඒගොල්ලෝ ගෙවල් දොරවල්වල ඉන්න අම්මා තාත්තාටවත් අවශ්‍ය ප්‍රමාණයට මුදල් එව්වේ නැහැ. හැබැයි, අපේ ආණ්ඩුව යටතේ 2024 වර්ෂයේ විදේශ ප්‍රේෂණ ඇමෙරිකන් ඩොලර් බිලියන 6.6ක් ලැබී තිබෙනවා. 2025 වර්ෂයේ ඇමෙරිකන් ඩොලර් 8.1ක් ලැබී තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විධියට බැලුවාම හැම ක්ෂේත්‍රයකින්ම ආර්ථික වර්ධන වේගයක් තමයි පෙන්නුම් කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ආර්ථික ක්ෂේත්‍රය ඉතා අඩ්ඩඬ්ඩාවට තිබුණේ. ආර්ථිකය හරියට, පෙට්‍රලුත් නැති, ඩීසලුත් නැති, හැම තැනම හප්පා ගෙන යන, දැන් නවතියි, දැන් නවතියි කියන බස් එකක් වාගේ ඇද ගෙන ගියේ. හැබැයි, රටේ ආර්ථික ක්ෂේත්‍රය සාර්ව ආර්ථික ස්ථාවරත්වයකට ගෙනැල්ලා, ආර්ථික ක්ෂේත්‍රයේ පදනම අපි ශක්තිමත් කරලා තිබෙනවා. එය කොච්චර ශක්තිමත්ද කිව්වොත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ආණ්ඩුව භාර ගන්නකොට මහා භාණ්ඩාගාරයේ රුපියල් කෝටි 80,000කට වැඩි OD එකක් තිබුණා. ණය කන්දරාවක් තිබුණේ. හැබැයි, විපක්ෂයේ හෘදය සාක්ෂියක් තිබෙන මන්ත්‍රීවරුන්ට ගිය අය වැයේදී කියන්න සිද්ධ වුණා, භාණ්ඩාගාරය පිරී ඉතිරී යනවා කියලා. කොච්චර ප්‍රමාණයකින්ද? ට්‍රිලියන 1.2යි. ඒ කියන්නේ, කෝටි 120,000කින් රුපියල් පිරුණා. ඒ නිසා තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "දිට්වා" වාගේ අති දැවැන්ත ව්‍යසනයක් ඇති වෙලාත් කිසිම අර්බුදයක් නැති මට්ටමට මේ රට ගෙනෙන්න අපට පුළුවන්කම ලැබුණේ. එය ලංකාව මෑත ඉතිහාසයේ මුහුණ දුන් දැවැන්තම ව්‍යසනයක්. අපි භාණ්ඩාගාරයේ එහෙම ඉතුරුවක් කළා. කෝටි 80,000ක OD එකක් තිබුණා. අපි කෝටි 120,000 -ට්‍රිලියන 1.2 - දක්වා භාණ්ඩාගාරයේ රුපියල් අගය වැඩි කළා. ඒකෙන් කෝටි 50,000ක් "දිට්වා" සුළි කුණාටුවෙන් ආපදාවට ලක් වුණු අපේ රටේ ජනතාවට යළි නැඟිටින්න ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා බෙදලා දුන්නා. ජනතාවට සහන දුන්නා. "සහන පැකේජ්" කියන සංකල්පය ලංකාවට හඳුන්වා දුන්නේ අපේ ආණ්ඩුවෙන්.

ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ මොහොතේ ලෝක මට්ටමින් ගත්තොත් ලෝක අර්බුදයක් තිබෙනවා, මැදපෙරදිග යුද්ධයත් එක්ක. ඒ නිසා සමහර රටවල් වහලා, සමහර රටවල්වල විශ්වවිද්‍යාල වහලා, සමහර රටවල්වල පාසල් වහලා, රාජ්‍ය සේවය ගෙදර ඉඳන් වැඩ කරන තත්ත්වයට පත් කර තිබෙනවා. හැබැයි, අපේ රටේ ඒ අර්බුදය ජනතාව මත පටවන්නේ නැතිව ඉතාම හොඳින් ආර්ථිකය කළමනාකරණය කරලා තිබෙනවා. අද තෙල් පෝලිම් නැහැ, ගෑස් පෝලිම් නැහැ. අවශ්‍ය ප්‍රමාණයට තෙල් ටිකත් තිබෙනවා, ගෑස් ටිකත් තිබෙනවා, විදුලියත් තිබෙනවා.

අර අතැන ඉන්න මන්ත්‍රීතුමා මාධ්‍ය සාකච්ඡා තියලා දිගින් දිගට කිව්වා, "හරියට නම් දැන් විදුලිය කපන්න ඕනෑ, පැය 4ක් කපන්න ඕනෑ, හැබැයි, අනුර දිසානායක විදුලිය කපන්නේ නැහැ" කියලා. ඒක තමයි අපේ ආණ්ඩුවේ වෙනස. ඒගොල්ලන්ගේ ප්‍රාර්ථනාව විදුලිය කපන එක. හැබැයි, අපි විදුලිය කැපුවේ නැහැ. අපි අඛණ්ඩව විදුලිය සපයනවා, අඛණ්ඩව තෙල් සපයනවා, අඛණ්ඩව ගෑස් සපයනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)

විපක්ෂ නායකතුමා කිව්වා පොහොර නැහැ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැවිලි ක්ෂේත්‍රයට විතරක් - තේ වගාවට විතරක් - අවුරුද්දට එක වතාවයි ණය සහනාධාරය දුන්නේ. නමුත් අපි තව වතාවක් - අවුරුද්දට දෙසැරයක් - දෙන්න තීන්දු තීරණ අරගෙන දැන් පොහොර සහනාධාරය ලබා දෙමින් ඉන්නවා. ලජ්ජයි! විපක්ෂ නායකතුමා ඔය පුටුවේ ඉඳගෙන අසත්‍ය කියනවා. කොච්චර අසත්‍ය කියනවාද කිව්වොත්, එතුමා AI තත්ත්වයට වැටිලා. එතුමා සජීවීව ඉන්නවා. හැබැයි, කියනවා ඒ AI ලු. අද ඒ තැනට වැටිලා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

දෙදරා තිබුණු මේ රටේ ආර්ථිකයට අපි ඉතා කෙටි කාලයක් ඇතුළත ඉතාම ශක්තිමත් පදනමක් දාලා තිබෙනවා. මොන ලෝක යුද්ධය ආවත් අපේ රටට ඒකට ඔරොත්තු දීමේ හැකියාව තිබෙනවා. ජාත්‍යන්තර සංවිධාන පවා ඒක ඔප්පු කරලා තිබෙනවා. ඒක ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියනවා, ලෝක බැංකුව කියනවා, ආසියානු සංවර්ධන අරමුදල කියනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Kins Nelson. You have eight minutes.

[අ.භා.1.00]

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ කථා කරන මාතෘකාව දිහා බැලුවාම ආණ්ඩු පාර්ශ්වයේ මැති ඇමතිවරු, මන්ත්‍රීවරු චෝදනා කරනවා අපේ විපක්ෂ නායකතුමා වැරදි දේවල් මේ පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කරනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම විපක්ෂ නායකතුමා පැහැදිලි කර දෙන්නේ අද රටේ තිබෙන තත්ත්වය. ඒක නිහතමානීව අහගෙන ඉඳලා වැරදියි නම් වැරදියි කියන්න. හරි නම් හරි කියලා පිළිගන්න. එහෙම නැතිව ඒවා විවේචනය කරමින්, මේ පෙන්වා දෙන දේවල් වැරදියි කියන එක නොවෙයි කරන්න ඕනෑ. මොකද, එතුමා කථා කරන්නේ ඇත්ත දේවල්.

අද උදේ පොහොර ගැන කථා කළ අවස්ථාවේත් මම කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිතුමා එක්ක ඒ ගැන තර්ක කළේ නැහැ. අද ඇත්තටම රට තුළ පොහොර ප්‍රශ්නයක් තිබෙනවා. මම නියෝජනය කරන්නේ ගොවි ජනපදයක්. මේ වනකොට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී ගොවියාට පොහොර නැති ප්‍රශ්නයක් තිබෙනවා. අප්‍රේල් මාසයේ 20වැනි දා මඩ වැඩ කරන්න වතුර දීලා තිබෙනවා. ගොවියා කොහොම හරි පොහොර ටික හොයාගෙන ගොවියාට අවශ්‍ය කර්තව්‍ය කරගෙන තිබෙනවා. හැබැයි, ගොවියා අදටත් රජයට කියන්නේ, අපෙන් රුපියල් 23,875ක මුදල් අයකරගෙන තිබෙනවා, අඩුම ගණනේ මේකට සරිලන පරිදි පොහොර මිටියක් අපට ලබා දෙන්න කියලායි. ඇමතිතුමාත් ඒක පිළිගත්තා. පොහොර නැති ප්‍රශ්නයක් තිබෙනවා. එහෙම නම්, මේ සල්ලි තියාගෙන ඉන්නේ ඇයි? මේ සල්ලි ටික වහාම ගොවීන්ට ලබා දෙන්න. ගොවි සංවිධාන හරහා සල්ලි එකතු කරගෙන තිබෙනවා; පොහොර මිටි 5ක් දෙනවා කියලා තිබෙනවා. හැබැයි දැන් කියනවා, දෙකහමාරයි දෙන්නේ කියලා. මේ නිසා අද ගොවි ජනතාව අන්ත අසරණභාවයට පත් වෙලා තිබෙනවා.

මේ රටේ වී ගොවීන් කියන්නේ ජාතික ආර්ථිකයට විශාල ශක්තියක් වන පිරිසක්. එතකොට එක පැත්තකින් වී ගොවියා වැටෙනවා කියන්නේ මේ රටේ බත් කන මිනිස්සුන්ට බත් ටික නැති වෙන එකයි. තවත් පැත්තකින් ජාතික ආර්ථිකයට ශක්තියක් දෙන්න බැරි වුණාම අපට මුදල් නැති වෙනවා. ඒ නිසා මේකෙන් දෙපැත්තකට ලොකු හානියක් සිද්ධ වනවා. එක පැත්තකින් පාරිභෝගිකයාට සාධාරණයක් වෙන්නෙත් නැහැ, මේ රටේ බත සපයන වී ගොවියාට සාධාරණයක් වෙන්නෙත් නැහැ, කිසිම කෙනෙකුට සාධාරණයක් වෙන්නෙ නැහැ.

ගොවියා කිසිම වෙලාවක පොහොර සහනාධාරයක් ගැන කථා කළේ නැහැ. නොමිලේ පොහොර දෙන්න කියලාත් නැහැ. පවතින රජයේ ඉන්න නායකයන් දේශපාලන වාසි ගන්න මැතිවරණ සමයේදී කියනවා, නොමිලේ පොහොර ටික දෙනවා කියලා; කිව්වා, පොහොර සහනාධාරය දෙනවා කියලා. හැබැයි, බලයට පත් වුණාට පසුව පොහොර සහනාධාරය දී ගන්නත් බැහැ, පොහොර ටික දී ගන්නත් බැහැ. අන්තිමට අර ගොවියා අන්තර අසරණභාවයට පත් වෙනවා. ගොවියා යෝජනා කරන්නේ මොකක්ද?

අපේ විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා හොඳ යෝජනාවක් ගෙනාවා. එතුමා ගොවි ජනපදවලට ගියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි තමයි පක්ෂයක් විධියට ඉස්සෙල්ලාම ගොවි ප්‍රඥප්තියක් ඉදිරිපත් කළේ. මම නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් තමයි අපි ඒක ආරම්භ කළේ. අපි ඒක ආරම්භ කරලා අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට ඇතුළත් කළා, අපි බලයට පත් වුණොත් අපේ රජයක් තුළින් ගුණාත්මකභාවයෙන් ඉහළ පොහොර මිටියක් රුපියල් 5,000ට වෙළෙඳ පොළෙන් මිලදී ගන්න සලස්වනවා කියලා. අපි කිසිම තැනක කිව්වේ නැහැ, පොහොර සහනාධාරයක් දෙනවා කියලා. අපි කිසිම තැනක කිව්වේ නැහැ, නොමිලේ පොහොර දෙනවා කියලා. ගොවියා එහෙම බලාපොරොත්තු වුණේත් නැහැ. ගොවියා කියන්නේ ස්වශක්තියෙන් නැඟී සිටින බොහොම ආඩම්බර පුද්ගලයෙක්. අද ඒ ගොවියා අන්ත අසරණභාවයට පත් කර තිබෙන නිසා ගොවියාට කරකියා ගන්න දෙයක් නැහැ.

රජයක් විධියට ඔබලාට දැන් බලය තිබෙනවා. මට මතකයි, ඔබලා බලය ගන්න කලින් පොළොන්නරුව දිස්ත්‍රික්කයට ඇවිල්ලා කුඹුරුවලට බැස්සා. ගොවීන් පාරට ගෙන්නුවා. වී කරල් ගෙනැල්ලා කාලා කිව්වා, "අපිට පුළුවන්, වී කිලෝ එකකට රුපියල් 150ක් දෙන්න" කියලා. නමුත් අද එහෙම වෙන්නේ නැහැ. ඒ නිසා අපි යෝජනාවක් කරනවා. පොහොර සහනාධාරය ආදී මේ තිබෙන ඒවා ඔක්කෝම අතහැර දමන්න කෝ. ගුණාත්මකභාවයෙන් ඉහළ පොහොර මිටියක් රුපියල් 5,000කට වෙළෙඳ පොළට දමන්න. අද යූරියා මිටියක් කීයද? යූරියා මිටියක් රුපියල් 18,000යි, 20,000යි. අද රටේ මිල පාලනයක් නැහැ. පසුගිය කාලයේ පොහොර මිටිය රුපියල් 50,000ට ගියා. ඒ කාලයේ ඒ සිද්ධ වුණු දේවල්වල වෙනසක් ඇති කරගන්න ඕනෑ නිසා තමයි ජනතාව ඔබතුමන්ලාට ඡන්දය

දීලා ඔබතුමන්ලා බලයට ගෙනාවේ. හැබැයි, ඔබතුමන්ලාත් ඒ දේම කරනවා නම්, ඔබතුමන්ලාත් ගොවියාට සාධාරණයක් කරන්නේ නැත්නම් ගොවියා කවුරු ළඟටද යන්න ඕනෑ? ගොවියාට අද යන්න තැනක් නැහැ.

ඔබතුමන්ලා කිව්වා මට මතකයි, "අපි හාල් ඇටයක්වත් ආනයනය කරන්නේ නැහැ" කියලා. පවතින තත්ත්වය තුළ මේ යල කන්නයේදී ගොවියාට නිසි ඵලදාවක් ලබා ගන්න පොහොර ටික ලබා දුන්නේ නැත්නම් මොකද වෙන්නේ? අක්කරයකින් නිසි අස්වැන්නක් ලබා ගන්න නම් පොහොර කිලෝ 90ක් පාවිච්චි කරන්න ඕනෑ කියලා රජය කියනවා. හැබැයි, රජය පොහොර සහනාධාරය තුළින් ලබා දෙන්නේ කිලෝ කීයද? කිලෝ 50යි. රජයම කියනවා - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කියනවා - අක්කරයකින් නිසි ඵලදාවක් ගන්න පොහොර කිලෝ 90ක් පාවිච්චි කරන්න කියලා. නමුත් දෙන්නේ කිලෝ 50ක් නම් ඉතුරු ටික හොයා ගන්නේ කොහෙන්ද?

තවම පොහොර සහනාධාරය දීලාත් නැහැ. ඔබතුමන්ලා රුපියල් 25,000ට තව 5,000ක් එකතු කරලා හෙක්ටෙයාරයකට රුපියල් 30,000ක් දෙනවා කිව්වා. ඒක ලබා දීලා තිබෙන්නේ කාටද? අප්‍රේල් මාසයේ 20වැනි දා වෙනකොට මඩ වැඩ කරන්න වතුර ලබා දුන්නා නම්, මේ පොහොර සහනාධාරය ලබා දෙන්න ඕනෑ මඩ වැඩ කරන්න කලින් නේද? දැන් කොච්චර කල් ගිහිල්ලාද? අද වෙනතුරු පොහොර සහනාධාරය දෙන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා මම විශේෂයෙන්ම යෝජනාවක් කරන්න කැමැතියි. මේ පොහොර සහනාධාරය ලබා දීම නවත්වලා, යල කන්නයට බැරි වුණත් මහ කන්නය එනකොටවත් ගුණාත්මකභාවයෙන් ඉහළ පොහොර මිටියක් වෙළෙඳ පොළට ගෙනෙන්න. ඒකට තමයි රජයක් තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Kins Nelson, you have two minutes left.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මේ ගෙනෙන පොහොර ගුණාත්මකභාවයෙන් ඉහළ පොහොරද, නැද්ද කියන එකත් බලන්න ඕනෑ. අපේ ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් ඇහුවා. පසුගිය රජය කාලයේ අසූචි නැවක් අපේ රටට ගෙන්වූවා, ඒකට මොකක්ද වෙලා තිබෙන්නේ කියලා එතුමා ඇහුවා. ඒ කාලයේ අඩුම ගණනේ අසූචි නැවක් හරි අපේ ලංකාවේ මුහුදු තීරයේ සැරිසැරුවා. දැන් පොහොර ඇටයක්වත් නැහැ නේ. පොළොන්නරුව නියෝජනය කරන එක නියෝජ්‍ය ඇමතිවරයෙක් කිව්වා, පසුගිය රජයන් පැවැති කාලවල පොහොර ඇටයක්වත් තිබුණේ නැහැ කියලා. ඒ කාලයේ පොහොර තිබුණා. ඒ කාලයේ කාබනික පොහොර තිබුණා; රසායනික පොහොර තිබුණා. ඒවා තිබුණා. අද තමයි පොහොර නැත්තේ.

මේවා පෙන්වා දෙනකොට ආණ්ඩුවේ සිටින මැති ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් කියනවා, විපක්ෂ නායකතුමා මොනවා කථා කරනවාද දන්නේ නැහැ කියලා. විපක්ෂ නායකතුමා කථා කරන්නේ අද මේ රටේ ජනතාවට තිබෙන දැවෙන ප්‍රශ්න. මේ පාර්ලිමේන්තුවේ අපේ විපක්ෂයේ කණ්ඩායම කිසිම වෙලාවක මේ පාර්ලිමේන්තුවේ තිබෙන වරප්‍රසාදවලට මුවා වෙලා කිසි කෙනෙකුට චෝදනා කරන්නේ නැහැ. මේ කථා කරන මාතෘකාවලට අවස්ථා උදා කර දුන්නේ කවුද? ආණ්ඩුවෙන් නේද? ඔබතුමන්ලා කරන දේවල් අපි පෙන්වා දෙන එක වැරදියිද? ඔබතුමන්ලා හරි දේවල් කරනවා නම්, විපක්ෂයක් විධියට අපිට මෙතැන නැඟිටලා මෙච්චර වෙලා කථා කරන්න අවශ්‍යතාවකුත් නැහැ. අපට කියන්න තිබෙන්නේ, "මේ ප්‍රශ්නයේදී ඔබතුමන්ලා හොඳට කටයුතු කරගෙන යනවා, අනේ තවදුරටත් මෙහෙම කරගෙන යන්න ශක්තිය, ධෛර්යය ලැබෙන්න" කියලායි. හැබැයි, අපට කථා කරන්න දවසින් දවස, දවසින් දවස විවිධ මාතෘකා එනවා. පොළොන්නරුව දිස්ත්‍රික්කය ගත්තොත්, අද සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්පූර්ණයෙන්ම කඩා වැටිලා. පොළොන්නරුව මහ රෝහල ගත්තොත්, MRI Scanner යන්ත්‍රයක් නැහැ. අනුරාධපුරයට ගිහිල්ලා තමයි රෝගීන් ඒ පරීක්ෂණ ටික කරන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Kins Nelson, your time is up.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනුරාධපුරයේ වෛද්‍ය අධිකාරිතුමා පොළොන්නරුව රෝහලට ලියුමක් එවලා තිබෙනවා, අනුරාධපුරයේ MRI Scanner යන්ත්‍රය කැඩිලා මාස 6ක් වෙනවා, තවමත් හදලා නැහැ, එම නිසා මෙම යන්ත්‍රයෙන් scan කර ගන්නා රෝගීන් අනුරාධපුරයට එවන්න එපා කියලා. ඉතින් අපි මේ දේවල් පෙන්වා දුන්නාම ඒක වරදක් විධියට ඔබතුමන්ලා දකිනවාද? මේ, අපි හැමෝටම දැවෙන ප්‍රශ්නයක්. ඔබතුමන්ලාගේ පාක්ෂිකයෝ වෙන්න පුළුවන්, අපේ පාක්ෂිකයන් වෙන්න පුළුවන්, මේවා මේ රටේ ජීවත් වෙලා ඉන්න අහිංසක පුරවැසියන්ගේ ප්‍රශ්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගොවියාගේ ප්‍රශ්නය විසඳන්න වෙනවා. මේ ප්‍රශ්න විසඳන්නේ නැතිව අපට ඉස්සරහට යන්න බැහැ. ගොවියාගේ ප්‍රශ්නය විසඳුවේ නැත්නම් මොකද වෙන්නේ? පසුගිය කාලයක ගොවියා අමනාප කරගෙන තමයි ජනාධිපතිවරයෙකුට රටින් යන්න සිද්ධ වන තත්ත්වයක් පවා උදා වුණේ. අපි එතැනට ගොවියා ගෙනෙන්නේ නැහැ. අපි ගම්වල ඉන්න ගොවීන්ට කියන්නේ නැහැ, පාරට බැහැලා උද්ඝෝෂණ කරන්න කියලා. අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියන්නේ ගොවියාට තිබෙන ප්‍රශ්න විසඳා දෙන්න කියලායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Dr.) Upali Pannilage. You have 13 minutes to speak on today's Adjournment Motion.

[අ.භා.1.09]

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබූ ආර්ථික සමාලෝචන වාර්තාව විශේෂයෙන්ම ජාතික ජන බලවේග ආණ්ඩුවේ ඉතාම වැදගත් සන්ධිස්ථානයක් විධියට මා ප්‍රථමයෙන්ම හඳුන්වා දෙන්න කැමැතියි.

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දශක ගණනාවකට පස්සේ මේ රටේ ජනතාව ඉතාම වැදගත් තීන්දුවක් අරගෙන, 2024 සැප්තැම්බර් මාසයේ පැවති ජනාධිපතිවරණයේදීත්, ඒ වාගේම 2024 නොවැම්බර් මාසයේ පැවති මහ මැතිවරණයේදීත්, එතෙක් මේ රටේ පාලන බලය හොබවපු නැති ජාතික ජන බලවේගයට ජනතාවාදී පාලනයක් සඳහා ආණ්ඩු බලය ලබා දුන්නා. අපි ආණ්ඩු බලය ලබාගෙන සම්පූර්ණ වසරක් හැටියට ගත කළේ 2025 වසරයි. එම නිසා මේ 2025 වසරේ අපේ ගමන් මහ පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික සමාලෝචන වාර්තාව ඉතා වැදගත් දිශානතියක් පෙන්නුම් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වෙනුවෙන් අද මේ විවාදයට එක්වීමට ලැබීම මා ඉතාම වැදගත් අවස්ථාවක් විධියටත් සලකනවා.

මේ මහ බැංකු වාර්තාව මඟින් පෙන්වා දෙන ප්‍රධාන කරුණු පිළිබඳව අපේ අවධානය යොමු වෙන්න ඕනෑ. සංඛ්‍යාලේඛන, වගු, ප්‍රස්තාර මෙන්ම ආර්ථික විද්‍යාවේ එළිදක්වන පාරිභාෂිත ශබ්ද මාලාවට එහා ගිය සමාජ, ආර්ථික, දේශපාලන ක්‍රියාවලියක් මේ වාර්තාව තුළින් ගම්‍ය කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි ප්‍රධාන වශයෙන් ගත්තොත් මෙහි සඳහන් වනවා, 2025 වර්ෂය තුළ අපේ ආර්ථික වර්ධන වේගය සියයට 5යි කියලා. අපි දන්නවා, වසර කිහිපයකට කලින් අපේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම බංකොලොත් වුණාට පස්සේ අපේ ආර්ථිකය වර්ධනය වසර ගණනාවක් තිස්සේ -වසර 2ක්, 3ක් තිස්සේ- සෘණ අගයක් අරගෙන තිබුණු බව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෘණ ආර්ථිකයක් තිබුණු අපේ රට දැන් සියයට 5ක ආර්ථික වර්ධන වේගයක් අත්පත් කරගෙන තිබෙනවා. අපේ රටේ ස්ථාවරත්වය, අපේ රට ආර්ථික වශයෙන් යම් ගමනක් යමින් තිබෙන බවට වූ ඒ පැහැදිලි සත්‍ය ජනතාවට මේ තුළින් මතු වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඊළඟට ඉතාම වැදගත් තවත් කාරණයක් තිබෙනවා. ඒ, අපේ රටේ උද්ධමනය. අපි දන්නවා, එක් අවස්ථාවක අපේ රටේ ආහාරමය කාණ්ඩයේ උද්ධමනය සියයට සියයකට ආසන්න ප්‍රමාණයක තිබුණා කියලා. ඒ වාගේම සාමාන්‍ය උද්ධමනය සියයට 35කට, 40කට ගිහිල්ලා තිබුණා. සාමාන්‍ය ජනතාව දන්නවා, උද්ධමනය කියන්නේ භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යෑමේ වේගය බව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2005 වර්ෂය තුළ අපේ රටේ භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යෑමේ වේගය අපට සියයට 3කට වඩා අඩුවෙන් - සියයට 2.8කට ආසන්න මට්ටමින් - පවත්වාගෙන යන්න හැකියාවක් ලැබුණා. ඒක තමයි ඒ තුළින් ගම්‍ය වන සමාජ යථාර්ථය, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කිසියම් රටක උද්ධමනය වේගයෙන් වර්ධනය වනවා නම්, භාණ්ඩ හා සේවාවල මිල වේගයෙන් වැඩි වෙමින් පවතිනවා නම් ඒ රටේ ජන ජීවිතවලට ඒක බලපානවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ උද්ධමනය වසරක් තුළ පාලනය කරගෙන තිබීම ඒ රටේ ජන ජීවිතවලට ඉතාම සාධනීය විධියට බලපානවා. මේ ලක්ෂණ මෙහෙම වෙන්නේ, අපි මේ ආර්ථික වර්ධනය අත්පත් කරගෙන තිබෙන්නේ, ඒ වාගේම උද්ධමනය පාලනය කරගෙන තිබෙන්නේ අපේ රටේ විශාල සමාජ, ආර්ථික සංවර්ධනයක් අත්පත් කරගන්නා ගමන්.

මට කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමා කිව්වා, පොහොර සහනාධාරය පිළිබඳව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, අපේ රටේ ජනගහනයෙන් සියයට 24.6ක් පමණම ජීවත් වන්නේ කෘෂි කර්මාන්තයෙන් බව. අහන්නත් බොහොම කනගාටුයි, අපේ රටේ ජනගහනයෙන් එවැනි ප්‍රමාණයක් වන ගොවි ජනතාවට පොහොර සහනාධාරයක් එපා කියන්නේ ඇයි කියලා. මේ රටේ සාතිශය බහුතරයක් වන මේ ගොවි ජනතාවගේ ජීවිත ගැන අපි මීට වඩා කල්පනා කරන්න ඕනෑ. සාමාන්‍යයෙන් හෙක්ටෙයාර ලක්ෂ 8කට ආසන්න ප්‍රමාණයක් මහ කන්නයේත්, හෙක්ටෙයාර 750,000කට ආසන්න ප්‍රමාණයක් යල කන්නයේත් මේ රටේ වී ගොවිතැන කරනවා. මීට කලිනුත් සඳහන් කළා වාගේ, මේ රටේ පොහොර මිටියක - පොහොර හොණ්ඩරයක - සාමාන්‍ය මිල රුපියල් 40,000ට, රුපියල් 45,000ට ගියා කියලා අපි දන්නවා. අපි බලයට එනකොට පොහොර සහනාධාරයක් දෙමින් තිබුණා. වී ගොවීන් සඳහා හෙක්ටෙයාරයකට රුපියල් 15,000ක පොහොර සහනාධාරයක් තමයි තිබුණේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔබතුමාත් දන්නවා, විශේෂයෙන්ම මෑත කාලයේ පවතින මැද පෙරදිග යුද්ධය තත්ත්වයත් එක්ක, තෙල් මිල ඉහළ යෑමේ වේගයත් එක්ක, ලෝක වෙළෙඳ පොළේ පොහොර මිලත් අසීමිත ලෙස ඉහළ ගියා, පොහොර ගෙන්වා ගැනීමට නොහැකි තත්ත්වයක් තිබුණා කියලා. නමුත්, මම ඉතාම වගකීමෙන් මේ කාරණය කියනවා. ජාතික පොහොර ලේකම් කාර්යාලය අපට සඳහන් කරලා තිබෙනවා, මේ යල කන්නයට අවශ්‍ය සියලු පොහොර මේ වනකොට අපේ රටට ගෙනැල්ලා තිබෙන බව. ඒ විතරක් නොවෙයි. අපි බලයට එනකොට තිබුණු හෙක්ටෙයාරයකට රුපියල් 15,000ක් වූ පොහොර සහනාධාරය අපි රුපියල් 25,000 දක්වා වැඩි කළා. මැද පෙරදිග අර්බුදය ආවාට පස්සේ තවදුරටත් ජනතාවට සහන දීම සඳහා ඒ රුපියල් 25,000ක සහනාධාරය අපි රුපියල් 30,000 දක්වා වැඩි කළා, හෙක්ටෙයාරයක් සඳහා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අනුව පොහොර සහනාධාරය පමණක් අපි දෙගුණයකින් වැඩි කරලා තිබෙනවා. අපි මේ රටේ ගොවි ජනතාව බලාගන්න ඕනෑ. මොකද, මේ තත්ත්වය බලපාන්නේ ගොවීන්ට විතරක් නොවෙයි. අපි සාමාන්‍යයෙන් කියනවා, මේ රටේ ඉන්නේ තුන් වේල බත් කන ජනතාවක් කියලා. බොහෝ ග්‍රාමීය ප්‍රදේශවල අදත් යථාර්ථය ඒකයි.

රටේ සහල් මිල පිළිබඳව අපි අවධානය යොමු කරන්න ඕනෑ. අදටත් අපේ රටේ සහල් මිල විශාල වශයෙන් ඉහළ යන්නේ නැතිව තිබෙනවා. මම හොඳටම දන්නවා, මෙවැනි ආර්ථික අර්බුදයක් තුළත් සාමාන්‍යයෙන් රුපියල් 200කට ආසන්නව නාඩු සහල් කිලෝවක මිල තිබෙන බව. මීට කලින් කථා කළ මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපි සහලින් ස්වයංපෝෂිතයි කියලා දශක ගණනාවක් තිස්සේ කිව්වත්, අපි බලයට එනකොටත් රට සහලින් ස්වයංපෝෂිත වෙලා තිබුණේ නැහැ. නමුත්, අපේ රටේ ගොවි ජනතාව අදටත් අපේ රටට අවශ්‍ය සහල් ප්‍රමාණාත්මකව නිෂ්පාදනය කර ගන්නවා. නමුත් සහල් වර්ග කිහිපයක හිඟයක් තිබෙනවා. සමහර වෙලාවට ඒ සහල් වර්ග ලෝකයේ වෙනත් රටවලත් නැහැ. එම නිසා එයට සමාන ආදේශ කිහිපයක් ගෙනෙන එක තමයි අපි කරන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මුළු ජනගහනයෙන් හතරෙන් එකක් වෙච්ච ගොවි ජනතාවගේ ජීවිත පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කරලා කටයුතු කරපු වසරක් තමයි 2025 වසර.

අපි මේ ආර්ථික ජයග්‍රහණ ළඟා කර ගත්තේ ක්ෂේත්‍ර ගණනාවකින්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි සඳහන් කළා වාගේ අපි මේ වර්ෂය අවසන් කරන්නේ අපේ රටේ විදේශීය ක්ෂේත්‍රය තුළ ජංගම ගිණුමේ ඩොලර් බිලියන 1.5කට ආසන්න අතිරික්තයක් වාර්තා කරලා. පසුගිය වර්ෂය තුළ පමණක් අපි ඩොලර් මිලියන 29,000කට වැඩි ප්‍රමාණයක් උපයා ගැනීමට සමත් වුණා. ඒ හැකියාව අපට ලැබුණේ ඒ ක්ෂේත්‍රය අපි දැවැන්ත ලෙස කළමනාකරණය කරමින්, ඒ ක්ෂේත්‍රය නිවැරදිව මෙහෙය වීම හරහායි. ලංකා ඉතිහාසය තුළ වැඩිම සංචාරකයන් ප්‍රමාණයක් පැමිණි නිසා ඩොලර් බිලියන 3.2කට වඩා අපට ආදායම් උපයා ගන්න පුළුවන් වුණා. පසුගිය වසර තුළත් විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් රටවල් ගණනාවකට පුහුණු ශ්‍රමිකයන් විශාල වශයෙන් යැවීමට අපි කටයුතු කළා. එහි

ප්‍රතිඵලයක් විධියටත්, පසුගිය වසර කිහිපයේ ක්‍රියාත්මක වූ කටයුතුවල ප්‍රතිඵලයක් විධියටත් ඩොලර් බිලියන 8.1කට ආසන්න ප්‍රමාණයක් විදෙස්ගත ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ විධියට උපයා ගන්න අපට හැකියාවක් ලැබුණා.

ඒ වාගේම, foreign direct investment - FDI - හැටියට ඩොලර් බිලියනයකට ආසන්න ප්‍රමාණයක් 2025 වර්ෂය තුළ පමණක් අපි උපයා ගත්තා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේවා ඔක්කෝම කරන අතරතුර අර්බුද ගණනාවක් එනවා අපි දැක්කා. ඒ අර්බුදත් සමනය කරගෙන අපට ණය ගෙවන්න සිදු වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් අපේ සමාජයේ කථා වෙනවා, මේ ආර්ථිකය මේ විධියට පවත්වාගෙන ගියොත් අපට 2028දී තමයි ණය ගෙවන්න වෙන්නේ කියලා. නමුත්, සමස්තයක් විධියට ගත්තාම 2025 වර්ෂය තමයි අපි වැඩිම ණය ගෙවපු වර්ෂය. රටක් විධියට අපේ රාජ්‍ය අංශයත්, පෞද්ගලික අංශයත් ලබා ගත් ණයවලින් 2025 වර්ෂය තුළ පමණක් ඩොලර් මිලියන 5,100කට - ඩොලර් බිලියන 5.1කට - ආසන්න ප්‍රමාණයක් ණය ආපසු ගෙවා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම මේ වනකොට කථා බහක් ඇති වෙලා තිබෙනවා, පෞද්ගලික වාහන ආනයනය සහ වාහනවල මිල ඉහළ යෑම පිළිබඳව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට පෙර කොහොමද මේ රට තිබුණේ? වාහන ආනයනය නතර කරලා තිබුණේ. අපි වාහන ආනයනය විවෘත කළා. වාහන ආනයනය විවෘත කිරීමේ ප්‍රතිඵලයක් විධියට මේ වර්ෂයේ මාස කිහිපයක් තුළ ඩොලර් බිලියන 3කට ආසන්න ප්‍රමාණයක් ඒ වෙනුවෙන් පමණක් වැය කරන්න අපට සිද්ධ වුණා. 2025 වර්ෂයේදී ඩොලර් බිලියන 2.1කට ආසන්න මුදල් ප්‍රමාණයක් වාහන ආනයනය වෙනුවෙන් වැය කරන්න අපට සිදු වුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. වාහන ආනයනයට ඩොලර් බිලියන 2.1කුත්, ණය ගෙවන්න ඩොලර් බිලියන 5.1කුත් වැය කරලා, සීමාවකින් තොරව ආනයන රටට ගෙනැල්ලා - ඒ සියල්ල කරලා - තමයි ජංගම ගිණුමේ අපි අතිරික්තයක් වාර්තා කළේ.

දේශීය අංශයෙනුත් අපි එහෙමයි කටයුතු කළේ. අපේ භාණ්ඩාගාරයට මුදල් ලැබෙන ප්‍රධාන ප්‍රභව තුන තමයි, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුව. මේ ගත වුණු වර්ෂය තුළ අපේ රටේ තිබෙන මේ ආයතන 3ම තමන්ගේ ඉලක්ක අබිබවා ආදායම් උපයා ගන්න සමත් වුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේවා නිකම්ම වුණු දේවල් නොවෙයි. මේ, එම ආයතන ඉතා මැනවින්, කාර්යක්ෂමව මෙහෙයවීමේ ප්‍රතිඵල සහ ඒවාට අවශ්‍ය ක්‍රම සැදීමේ ප්‍රතිඵල. එහෙම නැතුව නිකම්ම මේවා වෙන්නේ නැහැ. මේ ආයතන දශක ගණනාවක් තිස්සේ තිබුණු ආයතන. නමුත් ඒවායේ ආදායම් ඉලක්ක ඉක්මවා යන්නට හැකියාව ලැබුණේ අපි ඒ ආයතන නිසි පරිදි මෙහෙයවපු නිසායි. ඒ ආයතනවල කාර්ය මණ්ඩල ඒ සඳහා අපට විශාල වශයෙන් සහාය දැක්වූවා. අපි 2025 වර්ෂයේදී අය වැය ලේඛනය අනුව උපයා ගන්න අපේක්ෂා කළේ රුපියල් බිලියන 4,990යි. නමුත් අපි ඒ ප්‍රමාණයට වඩා රුපියල් බිලියන 500කට ආසන්න මුදල් ප්‍රමාණයක් වැඩිපුර උපයා ගන්න සමත් වුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ආයතන කළමනාකරණය කරමින් ඉතාම වැදගත්, දියුණු සහ විද්‍යාත්මක විධියට රාජ්‍ය පාලනය කරපු නිසායි ඒ ජයග්‍රහණ අපට හිමි කර ගන්න ලැබුණේ. ඒ සියල්ල ඔස්සේ මේ රටේ ලබා ගත්ත ජයග්‍රහණ අපි සමාජ සුබසාධනය පැත්තට යොමු කරමින් ජනතාවට ඒවා පෙරළා ලබා දුන්නා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට මතක ඇති, පසුගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ ආපු "දිට්වා" සුළි කුණාටුවෙන් රටේ විශාල විනාශයක් සිදු වුණු බව. අපි මීට කලින් ස්වාභාවික ව්‍යසනයක් විධියට අහලා තිබුණේ 2004 දෙසැම්බර් 26වැනි දා සිදු වුණු සුනාමි ව්‍යසනයයි. මට මතකයි, සාමාන්‍යයෙන් ඒ වෙලාවේ ඒ ව්‍යසනයෙන් වුණු පාඩුව විධියට ඇස්තමේන්තු කරලා තිබුණේ ඩොලර් බිලියන 1ක් බව. පසුව එයින් සිදු වුණු පාඩුව ඩොලර් බිලියන 1ත්, 2ත් අතර ප්‍රමාණයක් කියලා කිව්වා. නමුත්, මේ "දිට්වා" සුළි කුණාටුව ඇති වුණු අවස්ථාවේදී සිදු වූ පාඩුව ඩොලර් බිලියන 4.1ක්. ඒ කියන්නේ, සුනාමි ව්‍යසනයෙන් සිදු වුණු පාඩුව වාගේ 4 ගුණයක්. එහෙම නැත්නම් අපි පසුව කරපු ඇස්තමේන්තුව අනුව ඒ වාගේ දෙගුණයක විනාශයක් සිදු වුණා. ඒ විනාශයෙන් ආපදාවට පත් ජනතාව වෙනුවෙන් 2025 වසරේදී පමණක් රුපියල් බිලියන 500ක් - රුපියල් කෝටි 50,000ක් - වෙන් කරන්න අපට හැකියාව ලැබුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඉන් පසුව මැද පෙරදිග යුද්ධය ආවා. ඒ යුද්ධය හේතුවෙන් තෙල්, ගෑස් වාගේ දේවල්වල මිල ඉහළ ගියා. ගෝලීය වශයෙන් ආර්ථික අර්බුදයක් ආවා. නමුත්, ඒ තත්ත්වය පාලනය කරන්න අපි 2025 වර්ෂයේදී රාජ්‍ය ණය කළමනාකරණය කරලා මුදල් උපයා ගත්ත නිසා රුපියල් කෝටි 10,000ක් - රුපියල් බිලියන 100ක් - වැය කරන්න පුළුවන් වුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි එහෙමයි සමාජයේ ඒ සහන අවශ්‍ය කොටස්වලට සලකන්නේ.

සාරාංශයක් වශයෙන් කිව්වොත්. 2025 වර්ෂය කියන්නේ ආර්ථික ජයග්‍රහණ රාශියක් මේ සමාජයට ගෙනැත් දුන් වර්ෂයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ ආර්ථික ජයග්‍රහණවල ප්‍රතිඵල අපි සමාජයේ සාමාන්‍ය ජනතාව වෙත මේ වර්ෂය තුළත්, ඉදිරි වර්ෂ කිහිපය තුළත් ඉතාම වේගයෙන් ළඟා කර දෙනවාය කියන කාරණය මතක් කරමින්, මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු ඇමතිතුමාගෙන් පැහැදිලි කර ගැනීමකට මට පොඩි වේලාවක් ලබා දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. Make it brief, Hon. Member.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමා කිව්වා, දැන් ඇති වෙන්න පොහොර ගෙනැල්ලා තිබෙන්නේ කියලා. ගරු ඇමතිතුමනි, අදට මාසයක් වෙනවා යූරියා නැතුව මඩ වැඩ පටන් අරගෙන. මේ ගෙනාපු පොහොර කවදාද අපේ ගොවීන්ට ලබා දෙන්නේ? ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා පොහොර ගෙනැල්ලා තිබෙනවා නම් ඒවා ඉක්මනට දෙන්න. ඒක බොහොම හොඳ දෙයක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Upali Pannilage, would you like to answer that?

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ යල කන්නයට අවශ්‍ය සියලු පොහොර ගෙනැල්ලා තිබෙන්නේ. ඒ පොහොර දැනට බෙදා හරිමින් පවතිනවා. ඕනෑම තැනකින් අපට එක case එකක් අරගෙන කථා කරන්න පුළුවන්. ගොවි ජනතාව එක්ක ගත කරන සාමාන්‍ය පුද්ගලයෙකු විධියට මම දන්නවා, පොහොර බෙදා හැරීමේ කටයුතු කෙරෙන බව. එතුමා කිව්වා, යූරියා නැතුව මඩ වැඩ පටන් අරගෙන අදට මාසයක් වෙනවා කියලා. ඔබතුමාට අවශ්‍ය නම් අපේ මන්ත්‍රීවරු ඒ නිවැරැදි දත්ත ඉදිරිපත් කරයි. මම කියපු කරුණු නැවතත් සනාථ කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ රටේ කිසිම ආකාරයකින් පොහොර හිඟයක් ඇති වෙන්න ඉඩ තියන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Rauff Hakeem. The Floor is yours for seven minutes.

[1.25 p.m.]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

Thank you, Hon. Deputy Speaker.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පෙර කථා කරපු ආචාර්ය උපාලි පන්නිලගේ අමාත්‍යතුමා මැතකදී සිදු වුණු "දිට්වා" සුළි කුණාටුව පිළිබඳවත්, ඒ ආපදාව තුළින් ඇති වුණු අලාභය මීට පෙර සිදු වූ සුනාමියෙන් සිදු වූ අලාභයට වඩා තුන්, හතර ගුණයකින් වැඩි බවත්, ඊට අදාළව එතුමාගේ ආණ්ඩුව හරියාකාරව කටයුතු කරනවා කියා නොයෙකුත් කථා මෙතැන කියන්න පටන් ගත්තා. නමුත් ඇත්ත වශයෙන්ම එතුමා කියන පරිදි ආණ්ඩුවෙන් රුපියල් මිලියන 500ක් නොවෙයි, රුපියල් බිලියන 700කට වඩා මේ වෙනුවෙන් මුදල් වෙන් කර තිබුණත් තවම ප්‍රගතියක් නැති තත්ත්වයක් තමයි අපි දකින්නේ.

උදාහරණයක් විධියට, මේ ආපදා තත්ත්වය නිසා මහනුවර දිස්ත්‍රික්කයේ අලාභයට පත් වුණු පාසල් ගැන මම කියන්නම්. පාසල් 57කට විතර ඒ නිසා සෑහෙන ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වුණා. ඒ පාසල් අතුරින් පාසල් 25ක් වෙන තැන්වලට ගෙන යන්න තීරණය කර තිබුණා. නමුත් ඒ පාසල් 25න් එක පාසලක් පිළිබඳවවත් තවම තීරණයක් අරගෙන නැහැ. එම නිසා ඒ ස්ථානවලම ඒ පාසල් පවත්වාගෙන යනවා. මෑතකදී ඇද හැලුණු වර්ෂාපතනය නිසා ඒ ළමයින්ට ඉගෙනීම් කටයුතු කරගෙන යන්නත් ඉතාම අසීරු තත්ත්වයක් තමයි ඇති වෙලා තිබෙන්නේ. මෑතකදී ගරු ජනාධිපතිතුමා මහනුවර දිස්ත්‍රික් කාර්යාලයට පැමිණිලා මේ පිළිබඳව සාකච්ඡාවක් පැවැත්වූවා. ඒ සාකච්ඡාවේදී පෞද්ගලික අලාභ පිළිබඳව තිබෙන ගනුදෙනු සම්බන්ධයෙන් තමයි අපට කථා කරන්න සිදු වුණේ. ඒවාට අදාළ NBRI වාර්තා ලබා දීම ඉතාම ප්‍රමාදයි. ඒ ආපදාව සිදු වෙලා මේ වනකොට මාස හයක් ගත වෙලා ඉවරයි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූ විද්‍යා අංශයේ නිලධාරීනුත් එකතු වෙලා මේ කටයුත්ත කරනවා කිව්වාට තවමත් ඒක කෙරිලා නැහැ. ඒ වාගේ අකාර්යක්ෂමතාවක් තිබෙනවා.

සුළි කුණාටුවෙන් පසුව ඇති වුණු මේ ප්‍රශ්නය නිසා පාසල් ගණනාවක් වෙනත් තැන්වලට ගෙන යන්න ඕනෑ කියලා කථා කළා. මම උදාහරණයක් විධියට ඒ පාසල් ටික මොනවාද කියන්නම්. පරගල සිංහල විද්‍යාලය - ගම්පොල කලාපය, අල්-හික්මා විද්‍යාලය - ආඩියකඩවත්ත, බරණගල දෙමළ විද්‍යාලය - ගම්පොල කලාපය, කලෛයිමගල් දෙමළ විද්‍යාලය - තෙල්දෙණිය කලාපය, නාමගල් දෙමළ විද්‍යාලය - තෙල්දෙණිය කලාපය, අල්-අක්සා විද්‍යාලය - දෙනුවර කලාපය කියන ඒ පාසල් පවතින තැන්වලින් වෙන තැනකට ගෙන යන්න ඕනෑ කියලා තීරණය කළත්, තවමත් ගොඩනැඟිල්ලක්වත් හදා ගන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. ඒ ආපදාව සිදු වෙලා මේ වනකොට මාස හයක් ගත වෙලා ඉවරයි. ඒකයි අපි කියන්නේ, මේ ආණ්ඩුවේ අකාර්යක්ෂමතාව කියලා. මෙච්චර මුදල් වෙන් කරලා තිබුණත්, විශාල ලෙස පරිත්‍යාග ලැබුණත් ඒවා ඒ කාර්යයට පාවිච්චි නොකරන තත්ත්වයක් තිබීම අපි විවේචනය කළ යුතුව තිබෙනවා.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, அதேமாதிரி இன்னுமொரு விடயத்தை நான் சொல்லவேண்டும். இன்று விவசாயம் சம்பந்தமாக, குறிப்பாக பொலன்னறுவை மாவட்ட நெல் உற்பத்தியாளர்களின் பிரச்சினை சம்பந்தமாக கௌரவ கிங்ஸ் நெல்சன் அவர்கள் எடுத்துச் சொன்னார். இதேமாதிரியான பிரச்சினைதான் அம்பாறை மாவட்டத்திலும் இருக்கின்றது. அம்பாறை மாவட்டத்திலே சென்ற போகத்தில் அறுவடை செய்த நெல்லைக்கூட இன்னும் விற்க முடியாமல் வீடுகளிலே அடுக்கி வைத்திருக்கின்ற நிலைமை ஏற்பட்டிருக்கின்றது. ஒரு கிலோகிராம் நெல்லை 80 ரூபாய்க்குக்கூட விற்க முடியாத நிலைமை இன்று அம்பாறை மாவட்டத்தில் ஏற்பட்டிருக்கின்றது. தற்போது அடுத்த போகமும் ஆரம்பித்து விட்டது. இரண்டு போகங்களுக்குரிய நெல்லையும் விற்பனை செய்ய வேண்டிய பாரிய பிரச்சினை இருக்கின்றது. உரிய கொள்வனவு விலையை அடைய முடியாமல், விலை கூடும் என்ற எதிர்பார்ப்பில் இன்னும் விவசாயிகள் தவித்துக் கொண்டிருக்கின்றார்கள்.

இதற்கிடையில், விவசாயிகளுக்கு மானிய விலையில் வழங்கப்படுகின்ற உரம் சம்பந்தமான பிரச்சினையும் மிகப் பெரிய பிரச்சினையாக மாறியிருக்கின்றது. உலக சந்தையிலே உரத்தினுடைய விலை அதிகரித்து விட்டதென்பது உண்மை. ஆனால், அதை விவாசயிகளுக்குப் பெற்றுக்கொடுக்க வேண்டிய கடமை அரசாங்கத்துக்கு இருக்கின்றது. அதை இன்னும் சரிவரச் செய்யாத காரணத்தால், சாதாரண வெளிச்சந்தையிலே 18,000 - 20,000 ரூபாய் வரை கொடுத்து யூரியா உரத்தைக் கொள்வனவு செய்ய வேண்டிய நிலை ஏற்பட்டிருக்கின்றது. அரசாங்கம் மானியம் கொடுக்கின்ற விடயத்திலும் 50 சதவீதத்தையே மானியமாகக் கொடுக்க முடியும். அதற்கப்பால், இவ்வாறு அதிக விலை கொடுத்தாவது சந்தையிலே உரத்தைப் பெற முடியாத நிலையிலே விவசாயிகள் தவித்துக்கொண்டு இருக்கிறார்கள். அதற்கான தீர்வை அரசாங்கம் பெற்றுத்தர வேண்டும். இன்று நாங்கள் விவாதத்துக்கு எடுத்திருக்கின்ற விடயம் மத்திய வங்கியின் அறிக்கையாக இருந்தபோதும்கூட, விவசாயிகளின் பிரச்சினை சம்பந்தமாக ஒருசில விடயங்களை அவசியம் கருதி, இங்கு கூற வேண்டிய நிலைக்குத் தள்ளப்பட்டிருக்கிறேன் என்பதை நான் சொல்லிக்கொள்ள விரும்புகிறேன்.

Hon. Deputy Speaker, you also dealt with that in your speech. And, it is after a long time that we heard you speak. Once in a way, the Members presiding must take their chance and share their ideas with us. It is very good.

Sir, the talking point today is the inordinate depreciation of the rupee against the dollar. Yesterday's "Daily Mirror" also had a headline, which I referred to

and on which there was a big commotion in the House. The Leader of the House did not want me to go on. When I was reading it as the Pro-tem - the temporary - Chair of the Committee on Public Finance, I pointed out the issue relating to the Central Bank's difficulty in managing the dollar fluctuation. Yesterday's headline news is repeated again today by that newspaper in a special article captioned "Rupee depreciation's double edge" by Dr. Kenneth De Zilwa, Global Business Cycle Economist. There, he clearly states one thing, which I think is very important for us to record here. On the need to have a careful way forward, he says, I quote:

> "The Central Bank faces a delicate balancing act. Defending the anchor requires reserves, but those are low and IMF targets prevent aggressive selling."

The IMF conditions require that you cannot intervene in the foreign exchange market. For the first time, we saw the Central Bank purchasing about 10 to 12 million dollar reserves from the market. That was after a very long time. But, they have now given it up. So, there cannot be such intervention. They also cannot print money, which is also bound by the new Central Bank of Sri Lanka Act. We have given them independence. The Governor had made a very clear position regarding all this.

The article further states, I quote:

> "Allowing depreciation without intervention expands money supply and credit, fueling inflation and thus warranting a tightening cycle for shocks caused by depreciation due to external imbalances and lack of USD cashflows, -"

In economic terms, we call that "stagflation." When we try to control inflation, invariably, the tightening of monetary policies will result in growth being retarded. And, because of that retardation of growth, the Government needs to take some immediate measures.

What happened in fuel imports? Within the first three to four months alone, US Dollars 1.2 billion dollars had been spent on that. That is almost two-thirds the cost of fuel imports for the entire last year! So, that is the extent to which this issue has impacted us. Therefore, some serious note has to be taken. India has taken some preventive measures; the Indian Prime Minister has announced a work-from-home programme for people to conserve fuel. Therefore, we also have to take some drastic measures in order to meet this exigency, Sir.

In the meantime, just a day prior to the imposition of the surcharge on the Customs Import Duty on vehicle imports, some companies had been able to open LCs. How did that happen? That is a serious fraud or a serious corruption involved in this issue. How can somebody open LCs for almost 5,000 vehicles just a day prior to the increase in duties on vehicle imports? So, that is another issue. Earlier, we spoke about sugar imports after there was a reduction of 25 cents in duty, which resulted in Rs. 16 billion being earned by some businessmen. Similar corruption is happening even under this Government. Therefore, that should also be looked into.

Having said that, I conclude, Sir.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Eranga Gunasekara. You have 11 minutes to participate in today's Debate.

[අ.භා. 1.34]

**ගරු එරංග ගුණසේකර මහතා (නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க குணசேகர - நகர அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Urban Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා මහ බැංකුවේ, 2025 වසර සඳහා වූ වාර්ෂික ආර්ථික විවරණය පිළිබඳ කල් තැබීමේ විවාදයට සම්බන්ධ වන වෙලාවේ මම මුලින්ම මේ කාරණය කියන්න ඕනෑ. සාමාන්‍යයෙන් ගම්වල කථාවක් තිබෙනවා නේ, "මළ පෙරේතයින්ට පිරිත් අහගෙන ඉන්න බැහැ" කියලා. බොහෝ වෙලාවට අපේ රටේ විපක්ෂයේ සිටින කණ්ඩායමටත් අද වෙලා තිබෙන්නේ මොකක්ද? දෛනිකව, මාසිකව අපේ රටේ සිදු වන ප්‍රගතිය, අපේ රටේ සිදු වන සංවර්ධනය, ඒ වාගේම අපේ රටේ සිංහල, දෙමළ, බර්ගර්, මුස්ලිම්, මැලේ සියලු ජනතාව එකට එකතුවෙලා යන මේ ගමන ගැන කරන කතා බහ දේශපාලනික වශයෙන් මළ පෙරේතයන් බවට පත්වෙලා සිටින ඒ පිරිසට අද අහගෙන ඉන්න බැරිවෙලා තිබෙනවා. ඒ නිසා අද දවස තුළ අපි මේ විවාදය පවත්වන්නේ මහ බැංකු වාර්තාව පදනම් කරගෙන වුණත්, ඒ අය තමන්ට දැනෙන, නැත්නම් තමන් දන්නා කෑලි ටිකක් අල්ලාගෙන අද දවසේත් සුපුරුදු පරිදි ගජබින්න ටිකක් කියමින් යනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඉදිරිපත් වුණු විශ්ලේෂණය ඇතුළේ අපට, රටට ගතයුතු කරුණු මොනවාද කියන එක මම විශේෂයෙන් අවධානයට ලක් කරවන්න කැමැතියි.

පළමුවන කාරණය මේකයි. අපි බලයට පත්වෙලා අවුරුදු එකහමාරක් වාගේ කාලයක් වෙනවා. ඒ කාලය පුරාමත්, ඊට පෙරත් විපක්ෂයේ අය කිව්වේ, ඒගොල්ලන්ට තමයි අත්දැකීම් තිබෙන්නේ, අපට අත්දැකීම් නැහැ කියලා. ඒගොල්ලෝ කියනවා, අපට වැඩ බැහැ, ඒගොල්ලන්ගේ පැත්තේ තමයි වැඩකාරයෝ ඉන්නේ කියලා. හැබැයි, අපි වැඩකාරයෝද, නැද්ද කියන එක තේරෙන්නේ, - අපි නොවෙයි ලංකාවේ ආයතන ඇතුළේ - විශේෂයෙන්ම මාසිකව, වාර්ෂිකව අත් පත් කරගෙන තිබෙන ප්‍රගතීන් ඇතුළේයි කියන එක මම සඳහන් කරන්නට කැමැතියි.

මේ විශ්ලේෂණය ඇතුළේ තිබෙන පළමු දේ තමයි, දළ දේශීය නිෂ්පාදිතය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම දළ දේශීය නිෂ්පාදිතය 2024දී රුපියල් ට්‍රිලියන 30.1ක් වෙද්දී, 2025 දී, ඒ කියන්නේ වැඩ බැරි, දක්ෂ නැහැ කියලා කිව්ව අපේ ආණ්ඩුව ආවාට පස්සේ රුපියල් ට්‍රිලියන 32.5 දක්වා වර්ධනය කරගෙන තිබෙනවා. වැඩ බැහැ කියපු, දන්නේ නැහැ කියපු ආණ්ඩුව දැන් කරලා තිබෙන දේවල් තමයි මේ. ඒකපුද්ගල ආදායම ගත්තොත්, 2024දී එය ඇමෙරිකානු ඩොලර් 4,546ක් වුණා. නමුත් වැඩ බැහැ, දන්නේ නැහැ කියපු ආණ්ඩුව ඒක ඇමෙරිකානු ඩොලර් 5,003 දක්වා වර්ධනය කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා, ඉතිහාසයේ පළමු වතාවට තමයි ඇමෙරිකානු ඩොලර් 5,000 පැනපු ඒකපුද්ගල ආදායමක් අපි ලබාගෙන තිබෙන්නේ කියලා. ඒ තමයි, දන්නේ නැහැ, හැකියාව නැහැ කියපු ආණ්ඩුව කරලා තිබෙන දේවල්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ ප්‍රේෂණ ගත්තොත්, 2024දී ඇමෙරිකානු ඩොලර් බිලියන 6.6ක් තිබුණා. 2025දී එය ඇමෙරිකානු ඩොලර් බිලියන 8.1ක් බවට වර්ධනය කරගෙන

[ගරු එරංග ගුණසේකර මහතා]

තිබෙනවා. රාජ්‍ය ආදායම ගත්තොත්, 2024දී එය සියයට 13.6ක් වුණා. 2025දී ඒක සියයට 16.7 දක්වා වර්ධනය කරගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි, 2024දී ඩොලර් බිලියන 6.1ක් වුණු නිල සංචිත, 2025 වෙද්දී ඩොලර් බිලියන 6.8ක් දක්වා වර්ධනය කරලා තිබෙනවා. අය වැය හිඟය ගත්තොත්, 2024දී සියයට 6.8ක්ව තිබුණු අය වැය හිඟය 2025දී සියයට 2.3 දක්වා අඩු කරගෙන තිබෙනවා. ඒ වාගේම, සියයට 2.2ක්ව තිබුණු ප්‍රාථමික ගිණුමේ අතිරික්තය, සියයට 5.4 දක්වා වර්ධනය කරගෙන තිබෙනවා.

මේ වාර්තා ඇතුළේ පෙන්වමින් තිබෙන්නේ මොකක්ද? මේ පාර්ලිමේන්තුවේ ඒගොල්ලන්ට තිබෙන කාලයත්, ඒ වාගේම ඒගොල්ලන්ට සම්බන්ධ සමහර මාධ්‍ය ආයතනත්, ඒගොල්ලන්ගේ සමහර ස්ථානත් අරගෙන දවසේ පව කියමින් - බොරු කියමින් - යනවා. ඒ බොරු හැරෙන්න නැවත කියන්න දෙයක් නැති වුණාම තවත් බොරුවක් කියමින් යනවා. ඒ හැර වෙන කිසිම දෙයක් නැහැ. හැබැයි, ඒගොල්ලෝ අපට කිව්වේ මොනවාද? ඒගොල්ලෝ කිව්වා, අපට තේරෙන්නේ නැහැ, අපි දන්නේ නැහැ, අපට හැකියාව නැහැ කියලා. නමුත්, මේ වාර්තා හරහා දෛනිකව ඔප්පු වෙමින් යනවා, අපි මොකක්ද කරන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔව්, අපට අභියෝගයක් තිබෙනවා. මොකද අපි දන්නවා, මේ රටේ සියලු ජනතාව එකට එකතුවෙලා බිඳ වැටුණු රටක් ගොඩනගන්න අපට අවස්ථාව ලබා දීලා තිබෙන බව. ඒ අවස්ථාව තුළ අපි ඉතාම අභියෝගාත්මකව කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම, ඒවා තනි පුද්ගල ජයග්‍රහණ නොවෙයි, සියලුදෙනා සාමූහිකව එකතුවෙලා ලබා ගත් ජයග්‍රහණ. අපට, "පොර" කියන ජාතකය නැහැ. මම තමයි ඔක්කෝම දන්නේ කියන මානසිකත්වය නැහැ. අපි ඔක්කෝම එකට එකතුවෙලා ක්‍රමානුකූලව කළ යුතු දේවල් කරනවා. ඒ වාගේම, විපක්ෂය පැත්තෙන් මොනවා හෝ හොඳ යෝජනාවක් ගෙනාවොත්, අපි ඒකත් ගන්නවා. අර කිව්වා වාගේ අසනීප අපට නැහැ.

ඒ අනුව, ඉදිරි කාලයේදී අපි මුහුණ දිය යුතු අභියෝගයක් තිබෙනවා. ඒ අභියෝගය මේකයි. අපි දන්නවා, දැන් අපට ජාත්‍යන්තර වශයෙන් බලශක්ති අර්බුදයක් ඇවිත් තිබෙනවා කියලා. ඒක අප කැන්දාගත් එකක්වත්, අප උපයා ගත් එකක්වත් නොවෙයි. ලෝකය තුළ අපේ රට වාගේ රටකට බලශක්ති අර්බුදය වාගේ ඒවා එනවා. ලෝකයේ අනෙක් කලාපවලටත් එවැනි අර්බුද ඇවිත් තිබෙනවා. අපි මොකද කරමින් ඉන්නේ? අපි ජනතාවත් එක්ක එකතු වෙමින්, ඒ වාගේම ආණ්ඩුව විධියට එකතු වෙමින් ඒ තත්ත්වය ඉතා හොඳින්, වේගයෙන් කළමනාකරණය කරමින් යනවා. අපි දන්නවා, අපට ඒක අභියෝගයක් බවට පත් වෙලා තිබෙනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ විපක්ෂයේ කථාව බවට පත් වෙලා තිබෙන්නේ රුපියලේ අවප්‍රමාණය පිළිබඳවයි. ඔව්, අපට අභියෝගයක් තිබෙනවා. ඒ නිසා අපි රුපියලේ අවප්‍රමාණ වේගය අඩු කර ගන්න මැදිහත් වෙමින් වැඩ කරගෙන යනවා. ඒ වාගේම අපි දන්නවා, අපේ සමාජය තුළ දරිද්‍රතා රේඛාවෙන් පහළ සැලකිය යුතු ජනතාවක් ඉන්නවා කියලා. මෙවැනි අර්බුද ඇතුළේ ඔවුන් පීඩාවට පත් වෙනවා. "දිට්වා" ව්‍යසනය තුළත් එහෙමයි. බලශක්ති අර්බුදය තුළත් එහෙමයි. හැබැයි, අපේ මේ ජනතාවාදී ආණ්ඩුව මොකක්ද කරන්නේ? අපි පුළුවන් තරම් බලනවා, විශේෂයෙන් දරිද්‍රතා රේඛාවෙන් පහළ ඉන්න ජනතාව අත් නොහැර ඔවුන් එක්ක වැඩ කරන්නේ කොහොමද කියලා.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි ආරම්භ කළ සංවර්ධන වැඩසටහන් තිබෙනවා. මට මතකයි, "දිට්වා" ව්‍යසනය ආපු වෙලාවේ අපි අය වැය ඉදිරිපත් කරලායි තිබුණේ. එදා විපක්ෂ නායකතුමා ඇතුළු සියලු දෙනා මෙතැන බෙරිහන් දුන්නා, අය වැය වෙනස් කරන්න කියලා. හැබැයි, අපි ඒකට මැදිහත් වුණේ නැහැ. අපි ඒ අය වැයට අදාළ සංවර්ධන වැඩ කටයුතු සියල්ල කරමින් තමයි අනෙකුත් සහන කටයුතු කරමින් යන්නේ. අපට ඒක කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ අවුරුදු එකහමාරක් තුළ අපේ ආණ්ඩුව සහ අපේ නිලධාරින් එකතු වෙලා මූල්‍ය විනය පවත්වාගෙන යෑම නිසයි. ඒ වාගේම අපේ රටේ ඇති වුණු ආපදා තත්ත්වයන් අපි ඉතාම හොඳින් කළමනාකරණය කරමින් යනවා. ඒ ක්‍රියාවලිය තුළ තමයි අපට මේ විපක්ෂයේ භූමිකාව දකින්න ලැබෙන්නේ. විපක්ෂය අද දවස තුළත්, ඒ වාගේම පසුගිය කාලය පුරාත් කරමින් ඉන්නේ මොකක්ද? අපට කියන්න වෙන්නේ, අපේ රටේ අපරාධකාරී විපක්ෂයක් තිබෙනවා කියලායි. ඒ අපරාධකාරී විපක්ෂයේ කාර්යභාරය බවට පත් වෙලා තිබෙන්නේ මොකක්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක පැත්තකින් කිව්වා, වැඩ දන්නේ තමන් බව; හැකියාව තිබෙන්නේ තමන්ට බව; දක්ෂකම් ඔක්කොම තිබෙන්නේ තමන්ට බව. හැබැයි දවසින් දවස, මාසයෙන් මාසය, ලෝකයේත්, ලංකාව තුළත් ඔප්පු වෙමින් යනවා, කවුද මේ රටේ ජනතාවත් එක්ක වැඩ කරන්නේ, ආර්ථික වශයෙන් කොහොමද මේ ජයග්‍රහණ ලැබෙන්නේ කියලා. විදේශ සංචිත, විදේශ ප්‍රේෂණ, අපේ රටේ මිනිසුන්ගේ ප්‍රශ්න කළමනාකරණය කර ගන්නේ කොහොමද කියලා ජනතාවාදී ආණ්ඩුවක් විධියට අපි පෙන්වමින් යනවා. ඒක ඔප්පු වෙන්න පටන් අරගෙන තිබෙනවා.

පසුගිය කාලයේත් විපක්ෂයේ මෙතුමන්ලා තවත් බොරුවක් කියමින් ගියා. විපක්ෂ නායකතුමා, "දිට්වා" ව්‍යසනය කාලයේ කොටු රූල් පොතක් අරගෙන ගෙවල් ගාණේ ගියා, ආධාර දෙනවාද කියලා බලන්න. මම විපක්ෂ නායකතුමාට කියනවා, පුළුවන් නම් දැන් ඒ පොත සභාගත කරන්න කියලා. පොඩි පොතක් අරගෙන ලියමින් ගියා නේ, රුපියල් 25,000 ලැබුණාද, රුපියල් 50,000 ලැබුණාද කියලා, ඒ මුදල් ලැබුණාද නැද්ද කියලා අහමින්. ඒ කොටු රූල් පොත පුළුවන් නම් දැන් සභාගත කරන්නකෝ. දැන් ඒක ගේන්නේ නැහැ නේ; දැන් ඒවා ගැන කියන්නේ නැහැ නේ. මොකක්ද ගරු නියෝජ්‍ය කථානායකතුමනි වුණේ? මේගොල්ලන් හිතාගෙන හිටියේ අපත් වැඩ කරන්නේ ඒගොල්ලන් වාගේයි කියලා. ඒ මුදල් දෙනවා කිව්වාට පස්සේ පහුවෙනි දා විපක්ෂ නායකතුමා කථා කරන්න පටන් ගත්තා; කොටු රූල් පොත් අරගෙන ගෙවල් ගාණේ ගියා. දැන් ඒ පොත ගෙනැවිත් සභාගත කරන්න පුළුවන් නේ. දැන් ඒ ගැන ප්‍රශ්න කරන්න පුළුවන් නේ. නමුත්, එහෙම කරන්නේ නැහැ නේ. ඒවා කෝ? ඇයි ඒ?

අපි රටක් විධියට මේ රටේ ජනතාවගේ සල්ලිවලින් රුපියල් 25,000, රුපියල් 50,000, පාසල් ළමුන්ට රුපියල් 25,000 ආදි වශයෙන් දීලා අවසන් කර තිබෙනවා. ආපදාවට පත් වෙච්ච සෑම දිස්ත්‍රික්කයක්ම ගත්තොත්, සියයට 90කට, සියයට 95කට වැඩි ප්‍රමාණයක් දීලා තිබෙනවා. ඇත්තටම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එය සියයට 95ක් වෙලා තිබෙන්නේත් සමහර ඒවාට අදාළව සුදුසුකම් නැති නිසා මිස වෙන දෙයක් නිසා නොවෙයි. අද රවුෆ් හකීම් හිටපු අමාත්‍යවරයා ඒ ටික කියන්නේ නැහැ. මේ වෙද්දී ආපදාවට පත් වෙච්ච දිස්ත්‍රික්කවල නිවස අර්ධ හානියට පත් වෙච්ච කෙනාට රුපියල් ලක්ෂ 5කුත්, පූර්ණ හානි වෙච්ච කෙනාට රුපියල් ලක්ෂ 50කුත් දෙමින් යනවා. හැබැයි, මේක ක්‍රියාවලියක්. මොකද, මේ දෙන්නේ රටේ සල්ලි. වෙනදා වාගේ අපේ කොළයකින් අරයාට දෙන්න, මෙයාට දෙන්න කියලා දෙන්නේ නැහැ. අපි අදාළ නිලධාරින් එක්ක නිශ්චිත තොරතුරු සහතික කරමින් යනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා සමහර ලිපි ලේඛන මිනිසුන් ගාව ඒ විධියටම නැහැ කියලා. ඒ නිසා අපි ඒවා සම්බන්ධයෙනුත් මැදිහත් වෙමින් යනවා.

ඒ අතර, තවත් ඉදි කිරීම් තිබෙනවා. ඒ ඉදි කිරීම් කරන්න ඕනෑකම තිබෙන්නේ තවත් අනතුරක් සිදු නොවන විධියටයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා තමයි අපි NBRI එක හරහා වාර්තා ලබා ගනිමින් ඉන්නේ. ඒ තුළ තවදුරටත් හැකියාව ලබා ගැනීමට තමයි විශ්වවිද්‍යාලවලින් වාර්තා ලබා ගනිමින් ඉන්නේ. එහෙම නම්, මේක ක්‍රියාවලියක්. අපි කෙටි කාලීනව කරන්න පුළුවන් ටික ඉතාම වේගයෙන් කරමින් යනවා. නමුත් අපි දන්නවා, ඒ ජනතාවට ඉක්මනින් සහන ලබා දෙන්න ඕනෑ කියලා. ඒ නිසා තමයි ගරු ජනාධිපතිතුමාම සමහර දිස්ත්‍රික්කවලට ගිහිල්ලා මේ කටයුතු වේගවත් කරන්න මැදිහත් වෙන්නේ. අපි වැඩ කටයුතු කරමින් සිටිනවා. මොකද, ජනතාවගේ පීඩාව පිළිබඳව අපට කම්පනයක් තිබෙනවා. හැබැයි, ඒ කොටස මහ හරිනවා නේ. අප කරමින් ආපු දේවල් තිබෙනවා නේ. විපක්ෂ නායකතුමා ඒ වෙලාවේ ලියපු කොටු රූල් පොත සභාගත කළා නම්, අපට සත්‍ය සොයා ගන්න පුළුවන්. දවසේ බොරු තමයි මෙතැනදී කියන්නේ.

ඊයේ මෙතැන බෙරිහන් දෙන්න පටන් ගත්තා, අපි වාහන 4,000කට LCs open කරලා තිබෙනවා කියලා. ඒගොල්ලන්ගේ මතකයේ තිබෙන්නේ එහෙමයි. මොකද, ඒගොල්ලෝ කළේ එහෙම නේ. ඒගොල්ලන්ගේ ගජ මිතුරු සෙට් එකක් ඉන්නවා නේ. ඒ කාලයේ සමහර බදු පනවද්දීම ඒ අයට කියනවා. කියලා ඒගොල්ලන්ම ගේම ගහගන්නවා. ඒගොල්ලන් හිතන්නේ අපිත් එහෙමයි කියලා. ඒ නිසා තමයි ඊයේ ඇවිල්ලා කියන්න පටන් ගත්තේ, අපි වාහන 4,000කට LCs open කරලා තිබෙනවා කියලා. හැබැයි, අද විපක්ෂ නායකතුමාගේ tone එක මොකක්ද? අද වාහන 4,000ක් කියලා කියන්නේ නැහැ. වාහන වැඩි ප්‍රමාණයක් කියලායි අද කියන්නේ. දැන් බොරුව බාල වෙලා. ඉතින්, ඉහෙම තත්ත්වයක් තිබෙන්නේ. අතට අහුවෙන මොකක් හරි එකකින් දමලා ගහනවා. ඒක බොරුද, නැද්ද කියලාවත් අදාළ නැහැ. ඒ තැනට මේ අය පත් වෙලා ඉන්නවා.

ඊට පස්සේ බලශක්ති ප්‍රශ්නය ආපු වෙලාවේ විපක්ෂයේ මේ කට්ටිය බලාගෙන හිටියේ මොකක් වන කල්ද? මේගොල්ලන් බලාගෙන හිටියා, "අප්පටසිරි මරු තමයි! දැන් තෙල් පෝලිම් හැදෙනවා; ගෑස් පෝලිම් හැදෙනවා; එතැනට ගිහින් අපට දේශපාලනය කරන්න පුළුවන්" කියලා. හරිද? ඒගොල්ලන් තවම දන්නේ නැහැ ජනතාව වෙනස් වෙලා කියලා. විපක්ෂය වෙනස් වෙන්නේ නැති වුණාට ජනතාව වෙනස් වෙලා. ජනතාව දන්නවා, මේ රටේ විපක්ෂයේ හිටපු කණ්ඩායම රට බංකොලොත් කළාම තෙල් පෝලිම්වල හිටපු එකයි, ජාත්‍යන්තර බලශක්ති ප්‍රශ්නයයි කියන්නේ දෙකක් කියලා.

රුපියල අවප්‍රමාණය වීම පිළිබඳවත් දැන් සාකච්ඡා වෙමින් තිබෙනවා. අපිත් ජනතාවත් එකට එකතු වෙලා - සාමූහිකව - මේ අර්බුදය කළමනාකරණය කර ගනිමින් යනවා. මට කියන්න තිබෙන දේ මේකයි. විපක්ෂය හැම දාම දවස දෙක මොනවා හෝ දෙයක් පාර්ලිමේන්තුවේ හෝ එළියේ ඉඳගෙන කියනවා. ඒ හැරෙන්න වෙන කිසිදු දෙයක් කරන්නේ නැහැ. ඒ නිසා විනාශයට පත් වෙලා, අභාවයට පත් වෙලා යන විපක්ෂයක් එක්ක සංවාද කරනවාට වඩා මේ රටේ ජනතාව එක්ක එකට එකතු වෙලා අපි මේ රට ගොඩනඟමු කියන යෝජනාව කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana. You have seven minutes.

[අ.භා. 1.45]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට බෙහෙවින් ස්තුතියි, මට කාලය ලබා දීම පිළිබඳව.

මට කලින් කථා කරපු නියෝජ්‍ය ඇමතිවරයා කිව්වා අපේ විපක්ෂ නායකතුමාගේ කොටු රූල් පොත සභාගත කරන්න කියලා. මීට මාසයකට කලින් "දිට්වා" සුළි කුණාටුවෙන් තමන්ට ලැබුණේ රුපියල් 8,000යි කියලා - විශේෂයෙන්ම ගේ හදාගන්න රුපියල් 8,000ක් පමණයි ලැබුණේ කියලා - ළමයි පස්දෙනෙකු ඉන්න තාත්තා කෙනෙක් ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරියේ තිබෙන ලයිට් කනුවට නැග්ගා. මා ළඟ තිබෙනවා, ඒ සම්බන්ධව හිරු නාළිකාවේ විකාශය වූ වීඩියෝ එක. මේ පාර්ලිමේන්තුවේ එය පෙන්වන්න ඔබතුමා අවසර දෙනවා නම් මම එය පෙන්වන්නම්. කඳුකරයේ ජනතාව තවමත් කුඩාරම්වල ජීවත් වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මේ රටේ අහිංසක මිනිසුන්ගේ බදු මුදල් තමයි මහා භාණ්ඩාගාරයට සහ රජයට ලැබෙන්නේ. ඒ බදු මුදල් මේ ආණ්ඩුව කොහොමද පාලනය කරන්නේ? අද පැහැදිලිවම මේ ආණ්ඩුවේ බැරිකම සහ හොරකම තුළ අපේ රටේ බදු ගෙවන අහිංසක ජනතාවගේ බදු මුදල් නාස්ති වෙමින් පවතිනවා. ඒකට හොඳම උදාහරණය කියන්නම්. මේ සතිය ඇතුළත මේගොල්ලන්ගේ බැරිකම පෙන්වන කාරණය මොකක්ද කියලා මම දැන් කියන්නම්. බලන්න, මෙන්න මේ කාරණය.

A news report published on "The Morning Telegraph" website states, I quote:

> "Immigration Fraud: Rs.9.83M Paid For Fake System
> Immigration fraud probe exposes Rs.9.83 million payment for a digital system that never existed, with CID arresting an IT official."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක තමයි බැරිකම කියන්නේ. පැහැදිලිවම, සතියට සැරයක් මේ රටේ බදු ගෙවන අහිංසක ජනතාවගේ බදු මුදල් මේ විධියට අපට අහිමි වෙනවා. මහ බැංකුවේ අධිපතිවරයා මාධ්‍ය ප්‍රකාශයක් කරමින් කියනවා අපි දැක්කා, මේ රටේ මේ උද්ගත වෙලා තිබෙන කරුණු කාරණා සියල්ල සිදු වන්නේ ලෝකයේ තිබෙන තත්ත්වය මතයි කියලා. හැබැයි, එතුමාට අමතක වෙලා තිබෙනවා ලෝකයේ කිසිම රටක් මිල දී නොගන්නා විධියට වර්තමාන රජය තෙල් මිල දී ගන්නේ බැරලයක් ඩොලර් 280කට බව. බැරලයක් ඩොලර් 280කට අරගෙන මේ ආණ්ඩුව මාසයකට ඩොලර් මිලියන 500කට ආසන්න ප්‍රමාණයක් තෙල්වලට වියදම් කරන කොට, ජනාධිපතිවරයා ඇවිල්ලා කියනවා තෙල් ලීටරයක මිල රුපියල් 700ක් වෙන්න ඕනෑ, ආණ්ඩුව රුපියල් 100ක පාඩුවක් ලබනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ පාඩුව ලබන්නේ වෙන කවුරුවත් නොවෙයි, ඒ පාඩුව ලබන්නේ මේ රටේ බදු ගෙවන ජනතාවයි. බදු ගෙවන ජනතාව ඒ පාඩුව ලබන කොට, ඒ පාඩුව පියවා ගන්න මේගොල්ලන් තෙල් මිල වැඩි කරනවා කියන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පැහැදිලිව අර ගල් අඟුරු වංචාවෙන් වෙච්ච හානිය පියවා ගැනීම සඳහාත්, මේ අයගේ නොහැකියාව පියවා ගැනීම සඳහාත් තෙල් මිල වැඩි කරනවා කියන එකයි. එතකොට විදුලි බිල වැඩි වෙනවා. විදුලි බිල වැඩි වුණාම වතුර බිල වැඩි වෙනවා. වතුර බිල වැඩි වුණාම මේ රටේ

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

සමස්ත නිෂ්පාදන පිරිවැය වැඩි වෙනවා. එතකොට ඒක අපනයනයට බලපානවා. ඊට පස්සේ රටේ සමස්ත ආර්ථිකය කඩාගෙන වැටෙනවා. ඒක මහ බැංකු අධිපතිවරයාට තේරෙන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. මහ බැංකු අධිපතිවරයාට තේරෙන්නේ නැහැ, මේ ආණ්ඩුවේ නොහැකියාව තුළ සහ එතුමාගේ මහ බැංකුවේ නිලධාරින්ගේ නොහැකියාව නිසා ඩොලර් මිලියන 2.5ක් මේ රටට අහිමි වුණා කියලා. ඊට අමතරව නැවත වතාවක් ගෙවීම් කරන්න තිබෙනවා. Treasury එක ගෙව්වා වාගේම මහ බැංකුවත් 7 වතාවක් ගෙවපු ඒ payments ඕස්ට්‍රේලියාවේ අදාළ ආයතනයට ගිහිල්ලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ ආණ්ඩුවට වැරදීම්මයි සිද්ධ වෙන්නේ. මේ ආණ්ඩුවේ වැරදීමෙන්, ජනාධිපතිවරයා ජනාධිපති සමාව දෙනවා නොදෙන්න ඕනෑ පුද්ගලයෙකුට. වැරදීමෙන්, කන්ටේනර් 323ක් නිදහස් කරනවා. වැරදීමෙන්, බාල ගල් අඟුරු ගේනවා. වැරදීමෙන්, ඩොලර් මිලියන 2.5ක් වැරදි account එකකට දානවා. වැරදීමෙන්, ඩොලර් ලක්ෂ 6ක් US Postal Service එකට ගෙවනවා. වැරදීමෙන්, RDA එක දෙපාරක් contractorsලාට රුපියල් මිලියන 280ක් ගෙවනවා. වැරදීමෙන්, "අස්වැසුම" සහනාධාරය වෙනුවෙන් රුපියල් මිලියන 248ක් ගෙවනවා. වැරදීමෙන්, SriLankan Airlines එකේ payment එකක් කරනවා, ඩිරාම් 74,000ක. වැරදීමෙන්, චෙන්නායිවල තිබෙන SriLankan Airlines එකේ Indian Rupees - INR - මිලියන 2.2කට වෙච්ච දෙයක් නැහැ. වැරදීමෙන්, ටෙන්ඩර් පටිපාටියෙන් තොරව ගිහිල්ලා e-passports සකස් කරන්න දෙනවා. අන්න පෝලන්තයෙන් ඒකට පැමිණිලි කර තිබෙනවා. වැරදීමෙන්, Department of Immigration and Emigrationහි අලුතින් ඇති වෙච්ච fraud එකෙන් රුපියල් මිලියන 9.83ක් අපට අහිමි වෙනවා. මේකේ ප්‍රතිඵලය මොකක්ද? පත්තර කියවලා බලන්න. මේකේ ප්‍රතිඵලයක් විධියට අද දිනය වන විට ගොඩනැඟිලි ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල සියයට 25කින් විතර වැඩි වෙලා තිබෙනවා. ඖෂධ, ජලය ඇතුළු සියල්ලකම මිල සියයට 50කින් වැඩි වෙලා තිබෙනවා. අද ග්‍රෑම් 400 කිරිපිටි පැකට් එකක මිල රුපියල් 50කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම, කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 125කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඩොලරයක වටිනාකම රුපියල් 344ක් දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. මෙන්න මෙහෙමයි මේ අය මේ රටේ ක්‍රියා කරන්නේ.

බස්නාහිර පළාතේ ආණ්ඩුකාරතුමා අපි දන්නා කියන මනුස්සයා. එතුමාත් ඉල්ලා අස්වෙන්න හදනවා. ඇයි ඒ? මේ ආණ්ඩුව ගෙන යන ක්‍රියාමාර්ගය පිළිගන්න බැරි නිසා. ජනාධිපති ලේකම් අයින් කරනවා. හරිද? අමාත්‍යාංශ ලේකම්වරු, අමාත්‍යාංශ සභාපතිවරු ඉල්ලා අස් වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එවැනි තත්ත්වයක් තිබියදී මෙන්න තව මෙන්න මේ වාගේ දේවල් ගැනත් කියන්න කනගාටුයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වත්තල නායකකන්ද යහපත් එඬේරා බාලිකා විද්‍යාලය කියන්නේ අවුරුදු 98ක ඉතිහාසයක් තිබෙන, කතෝලික සභාව ආරම්භ කරපු බාලිකා විද්‍යාලයක්. නමුත්, අද ඒ පාසලේ විදුහල්පතිවරිය හැටියට කන්‍යා සොහොයුරියක් පත් කරන්න කියලා ඒ ප්‍රදේශයේ ජනතාව ඉල්ලා සිටිද්දී, මේ ආණ්ඩුව ඒකට ඇහුම්කන් දෙන්නේ නැහැ. ගරු කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන් 2025 ජුලි 02වැනි දා අපේ හනීෆ් යූසුෆ් මැතිතුමාට ලියුමක් ලියනවා. එම ලියුමෙන් නායකකන්ද යහපත් එඬේරා බාලිකා විද්‍යාලය ඇතුළු පාසල් 4ක් ඉදිරිපත් කරලා කියා තිබෙනවා, මෙම පාසලේ විදුහල්පතිවරිය හැටියට කතෝලික කන්‍යා සොහොයුරියක් පත් කරන්න කියලා. එවැනි ඉල්ලීමක් කර තිබියදීත් ආණ්ඩුව ඒකට ඇහුම්කන් දෙන්නේ නැතිව මේ අහිංසක දෙමව්පියන් ඇතුළු දරුවන් පීඩාවට පත් කරලා තිබෙනවා. කතෝලික ජනතාවගේ ඡන්දය අරගෙන, වත්තල ජනතාවගේ ඡන්දය අරගෙන බලයට ආපු ආණ්ඩුව අද මේ ප්‍රශ්නවලට ඇහුම්කන් දෙන්නේ නැහැ. මම මේ ගැන ලජ්ජා වෙනවා. ඒ වාගේම, තව දෙයක් මම කියන්න ඕනෑ. මම ඒ ඇමතිතුමාගේ නම කියන්නේ නැහැ, එතුමා හොඳ මනුස්සයෙක් නිසා. එතුමා මේ උද්ඝෝෂණයට යනවා. හත්දෙවියනේ! එතුමාට උද්ඝෝෂණය කරන්න දෙයක් නැහැ. එතුමාට කරන්න තිබෙන්නේ කතෝලික කන්‍යා සොහොයුරියක් විදුහල්පතිතුමිය විධියට පත් කරන්න කියලා ජනාධිපතිතුමාට කියන්නයි. ඒක කරන්නේ නැතිව උද්ඝෝෂණ කරලා වැඩක් නැහැ. අද ඉස්කෝලේ ඉස්සරහ කළු කොඩි දාලා, උද්ඝෝෂණය කරන්න මේ අහිංසක දෙමව්පියන්ට සිද්ධ වෙලා තිබෙනවා. ඒ දරුවන්ගේ මානසික තත්ත්වය බලන්න. ඒ දෙමව්පියන්ගේ මානසික තත්ත්වය බලන්න. අහිංසක ගුරුවරුන්ගේ මානසික තත්ත්වය බලන්න. මේ වාගේ දැවෙන ප්‍රශ්නයක්වත් විසඳා ගන්න බැරි තරමට අන්තිම ෆේල් ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව පත් වෙලා ඉවරයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Prof.) Ruwan Ranasinghe. You have 11 minutes.

[අ.භා. 1.53]

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)
(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 වසරට අදාළ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ආර්ථික විවරණය පිළිබඳව සාකච්ඡා කරන මේ විවාදයේදී අදහස් දක්වන්නට ලැබීම පිළිබඳව සතුටු වෙනවා.

අද දවසේ මාතෘකාවට එන්න පෙර විශේෂයෙන්ම මම මේ කාරණයත් කිව යුතුයි. විපක්ෂ නායකතුමා ඇතුළුව මේ විපක්ෂයේ යන එන මං නැතිව සිටින මන්ත්‍රීවරු අද මේ පාර්ලිමේන්තුව බොරු කියන්න තෝතැන්නක් බවට පත් කරගෙන තිබෙනවා. විපක්ෂ නායකතුමා උදේ නැඟිටලා කිව්වා පොහොර නැහැ කියලා. පොළොන්නරුවේ, එතුමාගේ මන්ත්‍රීවරයෙකුත් ඒ කියපු ඒවා ඔක්කෝම සාධාරණය කළා මෙතැන. මම හිතන විධියට, විපක්ෂ නායකතුමා කැමති වෙයි එතුමා කියන්නේ ඇත්ත කියලා කියනවාට. අපට වාර්තා වෙලා තිබෙන විධියට, අපි කරලා තිබෙන survey එක අනුව යල කන්නයට ඇති වෙන්න ශ්‍රී ලංකාව තුළ පොහොර තිබෙනවා. මහ කන්නයට අදාළ අවශ්‍ය පොහොර ලබා ගන්න අපි ඒ ප්‍රසම්පාදන කටයුතු කරමින්, රජයක් විධියට මැදිහත් වෙමින් ඉන්නවා; සාකච්ඡා කරමින් ඉන්නවා. රුසියාව එක්කත් පසුගිය දවස්වල ඒ සාකච්ඡා තිබුණා. ඒ වාගේම යම් යම් ස්ථානවල විශාල පොහොර තොග සඟවා තබා ගත්ත අවස්ථා අපට දකින්න ලැබෙනවා. ඒවා හෙළි වෙමින් තිබෙනවා. ඒ වාගේම විපක්ෂ නායකතුමා සඳහන් කළා, ගුණාත්මකභාවයෙන් අඩු පොහොර තිබෙනවාය කියලා. මම අහන්න කැමැතියි, එතුමා මොන lab එකේද ඒ test එක කළේ කියලා. මොකද, ඒ තරම් technical specificationsවලට යනවා නේ, මේවා ගැන. එහෙම නම් කොහේ lab එකේද test කළේ, මොනවාද අඩු criteria කියලා වාර්තා කරන්න අවශ්‍යයි, නිකම් බොරු කියන්නේ නැතුව මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා.

ඒ වාගේම පොළොන්නරුවේ අර මන්ත්‍රීතුමා සඳහන් කළා, සෞඛ්‍ය ක්ෂේත්‍රය කඩා වැටිලාලු, පොළොන්නරුවේ. මම එතුමාට මතක් කරන්න කැමැතියි මේ කාරණය. අපේ රජය බලයට ඇවිල්ලා තවම අවුරුදු එකහමාරයි. විශේෂයෙන්ම පසුගිය සතියේ අපේ රජයට පුළුවන් වුණා අපේ donor ආයතන, ආසියානු සංවර්ධන බැංකුව සම්බන්ධ කරගෙන cath labs 16ක් අලුතින් රටට එකතු කරන්න. මේ අවුරුදු එකහමාර තුළ අලුත් cath labs 16ක් අපේ සෞඛ්‍ය පද්ධතියට එකතු කරන්න අපට පුළුවන් වුණා. අවුරුදු 76කට අපේ රටේ ඒවා තිබුණේ 10යි. ඒ නිසා තමයි අවුරුදු ගණනක් තිස්සේ ඒ සඳහා පෝලිම් හැදිලා තිබෙන්නේ. අන්න එහෙම අපි මේ අවුරුද්දේ කරපු කාර්ය සාධනය තමයි මේ මහ බැංකු වාර්තාවේ තිබෙන්නේ. ඉතින් ඒ නිසා මම ආරාධනා කරනවා විපක්ෂ නායකතුමාට, එතුමාගේ මන්ත්‍රීවරුන්ට, මේක නැවත නැවත කියවන්න කියලා. ශ්‍රී ලංකාවේ මහ බැංකුව 2025 වසරට අදාළව නිකුත් කරලා තිබෙන මෙන්න මේ වාර්තාව නැවත නැවත කියවලා අවබෝධ කර ගන්න උත්සාහ කරන්න, මොනවාද ඒකේ කියලා තිබෙන්නේ කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විපක්ෂ නායකතුමා තවත් පට්ටපල් බොරුවක් කිව්වා. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව - poverty - සියයට 30යිලු. මම දන්නේ නැහැ, විපක්ෂ නායකතුමා කොහෙන්ද ඒ study එක කළේ, කවුද ඒ තොරතුරු දුන්නේ කියලා. හැබැයි UNICEF එක කියන විධියට ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව සියයට 24.5යි. ඒ නිසා මම මුලින් කිව්වා වාගේ පට්ටපල් බොරු කියන ස්ථානයක් බවට මේ පාර්ලිමේන්තුව පත් කරගෙන තිබෙනවා, මේ විපක්ෂයේ මන්ත්‍රීවරු.

ඒ වාගේම දැන් තවත් බොරුවක් කියලා ගියා මෙතැන හිටපු මන්ත්‍රීවරයෙක්. ඒ තමයි වාහන හාරදාහේ කථාව. ඊයේ ඉඳලා ඒ බොරුව සමාජගත කරමින් ඉන්නවා. හැබැයි, දැන් ඒක පොඩ්ඩක් අඩු වෙලා තිබෙනවා. මොකද, බොරුව හෙළිවෙලා තිබෙන්නේ. අපේ නියෝජ්‍ය ඇමතිවරයෙකුත් ඉස්සර වෙලා ඒ කරුණ පැහැදිලි කළා. වාහන ආනයන බද්ද සියයට 50කින් වැඩි කරන්න කලින් වාහන 4,000ක් සඳහා LCs open කරලාලු; මහා ලොකු බොරුවක් සමාජගත කළා. ඉතින්, දවසක්වත් පවතින්නේ නැති බොරු තමයි ජීවත් වීම සඳහා විපක්ෂය දැන් කියමින් ඉන්නේ.

මට කලින් කථා කළ මන්ත්‍රීතුමා කිව්වා, e-passport tender එකේ වංචාවක් සිද්ධ වෙලාලු, ඒ ගැන පෝලන්තය පැමිණිලි කරලාලු. හැබැයි, ඒ ටෙන්ඩරය කාටද දෙන්නේ කියලා තවම තීන්දු කරලාත් නැහැ. ඉතින්, ඇයි පැමිණිලි කරන්නේ? මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා, පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවාවෙලා ජනතාව නොමඟ යවන, රට නොමඟ යවන, පට්ටපල් බොරු කියන විපක්ෂයක් බවට දැන් මේ විපක්ෂය පත් වෙලා තිබෙනවා.

හැබැයි, අපේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ පසුගිය අවුරුදු එකහමාර තුළ අපි මොන තරම් දේවල් කළාද? 2024 සැප්තැම්බර් මාසයේ තමයි ජනාධිපතිවරයා පත්වෙන්නේ. ශ්‍රී ලංකාව නිදහස ලබනකොට අපේ රටේ ආර්ථිකය තමයි ආසියාවේ තුන්වැනි තැනට තිබුණු ආර්ථිකය. අපට ඉස්සරහින් හිටියේ, ඒ වෙලාවේ ශීඝ්‍රයෙන් කාර්මීකරණය වෙමින් තිබුණු ජපානය. ඊළඟට තිබුණේ මැලේසියාව. ඒගොල්ලන්ට හොඳ ස්වභාවික සම්පත් ප්‍රමාණයක් තිබුණා. අපි තමයි තුන්වැනි තැනට හිටියේ. ඒ වෙලාවේ ඩොලර් බිලියන එකක - US Dollars 1 billion - ආර්ථිකයක් ශ්‍රී ලංකාවට තිබුණා. ඉතාම හොඳ, ශක්තිමත් විදේශ සංචිත ප්‍රමාණයක් තිබුණා. ඉතා අඩු රාජ්‍ය ණය ප්‍රමාණයක් තමයි අපට තිබුණේ. ඒ වාගේම අපිට හොඳ ශක්තිමත් අපනයන ආර්ථිකයකුත් තිබුණා. හැබැයි, අවුරුදු 76ක සාපය තුළ මොකද වුණේ? දැන් එහෙම නැහැ කියලා ගියා නේ, අතැන හිටපු මන්ත්‍රීතුමා; අර කෑ ගහපු මන්ත්‍රීතුමා. හැබැයි, අවුරුදු 76ක් පුරාවට තිබුණු කණ්ඩායම් දෙකක පාලනය තුළින් ආසියාවේ තුන්වැනි තැනට තිබුණු ආර්ථිකය බංකොලොත් කරලා තමයි නැවතුණේ. ඒක තමයි සාපය. වෙන මොනවත් නොවෙයි. ලෝකයේ තිබෙන කීර්තිමත් ආයතන - ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල - කියනවා, ශ්‍රී ලංකාව සාර්ව ආර්ථික ස්ථායීකරණය සම්බන්ධයෙන් ලෝකයටම ආදර්ශයක් දීලා තිබෙනවා කියලා.

විශේෂයෙන්ම බංකොලොත් වෙච්ච රටක ආර්ථිකයක් ඉතාම කෙටි කාලයකින් ඉතාම සාර්ථකව නැවත ස්ථාවර තත්ත්වයකට ගෙනෙන්න අපේ රජය සමත්වෙලා තිබෙනවා කියලා කලින් කියපු ආයතන ප්‍රකාශ කරලා තිබෙනවා. විපක්ෂයට මේවා ඇහෙන්නේ නැහැ. ඒගොල්ලෝ වෙන කොහේ හරි තැනක තිබෙන බොරුවක් තමයි මෙතැනට ඇවිල්ලා කියන්නේ. අන්න එහෙම තිබුණු ආර්ථිකයක්, මේක. මම කිව්වා, ඩොලර් බිලියන එකක ආර්ථිකයක් තමයි 1948දී අපේ රටේ තිබුණේ කියලා. එය, 2023දී ඩොලර් බිලියන 84ක් දක්වා වැඩි වුණා. 2023 වෙනකම් ආර්ථිකය වැඩිවෙලා තිබුණා. 2024 දී අපේ ජනාධිපතිවරයා පත්වෙනවා. 2025 අවුරුද්ද ඉවර වෙනකොට එය ඩොලර් බිලියන 108.8ක් දක්වා වැඩි කර ගන්න අපේ ආණ්ඩුව සමත්වෙලා තිබෙනවා. අන්න එහෙමයි රටවල් කළමනාකරණය කරන්නේ, ආර්ථිකය කළමනාකරණය කරන්නේ, ආර්ථික ස්ථාවරත්වය ඇති කරන්නේ. ඒ නිසා මම ආයෙත් විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවා, 2025 අවුරුද්දට අදාළව ඉදිරිපත් කර තිබෙන මෙම වාර්තාව කියවන්න කියලා. ඒකෙන්, අපි ලබාගෙන තිබෙන සාක්ෂරතාව බලාගන්න පුළුවන්.

දැන්, ලංකාවේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඩොලර් 5,003යි. 1990දී චීනයේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඩොලර් 348ක තමයි තිබුණේ. ඒක 2026 වෙනකොට ඩොලර් 14,730ක් දක්වා වැඩිකරගෙන තිබෙනවා. 1990 දී ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඩොලර් 565ක තමයි තිබුණේ. ඒක 2024 වෙනකොට තිබුණේ ඩොලර් 487ක් විධියට. අපේ නිවැරදි ආර්ථික ක්‍රියාකාරිත්වය හමුවේ ඒක ඩොලර් 500කට වැඩි ප්‍රමාණයකින් වැඩිකර ගැනීමට අපි අවුරුද්දක් ඇතුළත සමත්වෙලා තිබෙනවා. තෙල් නැහැ කියලා දැන් විපක්ෂ නායකතුමා කියලා ගියා. තෙල්, මේ පාර්ලිමේන්තුවේ නැහැ. ඒකට පෙට්‍රල් ෂෙඩ්වලට යන්න ඕනෑ. තෙල් නැති වෙනකම් ඔබතුමන්ලා බලාගෙන හිටියා. හැබැයි, අපි ඒකට අවශ්‍ය මැදිහත්වීම කරලා, අපේ රටට අවශ්‍ය තෙල් තොග ලබාගන්න කටයුතු කර තිබෙනවා. ඒ වාගේම තෙල් මිලදී ගන්න අවශ්‍ය විදේශ විනිමය උපයා ගන්නත් අපි සමත්වෙලා තිබෙනවා. වෙනදා තෙල් නැව් ඇවිල්ලා ආපහු ගියේ ඩොලර් නැති නිසා. හැබැයි,

[ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා]

දැන් එහෙම නැහැ. අපි දන්නවා, ලෝකයේ ඉතා දරුණු යුද තත්ත්වයක් තිබෙනවා කියලා. විශේෂයෙන්ම West Asiaවල, තෙල් වෙළඳාම සිද්ධවෙන region එකේ ඇතිවෙලා තිබෙන යුද තත්ත්වයත් එක්ක බනිජ තෙල් වෙළඳ පොළේ ඉතාම අභියෝගාත්මක තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. ඒක, ලෝකයේ තිබෙන දැවැන්ත ආර්ථික ප්‍රශ්නයක්. අපේ රටේ ප්‍රංචි ආර්ථිකයක් තිබුණත්, එම අභියෝගාත්මක තත්ත්වයට මුහුණ දෙමින්, රටට අවශ්‍ය බනිජ තෙල් ටික ලබාගන්න පුළුවන් වන විධියට අපි එය කළමනාකරණය කර තිබෙනවා. අවුරුදු 76කට පසුව ඉතිහාසයේ පළමුවැනි වතාවට ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඩොලර් 5,000 සීමාව ඉක්මවා යන්න අපි සමත්වෙලා තිබෙනවා. ඒක අවුරුදු එකහමාරක අපේ පාලන කාලය තුළ ලැබූ ඉතාම හොඳ සාක්ෂාත් කර ගැනීමක්.

ඊළඟට ආර්ථිකයේ ප්‍රසාරණය ගත්තොත්, කෘෂිකාර්මික අංශය සියයට 1.4කින් ප්‍රසාරණය වෙනවා. සේවා අංශය සියයට 3.3කින් ප්‍රසාරණය වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කාර්මික අංශය ගැනත් විශේෂයෙන්ම සඳහන් කරන්න අවශ්‍යයි. 2025 අවුරුද්දේ වැඩිම ප්‍රසාරණයක් ලබාගෙන තිබෙන්නේ කාර්මික අංශය. එය, සියයට 7.8යි. ඒකෙන් කියැවෙන්නේ වෙන කිසිම දෙයක් නොවෙයි. අපේ රටේ ආර්ථිකය නැවත පණ ගහලා කර්මාන්ත දියුණු වෙන්න පටන්ගෙන තිබෙනවා. විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දියුණු වෙන්න පටන්ගෙන තිබෙනවා. ඒවා තමයි දීර්ඝ කාලීන ආර්ථික ප්‍රතිලාභ. ඒවා තමයි ස්ථාවර ආර්ථිකයක් ගොඩ නඟන්න අපට රුකුලක් වෙන්නේ. අපි ඒ ආරම්භය, ස්ථාවරත්වය සුළු හා මධ්‍ය පරිමණ කර්මාන්තවලට ලබා දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ගත්තොත්, අපි ඉතාම ප්‍රශස්ත ලෙස ඒ කටයුතු කර තිබෙනවා. Primary surplus එක 2025දී සියයට 5.4ක් දක්වා වැඩි කරගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. අපි දන්නවා, මීට කලින් එහෙම එකක් වාර්තා වුණේ 1987දී බව. ඊට පසුව සියයට 0.7ක් හැටියට අපේ ජංගම ගිණුමේ අතිරික්තයක් වාර්තා කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. මෙන්න මේවා තමයි විපක්ෂය කියන "L" board ආණ්ඩුව ඇවිල්ලා කරපු ඒවා. 1987න් පසුව අපේ රටේ ජංගම ගිණුමේ අතිරික්තයක් තිබිලා නැහැ. හැබැයි, අපි අවුරුදු එකහමාරක් ඇතුළත ඒක පෙන්වා තිබෙනවා. අවුරුදු 76ක් පුරාවට විනාශ කරලා, බංකොලොත් කරපු ආර්ථිකය නැවත ඉතාම ශක්තිමත් ලෙස ස්ථාවර කරන්න, විශේෂයෙන්ම රජයේ මූල්‍ය විනය ස්ථාපිත කරන්න අපි සමත් වෙලා තිබෙනවා.

දැන් මේ තැන් තැන්වලට ඇවිල්ලා කෑ ගහලා යනවා නේ. මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා පෝලිමට බොරු තොගයක් කියලා ගියා. ඕවා කිය කියා ඉන්න පුළුවන්. හැබැයි, මේ වාගේ හොරකම් ඔයගොල්ලන්ගේ කාලයේ අහුවුණේ නැහැ. ජනාධිපතිවරුද, ඒගොල්ලන්ගේ නෑදෑයන්ද, පුතාලාද, මොන නිලධාරීන්ද, ඉහළද, පහළද, සභාපතිවරුන්ද කියන එක අපට අදාළ නැහැ. මූල්‍ය වංචාවේ, දූෂණයේ යෙදෙනවා නම් ඒ අයට එරෙහිව නීතිය ක්‍රියාත්මක වෙනවා. ඒකේ ප්‍රතිඵලයක් විධියට තමයි ඕවා දැනගන්න වෙන්නේ. ඔයගොල්ලන්ගේ අවුරුදු 75 පුරාවට ඕවා දැනගන්නවත් හම්බ වුණේ නැහැ. ඒක තමයි වෙනස.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සංචාරක ක්ෂේත්‍රය ගත්තොත්, එය ඉතාම සාර්ථකව අපි කළමනාකරණය කළා. අපට කෙටි කාලීන ඉලක්කයක් තිබුණා, මිලියන 3ක් දක්වා සංචාරක පැමිණීම වැඩි කරගන්න. ඒ වෙනුවෙන් අපි අපේ ප්‍රවර්ධන වැඩ කටයුතු දියත් කළා. දෙසැම්බර්, ජනවාරි, පෙබරවාරි මාසවල ඉතාම සාර්ථකව, ඉතිහාසගත ලෙස අපේ රටට සංචාරකයින් ගෙන්වා ගන්න පුළුවන් වුණා. නමුත් අවාසනාවකට, මැද පෙරදිග ඇතිවුණු යුදමය තත්ත්වයත් එක්ක සංචාරක පැමිණීම ලෝකයේම අභියෝගයට ලක් වුණා. විශේෂයෙන්ම මැද පෙරදිගින් එන එමිරේට්ස්, කටාර් වාගේ ගුවන් සමාගම්වල ගුවන් යානා ක්‍රියාකාරිත්වය අඩපණ වීම නිසා දැන් අපේ රටට සංචාරකයන් පැමිණීමේ අඩුවක් තිබෙනවා. නමුත් ඉන්දියාව, චීනය වාගේ සංචාරක වෙළෙඳ පොළවල්වල ප්‍රවර්ධනය හරහා කෙටි කාලීනව මේකට මුහුණ දෙන්න අපි දැන් සැලසුම් කර තිබෙනවා.

ආර්ථිකය කළමනාකරණය කිරීමේදී අපි මොනවාද කරලා තිබෙන්නේ කියන එක විශේෂයෙන්ම මම විපක්ෂයට කියන්න කැමැතියි. ඒක මහ බැංකුව ප්‍රකාශයට පත් කරන ලද "වාර්ෂික ආර්ථික විවරණය 2025" තුළින් ඉතාම හොඳින් පැහැදිලි කර දී තිබෙනවා. ඒ පිළිබඳව නැවතත් අධ්‍යයනය කරලා, අනාගතයේ කවදා හරි දවසක බලයට එන්න පුළුවන් වුණොත් - අපි හිතමු, පුළුවන් වෙයි කියලා - කොහොමද කරන්නේ කියලා ඒකෙන්වත් ඉගෙන ගන්න කියලා මේ අයට ආරාධනා කරමින්, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ඒ. අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[පි.ව. 2.05]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! இன்றைய விவாதத்தில் உரையாற்ற வாய்ப்பளித்தமைக்கு நன்றி. இந்த நாட்டில் இடம்பெற்ற முள்ளிவாய்க்கால் அவலம் சம்பந்தமாகப் பலரும் பலவிதமாகப் பேசுகிறார்கள். உண்மையிலே முள்ளிவாய்க்கால் அவலம் என்பது உலக நாடுகளிலே எந்த மக்களுக்கும், எந்த இனத்துக்கும் ஏற்படக்கூடாத ஓர் அவலம்! இறுதி யுத்தத்தின்போது முள்ளிவாய்க்காலிலே இருந்து அத்தனை மக்களும் ஒன்றிணைந்து வெளியேறி வருகின்றபோது பட்ட அவஸ்தைகளைத்தான் எமது மக்கள் "மே-18" இல் மன வேதனையோடு நினைவுகூர்ந்து குரலெழுப்புகிறார்கள்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, முள்ளிவாய்க்கால் யுத்தத்தின் இறுதிக் கட்டத்தில் ஒரு குழந்தை இறந்த தாயின் மார்பிலே பால் குடித்த சம்பவம் இடம் பெற்றிருக்கின்றது. அது இந்த முள்ளிவாய்க்கால் அவலத்திலே ஓர் அங்கம்! ஒரு தாயையும் பிள்ளையையும் இரண்டு கைகளிலும் பிடித்துக் கூட்டிக்கொண்டு வருகின்ற ஒரு தகப்பன் குண்டடிபட்டு இறக்கின்ற சந்தர்ப்பத்தில், அந்தத் தகப்பனைத் தூக்கித் தாங்கக்கூட முடியாதவர்களாக அதைத் தாண்டி ஓடி வருகின்ற ஓர் இனத்தைச் சேர்ந்தவர்களாக அந்தக் குழந்தையும் தாயும் எப்படி அவலப்பட்டிருப்பார்கள் என்பதை இந்த முள்ளிவாய்க்கால் பேரவலம் சொல்லுகிறது, கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே!

ஒரு தாய் தன் குழந்தைகளைக் கூட்டிக்கொண்டு வருகின்றபோது அந்தத் தாய் சுட்டுக் கொல்லப்படுகிறாள்; அந்தக் குழந்தைகள் அநாதரவாக நிற்கின்றனர். எங்களுடைய இனத்தில் இறந்தவர்களுக்கு மரியாதை செய்கின்ற முறை

இருக்கின்றது. ஆனால், அந்த முள்ளிவாய்க்கால் யுத்தத்தின் போதான அவலத்திலே தன்னுடைய தாய், தன்னுடைய பிள்ளை, தன்னுடைய தகப்பன் மற்றும் தன்னுடைய உறவுகள் செத்து மடிகின்றபோது, அந்த உடல்களைக் காட்டு மிருகங்கள் கடித்துக் குதறுகின்ற நிலைமையிலும், அதைத்தாண்டி வந்த அந்தச் சம்பவங்களை எண்ணியும், அவர்களுக்கு ஓர் இறுதிக் கிரியையைக்கூட செய்ய முடியவில்லையே என்று எண்ணியும் இன்றைக்கும் மன நோயாளிகளாக எங்களுடைய இனத்தவர்களில் பலரும் நடமாடிக்கொண்டு இருக்கிறார்கள்.

இந்த மே 18ஆம் திகதி, வானைத் தொடுமளவுக்கு எங்களுடைய இனத்தின் அழுகுரல் எழுந்தது, கௌரவ அம்மையார் அவர்களே! ஆனால், அன்று கடவுளுக்குக்கூட இரக்கம் வரவில்லை. இந்த அவலத்துக்கு நீதி வேண்டி ஐ.நா. வரை சென்றாலும்கூட, இன்றைக்கும் விடிவு கிடைக்காத நிலையிலேயே என்னுடைய இனம் இருந்து கொண்டிருக்கின்றது. தம்முடைய உறவுகளுக்கு, தன்னுடைய தகப்பனுக்கு இறுதிக் கிரியைகூட செய்ய முடியாத ஓர் அவல நிலைக்குத் தள்ளப்பட்டுவிட்டோமே என்ற ஏக்கத்தோடு இன்றும் மனநோயாளிகளாக மாற்றப்பட்டிருக்கின்றவர்களாக என்னுடைய இனத்தின் உறவுகள் பலர் வாழ்ந்து கொண்டிருப்பது வேதனை தருகின்றது. இறைவனுக்கும் அது தெரியவில்லை, கௌரவ அம்மையார் அவர்களே!

அடுத்தபடியாக, முல்லைத்தீவு மாவட்டத்திலே யாழ்ப்பாணப் பல்கலைக்கழக வளாகம் ஒன்றை அமைப்பதற்கு இடங்கள் ஒதுக்கப்பட்டிருந்தன. ஆனால், இற்றைவரை அதற்கான வேலைத்திட்டங்களோ அல்லது நடவடிக்கைகளோ எடுக்கப்படவில்லை. அது முல்லைத்தீவு என்ற காரணத்தாலோ அல்லது வன்னி என்ற காரணத்தாலோ என்னவோ, அதைப் புறந்தள்ளுகின்ற ஒரு சூழல் இருக்கின்றதா என்று தெரியவில்லை. அரசாங்கம் இதிலே கவனம் செலுத்த வேண்டும். ஏனென்றால், முல்லைத்தீவு மாவட்டத்திலும் மன்னார் மாவட்டத்திலும் பல்கலைக்கழக வளாகங்களைக் கொண்டுவருவதற்கான முயற்சிகள் மேற்கொள்ளப்பட்டாலும், அது இடையிடையே தடைப்படுகின்றதொரு சூழல் இருக்கிறது. எனவே, அங்கு இந்த வளாகங்களை நிறுவி, போரால் பாதிக்கப்பட்ட எங்களுடைய மக்களின் கல்வித் தரத்தை உயர்த்துவதற்கு அரசாங்கம் முயற்சி எடுக்க வேண்டுமென்று இச்சந்தர்ப்பத்திலே கேட்டுக் கொள்கிறேன்.

கௌரவ அம்மையார் அவர்களே! நான் அண்மையில் மன்னாரிலுள்ள கொன்னையன் குடியிருப்பு, கட்டுக்காரன் குடியிருப்பு ஆகிய இரண்டு கிராமங்களுக்குச் சென்றிருந்தேன். இந்தக் கொன்னையன் குடியிருப்புக் கிராமத்தில் இரண்டு பிரதான பிரச்சினைகள் இருக்கின்றன. ஒன்று, அங்கு தோட்டம் செய்பவர்கள் கோழி எச்சங்களை வெறுமனே உரமாகத் தூவுகிறார்கள். அந்த எச்சங்களிலிருந்து வருகின்ற துர்நாற்றம் காரணமாக இலையான்கள் அந்தக் கிராமத்துக்குள் படையெடுக்கின்றன. குழந்தைகளுடைய உணவுகளிலும் அவர்கள் பாவிக்கின்ற பொருட்களிலும் அந்த இலையான்கள் அமர்வதால், தொற்றுநோய்கள் ஏற்படுகின்ற அவல நிலையில் அந்தக் கொன்னையன் குடியிருப்பு இருந்து கொண்டிருக்கின்றது. புத்தளத்தில் அது தடை செய்யப்பட்டிருக்கிறது. ஆனால், புத்தளத்தைச் சேர்ந்தவர்கள்தான் அங்கு வந்து இந்தக் கோழி எச்சங்களைப் பயன்படுத்தி சிறு சிறு தோட்டங்களைச் செய்கிறார்கள். அது தடை செய்யப்பட வேண்டும். அதுமட்டுமல்ல, அங்கே மீன்களைத் தகரத்தில் அடைக்கும் - canned fish - ஒரு தொழிற்சாலை இருக்கிறது. உண்மையிலேயே அது நல்ல விடயம். ஆனால், அத்தொழிற்சாலையின் கழிவுகள் அந்தக் கிராமத்தில் பொதுவெளியில் விடப்படுகின்ற காரணத்தால், அங்கு இருக்கின்ற நீர்நிலைகள் மிகவும் மோசமாகப் பாதிப்படைந்து, பாவனைக்குட்படுத்த முடியாத ஒரு நிலை காணப்படுகின்றது.

கல்வியை எடுத்துக்கொண்டால், நான் முன்னர் குறிப்பிட்டதுபோன்று வன்னி மாவட்டம் கல்வியில் புறக்கணிக்கப்படுகின்ற ஒரு நிலை காணப்படுகின்றது. யாழ்ப்பாண மாவட்டத்தில் ஆசிரியர்கள் excessஆக இருப்பதாகச் சொல்லுகிறார்கள். ஆனால், எங்களுடைய வன்னி மாவட்டத்தில் கணிதம் மற்றும் விஞ்ஞான பாடங்களுக்கான ஆசிரியர் பற்றாக்குறை காணப்படுகின்றது. இருந்தாலும், அங்குள்ள பாடசாலை அதிபர்களும், கல்வித் திணைக்கள அதிகாரிகளும் தமது திறமையால் வன்னி மாவட்டத்தை இன்றைக்கும் ஒரு சிறந்த நிலையில் வைத்துக் கொண்டிருக்கின்றார்கள்.

நான் இந்த உயர் சபையிலே ஒன்றைச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். வன்னி மாவட்டம் கல்வியில் தொடர்ந்தும் புறக்கணிக்கப்படுமாக இருந்தால், அதற்காகப் பாரியதொரு போராட்டத்தை நிச்சயமாக நாங்கள் செய்யவேண்டி வருமென நான் எச்சரிக்கின்றேன். ஏனென்றால், போரினால் அல்லோலகல்லோலப்பட்ட என்னுடைய சமூகம், போருக்குள் வாழ்ந்த என்னுடைய சமூகம், இன்றைக்குக் கல்வியிலும் புறக்கணிக்கப்படுகின்ற, கேட்பாரற்று இருக்கின்ற, கவனிப்பாரற்று இருக்கின்ற ஒரு நிலை தொடர்ந்து கொண்டிருக்கின்றது. அதைத் தட்டிக்கேட்பதற்கான ஒரு வழியை நிச்சயமாக நாங்கள் உருவாக்குவோம். அந்த வகையிலே, இந்தக் கல்வி விஷயத்தில் அரசாங்கமும் வட மாகாண கல்வித் திணைக்களமும் கவனம் எடுக்க வேண்டும். எங்களுடைய ஆளுநர் அவர்கள் இதிலே மிக அக்கறையோடு இருந்து கொண்டிருக்கின்றார். இருந்தாலும், வன்னி மாவட்டம் கல்வியில் புறக்கணிக்கப்படுகின்ற நிலை தொடர்ந்து கொண்டிருக்கின்றது. ஆகவே, இதை ஓர் எச்சரிக்கையாக நான் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ඔබතුමාට නියමිත කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

முடிக்கிறேன்.

கல்வி விஷயத்திலே வன்னி மாவட்டம் புறக்கணிக்கப்படுகின்ற நிலைமையை எம்மால் ஒருபோதும் அப்படியே பார்த்துக்கொண்டிருக்க முடியாது; புரட்சி வெடிக்கும் என்பதை நான் இங்கு சொல்லிக்கொள்ள விரும்புகின்றேன். நன்றி! வணக்கம்!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.13]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ශ්‍රී ලංකා මහ බැංකුවේ 2025 වර්ෂය සඳහා වූ වාර්ෂික ආර්ථික සමාලෝචන වාර්තාව ගැනයි අද අපි සාකච්ඡා කරන්නේ. මේ වෙනකොට අපට පෙනෙනවා, අද අපේ රටේ හැම අංශයක්ම ඉතාම අවාසනාවන්ත ලෙස කඩා වැටෙන ආකාරය. අපි මුලින්ම කථා කරමු, ඩොලර් එක සම්බන්ධයෙන්. ඒ ගැන දැන් මෙතුමන්ලා ලොකුවට කථා කරනවා. මට මතකයි, රට බංකොලොත් වූ පසුගිය කාලයේ ඩොලර් එක පිළිබඳව දවසින් දවස මේ පාර්ලිමේන්තුවේදී කථා කළ ආකාරය, ජේවීපී එකේ හිටපු මන්ත්‍රීවරුන් තුන්දෙනා. අද මොකක්ද කියන්නේ? අද උදේ ඩොලර් එකේ අගය රුපියල් 343යි. හවස් වනකොට රුපියල් 346යි. ඩොලර් එක උදේට එක ගණනක්, හවසට තව ගණනක්. හෙට වනකොට තුන්සිය කීය වෙයිද දන්නේ නැහැ. තමුන්නාන්සේලා මේ රට භාර ගන්න අවුරුදු එකහමාරකට කලින්, ඒ කියන්නේ රනිල් වික්‍රමසිංහ-රාජපක්ෂ ආණ්ඩුව කාලයේ ඩොලර් එක තිබුණේ රුපියල් 272ට. ඒ දෙසිය හැත්තෑ ගණනේ ඉඳලා ඩොලර් එක දෙසිය අනූ ගණනට ආවා, ජනාධිපතිවරණය ඉවර වෙලා පාර්ලිමේන්තු මැතිවරණය එනකොට. හැබැයි, දැන් ලොකු වෙනසක් සිද්ධ වෙලා තිබෙනවා.

දැන් තමුන්නාන්සේලා යන මේ තත්ත්වය තුළ මොකක්ද වෙන්නේ? ඔබ දන්නවා, ඩොලර් එක වැඩි වෙන්න, වැඩි වෙන්න අපි ආනයනය කරන සෑම භාණ්ඩයකම මිල වැඩි වන බව. ආනයනය කරන සෑම භාණ්ඩයක්ම කියන්නේ මොනවාද? අපේ අහිංසක දෙමව්පියන්, එහෙම නැත්නම් අපේ පවුල්වල සාමාජිකයින්ගේ ජීවන බර අද එන්න එන්නම වැඩි වෙලා තිබෙන්නේ. දැන් පරිප්පු ඇටේ ඉඳලා හැම දෙයකම මිල වැඩි වනවා. එතකොට කවුද මේවාට වග කියන්නේ? මීට පෙර කථා කරපු සංචාරක නියෝජ්‍ය ඇමතිතුමා කියනවා, අද සංචාරක ව්‍යාපාරය දියුණු වෙලා, රටට එන සංචාරකයින් ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා කියලා. රටට එන සංචාරකයින් ප්‍රමාණයේ යම් වැඩිවීමක් වෙලා තිබෙනවා. ඒක අපි පිළිගන්නවා. හැබැයි, 2018දී තමයි හොඳම සංචාරක ආදායම තිබුණේ. හැබැයි, පාස්කු ප්‍රහාරයට කලින් තිබුණු ඒ ආදායමත් එක්ක සංසන්දනය කරනකොට අද ඒ ආදායම බිලියන ගාණකින් අඩු වෙලා තිබෙන්නේ. අපට numbers වැඩි වුණා කියලා වැඩක් වෙන්නේ නැහැ. රටට එන මුදල් ප්‍රමාණය, ඩොලර් ප්‍රමාණය අපි වැඩි කර ගන්න ඕනෑ. දැන් මේ තත්ත්වය තුළ, ඩොලරයේ අගය වැඩිවීම තුළ, එහෙම නැත්නම් රුපියල බාල්දුවීම තුළ කාටද කියන්න පුළුවන් වන්නේ මේ ආර්ථිකය ස්ථාවරයි කියලා?

අද මේ ආණ්ඩුවේ මුදල් නියෝජ්‍ය ඇමතිවරයා කථා කළා. ඒ කාටද කියන්න පුළුවන් වන්නේ මේ ආර්ථිකය ස්ථාවරයි කියලා? තවත් නියෝජ්‍ය ඇමතිවරයෙක් කිව්වා, එතුමන්ලා රටේ ස්ථාවරත්වය හදලා තිබෙනවා කියලා. මම අහනවා, ඩොලරයේ අගය මේ විධියට වැඩි වෙලා රුපියල බාල්දු වෙන එකද ස්ථාවරත්වය කියලා. තමුන්නාන්සේලා මේ තත්ත්වය හරියට පාලනය කළේ නැත්නම් මේ රටේ ජනතාවට ඉතාම අවාසනාවන්ත තත්ත්වයන්වලට මුහුණ දෙන්න සිද්ධ වනවා. ඒක අනිවාර්යයෙන් වෙන දෙයක්. ඒක නවත්වන්න හම්බ වෙන්නේ නැහැ. හෙට වනකොට ඩොලරයේ අගය රුපියල් 350ක් වෙයි. ඒ වාගේම තවත් ඉස්සරහට මේ අගය තවත් ඉහළ යයි. ඉතින් ඒ නිසා අපි කියන්නේ මෙන්න මේවා සම්බන්ධයෙන් තමුන්නාන්සේලා මීට වඩා අවධානය යොමු කරන්න ඕනෑය කියන එකයි. මොකද, මේක සම්පූර්ණයෙන්ම ජනතාවගේ ජීවන තත්ත්වයට බලපානවා; උද්ධමනයට - භාණ්ඩ මිල ඉහළ යන්න - බලපානවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් ආණ්ඩුව අවධානය යොමු කරන්න ඕනෑ. අද ඔය කථා කරන අය චෝදනා කරනවා, විපක්ෂය බොරු කියනවා කියලා. නමුත් කවුද බොරු කිව්වේ කියලා ජනතාව දන්නවා. ඒ නිසා ඒවා බොරුද, ඇත්තද කියන එක ගැන තර්ක කරන්න මම යන්නේ නැහැ.

දැන් බලන්න, එක පැත්තකින් ආර්ථිකය ඒ විධියට කඩා වැටෙනකොට, අනික් පැත්තෙන් රාජ්‍ය පරිපාලනයත් කඩාගෙන වැටෙනවා. අපේ රටේ නිලධාරින් අද වැඩ කරන්න බය වෙලා ඉන්නේ. විශේෂයෙන්ම මුදල් අමාත්‍යාංශයේ ඩොලර් මිලියන දෙකහමාරක් වැරදි ගිණුමකට යොමුවීම තුළ ඒ අංශයේ වැඩ කරපු ඒ නිලධාරියාට මොකක්ද වුණේ? කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටියේ - මීට පෙර කථා කරපු නියෝජ්‍ය ඇමතිවරයාගේ ගමේ - හිටපු ඒ නිලධාරියාට අන්තිමට මොකක්ද සිද්ධ වුණේ? ඒ පීඩනය අන්තිමට ගියේ එම නිලධාරියාගේ බල නහරවලින්. මේවා කියන්නත් කනගාටුයි. අද මේ රටේ නිලධාරින්ට සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? මේ ආණ්ඩුව එක එක දේවල් ගැන අත්දැකීම් ලබා ගන්න හදනවා; වැරදි කරනවා. අන්තිමට ඒක යනවා, නිලධාරියාගේ පිටින්. නිලධාරින්ට මේ පීඩනය දරාගන්න බැරිව අද ගොඩක්දෙනෙක් තනතුරුවලින් අයින් වෙන්න ලෑහැස්ති වෙලා ඉන්නවා. සමහර අය suicide කර ගන්නවා, තවත් සමහරුන් අද ඉහළ තනතුරු භාර ගන්නේත් නැහැ. මේක සාමාන්‍ය තත්ත්වයක් කියලා හිතන්න එපා. ඒ නිසා තමුන්නාන්සේලා මොනවා කථා කළත්, අද රජය එක පැත්තකින් ආර්ථික වශයෙන් කඩාගෙන වැටෙනවා. අනික් පැත්තෙන්, පරිපාලන වශයෙන් රජයේ නිලධාරින් වැඩකටයුතු කරන්න බය වෙලා ඉන්නවා, විශේෂයෙන් හරි වගකීමක් අරගෙන වැඩකටයුතු කරන්නට. මොකද, ආණ්ඩුව තමන්ගේ ප්‍රතිපත්තිය අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක කිරීමේදී ඇමතිවරයා වගකීම ගන්නේ නැත්නම්, නියෝජ්‍ය ඇමතිවරයා වගකීම ගන්නේ නැත්නම්, ඒ වගකීම ගන්න දේශපාලන අධිකාරිය පස්ස ගහනවා නම්, අද නිලධාරින් ඒ වගකීම ගන්න ලෑහැස්ති වන්නේ නැහැ. නිලධාරින් අද ඒ වගකීම නොගන්නේ ඇයි? මොකද, අද දේශපාලනඥයා කර අරිනවා. වැරැද්දක් වෙච්ච ගමන් ඒක නිලධාරියා පිටින් දානවා. ඒ තත්ත්වය තුළ අද නිලධාරින් - මේ රටේ අමාත්‍යාංශ ලේකම්වරයාගේ ඉඳලා පහළට යනකම්ම - ජනතාව වෙනුවෙන් ඉෂ්ට කරන්න තිබෙන ඒ වගකීම් පැහැර හරිනවා. ඒක ආණ්ඩුවේ වැරැද්ද කියලා අපි පැහැදිලිව කියනවා. ඒක තමයි අද සිද්ධ වෙලා තිබෙන්නේ. තමුන්නාන්සේලා නොයෙකුත් දේවල් කථා කළාට, අද මේ රටේ සංවර්ධනයක් සිද්ධ වන්නේ නැහැ.

පසුගිය කාලයේ "දිට්වා" සුළි කුණාටුව ඇති වුණා. ඒකෙන් පවුල් ගණනාවක් අනාථ වුණා. ඒ ආපදාවට පත් වුණු අය වෙනුවෙන් දෙනවා කියපු දේවල්වලින් මොනවාද තමුන්නාන්සේලාට ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ? නිවාස අහිමි වූවන්ට තමුන්නාන්සේලා කොච්චර නිවාස හදා දීලා තිබෙනවාද? මොකක්ද ඒවායේ ප්‍රගතිය? ගොඩක් දිස්ත්‍රික්ක දිහා බැලුවාම ඉතාම අවාසනාවන්ත තත්ත්වයක් තමයි දකින්නට තිබෙන්නේ. ගෙවල් හදන්න තවම ඉඩම් තෝරා ගෙන නැහැ. ඒ ආපදාව සිදු වෙලා මේ වනකොට මාස කීයක් ගත වෙලා තිබෙනවාද? ඒ නිසා තමුන්නාන්සේලා මේ තත්ත්වය හරියට තේරුම් ගන්නට අවශ්‍යයි. එහෙම නැත්නම් ඒකෙන් දුක් විඳින්නේ මේ රටේ ජනතාව. ඒ නිසා අපි කියනවා, මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා විපක්ෂය බොරු කියනවා කියමින්, විපක්ෂ නායකතුමාට චෝදනා කරමින් තමුන්නාන්සේලා කටයුතු කළා කියලා ඵලක් වෙන්නේ නැති බව. මහ පොළොවේ ක්‍රියාත්මක කරන ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ මොකක්ද? මේ රටේ මිනිස්සු ඔබතුමන්ලාට ඡන්දය දුන්නේ රට බංකොලොත් වෙලා තිබුණු වෙලාවක ඒ පීඩනයත් එක්ක අලුත් දෙයක් බලාපොරොත්තුවෙනුයි. නමුත්, අද වනකොට ජනතාවගේ

බලාපොරොත්තු සම්පූර්ණයෙන්ම කඩ වෙලා තිබෙනවා. ජනතාව අද කරකියා ගන්න දෙයක් නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ජීවන බර වැඩි වෙලා තිබෙනවා. කවුරු මොනවා කිව්වත් මේ රටේ දුප්පත්කම අද වනකොට වැඩි වෙලා තිබෙනවා. වේලක් හැර වේලක් කන පවුල් ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. මේ රටේ වේල් දෙකක් කන්න බැරි පවුල් ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි, මධ්‍යම පන්තිය අද වනකොට පහළට වැටිලා තිබෙනවා. දුප්පතුන් තවත් දුප්පත් වෙලා තිබෙනවා.

නියෝජ්‍ය ඇමතිවරයෙක් මේ සභාවේදී කිව්වා, අද වනකොට සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට එතුමන්ලා ගොඩක් උදවු කරලා තිබෙනවා, ඔවුන් ගොඩක් දියුණු වෙලා තිබෙනවාය කියලා. ඒ අයත් එක්ක කථා කරලා බලන්න මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. මම ඔබතුමන්ලාට කියනවා, අද අපේ රට තිබෙන්නේ ඉතාම අමාරු තැනක බව. ඒ අමාරු තැනට අපේ රට පත් වීම තුළ මේ රටේ සමස්ත ජනතාව පීඩාවට පත් වෙලා සිටිනවා. ඉදිරි අනාගතය ඔවුන්ට අපැහැදිලි වෙලා තිබෙනවා. ඒ නිසා තමයි තමුන්නාන්සේලා සමහර තනතුරුවලට පත් කරපු උදවිය අද වනකොට ඒ තනතුරුවලින් ඉල්ලා අස් වෙන්නේ. මොකද, ඒ අයට සමාජයට මුහුණ දෙන්න බැරි වෙනවා. ඒ නිසා මට පෙනෙන විධියට, මම දන්නා දේශපාලනයේ හැටියට මා ඔබතුමන්ලාට කියනවා, මේ රටේ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ පැවති කොවිඩ් වසංගතයෙන් පස්සේ, අවසාන මාස අටක් විතර වනකොට තිබුණේ මේ වාගේ තත්ත්වයක් කියන එක. ඩොලරයේ අගයත් මේ විධියට තමයි ඒ කාලයේ ඉහළ ගියේ. ඒ නිසා අද ලොකු ලොකු දේවල් ගැන උදන් අනන්නේ නැතුව මේ සැබෑ තත්ත්වයට මුහුණ දීලා, මේ රටේ ඇති වෙලා තිබෙන අවාසනාවන්ත තත්ත්වයෙන් රට ගොඩ ගන්න පුළුවන් වෙන්නේ කොයි ආකාරයෙන්ද කියලා බලන්න. විශේෂයෙන්ම තමුන්නාන්සේලාට ජනතාව ලබා දුන්නු ජන වරමට උපකාරයක් හැටියට ඒ ජන වරම මොකක්ද කියලා හඳුනා ගෙන කටයුතු කරන්න කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිමින්, මට කථා කරන්න වේලාව ලබා දීම ගැන ඔබතුමියට මගේ ස්තුතිය පළ කරමින් මගේ කථාව මම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අජන්ත ගම්මැද්දෙගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක් ලැබෙනවා.

[අ.භා. 2.22]

**ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා**
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

නිවැරැදි රාජ්‍ය පාලනයක් වාගේම නිවැරැදි ආර්ථික කළමනාකරණයක ප්‍රතිඵලයක් විධියට මේ රටේ ආර්ථිකය නිවැරැදි දිශාවකට අරගෙන යන්න පුළුවන් වුණු රජයක් ලෙස ඇත්තටම අපි අද දවස ගැන සතුටු වෙනවා. මොකද, 2025 වර්ෂයට අදාළව මේ රටේ ආර්ථික කළමනාකරණය පිළිබඳවත්, එහි ප්‍රගතිය පිළිබඳවත් අද අපට මේ ගරු සභාවට අදහස් ඉදිරිපත් කරන්න පුළුවන් වෙලා තිබෙනවා.

මේ අවස්ථාවේදී විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. විපක්ෂය හැම දාම හීන දැක-දැක හිටියා. අපි දන්නවා, මැතිවරණ කාලයේදීත් එතුමන්ලා හීන දැක්ක බව. ඒ හීනවලට අනුව නම් දැන් අපි වාගේ දේශපාලන ව්‍යාපාරයක් තිබෙන්නත් බැහැ. මොකද, එතුමන්ලා ඒ තරමට හීන දකිමින් කොහොම හරි බලය ගන්න පුළුවන්ද කියලා බැලුවා. හැබැයි, එතුමන්ලාට බලය ගන්න බැරි වුණා. මේ රටේ ජනතාව ඒ සම්ප්‍රදායික දේශපාලන කඳවුරු ප්‍රතික්ෂේප කරලා, අලුත් දේශපාලන කඳවුරකට රාජ්‍ය පාලනය සහ ආර්ථිකය හැසිරවීමේ බලය ලබා දුන්නා. එහි ප්‍රතිඵලයක් විධියට තමයි 2025 වර්ෂයේදී අපට ඉතාම සාධනීය විධියට ආර්ථික ඉලක්ක කරා ළඟා වෙන්න පුළුවන් වුණේ. විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, ඒ ඉලක්ක කරා ළඟා වෙන්න මේ රටේ අතිමහත් බහුතරයක් ජනතාව අපි පිළිබඳව විශ්වාසය තැබුවා වාගේම ඒ වෙනුවෙන් කැප කිරීම් කළ බව. එම නිසා මේ ගරු සභාවේදී ඒ සම්බන්ධව එම ජනතාවට ප්‍රණාමය පළ කරන්න අවශ්‍යයි.

අපි දන්නවා, 2022දී ආර්ථික වර්ධනය සෘණ 7.3ක් බව. හැබැයි අපට පුළුවන් වුණා, නිවැරදි ආර්ථික කළමනාකරණයත් එක්ක යම් මැදිහත්වීමක් කරලා, මේ ආර්ථික වර්ධනය 2025 අවුරුද්ද වෙනකොට ධන 5 දක්වා වර්ධනය කරන්න. ඒ කියන්නේ, ආර්ථික වර්ධනය වැඩි කර ගන්න අපට පුළුවන් වුණා. විශේෂයෙන්ම මම සඳහන් කරන්න ඕනෑ, 2025දී අය වැය පුරෝකථනවලට අනුව ඇස්තමේන්තුගත ආදායම හැටියට රුපියල් මිලියන 4,990ක - රුපියල් බිලියන 4ක - ආදායමක් අපි අපේක්ෂා කළ බව. අපි ඒ ඉලක්කගත ආදායම වර්ධනය කරගෙන තිබෙනවා. ඒ කියන්නේ, පුරෝකථනය කළ ආදායමටත් වඩා වැඩි ආදායමක් ලබා ගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. පොදුවේ ගත්තාම ඒක අපේ ආර්ථිකයේ වේගවත් වර්ධනයකට හේතු වෙලා තිබෙනවාය කියලා මම හිතනවා.

විශේෂයෙන්ම මම ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ගැනත් සඳහන් කරන්න ඕනෑ. ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඇමෙරිකානු ඩොලර් 5,000 ඉක්මවා යන්න පුළුවන් ප්‍රමාණයට වර්ධනය කර ගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. මම හිතන විධියට, මේවා තමයි සාධනීය වර්ධනයන්. විපක්ෂය හැම දාම කියන විධියට බොරු කියමින්, බොරුව සමාජගත කරන්න උත්සාහ කරමින් ඉන්නවා. ඒක ඒ විධියටම විපක්ෂයට කරගෙන යන්න ඉඩ දීලා, ඉතාම සාර්ථකව අපේ ගමන ඉස්සරහට යන එක තමයි ආණ්ඩුවක් විධියට අපි මේ වෙලාවේදී කරන්න ඕනෑ.

ලෝක ආර්ථික තත්ත්වය අනුව මේ වෙලාව වෙනකොට හැම රටක්ම ආර්ථික අර්බුදවලට ලක් වෙමින් තිබෙනවා, බාහිරින් ඇති වන බලපෑම් නිසා. අපේ රටටත් ඒ බාහිර බලපෑම ඉතාම වේගයෙන් බලපා තිබෙනවා. ඒ බාහිර බලපෑමත් එක්ක වුණත් අද වනකොට අපට ආර්ථිකය යම් තරමකට කළමනාකරණය කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. අපි වාහන ආනයනය කිරීම පාලනය කර ගන්න යම් උපක්‍රම පාවිච්චි කරනවා. ඒවා සාර්ථක උපක්‍රම. ඒවා කළේ නැතුව හිටියා නම් අද වනකොට අපට ඩොලරයකට ගෙවන්න සිදු වන රුපියල් ප්‍රමාණය තවත් වැඩි වෙනවා. ඒ අනුව අපි යම් මට්ටමකින් එම උපක්‍රම පාවිච්චි කරමින්, ආර්ථිකයේ යම් කළමනාකරණයක් කරමින් ඉස්සරහට යනවා. ඒ පිළිබඳව විපක්ෂයට ලොකු වේදනාවක් තිබෙනවා. "පත් වෙලා ඉන්න ආණ්ඩුවට මේ කාරණා කරගෙන යන්න බැහැ, හැම දාම ආර්ථිකය කරගෙන ගියේ අපි, අපි තමයි ආර්ථික ඔස්තාර්ලා" කියලා තමයි විපක්ෂය හිතා ගෙන හිටියේ. නමුත්, ඒ තත්ත්වය අබිබවා ගිහින් අපට පුළුවන් වෙලා තිබෙනවා, ආර්ථිකය යම් තැනකට ගෙනෙන්න. ඒ සම්බන්ධයෙන් විපක්ෂයට යම් වේදනාවක් තිබෙන බව අපට පෙනෙනවා වාගේම දැනෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරු අදහස් ඉදිරිපත් කරනකොට වාගේම එතුමන්ලා කරන සමහර චෝදනා දිහා බැලුවාම ඒවා වේදනාවෙන් කරන චෝදනා කියලා අපට තේරෙනවා. ඒ වේදනාව හේතුවෙන් කරන චෝදනා නිසා මේ රටේ ජනතාව දන්නවා, විපක්ෂය ඉතාම දරුණු අර්බුදයක ගිලිලා ඉන්නවා

[ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා]

කියලා. එම නිසා විපක්ෂයට හැම දාම ඔය චෝදනාව ඔය විධියට කරමින් ඉදිරි අවුරුදු තුනත් ඔය විධියට ගත කරන්න පුළුවන්. අපි සාර්ථකව මේ ගමන ඉස්සරහට යනවා. ඒ විශ්වාසය අපට තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ආර්ථික ජයග්‍රහණ ලබා ගත්තා. හැබැයි, ඒ ලබා ගත්ත ජයග්‍රහණ අපි කවුරුවත්, විශේෂයෙන්ම අපේ අමාත්‍ය මණ්ඩලයවත්, අපේ මන්ත්‍රීවරුන්වත්, ඒ වාගේම රාජ්‍ය සංස්ථාවල සභාපතිවරුන්වත් තමන්ගේ පෞද්ගලික බූදලයක් විධියට පාවිච්චි කළේ නැහැ. මේ ආර්ථික ජයග්‍රහණ අපි ක්‍රමානුකූලව මේ රටේ ජනතාවට, පහළ මට්ටමේ ඉන්න ජනතාවට ලබා දෙන්න කටයුතු කළා. ඒක තමයි විශේෂත්වය. ඒ නිසා ජනතාව මේ ආණ්ඩුව කෙරෙහි විශ්වාසයෙන් ඉන්නවාය කියන කාරණය විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. මොකද, අපි දන්නවා, සාමාන්‍යයෙන් රාජ්‍ය සේවකයෝ පාරට බැහැලා ඉල්ලුවේ නැත්නම් ඉතිහාසයේ කවදාවත් වැටුප් වැඩි කළේ නැහැ කියලා. හැබැයි, අපි එහෙම නොවෙයි. අපි රාජ්‍ය සේවකයන්ගේ වැටුප වැඩි කළා, අවුරුද්දෙන් අවුරුද්ද වැඩි වන විධියට. 2027 දක්වා වැටුප් වැඩි වන විධිය අපි අය වැය ලේඛනය තුළ පෙන්වා තිබෙනවා. ඒ විධියට අපි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කර තිබෙනවා. නමුත්, ඉතිහාසයේ හැම දාම විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ පාරට බැහැලා අරගළ කරලා තමයි මහපොළ ශිෂ්‍යාධාරය වුණත් ඉතාම සොච්චමකින් වැඩි කර ගත්තේ. හැබැයි, විශ්වවිද්‍යාල ශිෂ්‍යයාගේ මහපොළ ශිෂ්‍යාධාරය අපි රුපියල් 10,000 දක්වා වැඩි කළා. මේ ලබා ගත් ආර්ථික ජයග්‍රහණ තමයි අපි ඔවුන්ට ලබා දුන්නේ. ඒ වාගේම තමයි වතු කම්කරුවන්ගේ දෛනික වැටුප. වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 400කින් වැඩි කරන්න අපට පුළුවන් වුණා. රුපියල් 400කින් තමන්ගේ දෛනික වැටුප වැඩි කිරීම ගැන වතු කම්කරුවන්ට ලොකු සතුටක් තිබෙනවා. එවැනි ආර්ථික සහන අපට ලබා දෙන්න පුළුවන් වුණා.

අපි දන්නවා, 2022න් පසුව මේ රටේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කටයුතු සම්පූර්ණයෙන් නැවතිලා තිබුණු බව. හැබැයි, අපි 2025 ඉඳලා නැවත ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වැඩ පටන් ගත්තා. රජයේ ඉදිකිරීම් පටන් ගත්තා. නතර වෙලා තිබුණු ඉදිකිරීම් කටයුතු පටන් අරගෙන, ඒවා වේගයෙන් කෙරීගෙන යනවා. නතර වෙලා තිබුණු සංවර්ධන ව්‍යාපෘති නැවත පටන් ගන්න පුළුවන් වුණේ අපේ ආණ්ඩුව යටතේ. ඉදිකිරීම් කටයුතු ඔක්කෝම නැවතිලා තිබුණේ. අපි ඉතා හොඳ ආර්ථික කළමනාකරණයක් ඇති කරලා තිබෙන්නේ. ඒක විපක්ෂයට දරා ගන්න බැහැ. අපි ඒක දන්නවා. මොකද, විපක්ෂය හැම දාම බලාගෙන හිටියේ මේ ආණ්ඩුව කඩා වැටෙනතුරු; ආණ්ඩුව මාස තුනෙන් කඩා වැටෙයි, මාස හයෙන් කඩා වැටෙයි, අවුරුද්දෙන් කඩා වැටෙයි කියලා බලාගෙන හිටියා. පසුගිය අප්‍රේල් වනකොට කඩා වැටෙයි කියලා හිතුවා. අප්‍රේල් වන විටවත් වට්ටන්න ඕනෑ කියලා හිතුවා. එහෙම හිතලා තමයි ඒ අය වැඩ කළේ. විපක්ෂය විධියට එහෙම නොවෙයි, කටයුතු කරන්න ඕනෑ.

මම විපක්ෂයෙන් විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා. ඒ තමයි, විපක්ෂය විධියට සාධනීය විවේචන ඉදිරිපත් කරන්න කියන එක. ආණ්ඩුවකට සාධනීය විවේචන අවශ්‍යයි. අපි ඒවා පිළිගන්න සූදානම්. හැබැයි, මේ කරන්නේ සාධනීය විවේචන නොවෙයි. හය කරන්න පුළුවන්ද කියලා බලලා, මෙතැන යටි ගිරියෙන් කෑ ගහමින් කථා කරන විපක්ෂයක් නොවෙයි, අද රටට ඕනෑ. සාමාන්‍යයෙන් ආර්ථිකයේ යම් කළමනාකරණයක් කරනකොට විපක්ෂය හොඳ සාධනීය අදහස් ඉදිරිපත් කරන්න ඕනෑ. අපි දැක්කා, ඉතා හොඳ සාධනීය විවේචන සහ යෝජනා ඉදිරිපත් කරන මන්ත්‍රීවරු දෙදෙනෙක්, තුන්දෙනෙක් විපක්ෂයේ ඉන්න බව. අපි ඒවා පිළිගන්න සූදානම්. නමුත්, අනෙක් සියලුදෙනා බලන්නේ, මේ ජනතා බැඳීම කොහොම හරි බිඳින්න ඕනෑ, මේ ආණ්ඩුව කොහොම හරි කඩා වට්ට ගන්න ඕනෑ කියලායි. ඒ අය දන්නවා, මේ විධියට ඉස්සරහට ගියොත් මේ රටේ ජනතාව තවත් ආණ්ඩුවත් එක්ක එකතු වෙන බව. ඒ නිසා ඒක වළක්වන්න අවශ්‍ය මැදිහත්වීම් කරන්න විපක්ෂය බොරුවෙන් සහ ඉතාම නරක විධියට මේ කරන හැසිරීම අපි ඉතාම පිළිකුල් සහගතව හෙළා දකිනවා. එහෙම විපක්ෂයක් නොවෙයි, රටට ඕනෑ. අලුත් පරම්පරාව - younger generation එක - ඉල්ලන්නේ එහෙම මැදිහත් වීමක් නොවෙයි. Younger generation එක ඉල්ලන්නේ, ආණ්ඩුවත්, විපක්ෂයත් කියන දෙකම එකතු වෙලා ඉතාම සාධනීය විධියට මේ රට ඉස්සරහට ගෙන යන්න අවශ්‍ය මැදිහත් වීම කරන්න කියලායි. විපක්ෂයට එවැනි තත්ත්වයට පත් වෙන්න කියන ආරාධනාව කරමින්, සාධනීය විවේචන ඉදිරිපත් කරන්න කියන ඉල්ලීමත් කරමින්, මම නිහඬ වනවා.

සියලුදෙනාට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.32]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පසුගිය අවුරුද්දට අදාළව ඉදිරිපත් කර තිබෙන වාර්ෂික ආර්ථික සමාලෝචන වාර්තාව පිළිබඳව ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන් කළ කථාවලට අපි ඇහුම්කන් දුන්නා. බලන්න, තමුන්නාන්සේලා කථා කළ විධියට මේ රටේ ආර්ථිකය අද බොහොම ශක්තිමත් තැනක තිබෙන්න ඕනෑ. ජනතාවට එය දැනෙන්න ඕනෑ. අපි අහනවා මේ රටේ ජනතාවට තමුන්නාන්සේලා කියන ඒවා දැනෙනවා ද කියලා.

ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව කාලයේ රට බංකොලොත් වෙලා ඩොලරයේ අගය පාලනය කර ගන්න බැරි තත්ත්වයට පත් වුණා. අද මම දකින්නේ එවැනි තත්ත්වයක්. ඩොලරයේ අගය ගත්තොත්, උදේ තිබෙන ගණන නොවෙයි, හවස තිබෙන්නේ. ගිය මාසයේ මේ වෙලාවේ ඩොලර් එකක වටිනාකම, රුපියල් 318යි.

අද දවල් රුපියල් 346යි. අපට ආරංචියි, හවස් වනකොට තව වෙනස් වෙනවා කියලා. ඔය, ආණ්ඩුවේ කෙරුවාව තමයි. රටක ආර්ථිකය කියන්නේ, ඩොලරය පාලනය කිරීම, තමන්ගේ රුපියල ශක්තිමත් කරන එක. ගෝඨාභය රාජපක්ෂ යුගයේ තිබුණු අඳුරුම කාලය දැන් ඇවිල්ලා තිබෙන්නේ. අපි අහනවා, ආණ්ඩුව ආදායම වැඩි කරගෙන තිබෙන්නේ කොහොමද කියලා. ආණ්ඩුව එන්න ඉස්සෙල්ලා කිව්වේ, නිෂ්පාදන ආර්ථිකයක් හදනවා කියලායි. හැබැයි, අද මොකක්ද කරලා තිබෙන්නේ? අද බදු පිට බදු ගහලා, මිනිස්සුන්ට ජීවත් වෙන්න බැරි තත්ත්වයට පත් කර තිබෙනවා.

මට මතකයි, යහ පාලන ආණ්ඩුව තිබෙන කාලයේ අපි මේ රටේ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ - වැඩි කොටසක් ඉන්නේ ආණ්ඩුවේ - පඩි වැඩි කළා, එකට තුනකින්. අපි යහ පාලන ආණ්ඩුවේ ඉන්න කාලයේ අධිකරණ සේවයේ එකට තුනකින් පඩි

වැඩි කළා. රජයේ හැම සේවකයකුටම අවම වශයෙන් සියයට 107කින් පඩි වැඩි කළා. තමුන්නාන්සේලා ඇවිල්ලා මොනවාද කරලා තිබෙන්නේ? ඒකෙන් බදු ගන්නවා. එහෙම කරලා කියනවා, ආදායම වැඩි කළා කියලා. තමුන්නාන්සේලා පොරොන්දු වුණේ VAT එක අඩු කරලා බඩු මිල අඩු කරන්න. අද මොකක්ද වෙලා තිබෙන්නේ? බඩු මිල වැඩි කරලා තිබෙනවා.

තමුන්නාන්සේලා බලයට එද්දී ගෑස් සිලින්ඩරයක් තිබුණේ රුපියල් 3,690කට; දැන් ඒක රුපියල් 5,000කට කිට්ටු වෙලා තිබෙනවා, පරිප්පු කිලෝවක් තිබුණේ රුපියල් 320කට; දැන් කිලෝවක් රුපියල් 440යි, බී ලූනු කිලෝවක් තිබුණේ රුපියල් 110කට; දැන් රුපියල් 160යි, මිරිස් කිලෝවක් තිබුණේ රුපියල් 900කට; දැන් රුපියල් 1,250යි, හාල්මැස්සෝ කිලෝවක් තිබුණේ රුපියල් 750කට; දැන් රුපියල් 1,200යි. අද දවල් කිරිපිටි රුපියල් 125කින් වැඩි කරලා තිබෙනවා. ආර්ථිකය හරි ගියා නම් ජනතාවට ඒක දැනෙන්න ඕනෑ.

ජේ.ආර්. ජයවර්ධන මහත්මයා එදා -1977දී- බලයට ඇවිල්ලා මේ රටේ කෘෂිකර්ම විප්ලවයක් කළා, කර්මාන්ත විප්ලවයක් කළා. මම JVP/NPP ආණ්ඩුවට කියනවා, අවුරුදු දෙකක් කිට්ටු වෙන්න එනවා, ඔබතුමන්ලා පටන් ගත්ත කර්මාන්තශාලාවක්, හදපු වැවක්, හදපු මොකක් හරි ව්‍යාපෘතියක් කියන්න කියලා. දැන් කියනවා, විදේශ සංචිත ඩොලර් බිලියන 7කට කිට්ටු වෙලා කියලා. හැබැයි, කථා කරන්නේ, ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ අඳුරු යුගය ගැන. මේ ආණ්ඩුව එනකොටත් විදේශ සංචිත ඩොලර් බිලියන 6ක් තිබුණා, ඩොලර් බිලියන 6 පැනලා තිබුණා. අද ලජ්ජා නැතිව ආණ්ඩුවේ සමහර මැති ඇමතිවරු කියනවා, අපි ඇවිල්ලා තමයි මේක වැඩි කළේ කියලා. අනුන්ගේ ළමයින්ට උප්පැන්න දෙන්න හදනවා. පඩි වැඩි කළේ අවුරුදු ගණනකින් ලැබෙන විධියට.

මේ රටේ සියයට 24ක් ඉන්නේ ගොවීන්. අපි ඉන්නේ ගොවීන් ඉන්න දිස්ත්‍රික්කවල. වී කිලෝව රුපියල් 120ට ගන්නවා කිව්වා. නමුත්, අද අපේ ප්‍රදේශයේ වී කිලෝවක් රුපියල් 90ට යන්නේ. ගොවියාට දැන් ඔරොත්තු දෙන්නෙම නැහැ. ගිය කන්නයේ අක්කරයක් සී සෑවේ රුපියල් 20,000ට. දැන් 30,000ක් යනවා. මේ නිසා ගොවියා ජීවත් වෙන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ආණ්ඩුවේ මැති ඇමතිවරු කියනවා, පොහොර තිබෙනවා කියලා. ගමට ගියාම කඩේක පොහොර ඇටයක්වත් හොයා ගන්න නැහැ. වෙළෙඳ පොළේ පොහොර රුපියල් 17,000ක්, 18,000ක් වනවා. මෙහෙම ගියොත් තමුන්නාන්සේලාට ගමට යන්න බැරි වෙයි. මම කෘෂිකර්ම ඇමතිතුමාටයි, නියෝජ්‍ය ඇමතිතුමාටයි කියනවා, පුළුවන් නම් ගිහිල්ලා ඉස්සර වාගේ කුඹුරකට බහින්න කියලා. ඒ වාගේ තත්ත්වයට අද මේ රට පත් කර තිබෙනවා.

මම හිතන විධියට, අද දේශපාලනයයි, පරිපාලනයයි කලවම් වෙලා තිබෙන්නේ. ඉස්සර දේශපාලනඥයෝ දේශපාලනය කළා. එදා පුරුදු පුහුණු කළ, විභාගවලින් ආපු නිලධාරින් හිටියා, පරිපාලන සේවයේ. අද මේ රටේ ප්‍රධාන තනතුරු තුනෙහිම ලේකම්වරු හැටියට ඉන්නේ ජනතා විමුක්ති පෙරමුණ වේදිකාවේ කථා කරපු අය. ජනාධිපති ලේකම්, ජනතා විමුක්ති පෙරමුණේ වේදිකාවේ හිටියේ. එයා අස් වුණා මම හිතන්නේ. මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ජනතා විමුක්ති පෙරමුණේ වේදිකාවේ කථා කරපු එක්කෙනෙක්. ඊළඟට, මුදල් අමාත්‍යාංශයේ ලේකම් මේ පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය ඇමතිවරයෙක්. පරිපාලන තන්ත්‍රය අද දේශපාලනීකරණය කරලා. පරිපාලන සේවයේ නිලධාරින් අද වැඩක් කරන්න බයයි. ඒ නිසා ජනාධිපතිට කියන්න සිද්ධ වෙලා තිබෙනවා, "මම ඔයගොල්ලන්ව බලා ගන්නම්, මොකුත් කරන්නේ නැහැ" කියලා. අද මේ රට කඩා වැටිලා; වැඩක් කෙරෙන්නේ නැහැ. තමුන්නාන්සේලා පසුගිය අවුරුද්දේ අය වැයෙන් වෙන් කරපු මුදලින් සියයට 50ක් වියදම් කරලා තිබුණේ නැහැ. මුදල් තිබුණේත් නැහැ. අප අහන්නේ මේ රට දවසෙන් දවස කොහේටද යන්නේ කියලායි.

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාත්, මමත් යහ පාලන ආණ්ඩුවේ හිටපු කැබිනට් ඇමතිවරු. ඒ කාලයේ දරිද්‍රතා රේඛාවට පහළින් සියයට හතරයි හිටියේ. තමුන්නාන්සේලාගේ මේ ආණ්ඩුව කොහේද යන්නේ කියලා දන්නේ නැහැ, මොකක්ද කරන්නේ කියලා දන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය, සමාජවාදී ප්‍රතිපත්තියද, රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ප්‍රතිපත්තියද, ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ ප්‍රතිපත්තියද කියලා දන්නේ නැති වන තරමටම කලවම් වෙලායි තිබෙන්නේ. අද සියයට 25කට වැඩි පිරිසක් දරිද්‍රතා රේඛාවෙන් පහළ ඉන්නවා. ගොවියා තමයි අන්තිම අසරණ තත්ත්වයට වැටිලා ඉන්නේ. 1994දී අපේ ආණ්ඩුවේ කාලය අවසන් වනකොට දළ දේශීය නිෂ්පාදිතයෙන් ගොවියාගේ පංගුව - කෘෂිකර්මයේ පංගුව - සියයට 21යි. අද එය සියයට 8ට බැහැලා තිබෙනවා. අද දරිද්‍රතා රේඛාවෙන් පහළ ඉන්න සියයට 25න් බොහෝ අය ඉන්නේ ගම්වලයි. ඒ අය ගොවියෝ. තමුන්නාන්සේලාට ගොවියා ආරක්ෂා කරන්න බැරි වෙලා තිබෙනවා. ඇමතිවරු දැන් මෙහේ ඇවිල්ලා කියනවා, පොහොර සඳහා බැංකුවලට මුදල් දාලා තිබෙනවා කියලා. ගමට ගිහින් ඇහුවාම කියනවා, බැංකුවට මුදල් වැටිලා නැහැ කියලා. මේ අවුරුද්දේ වී නිෂ්පාදනයත්, අනෙක් නිෂ්පාදනත් අඩු වෙනවා; අනිවාර්යයෙන්ම අඩු වෙනවා.

දැන් අපි අහනවා, තෙල් මිල ගැනත්. තමුන්නාන්සේලාගේ හොරකම කොච්චරද කියතොත්, ගල් අඟුරු හොරකම නිසා දවසකට බිලියන ගාණක් වැය වනවා, විදුලිය නිපදවන්න. බාල ගල් අඟුරු ගෙනාපු නිසා ඩීසල් විදුලි බලාගාරවලින් විදුලිය නිෂ්පාදනය කරන්න ඩීසල් ලීටර් ලක්ෂ 7ක් යනවා. ඔන්න, හොරකමේ ප්‍රතිඵල. විදුලි බිල තුනෙන් එකකින් අඩු කරනවා කියලායි කිව්වේ. නමුත් දැන් තුනෙන් දෙකකින්, ඒ කියන්නේ සියයට 60කින් විදුලි බිල වැඩි කරලා තිබෙනවා.

පසුගිය අවුරුද්දේ මැයි මාසයේ ඩීසල් ලීටරයක මිල රුපියල් 274යි. අද **වන**කොට රුපියල් 392යි. පසුගිය මාසයේ, මැයි මාසයේ පෙට්‍රල් ලීටරයක් **රුපියල්** 293යි, අද රුපියල් 410යි. කෝ, පාලනයක්? ජපානයේ ඩීසල් ලීටරයක මිල යෙන් 150යි; ඒක convert කළාම රුපියල් 300යි.

තමුන්නාන්සේලා අද වනකොට අපේ රටේ මිනිසුන්ට වාහන ගේන්න ඉඩ දීලා තිබෙනවා. දැන් tax එක එන්න එන්න වැඩි කරනවා. හොරකම කියන එක අද ඉහළටම ගිහිල්ලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ ජෝන් කීල්ස් සමාගම සහ තමුන්නාන්සේලාට උදව් කරන සමාගම් මේ බදු වැඩි කරන්න ඉස්සෙල්ලා වාහන 4,000කට LCs විවෘත කරලා තිබෙනවා. මෙවා කවදාවත් මේ රටේ සිද්ධ වෙච්ච නැති දේවල්. ඒක තමයි අප කියන්නේ, "පව මදිවට හොරු!" කියලා; "හොරු මදිවට පව!" කියලා. පව කියලා ආපු ආණ්ඩුව දැන් හොරකම් කරන්නත් පටන් අරගෙන.

තමුන්නාන්සේලාට බැරි වෙලා තිබෙනවා මේ රට පාලනය කරන්න. තමුන්නාන්සේලාට බැරි වෙලා තිබෙනවා, මේ රටේ ආර්ථිකය හසුරුවන්න. ඩොලරය අද නිකම් නූල කැඩිච්ච සරුංගලයක් වාගෙයි. මුදල් ඇමති දන්නේත් නැහැ, මහ බැංකුවේ අධිපති කියනවා, රටේ අනාගතය අවිනිශ්චිතයි කියලා. මහ බැංකුවේ අධිපති ඒක කිව්වාට පස්සේ රටේ ජනතාව අද මොනවාද කල්පනා කරන්නේ?

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ආවා විතරයි සමහර රටවලට යන්න දැන් වීසා දෙන්නේ නැහැ. යුරෝපයට දෙන්නේ නැහැ, වීසා. ජපානයට දෙන්නේ නැහැ, වීසා. එංගලන්තයට දෙන්නේ නැහැ, වීසා. ඇමතිවරයෙකුට යන්න බැහැ.

රණවිරුවන් සැමරූ දිනයේ ජනාධිපති කියනවා, මේ රටේ ආයෙත් යුද්ධයක් එන්නේ නැහැ කියලා. ඇයි ඉතින්,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

"යුද්ධයක් එන්නේ නැහැ" කියලා, අපි කොහොමද දන්නේ? ඒගොල්ලන් නේ, යුද්ධ කළේ. LTTE එක යුද්ධ කරද්දී JVP එක මිනිස්සු මැරුවා. එක ඇමතිවරයෙක් කියා තිබෙනවා මට මතකයි, "අපිට ඉතින් රණවිරුවන් සමරන්න යන්න බැහැ" කියලා. රණවිරුවන්ට කරපු දේවල් අපට මතකයි. රණවිරුවන්ව - පොලීසියේ අය, හමුදාවේ අය - මැරුවා. එහෙම අයයි මේ ඉන්නේ. හැබැයි ඒ අය විශ්වවිද්‍යාලවලින් ආපු අය නොවෙයි; අලුතින් ආපු අය නොවෙයි; JVP cadre එකේ ඉන්න පරණ අය. එවැනි අය රට පාලනය කරනවා. ඉතින් කොහොමද, ලෝකය විශ්වාස කරන්නේ? කොහොමද, මිනිස්සු විශ්වාස කරන්නේ? අපි කියනවා, බොරු කියන්නේ නැතුව ජනතාවට මීට වඩා සහනයක් දෙන්න කියලා.

ස්තුතියි

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.43]

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, மே மாதம் 18ஆம் திகதி முள்ளிவாய்க்கால் நினைவேந்தல் தினமாகும். இம்முறை இத்தினமானது வடக்கு, கிழக்கு உட்பட தமிழர்கள் வாழுகின்ற பிரதேசங்களில் உணர்வெழுச்சியோடு அனுஷ்டிக்கப்பட்டது. 2009ஆம் ஆண்டு இறுதி யுத்தம் நடைபெற்ற பகுதியில் நானும் என்னுடைய சகோதரர்கள் உட்பட குடும்பத்தினரும் வாழ்ந்த நாட்களை நினைத்துப் பார்க்கின்றேன். அந்த நேரத்தில் மக்கள் பட்ட கஷ்டங்களையும் இடம்பெற்ற மனித அவலங்களையும் இப்பொழுதும் மறக்க முடியாது. ஏனென்றால், அந்த நேரத்தில் பலர் குடும்பம் குடும்பமாக செத்துப் போனார்கள்; பலர் காணாமல்போய் இருந்தார்கள். காணாமல்போன பலர் தொடர்பில் இன்றுவரை எந்தவிதமான தகவலும் இல்லாமல் இருப்பதாக அவர்களின் உறவினர்கள் தொடர்ச்சியாகக் கூறி வருகின்றார்கள். கடந்த 18ஆம் திகதிகூட, எல்லோரும் ஒன்றிணைந்து கண்ணீர்மல்க தமது அஞ்சலிகளையும் பிரார்த்தனைகளையும் செய்திருந்தார்கள். இந்த நாளானது, ஒட்டுமொத்த தமிழன மக்களுக்கும் முக்கியமான ஒரு நாளாக இருந்து வருகின்றது.

நேற்றைய தினம் இடம்பெற்ற தேசிய போர் வீரர் நினைவுதின நிகழ்வில் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் மிகத் தெளிவாகக் குறிப்பிட்டு இருந்தார், "இனி இலங்கையில் யுத்தமொன்று வரக்கூடாது; அது ஏற்பட நாங்கள் அனுமதிப்பதும் கிடையாது" என்று. கடந்த காலங்களில் யுத்தம் காரணமாக வடக்கு, கிழக்கு, தெற்கு, மேற்கு என இந்த நாட்டில் வாழ்ந்த மக்கள் மிக மோசமாகப் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். அவர்கள் பாரிய மனித அவலங்களைச் சந்தித்திருக்கிறார்கள். அந்த நிலையிலிருந்து மீண்டு, இந்த நாட்டை நல்ல முறையில் அடுத்த சந்ததியினரிடம் கொடுக்க வேண்டுமென்றால், நாங்கள் சரியான முறையில் இந்த அரசாங்கத்தையும் மக்களையும் வழிப்படுத்த வேண்டிய தேவையிருக்கின்றது.

குறிப்பாக, வடக்கு, கிழக்கில் வாழ்கின்ற தமிழ் மக்கள், இறுதி யுத்தத்தின்போது தங்களுக்கு நிகழ்ந்த அநீதிக்கு நீதியைப் பெற்றுத்தருமாறு வலியுறுத்தி இன்றுவரை போராட்டம் நடத்திக்கொண்டு இருக்கிறார்கள். தற்போது இங்கிருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்கள் எவரும் 2009ஆம் ஆண்டு அங்கு இருந்தது கிடையாது. ஆனால், நான் அங்கு இறுதிவரை இருந்தேன். ஒரு சாரத்தோடும் ஒரு T-shirt உடனும் 4 நாட்கள் சாப்பிடாமல் கரையில் ஒதுங்கியிருந்தேன். அந்த யுத்தத்தால் ஏற்பட்ட வலியையும் வேதனையையும் ஒரு குடிமகனாக நான் அறிந்திருக்கின்றேன். அந்த அடிப்படையில்தான், இந்த நாட்டில் வாழுகின்ற தமிழ் மக்கள் உட்பட அனைவருக்கும் நீதி கிடைக்க வேண்டும் என்பதற்காக எங்களுடைய தேசிய மக்கள் சக்தி அரசாங்கம் பல்வேறு முயற்சிகளையும் முன்னெடுப்புகளையும் மேற்கொண்டு வருகின்றது. உண்மைகளைக் கண்டறிந்து, அவற்றைப் பாதிக்கப்பட்ட மக்களுக்குச் சொல்ல வேண்டும் என்பதில் நாங்கள் தெளிவாக இருக்கின்றோம்.

கடந்த 18ஆம் திகதி வடக்கு, கிழக்கு தாயகப் பகுதிகளில் எங்களுடைய மக்கள் எந்தவிதமான இடையூறும் அச்சுறுத்தலும் இன்றி, இறந்துபோன தங்களுடைய உறவுகளின் ஆத்மாக்களுக்குப் பிரார்த்தனை செய்தார்கள். குறிப்பாக, எங்களுடைய அரசாங்கம் எந்தவித இடையூறையும் ஏற்படுத்தவில்லை. அதற்காக அந்த மக்கள் எங்களுடைய அரசாங்கத்துக்கு நன்றி தெரிவித்தார்கள் என்பதை நான் இந்த உயரிய சபையில் தெரிவித்துக்கொள்கின்றேன். அதற்கான ஏற்பாடுகளை எங்களுடைய சனாதிபதி அவர்களே செய்திருக்கிறார். அதற்காக அவருக்கும் எங்களுடைய மக்கள் சார்பில் நன்றியைக் கூறிக்கொள்கின்றேன்.

இன்று சக நாடாளுமன்ற உறுப்பினர் கௌரவ சுனில் ராஜபக்ஷ அவர்களால் கொண்டுவரப்பட்ட ஒத்திவைப்புப் பிரேரணையை ஆளுங்கட்சி சார்பில் முழுமையாக அதரித்துப் பேசுகின்றேன். எமது நாட்டின் மத்திய வங்கியால் வெளியிடப்பட்டுள்ள 2025ஆம் ஆண்டுக்கான வருடாந்த பொருளாதார மீளாய்வு அறிக்கையென்பது வெறும் புள்ளிவிபரங்களின் தொகுப்பல்ல. அது எமது தாய் நாடு கடந்த கால நெருக்கடியிலிருந்து மீண்டு, எவ்வாறு ஸ்திரத்தன்மையையும் புதிய பொருளாதார மறுமலர்ச்சியையும் நோக்கி நகர்ந்துள்ளது என்பதற்கான உத்தியோகபூர்வ சான்றாகும்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நாம் எங்கே இருந்து பயணத்தை ஆரம்பித்தோம். கடந்த காலத் தவறுகளும் பொருளாதாரப் பாதிப்புகளும் எம்மை எத்தகையதொரு பாதாளத்தில் கொண்டு சேர்த்திருந்தது என்பதை இந்த உயரிய சபை சற்று ஆழமாக யோசிக்க வேண்டும். 2022ஆம் ஆண்டு வரலாற்றில் ஏற்பட்ட மாபெரும் பொருளாதார வீழ்ச்சியுடன் இந்த நாட்டின் வாழ்வாதாரமும் நிதித்துறையும் முற்றிலும் முடங்கிப் போயின. அதற்கு ஒரு நேரடி உதாரணத்தை நான் கூற விரும்புகின்றேன். கடந்த

காலத் தவறான நிதிக் கொள்கையால் எமது நாட்டின் அந்நியச் செலாவணிக் கையிருப்பு பூச்சிய நிலையை அடைந்தபோது, அத்தியாவசியப் பொருட்களை இறக்குமதி செய்யக்கூட எம்மிடம் டொலர்கள் இருக்கவில்லை. இதன் விளைவாக, நாட்டின் பொருளாதார உற்பத்தி முற்றிலும் ஸ்தம்பித்ததுடன், கொளுத்தும் வெய்யிலில் அத்தியாவசியப் பொருட்களுக்காக எமது நாட்டு மக்கள் மைல் கணக்கில் நீண்ட வரிசைகளில் நின்றதை சர்வதேச ஊடகங்கள் தலைப்புச் செய்திகளாக்கின. வராக்கடன்களால் எமது வங்கிக் கட்டமைப்பு ஆட்டம் கண்டது; பணவீக்கம் உச்சமடைந்தது. சாதாரண நடுத்தரக் குடும்பங்களின் சமையலறைகளை அது சூறையாடியது. கடந்த கால பாதிப்புகள் எமது ஒட்டுமொத்த சமூகக் கட்டமைப்பையே தேசியப் பாதுகாப்பு அச்சுறுத்தலின் விளிம்புக்குக் கொண்டு சேர்த்திருந்தது.

Economic mismanagement of the past brought this nation to its knees. Look at the stark example of 2022. Our foreign reserves depleted to a near zero, leaving us unable to import the essential fuel and medicines, forcing our citizens into miles-long queues and collapsing domestic production. எமது அரசாங்கமானது அந்தப் பாதாளத்திலிருந்து நாட்டை மீட்டெடுக்க துணிச்சலான, திட்டமிட்ட கட்டமைப்புச் சீர்திருத்தங்களை மேற்கொண்டது. அதன் பலனாக, 2025ஆம் ஆண்டின் இறுதியாகும்போது நாடு சரியானதொரு பாதையில், வலுவான பொருளாதார அடித்தளத்துடன் முன்நோக்கி நகர்ந்தது. அதன் நேரடிப் பிரதிபலிப்பாக இலங்கையின் ஒட்டுமொத்தப் பொருளாதாரம் வரலாற்றிலேயே முதன்முறையாக 100 பில்லியன் டொலர் எல்லையைத் தாண்டி சாதனை படைத்தது.

அதேபோன்று, எமது மக்களின் தனிநபர் வருமானம் 5,000 டொலரைக் கடந்து உயர்வடைந்துள்ளது. அரசாங்கத்தின் முறையான நிதிக் கொள்கையால் 2025ஆம் ஆண்டு முழுவதும் பணவீக்கமானது ஒற்றை இலக்கத்திலேயே பேணப்பட்டது. இருப்பினும், மத்திய வங்கி அறிக்கை சுட்டிக்காட்டுவதுபோல, உள்நாட்டு அபாயங்கள் நீங்கியுள்ள போதிலும், தற்போதைய புவிசார் அரசியல் மற்றும் உலகளாவிய விநியோகச் சங்கிலி மாற்றங்களால் ஏற்படும் வெளிப்புற அச்சுறுத்தல்களுக்கு நாம் முகங்கொடுக்க வேண்டியுள்ளது. இந்த உலகளாவிய அச்சுறுத்தல்களைக் குறைத்து, நிலையான வளர்ச்சியை உறுதிசெய்ய வேண்டுமாயின், நாட்டின் ஒட்டுமொத்த வளங்களையும் குறிப்பாக இதுவரை முழுமையாகப் பயன்படுத்தப்படாத பிராந்தியங்களின் பொருளாதார ஆற்றல்களையும் நாம் தேசிய நீரோட்டத்துடன் இணைக்க வேண்டும். To effectively mitigate the geopolitical economic vulnerabilities and sustain this growth, we must unlock the hidden economic potential of our regions and fully integrate them into the national economic architecture.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இலங்கையின் நிலப்பரப்பில் மூன்றில் ஒரு பகுதியையும் கடற்கரையில் மூன்றில் இரண்டு பங்கையும் கொண்டுள்ள வடக்கு மற்றும் கிழக்கு மாகாணங்கள் வெறும் ஓரங்கட்டப்பட்ட பகுதிகள் அல்ல. அவை நாட்டின் 'வடக்கு நுழைவாயில்' மற்றும் நீலப் பொருளாதாரத்தின் மிக முக்கிய மையங்களாகும். இந்தியப் பெருங்கடல் மற்றும் தெற்காசிய கடல்சார் புவியியலில் குறிப்பாக, இந்தியாவின் தெற்குக் கடற்கரைக்கு மிக அருகில் அமைந்துள்ள இவ்விரு மாகாணங்களும் சர்வதேச வர்த்தகப் பாதைகளின் மூலோபாய மையப்புள்ளிகளாக விளங்குகின்றன.

எமது அரசாங்கம் போருக்குப் பிந்திய மறுசீரமைப்புப் பணிகள் ஊடாக காங்கேசன்துறை துறைமுக மேம்பாடு, பருத்தித்துறை மற்றும் மன்னார் போன்ற கடற்கரையோர வர்த்தக உட்கட்டமைப்புகள் மற்றும் பலாலி சர்வதேச விமான நிலையத்தின் ஊடான பிராந்தியத் தொடர்பு மேம்பாடுகளை மேற்கொண்டுள்ளது. இவை கொழும்பு, திருகோணமலை மற்றும் தென்னிந்திய துறைமுகங்களை இணைக்கும் ஒரு பிராந்திய விநியோக மையமாக எமது நாட்டை மாற்றுவதற்கான சாத்தியக்கூறுகளைக் கொண்டுள்ளன. அது சம்பந்தமாக எங்களுடைய தேசிய மக்கள் சக்தி அரசாங்கம் பல முனைப்புகளை முன்னெடுத்து வருகின்றது. நீண்ட, நிலையான, நல்லதொரு நாட்டை உருவாக்க வேண்டுமெனச் சொன்னால், இந்த நாட்டில் நாங்கள் கொண்டிருக்கின்ற கொள்கைகள் உண்மையிலேயே சரியாக இருக்க வேண்டும். அந்த வகையில், அவை சரியாக இருக்கின்றது என்பதை இந்த உலகமும் மக்களும் ஏற்றுக்கொண்டு இருக்கின்றார்கள்.

தற்போது வடக்கு மாகாணம் தேசிய மொத்த உள்நாட்டு உற்பத்தியில் 3-4 சதவீதத்தையும், கிழக்கு மாகாணம் 5-6 சதவீதத்தையும் வழங்கி வருகின்றது. இவ்விரு மாகாணங்களும் இணைந்து தேசிய உற்பத்தியில் 8-10 சதவீத பங்களிப்பை வழங்கியபோதிலும், அவற்றின் உண்மையான பொருளாதாரத் திறன் இதைவிட மிக அதிகமாகும்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
Madam, I need one more minute.

மன்னார் வளைகுடா மற்றும் பாக் விரிகுடா போன்ற வளமான கடல்சார் வளங்கள்மூலம் 50,000க்கும் மேற்பட்ட மீனவக் குடும்பங்களின் வாழ்வாதாரத்தை உறுதிப்படுத்துவதுடன், ஆழ்கடல் கடல்பாசி வளர்ப்பு, நண்டு மற்றும் இறால் பண்ணைகள்மூலம் எமது அரசாங்கம் கடல்சார் ஏற்றுமதி வருவாயையும் அதிகரித்து வருகின்றது. அதேவேளை, இரணைமடு, அக்கராயன், மாந்தைக் குளம் போன்ற நீர்ப்பாசனக் கட்டமைப்புகளின்கீழ் மேற்கொள்ளப்படும் நெல் சாகுபடி, பெரிய வெங்காயம், மிளகாய், திராட்சை உற்பத்தி மற்றும் வவுனியா, மன்னார் சார்ந்த பாற்பண்ணைகள்மூலம் நாட்டின் ஒட்டுமொத்த உணவுப் பாதுகாப்புக்கும், கிராமப்புற வேலைவாய்ப்புக்கும் இம்மாகாணங்கள் மிகப் பெரிய தூண்களாக விளங்குகின்றன.

நாம் புவிசார் அரசியல் மற்றும் இயற்கைச் சவால்களை முறியடித்து, டிஜிட்டல் மயமாக்கல் மற்றும் ஏற்றுமதி பன்முகத்தன்மைமூலம் பொருளாதாரக் கட்டமைப்பை மேலும் பலப்படுத்த வேண்டியுள்ளது. இந்த உன்னதமான இலக்கை அடைவதற்காக எமது நாட்டைப் புதியதோர் உன்னத நிலைக்குக் கொண்டுசெல்ல எவ்விதப் பொய்ப் பிரசாரங்களுக்கும் இடங்கொடுக்காது, கட்சி பேதங்களைக் கடந்து, உங்கள் அனைவரினதும் முழுமையான ஒத்துழைப்பை வழங்க வேண்டுமென இந்த உயரிய சபையில் கேட்டு, விடை பெறுகின்றேன்.

நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.54]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද මේ කල්තැබීමේ විවාදය ආණ්ඩු පක්ෂය විසින් ගෙනැල්ලා තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ බොහෝ මන්ත්‍රීවරු 2025 වසරේ ආර්ථික වර්ධනය පිළිබඳව ප්‍රකාශ කරනකොට මට දැනුණේ, මට තේරුණේ මේකයි. අර කථාවක් තිබෙනවා නේ, "මගේම කලිසම අගේට ඇඳගෙන උගේ වගේ යනවා" කියලා. එහෙම නැත්නම් මට හිතෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අනුන්ගේ දරුවන්ට උප්පැන්න දෙනවාදෝ කියලා.

දැන් විදේශ ප්‍රේෂණ ගැන කථා කරනවා, ගෙවුම් ශේෂය ගැන කථා කරනවා, ප්‍රාථමික ගිණුමේ ශේෂය ගැන කථා කරනවා. මට මතක හැටියට ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ප්‍රාථමික ගිණුමේ ශේෂය 2022 වර්ෂයේ වාගේ බින්දුවට තිබුණේ. 2022, 2023, 2024 කාලයේ වෙනත් ජනාධිපතිවරයෙක් පත් වෙලා, ඒ ජනාධිපතිවරයාගෙන් පස්සේ 2024 සැප්තැම්බර් මාසයේ 21වන දා තමයි ජනාධිපතිවරයා හැටියට අනුර කුමාර මහත්මයා පත් වෙන්නේ. 2024 නොවැම්බර් මාසයේ පාර්ලිමේන්තු මැතිවරණය පවත්වලා දෙසැම්බර් මාසයේ වාගේ තමයි පාර්ලිමේන්තුව රැස්වෙන්නේ. ඒ කෙටි කාලය තුළ ප්‍රාථමික ගිණුමේ ශේෂය ඩොලර් බිලියන 6.6ක්ව තිබියදි තමයි තමුන්නාන්සේලා ආණ්ඩුව භාර ගන්නේ. අද ගත්තාම, ඒක ඩොලර් බිලියන 6.7යි. ඉතින්, දශම එකයි වැඩි වෙලා තිබෙන්නේ. ඒ ඩොලර් බිලියන 6.6 අයිතිකාරයා කවුද? 2022දී ඒක බින්දුවට වැටිලා තිබුණා කියලා අපි පිළිගන්නවා. හැබැයි, 2024දී ඔබතුමන්ලා ආණ්ඩුව භාරගත්තාට පසු ඔබතුමන්ලා අද කියන මේ ආර්ථික වර්ධනය ඔබතුමන්ලාගේ පිලේ වැඩ පිළිවෙළක්ද? ඔබතුමන්ලා කරපු දෙයක්ද මේ? ඔබතුමන්ලා කරපු දෙයක් වාගේ ඔබතුමන්ලාට කියන්නේ, මේ වැඩ පිළිවෙළ ඔබතුමන්ලා ඉදිරියට ගෙනියන්නේ ඔබතුමන්ලාට ලජ්ජා නැති නිසා. ඔබතුමන්ලාගේ නායකයා ප්‍රමුඛ මේ ආණ්ඩුවේ හැමෝටම ඒ ලජ්ජාව නැහැ. අපි යම් වෙලාවක කල්පනා කළා, JVP එක වෙනයි ජාතික ජන බලවේගය වෙනයි, ඇත්තටම ජාතික ජන බලවේගයේ ඉන්නේ උගතුන්, වියතුන්, එයාලා බොරු නොකියයි කියලා. හැබැයි JVP පිලට වැටිච්ච නිසා දැන් ඒගොල්ලන්ට බොරු කියන්න වෙලා තිබෙනවා. 2023, 2024, 2025 මේ ආර්ථික වර්ධනය සිදු වීමේදී තිබිච්ච වැඩ පිළිවෙළේ අයිතිකාරයා කවුද, ඒ වැඩ පිළිවෙළ කළේ කවුද කියන කාරණය ලජ්ජා නැතුව, බය නැතුව කියන්න.

විපක්ෂය බොරු කියනවා කියලා කිව්වා නේ දැන්. මෙතැන තිබෙනවා බොරු එකසිය ගණනක්. තමුන්නාන්සේලා කියපු ඒ බොරු ටිකක් මම කියන්න ඕනෑ. මොකද, අපේ විපක්ෂ නායකතුමා කිව්වේ බොරු කියලා කියනවා නේ. තමුන්නාන්සේලා කිව්වා, අර්ජුන මහේන්ද්‍රන් ලංකාවට ගේනවා කියලා. මම මේ බොරු එකසිය ගණනම කියන්න යන්නේ නැහැ. ඊළඟට කිව්වා, බලයට පත් වෙලා පළමුවැනි සතියේ 70ක් විතර ඇතුළට දානවා කියලා. පෙට්‍රල් රුපියල් 52කට දෙනවා කිව්වා. විදුලි ගාස්තු තුනෙන් එකකින් අඩු කරනවා කිව්වා. මේවා බොරු නොවෙයිද? ඊළඟට, 2025.04.21 දින පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු එළිදක්වනවා කිව්වා. ඒ කියන්නේ, 2025.04.21වැනි දා වෙනකොට. දැන් මේ යන්නේ 2026 වර්ෂය. එදා කියපු බොරු ගොඩක් මෙතැන තිබෙනවා. ඊළඟට කිව්වා, මුහුදු වතුරෙන් සල්ෆියුරික් හදනවා කියලා. බොරු 150ක් විතර කියලා තිබෙනවා. මට ඒ එකින් එක කියන්නත් බැහැ. ඊළඟට, "දිට්වා" ගැනත් ඔයගොල්ලන් උජාරුවට කථා කරනවා නේ. ඉස්සෙල්ලාම කිව්වා, හානි වුණු දේපළවලට කෝටියක් දෙනවා කියලා. ඊළඟට කිව්වා, නිවසේ වහලේ තහඩුවක් ගියත් ලක්ෂ 10ක් දෙනවා කියලා. ඉඩමකට ලක්ෂ 50ක් දෙනවා කිව්වා. ගෙදරකට ලක්ෂ 50ක් දෙනවා කිව්වා. මේවා මේ තමුන්නාන්සේලාගේ නායකයෝ කියපු බොරු ටික. ඕනෑ නම් මම මේ කොළයේ පිටපතක් දෙන්නම් බලන්න. මොකද, දැන් අමතක වෙලාත් ඇති.

බොරුවට උත්පත්තියක් තිබෙනවා නම්, බොරුවට ජාතකයක් තිබෙනවා නම්, ඒ ජාතකයේ අයිතිය තිබෙන්නේ ජාතික ජන බලවේගයේ තමුන්නාන්සේලාට. එහෙම බොරු කිය කියා බොරුවෙන්ම ජීවිතය ගෙන යන්න එපා. ලැබුණු ජන වරම අනුව තව අවුරුදු පහක් යන්න ඕනෑය කියලා බොරු කියාගෙන යන්න එපා. ඔය කියන ආර්ථික වර්ධන වේගය අද සමාජය තුළ ප්‍රායෝගිකව දකින්න නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. කෘත්‍රිම ආර්ථික වැඩ පිළිවෙළක් අද සමාජය තුළ සිද්ධ වෙලා තිබෙනවා. ඇයි? ජනතාවට මේ ආර්ථික පීඩනය දරා ගන්න බැරුව දෛනික ආර්ථික අවශ්‍යතාවලින් විතැන් වෙලා තිබෙනවා. වේල් තුන කාපු මිනිස්සු අද එක වේලයි කන්නේ. එක වේලක් කාපු මිනිස්සු වතුර ටිකක් බීලා ඉන්නවා. ගමන් බිමන් යන්නේ නැහැ. එක මන්ත්‍රීතුමෙක් කිව්වා ඒ කාලයේ පෝලිම් තිබුණා කියලා. අර කංචන විජේසේකරගේ QR code එක නැත්නම්, දැනුත් පෝලිමක් තමයි තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමා. ඔයගොල්ලන් පෝලිම අයින් කරලා නැහැ. ඔයගොල්ලන් කරලා තිබෙන්නේ සීමා කරන එක. ඔත්තේ ඉලක්කම්වලට දවසයි, ඉරට්ටේ ඉලක්කම්වලට දවසයි කියලා ඔයගොල්ලන් QR code එකට ඉන්ධන ටික බෙදා දෙනවා. ඒ නිසා පෝලිම නැති වෙලා තිබෙනවා. ඊළඟට, ඔයගොල්ලන් ගෑස් පෝලිම හැදුවා. ඔයගොල්ලන් ඉන්ධන පෝලිම හැදුවා. ඒ සියලු දේ කළා. ඒ සියලු දේවල් කරලා අද මේ පසුපෙළේ මන්ත්‍රීවරයෙක් ලවා කියනවා, "අපි ආර්ථිකය හොඳට හදලා තිබෙනවා" කියලා. මහ පාරේ ඉන්න අයගෙන්, එහෙම නැත්නම් කෘෂිකර්මාන්තයේ යෙදී සිටින අයගෙන්, එහෙමත් නැත්නම් රාජ්‍ය ආයතනවලට ගිහිල්ලා කථා කළා නම් කියලා දෙයි ආර්ථිකය හැදුවේ කොහොමද කියලා.

තව කිව්වා, මාස හයෙන් හයට රාජ්‍ය සේවකයාගේ පඩි වැඩි කරනවා කියලා. එහෙම කියලා ඒ අය අන්දලා තමුන්නාන්සේලා ඒ අයගේ ඡන්දය ගත්තා. අද රාජ්‍ය සේවකයන්ට කියනවා, "පාරට එන්න එපා. ඉල්ලීම් දෙන්නේ නැහැ. පඩි වැඩි කරන ඒවා ඉල්ලන්න එපා. ගෙදරට වෙලා ඉන්න. හතර හන්දි කඩනවා" කියලා. ඔන්න ඔයගොල්ලන් කියපු දේවල්. එහෙම බොරු කියලා දැන් ආර්ථිකය හැදුවාය කියන එක සාධාරණද කියලා අපි අහනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. දැන් ආර්ථිකය හැදුවා කියන්නේ පසුගිය පාලන කාලයේ තිබුණු වැඩ පිළිවෙළ අනුවයි. අපි හැම දාම මේ රටට යහපතක් වෙන්න ඕනෑය කියපු, ඒ මොනවාද කියන කාරණය බය නැතුව කියපු උදවිය. බොරු කිව්වේ ඔයගොල්ලන්. සමගි ජන බලවේගයේ අය බොරු කිව්වේ නැහැ. ඒ නිසා අපි එදා කිව්වා වාගේම අදත් ඒ දේවල් කියනවා. කෙහෙල් ගෙඩියේ නැට්ට කෙළින් කරනවා කියනකොට අත්පුඩි ගහලා තමුන්නාන්සේලාට බලය දුන්නා. සජිත් ප්‍රේමදාස මහත්තයා තරුණ ගැහැනු ළමයින්ට අවශ්‍ය සනීපාරක්ෂක තුවා දෙනවා කිව්වාම ඒකට විහිළු කළා; ඒක මෝඩ කථාවක් කිව්වා. අද මොකද වෙලා තිබෙන්නේ? අද තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ ප්‍රමුඛ කාර්යයක් බවට ඒක පත් වෙලා තිබෙනවා. අපි දන්නවා, රටට යහපත් දේවල්, අනාගතයට

ඔබිත දේවල් කවුද කළේ කියලා. ඔයගොල්ලන් කිව්වා, මාළු අල්ලන අයට SMS එකෙන් මාළු ඉන්න තැන් දන්වනවා කියලා. සජිත් ප්‍රේමදාස මහත්තයා smart boards පාසල්වලට බෙදනකොට තමුන්නාන්සේලා කිව්වා, පාසලේ දේශපාලනය කරනවා කියලා. හැබැයි, ඔයගොල්ලන් අද වෙනකම් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළ හරියට හදාගෙන නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මම අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මේ රට තුළ දැන් සැබෑ ආර්ථික, දේශපාලන සහ සමාජයීය වැඩ පිළිවෙළ ගොඩනගන්න පුළුවන් ඒ ශක්තිමත් කඳවුර ගොඩ නැඟී තිබෙනවා. ඔය පිලේ ඉන්න සැබෑ උගතුන්, ජාතික ජන බලවේගය යැයි කියා ගනිමින් මේ රට ගොඩනගන්න ගිය උදවිය ඒක තේරුම් ගන්න කියන කාරණය මතක් කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point එක මොකක්ද?

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Madam, yesterday, the Member seated in seat number 16 in Opposition Benches mentioned my name saying that I had abusively treated a lady member of the public in Parliament. That is an absolute lie. I have not, in any way, spoken to anybody in the Library or in any other part of the Parliament and certainly not to anybody who has any sort of links to that Member. Therefore, I wish to seek your permission to raise a matter of Privilege officially tomorrow at the first available opportunity.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු රුවන් විජේවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.02]

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රට බරපතළ අභ්‍යන්තර කම්පනයකට මුහුණ දෙමින් තිබියදී වුවද, 2025 වර්ෂයේදී අත් කරගත් ආර්ථික ජයග්‍රහණය සහ මේ රට ඉදිරියට ගෙන යන වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් මහ බැංකුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව පිළිබඳව සභාව කල් තබන අවස්ථාවේ විවාදය සිදු කරන මේ මොහොතේදී, විශේෂයෙන්ම අද දවසේ මේ විවාදය තුළ මතු කරපු කාරණා කිහිපයක් එක්ක මගේ කථාව ඉදිරියට ගෙන යන්න කැමැතියි.

මෙතුමන්ලා මතු කළ එක කාරණාවක් තමයි අපි වෙන කෙනෙකු - ඒ කියන්නේ, ඒගොල්ලන් - ඇඳපු කලිසම ඇඳගෙන අගේට යනවා කියපු කථාව. ඒ වාගේ අදහසක් මෙතැන මතු කරන්න උත්සාහ කළා. ඒ අය 2024 වෙනකොට ඩොලර් බිලියන හයකට ආසන්න සංචිතයක් ගොඩනහා තිබුණේ කොහොමද කියන කාරණාව බැලුවොත්, ඒක ගොඩනගන්න හදා ගත් ආර්ථික වටපිටාව මොකක්ද කියන එක පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. ණය ගෙවන්නේ නැතුව, ආනයන දැඩි ලෙස සීමා කරමින්, රටේ ආර්ථිකය තුළ රැකියා ලබා දීම සීමා කරමින්, සම්පූර්ණයෙන්ම නවත්වමින්, සංවර්ධන කටයුතු සම්පූර්ණයෙන්ම නවත්වා, බින්දුවට දමා තිබුණු රටක තමයි ඒගොල්ලන් ඩොලර් බිලියන හයක ආර්ථිකයක් හැදුවේ. එතකොට automatically, අර ගිවිසුමත් එක්ක යනකොට ඩොලර් බිලියන 6 දක්වා ගෙනෙන්න පුළුවන්.

හැබැයි, අපි මේ ඩොලර් බිලියන 6ට 2025දී මොකක්ද කළේ? එක තැන නතර වෙච්ච ආර්ථිකයක් - stagnated economy එකක් - තිබුණා. අපි ඒ ආර්ථිකය ඉදිරියට ගමන් කරන ආර්ථිකයක් බවට පරිවර්තනය කළා. අපි රට ඇතුළේ වැඩ කෙරෙන ප්‍රමාණය දැඩි ලෙස සංවර්ධනය කරනු ලැබුවා. උදාහරණයක් විධියට ගත්තොත්, ණය ගෙවීම ආරම්භ කරලා, ආනයන සීමා ඉවත් කරලා, ආනයන සිදු කරන රටක් ඇති කරලා, රැකියා දහස් ගණනක් ලබා දුන්නා. ඒ වෙනකොට රැකියා දහස් ගණනක් ලබා දීලා තිබුණේ නැහැ. රටේ තිබෙන පුරප්පාඩු හඳුනා ගනිමින්, ඒවාට නිශ්චිත ක්‍රමවේදයක් යටතේ රැකියා ලබා දෙමින් අපි සංවර්ධන කටයුතු සිදු කළා.

ඊළඟට, අවුරුදු ගණනාවක් ඇතුළත පාරක්වත් හදලා තිබුණේ නැහැ. පාරක කොන්ක්‍රීට් එකක්වත් දාලා තිබුණේ නැති රටක අපේ සංවර්ධන වැඩ පිළිවෙළ තුළින් අධිවේගී මාර්ග පවා හදන්න ආරම්භ කරලා, අපි මේක ඩොලර් බිලියන 7ක මට්ටමට ගෙනැල්ලා තිබෙනවා. ආනයන වියදම් විතරක් මේකට එකතු කළත් තවත් ඩොලර් බිලියන 5ක් විතර වෙනවා. රනිල් වික්‍රමසිංහ ගිය පාරෙම ගියා නම් අපිට ඩොලර් බිලියන 12ක සංචිතයක් හදා ගන්න තිබුණා. අපි එහෙම කළේ නැහැ. අපි ඊට වඩා වෙනස් පිළිවෙළක් අනුගමනය කරමින් කටයුතු කළා. මේ රටේ ජනතාව අපට ලබා දුන් ජන වරම අනුව වෙනස් පාරක යමින්, වික්‍රමසිංහ මහත්මයාගේ පිළිවෙළට වඩා වෙනස් පියවරක් තබමින් තමයි අපි ඒක වෙනස් කරනු ලැබුවේ. IMF එකේ prediction එක තිබුණේ 3.5 per cent growth එකක් එයි කියලා. හැබැයි, අපි ඒක බිලියන 5ක මට්ටමට ගෙනෙනවා. එතකොට අපි රනිල්

[ගරු රුවන් විජේවීර මහතා]

වික්‍රමසිංහගේ පාරේ ගිහිල්ලා නොවෙයි, ඊට වඩා වෙනස් ආකාරයක ජනතාවාදී පියවර රැසක් ගන්නා ගමන් තමයි ඒක හදා ගත්තේ.

බලය ගත්තාට, අපි කියපු කිසි දෙයක් කළේ නැති ආණ්ඩුවක් කියලා කියන්න විපක්ෂ නායකතුමා උත්සාහ කළා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ගත්තේ මොන වාගේ රටක්ද, මොන වාගේ තත්ත්වයක තිබුණු රටක්ද, මොන වාගේ ආර්ථිකයක්ද මේකේ තිබුණේ කියලා ඔබතුමිය දන්නවා. තවත් පව පෙළක් කිව්වා. මම ඒවාටත් උත්තර දෙන්නම්.

2026.05.18 දින "ලංකාදීප" පුවත් පතේ "සඳුදා හමුව" කියන විශේෂාංග ලිපියේ මෙසේ සඳහන් කර තිබෙනවා:

> "2022 ආර්ථික අර්බුදය හුදෙක් විදේශ විනිමය හිඟයක්, ණය අර්බුදයක් හෝ වැරදි ආර්ථික කළමනාකරණ තීරණවල ප්‍රතිඵලයක් පමණක් නොවීය. එය දිගුකාලීනව ගොඩනැඟුණු දූෂණ පද්ධතියක වගවීමෙන් නිදහස් වූ බල ජාලවල, අකාර්යක්ෂම ප්‍රසම්පාදනවල සහ නීතිය තෝරාගත් පරිදි ක්‍රියාත්මක වූ පාලන සංස්කෘතියක් පැවතීම ආදී නොයෙක් සාධකවල ප්‍රතිඵලයක් ලෙස ද කියවිය යුතුය"

අපි වෙනස් කළේ දේශපාලනීකරණය වෙච්ච, පවුල්වාදයෙන් ගිල ගත්ත, අල්ලස හා දූෂණය රජ කරපු, අරාජිකත්වය කරා ගමන් කරමින් තිබුණු රටක් කියන එක ගරු විපක්ෂ නායකතුමාට මම කියන්න කැමැතියි. ඒ සංස්කෘතිය වික්‍රමසිංහ වෙනස් කරලා තිබුණේ නැහැ; ඒක වෙනස් කරලා තිබුණේ නැහැ. ඒක පෝෂණය කරලා තිබුණේ. ඒක තමයි අපි වෙනස් කළේ. ඒක වෙනස් කරලා, ශිෂ්ටත්වය කරා ගමන් කරන, අරාජිකත්වයෙන් වෙනස් වුණු, ශිෂ්ට සම්පන්න, නීතියේ විධානය මත පාලනය වන රාජ්‍යයක් අපි හැදුවා. ඒකට උදාහරණය මොකක්ද? 2002දී අපේ රට දූෂණ සංජානන දර්ශකයේ 52 වෙනි ස්ථානයේ තිබුණේ. 2019 වෙනකොට අපි දූෂණ සංජානන දර්ශකයේ 93 වෙනි ස්ථානයට පල්ලම් බහිනවා. 2023 වෙනකොට දූෂණ සංජානන දර්ශකයේ 94 වෙනි ස්ථානය වුණා. 2024දී දූෂණ සංජානන දර්ශකයේ 121 වෙනි ස්ථානය වුණා. අපි රටේ බලය ගත්තාට පස්සේ මොකක්ද කළේ? දූෂණ නැවැත්තුවා, වංචාව නැවැත්තුවා. ගල් අඟුරු පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා නම් තවත් දවස් 2ක් තිබෙනවා, ගිහිල්ලා කියන්නකෝ. එක්කෙනෙක්වත් ඒ පැත්ත පළාතේ යන්නේ නැහැ. පූර්ණ බලැති ජනාධිපති කොමිෂන් එකක් පත් කරලා තිබෙනවා. මෙතැන කෑ ගහන්න දෙයක් නැහැ. ගිහිල්ලා කියන්නකෝ, එතැනට. ෆයිල් එකක් හදාගෙන යන්නකෝ. ඒ විධියට කටයුතු කරන්නේ නැතිව මෙතැන නිකම් බොරුවට කථා කරනවා. එහෙම වැඩක් නැහැ. කියන්න ඕනෑ තැන් අපි හදලා තිබෙනවා. අදාළ තැන්වලට කියන්න. දූෂණ සංජානන දර්ශකයේ 121වැනි ස්ථානයේ තිබුණු රට, අවුරුද්දක් ඇතුළත අපි 107වැනි ස්ථානය දක්වා ගෙනාවා. 107වැනි ස්ථානය දක්වා ගෙනැල්ලා රට ගැන හැඟීමක් ඇතිව, ගෝත්‍රිකත්වය තිබුණු රටක් ශිෂ්ට සම්පන්න රාජ්‍යයක් බවට පරිවර්තනය කරන ගමනක අඩිතාලම දැම්මා.

නිෂ්පාදන ආර්ථිකයක් තිබෙන රටක් ගොඩනඟන එක, එක රැයකින් කරන්න පුළුවන් එකක් නොවෙයි. ඒක එක රැයකින් කරන්න බැහැ; අවුරුද්දකින් කරන්න බැහැ. ඒකට ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් අවශ්‍ය කරනවා. කර්මාන්ත අමාත්‍යාංශය ඇතුළේ ඒ හැම දෙයක්ම පටන් අරගෙන තිබෙනවා. කෘෂිකර්මාන්තය විනාශ කරලා තිබුණා. අමු බොරුවක් කිව්වා, පොහොර ලැබිලා නැහැ කියලා. අපේ දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම කොමසාරිස්තුමියට මම කථා කළා. මම දැන් කථා කරලා ගත්ත තොරතුරු ටික, මේ. ඒ ගත්ත තොරතුරුවල තිබෙනවා, මේ අවුරුද්දේ යල කන්නයට හෙක්ටෙයාර 12,053ක් වගා කරලා තිබෙන බව. ඒකෙන් දත්ත පද්ධතියට දාලා තිබෙනවා, හෙක්ටෙයාර 10,970ක්. ඒකෙන් හෙක්ටෙයාර 9,394කට ගෙවලා තිබෙනවා. හෙක්ටෙයාර 10,000න් හෙක්ටෙයාර 9,394කට ගෙවලා තිබෙනවා. හැබැයි කියනවා, පොහොර ලැබුණේ නැහැ කියලා. විපක්ෂ නායකතුමා ගියා, බුත්තලට. බුත්තල කොහේටද එතුමා ගියේ? වගකිව යුතු නායකයෝ මොකක්ද කරන්න ඕනෑ?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අතිරේක විනාඩි දෙකක් ලැබිලා තිබෙනවා.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
ස්තුතියි.

විපක්ෂ නායකතුමා ගියා, බුත්තලට. ගිහිල්ලා මොකක්ද කළේ? කුඹුරක් ළඟට ගිහිල්ලා ගොවියෝ ටිකක් එකතු කරගෙන පොහොර සහනාධාරය ලැබුණේ නැහැ කියලා, කලින් හදා ගත් plan එකකට අනුව, drama එකකට අනුව හොඳ act එකක් කළා. හැබැයි, එතැන හිටපු අයගෙන් කුඹුරේ ඉඳන් කථා කරන කෙනාටත් පොහොර සහනාධාරය දීලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. දත්ත ගන්න ඕනෑ නිවැරදි තැන්වලින්. තමුන්නාන්සේලා දත්ත ගන්න, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන්. නිවැරදි තැන්වලින් දත්ත ගන්නේ නැතුව තමන්ට හිතෙන හිතෙන තැන්වලින් දත්ත අරගෙන කථා කරන්න ලැහැස්ති වෙන්න එපා. විපක්ෂ නායකතුමාට යන්න තිබුණා, එතැනින් කිලෝමීටර දෙකක් එහාට. විපක්ෂ නායකතුමා නිවාස ඇමති විධියට ඉන්න කොට බාගෙට හදලා අත්හැර දැමූ ගෙවල්වලට ටකරන් ඇදගෙන අන්ත අපා දුක්විඳින මිනිස්සු ඉන්න තැනක් තිබෙනවා, ගෝනගන්ආර කියන ප්‍රදේශයේ. එතැනට ගිහිල්ලා බැලුවා නම් පෙනෙනවා, නිවාස 50ක් හදනවා කියලා ව්‍යාපෘතියේ තිබුණත්, එතැන තිබෙන්නේ නිවාස 10ක් විතර බව. එතැන වල් බිහි වෙලා. ඒ මිනිස්සු දරුවන් එක්ක අපා දුකක් විඳිනවා. *[බාධා කිරීමක්]* මෙතැන කෑ ගහන්න දෙයක් නැහැ. එතැනට ගිහිල්ලා කියන්න තිබුණා, "අනේ, මේක මම නිවාස ඇමති විධියට ඉන්න කොට කරපු දෙයක්" කියලා. ඒ සම්බන්ධ තොරතුරු තිබෙනවා. මම ප්‍රශ්නයකුත් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒකත් මම කියන්නම්. එතැනට ගිහිල්ලා එතුමාට කියන්න තිබුණා, "මේක මම නිවාස ඇමති විධියට ඉන්නකොට පටන් ගත්ත වැඩක්" කියලා. මේ පාර්ලිමේන්තුවේදී අන්න ඒවා ගැන කථා කරන්නකෝ.

අපට තනතුරක් ලැබුණා කියලා, අපට ප්‍රජාවක් හිටියා කියලා නිවැරදි නායකයෝ, විශිෂ්ට නායකයෝ ලෝකයට දායාද වෙන්නේ නැහැ. කටයුතු කරන පිළිවෙළ, ගමන් කරන දිශාව, මිනිසුන්ට පාර පෙන්වන විධිය, අර්බුදයකදී පොදුවේ මහජනතාවට ආලෝකය සපයන විධිය අනුව තමයි නායකත්වය කියන එක හැදෙන්නේ. අපේ රටෙන් බලන්න බැරි නම් ඉන්දියාවේ අග්‍රාමාත්‍යවරයා ගැන බලන්න. මේ තරම් බරපතළ ගෝලීය අර්බුදයක් තිබෙන වෙලාවේදී ඉන්දියාවේ අග්‍රාමාත්‍යවරයා කියනවා, "Nation first" කියලා. එතුමා කථාවක් කරනවා. ඒකෙදි එතුමා කියනවා, සැබෑ දේශ ප්‍රේමය කියන්නේ දේශ සීමාවට ගිහිල්ලා යුද්ධ කරලා රට වෙනුවෙන් දිවි පුදන එක විතරක් නොවෙයි, අර්බුදකාරී අවස්ථාවක රටේ පවතින තත්ත්වයන් තේරුම් අරගෙන, ඊට අනුකූලව හැඩගැහෙන එකත් ඉතා වැදගත් කියලා. ඒ අවස්ථාවේ එතුමා ජනතාවගෙන් ඉල්ලීම් හතක් කරනවා.

ඒ ඉල්ලීම්වල තිබෙනවා, ගෙදර ඉඳන් වැඩ කරන්න පුරුදු වෙන්න කියලා; work from home පටන් ගන්න කියලා එතුමා එහිදී කියනවා. තවදුරටත් එතුමා කියනවා, අවුරුද්දක කාලයක් රත්‍රන් මිලදී ගන්න එපා, ඉන්ධන භාවිතය සීමා කරන්න, පොදු ප්‍රවාහන සේවය භාවිත කරන්න කියලා. ඒ විතරක් නොවෙයි. Chemical fertilizerවලින් අයින් වෙන්න, කාබනික පොහොරවලට යන්න, ඒ වාගේම විදේශ සංචාර අවුරුද්දකට සීමා කරන්න, මේ අවුරුද්දේ විදේශ සංචාර යන්න එපා කියලා කියනවා. ඇයි ඒ? ඉන්දියාවේ ඩොලර් බිලියන 700ක සංචිතයක් තිබෙනවා. එහෙම තියාගෙනත් එතුමා ජනතාවගෙන් ඒ ඉල්ලීම් කරනවා. මොකද, මේ වන විට ආර්ථිකයේ අවිනිශ්චිතතාවක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒක ගෝලීය වශයෙන්, භූ දේශපාලන වශයෙන් නිර්මාණය වුණු එකක්.

මරික්කාර් මන්ත්‍රීතුමා කියනවා, 1990දී ප්‍රේමදාස මහත්තයා මේ ආර්ථිකය නියමෙට කළමනාකරණය කළා කියලා. 1990 කාලයත් එක්ක බලන කොට අද වනකොට අවුරුදු 40කට ආසන්න කාලයක් ගෙවිලා. ලෝකයේ භූ දේශපාලන, සමාජ ආර්ථික වටපිටාව වෙනස් වෙලා තිබෙන්නේ. අපි ඒක තේරුම් ගත යුතුයි. අසීරු සමාජ, ආර්ථික වටපිටාවක්, භූ දේශපාලනික වටපිටාවක් තිබෙන වෙලාවේදී අපි ගෞරවනීය ඉල්ලීමක් කරනවා. Responsible leadership is the most important thing, nothing else. So, that is why we say to the Opposition, you have to act, work and behave responsibly, not only in Parliament but outside as well.

Thank you very much.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.12]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මීට කලින් කථා කරපු නියෝජ්‍ය ඇමතිවරයෙක් සාර්ව ආර්ථිකය ගැන කිව්වා. මොන සාර්ව ආර්ථිකයක්ද, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි? මේ වනකොට ඕස්ට්‍රේලියාවට ණය ගෙවීම සම්බන්ධයෙන් ලංකාව තාක්ෂණික ලෙස ණය ගෙවීම පැහැර හැරි රාජ්‍යයක් බවට පත් වෙලා තිබෙනවා. දින තුනක් ඇතුළත ඩොලරයේ වටිනාකම රුපියල් 11කින් වැඩි වෙලා තිබෙනවා. අද වන විට ඩොලරයේ වටිනාකම රුපියල් 346යි. දවසින් දවස රුපියල බාල්දු වන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. රුපියල අවප්‍රමාණය වීම ආර්ථිකයට අහිතකර නැහැයි කියන නියෝජ්‍ය මුදල් ඇමතිවරයෙකු ඉන්න ආණ්ඩුවක මහ බැංකුව ගැන අද අපට කථා කරන්න වෙලා තිබෙනවා.

2021 වර්ෂයේ මැද භාගයේ ආර්ථික අර්බුදයක් පටන් ගන්න කොට මම මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, මේ රට පාලනය කරන්නේ කළු පාට කුරුල්ලෙක් කියලා. ඒ කළු පාට කුරුල්ලා රට බංකොලොත් කරලා ගමට පියඹා ගියා. 2026 වර්ෂය වනකොට මේ රට පාලනය කරන්නේ හැකර්ලා සෙට් එකකුයි, මුදලාලිලා කිහිපදෙනෙකුයි. ඒ හැකර්ලා මුදල් අවභාවිත කරපු ආකාරය පිළිබඳව, ආයතන සහ ඉලක්කම් පිළිබඳව අද ගරු කවින්ද ජේෂාන් මන්ත්‍රීතුමාත් කිව්වා. එදා කළු කපුටා, අද හැකර්ලා, එහෙම නැත්නම් කළු මුදලාලිලා ටිකක් ඉන්නවා.

අද වනකොට මේ රට 2021 වර්ෂයේ අග භාගයේ, නැත්නම් 2022 වර්ෂයේ මුල තිබුණු තත්ත්වයටම ඇවිල්ලා තිබෙනවා. උදාහරණ විධියට ගත්තොත්, කිරි පිටි මිල ඉහළ ගිහින් තිබෙනවා, ගෑස් මිල, විදුලි බිල, පොහොර මිල ඉහළ ගිහින් තිබෙනවා. අද ගොවියා අනාථ වෙලා තිබෙනවා. මේ වනකොට මිනිස්සුන්ට දරාගන්න බැරි තරමට බඩු මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා. මම කලින් කිව්වා වාගේ ඩොලරයට සාපේක්ෂව රුපියල නැවත වතාවක් ඉතාම නරක විධියට බාල්දු වෙමින් තිබෙනවා. දින තුනකට රුපියල් 11ක් වැඩි වුණා කියන්නේ, දවසකට රුපියල් 3යි ශත 65කට වඩා වැඩි වන තත්ත්වයක් මේ වන විට ඇතිවෙලා තිබෙනවා කියන එකයි.

අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ පාලනයේ මාස 16ට රුපියල් ට්‍රිලියන 5ක ණය අලුතින් අරගෙන තිබෙනවා. මේ ආණ්ඩුව ඇවිල්ලා මාසයක් යනකොට දිගට හරහට ණය ගන්නකොට මම මේ පාර්ලිමේන්තුවේදීම කිව්වා, වෙන්න පුළුවන් දේවල් මොනවාද කියලා. අද වනකොට එදා මම කිව්ව දේවල් වෙලා තිබෙනවා. මේ වන විට උද්ධමනය සියයට 5.7ත් ඉක්මවලා තිබෙනවා. මේ යන විධියට ගියොත් නැවත වතාවක් බැසිල් රාජපක්ෂ යුගයේදී වාගේ උද්ධමනය සියයට 20 ඉක්මවන්න පුළුවන්. එහි මූලික ලක්ෂණ මේ වනකොට අපට පෙනෙන්න තිබෙනවා.

මේ ආණ්ඩුව මාසයක් තිස්සේ කියන්නේ මොකක්ද? වර්තමාන තත්ත්වය ගැන කථා කරනකොට කියනවා, ආර්ථිකය බිඳ වැටීම අතැනත් වෙනවා, මෙතැනත් වෙනවා, අපේත් වෙනවා කියලා. එහෙම නැත්නම්, ඉන්දියාවේත් මෙහෙමයි, අපේත් මෙහෙමයි කියනවා. එහෙම කියන්නේ කවුද? ආණ්ඩුව. ආණ්ඩුව විතරක් නොවෙයි, මහ බැංකු අධිපතිතුමාත් කියනවා, අතැනත් වෙනවා, මෙතැනත් වෙනවා, කොහෙත් එහෙමයි, ඒ නිසා අපේත් එහෙමයි කියලා. ඒ නිසා දැන් මෙතැන ප්‍රශ්නය විධියට තිබෙන්නේ, නිසි ආර්ථික කළමනාකරණයක් නොමැති වීමයි. මුලින්ම මේ ආණ්ඩුව තේරුම් ගන්න ඕනෑ, රටේ ආර්ථික අර්බුදයක් තිබෙනවා කියලා. නමුත් මේ ආණ්ඩුවට තේරෙන්නේ නැත්තේත් ඒකමයි. රටේ ආර්ථික අර්බුදයක් ඇති බව වටහා ගැනීමට මේ ආණ්ඩුවට නොහැකි වෙලා තිබෙන බව දැන් අපට පෙනෙනවා.

ඒ වාගේම අමාත්‍ය මණ්ඩලයේ මුල් පුටුවල සිටින අයට ආර්ථිකය පිළිබඳව දැනුමක් තිබෙන නිලධාරින් ලබා දෙන උපදෙස් කියලා, මැනලා, තේරුම් අරගෙන ක්‍රියාත්මක කරන්න හැකියාවක් නැතිකමත් අද වනකොට දකින්න තිබෙන බව මම බොහොම කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ. මතක තබාගන්න, එදා ආර්ථිකය ගොඩ දමනකොට හිටපු රජයේ සේවකයින්, රජයේ නිලධාරින් ටිකම තමයි අදත් ඉන්නේ කියන එක. එහෙමනම්, ඔබතුමන්ලා තේරුම් ගන්න ඕනෑ, ගැටලුව තිබෙන්නේ කොතැනද කියලා.

මහ බැංකු අධිපතිතුමා ගැනත් මම වචනයක් කියන්න ඕනෑ. නන්දලාල් වීරසිංහ මහත්මයා 2020 සැප්තැම්බර්වල මහ බැංකු නියෝජ්‍ය අධිපති ධුරයෙන් ඉවත්ව ඕස්ට්‍රේලියාව බලා පියාඹන්න සූදානම් වන විට රටේ තිබුණු තත්ත්වයට හැම අතින්ම සමාන තත්ත්වයක් තමයි අදත් දකින්න තිබෙන්නේ. මහ බැංකුවේ ගිණුම්කරණය හරහා මුදල් අතුරුදහන් වනවා වාගේම අනික් බැංකුවල මුදල් ද දිනපතා අතුරුදහන් වනවා. හැබැයි එතුමා ඇවිල්ලා කියනවා, අතැනත් වෙනවා, මෙතැනත් වෙනවා, අපේත් වෙනවා කියලා. දැන් උද්ධමනය වැඩි වෙනවා. එතුමා කියනවා, අතැනත් වෙනවා, මෙතැනත් වෙනවා, අපේත් වෙනවා කියලා. ඒ අනුව එතුමා කියන්නේ එතුමන්ලාට මේක සාමාන්‍ය දෙයක් කියන එකයි.

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

නන්දලාල් වීරසිංහ මහත්මයා වැඩකාරයෙක් වුණේ 2022 අගෝස්තු මාසයේ ඉඳලා ඔහුට නිවැරදි දේශපාලන නායකත්වයක් ලැබුණු නිසා සහ ඒ යටතේ ආර්ථිකය මෙහෙයවන්න ලැබුණු නිසායි. එහෙම නැත්නම්, නන්දලාල් වීරසිංහලාගේ යුගයේදීම තමයි එදා බැසිල් රාජපක්ෂලා රට බංකොලොත් කළේ. අදත් නන්දලාල් වීරසිංහලාගේ මේ යුගයේදීම තමයි හැකර්ලා රට බංකොලොත් කරන්නේ කියන එකත් මම කියන්න ඕනෑ. එදා ගෝඨාභය රාජපක්ෂ සිටියා. අද ඒ වෙනුවට අනුර කුමාර දිසානායක ඉන්නවා. හැබැයි, ඒ අවස්ථා දෙකටම සම්බන්ධ වන්නේ නන්දලාල් වීරසිංහ. එහෙම නම්, මේ රටේ තිබෙන අර්බුදය මොකක්ද? විධායකයට - ජනාධිපතිට - හා කැබිනට් මණ්ඩලයට රටේ ආර්ථිකය ගැන කිසිම අට මහලක් තේරෙන්නේ නැති එක තමයි දැන් තිබෙන අර්බුදය කියලා මම මේ වෙලාවේ කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම තවත් කාරණයක් කියන්න ඕනෑ. ආණ්ඩුවටට මේක කරන්න පුළුවන්ද කියන සැකය - විචිකිච්ඡාව - අද මේ රටේ ජනතාවට වාගේම පිට රටවල සිටින අපේ ජනතාවටත් ඇතිවෙලා තිබෙනවා. ඒ නිසා මම මිනිස්සුන්ට කියනවා, එවැනි විචිකිච්ඡාවක් ඇති වීම ගැන අපි සැකයක් හිතලා වැඩක් නැහැ, ඒක සාධාරණයි කියලා.

මහ බැංකු වාර්තා අනුව පෙනෙනවා, බැඳුම්කර නිකුත් කිරීම තුළින් සපයාගන්නා ලද දේශීය ණය ප්‍රමාණය 2025 ජනවාරි ඉඳලා 2026 ජනවාරි 1වැනි දා දක්වා රුපියල් බිලියන 1,348.71කින් වැඩිවෙලා තිබෙන බව. අද ඉන්දියාවට පාලම් බඳින්න කථා කරනවා, හැබැයි "දිට්වා" සුළි කුණාටුවෙන් කඩාගෙන ගිය මොරගහකන්ද ජලාශය ඉදිරිපිට තිබෙන පාලම හදාගන්න තවම බැරිවෙලා තිබෙනවා. මාතලේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට එක්තරා අවස්ථාවක ජනාධිපතිතුමා ආවා, මොකක්ද වුණේ? කිසිවෙක් නොමළ ගෙයකින් අබ මිටක් සොයා ගන්න කිසාගෝතමී ගෙයක් ගාණේ ගියා වාගේ අසරණ වුණු මිනිසුන්ට අද හැම තැනම ඇවිද, ඇවිද ඉඩම් හොයන්න සිදු වෙලා තිබෙනවා. ඒ තරමට කොන්දේසි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමියට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ආපදාවට ලක් වෙච්ච අය අද සීසීකඩ; ඇටන්වල මිනිස්සු, අඹන්ගඟ කෝරළේ නාගල මිනිස්සු, ඇල්කඩුව, ඕවිලිකන්ද වාගේ ප්‍රදේශවල මිනිස්සු අද සීසීකඩ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මගේ කථාව අවසන් කරන්න කලින් මේ කාරණයත් මම කියන්න ඕනෑ. 2026.05.06වැනි දින මාතලේ දිස්ත්‍රික්කයේ ආපදාවට පත් අයට දීමනා ගෙවීම් සහ ජීවිත හානි පිළිබඳව දත්ත ඇතුළත් ලේඛනය මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

විපක්ෂ නායකතුමාගේ කොටු රුල් පොත ගැන කිව්වා නේ. මට කියන්න ඕනෑ, ඔයගොල්ලන් කරලා තිබෙන හැටි. මගේ ළඟ මේ තිබෙන්නේ 2026.05.06වැනි දින මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිකුත් කරපු වාර්තාව. ඒ අනුව රජයේ ඉඩමක නිවසක් ඉදිකිරීමට ගෙවීම් ප්‍රතිශතය 12යි. නිවසක් මිලදී ගැනීමට ගෙවීම් ප්‍රතිශතය 7.41යි. අයිඅවදානම් සහිත 524දෙනෙක් නිවෙස් මිලදී ගැනීමට තෝරලා තිබෙනවා. නමුත්, එයින් 5දෙනෙකුටයි දීලා තිබෙන්නේ. ඉඩමක් මිලදී ගැනීමට 12දෙනෙක් තෝරා ගත්තත් කාටවත් ඒ අවස්ථාව ලබා දීලා නැහැ. මම නැවත වතාවක් කියනවා, 2022දී අර්බුදය තිබුණු තැනමයි මේ රටේ අපි ඉන්නේ කියන එක.

අවසාන කාරණය මේකයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ රටේ බලශක්ති අර්බුදයක් තිබෙනවා. තෙල්, ගෑස්, ගල් අඟුරු ආදී හැම දෙයක් සම්බන්ධයෙන්ම අර්බුදයක් තිබෙනවා. අද මේ රටේ රුපියලට වඩා වේගයෙන් බාල්දු වෙන්නේ එකම එක දෙයයි. ඒ, ඔබතුමියලාගේ ආණ්ඩුව. මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුනිල් බියන්විල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.19]

**ගරු සුනිල් බියන්විල මහතා**
(மாண்புமிகு சுனில் பியன்வில)
(The Hon. Sunil Biyanwila)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපි සාකච්ඡා කරන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2025 වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබෙන වාර්ෂික ආර්ථික සමාලෝචන වාර්තාව පිළිබඳවයි. මේ වාර්තාව පිළිබඳව සාකච්ඡා කරන්න පෙර මීට කලින් විපක්ෂයේ මන්ත්‍රීවරුන් කළ ප්‍රකාශ සම්බන්ධයෙන් යමක් මම කියන්න කැමතියි. ඔවුන් කිව්වා, රටේ ආර්ථිකය කඩාගෙන වැටෙනවා, ඩොලරය වේගයෙන් ඉහළ යනවා, ඒ හින්දා ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට වෙච්ච දෙයම තමයි මේ ආණ්ඩුවටත් වෙන්නේ කියලා. ඒ ගැන ඔබතුමන්ලා සැකයක් තියා ගන්න එපා. ඩොලරය ඉහළ යන එක අපි පාලනය කරනවා. ඒ වාගේම ආර්ථික කඩා වැටීම නැවත වෙන්නේ නැහැ කියන එක පිළිබඳව අපි රටේ ජනතාවට වග කියනවා.

ඒ වාගේම තවත් මන්ත්‍රීවරයෙක් සඳහන් කළා, JVP එකේ අය අපරාධකාරයෝ කියලා. මම මතක් කරලා දෙන්න කැමතියි, අපි බලය ගත්තාට පස්සේ කිසිම කෙනෙකුට විරුද්ධව ගල් කැටයක්වත් අතට ගත්තේ නැති බව. අපි කාටවත් අසාධාරණයක් කළේ නැහැ. රටේ මැතිවරණයක් නොතිබුණා වාගේ තත්ත්වය පැවතුණා. හැබැයි, 1977දී මැතිවරණය ඉවර වෙලා පවුල් කීයකගේ නිවෙස් අහිමි කළාද, කී දෙනෙකුගේ ජීවිත අහිමි කළාද කියලා කල්පනා කරලා බලන්න. අපේ පොන්නම්බලම් මන්ත්‍රීතුමාට එහෙම මේවා මතකයි. 1983දී දෙමළ ජනතාව අමු අමුවේ ගිනි ගොඩවල්වලට දැම්මා. එහෙම අය තමයි ජනතා විමුක්ති පෙරමුණ ගැන කියන්නේ. අපේ භාවිතාවන්, ආදර්ශයන් පසුගිය කාලය පුරාවටම රටේ ජනතාව තේරුම් අරගෙන ඉන්නවා. ඒ හින්දා ඒ පිළිබඳව ගැටලුවක් නැහැ.

ඒ වාගේම මේ කාරණයත් මම මතක් කරන්න ඕනෑ. අපි 2025 අවුරුද්දේ ආර්ථික වර්ධනය ගැන කථා කරනකොට 2024 අවුරුද්ද ගැන කථා නොකර බැහැ. පසුගිය කාලයේ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ජනාධිපතිවරණය පැවති වෙලාවේ අපි රැස්වීම්වලට ගියා. අපි රැස්වීම්වලට යනකොට පාර අයිනේ තිබෙන කඩවල "කැම ලැස්තියි" කියලා බෝඩ් ගහලා තිබෙනවා දැක්කා. නමුත්, අපි කඩේට ගියාම කඩේ වහලා. එහෙම තත්ත්වයක් තිබුණේ. කර්මාන්ත කඩාගෙන වැටිලා, පොහොර සහනාධාරය නැති කරලා, ගොවීන්ට ගොවිකම නැති වෙලා, රටේ ආර්ථිකය කඩාගෙන වැටිලා තිබුණේ. හැබැයි, අපි මොකද කළේ? අපි බලයට ඇවිල්ලා කෙටි කාලයකින් මේ තත්ත්වය වෙනස් කළා. ඒ අනුව 2025 වසර ඇතුළත රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කරන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ විධියට වැටුප් වැඩි කරපු වෙලාවේ මොනවාද කිව්වේ? රුපියල් 500කින් වැටුප් වැඩි කරන්නේ, රුපියල් 2,000කින් වැඩි කරන්නේ, රුපියල් 5,000කින් වැඩි කරන්නේ කියලා ජනතා මතයක් හදන්න උත්සාහ කළා. නමුත් වැටුප ලැබුණාට පස්සේ මේ විපක්ෂයේ අය නිහඬ වුණා.

ඊට පස්සේ අපි වතු කම්කරුවන්ගේ වැටුප වැඩි කළා. ඔවුන්ගේ වැටුප වැඩි කළාට පස්සේ මොකද වුණේ? ඒ පිළිබඳව නොයෙකුත් මතවාද හදන්න උත්සාහ කළා. හැබැයි, ඒක නතර කරන්න පුළුවන් වුණාද? බැරි වුණා. ඊට පස්සේ මොකද වුණේ? විවිධ අවස්ථාවලදී අපේ ඇමතිවරුන්ට අවලාද නඟන්න පටන් ගත්තා. ගල් අඟුරු හොරකම් කළා කිව්වා. ඒ වාගේම කන්ටේනර් වංචාවක් පිළිබඳව කිව්වා. ඊට පසුව මොකද වුණේ? ටික කාලයක් යනකොට මේවා මේගොල්ලන්ට පවත්වා ගෙන යන්න බැරි වුණා. ඒ නිසා අද කියන බොරුව හෙට සමාජගත කරන්න බැරි බව අපි හොඳටම දන්නවා.

ඒ වාගේම විපක්ෂ නායකතුමා ඇතුළු පිරිස තව දෙයක් කිව්වා. ඒ මොකක්ද? මේ ආණ්ඩුවේ අයට බිම් මට්ටමට බහින්න බැහැ කිව්වා. අපට බිම් මට්ටමට බහින්න පුළුවන්ද, බැරිද කියන එක අපි මැයි දිනයේදී පෙන්වා දුන්නා. අපි දිස්ත්‍රික්ක 21ක මැයි දින සැමරුම් කළා. ඉතිහාසයේ අන් කවරදාටත් වඩා දියුණු මට්ටමේ මැයි දින සැමරුම් අපි කළා. ඒ දිහා බැලුවාම බලා ගන්න පුළුවන්, නැවත නැවතත් ජනතාව කවුරු එක්කද ඉන්නේ කියන එක. විපක්ෂ නායකතුමා කථා කරනකොට නැඟිටලා ගිය ජනතාවක් ඔවුන්ට ඉන්නේ. මේවා සන්සන්දනය කරලා බලනකොට අපට මේ පිළිබඳව අවබෝධයක් ලබා ගන්න පුළුවන්.

නැවතත් මම මේ කාරණය කියන්න කැමැතියි. ඔබතුමන්ලා මතක තබා ගන්න, පාර්ලිමේන්තු රැස්වීම් අවසන් වෙලා අපි නැවත යන්නේ බිම් මට්ටමට තමයි කියන එක. අපි පුරුදු ජීවිතය තමයි ගත කරන්නේ. පසුගිය කාලයේදී ඔබතුමන්ලාට විවේචනයක් තිබුණා. ඒ මොකක්ද? මේගොල්ලන් බැකෝ එකෙන් බෙදාගෙන ජනතාවට කන් හැන්දෙන් බෙදනවා කියලා. ඒක අපි වෙනස් කළා. දැන් ජනතාවට බැකෝ එකෙන් බෙදලා අපි කන් හැන්දෙන් බෙදා ගන්නේත් නැහැ. එහෙමයි අපි කැප කිරීම් කරන්නේ. ඔබතුමන්ලාට බලය ගන්න පුළුවන් නම්, ඔබතුමන්ලා ඔය ඉන්න තැන වෙනස් කර ගන්න. අපි බිම් මට්ටමට යනවා. ඒ නිසා ගොවීන්ට ප්‍රශ්නයක් නැහැ. අපි ඉස්සරහට වැඩ පිළිවෙළක් හදා තිබෙනවා. "ප්‍රජා ශක්ති" වැඩ පිළිවෙළ යටතේ අපි බිම් මට්ටමට යනවා. ඒ වාගේම කොට්ඨාස සභා කැඳවන්න අපි බිම් මට්ටමට යනවා. බිම් මට්ටමට ගිහිල්ලා අපි මොකක්ද කරන්නේ? ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කරන්න ඕනෑ සාකච්ඡාව අපි බිම් මට්ටමින් කරනවා. ඒ සාකච්ඡාව කරන්නේ අපි විතරක් නොවෙයි, ඔබතුමන්ලා අත්හැර යනවා කියලා සඳහන් කරන රාජ්‍ය නිලධාරින් එක්ක එකතු වෙලා. ග්‍රාම නිලධාරිතුමා, සංවර්ධන නිලධාරිතුමිය, ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් පටන් ගෙන ඉහළම සිටින නිලධාරින් එක්ක අපි බිම් මට්ටමින් ඒ කටයුතුවලට මැදිහත් වෙලා තිබෙනවා. ඒ නිසා බිම් මට්ටම පිළිබඳව අපට ප්‍රශ්නයක් නැහැ. අපේ සැලසුම් ඇතුළේ ආර්ථිකය ශක්තිමත් කරලා ජනතාව ඉල්ලපු ඒ ජීවිතය ලබා දෙන්න අපි උත්සාහ කරනවා. අපි විශ්වාස කරනවා, මේ රටේ ජනතාව නැවත වතාවක් මේ පාලකයන්ට ඡන්දය දෙන්නේ නැහැ, මේ පාලකයෝ පත් කර ගන්නේ නැහැ, මේ විපක්ෂයේ අය පත් කර ගන්නේ නැහැ කියලා. ඒක අපට සහතිකයි. මේ ගොඩනඟන රට නැවත කඩා වැටෙන්න අපි ඉඩ තබන්නේ නැහැ. වෙනත් පක්ෂ ඇතුළේ වැඩ කරන්න පුළුවන්, බුද්ධිමත් මිනිස්සු ඉන්නවා නම් අපි ඒගොල්ලන්ටත් අවස්ථාව දෙනවා. අපට ඒ ගැන ප්‍රශ්නයක් නැහැ.

මේ අය බොහෝ අවස්ථාවලදී මතු කළා, අපි පක්ෂ සාමාජිකයෝ, වේදිකාවේ හිටපු අය අමාත්‍යාංශවලට දානවා කියලා. ඔව්, පසුගිය කාලයේ කවුද මාලිමාවේ වේදිකාවට ආවේ නැත්තේ? රාජ්‍ය සේවකයෝ ආවා; මේ රටේ බුද්ධිමතුන් ආවා. ඇයි, ඔවුන් මාලිමාවේ වේදිකාවට ආවේ? තිබුණු තත්ත්වය විසින් ඒ අයට බල කළා, මාලිමාවේ වේදිකාවට ඇවිල්ලා වාඩි වෙන්න. ඒ නිසා අපට ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. පසුගිය කාලයේ අපි එක්ක වාඩි නොවුණත් අප ඒ අයට අවස්ථාව ලබා දුන්නා. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අවස්ථාව අපි ඒ අයට ලබා දුන්නා. ඇයි, ඒ? සුදුසු නම් අපි ඒ අයට අවස්ථාව දෙනවා. අපට ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. අපේ එහෙම බෙදීමක් නැහැ. අපි හැම වෙලාවකදීම කල්පනා කරන්නේ ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කරන්නේ කොහොමද කියන එකයි. අපි ඒ ගැන කල්පනා කළා.

මේ අවස්ථාව වනවිට කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ ලොකු විප්ලවයක් සිදු වෙමින් තිබෙනවා. අපි කල්පනා කරනවා, පශු ක්ෂේත්‍රයේ කිරි ගොවියා ශක්තිමත් කරන්න. දැනට අපි dairy hubs හදලා කිරි ගොවීන් ශක්තිමත් කරන්න කටයුතු කරනවා. දැන් රටේ නිෂ්පාදනය කරන්නේ දවසකට කිරි ලීටර් ලක්ෂ 10යි. ඒ කිරි ලීටර් ලක්ෂ 10, ලීටර් ලක්ෂ 30 දක්වා වර්ධනය කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අපි හදලා තිබෙනවා. ඒ තුළ ගොවීන්ට තිබෙන පීඩනය වැඩියි. ඒ පීඩනය වැඩි නිසා අපි තණකොළ නිෂ්පාදනයත් කර්මාන්තයක් හැටියට ගෙනයන්න වැඩ පිළිවෙළ හදමින් ඉන්නවා. ඒ ක්ෂේත්‍රය තුළ අපි විවිධ වැඩ කරමින් ඉන්නවා.

ඔබ අපි කවුරුත් දන්නවා, පසුගිය කාලයේ අපේ රටේ ආර්ථිකය කඩා වැටීම නිසා වී ගොවියාත් කඩා වැටුණු බව. ඊට පසු මොකද වුණේ? අපි ආණ්ඩුව ගත්ත ගමන්ම පුරන් කුඹුරු නැවත අස්වද්දන්න වැඩ පිළිවෙළක් හැදුවා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට තමයි පසුගිය මහ කන්නයේ වැඩි අස්වැන්නක් ලබා ගන්න අපට පුළුවන් වුණේ. කවුරු කොහොම කිව්වත් අපි දන්නවා, ගොවීන්ට ප්‍රශ්නයක් තිබෙන බව. අපි දන්නවා, ලෝක අර්බුදයක් තුළ ගොවීන් ප්‍රශ්නවලට මුහුණ දීලා තිබෙනවාය කියලා. අපි ඒවා කළමනාකරණය කර ගන්නවා, පසුගිය කාලයේ කළමනාකරණය කර ගත්තා වාගේ. එහෙම කළමනාකරණය කරලා ඒ ගොවීන්ට ඕනෑ කරන පහසුකම් ටික හදන්න අපි වැඩ පිළිවෙළ හදාගෙන යනවා. ඒ නිසා සැකයක් තබා ගන්න එපා, අපි මේ රටේ ආර්ථිකය හදනවා. ආර්ථිකය හදලා, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබුණු සියලු දේවල් ජනතාවට ඉෂ්ට කර දෙන්න ඕනෑ කරන වටපිටාව අපි හදනවා. අපි ලස්සන රටක් හදනවාමයි. ඉතිහාසය පුරා අපේ සහෝදර සහෝදරියන් ජීවිතය පූජා කළේ ඕකට තමයි. ඒ නිසා ඒගොල්ලන්ගේ අරමුණ ඉෂ්ට කරන්න කිසිවිටෙකත් අපි පසු බහින්නේ නැහැ; ඉදිරියට තිබ්බ පියවර පසුපසට ගන්නේ නැහැ. මේ වැඩේ අවසන් කරලා මිසක අපි පස්ස බලන්නේ නැහැ. අපි ජනතාවගේ අරමුණ ඉෂ්ට කරන්න ආපු මිනිස්සු. එහෙම නැතිව, අපි අපේ ජීවිත ගොඩ නඟා ගන්න ආපු මිනිස්සු නොවෙයි. ඒක මේ රටේ ජනතාව දන්නවා. මේ රටේ ජනතාවත් එක්ක අපේ ගනුදෙනුවක් තිබෙනවා. විශේෂයෙන්ම ගත්තොත්, අපි මේ රටේ ආර්ථිකය හදනවා වාගේම මේ රටේ ජාතික සමඟියත් හදලා තිබෙනවා. අවුරුදු 76ක් තිස්සේම ඒ ඇති කරපු අසමඟිය විසින් අපේ ආර්ථිකයට සිදු වූ විශාල බාධාවක්

[ගරු සුනිල් බියන්විල මහතා]

තිබෙනවා. අන්න ඒක වෙනස් කරලා සිංහල, දෙමළ, මුස්ලිම් මිනිස්සු එකතු කරලා, ඔවුන්ව සහෝදරත්වයෙන් රටේ ආර්ථිකයට සම්බන්ධ කරලා අපේ රටේ ආර්ථිකය අපි ශක්තිමත් කරනවා. ඒ ආර්ථිකය ශක්තිමත් කරන එක ඇතුළේ අපි බලාපොරොත්තු වුණු, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබුණු ලස්සන රට නිර්මාණය කරනවා කියන පණිවුඩය ලබා දෙමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු චානක සම්පත් මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

**ගරු නලින් හේවගේ මහතා**
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුයි" යි මා යෝජනා කරනවා.

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (MRS.) ROHINI KUMARI WIJERATHNA took the Chair.*

[අ.භා. 3.29]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මීට පෙර කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා, මැතිවරණ සමයේ එතුමන්ලා වේදිකාවලට යනකොට "කෑම ලැස්තියි" කියලා කඩවල් අසල බෝඩ් ගහලා තිබුණා; කඩේට ගියාම කෑම තිබුණේ නැහැ කියලා. ඇත්තටම අද "කෑම ලැස්තියි" කියලා බෝඩ් ගහලා තිබෙනවා. හැබැයි, කඩේට ගියාම මුලින්ම අහන්න වෙලා තිබෙනවා, "කහ පාට ගෑස් සිලින්ඩරයකින් ද උයන්නේ; නිල් පාට ගෑස් සිලින්ඩරයකින් ද උයන්නේ?" කියලා. ඒ වාගේම, "කෑම ලැස්තියි" කියලා බෝඩ් එකක් දාලා තිබෙන නිසා කඩේ ඇතුළට ගියාට, කෑමවල මිල ගණන් ඇහුවාම ආපහු හැරිලා එන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒක තමයි අද තත්ත්වය. එම නිසා මම ඒ පිළිබඳව මීට වඩා කථා කරන්නේ නැහැ.

අද අපි කථා කරන්නේ අපේ රටේ ආර්ථිකය ගැන. ඇත්තටම ඔබේ ආණ්ඩුව ආර්ථිකය සම්බන්ධයෙන් යම් යම් පියවර තැබුවා නම්, ඒ තබපු පියවර අද මේ සමාජය තුළින්, අපේ ආදරණීය ජනතාවගේ ආර්ථිකය තුළින් අපට බලාගන්න පුළුවන්. හැබැයි, අපි ගම්වලට ගිහිල්ලා බැලුවාම, එහෙම නැත්නම් අපේ ආදරණීය ජනතාව දිහා බැලුවාම එවැනි ආර්ථිකයක් හැදිලා තිබෙනවා කියලා අපට දකින්න ලැබෙන්නේ නැහැ. හැබැයි, මේ ආණ්ඩුවේ යම් යම් හොඳ දේවල් තිබෙනවා. අපි ඒවා අගය කරනවා. එහෙම නැතිව අපි සම්පූර්ණයෙන්ම විවේචනාත්මකව කථා කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ආර්ථික වර්ධනය ගැන කථා කරනකොට අපට මහින්ද රාජපක්ෂ යුගය අමතක කරන්න බැහැ. අපට මතකයි, එතුමා 2004දී අපේ රටේ ආර්ථිකය, මේ රට බාර ගන්නකොට ඒකපුද්ගල ආදායම කොපමණද කියලා. අද ඒකපුද්ගල ආදායම පිළිබඳව කථා කළා. එතුමා 2004දී මේ රටේ ආර්ථිකය බාර ගන්නකොට ඒකපුද්ගල ආදායම ඩොලර් 1,063යි. එතුමා මේ රට 2014දී බාරදීලා යනකොට ඒකපුද්ගල ආදායම ඩොලර් 3,821 දක්වා වර්ධනය කර තිබුණා. හැබැයි, ඒකපුද්ගල ආදායම ඒ ආකාරයට වර්ධනය කළේ මොන යුගයකද කියන කාරණය ඔබතුමන්ලාට මතක ඇති. අපි විජයග්‍රහණයේ සැමරුම පැවැත්වුවා මේ මාසයේ 18වැනි දා. තිස්වසරක ශාපලත් යුද්ධය හමුවේ තමයි මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ වර්ධන වේගය අත්පත් කර ගත්තේ.

ඒ වාගේම, අද දළ දේශීය නිෂ්පාදිතය ගැන කථා කළා. 2004දී මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රට බාර ගන්නකොට දළ දේශීය නිෂ්පාදිතය ඇමෙරිකානු ඩොලර් බිලියන 20.1යි. 2014දී එතුමා ආණ්ඩුව බාරදීලා යනකොට ඇමෙරිකානු ඩොලර් බිලියන 79.4 දක්වා දළ දේශීය නිෂ්පාදිතය වර්ධනය කරලා ගියේ. මතක තියා ගන්න, දළ දේශීය නිෂ්පාදිතය ඒ ආකාරයට වර්ධනය කළේ තිස්වසරක ශාප ලත් යුද්ධය පවතින සමයේදී බව. ඒ විතරක් නොවෙයි, අද ආර්ථික වර්ධන වේගය ගැන කථා කළා. උපරිම ආර්ථික වර්ධන වේගය අත්පත් කර ගත්තේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා. ඒ, 2012 වර්ෂයේ. ඒ වෙලාවේ සියයට 9.1ක ආර්ථික වර්ධන වේගයක් අත්පත් කර ගත්තා. අපිට ඒවා අමතක කරන්න බැහැ. එතුමා ඒ වර්ධන වේගය අත්පත් කර ගත්තා. නමුත් 2014න් පස්සේ යහ පාලන ආණ්ඩුව සමයේදී මම කියපු ඒ තීරණායක - ඒකපුද්ගල ආදායම වෙන්න පුළුවන්, දළ දේශීය නිෂ්පාදිතය වෙන්න පුළුවන්, ආර්ථික වර්ධන වේගය වෙන්න පුළුවන් - කුමන තත්ත්වයකට පත් වුණාද කියන කාරණය ගැන කථා කරන්න මම උත්සාහ ගන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එදා මහින්ද රාජපක්ෂ මැතිතුමා අධිවේගී මාර්ග හැදුවා; වරායන් හැදුවා; ගුවන් තොටුපොළවල් හැදුවා; වාරි කර්මාන්තය ශක්තිමත් කළා; නොරොච්චෝලේ වැනි විදුලි බලාගාර හැදුවා. ඒ වාගේම වරාය නගරය හැදුවා. විශාල මාර්ග පද්ධති හැදුවා. ඒ වාගේම පාලම්, බෝක්කු ඇතුළු සමස්ත යටිතල පහසුකම් පද්ධතියම සංවර්ධනය කළා.

රජයේ රැකියා ලබා දුන්නා විතරක් නොවෙයි, පෞද්ගලික අංශයත් ශක්තිමත් කළා. එදා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ රටට එකතු කළ දායාද තමයි අද මේ ආණ්ඩුව ඔවුන්ගේ

ආර්ථික වර්ධනය ඇති කර ගන්න පාදක කර ගෙන තිබෙන්නේ. එදා වරාය නගරයට කිව්වේ මොනවාද? අපේ රට චීන කොලනියක් කරන්න හදනවාය කිව්වා. සීගිරි ගලත් මදි වෙනවාය කිව්වා. ගල් මෙච්චර ඕනෑය කියලා වේදිකාවල විවිධ මතිමතාන්තර කිව්වා. හැබැයි, අද වරාය නගරය තමයි ඉදිරියට ගෙන යන්නේ. එදා මත්තල ගුවන් තොටුපොළ හදනකොටත් විවිධ කථා කිව්වා. අද ඒ ගුවන් තොටුපොළ පාවිච්චි කරනවා. එදා වරාය හදනකොට විවිධ දේවල් කිව්වා. අද වරාය තුළින් ප්‍රයෝජන ගන්නවා. එදා උමා ඔය හදනකොට, උමා ඔයේ හිලක් තිබෙනවාය කිව්වා. අද ඒකේ ප්‍රතිලාභ මේ රජය ගන්නවා. එදා අධිවේගී මාර්ග හදනකොට, රාජපක්ෂලාට ඇඹුල්තියල් ගෙන යන්න හදනවාය කිව්වා. එහා ගෙදර බල්ලාට මෙහා ගෙදරට එන්න බැහැයි කිව්වා. හැබැයි ඒ අධිවේගී මාර්ග පද්ධති පාදක කරගෙන තමයි අද මේ ආණ්ඩුව ආර්ථිකය ඉදිරියට ගෙන යන්නේ කියන කාරණයත් විශේෂයෙන් සිහිපත් කරන්න ඕනෑ.

ආර්ථිකය ශක්තිමත් වෙනවා නම්, අපි හැමෝම කැමැතියි. ජනතාව විධියට, විපක්ෂය විධියට අපි ඒ සඳහා බාධක දමන්නේ නැහැ. මම කියන්නේ නැහැ, 76 වසරක කාලය තුළ ඔබ විපක්ෂයේ ඉන්නකොට කරපු දේවල්. මේ රටේ ආර්ථිකය බිඳ වට්ටන්න, එහෙම නැත්නම් මේ රටේ ආර්ථිකය ඉදිරියට නොයවන්න ගත්ත තීන්දු තීරණ ගැන කියන්න මම වෙලාව ගන්නේ නැහැ. හැබැයි මට යුතුකමක් තිබෙනවා, මේ අවස්ථාවේදී මේ කාරණය කියන්න. තිස් වසරක ශාපලත් යුද්ධය නිමා කිරීම හේතුවෙන් අපි 18වැනි දා විජයග්‍රහණයේ සැමරුම පැවැත්වුවා. හැබැයි ඒ සැමරුම පැවැත්වූයේ, විජයග්‍රහණයේ සැමරුමක් විධියටද කියන කාරණය පිළිබඳව අද ප්‍රශ්නයක් තිබෙනවා. ඒ සැමරුම පැවැත්වූවේ, එල්ටීටීඊ ඩයස්පෝරාවේ සීමාවන් යටතේ බව තමයි අපට දකින්න ලැබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, යුද්ධයෙන් මිය ගිය ඕනෑම කෙනෙක් පිළිබඳව අපට කම්පනයක් තිබෙනවා. යුද්ධයෙන් මිය ගියාම ඔවුන් සමරන්න ඕනෑ කෙනෙකුට අයිතියක් තිබෙනවා. ඒ අයිතියට අපි ගරු කරනවා. හැබැයි අද සමහර ස්ථානවල, - උතුරේ වෙන්න පුළුවන් - යුද්ධයෙන් මිය ගිය ජනතාව සමරන්න පවත්වපු ඒ උළෙලවල් පවත්වපු ආකාරය අපි දැක්කා. ඊළාම් සිතියම ගහගෙන, ඊළාම් සින්දු කියාගෙන, වෙනම රාජ්‍යයක් ඕනෑය කියලා සටන් පාඨ කියමින් තමයි ඒ සමහර සැමරුම් පැවැත්වූයේ. එහෙම සමරන්න ඉඩ දෙන්න බැහැ. මේක ත්‍රිවිධ හමුදාව ඇස්, ඉස්, මස්, ලේ දන් දීලා නිදහස් කර ගත්ත රට; තමන්ගේ ජීවිත පරිත්‍යාග කරලා නිදහස් කර ගත්ත රට. ඒ ජීවිතවලට වටිනාකමක් දෙන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ පිළිබඳව අපි මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ.

අපි දැක්කා, මේ පාර්ලිමේන්තුවේ ඉන්න උතුරේ සමහර මන්ත්‍රීවරු හැමදාම ජාතිවාදය කර පින්නාගෙන තමයි මේ පාර්ලිමේන්තුවට එන්නේ. ඒ අය සමහර අවස්ථාවලදී ජාතිවාදය ඉදිරියට අරගෙන තමයි පාර්ලිමේන්තුවට එන්න, බලය ලබා ගන්න උත්සාහ ගන්නේ. අපි දැක්කා යුද ජයග්‍රහණය පිළිබඳව ඒ අය කියන කථා. ඔවුන් විජයග්‍රහණයේ දිනය ජන සංහාර දිනයක් විධියට නම් කරන්නය කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි මේ කාරණය අහනවා. ඔවුන් මේ පාර්ලිමේන්තුවේ දිවුරුම් දීලා තිබෙන්නේ ඒකීය රටක් වෙනුවෙන්. ඔවුන්ට පුළුවන්ද, ජන සංහාර දිනයන් යෝජනා කරන්න? ඒ නිසා අපි ඒ සම්බන්ධයෙන් අපේ විරෝධය ප්‍රකාශ කරනවා. අපි කිසි ලෙසකත් ජන සංහාර දිනයන් යෝජනා කරන්න ඉඩ තියන්නේ නැහැ. ඒ වාගේම ඊට විරුද්ධව අපි කටයුතු කරනවා. එහෙම යෝජනා කළ මන්ත්‍රීවරු ඉන්නවා නම්, සමාජයේ එහෙම කථා කළ උදවිය ඉන්නවා නම්, ඊට විරුද්ධව කටයුතු කරන්න ආණ්ඩුවට වගකීමක් තිබෙනවාය කියන කාරණයත් මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. ලංකා බනිජ වැලි නීතිගත සංස්ථාවේ සේවක මහත්වරුන් වෙනුවෙන් අපි හැමදාම මේ පාර්ලිමේන්තුවේ හඬ නැඟුවා. ඒ සඳහා අපේ බිමල් රත්නායක ගරු ඇමතිතුමා ඉතාම හොඳ උත්තරයක් දුන්නා. එතුමා කිව්වා, දැනට සේවයේ ඉන්න පිරිස බඳවා ගන්නවාය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 102දෙනෙක් බඳවා ගන්න අද අනුමැතිය ලැබී තිබෙනවා. හැබැයි, ඒ 102ක පිරිස බඳවා ගන්න හදන්නේ විවෘත, ප්‍රසිද්ධ දැන්වීම් පළ කරලා. එතකොට අර ඇතුළේ ඉන්න කණ්ඩායමට ඉඩක් ලැබෙන්නේ නැහැ. හැබැයි, බිමල් රත්නායක මැතිතුමා පාර්ලිමේන්තුවේදී පොරොන්දු වුණේ, ඒ ඇතුළේ ඉන්න කට්ටිය බඳවා ගන්නවා කියලායි. ඔවුන් අවුරුදු එකහමාරක් කිසිදු වැටුපක් නැතුව සේවය කළා. ඒ නිසා ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. අවසාන වශයෙන්, රටේ ආර්ථිකය ශක්තිමත් වෙනවා නම්, මේ ආණ්ඩුව රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න කටයුතු කරනවා නම්, අපි හැමෝම සතුටුයි කියන කාරණයත් සිහිපත් කරමින්, අවස්ථාව ලබා දීම පිළිබඳවත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නලින් හේවගේ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.38]

**ගරු නලින් හේවගේ මහතා (වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நலின் ஹேவகே - தொழிற்கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. Nalin Hewage - Deputy Minister of Vocational Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේක ඉතා වැදගත් විවාදයක් කියලා මම හිතනවා. මොකද, මේ විපක්ෂය දීර්ඝ කාලයක් තිස්සේ, එනම් අප ආණ්ඩු බලය ගන්න කලිනුත්, ආණ්ඩු බලය ගත්තාට පසුවත් කියපු කාරණාවක් තමයි, "මේ අයට පළපුරුද්ද නැහැ, කළ පුරුද්ද නැහැ, දන්නේ නැහැ, අවබෝධයක් නැහැ, පෙට්ටි කඩයක්වත් කරලා නැහැ" කියන එක. අන්න එහෙම කියපු කට්ටියට තමයි මේ Central Bank report එකෙන් - මෙය අපේ වාර්තාවක් නොවෙයි - ටිකක් තද කනේ පහරක් ගහලා තිබෙන්නේ. ඒ නිසා විපක්ෂය අද මේ Central Bank report එක මත පිහිටා නොව, ඉතාම අවිචාරාත්මකව කරුණු කාරණා කිහිපයක් ඉදිරිපත් කරනවා.

ගරු රෝහිණී කුමාරි කවිරත්න මන්ත්‍රීතුමිය මූලාසනයේ හිටියත් මම එතුමියට එක අභියෝගයක් කරනවා. ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය දැන් වුට්ටකට කලින් කිව්වා, මේ රටේ ණය බර ට්‍රිලියන 5කින් වැඩි වෙලා කියලා. මම අපේ කවිරත්න මන්ත්‍රීතුමියට අභියෝග කරනවා, පුළුවන් නම් ඒක ඔප්පු කරන්න කියලා. එහෙම ඔප්පු කළොත් මම මන්ත්‍රී ධුරයෙන් අස් වෙන්න සූදානම්. ඔබතුමිය කියපු විධියට පසුගිය අවුරුද්දට මේ රටේ ණය බර ට්‍රිලියන 5කින් වැඩි වෙලා නම්, ඔබතුමිය ඒක ඔප්පු කරන්න. ඕනෑම රූපවාහිනී සංවාදයකට එන්න මම සූදානම්. ඒ වාගේ පට්ටපල් බොරු කියන තත්ත්වයට මේ විපක්ෂය අද පත් වෙලා තිබෙනවා. මේ රටේ ණය බර ට්‍රිලියන 5කින් වැඩි වෙලා කියලායි දැන් වුට්ටකට කලින් කිව්වේ. ඒක ඔප්පු කළොත් මම සූදානම්, පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් අස් වෙන්න. ඒ වාගේම, ඒක ඔප්පු කරන්න බැරි වුණොත් කවිරත්න මන්ත්‍රීතුමිය සූදානම් වෙන්න ඕනෑ, අස් වෙන්න. මෙන්න මේ විධියේ බොරු තමයි විපක්ෂය

[ගරු නලින් හේවගේ මහතා]

කියන්නේ. තවත් බොරුවක් කියනවා මම ඊයේ උදේත් දැක්කා. ඒක ඊයේ උදේ 11.04ට විපක්ෂ නායකවරයා කියපු එකක්. ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය විතරක් නොවෙයි ඔය වාගේ කථා කියන්නේ. ඊයේ විපක්ෂ නායකවරයා කියනවා, Vitz කාර් එක රුපියල් ලක්ෂ 12ට දෙනවා කියලා මා කියපු බවක්. මම සජිත් ප්‍රේමදාස නමැති විපක්ෂ නායකවරයාට කියනවා, රුපියල් ලක්ෂ 12ට Vitz කාර් එකක් දෙනවා කියලා මා කොහේ හරි කියලා තිබෙනවා නම් ඒක ඔප්පු කරන්න කියලා. ඒක ඔප්පු කළොත් මම අස් වෙනවා. එහෙම නැත්නම්, ඒක ඔප්පු කර ගන්න බැරි විපක්ෂ නායකවරයා ඉල්ලා අස් වෙන්න ඕනෑ. මේගොල්ලෝ පට්ටපල් බොරු ටිකක් කියන්නේ.

පසුගිය අවුරුද්දට අදාළව මහ බැංකුව ඉදිරිපත් කළ වාර්තාවේ ඉතා පැහැදිලිව කියන්නේ මොකක්ද? 2024 වර්ෂයේදී මේ රටේ ආර්ථිකය ඩොලර් බිලියන 99.6යි. එය, ඩොලර් බිලියන 108.8 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ, ආර්ථිකය ඩොලර් බිලියන 9.2කින් වැඩි වෙලා තිබෙනවා. හැබැයි, එක්සත් ජාතික පක්ෂය මොකක්ද කියන්නේ? ඒ ගොල්ලෝ 2015දී බලය ගන්න කොට රටේ ආර්ථිකය ඩොලර් බිලියන 79යි; බැහැලා යනකොට ඩොලර් බිලියන 93යි. අවුරුදු 5ටම ඩොලර් බිලියන 4යි වැඩි වුණේ. හැබැයි මේ කියන එක අවුරුද්දට ආර්ථිකය ඩොලර් බිලියන 9.2කින් වැඩි වෙලා තිබෙනවා.

උද්ධමනය ගැනත් කිව්වා. ඔබතුමියලා රුපියල ගැනත් කථා කරනවා. විපක්ෂයේ ඔබතුමන්ලා 2015දී බලයට එන කොට ඩොලරයේ අගය රුපියල් 131යි. ඔබතුමන්ලා 2019දී බැහැලා යනකොට ඩොලරය රුපියල් 185යි. රුපියල අවප්‍රමාණයෙන් විතරක් වැඩි වෙච්ච ණය බර කීයද? ඔය ආර්ථික ඔස්තාර්ලා; හර්ෂලා, රවීලා ආදි ඔක්කොම එක්සත් ජාතික පක්ෂයේ සිටිද්දී මොකද වුණේ? මේ අය 2015දී බලය ගන්න කොට ඩොලරයේ අගය රුපියල් 131යි; 2019දී බැහැලා යනකොට ඩොලරයේ අගය රුපියල් 185යි. රුපියල අවප්‍රමාණයෙන් විතරක් කෝටි එක්ලක්ෂ හැත්තෑ දෙදාහකින් ණය බර වැඩි වෙලා තිබුණා. දැන්, මේ කථා කරන මොහොත වන කොට මුදල් ඒකකය අවප්‍රමාණය වෙලා නැත්තේ මේ කලාපයේ මොන රටේද කියන්න. ඒකට මේ පවතින යුදමය වාතාවරණය නිසා ඇති වෙච්ච තත්ත්වයත් බලපා තිබෙනවා. ඒක පිළිගන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි, ඒකපුද්ගල ආදායම ගත්තොත්, එය ඩොලර් 4,546 සිට 5,003 දක්වා වැඩි වෙලා තිබෙනවා. විරැකියාව සියයට 4.4 ඉඳලා 3.9 දක්වා අඩු වෙලා තිබෙනවා; සංචිත ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා; සංචාරකයන්ගේ පැමිණීම වැඩි වෙලා තිබෙනවා; අපනයන ආදායම වැඩි වෙලා තිබෙනවා. මේවා තමයි ආර්ථිකයේ වර්ධනීය දත්ත. අපට පෙට්ටි කඩයක්වත් කරන්න බැහැ කියලා කියපු කට්ටියට මහ බැංකු වාර්තාවෙන් මේ වනකොට ඔප්පු කරලා තිබෙනවා, අපට පෙට්ටි කඩයක් නොවෙයි, සුපර්මාර්කට් එකක් නොවෙයි, රටක් කරන්න පුළුවන් කියන එක. ඒගොල්ලන් දැන් කියන විදියට ඒගොල්ලන්ට නේ මේවා කරන්න පුළුවන්.

සාමාන්‍යයෙන් එක්සත් ජාතික පක්ෂය කියන්නේ, ව්‍යාපාරික පන්තියට හිතවත් එකක් කියලා නේ, කියන්නේ. ඒ අය 2015දී බලය ගන්න කොට ව්‍යාපාර විශ්වසනීය දර්ශකය තිබුණේ 81. ඒ අය 2019 බැහැලා යනකොට එම දර්ශකය තිබුණේ 110. කඩ කරපු කට්ටිය, ලොකු shopping malls කරපු කට්ටිය එහෙම තමයි කළේ. 2015දී සියයට 5ක වර්ධන වේගයක් තිබුණා. 2016දී සියයට 4.5යි. 2017දී සියයට 3.6යි. 2018දී සියයට 3.2යි. බැහැලා යනකොට සියයට 2යි. ඔන්න, shopping malls කරපු කට්ටියගේ වැඩ. අපට නේ පෙට්ටි කඩයක්වත් කරන්න බැහැ කිව්වේ. Shopping malls කරපු කට්ටිය බලයේ ඉන්න කොට 2015දී ආර්ථික වර්ධන වේගය සියයට 5යි; බැහැලා යනකොට සියයට 2යි. ඒ අය එහෙමයි කළේ. 2016දී රටේ මුළු ආදායමෙන් ණය වාරිකයයි, පොලියයි ගෙව්වාට පස්සේ බිලියන 452ක් ඉතිරි වුණා. 2017දී රටේ මුළු ආදායමෙන් ණය වාරිකයයි පොලියයි ගෙව්වාට පස්සේ බිලියන 352ක් ඉතිරි වුණා. 2018දී රටේ මුළු ආදායමෙන් ණය වාරිකයයි, පොලියයි ගෙව්වාට පස්සේ බිලියන 41ක් ඉතිරි වුණා. 2019දී රටේ මුළු ආදායමෙන් ණය වාරිකයයි, පොලියයි ගෙව්වාට පස්සේ බිලියන 4යි ඉතිරි වුණේ. 2020දී රටේ මුළු ආදායමෙන් ණය වාරිකයයි පොලියයි ගෙවන්න බිලියන 521ක් මදි වුණා. ඔන්න shopping malls කරපු කට්ටියගේ වැඩ. ඒ අය දැන් අපට උගන්වන්න එනවා, ආර්ථිකය හදන හැටි. එදා ඒ අය මේ ආර්ථිකය වැට්ටුවේ එහෙමයි. වානක මාදුගොඩ මන්ත්‍රීතුමා, ඔබතුමා දැන් චුට්ටකට කලින් කිව්වා, ඔබතුමන්ලා තමයි ආර්ථිකය හැදුවේ, ඒ කාලයේ GDP එක මෙච්චර මෙච්චර වැඩි වුණා කියලා. 2024දී මේ රටේ GDP එක සියයට 24.7 යි. ඔබතුමන්ලා බැහැලා යනකොට සියයට 79.1යි. වර්ධනය සියයට 221යි. හැබැයි, ඔබතුමන්ලා ගත්තු ණය ප්‍රමාණයේ වර්ධනය සියයට 252යි. පාන් ගෙඩියක් දීලා ඒක කන්න මාජරින් පැකට් එකක් දුන්නොත් හිත හදාගන්න පුළුවන්. හැබැයි, පාන් ගෙඩියක් දීලා ඒ ප්‍රමාණයේම සයනයිඩ් කුට්ටියක් කන්න දුන්නොත් මොකද වෙන්නේ? ඔබතුමන්ලා කළේ එහෙම වැඩක්. සියයට 221ක වර්ධනයක් පෙන්වන ගමන් ණය ප්‍රමාණය වැඩි වුණා සියයට 252කින්. මාදුගොඩ මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා හැම අවුරුද්දකම සියයට 25කින් ණය බර වර්ධනය කළා. 2015 මහ බැංකු වාර්තාවේ තිබෙනවා NEET කියලා දර්ශකයක්. රජතුමාගේ පුතා "තාරුණ්‍යයට හෙටක්" හදලායි තිබුණේ. ඒ NEET දර්ශකයෙන් කියනවා 2015 වනකොට මේ රටේ තරුණයන්ගෙන් සියයට 40ක් රැකියාවක නියැළෙන්නේ නැහැ; අධ්‍යාපනයක නියැළෙන්නේ නැහැ; පුහුණුවක නියැළෙන්නේ නැහැ කියලා. ඒවා සඳහන් වෙලා තිබෙන්නේ මහ බැංකු වාර්තාවේ. මෙතැන කථා කරන්නේ මහ බැංකු වාර්තා අරගෙන නොවෙයි. මහ බැංකු වාර්තාවක් අරගෙන කියවන්න තරම් මොළයක්, දැනුමක් තිබුණා නම් මේ සංවාද මීට වඩා දියුණුයි. ඔබතුමන්ලා හැදුවා කියන රටේ, 2015 මහ බැංකු වාර්තාවේ සඳහන්ව තිබෙනවා NEET කියන දර්ශකය ගැන. එතකොට "තාරුණ්‍යයට හෙටක්" හදලායි තිබුණේ. ඒ මහ බැංකු වාර්තාව කියනවා, තරුණයන්ගෙන් සියයට 40ක් රැකියාවක නියැළෙන්නේ නැහැ, පුහුණුවක නියැළෙන්නේ නැහැ, අධ්‍යාපනයක නියැළෙන්නේ නැහැ කියලා. ඔන්න! සංවර්ධනය. එහෙම බිඳ වට්ටලා තමයි මේ රට බංකොලොත් - bankrupt - රටක් බවට පරිවර්තනය කළේ.

ඔබතුමන්ලා දන්නවා මේ රට සුනාමි ව්‍යසනයටත් මුහුණ දුන්නු බව. අපි ආර්ථිකය හැදුවා විතරක් නොවෙයි, දේශපාලන සංස්කෘතියත් වෙනස් කළා. මොකද, ආර්ථිකය බංකොලොත් වෙන්න බලපාන ප්‍රධානම දේ තමයි දේශපාලන සංස්කෘතිය. අපි ඒ දේශපාලන සංස්කෘතිය ගිය අවුරුද්දේ වෙනස් කළා. ලංකා ඉතිහාසයේ එදා මෙදා තුර බර අඩි තියන්න පුළුවන් යෝධ ගමනක් ආරම්භ කරපු වර්ෂයක් තමයි, 2025 වර්ෂය. අපි දේශපාලන සංස්කෘතිය වෙනස් කළා; කුඩා කැබිනට් මණ්ඩලයක් හැදුවා; අමාත්‍යාංශ විෂයයන් විද්‍යාත්මක පදනමකින් බෙදුවා; ජනාධිපතිතුමාගේ ඉඳලා ආදර්ශයක් ලබා දුන්නා; නිල නිවාස ගත්තේ නැහැ; මන්ත්‍රී පෙන්ෂන් එකත් කපා ගත්තා; වෛද්‍ය රක්ෂණය රුපියල් ලක්ෂ 10 ඉඳලා ලක්ෂ දෙකහමාර දක්වා අඩු කර ගත්තා. අපි දේශපාලන සංස්කෘතියේ දැවැන්ත වෙනසක් කළා. වාහන බලපත්‍රය අරගෙන විකුණා ගන්න පුළුවන් වුණත්, අපි එය ගත්තේ නැහැ. අපි ඒක මන්ත්‍රීවරුන්ට ලබා දුන්නේ නැහැ. අපි වෙනසක් කළා. ආර්ථිකය හදන ගමන් ආර්ථිකය විනාශ වෙන්න තිබෙන දේශපාලන සංස්කෘතිය අපි වෙනස් කළා.

තුන්වැනියට "දිට්වා" ව්‍යසනය ගැනත් කියන්න ඕනෑ. එහිදී ලංකා ඉතිහාසයේ දෙන්න පුළුවන් වැඩිම සහනාධාර ප්‍රමාණය දුන්නා. ආපදාවට ලක් වුණු නිවැසියන්ට තම ගෙදර පිරිසිදු කරගෙන යන්න රුපියල් 25,000ක් දුන්නා; ළමයින්ගේ පොත් පත් ටික ගන්න රුපියල් 25,000ක් දුන්නා; ගෙයක් කුලියට ගන්නවා නම් ඒකට රුපියල් 25,000ක් දුන්නා; ආර්ථිකය බිඳ වැටිලා නම් මාස 6ක් යනකල් රුපියල් 50,000ක් දුන්නා; කඩයක් නම් රුපියල් 100,000ක් දුන්නා; ඉඩමක් ගන්න රුපියල් ලක්ෂ 50ක් දුන්නා; නිවාසයක් හදාගන්න රුපියල් ලක්ෂ 50ක් දුන්නා. මෙහෙම වන්දි දීපු රජයක් මීට පෙර තිබුණේ නැහැ. විපක්ෂයේ ඔබතුමන්ලා ඒ දවස්වල ආණ්ඩුව විවේචනය කරමිනුයි හිටියේ. නමුත් අපට මතකයි, සුනාමි ව්‍යසනය ආපු වෙලාවේ අපි ගාල්ල ඉඳන් මාතර දක්වා රේල් පාර හැදුවා; ගාල්ලේ, දිගම බස් නැවතුම්පොළ හැදුවා. හැබැයි, ඔබතුමන්ලා එක පෙට්ටි කඩයක්වත් හැදුවේ නැහැ, මේ වනකොට. ආණ්ඩුව විවේචනය කරමිනුයි හිටියේ. ආර්ථිකය ස්ථාවර කරන ගමන්, ආර්ථිකය අස්ථාවර වෙන්න බලපාන දේශපාලන සංස්කෘතිය වෙනස් කරන ගමන් ආපු අර්බුදයටත් අපි ඉතාම හොඳින් මුහුණ දුන්නා.

අපි මොනවාද කළේ කියලා විපක්ෂය අහනවා නේ. මම අහනවා, මේ කෙටි කාලය තුළ අපි මොනවාද නොකළේ කියලා. පසුගිය කාලයේ අපි කාටද නොසැලකුවේ? ඒ අවුරුද්ද ඇතුළත මේ රටේ සලකන්න පුළුවන් හැම ජනතාවටම අපි සැලකුවා. රාජ්‍ය සේවකයන්ට පඩි වැඩි කරලා පළමු වටයේ වැඩි කිරීම වෙනුවෙන් රුපියල් බිලියන 110ක මුදලක් වෙන් කළා. දෙවන වටයේ වැඩි කිරීම වෙනුවෙන් තවත් රුපියල් බිලියන 110ක් වෙන් කළා. තුන්වන වටයට අදාළ වැඩි කිරීම වෙනුවෙන් ලබන අවුරුද්දේත් රුපියල් බිලියන 110ක් වෙන් කරනවා. කලින් මෙවැනි රජයක් තිබුණේ නැහැ. අපි රාජ්‍ය සේවකයන්ගේ පෙන්ෂන් එකත් වැඩි කළා; විශ්‍රාමිකයන්ගේ දීමනාවත් වැඩි කළා. ඒ වාගේම, රාජ්‍ය සේවයට 76,000ක් බඳවා ගන්න දැන් කටයුතු කරගෙන යනවා. මේ දේවල් තමයි අපි කළේ.

ඒ විතරක් ද නොවෙයි. වැඩිහිටි දීමනාව වශයෙන් අම්මාට තාත්තාට ලබා දුන් රුපියල් 3,000ක දීමනාව රුපියල් 5,000ක් කළා. වකුගඩු රෝගීන් සඳහා ලබා දුන් රුපියල් 7,500 දීමනාව රුපියල් 10,000ක් කළා. "අස්වැසුම" ගන්න හිටියේ පවුල් ලක්ෂ 18යි. ඒක පවුල් ලක්ෂ 20ක් දක්වා වැඩි කළා. අස්වැසුම ප්‍රතිලාභ යටතේ ගෙවනු ලැබූ රුපියල් 8,500, රුපියල් 10,000ක් කළා; රුපියල් 15,000 රුපියල් 17,500ක් කළා. ඒක පසුගිය මාසයේ රුපියල් 25,000ක් කළා. පාසල් යන දරුවන්ට පොත් පත් ටික නොමිලේ දීලා, ඇඳුම් ටික නොමිලේ දීලා අමතර පොත් පත් ගන්නත් රුපියල් 6,500ක දීමනාවක් දුන්නා. පාසල් ළමුන් ලක්ෂ 3කට සපත්තු කුට්ටම් ගන්න වවුචර්පත් දුන්නා. කාටද අපි නොසැලකුවේ? ළමා නිවාසයේ ඉන්න දරුවාටත් රුපියල් 5,000ක් දීලා විවාහ වෙනකොට දසලක්ෂයක ගෙයක් දුන්නා. මෙහෙම ආණ්ඩුවක් හැදුවාද, ඉතිහාසයේ? 2025 කියන්නේ එහෙම වර්ෂයක්. පෞද්ගලික අංශයේ සේවකයන්ට රුපියල් 22,000ක්ව තිබ්ච්ච අවම වැටුප රුපියල් 27,000 සිට රුපියල් 30,000 දක්වා වර්ධනය කළා.

ඔබතුමන්ලා හැමදාම වතු ප්‍රජාව රැවැට්ටුවා. ඒ රවට්ටපු ජනතාවගේ දෛනික වැටුප අපි රුපියල් 1,350 සිට 1,750 දක්වා වැඩි කළා. දැන් කියන්න, අපි කාටද සැලකුවේ නැත්තේ කියලා. දහතුන් ලක්ෂයක් වන රාජ්‍ය සේවකයන්ට සැලකුවා. 650,000ක් වන විශ්‍රාමිකයන්ට සැලකුවා. 2,000,000ක් වන "අස්වැසුම" ප්‍රතිලාභී පවුල්වලට සැලකුවා. කාටද සැලකුවේ නැත්තේ? 4,000,000ක් වන පාසල් දරුවන්ට සැලකුවා. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට මහ පොළ දීමනාව වශයෙන් එදා මෙදා තුර දුන්නේ රුපියල් 5,000යි. ඔබතුමන්ලා අවුරුදු 40කටම දුන්නේ රුපියල් 5,000යි. අපි එක අවුරුද්දෙන් රුපියල් 5,000ක් වැඩි කළා. දැන් ඒ මුළු දීමනාව රුපියල් 10,000යි. තවමත් අහනවා, අපි මොනවාද කළේ කියලා. මෙතැන් සිට මේ රටේ අහන්න ඕනෑ, මේ ආණ්ඩුව මොනවාද නොකළේ කියලායි. ආර්ථිකය ස්ථාවර කරලා, ආර්ථිකය අස්ථාවර වෙන්න බලපාන දේශපාලන සංස්කෘතිය වෙනස් කරලා, "දිට්වා" සුළි කුණාටුවට මුහුණ දීලා ජනතාවටත් සහන දුන්නා. දැන් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා මෙතැනදී කිව්වා, ගිය අවුරුද්දේ ප්‍රාග්ධන වියදම්වලින් සියයට 50ක් වැය කරලා නැහැ කියලා. ඔක්කෝම බොරුකාරයෝ. මම කියනවා, පුළුවන් නම් ඒක ඔප්පු කරන්න කියලා. ඒත් මම පාර්ලිමේන්තුවෙන් අයින් වෙනවා. මම අභියෝග තුනක් කළා. පුළුවන් නම් ඔප්පු කරන්න, සියයට 50යි කියලා. පුළුවන් නම් ඔප්පු කරන්න. මේ පට්ටපල් බොරු කියන්නේ. ඉතින් ඒක නිසා මේවා නොවෙයි, වුවමනාකම තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි, රටේ සංවර්ධනයට ට්‍රිලියන 1.4ක දැවැන්ත මුදලක් වෙන් කළා. දකුණු පළාත් සභාව ගත්තොත්, 2020 ඉඳලා 2024 දක්වා පළාත් සභාව සාමාන්‍යයෙන් අවුරුද්දකට වියදම් කරන්නේ මිලියන 650යි. අපි ඇවිල්ලා, 2025ට මිලියන 2,800ක් වෙන් කළා. මේ අවුරුද්දේ මිලියන 3,000යි. ඒක ඔබතුමන්ලා වෙන් කළා වාගේ හය ගුණයක්. ඔව්, මේකේ ඇත්ත තිබෙනවා, මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමන්ලා මහා ලොකු බෝඩ් ගහගෙන, විවෘත කිරීම් දාගෙන වාහන 10, 15 ගමට යනකොට හිතනවා, ආං ඇමතිවරයා ආවා කියලා. අපේ ඒ ටික නැති හින්දා අපේ අඩුවක් තියෙන බව ඇත්ත. අපි ට්‍රිලියන 1.4ක් වියදම් කළා. ඒ විතරක් නොවෙයි, මේ රටේ ආර්ථිකය හදන්න, දුගී දුප්පත්භාවය නැති කරන්න හැම ගමකටම මිලියන එකක්, දෙකක්, තුනක් දැන් එවලා තිබෙන්නේ. මිලියන 24,000ක් වෙන් කරලා තිබෙනවා, ග්‍රාම නිලධාරි වසම් 14,000කට. කලින් ආණ්ඩු එහෙම කළාද? මිලියන 24,000ක් ග්‍රාම නිලධාරි වසම් 14,000කට මේ වෙනකොට වෙන් කරලා තිබෙනවා. ඒක නිසා පසුගිය අවුරුද්ද තරම් ස්ථාවර ගමනක් යන්න පුළුවන් දැවැන්ත අඩිතාලමක් දමපු තවත් වසරක් නැහැ.

අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනාවා; මත්ද්‍රව්‍ය ටික ඇල්ලුවා; පාතාලය ඇල්ලුවා. දැන් කෝ, අර දවසේ උණ්ඩය? කෝ, දවසේ වෙඩිල්ල? මත්ද්‍රව්‍ය ටික අල්ලලා, පාතාලය අල්ලලා, නීතිය ක්‍රියාත්මක කළා. අධිකරණයට ගේන්න බැහැ කියපු කට්ටිය ගෙනැල්ලා කටයුතු කළා. ඒ නිසා අපි දැන් දැවැන්ත වෙනසක් කරලා තියෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විපක්ෂය ඉතිහාසයේත් බොරු කිව්වේ. සජිත් ප්‍රේමදාස මහත්තයා කිව්වා මට මතකයි, "දෙකක් තිබුණොත් එකක් ගන්නවා" කියලා. සජිත් ප්‍රේමදාස මහත්තයාගෙන් මම අහනවා, එතුමාට දෙකක් තිබිලා මේ අවුරුදු එකහමාරෙදී එයින් ගත්ත එක මොකක්ද කියලා. එතුමා රැස්වීම්වල ගිහින් කිව්වා, දෙකක් තිබුණොත් එකක් ගන්නවා කියලා. මේ අවුරුදු එකහමාරට සජිත් ප්‍රේමදාස මහත්තයාට දෙකක් තිබිලා එයින් එකක් ගත්ත දේවල් ටික පුළුවන් නම් කියන්න. ඒ වාගේ පට්ටපල් බොරු කිව්වා. මේ බොරු ජනතාව පිළිගන්නේ නැති හින්දා තමයි අපි එකට විසි එකේ අනුපාතයෙන් මැයි දින රැළි ලංකාව පුරා තිබ්බේ. ඔබතුමන්ලා හට් එකක් ගහලා එකක් තියනකොට, එකට විසි එකේ අනුපාතයෙන් අපි තිබ්බා. දැන් අපට ජනතාව නැහැලු. ජනතාව නැත්තේ කාටද කියලාත් තේරෙනවා. අපි මේ වැඩ ටික කරනකොට ඔබතුමන්ලා තව ටිකක් හෝදලා යන බව මතක් කරමින් මා කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නලින් හේවගේ මන්ත්‍රීතුමා දිගින් දිගටම මට පිළිතුරු දෙන්න කියලා යෝජනා කළා. එතුමාගෙන් මම අහන්න කැමැතියි, ඔබේ ආණ්ඩුව මේ අවුරුදු එකහමාර ඇතුළත ණය ගත්තේ නැද්ද කියලා. ඒ වාගේම ඔබතුමා කිව්වා, අපි බෝඩ් ගහගෙන විවෘත කිරීම් කළා කියලා. හැබැයි, අපි දැක්කේ ගාල්ලේ Clean Sri Lanka වැඩපිළිවෙළට ඔබතුමා ගිහිල්ලා බෝඩ් ගහගෙන විවෘත කරන එකක් විතරයි. අපි ඒ වැඩසටහන විතරයි දැක්කේ. ඔබතුමා අපට චෝදනා කළාට ඔබතුමාගේ පසුගිය කාලසීමාව ගෙවුණේත් ඒ විධියට තමයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එන්. තාහීර් මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.51]

**ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද ආර්ථික විවරණය ගැන මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා වන වෙලාවේ මටත් කථා කරන්න අවස්ථාව දීම ගැන ස්තුතිය පුද කරනවා. විශේෂයෙන්ම ගත්තොත්, රටේ ආර්ථිකය ශක්තිමත් වෙන්න ඕනෑ. ඒකට සියලු ශ්‍රී ලාංකිකයන් හැටියට අපි සතුටු වෙන්න ඕනෑ. මෙතැන ඉලක්කම්වලින් කියනකොට අපටත් ඉලක්කම්වලින් කියන්න වෙනවා. විශේෂයෙන්ම මේ ආණ්ඩුව පත් වෙනකොට ආර්ථික අර්බුදයක් තිබුණේ නැහැ. ඒ ආර්ථික අර්බුදය තිබුණේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ. ඒක කොවිඩ් වසංගතයත් එක්ක තිබුණා. නමුත් අපේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපතිතුමා හැටියට පත් වුණාට පස්සේ ඒ තෙල් ප්‍රශ්නය, පොහොර ප්‍රශ්නය, ඒ ඔක්කෝම විසඳිලා තියෙනකොට තමයි ඔයගොල්ලෝ ආණ්ඩුව ගත්තේ. ඔයගොල්ලෝ ආණ්ඩුව ගන්නකොට බැංකු ණය තියෙන්න පුළුවන්. ඒක වෙන ප්‍රශ්නයක්. නමුත් කිසිම පෝලිමක් තිබුණේ නැහැ. ඉලක්කම්වලින් එහාට මෙහාට කියනවා. හරිද? මෙතැන ඉන්න 225දෙනාම පාර්ලිමේන්තුවේදී එහාට මෙහාට කථා කළාට රටේ ජනතාව ඒ තොරතුරු දන්නවා. අපේ රටේ ලක්ෂ 220ක් ජනතාව ඉන්නවා. ඒ ජනතාවගෙන් ගිහිල්ලා අහන්න, ගමට ගිහිල්ලා අහන්න අද තත්ත්වය මොකක්ද කියලා. අද පොහොර මිටියක ගණන කීයද? අද කිරිපිටිවල ගණන කීයද? තෙල් ගණන කීයද? ඔබතුමන්ලා ආණ්ඩුව භාර ගන්නකොට තිබුණු ගණනයි, වර්තමාන ගණනයි ගිහිල්ලා බලන්න. එතකොට තේරෙනවා. මෙතැනදී විපක්ෂයෙන් කියනවා කියලා ආණ්ඩු පක්ෂයෙන් තර්ක කෙරුවාට, ගමට ගිහිල්ලා යථාර්ථය බලන්න. ඒ නිසා නිකම් බොරුවට එක එක්කෙනාට චෝදනා කරන්නේ නැතුව, අපේ රටේ ආර්ථිකය ශක්තිමත් වෙනවා නම් අපි අවංකවම සතුටුයි. ඒක වෙන්න ඕනෑ දෙයක්. අපි රටේ පුරවැසියෝ හැටියට ඒක විශ්වාස කරනවා. නමුත්, මෙතැනට ඇවිල්ලා විපක්ෂය කියන දේවලට ආණ්ඩුවෙන් ඉලක්කම්වලින් ගණන් කියලා හරියන්නේ නැහැ. ඇත්තටම ආර්ථික අර්බුදයක් ඇති වුණා. දැන් ආර්ථික අර්බුදය ආයෙත් වැඩි වෙලා තිබෙනවා. ඔබතුමන්ලා කියන්න, 290ට, 300ට තිබුණු ඩොලරය දැන් කීයද? දැන් 340ත් පැනලා තිබෙනවා. ඉතින්, කොහොමද ආර්ථිකය දියුණු වෙන්නේ? ඔබතුමන්ලාට කියන්න, මේ 15වැනි දා වාහන 4,000ක් ගෙන්වන්න LCs open කරලා තිබෙනවා. ඒවාට රුපියල්වලින් ගෙවන කොට ඩොලරයේ අගය ඉහළ යනවා. එකපාර LCs 4,000ක් open කරලා තිබෙනවා. එතකොට කොහොමද ඩොලරය පාලනය කරන්නේ? අහිංසක, දුප්පත් ජනතාව මෙච්චර වාහන ගන්නේ නැහැ. එදා එදා කුලී වැඩ කරන අය වාහන ගන්නේ නැහැ. සල්លි තිබෙන අයට වාහන ගන්න අවස්ථාව දීලා, ඩොලර් එක නැග්ගා. ඒක තමයි ඇත්ත කථාව.

ඇත්තටම 76 අවුරුද්දක් තිස්සේ මේ රටේ යම් යම් නායකයෝ ඉඳලා තිබෙනවා. ඩී.එස්.සේනානායක මැතිතුමා, ඩඩ්ලි සේනානායක මැතිතුමා, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, ආර්. ප්‍රේමදාස මැතිතුමා, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය, මහින්ද රාජපක්ෂ මැතිතුමා, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා හිටියා. වර්තමානයේ රටේ ජනාධිපති හැටියට අනුර කුමාර දිසානායක මැතිතුමා ඉන්නවා. ඒ හැම නායකයෙක්ම රටේ යම් කිසි පෙරළියක් කරලා තිබෙනවා. අපි ඒක නැහැ කියන්නේ නැහැ. හැමදාම 76 අවුරුද්දේ ශාපය, ශාපය කියලා කියන්නේ නැතුව දැන් අලුතින් මේ රට හදන්න ඕනෑ. ඒකම කියලා හරියන්නේ නැහැ. යම් යම් කාලවල එක එක අර්බුද ආවා. වේගුවේරා අර්බුදය ආවා, 1983 අර්බුදය ආවා, 1988-1989 ජේවීපී අර්බුදය ආවා. ඒවා කාලයෙන් කාලයට එනවා. ඒක හැමදාම පෙන්වා පෙන්වා ඉන්නේ නැතුව, ඒක අමතක කරලා අපි සියලුදෙනා එකතු වෙලා රට හදන්න ඕනෑ. රට හදනවා නම් අවංකව කරන්න ඕනෑ. එකිනෙකාට චෝදනා කරන්නේ නැතුව ඒක කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම පුත්තලම ආසනය නියෝජනය කරන්නේ. පුත්තලම විශාල වශයෙන් ගංවතුරට යට වුණා. අද හදිසි නීතිය තිබෙනවා. පුත්තලම නගරය කළපු ආශ්‍රිත ප්‍රදේශයක්. උඩහින් එන වතුර ඔක්කොම ගලා ගෙන එනකොට පුත්තලම නගරය අවට රත්මල්යාය, පිල්ලයඩිය, මදුරන්කුලිය යන ප්‍රදේශ සම්පූර්ණයෙන්ම යට වුණා. ඔබතුමන්ලා දන්නවා, ලංකාවටම මේ ටිකේ වැහැපු වැස්සෙන් යට වෙලා පුත්තලමට හුඟක් අලාභහානියක් වුණා. ඒ නිසා ඒකට කඩිනමින් විසඳුමක් ලබා දෙන්න ඕනෑ. ඒක මේ ආණ්ඩුව එන්න කලින් අවුරුදුවල ඉඳලාම තිබෙනවා. ජනතාවගේ අත්‍යවශ්‍ය ප්‍රශ්නයක් මේක. මෙතැන හරියට ඇළ මාර්ගයක් නැහැ. අනෙක් එක තමයි, උඩහින් එන වතුර. ඉඟිණිමිටිය, තබ්බෝව වාගේ ව්‍යාපෘතිවල dams කැඩෙනවාට වතුර එකපාරම අරිනවා. ඔබතුමන්ලා TV එකෙන් දැකලා ඇති. වතුර එකපාර ඇරියාම ඒ වතුර ඇවිල්ලා ගලලා, ඉස්කෝල ගොඩනැඟිලි, කච්චේරිය ආදී සියලු ගොඩනැඟිලි සම්පූර්ණයෙන් යට වුණා. ඒ ඇළ මාර්ග, කානු හරියට හදලා නැහැ. ඒ නිසා ඒවා හදන්න. ඒවාට අපි සම්පූර්ණ සහයෝගය දෙනවා. විපක්ෂය හැටියට අපි එන්න ඕනෑ නැහැ, ආණ්ඩු පක්ෂය හැටියට ඔබතුමන්ලා ඒවා හදන්න. මේක ජනතාවට අයිති දෙයක්. ඒ නිසා බොරුවට ඉලක්කම්වලින් ඒක කළා, මේක කරනවා කියලා හරියන්නේ නැහැ. ඒක ජනතාව බලාපොරොත්තු වෙන්නේ නැහැ. ක්ෂණික විසඳුමක් ඒ වෙලාවට කරන්න ඕනෑ. ඒක කරන්නේ නැතුව ඉඳලා අපට කියනවා, "දැන් මෙච්චර මුදල් තිබෙනවා, මෙච්චර වියදම් කළා" කියලා. ජනතාවගේ අවශ්‍යතාව ඒ වෙලාවේ ඉෂ්ට කරන්න ඕනෑ. ඒකයි බලාපොරොත්තුව.

ඒ වාගේම ඔබතුමන්ලා ආර්ථිකය ගැන කථා කරනවා. මේ රටේ ආර්ථිකයට ගංවතුරෙන් කොච්චර බාධා එනවාද? පුත්තලම ගත්තාම, ලුණු ලේවා ඔක්කොම ඉවරයි, ඉස්සෝ කොටු ඉවරයි, එදාට එදාය කෘෂිකර්මාන්තය කරන ජනතාව ඉවරයි. ඒ නිසා ඒකට කඩිනම් විසඳුමක් ලබා දෙන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබුණු කාලය අවසානයි.

**ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
එහෙම නම් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු හයක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.57]

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

இலங்கை மத்திய வங்கியினால் சமர்ப்பிக்கப்பட்ட 2025ஆம் ஆண்டுக்கான பொருளாதார மீளாய்வு மற்றும் நிதியியல் அறிக்கைகள் மற்றும் தொழிற்பாடுகள் தொடர்பான விவாதத்தில் கலந்து கொள்வதையிட்டு மகிழ்ச்சியடை கின்றேன். மத்திய வங்கியின் இந்த அறிக்கையில், 2025ஆம் ஆண்டுக்கான இலங்கையினுடைய மொத்த உள்நாட்டு உற்பத்தி 5 சதவீதமாக அதிகரித்து இருப்பதாகச் சொல்லப்பட்டிருக்கிறது. அந்த அதிகரிப்புக்கான ஏதுநிலைகள் மற்றும் சவால்கள் தொடர்பாகவும் இந்த அறிக்கையிலே பல விடயங்கள் குறிப்பிடப்பட்டிருக்கின்றன. இலங்கையினுடைய மொத்த உள்நாட்டு உற்பத்தி அதிகரிப்பிலே முக்கியமாக மூன்று துறைகள் பங்களிப்புச் செய்வதாகவும் இந்த அறிக்கையில் கூறப்பட்டுள்ளது. குறிப்பாக, கைத்தொழில் சேவைகள் மற்றும் சுற்றுலா அத்தோடு விவசாயம் தொடர்பாகவும் இந்த அறிக்கையில் சொல்லப்பட்டிருக் கின்றது. அதேவேளையில், இந்த நாட்டினுடைய வேலையின்மை - வேலையில்லாத நிலைமை - தொடர்பாகவும் இந்த அறிக்கையிலே குறிப்பிடப்பட்டிருக்கின்றது. அதாவது, 2024ஆம் ஆண்டு 4.4 சதவீதமாகக் காணப்பட்ட வேலையின்மை வீதம் 2025ஆம் ஆண்டு 3.9 சதவீதமாகக் குறைவடைந்திருப்பதாகச் சொல்லப்பட்டிருக்கிறது.

2025ஆம் ஆண்டு எங்களுடைய நாட்டில் ஏற்பட்ட பொருளாதார முன்னேற்றம் தொடர்பான பல நல்ல விடயங்கள் இந்த அறிக்கையிலே சொல்லப்பட்டு இருக்கின்றது. ஆகவே, வங்குரோத்து அடைந்த ஒரு நாட்டின் பொருளாதாரத்தில் கடந்த இரண்டு வருட காலத்தில் உண்மையாகவே சிறிதளவேனும் ஒரு முன்னேற்றம் காணப்பட்டிருந்தால், அந்த விடயத்துக்காக நாங்கள் அரசாங்கத்தைப் பாராட்டலாம். ஆனால், இந்தப் பொருளாதார முன்னேற்றத்திற்காக இன்னும் சிறப்பாகச் செய்யக்கூடிய சந்தர்ப்பங்கள் தவறவிடப்பட்டுள்ளதாகவே நான் கருதுகின்றேன்.

இப்பொழுது உலகத்தில் ஏற்பட்டுள்ள போர்ச் சூழ்நிலைகள் காரணமாக, எங்களுடைய நாட்டுக்கு அதிக வருவாயை ஈட்டித் தந்த சுற்றுலாத்துறை 19.8 சதவீதத்தால் வீழ்ச்சியடைந் துள்ளதாக இந்த அறிக்கையில் சுட்டிக் காட்டப்பட்டிருக் கின்றது; இது ஒரு முக்கியமான பிரச்சினை. அதேபோல, எங்களுடைய நாட்டினுடைய மொத்த அந்நியச் செலாவணிக் கையிருப்பு குறைவடைந்து இருக்கின்றது. இங்கு பேசிய பலரும் குறிப்பிட்டதைப்போல, டொலர் விலை அதிகரிப்பதற்கு இந்தக் கையிருப்புக் குறைதல் என்பது மிகவும் முக்கியமான காரணமாகும். ஆனால், இதில் அரசாங்கத்தை மாத்திரம் நாங்கள் குறை சொல்ல முடியாது. நாங்கள் வாழுகின்ற இந்த உலகத்தில் ஏற்பட்ட, எங்கள் சக்திக்கு அப்பாற்பட்ட சில மாற்றங்களும் இந்த நிலைமைக்குக் காரணமாக இருக்கின்றது என்பதை நாங்கள் புரிந்து கொண்டிருக்கின்றோம். இவ்வாறான நிலையிலே எங்களுடைய நாட்டின் மொத்த உள்நாட்டு உற்பத்தியை அதிகரிக்க வேண்டுமானால், இந்த நாட்டின் அனைத்து மாகாணங்களும் அதற்குப் பங்களிப்புச் செய்ய வேண்டும் என்பது எங்களது கருத்தாகும்.

குறிப்பாக, இன்றைய பொருளாதார நிலையில் நாங்கள் வடக்கு, கிழக்கு மாகாணங்களை எடுத்துக்கொண்டால், மொத்தத் தேசிய உற்பத்தியில் வடக்கு மாகாணம் 4.2 சதவீத பங்களிப்பையே வழங்குகின்றது. அதேபோல கிழக்கு மாகாணத்தைப் பார்த்தால், அது கிட்டத்தட்ட 5 சதவீத பங்களிப்பைச் செய்கின்றது. இந்த இரண்டு மாகாணங்களையும் சேர்த்துப் பார்த்தால் GDPஇல் அவற்றின் பங்களிப்பு 9 - 10 சதவீதமேயாகும். ஆனால், மத்திய மாகாணத்தைப் பார்த்தால், அந்த ஒரு மாகாணமே இலங்கையின் மொத்தத் தேசிய உற்பத்தியில் 42 சதவீத பங்களிப்பை வழங்குகின்றது. அந்த வகையில், மாகாணங்களுக்கிடையிலான பொருளாதார அடைவு நிலைகளில் பாரிய வித்தியாசங்கள் காணப்படுகின்றன. வடக்கு, கிழக்குப் பிரதேசங்களில் இடம்பெற்ற உள்நாட்டு யுத்தமும் இதற்கொரு முக்கிய காரணமாக இருக்கலாம். ஆகவே, இந்த விடயங்களைக் கருத்திற்கொண்டு, எப்படி எங்களுடைய வடக்கு, கிழக்கு மாகாணங்களின் முழுமையான பங்களிப்பை இந்த நாட்டின் தேசிய உற்பத்திக்குப் பெற்றுக் கொள்வது என்பது தொடர்பாக ஒரு விசேட திட்டம் அரசாங்கத்திடம் இருக்க வேண்டும். ஆனால், இதுவரையில் அவ்வாறானதொரு திட்டம் தயாரிக்கப்பட்டதாக எங்களால் அறிய முடியாமல் இருக்கின்றது.

உதாரணமாக, தொழில்மயமாக்கலை எடுத்துக்கொண்டால் எங்களுடைய பிரதேசங்களான வட, கிழக்கு மாகாணங்களில் அது முற்றாக இல்லை. அது சிறு கைத்தொழிலாகவோ, நடுத்தரக் கைத்தொழில் முயற்சிகளாகவோ அல்லது பாரிய கைத்தொழில் முயற்சிகளாகவோ இருக்கலாம்! இதுவரை அவ்வாறான முயற்சிகள் பெரியளவில் முன்னெடுக்கப்பட வில்லை. அதேபோல, அங்கு தொழில் துறையை மேம்படுத்தக் கூடியதாக வெளிநாட்டில் இருந்தோ அல்லது உள்நாட்டி லிருந்தோ முதலீட்டாளர்கள் முன்வர வேண்டுமாகவிருந்தால், அந்தத் தொழில் துறையை மேம்படுத்தக்கூடிய நிருவாகக் கட்டமைப்பு வேண்டும். அவ்வாறான நிருவாகக் கட்டமைப்பு இன்னும் ஏற்படுத்தப்படவில்லை. அத்தோடு, உற்பத்தி செய்யப்படும் பொருட்களுக்குச் சந்தை வாய்ப்புகள், மதிப்புக்கூட்டல் - value addition - மற்றும் முத்திரையிடல் - branding - போன்ற பல விடயங்கள் செய்யப்படவேண்டி இருக்கின்றன. இந்த விடயங்கள் தொடர்பில் இந்த அரசாங்கத்திடம் எவ்வாறான புரிதல் அல்லது திட்டம் இருக்கின்றது என்பது கேள்விக்குறியான விடயமாக இருக்கின்றது.

வடக்கு, கிழக்கு மாகாணங்களுடைய பொருளாதாரத்தின் முதுகெலும்பாக இருப்பவை விவசாயம், விலங்கு

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

வேளாண்மை, மீன்பிடி போன்றவையாகும். இவற்றை மேம்படுத்த என்ன செய்யப்பட்டிருக்கின்றது? இத்துறைகளை மேம்படுத்த அரசாங்கத்திடம் திட்டம் எதுவும் இருக்கின்றதா என்ற கேள்வி எழுகின்றது. ஆகவே, நீங்கள் இந்த விடயம் தொடர்பில் மிகவும் உன்னிப்பாகக் கவனித்து, இந்த நாட்டின் மொத்தத் தேசிய உற்பத்திக்கு உதவக்கூடிய வகையில் எங்களுடைய வடக்கு, கிழக்கு மாகாணங்களுடைய பொருளாதாரத்தைக் கட்டியெழுப்ப வேண்டும். அதற்குரிய முதலீட்டாளர்களைக் கொண்டுவர வேண்டும்; அதற்கான வசதி வாய்ப்புகளையும் அடிப்படை உட்கட்டுமான வசதிகளையும் ஏற்படுத்த வேண்டும். அந்த வகையில், எங்களுடைய பிரதேசங்களில் இருக்கின்ற விமான நிலையங்கள், துறைமுகங்கள் அபிவிருத்தி செய்யப்பட வேண்டும். இவ்வாறு பல விடயங்கள் செய்யப்பட வேண்டியிருக்கின்றது.

அடுத்து, இந்தச் சந்தர்ப்பத்தில் எங்களுடைய வவுனியா மாவட்டத்தில் இருக்கின்ற முக்கியமான ஒரு பிரச்சினை சம்பந்தமாக இங்கு குறிப்பிட விரும்புகிறேன். வவுனியா பல்கலைக்கழகத்துக்கு முன்பாக இருக்கின்ற ஒதுக்குக்காடு - reserved forest - வனவளப் பாதுகாப்புத் திணைக்களத்தின் அதிகாரிகளுடைய உதவியோடு துஷ்பிரயோகம் செய்யப்பட்டு, அழிக்கப்பட்டிருக்கின்றது. அதற்குரிய சகல ஆதார புகைப்படங்களையும் என்னால் உங்களுக்குக் காட்ட முடியும். அது ஒரு பாரிய காடு. வனவளப் பாதுகாப்புத் திணைக்களத்தின் காரியாலயத்திலிருந்து சுமார் ஒன்றரை கிலோமீற்றர் தூரத்துக்குள் இருக்கின்ற இந்த ஒதுக்கக்காடு கிட்டத்தட்ட 40 ஏக்கர் அளவானது. அவர்களுடைய அனுசரணை இல்லாமல் அந்தக் காட்டை அழிக்க முடியாது. ஆனால், விவசாயிகள் தங்களுடைய விவசாயத் தேவைகளுக்காக அல்லது கால்நடைகளை வளர்ப்பதற்காக அந்தக் காட்டுக்குள்ளே போவதற்குத் தடை விதிக்கின்ற இந்தத் திணைக்களம் தொடர்பாக -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up. Please wind up.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
எனக்கு இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

என்னிடமுள்ள ஆதாரங்களை நான் இந்தச் சபைக்குத் தருகின்றேன். Survey planஇல் reserved forest என்று குறிப்பிடப்பட்டிருக்கின்றது. அப்படியானால் யாருடைய அனுமதியுடன் இந்தப் பாரிய காட்டை அழிக்கின்ற நடவடிக்கைகள் மேற்கொள்ளப்படுகின்றது? வனப் பாதுகாப்புத் திணைக்களத்தின் ஒத்துழைப்புடனேயே அங்கே இந்தப் பாரிய ஊழல் நடக்கின்றது. இந்த விடயம் அரசாங்கத்துக்குத் தெரியுமா அல்லது அரசாங்கத்துக்கும் இந்த ஊழலில் சம்பந்தம் இருக்கின்றதா என்பதை இந்தப் பாராளுமன்றத்துக்கு இந்த அரசாங்கம் தெளிவுபடுத்த வேண்டுமென்று கேட்டு, இது தொடர்பான ஆவணங்களை இந்தச் சபைக்குச் ***சமர்ப்பிக்கின்றேன்**. நன்றி!

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.05]

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අපි විවාදයට ගන්නේ 2025 වර්ෂයට අදාළව ශ්‍රී ලංකාවේ ආර්ථිකය සහ අනෙකුත් සේවා සංවර්ධනය වුණේ කොහොමද, නැත්නම් කඩා වැටුණේ කොහොමද, පසුබෑවේ කොයි තරම් ප්‍රමාණයකින්ද කියන කාරණා ගැන ඉදිරිපත් කර තිබෙන මහ බැංකු වාර්තාව ගැනයි. පවතින මේ තත්ත්වය විග්‍රහ කරලා එතැනින් එහාට අපි රටක් විධියට ඉස්සරහට යන්නේ කොහොමද කියලා බලන්නයි. මූලාසානරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද උදේ ඉඳලා මේ සභාවේ කළ ගොඩක් කථා අපි අහගෙන හිටියා. රටේ ආර්ථිකය සංවර්ධනය වුණේ කොහොමද, ඉස්සරහට ගියේ කොහොමද කියන එක පිළිබඳව මේ මහ බැංකු වාර්තාව ඇතුළේ ඉතා පැහැදිලිව සඳහන් කරලා තිබියදීත්, ආර්ථිකයක සංවර්ධනයන් මනින දර්ශක සියල්ලම නිවැරදිව ඉස්සරහට ගිහිල්ලා තිබියදීත්, විපක්ෂයෙන් කරුණු ඉදිරිපත් කළ හැම කෙනෙකුම වාගේ කිව්වේ කඩාගෙන වැටිලා, පස්සට ගිහිල්ලා, නැති වෙලා කියන එකයි. හරියට ආර්ථිකයක් නැහැ වාගේ කථා කළේ.

විශේෂයෙන්ම අපි මෙහෙම සංවාදයක්, සාකච්ඡාවක් ගන්න හේතුවක් තිබෙනවා. මහ බැංකු වාර්තාව කියන්නේ සංවර්ධනය විතරක්ම පෙන්වන එකක් නොවෙයි. මේකේ යම් අඩු පාඩුවක් තිබෙනවා නම්; යම් පසුබෑසීම් තිබෙනවා නම්, ආර්ථිකයේ කොයි කොයි ක්ෂේත්‍රවලද පසුබෑසීම් තිබෙන්නේ, ඒ පසුබෑහැලා තිබෙන ක්ෂේත්‍ර පසුබසින්න හේතු මොනවාද කියලා සංවාදයක්, සාකච්ඡාවක් ගන්න පුළුවන් මට්ටමට මේ වාර්තාව ඉදිරිපත් කරලා තිබෙනවා. හැබැයි ඒ ඉදිරිපත් කරලා තිබෙන වාර්තාව මත පදනම් වෙලා නොවෙයි කරුණු කියන්නේ. ඒ කරුණු, අදහස් ලබා ගත්තේ කොහෙන්ද කියලා හිතා ගන්න බැහැ. මේ මොහොත වන විට 2024ට සාපේක්ෂව ආර්ථික දර්ශක සියල්ලම ඉහළට ගියා වාගේම, සමහර ආර්ථික දර්ශක ඒ තරම් ඉහළ ප්‍රමාණයකින් වාර්තා කළ පළමුවෙනි අවස්ථාව 2025 කියලා දැන් අපි දන්නවා. ආර්ථික දර්ශක ප්‍රමාණයක් ඒ තරම් ඉස්සරහට ගියේ ලංකාවේ පළමුවෙනි වතාවට නම්, ඒ ආර්ථික දර්ශක අත්පත් කර ගැනීම වෙනුවෙන් 2025 වර්ෂයේ ජනවාරි මාසයේ ඉඳලා නොවැම්බර් 27 දක්වා මේ රටේ විධිමත්ව, සැලසුම්සහගතව මෙහෙයවපු ක්‍රියාවලියක් තිබුණා. ඒ ආර්ථික දර්ශක කාර්තුවෙන් කාර්තුවට මැනලා බැලුවත්, ඒ ආර්ථික දර්ශක වසර පුරා මැනලා බැලුවත්, ඉස්සරහට ගිහිල්ලා තිබෙනවා කියන එක ඉතාමත් හොඳින් පෙනෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අපි දන්නවා, නොවැම්බර් මාසයේ 27වැනි දා වෙනකොට ඒ ආර්ථික දර්ශක බිඳ වැටෙන, කඩා වැටෙන ක්‍රියාවලියක් සිද්ධ වුණු බව. ඒ තමයි සිදු වූ ස්වභාවික ආපදා තත්ත්වය. ඒ ස්වාභාවික විපත සිද්ධ වෙලා ආර්ථික ක්‍රියාවලිය අඩපණ වෙනකොට, දෙසැම්බර් මාසයේ අපේ ආර්ථික දත්ත යම් ප්‍රමාණයකට පසු බෑසීමක් සිද්ධ වුණා. ලංකාවට සංචාරකයන් එන ප්‍රමාණය සහමුලින් බිඳ වැටුණා. ඉදි කිරීම් කර්මාන්තයේ සමහර ව්‍යාපෘති

නතර වුණා. දෙසැම්බර් මාසයේ සමහර සංවර්ධන කාර්යයන් එක තැන පල් වෙන තත්ත්වයට පත්වුණා. සමස්ත වර්ෂය විධියට ගත්තාම, සියලු දර්ශකවලින් ඉදිරියට ගියාට දෙසැම්බර් මාසය වන විට යම් ප්‍රමාණයක බිඳ වැටීමක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හැබැයි මේ ආර්ථිකය හදන්න, ආර්ථිකය විධිමත් කරන්න, හොරකම නතර කරන්න, වංචාව නතර කරන්න කියලා ඉස්සරහා ඉඳගෙන උපදෙස් දෙන අයගෙන් වැඩිම ප්‍රමාණයක්; අපව වැඩියෙන්ම විවේචනය කරන අය දිහා බැලුවොත්, ඒ හැම කෙනෙකුම මේ ආර්ථිකය වැට්ටීම වෙනුවෙන්, යම් යම් හොරකම් වංචා වෙනුවෙන්; හොරකම් වංචා නිසාම මේ ආර්ථිකයට පාඩු කිරීම වෙනුවෙන්; නැත්නම් හොරකම් වංචා කරලා රටට, ආර්ථිකයට හානියක් කළා කියලා නඩු තිබෙන අය බව පෙනෙනවා. ආණ්ඩුව විවේචනය කරන එකනෙකා පිළිබඳව අරගෙන බලන්න. වැඩිම විවේචන කරන හැම කෙනෙකුටම වාගේ එක්කෝ නඩු වැටිලා, එහෙම නැත්නම් නඩු වැටෙන්න අදාළ පරීක්ෂණ විධිමත් විධියට යනවා. එහෙම අය කියන උපදෙස් පිළිපැදලා අපට ආර්ථිකය හදන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ විතරක් නොවෙයි. අපේ මන්ත්‍රීවරයෙක් කථා කරලා අහනවා මම දැක්කා, උතුරේ සංවර්ධනයට දායක වෙන්න මොනවාද කරන්නේ කියලා. උතුරේ පොල් ත්‍රිකෝණය ආරම්භ කරනවා. උතුරේ පොල් ත්‍රිකෝණය යටතේ අක්කර 16,000කට වැඩි ප්‍රමාණයක පොල් හිටවන්න සැලසුම් කළ වැඩ පිළිවෙළ ජනාධිපතිතුමා ගිහිල්ලා පළමුවෙනි අවුරුද්දේ ආරම්භ කළා. එතකොට ආර්ථිකයට දායක වෙන වැඩ තමයි ඒ කරන්නේ. ධීවර කර්මාන්තයට අදාළව වරායවල් සංවර්ධනය කරනවා. ඒ වාගේම ධීවරයෝ මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්නවලට එකින් එක උත්තර සපයමින් සිටිනවා. ඒ විතරක් නොවෙයි. උතුරේ සංවර්ධන කටයුතු සඳහා 2025 වර්ෂයේදී රුපියල් මිලියන 5,000කට වැඩි මුදලක් වෙන් කරලා මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් අපි ආරම්භ කළා. ඒ වාගේ ව්‍යාපෘති එකින් එක ක්‍රියාත්මක වෙලා උතුරු පළාත සංවර්ධනය වනකොට නිශ්චිත වශයෙන්ම උතුරේ ආර්ථිකයට දායක වන ක්‍රියාවලියකට අපට එන්න පුළුවන්.

මෙතැනදී මන්ත්‍රීවරයෙක් කියනවා මම අහගෙන හිටියා, එතුමන්ලාගේ ආණ්ඩුවේ හිටපු ජනාධිපතිතුමා හොඳට රට හැදුවා කියලා. එහෙම රට හදනකොට තිබුණු ආර්ථික වර්ධන වේගය ගැනත් එතුමා කිව්වා. මේ වාගේ විවාද කරන මොහොතකදී එතුමන්ලා කිව්වා මට මතකයි, ඒ සංවර්ධනය කොහොමද අත්පත් වුණේ කියලා. ලෝකයෙන් දැවැන්ත ණයක් අරන්, ඒ ණයවලින් මාර්ග ව්‍යාපෘති හදලා, මහ පාරේ ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනකොට ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සියයට 30කට ආසන්න ප්‍රමාණයක ආර්ථික වර්ධන වේගයක් තිබෙන බව පෙන්වුවා. එතුමන්ලා ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ තමයි ආර්ථික වර්ධන වේගය වැඩියෙන්ම පෙන්වූයේ. හැබැයි මම දැක්කා කියනවා, අපි ඒකෙන් තමයි ලූ ආර්ථික ප්‍රතිලාභ අත්පත් කර ගන්නේ කියලා. ඒ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රතිලාභ අත්පත් කර ගන්න අපට තව අවුරුදු ගණනාවක් යයි. මොකද, අපට ණය කන්දරාවක් ගෙවන්න තිබෙනවා. පසුගිය අවුරුද්දේ ඩොලර් බිලියන 5.1ක විතර ණය අපට ගෙවන්න වුණා. මේ අවුරුද්දේත් ගෙවන්න ඕනෑ. ඒ ණය ගෙවන ගමන් තමයි අපි ජනතාවට ප්‍රතිලාභ ලබා දෙන්නේ. අපේ ගරු නලින් හේවගේ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ, මේ සමාජයේ ප්‍රතිලාභ අවශ්‍ය කුමන ක්ෂේත්‍රවලටද, කුමන පුද්ගලයන්ටද කියලා සොයා බලා ඒ හැම කෙනෙකුටම ප්‍රතිලාභ ලැබෙන විධියට රටේ ආර්ථිකය අපි ස්ථාවර කරලා තිබෙනවා. ඒ අනුව තමයි අපි මහපොළ ශිෂ්‍යාධාර මුදල ඇතුළු ශිෂ්‍යාධාර මුදල් වැඩි කළේ, ළමයින් වෙනුවෙන් ලබා දෙන අනෙකුත් දීමනා වැඩි කළේ සහ රජයේ සේවකයින්ගේ වැටුපත්, විශ්‍රාම වැටුපත් වැඩි කළේ. ඒ හැම කෙනාටම ලැබෙන ප්‍රතිලාභ ඉහළ මට්ටමින් අපි වැඩි කළා. ඒ අනුව 2027 වසර වනකොට සමහර රාජ්‍ය සේවකයින්ට සියයට 60කින් විතර වැටුප් වැඩි වනවා. ඒ ඔක්කෝම වැඩි කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ, අපි රටේ ආර්ථිකය ස්ථාවර කිරීම නිසායි.

ඒ අනුව අපි 2026 වසරට මුහුණ දෙන්නේ කොහොමද? 2025 වසරේදී "දිට්වා" සුළි කුණාටුවෙන් ඇති වුණු පීඩාව ආවරණය කරන ගමන්, මැද පෙරදිග යුද්ධයත් එක්ක අද ඇති වෙලා තිබෙන බලශක්ති අර්බුදය ඇතුළේ මුහුණ දෙන ප්‍රශ්නවලට උත්තර හොයමින්, ඒවා මත ගොඩනැඟෙන ආර්ථිකය කඩා වැටෙන්න බලපාන සමහර කාරණා හඳුනාගෙන ඒවාට විකල්ප යෝජනා ඉදිරිපත් කරමින් තමයි අපි මේ ආර්ථිකය ස්ථාවර කරමින් යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ විපක්ෂයේ නඩු වැටෙන, නඩු තිබෙන සහ නඩු වැටෙයි කියලා භයෙන් ඉන්න අය මේ ආණ්ඩුවේ ගමන් මග පිළිබඳව වැරදි චිත්‍ර මවාපානවා. ඒවා සමාජය පිළිගනීවිද, නැද්ද කියලා නැවත අපට හිතන්න පුළුවන්. ඒ නිසා ඒ අයටම සිදු වනවා, මේ සමාජය ඉස්සරහ ඒ කියන කරුණු ඔප්පු කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අජිත් අගලකඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.13]

**ගරු අජිත් අගලකඩ මහතා**
(மாண்புமிகு அஜித் அகலகட)
(The Hon. Ajith Agalakada)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අපි මේ ගරු සභාවේ සංවාදයට ලක් කරලා තිබෙන්නේ, අපේ රජය පාලනය භාර අරගෙන අය වැයක් ඉදිරිපත් කරලා ගත කරපු සම්පූර්ණ වසරකට අදාළව අපේ මධ්‍යම බැංකුව ඉදිරිපත් කළ පළමුවැනි වාර්තාව සමාලෝචනයට ලක් කිරීමයි. මේ වාර්තාවේ ඇති වගු ඇතුළේ, ප්‍රස්තාර ඇතුළේ, වෘත්ත ඇතුළේ, ඉලක්කම්වලින් හා අකුරුවලින් ගොඩක් විස්තර සටහන් වෙලා තිබෙනවා. ඒවා අධ්‍යයනය කරනකොට අපට තේරෙනවා, මේ හැම පරිච්ඡේදයකදීම අපි යම් සාර්ථකත්වයක් ලබා ගත් බවක්. හැබැයි, ඒ ගණන් ඉලක්කම් ඇතුළේ තිබෙන සාර්ථකත්වයට එහා ගිය ගැඹුරු කථාවකුත් මෙහි තිබෙනවා.

අපි සාම්ප්‍රදායිකව මේ රටේ බලය ගත් දේශපාලන ව්‍යාපාරයක් නොවෙයි. අපි, අපේ පවුල්වලින් දේශපාලන බලය අත්පත් කරගෙන ආපු, පරම්පරාවෙන් දේශපාලන වගකීම් භාර ගත් දේශපාලන ව්‍යාපාරයකුත් නොවෙයි. අපි භාර ගන්නකොට මේ රට තිබුණු විධියත්, අපි භාර ගත් වගකීම මත කටයුතු කරමිනුත් තමයි අපි ගිය වසරේදී යම් ප්‍රගතියක් අත් කරගෙන තිබෙනවා නම්, එම ප්‍රගතිය ගැන සමාලෝචනයක් කරන්න වෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ අනුව හිතුවාම අපි මේ රට භාර ගන්නකොට තිබුණේ බිඳ වට්ටපු ආර්ථිකයක්. දීර්ඝ කාලයක් තිස්සේ ආර්ථිකය කඩා වට්ටමින් ඇවිල්ලා, තමන්ගේ ගජ මිතුරන්ට හා හිතවතුන්ට බදු සහන දෙමින්, රජයේ දේපළ පවරා දෙමින්, බිඳ වට්ටවපු ආර්ථිකයක් තමයි අපි භාර ගන්න මොහොත වනකොට මේ රටේ තිබුණේ. ඒ වාගේම වාහන,

[ගරු අජිත් අගලකඩ මහතා]

කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ඇතුළු භාණ්ඩ 2,000කට ආසන්න ප්‍රමාණයක් ආනයනය කිරීම තහනම් කළ තත්ත්වයක් තමයි අපි මේ ආණ්ඩුව භාර ගන්නකොට රටේ තිබුණේ.

දූෂණ සංජානන දර්ශකයේ 121වන ස්ථානයේ තමයි අපේ රට පැවතුණේ. බංකොලොත් කියලා නිල වශයෙන්ම අපේ රට ලෝකය ඉදිරියේ පිළිගෙන තිබුණා. ඒ වාගේම ජාත්‍යන්තර විශ්වාසය බිඳ වැටීම නිසා අපේ පාස්පෝට් එකට, අපේ ණයවර ලිපියකට ලෝකයේ වෙනත් රටවල තැනක් තිබුණේ නැහැ. ඒ වාගේම රටේ ආර්ථිකය ගොඩනහන්න පළපුරුද්දක් ඇති නායකයින් ඒ සඳහා 2048 වසර වනකල් කාලය ඉල්ලපු වකවානුවකයි අපි මේ රටේ පාලනය භාර ගත්තේ. ඒ වාගේම පුළුවන් හැම කෙනෙකුම ඔවුන්ගේ ආර්ථිකය ගොඩනහා ගන්න, සුබවිහරණය සඳහා අපේ රට අත්හැරලා ලෝකයේ වෙනත් රටවලට යන තත්ත්වයක් ඇතුළේ තමයි අපි මේ රට භාර ගත්තේ. එවැනි තත්ත්වයක තිබුණු මේ රට භාර ගත් අපි කොයි වාගේද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විපක්ෂයේ මන්ත්‍රීවරුන් කියන විදියට ගත්තොත්, අපි මීට කලින් පෙට්ටි කඩයක්වත් නොකරපු අය; අත්දැකීම්, දැනුම, පළපුරුද්ද නැති අය; පත් වෙච්ච අපේ මන්ත්‍රීවරුන් අතර - අපි මැතිවරණයට ඉදිරිපත් වන වෙලාවේ අපේ අපේක්ෂකයින් අතර - දක්ෂතා තිබෙන, වගකීම් භාර ගන්න පුළුවන් අය විදියට කවුද ඉන්නේ කියලා ප්‍රශ්න කරපු අය; ඒ වාගේම අපි ජාත්‍යන්තර සබඳතා නැති අය. විපක්ෂය අපට කිව්වේ එහෙමයි. අඩු ගාණේ අපි එක සුද්දෙක්වත් හඳුනන්නේ නැති මිනිස්සු; ඉංග්‍රීසි කථා කරන්න බැරි මිනිස්සු; ඒ වාගේම රාජ්‍ය පාලනයට අලුත් මිනිස්සු; මේ රජය පවත්වාගෙන යන ව්‍යුහය ගැන දැනුමක් නැති මිනිස්සු විදියට තමයි ඔවුන් අපව හැඳින්වූයේ. එම වපසරිය ඇතුළේ තමයි අපි මේ පාලනය 2024 සැප්තැම්බර්වලින් පස්සේ භාරගෙන පවත්වාගෙන ආවේ. 2025 වසරේ අපේම අය වැයක් ඉදිරිපත් කරලා, අපි මේ ජයග්‍රහණ ලබාගෙන තිබෙන්නේ ඒ තත්ත්වයන්, විග්‍රහයන් සියල්ල පරාජයට පත් කරමිනුයි.

අද උදේ ඉඳලා මේ විවාදයට සම්බන්ධ වෙච්ච ආණ්ඩු පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් මේ වාර්තාවේ තිබෙන ඉතාම සාධනීය කරුණු ඉදිරිපත් කළා. ඒවා එකින් එක කියන්න ඕනෑ නැති වුණත් ඉන් එකක් දෙකක් මම මතක් කරන්නම්. රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 16.7ක් බවට පත් කර ගන්න අපට හැකි වුණා. මට මතකයි, මම වාර්තාවක තිබෙනවා දැක්කා, 1990 වසරේ රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 23ක් දක්වා ඇවිල්ලා තිබුණා කියලා. ඒ කාලයේදී ලාභ අලාභ ගැන හිතන්නේ නැතිව ජනතාවට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම්, ප්‍රවාහන පහසුකම්, අධ්‍යාපන පහසුකම් ලෝභ නැතිව දෙන්න පුළුවන්කම තිබුණා, රජයට හොඳ ආදායමක් තිබුණු නිසා. දැන් ඒ තත්ත්වය ක්‍රමානුකූලව වර්ධනය වෙමින් එනවා. අප දන්නවා, ආසියාව පැත්තෙන් ගත්තාම, අපේ රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 24ක් වෙන්න ඕනෑ බව. ඒ ඉලක්කය ඉතා පහසුවෙන් කෙටි කාලයක් ඇතුළත ළඟා කරගන්න පුළුවන් කියන විශ්වාසය අපට තිබෙනවා. අපි දන්න ඉතිහාසය ඇතුළේ පුරෝකථනය කරනවාට වඩා වැඩි අය වැය පරතරයක් තමයි හැම දාම තිබුණේ. එතකොට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6.8ක් වෙච්ච අය වැය පරතරය 2025 වසර ඉවර වනකොට සියයට 2.3කට අඩු කර ගන්න අපට පුළුවන් වුණා. අපි හිතනවා, ඒක කෙටි කාලයක් ඇතුළත පළපුරුද්ද අඩු, අත්දැකීම් අඩු නවකයින් පිරිසක් විදියට අපි ලබා ගත් විශාල ජයග්‍රහණයක් කියලා.

ඊළඟට, ප්‍රාථමික ගිණුමේ ශේෂය බලන්න. ඔබතුමියත් දන්නවා, අපේ රටේ ණය පොලී වාරික ගෙවන එක හැර ඉතිරි වියදම් වෙන්නේ ප්‍රාථමික ගිණුමෙන් කියලා. මේ ගිණුම ශක්තිමත් වෙලා තිබුණොත් තමයි ස්ථාවරව අපට ඉදිරි ක්‍රියාමාර්ග තෝරා ගන්න පුළුවන්කම ලැබෙන්නේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියනවා, අපේ රටේ ප්‍රාථමික ගිණුමේ ශේෂය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3ක අවමයක් පවත්වාගන්න කියලා. නමුත් කියන්න සතුටුයි, අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5.4ක ඉතාම ශක්තිමත් තැනක ප්‍රාථමික ගිණුමේ ශේෂය පවත්වාගන්න. එතැනට අපට මේ ආර්ථිකය ගෙන එන්න පුළුවන්කම ලැබුණා. අපේ ඒකපුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 4,546 ඉඳලා 5,003ට වර්ධනය කර ගන්නත්, ඒ වාගේම අපේ සමස්ත ආර්ථිකයේ වටිනාකම ඇමෙරිකානු ඩොලර් බිලියන 99.6 ඉඳලා 108.8ට වැඩි කර ගන්නත් මේ කාලය ඇතුළත අපට පුළුවන් වෙලා තිබෙනවා.

ඒ වාගේම විදේශ ප්‍රේෂණ බලන්න. මේක වාර්තාවක්. පසුගිය වසරේ තිබුණේ ඩොලර් බිලියන 6.6යි. මේ වසරේ විදේශ ප්‍රේෂණ ඩොලර් බිලියන 8.1 දක්වා වර්ධනය කර ගන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. අපේ රටෙන් එළියේ වැඩ කරන අපේ ජනතාව අපේ රජය ගැන විශ්වාසය තහවුරු කරගෙන තිබෙනවා කියන කාරණය එතැනින් පැහැදිලි වනවා. ඒ වාගේම වැඩිම සංචාරකයින් ප්‍රමාණයක් ආකර්ෂණය කර ගන්න, ආර්ථික වර්ධන වේගය සියයට 5කින් පවත්වාගෙන යන්න ආදී වශයෙන් සියලු අංශවලින් ඉතා හොඳ, ඉහළ වර්ධනයක් පසුගිය වසරේදී අපට අත්පත් කර ගන්න පුළුවන් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපට කලින් ගොඩක් රජයන් මේ රට පාලනය කළ බව අපි දන්නවා. ඒ රජයන් අය වැය ඉදිරිපත් කළා; වාර්ෂික සමාලෝචනත් කළා. හැබැයි, අපි දන්න ඉතිහාසයේ හැමදාම පුරෝකථනය කළාට වඩා අය වැය පරතරය වැඩි වුණා. පුරෝකථනය කළා, අය වැය හිඟය පියවා ගන්න අපි යම්කිසි ණය ප්‍රමාණයක් ගන්න ඕනෑ කියලා. නමුත්, ඊට වඩා වැඩි ණය ප්‍රමාණයක් ගන්න සිද්ධ වුණා. මුදල් අච්චු ගහන්න වුණා. එතකොට අය වැයෙන් ඉලක්ක කරපු ප්‍රමාණය ඒගොල්ලන්ට වියදම් කර ගන්න බැරි වුණා. පළපුරුද්ද, අත්දැකීම් සියල්ල සහිත අයට කර ගන්න බැරි වුණු වැඩේ අවුරුද්දකුත් මාස 4ක වාගේ අත්දැකීම් තිබෙන අපේ කණ්ඩායම විසින් සිදු කරලා මේ ජයග්‍රහණය ලැබුවේ කොහොමද? අපි එතැනට මේ තරම් ඉක්මනින් පත් වුණේ කොහොමද? රටේ ජනතාව මේ ආණ්ඩුව මේ වැඩේ ගොඩ දමනවා කියන විශ්වාසය තහවුරු කර ගන්න තැනට පත් කර ගත්තේ කොහොමද? ඒක ඉතා විශ්මිත දෙයක්. ඒ තමයි, අපේ දේශපාලන ව්‍යාපාරයටම ආවේණික වූ, අපට තිබෙන අපේ සංවිධානාත්මක බවේ, කැප කිරීමේ, ජනතාවට අසීමිතව ප්‍රේම කිරීමේ, තනි තනිව තීන්දු ගන්නේ නැතිව සාමූහිකව තීන්දු ගැනීමේ ප්‍රතිඵලය. අපට තනි තනි අරමුණු නැහැ, සාමූහික අරමුණු තිබෙන්නේ. මීට කලින් පත් වුණු රජයන්වලදී එක් එක් ඇමතිවරයා හෝ මන්ත්‍රීවරයා, ආණ්ඩුවේ නම් අගමැතිතුමිය, නැත්නම් විධායක ජනාධිපතිතුමා තනි තනිව හම්බ වෙලා තමයි දිස්ත්‍රික්කයට එක එක ප්‍රතිපාදන වෙන් කරගෙන දිස්ත්‍රික්කයේ සේවාවන් සැපයුවේ කියන එක අපි දන්නවා. නමුත්, අපි එහෙම නොවෙයි. පොදුවේ මේ ප්‍රශ්නය ගන්නවා. අවශ්‍යතාව අනුව ලැබිය යුතු පරිදි දිස්ත්‍රික්ක සියල්ලටම සාධාරණ පිළිවෙළට බෙදී යන විදියට පොදු තීන්දු අරගෙන, එකමුතුව, එක හඬින් වැඩ කරපු නිසා තමයි අපට මේ තත්ත්වය ලබා ගන්න පුළුවන්කම ලැබුණේ. ඒ වාගේම පවතින තත්ත්වයන් නිවැරදිව විග්‍රහ කරගෙන, හැම විටම එකතු වෙලා සාමූහිකව කථා කරමින්, සියලු තොරතුරු විශ්ලේෂණය කර ගනිමින් අපි මේ ගමන ඉදිරියටත් යමින් ඉන්නවා. අපට විශ්වාසයි, 2025දී අපි ලබා ගත් මේ ජයග්‍රහණ ප්‍රමාණය අඛණ්ඩව ඉදිරියට අරගෙන ගිහිල්ලා, අපේ රටේ ජනතාවට අපි දී තිබෙන පොරොන්දුව වන පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් ඉතා කෙටි කාලයකින් ගොඩ නඟන්න පුළුවන්

වෙයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට කථා කරන්න කාලය ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.22]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය මූලාසනයේ ඉන්න අවස්ථාවේදී මට කථා කිරීමට අවස්ථාව ලබා දීම මම අගය කරනවා. 2025 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබෙන, ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ආර්ථික සමාලෝචන වාර්තාව ගැන අද දවසේ අපි කථා කරනවා. මේ දත්ත තුළින් ලබා තිබෙන්නේ මොනවාද, ඒ කියපු දේවල් අද වනකොට සාක්ෂාත් වෙලා තිබෙනවාද, 2028දී ණය ගෙවනකොට කොයි වාගේ ශක්තිමත් ආර්ථිකයක් තිබේවිද, ලෝකයත් එක්ක අපි එය තරණය කරගෙන යන්නේ කොහොමද කියන එකයි අපට දැනගන්න අවශ්‍ය වන්නේ.

අපේ රට ගැන කථා කිරීමට පෙර මම කැමතියි, ඉන්දියාවේ මෝදි අගමැතිතුමා මීට දවස් හයහතකට ඉස්සෙල්ලා කථා කරපු දෙයක් මූලාශ්‍රයක් කර ගන්න. එතුමා ඒ අවස්ථාවේදී US Dollars 740 billion විතර සංචිතයක් - reserve එකක් - තියාගෙන හිතුවේ නැහැ, අපි මීට වැඩිය අවනත වෙන්න අවශ්‍යයි, ආරක්ෂා කිරීම සහ කටයුතු කිරීම අවශ්‍යයි කියන එක සම්බන්ධව. තෙල් මිල වැඩි කරනවා, ගෙදර ඉඳන් වැඩ කරන්න ඕනෑ, ඉන්දියාවේ සංචාරකයින්ට එහේ මෙහේ යන්න එපා කියලා යම් ඉදිරි දැක්මක් සහිතව එතුමා කටයුතු කළා.

එතුමා වාගේම තමයි, සිංගප්පූරුවේ අගමැති ලෝරන්ස් වොංග් මැතිතුමා. එතුමා අවුරුදු ගණනාවකට සැරයක් Economic Strategy Review එකක් කරනවා. පසුගිය සුමානයේ ඒ ගැන සමාලෝචනය කරලා, ඉතාම අමාරු ආර්ථික තත්ත්වයක් තිබෙනවා, සිංගප්පූරුව වශයෙන් ඒ තත්ත්වයට මුහුණ දෙන්නේ කොහොමද කියන එක එතුමා පෙන්වා දුන්නා.

ඊට අසල්වැසි රට වන මලයාසියාවේ අගමැති අන්වර් ඊබ්‍රාහිම් මහතා ඒ ආකාරයෙන්ම, මේ වාගේ අමාරු තත්ත්වයකදී කොහොමද කටයුතු කරන්න ඕනෑ වන්නේ කියන එක පෙන්වා දුන්නා. ඒ හැම අවස්ථාවේදීම අපි බලන්න අවශ්‍ය වන්නේ රටේ ජනතාවට දුන් පොරොන්දු ක්‍රියාත්මක කරගෙන ඒ අමාරු ගමන ඉදිරියට ගෙන යන්න පුළුවන් වන්නේ කොහොමද කියන එකයි.

අපේ රටේ නොයෙක්, නොයෙක් පොරොන්දු දීලා තිබෙනවා. මූලික වශයෙන් එක කාරණයක් මම කියන්න අවශ්‍යයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පොහොසත් අය පොහොසත් වෙන එක ප්‍රශ්නයක් නැති වුණත්, දුප්පත් අය මීට වැඩිය දුප්පත් වෙන්න එපා කියන ඒ වැදගත් කීම රට තුළ සිද්ධ වෙලා තිබෙනවාද, නැද්ද කියන එක තමයි අපට අහන්න තිබෙන්නේ. මගේ කථාව පටන් ගන්න අවස්ථාවේදීම මම කියනවා, බඩගින්නේ ඉන්න මිනිසුන්ට බදු ගහන්න එපා, ඒ වාගේම ජීවිතය ඉල්ලා ඒ වෙනුවෙන් යදින අයට බදු ගහන්න එපා කියලා. ඒ මූලික ඉල්ලීම කරමින් තමයි මම කොයි ආකාරයෙන්ද අපි ඉදිරියට කටයුතු කරන්න අවශ්‍ය වන්නේ කියන කාරණයට ප්‍රවේශ වන්නේ.

මම මේක කොටස් තුනකට ගත්තා. එකක් තමයි, අද වනකොට cyber attacks සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන ප්‍රශ්නය. අනෙක් එක තමයි, තිබෙන දත්ත ටික. ඊළඟ එක තමයි, කොයි ආකාරයෙන්ද අපි ඉදිරියට කටයුතු කරගෙන යන්න තිබෙන්නේ කියන එක.

මේ කථා කරන මොහොත වනවිට අපි සියලුදෙනාම දන්නවා, බැංකු පද්ධතියට ලොකු ප්‍රහාරයක් එල්ල වෙලා තිබෙන බව. මේ ප්‍රහාරය ඇති වෙලා තිබෙන්නේ පිටස්තරව. NDB බැංකුවේ රුපියල් මිලියන 13,200ක මූල්‍ය වංචාවක් සිදු වෙලා තිබෙනවා. මේක කොයි ආකාරයෙන්ද වෙලා තිබෙන්නේ කියන එක ගැන සොයා බලන්න වෙනවා. නමුත් මේ දූෂණය ඇති වෙලා තිබෙන්නේ අභ්‍යන්තරව තමුන්නාන්සේලාගේ general ledger එකට ප්‍රශ්නයක් ඇති කරගෙන තිබෙන නිසායි.

"අස්වැසුම" ප්‍රතිලාභ ගෙවීමේදී රුපියල් මිලියන 248ක වංචාවක්, මහජන බැංකුවේ රුපියල් මිලියන 656ක වංචාවක්, Immigration and Emigration Department එකේ රුපියල් මිලියන 9.83ක වංචාවක්, Sri Lanka Insurance එකේ රුපියල් මිලියන 6,000ක වංචාවක්, SriLankan Airlines එකෙන් ඩුබායි වෙත කළ ගෙවීමකදී රුපියල් මිලියන 80ක වංචාවක්, ශ්‍රීලන්කන් ගුවන් සේවයේ වෙන්නායි කාර්යාලයේ සිදුව තිබෙන රුපියල් මිලියන 110ක වංචාවක්, මුදල් අමාත්‍යාංශයේ ඩොලර් මිලියන 2.5ක වංචාවක්, US Postal Service එක වෙත මුදල් ගෙවීමේදී ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 6ක වංචාවක් සිදු වෙලා තිබෙනවා. අද ඒ ඇමතිතුමා හෙළිදරව් කළා, RDA එකේ වංචාව මොන වාගේ එකක්ද කියන එක. ඒකත් පිටස්තර ප්‍රශ්නයක් නිසා ඇති වෙලා තිබෙනවා කියන එක තමයි කියන්නේ. ප්‍රංශ ආණ්ඩුවට ගෙවන්න තිබෙන ණය ප්‍රමාණය පිළිබඳවත් අදාළ විෂය භාර ඇමතිවරයා හෙළිදරව් කළා.

2025 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ආර්ථික සමාලෝචන වාර්තාව තුළ ඉදිරිපත් කරලා තිබෙනවා, සංචාරක කර්මාන්තය බොහොම හොඳට ඉදිරියට ගිහිල්ලා තිබෙන බවත්, පිට රට වැඩ කරන කට්ටිය ලංකාවට එවා තිබෙන ප්‍රේෂණ ඇමෙරිකානු ඩොලර් බිලියන 8.1ක වාර්තාගත අගයක් ගෙන තිබෙන බවත්, primary surplus එකක් තිබෙන බවත්, අපේ ආදායමෙහි සියයට 14ක වර්ධනයක් වෙලා තිබෙන බවත්. ඒ කියන්නේ, රුපියල් බිලියන 5,300ක් දක්වා සමස්ත ආදායම වැඩි වෙලා තිබෙනවා. GDP per capita එක ඇමෙරිකානු ඩොලර් 5,003ක් බවත් සඳහන් වෙනවා. ඒ වාගේම මහ බැංකුව තුළ සල්ලි අච්චු ගහන්නේ නැහැ කියන එක ගැන කථා වෙනවා. එමෙන්ම, විරැකියාව අඩු වෙලා තිබෙන බවත්, අපේ පිට රට සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 6.6ක් බවත්, 2024දී ආර්ථික වර්ධන වේගය සියයට 5ක් බවත්, 2025දී ආර්ථික වර්ධන වේගය සියයට 5ක් බවත්, මහ බැංකුව රුපියල් බිලියන 193ක ලාභයක් ලබා තිබෙන බවත් සඳහන් වෙනවා.

ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, මහ බැංකුව ඇතුළේ රුපියල් බිලියන 193ක ලාභයක් ලබා තිබෙනවා නම් ඒකෙන් ඔබතුමන්ලාගේ ආණ්ඩුවට කීයක් ලැබිලා තිබෙනවාද කියන ප්‍රශ්නය තමයි අහන්න තිබෙන්නේ. මම මේ කරුණු කිව්වේ මෙම වාර්තාවේ පසුබිම් කරුණු පාදක කරගෙනයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, අපි මහ බැංකු වාර්තාව අරගෙන ඉදිරිපත් කළාට මහ බැංකුව මතක් වෙනකොට ඔබතුමාට මොකුත් කථා කරන්න බැරි වෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

දැන් එතුමා කියන නිසා මගේ tuition class එක එහෙනම් පොඩ්ඩක් වෙනස් කරන්නම්. මොකද, එතුමාට ඒක ගැන දැනුවත් කරන්න පුළුවන්. "The Sri Lankan Economy is performing well, the reform commitment is strong....." කියලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ Communication Department Director Julie Kozack කියනවා. දැන් මේ දහලන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 700ක් ලබා ගන්න. Tranches දෙකයි. පස්වැනි සමාලෝචනය අනුව ඇමෙරිකානු ඩොලර් මිලියන 350යි, හයවැනි සමාලෝචනය අනුව ඇමෙරිකානු ඩොලර් මිලියන 350යි. දෙකම එකතු කළාම ඇමෙරිකානු ඩොලර් මිලියන 700යි. ඒකට ඔබතුමන්ලාගේ ආණ්ඩුවට මොනවාද කරන්න තිබෙන්නේ? පෙට්‍රල් මිල වැඩි කරන්න තිබෙනවා; විදුලි බිල වැඩි කරන්න තිබෙනවා; රුපියල අවප්‍රමාණය කරන්න තිබෙනවා. ඒ වාගේම තමයි තව දවස් 6, 7ක් යනකොට interest rates වැඩි කරන්නත් පටන් ගන්නවා. මේ ඔක්කෝම කරන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 350ක් වන එක tranche එකක් ගන්න. එහි වටිනාකම රුපියල්වලින් ගත්තොත්, බිලියන 121යි. මම ඒක සන්සන්දනය කළේ මේ නිසායි. මේ වාරිකය ගන්නකොට රුපියල අවප්‍රමාණය වෙලා තිබෙන අගය ගත්තොත්, ඩොලරයේ අගය රුපියල් 293 ඉඳන් මේ කථා කරන මොහොත වනවිට රුපියල් 347 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ තත්ත්වයට ගියාම රුපියල අවප්‍රමාණය වීමේ තොග ණය වෙනස රුපියල් මිලියන 2,100ක්; ඒ කියන්නේ රුපියල් ට්‍රිලියන 2.1ක් වෙනවා. ඒ කියන්නේ, තමාගේ සම්පූර්ණ විදේශ විනිමය ඩොලර් බිලියන 38ක් තිබෙන වෙලාවේ ඒක වැඩි කරනවා, රුපියල් 54කින්. එය රුපියල් 54න් වැඩි කළාම ඒක රුපියල් ට්‍රිලියන 2.1ක් වෙනවා. විදේශීය වශයෙන් ගත්තාම, ඒකේ carrying cost එක සියයට 8යි. දේශීය වශයෙන් ගත්තොත් සියයට 11යි. මම අඩු ප්‍රමාණය සැලකිල්ලට ගත්තා. මොකද, ඔබතුමන්ලාට එහි යම් විධියක අනවශ්‍ය, නරක තැනක් පෙන්වන්න ඕනෑ නැහැ. එතකොට ඒකට රුපියල් බිලියන 168ක් යනවා. පොතුහැර ඉඳන් දඹුල්ලට යන පාර හදන්න වැය වෙන්නේ රුපියල් බිලියන 122යි. මේක නිකම් අවප්‍රමාණය වෙලා ඒකට රුපියල් බිලියන 168ක් යනවා. ඔන්න මේකේ තිබෙන ප්‍රශ්නය. ඔබතුමන්ලා ඇමෙරිකානු ඩොලර් මිලියන 350ක් ගන්න කොතරම් නැටුවත් අන්තිමට රුපියල් බිලියන 121ක් ලබා ගන්න රුපියල් බිලියන 168ක් තමන්ගේ වැයට දානවා. මෙන්න මේක තමයි තිබෙන අපරාධය. මේක බලලා මහ බැංකු අධිපති කියනවා, අපේ තොග ණය සම්බන්ධයෙන් ගත්තොත් දේශීය වශයෙන් කිසිම ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ කියලා. මෙන්න මේක තමයි ඇති වෙලා තිබෙන ප්‍රශ්නය.

ඒ වාගේම පිට රටවල කට්ටිය හුහක් ලංකාවට ඇවිල්ලා ගිහිල්ලා තිබෙනවා. "Sri Lanka's trade, export and FDI push lack ambition and urgency, warns think tank" මෙන්න මේක තමයි ඒ පිට රට කට්ටිය ඇවිල්ලා කියලා තිබෙන්නේ. ලංකාවේ Japanese Ambassador කියනවා, "Kindly walk the talk, not talk the talk " කියලා. මම හිතන විධියට, එදා ඉඳන් ලංකාවට මේ ප්‍රශ්නය තිබෙනවා. මේකේ සංකල්පමය වශයෙන් වෙනසක් ඇති කරන්න අවශ්‍යයි.

ඉරාන යුද්ධය පටන් ගත්තේ පසුගිය පෙබරවාරි 28වැනි දා. මාර්තු 07වැනි දා මහ බැංකුවේ මූල්‍ය අංශය - මුදල් අමාත්‍යාංශයේ කොටස් දෙකක් තිබෙනවා. මූල්‍ය අංශය අයත් වන්නේ මහ බැංකුවට; fiscal policy අංශය අයත් වන්නේ මුදල් අමාත්‍යාංශයට - කියා තිබෙනවා, "Sri Lanka is in a good position and can absorb any oil shocks. We have enough reserves not to get our forward march upset" යනුවෙන්. මෙන්න මෙහෙම කියා තමයි ඊට පසුව මෙහෙම උත්තර දෙන්නේ. මීට සුමානයකට පමණ කලින් කිව්වා, සියයට පහකට ආසන්න ආර්ථික වර්ධනයක් ලබා ගැනීමේදී ප්‍රශ්නයක් ඇති වෙනවා, ඒ නිසා මේක කරන්න අමාරු වෙනවා කියලා. අද එහෙම කියන්නේ එදා කිසි ප්‍රශ්නයක් නැහැ කියපු අයයි. මම මේ පදනමක් සහිතව කියන්න හදන්නේ. යුද්ධයක් ඇති වුණාම ඒක ජෙනරාල්වරුන්ටම විතරක් භාර දීලා හරියන්නේ නැහැ. එතැනින් ඉදිරියට ගමන් කරන්න අවශ්‍යයි.

මීට පෙර කථා කළ මන්ත්‍රීතුමන්ලා පෙන්වපු ආකාරයට මේ වාර්තාවේ තිබෙන දේවල්මද, අද ජන ජීවිතය තුළ සාක්ෂාත් කර ගෙන තිබෙන්නේ? අපි බැලුවොත් අද වනවිට තිබෙන සම්පූර්ණ ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 34.2ක් වෙනවා. 2024 සැප්තැම්බර් මාසය වනවිට රුපියල් ට්‍රිලියන 28.3ක්ව තිබුණු, US Dollars 92.8 billionක්ව තිබුණු ණය ප්‍රමාණය අද US Dollars 107 billionවලට වැඩි වෙලා; රුපියල් ට්‍රිලියන 34.2ක් වෙලා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

Reference එක මොකක්ද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Reference එක Complete outstanding - *[බාධා කිරීමක්]* This is from the Public Debt Management Office of your Finance Ministry. *[බාධා කිරීමක්]* හරි. ඒ රුපියල් ට්‍රිලියන 32ට රුපියල් ට්‍රිලියන 2.1 එකතු කළාම, ට්‍රිලියන 34.2 වෙනවා. මම අද මෙතැනට එන්න ඉස්සෙල්ලා ඔබතුමාගේ මුදල් අමාත්‍යාංශයේ ඒ අදාළ අයට කථා කරලා තමයි ආවේ. මම සාමාන්‍යයෙන් මෙතැන නිකරුණේ නිර්මාණශීලී ගණිතයක් ඉදිරිපත් කරන්නේ නැහැ. මොකද, ඒකෙන් කිසි වාසියක් ලැබෙන්නේ නැහැ. ඊළඟට, මම කිව්වා වාගේ debt stock එක ඩොලර් බිලියන 168ක් තිබුණා. ඒ ප්‍රමාණයෙන් මහවැලි ව්‍යාපාර දෙකක් කරන්න තිබුණා. බිමල් ඇමතිතුමාගේ අමාත්‍යාංශයට අදාළව පොතුහැර-ගලගෙදර මාර්ගය හදන්න තිබුණා. නැත්නම් විදුලි බිල අද සියයට 35කින් අඩු කරන්න තිබුණා. ලක්ෂ 25ක් වටිනා ගෙවල් 85,000ක් හදන්න තිබුණා. ඒ වාගේම SME sector එකේ ලක්ෂ තුනකට විතර ලක්ෂ පහ ගණනේ ණයක් දෙන්න තිබුණා. මේ ඔක්කෝම අවප්‍රමාණය වීම තුළින් විතරක් නැති වෙලා තිබෙන තත්ත්වයක් තමයි තිබෙන්නේ.

ඒ වාගේම අපි මේ අවස්ථාවේදී බැලිය යුතු තව කාරණයක් තමයි GDP per capita එක. එය ඩොලර් 5,003යි කියලා මේ වාර්තාවේ තිබෙනවා. එය ඩොලර් 5,003ට තිබුණේ ඩොලරයේ අගය 302ට තිබියදී. අද වනවිට එහි වටිනාකම 347යි. US Dollars 5,003ක් කියපු ඒකපුද්ගල ආදායම අද ඩොලර් 4,497ට අඩු වෙලා තිබෙනවා. මේ සුමාන දෙක තුන තුළ, මේ වාර්තාව ඉදිරිපත් කළ කාල වකවානුවේ 5,003යි කියපු ඒකපුද්ගල ආදායම අපි මේ විවාදය කරන අවස්ථාව වනවිට 4,497ට අඩු වෙලා තිබෙනවා. ඒ වාගේ තමයි මම මීට පෙර කිව්වා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගියාට ප්‍රශ්නයක් නැහැ කියලා. නමුත් ඒ සුද්දන් කියන විධියට නටන්න අවශ්‍ය නැහැ. මේක දේශීය වශයෙන් ගන්න අවශ්‍යයි. අපි අනිවාර්යයෙන්ම මුදල් වැඩි කරන්න ඕනෑ. වියදම් වැඩි කරන්න ඕනෑ. වියදම අඩු කරන එක විතරක් නොවෙයි, තිබෙන්නේ. වියදම් කරන්න අවශ්‍යයි. දැන් මේ කටයුතු සිදු කරන්නේ Public Financial Management Act එක යටතේ. ඒ අනුව වියදම් සියයට 13ට සීමා වෙලා තිබෙනවා. නමුත් එන අවුරුද්දේ ආදායම වර්ධනය වන්නේ මේ අවුරුද්දේ වියදම් කළොත් විතරයි.

අද වනවිට tax files තිබෙන්නේ ලක්ෂ 14යි, අනිල් ඇමතිතුමා. ඒ ලක්ෂ 14න්, ලක්ෂ 12ක් පෞද්ගලික අංශයේ. 134,000ක් තිබෙන්නේ corporate companiesවල files. අද වනවිට කොම්පැනි 256,000ක් තිබුණත්, එයින් 134,000කට විතරයි tax files තිබෙන්නේ. අපේ workforce එකේ, ඒ කියන්නේ ශ්‍රම බලකාය තුළ ලක්ෂ 84ක් සිටිනවා. 540,000යි, PAYE Tax ගෙවන්නේ. ඇයි? Taxes සියයට 30ක්, 45ක් කොම්පැනිවලින් ගෙවනවා. PAYE Tax එකට සියයට 36ක් ගෙවනවා. ඒ වාගේම කථා කළත්, නැතත් රජයට සියයට 33ක් බදු ගෙවනවා. සියයට එකක VAT එකෙන් බිලියන 80ක් ලබා ගන්නකොට, SSCL එකෙන් ප්‍රතිශතයක් වශයෙන් බිලියන 125ක් ලබා ගන්නවා.

මම මේ ඔක්කෝම ඉදිරිපත් කළේ එක කරුණක් කියන්නයි. බලන්න, රුපියල පාවෙන විධිය. මම මේ උපුටා ගන්නේ මීට සුමානයකට ඉස්සෙල්ලා දෙදෙනෙක් කථා කළ දෙයක්. මම හිතන විධියට නිරෝෂන් පාදුක්ක මැතිතුමා වාර්තා කරපු කාරණය සම්බන්ධව මම මේ ආණ්ඩුවෙන් කාරුණිකව අහනවා. අනිල් ජයන්ත ඇමතිතුමා, LCs 4,000ක් විවෘත කර තිබෙනවාද කියන එක කරුණාකර බලන්න. මොකද, ඔබතුමන්ලා දැනුවත් කළා අධිභාරයක් දමන බවට. අධිභාරයක් දමා තිබෙනවා නම් 650,000ක් ඉතුරු වෙනවා කියලා ඔබතුමාම කිව්වා. ඒක හරි. ඒ, ඔබතුමන්ලා ගෙනියන ආකාරය. හැබැයි, මම ඒකට සංශෝධනයක් ඉදිරිපත් කළා. ඒක US Dollarsවලින් තිබුණා නම් වඩාත් හොඳයි. හැබැයි, ඒක වෙනත් මතයක්. මේ LCs 4,000න්, 3,500ක් NTB එකෙන් විවෘත කළා කියා ඒ අය කියන එක ගැන තමයි මම සඳහන් කරන්නේ. කරුණාකර මේ ගැන බලා කටයුතු කරන්න. ඒ වාගේ දවස් දෙකකට ඉස්සර වෙලා විවෘත කර තිබෙනවා නම්, insider trading තිබෙනවා. කරුණාකරලා ඒ වාසිය තමන්ගේ ආණ්ඩුවට ගන්න. මොකද, ඒක කාටවත් දෙන්න එපා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා කියන,-

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු සභානායකතුමනි, මම කථා කරන්නේ බිලියන 4ක ප්‍රශ්නයක් ගැන. ඒ නිසා කරුණාකරලා මේ සම්බන්ධව බලලා, ඒකේ වාසිය ආණ්ඩුව ගන්න ඕනෑ.

ඒ වාගේම ජූනි මාසයේ mutual evaluation එකට එනවා. මේ අවස්ථාවේදී බලන්න ඕනෑ normalද, greyද, blackද කියන එක නොවෙයි. කරුණාකරලා රටට ඕනෑ කරන ඩොලර් ටික ගෙන්වා ගන්න. ඉස්සෙල්ලා අපේ සංචිත ටික හදා ගන්න. ඒක මුල් කරගෙන කථා කරන්න. මේ කථා කරන මොහොතේ එක පැත්තකින් රුපියල අවප්‍රමාණය වෙනකොට, අනෙක් පැත්තෙන් මහ බැංකුව ස්වාධීනත්වය තියා ගෙන ඔබතුමන්ලාට අනිවාර්යයෙන්ම පොලී අනුපාතය වැඩි කරනවා. ඊට පස්සේ ප්‍රතිශතය වැඩි වෙනකොට බිලියන 170ක් අපේ වියදමට වැඩි වෙනවා. එතකොට අනවශ්‍ය ලෙස ප්‍රශ්නයක් ඇති වෙනවා කියන එක තමයි මේ අවස්ථාවේදී මතක් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජනාධිපතිතුමා කියලා තිබෙනවා තෙල් මිල වැඩි කරන්න අවශ්‍යයි කියලා. එක පැත්තකින් එහෙම කියනවා වාගේම, අනෙක් පැත්තෙන් සිනොපෙක්ලා වැඩි කරලා ඉවරයි. ඒක තමයි කළ යුතු දේ, මෙතැන සද්ද කරන්නේ නැතිව - CPC එකේ අඩු වුණාට ප්‍රශ්නයක් නැහැ - අර පැත්තෙන් කරගෙන යන එක. නමුත්, ඒක නොකිරීම තුළ වෙනත් ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ නිසා රුපියල අවප්‍රමාණය වීම සහ පොලී අනුපාතය වැඩි වීම යන දෙකම බලපානවා ශක්තිමත් ආර්ථිකයක් හදා ගෙන ඉදිරියට යනකොට.

මම කියන අනෙක් කාරණය තමයි, cybercrimes. Colombo Port City එකේ වීසා ක්‍රමය පාවිච්චි කරලා අනවශ්‍ය ලෙස ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මෙය නිවැරදි කරන්න අවශ්‍යයි. මම ඊයේ ඇහුවේ කොයි ආකාරයෙන්ද මේක හදා ගන්නේ කියන එකයි.

ඒ වාගේම මහ බැංකුවේ මූල්‍ය අංශය; මේ තිබෙන බැංකු පද්ධතිය සම්බන්ධයෙන් මම ඉතාම පෞද්ගලිකව ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. මොකද, මේ මූල්‍ය අංශයත් එක්ක සෙල්ලම් කරන්න එපා. මහ බැංකුවේ ප්‍රශ්නයක් ඇති වුණොත් ඒක ප්‍රශ්නයක් නැහැ. නමුත්, බැංකු ක්ෂේත්‍රයේ ප්‍රශ්නයක් ඇති වුණොත් ඒක ප්‍රශ්නයක් වෙනවා. දැනට එවැනි ප්‍රශ්නයක් මේ බැංකු ක්ෂේත්‍රයේ ඇති වෙලා නැහැ; ප්‍රසිද්ධ වෙලා නැහැ. නමුත්, බැංකු තුනක ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. NDB බැංකුවේ ප්‍රශ්නය හෙළිදරව් කරලා තිබෙනවා. ඒ සම්බන්ධව නිසි ආකාරයක උත්තරයක් ලබා දීලා නැහැ. Bank supervision සම්පූර්ණයෙන්ම කඩා වැටිලා තිබෙනවා. ඒ ප්‍රශ්නය නිවැරදි කරන්න අවශ්‍යයි. මේ අවස්ථාවේදී නුවර බැංකුවක - ලොකු බැංකු තුනකින් එකක් - ආයෙත් වාර්තා කරලා තිබෙනවා වංචාවක් ඇති වෙලා තිබෙනවා කියලා. කොමර්ෂල් බැංකුවක් - නම "Commercial Bank" නොවෙයි - තුළ නැවත ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා, වාර්තා කරන්න ගිහිල්ලා. නුවර සිදුවීම වාර්තා කිරීම නවත්වලා තිබෙනවා.

ඒ වාගේම මීගමුවේ කොමර්ෂල් බැංකුවක කාරණය cyber security manager ගිහිල්ලා උසාවියේ වාර්තා කරලා තිබෙනවා. Advertising company එක මේක එළියට යන්න නොදී, ප්‍රසිද්ධ වෙන්න නොදී සල්ලි දීලා නවත්වලා තිබෙනවා. නමුත්, three brave investigative media personnel were unable to be silenced. “Harideshaya”, “Sri Lanka Mirror” සහ “The Leader” කියන වෙබ් අඩවි. මම හිතන්නේ මේක කියන්න අවශ්‍ය වන්නේ, බැංකු ක්ෂේත්‍රයේ සිදු වන වංචා ටික නවත්වන්න. සාමාන්‍ය advertising කරන එක නවත්වලා තිබෙනවා. ඔබතුමන්ලා මේ බැංකු ක්ෂේත්‍රයේ තිබෙන ප්‍රශ්නය බලන්න. ගරු අනිල් ජයන්ත මැතිතුමනි, ඔබතුමාට යම් විධියකින් ප්‍රායෝගික lecturing knowledge එක තිබෙන නිසා බලන්න මේ වෙන එක. එකපාරට ප්‍රශ්නයක් ඇති වුණොත් ඒක බලපාන්නේ ආණ්ඩුවට මිසක් මහ බැංකුවට නොවෙයි. මේ ගැන කරුණාකරලා බලා ඒ සම්බන්ධව ක්‍රියාත්මක වෙන්න.

ඒ වාගේම Financial Institution Restructuring Agency - FIRA - එකට අදාළ බිලියන 1.4ක් - මිලියන 1,400ක් - අද බොල් ණය වශයෙන් තිබෙනවා. මේ බොල් ණය නිසා බැංකුවලට ණය මවන්න බැහැ. මේ ණය මවන්න බැරි නිසා පෞද්ගලික අංශය හා රජයට ගන්න පුළුවන් සල්ලි අනවශ්‍ය ලෙස බැංකු තුළ හිරවෙලා තිබෙනවා. මේවා නිවැරදි කරන්න. 2015දී අපි අය වැයේදී මේ සඳහා වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළා. අපිට වෙලාව තිබුණේ නැහැ, ඒක ක්‍රියාත්මක කරන්න. ඊට පස්සේ ඇද ඇද ගිහිල්ලා තිබෙනවා. මම කාරුණිකව ඉල්ලා සිටින්නේ, මේ FIRA එක බලලා "bad bank" එකක් ඇති කරලා මේ සඳහා විකල්පයක් හොයා ගන්න කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාවේදී මට මතක් වෙන්නේ මේකයි. මේ ආණ්ඩුවේ කිසිම වංචාවක් නැහැ. නමුත්, හොරකමක් තිබෙනවා කියලා කථා කරනවා. අනෙක් පැත්තෙන්, ආයතන විකුණන්නේ නැහැ. නමුත්, පෞද්ගලික අංශයට ලබා දීලා ප්‍රතිව්‍යුහගත කිරීමක් කරලා තිබෙනවා. මේ ආණ්ඩුව විදේශ

[ගරු රවී කරුණානායක මහතා]

රටවලින් ණය ගන්නේ නැහැ. නමුත්, ඔවුන් මූල්‍ය සහාය ලබා ගන්න කියලා තිබෙනවා. එදා ඇමතිවරුන්ට හොරු කියලා කිව්වාට, දැන් රජයේ නිලධාරින් තමයි හොරු වෙලා තිබෙන්නේ. මම කියන්නේ කරුණාකරලා අපි ඇත්ත, ඇත්ත ආකාරයෙන් හෙළිදරව් කරමු. ප්‍රශ්න තිබෙනවා. ප්‍රශ්නවලට අලුත් උත්තර හොයන එක තමයි කරන්න තිබෙන්නේ. නමුත්, නිර්භීත තීන්දු ගන්න අවශ්‍යයි. තීන්දුවක් ගන්නකොට වැරදෙන්න පුළුවන්. ඒකෙදි සද්භාවයෙන්, රට වෙනුවෙන් කටයුතු කරනවා නම් ඒක ප්‍රශ්නයක් නැහැ. ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, ඔබතුමා ඔබතුමාගේ අමාත්‍යාංශයේ තීන්දු ගන්නවා. එහෙම තමයි කරන්න අවශ්‍ය වෙන්නේ. නමුත් බලන්න, මේ ගරු සභාව දිහා. ඇමති මණ්ඩලයේ 26දෙනෙක් හිටියත් දෙදෙනෙකු පමණයි දැන් මෙහි ඉන්නේ. මේ සම්බන්ධයෙන් මීට වඩා ඍජු තීන්දු ගන්න අවශ්‍යමයි. මේ අවස්ථාවේ අපට කියන්න පුළුවන්,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු අගමැතිනිය ඇහුවා, "යුද්ධය කළේ අපෙන් අහලාද?" කියලා. එහෙම අහනවා නම් අපට අහන්න වෙනවා, "රුපියල අවප්‍රමාණය කරන්නේ අපෙන් අහලාද?" කියලා.

මේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නය අප හැමදෙනාටම බලපානවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේ මාතලේ දිස්ත්‍රික්කයේ අයෙක් වුණත් රෑට නිදා ගන්න කොට ඩොලර් එකක් රුපියල් 320යි; උදේ නැඟිටලා බලන කොට ඩොලර් එකක් රුපියල් 345යි. ආනයන වියදම් තවම ඇවිල්ලා නැහැ. ඒ වියදමත් එන්න පටන් ගත්තාම ලොකු ප්‍රශ්නයක් තමයි ඇති වෙන්නේ. *[බාධා කිරීමක්]* ඔව්, ඔව්, රුපියල්වලින් තමයි. සුද්දාගේ ඩොලර් එක රුපියල් වෙන කොට මාස දෙකක් යනවා. ඊට පස්සේ වැඩේ වැරදිලා ඉවරයි.

මම ඉතාම ඕනෑකමින් මේ කාරණය කියන්න ඕනෑ. හම්බන්තොට වරායෙන් ඉල්ලා තිබෙනවා, කාර් 30,000ක ප්‍රමාණයකට ඉඩ දෙන්න කියලා. ඒකට ඉඩ දෙන්න. ඩුබායිවල තිබෙන ඒවා පුළුවන් තරම් මෙහේට ගෙන්වා ගන්න. ඒ අයට කොළඹ වරායේ ඉඩක් දෙන්න-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම තව මිනිත්තුවක කාලයක් ගන්නේ.

මේ රටට සල්ලි ගෙනෙන offshore companies අහනවා, register කරන්න US Dollars 15,000ක් දෙන්නේ මොකටද කියලා. මොකටද එහෙම කරන්නේ? රටට සල්ලි ඕනෑ ප්‍රමාණයක් ගෙනෙන්න ඉඩ දෙන්න. අපේ රටින් ඩොලර් ගෙන යන එක තමයි ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ. ඇයි ගල් යුගයේ දේවල් ආපහු මේ රටට ගෙනෙන්න අවශ්‍ය වන්නේ? කරුණාකරලා ඒ කොන්දේසි පුළුවන් තරම් ලිහිල් කරන්න. අපි එදා කිව්වා, SriLankan Airlines එකට බිලියන 20ක් දීලා ප්‍රශ්නය විසඳන්න බැහැ කියලා. මේ වනකොට ඒ ආයතනයට සභාපති කෙනෙකුත් නැහැ; CEO කෙනෙකුත් නැහැ. ඒ ආයතනය auto pilot විධියට ක්‍රියාත්මක වෙන්නේ.

Tourism industry එකෙන් කියනවා, 2030 ඉලක්කය ලබා ගන්න, ඒ අයට බිලියන 17ක් අවශ්‍යයි කියලා. කරුණාකර ඒක දෙන්න. එහි TDL එක ගෙවන්නේ වෙන කවුරුවත් නොවෙයි, සුද්දෝ සහ අපි. සංචාරක ආදායම ලබා ගැනීමට ඒ කියන කටයුතු කරන්න අවශ්‍යයි.

2026 දෙසැම්බර් මාසය වනකොට ලංකා ආණ්ඩුවත් එක්ක තිබෙන IMF plan එක අවසන්. එය අවසන් වුණාට පසුව, සැලැස්මක් තිබෙනවාද? ඒ ගොල්ලන්ට පෙනෙන්නේ නැහැ, යම් විධියක යෝජිත වැඩ පිළිවෙළක් තිබෙනවා කියලා. නිසි වැඩ පිළිවෙළක් පුළුවන් තරම් ඉක්මනට ඇති කරන්න. ඔබතුමන්ලාට ආර්ථික සැලැස්මක් නොවෙයි තිබෙන්නේ. ආර්ථිකයට patchwork එකක් කර තිබෙන නිසා තමයි ඒක තවම දැනිලා නැත්තේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ අවස්ථාවේදී මූලාසනයෙන් අපට අවස්ථාව දීලා තිබෙනවා, ඒ හෙළිදරවු කිරීම කරන්න. මම ඒක අගය කරනවා. නමුත් එක කාරණයක් තිබෙනවා. මේ රට හදන්න බැරි රටක් නොවෙයි. මේ රට හදන්න ඕනෑකමක් තිබෙනවාද, නැද්ද කියන එකයි ප්‍රශ්නය. නිර්භීත තීන්දු අරගෙන අපේ ඉදිරි අනාගත තරුණ සම්පතට ව්‍යාපාර ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට වෙන්න අවස්ථාව උදා කරලා දෙන්න. බිස්නස් කරන අයට පහසුවෙන් වැඩ කරන්න අවශ්‍ය කටයුතු සලස්වන්න කියලා අවසාන වශයෙන් මම මතක් කරනවා. සැලසුම් සහගතව මෙහි මුද්‍රණය කරලා තිබෙන දේවලට වඩා හුඟක් වෙනස් ප්‍රායෝගික තත්ත්වයක් තමයි අද තිබෙන්නේ.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සුනිල් රත්නසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු අටක කාලයක් තිබෙනවා.

Order, please! Will an Hon. Member propose the Hon. Upul Kithsiri to the Chair?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
Hon. Presiding Member, I propose that the Hon. Upul Kithsiri do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (MRS.) ROHINI KUMARI WIJERATHNA left the Chair and THE HON. UPUL KITHSIRI took the Chair.*

[අ.භා. 4.43]

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙරාතුව කථා කරපු මන්ත්‍රීතුමා සඳහන් කළා, මැද පෙරදිග යුද්ධය හමුවේ ඇති වෙච්ච අර්බුදයේදී ඉන්දියාවේ අගමැතිතුමා කටයුතු කරපු ආකාරය නිවැරැදියි, සිංගප්පූරුවේ ජනාධිපතිතුමා කටයුතු කරපු ආකාරය නිවැරැදියි, මැලේසියාවේ ජනාධිපතිතුමා එය කළමනාකරණය කරපු ආකාරය නිවැරැදියි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් එතුමාට අමතක වෙනවා, රුපියල් කෝටි 10,000ක සහන පැකේජයක් දීලා, රුපියල් 10,000ට තිබුණු "අස්වැසුම" දීමනාව රුපියල් 15,000 දක්වා වැඩි කරලා, රුපියල් 17,500ට තිබුණු "අස්වැසුම" දීමනාව රුපියල් 25,000 දක්වා වැඩි කරලා, රුපියල් 25,000ට තිබුණු පොහොර සහනාධාරය රුපියල් 30,000 දක්වා වැඩි කරලා, ධීවරයෙකුට දිනකට ලීටර් 25ක් දක්වා එක් ලීටරයකට රුපියල් 50 ගණනේ සහනයක් දීලා, බහුදින ධීවර යාත්‍රාවලට 150,000ක සහනාධාරයක් දීලා, ඉන්ධනවලට මාසිකව රුපියල් 20,000ක් දීලා, මිලියන 20,000ක් මාසිකව මහා භාණ්ඩාගාරයෙන් වෙන් කරපු අපේ රටේ ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා මේ අර්බුදය කළමනාකරණය කරපු ආකාරය. එතුමාට ඉන්දියාවේ අගමැති, සිංගප්පූරුවේ ජනාධිපති, මැලේසියාවේ ජනාධිපති මතක් වුණාට අපේ රටේ ජනාධිපතිවරයා මේ අර්බුදය කළමනාකරණය කළේ කොහොමද කියන එක අමතක වෙනවා. අපි ඒ ගැන පුදුම වෙන්නේ නැහැ. මොකද, මහ බැංකුව මහ දවාලේ කඩලා අපේ රටේ ආර්ථිකය සම්පූර්ණයෙන් විනාශ කරන්න දායක වෙච්ච විපක්ෂයෙන්, සමහර වෙලාවට තමන් හිටපු ගෙදර කාගේද කියලා ඇහුවාම ඩිමෙන්ෂියා රෝගය හැදිච්ච විපක්ෂයෙන් අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ, අපේ ආණ්ඩුව, අපේ ජනාධිපතිවරයා මේ අර්බුදය හොඳින් කළමනාකරණය කළා කියන පණිවුඩය දෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් සමහර වෙලාවට රුස්ස ගස් වාගේ දැක්කා. රුස්ස ගස් වාගේ දැක්කා! හැබැයි, ඒ රුස්ස ගස් - ඒ අය - අද උදේ හැසිරුණු විධියෙන් අපට තේරුණා, අරටුවක් නැති බෙන තිබෙන ගස් ටිකක් තමයි තිබෙන්නේ කියලා. සරලවම කිව්වොත් අද විපක්ෂයට අත් වෙලා තිබෙන්නේ "නිසි කල පැසුණු උන් අකලට නැසුණු කල - අකලට පැසුණු උන් කට මැත දොඩනු ඇත" කියන තත්ත්වයයි. ඕක තමයි අද විපක්ෂයට වෙලා තිබෙන්නේ. කියන්න පුළුවන් ලොකුම බොරු ටික ඇවිල්ලා කියනවා.

අපේ දිස්ත්‍රික්කයේ ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීවරයා එක් අවස්ථාවක කිව්වා, "දිට්වා සුළි කුණාටුව ආවා. සෝමාවතියේ හාමුදුරුවෝ ගැන බැලුවේ නැහැ" කියලා. අපි උදේ, දිවා, රාත්‍රී උන්වහන්සේගේ අවශ්‍යතා සොයා බැලුවා, දේශපාලන අධිකාරිය විධියට. ඊට පස්සේ කිව්වා, "දිස්ත්‍රික්කයේ වකුගඩු රෝගීන්ගේ දීමනා ටික ගෙවලා නැහැ" කියලා. "වැඩිහිටි දීමනා ගෙවලා නැහැ" කිව්වා. ඒ සියලු දීමනා ගෙවලා තිබියදී එහෙම කිව්වා. අදත් ඇවිල්ලා පව ගොඩක් කිව්වා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතුමා කිව්වා, "පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පොහොර සහනාධාරය දීලා නැහැ" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් 25,000 ගාණේ නොවෙයි, රුපියල් 30,000 ගාණේ ගොවීන් 35,973දෙනෙකුට හෙක්ටෙයාර 29,788කට රුපියල් මිලියන 532කට අධික මුදලක් දීලා තිබෙනවා, පොළොන්නරුව දිස්ත්‍රික්කයට. නමුත් සත පහක් දීලා නැහැ කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා කියනවා, "ගොවියා පොහොර සහනාධාරයක් ඉල්ලුවේ නැහැ. පොහොර සහනාධාරය දෙන්න ඕනෑ නැහැ" කියලා; "ගොවියා නොමිලේ පොහොර දෙන්න කිව්වේ නැහැ" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒගොල්ලන් බලයේ ඉන්න කොට රුපියල් 15,000ට තිබුණු පොහොර සහනාධාරය තමයි අපි රුපියල් 25,000 දක්වා වැඩි කළේ. මේ අර්බුදය හමුවේ යල කන්නය සඳහා නැවත රුපියල් 5,000ක් වැඩි කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගොවි ජනපදයක ගොවි ජනතාවගෙන් ඡන්දය අරගෙන මේ පාර්ලිමේන්තුවට ඇවිත් දැන් එතුමා කියනවා, "පොහොර සහනාධාරය ගොවියා ඉල්ලුවේ නැහැ. ගොවියාට පොහොර නොමිලේ දෙන්න ඕනෑ නැහැ" කියලා. අපි ඒ ගැන කනගාටු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතුමා විතරක් නොවෙයි, එතුමාගේ තාත්තා කිව්වේ මොකක්ද? අපේ දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව තමන් ගත්තු ණය ටික ගෙවා ගන්න බැරුව, වී ටික විකුණා ගන්න බැරුව බෙල්ලේ වැල ලාගෙන මැරෙන කොට, වහ බීලා මැරෙන කොට එතුමාගේ තාත්තා කිව්වා, "ගොවියෝ වහ බොන්නේ ජොලියට" කියලා. "ගොවියෝ වහ බොන්නේ ජොලියට" කිව්වා! අද එතුමාගේ පුතා ඇවිල්ලා පාර්ලිමේන්තුවේ කියනවා, "ගොවියෝ පොහොර සහනාධාරය ඉල්ලුවේ නැහැ. ගොවියාට නොමිලේ පොහොර දෙන්න ඕනෑ නැහැ" කියලා. අපි බෙහෙවින්ම කනගාටු වෙනවා, ගොවි ජනතාවගේ ඡන්දය අරගෙන ඇවිත් එතුමා කරන ප්‍රකාශ සම්බන්ධයෙන්. ඒ වාගේම, පොහොර දීලා නැහැ කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි මේ වනකොට පොහොර මෙට්‍රික් ටොන් 5,078ක් ගොවීන්ට ලබා දීලා තිබෙනවා. මේ වනකොට පොළොන්නරුවේ ගබඩාවල පොහොර මෙට්‍රික් ටොන් 51.5ක් ඉතිරි වෙලා තිබෙනවා. අපේ දිස්ත්‍රික්කයට යල කන්නයට තවත් පොහොර මෙට්‍රික් ටොන් 5,960ක් අවශ්‍ය වෙනවා. ඒ පොහොර මෙට්‍රික් ටොන් 5,960ත් ඇණවුම් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විපක්ෂයට මතක් කරලා දෙන්න ඕනෑ, කියන්න ඕනෑ, ලෝකයේ බොහොමයක් රටවල එකම පක්ෂයක් දීර්ඝ කාලයක් පාලනය කරන්නේ නැති බව. විවිධ ආකාරයට විවිධ අවස්ථාවල බලය හුවමාරු වීම සිද්ධ වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ බල හුවමාරුව සිද්ධ වනකොට ඒ ඒ රටවල් පාලනය කළ පාලක පක්ෂය රටේ සාරය සම්පූර්ණයෙන්ම උරා බීලා, රට කාබාසිනියා කරලා, රට සම්පූර්ණයෙන් විනාශ කරලා නොවෙයි ඊළඟට බලයට එන කණ්ඩායමට භාර දෙන්නේ. ඒ වාගේම ඒ අයට තිබෙන්නේ කලින් ආණ්ඩුව, කලින් බලයේ හිටපු අය අධ්‍යාපනය නතර කරපු තැන ඉඳලා ඉස්සරහට අරගෙන යන්න; සෞඛ්‍යය නතර කරපු තැන ඉඳලා ඉස්සරහට අරගෙන යන්න; ආර්ථිකය නතර කරපු තැන ඉඳලා ඉස්සරහට අරගෙන යන්න. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට සිද්ධ වුණේ මොකක්ද? 2024දී ආර්ථිකය නතර කරලා තිබුණේ. ක්‍රියාත්මක ආර්ථිකයක් නොවෙයි අපට දුන්නේ. 2022.04.12වැනි දා මහ බැංකුවේ අධිපතිවරයා කියනවා, අපි ගත්ත ණය දේශීයවත් විදේශීයවත් ගෙවන්න බැහැ, අපි බංකොලොත් රාජ්‍යයක් කියලා පිළිගන්නවා කියලා. එහෙම රාජ්‍යයක් තමයි අපි භාරගත්තේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි බංකොලොත්භාවයෙන් රට මුදා ගත්තා. Fitch Ratings ඇතුළු ණය ශ්‍රේණිගත කරන කණ්ඩායම් අපි

[ගරු සුනිල් රත්නසිරි මහතා]

සංවර්ධනය වෙමින් වේගයෙන් ඉස්සරහට එනවා කිව්වා. Verite Research ආයතනය කිව්වා, රටේ ජනතාව සියයට 65ක් ආණ්ඩුව පිළිබඳ ප්‍රසාදයෙන් කථා කරනවා කියලා. Transparency International සංවිධානය කිව්වා, දූෂණ සංජානන දර්ශකයේ අපි ඉස්සරහට ඇවිල්ලා ඉන්නවා කියලා. හැබැයි, මුළු ලෝකයම ආණ්ඩුව ගැන හොඳ කිව්වත් අපේ ආණ්ඩුවේ වරදක් දකින්නේ මේ කුජීත වෙච්ච විපක්ෂය විතරයි. රටට සාපයක් වෙච්ච මේ විපක්ෂයට මැයි රැලියක් කරගන්නට බැරි වුණා. අපි මැයි රැලි 21ක් දිස්ත්‍රික්ක 21ක් පුරා කරනකොට ඒගොල්ලන්ට එක මැයි රැලියක් කරගන්න හැකියාව තිබුණේ නැහැ. ඒ නිසා අපට ගමට යන්නත් පුළුවන්, ගමේ ජනතාව එක්ක දේශපාලනය කරන්නත් පුළුවන්. අපි ගමත් හදනවා, රටත් හදනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.53]

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனது உரையைத் தொடங்குவதற்கு முன்பு, சில நாட்களுக்கு முன்னர் மறைந்த மூத்த ஊடகவியலாளரான அமரர் டி.பி.எஸ். ஜெயராஜ் அவர்களுக்கு இலங்கை தொழிலாளர் காங்கிரஸ் சார்பாகவும் மலையக மக்கள் சார்பாகவும் அவருடைய குடும்பத்தினருக்கு என்னுடைய ஆழ்ந்த அனுதாபத்தைத் தெரிவித்துக் கொள்கின்றேன்.

நான் இங்கு சில விஷயங்களைப் பேசியாக வேண்டும். கடந்த பாராளுமன்ற அமர்வில் நீங்கள் எல்லோரும் கவனித்திருப்பீர்கள், மலையகத்தில் சில அடாவடித்தனங்கள் நடக்கும்போது அது தொடர்பான விடயங்களை எதிர்க் கட்சியினராகிய நாங்கள் ஆளுந்தரப்பினர் மத்தியில் கொண்டுவந்து சேர்த்ததை. அப்படி நாங்கள் கொண்டுவரும் போது, ஆளுந்தரப்பில் இருக்கும் சில அமைச்சர்கள் சொன்னார்கள், “இது சம்பந்தமாக கட்டாயம் தீர்வொன்றைப் பெற்றுக்கொடுப்போம்” என்று. கடந்த வாரம் நானும் மூத்த பாராளுமன்ற உறுப்பினரான கௌரவ மனோ கணேசன் அவர்களும் கோரிக்கையொன்றை முன்வைத்தோம். அதாவது, மலையகத்தில் இருக்கின்ற பெருந்தோட்ட நிறுவனங்களையும் காவல்துறையினரையும் பாராளுமன்ற உறுப்பினர்களையும் ஒன்றுசேர்த்து கலந்துரையாடல் ஒன்றை நடத்த வேண்டும் என்று. நேற்றைய தினம் கதையொன்று வந்திருக்கின்றது, நாளைய தினம் பாராளுமன்றத்தில் நடைபெறவிருந்த அந்தக் கலந்துரையாடலை அடுத்த வாரம் தள்ளிப் போடுவதாக. இதனை அமைச்சின் செயலாளர், பிரபாத் சந்திரகீர்த்தி அவர்கள் சொல்லியிருக்கிறார். கௌரவ மனோ கணேசன் அவர்கள் இது தொடர்பில் கௌரவ அமைச்சர் ஆனந்த விஜேபால அவர்களுடன் பேசியிருக்கிறார். நாளைய தினம் அந்தக் கலந்துரையாடல் இருப்பதுபோலத்தான் தெரிகிறது. கட்டாயம் அரசாங்கம் கொடுத்த வாக்குறுதியைக் காப்பாற்ற வேண்டும். நாளை அந்தக் கலந்துரையாடல் நடைபெற வேண்டும்; அது முக்கியமானதொரு கலந்துரையாடல்! அதில் நாங்கள் அனைவரும் பங்கேற்க இருக்கிறோம்; ஊடகத் துறையில் இருக்கின்றவர்களும் பங்கேற்க இருக்கிறார்கள்.

இன்றைக்கு உடபுஸல்லாவ பகுதியாக இருக்கட்டும், கஹவத்தை பகுதியாக இருக்கட்டும், மஸ்கெலியா பகுதியாக இருக்கட்டும், மலையகத்தின் பல்வேறு பகுதிகளிலும் தோட்ட முகாமையாளர்கள் மூலமான அடாவடித்தனமும் அராஜகமும் அதிகரித்துவிட்டன. இது ஆளுங்கட்சியின் பிரச்சினையோ, எதிர்க்கட்சியின் பிரச்சினையோ கிடையாது. இதை வைத்து எதிர்க்கட்சி அரசியல் இலாபம் தேட வேண்டும், ஆளும் கட்சியை வீழ்த்த வேண்டும் என்பது எங்களுடைய நோக்கம் கிடையாது. வெளிப்படையாகவே சொல்கிறேன், 'பெட்ரோ' தேயிலைத் தொழிற்சாலையில் இப்படியானதொரு பிரச்சினை நடந்தபொழுது, அதை நான் தட்டிக் கேட்டேன். அப்படித் தட்டிக் கேட்டதற்கு, நான் அடாவடித்தனம் செய்வதாக சனாதிபதி அவர்கள் என்மீது முத்திரை குத்தினார். பரவாயில்லை! இவ்விடயம் தொடர்பில் எனக்கு எதிராக நீதிமன்றத்தில் வழக்குத் தாக்கல் செய்யப்பட்டு, இன்றுவரை அது தொடர்ந்துகொண்டு இருக்கின்றது. அன்றைக்கு நான் அப்படிச் செய்யும்போது நிறையப் பேர் என்னிடம், "ஏன் இந்த மாதிரி அடாவடித்தனம் செய்கிறீர்கள்?" என்று கேட்டார்கள். அது அடாவடித்தனம் அல்ல; தட்டிக் கேட்டேன். ஏனென்றால், அந்த மொழி மட்டும்தான் தோட்ட முகாமையாளர்களுக்குப் புரியும்.

இன்றைக்கு தோட்டத்துக்கும் மலையகத்துக்கும் சம்பந்தமில்லாத உறுப்பினர்கள் இங்கே ஆளுந்தரப்பிலும் இருக்கிறார்கள்; எதிர்க்கட்சியிலும் இருக்கிறார்கள். அவர்களுக்கு இன்றைக்குத் தோட்டப்புறத்தில் நடக்கின்ற விஷயங்கள் தெரியாது. இதுதான் உண்மை! அங்கிருக்கின்ற பெருந்தோட்ட நிறுவனங்கள் எந்தளவுக்கு மோசமாக அந்த மக்களை வைத்திருக்கின்றன என்பது நிறையப் பேருக்குத் தெரியாது. நீங்கள் கொஞ்சம் சிந்தித்துப் பாருங்கள்! இன்றைக்கு மலையக மக்களுக்கான வீட்டுத்திட்டம் பிரச்சினையாக இருக்கின்றது. இந்த விடயத்தை வெளிப்படையாகவே பேசுவோம். நான் சொல்கின்ற விடயம் தவறாக இருந்தால், ஆளும் தரப்பில் யார் வேண்டுமானாலும் எழுந்து, நான் சொல்வது தவறென்று தைரியமாகச் சொல்ல முடியும். நான் சொல்வதை நிரூபிக்கிறேன். அது சம்பந்தமான அனைத்து ஆதாரங்களையும் சபையில் *சமர்ப்பிக்கின்றேன்.

பெருந்தோட்ட வீட்டுத் திட்டத்தைப் பொறுத்தவரைக்கும், நாங்கள் 10,000 வீட்டுத் திட்டத்தை அறிமுகப்படுத்தி, 1,300 வீடுகளை அமைப்பதற்கான செயற்பாடுகளை முன்னெடுத்தோம்; இது இரண்டரை வருடத்துக்கு முன்னர் நடைபெற்ற விடயம். அன்றைக்கு இந்த ஆளுந்தரப்பினர் சொன்ன விஷயம், “நாங்கள் ஆட்சிக்கு வந்து இரண்டு வருடத்துக்குள் கிட்டத்தட்ட 9,000 வீடுகளைக் கட்டுவோம்” என்பது. ஆனால், இன்றைய நிலவரப்படி 2,080 வீடுகள் கட்டப்பட அடையாளம் காணப்பட்டிருக்கின்றது. ஆனால், இன்னும் அதற்கான காணிகள் விடுவிக்கப்படவில்லை. நான் சொல்வது தவறு என்றால், யார் வேண்டுமென்றாலும் தாராளமாக அதைச் சுட்டிக் காட்டலாம். ஆனால், இந்த இடத்தில் நான் ஓர் எதிர்க்கட்சி உறுப்பினராக உங்கள் எல்லோரிடமும் சொல்கின்றேன், அது ஆளுங்கட்சியின் தவறு கிடையாது; அது அமைச்சருடைய தவறு கிடையாது. அதற்கு முக்கிய காரணம் மலையகத்தில் இருக்கின்ற systemதான்.

இன்று நீங்கள் வடக்கு, கிழக்கை எடுத்துப் பாருங்கள்! அங்குள்ளவர்களுக்கு இந்திய அரசாங்கத்தின் உதவியூடாக ஒரு வீடு கிடைக்குமாயின், அதை நேரடியாக அவர்களிடமே வழங்க முடியும். ஏனென்றால், அது தனியார் காணி. ஆனால், மலையகத்தில் அப்படிக் கிடையாது. எந்த அரசாங்கமாக

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

இருந்தாலும் சரி, மலையகத்தில் வீடு கட்டுவதாக இருந்தால் முதலில் ஒரு கோரிக்கையை அங்குள்ள trust இடம் முன்வைக்க வேண்டும். கோரிக்கையை முன்வைத்ததன் பின்னர் அமைச்சினூடாக அந்த trust நிறுவனத்திடம் பேசி, அதற்கப்புறம் பெருந்தோட்டத் துரைமார்களிடம் பேசி, அவர்கள் CEOவிடம் பேசி, அவர் சம்மதித்ததன் பின்னர் நிதி அமைச்சிடம் பேசி, இறுதியாக approval பெற வேண்டும். இந்த நடைமுறைகள் அனைத்தும் மேற்கொள்வதற்குள் வீட்டுத் திட்டம் காலாவதியாகிவிடும். இதுதான் உண்மையான நிலவரம். அதனால்தான் கடந்த அரசாங்க காலத்தில் நான் அமைச்சராக இருந்தபோது, 2023 ஒக்ரோபர் 30ஆம் திகதி ஒரு கோரிக்கையை முன்வைத்து ஓர் அமைச்சரவைப் பத்திரத்தைச் சமர்ப்பித்தேன். இதற்கு யார் வேண்டுமானாலும் பெயர் போட்டுக் கொள்ளலாம், அதுபற்றி எனக்குப் பிரச்சினை இல்லை. ஆனால், அதனை அமுல்படுத்தினால் நல்ல விஷயம். நான் இந்த விடயத்தைப் பலமுறை இங்கே சொல்லியிருக்கிறேன். அந்த அமைச்சரவைப் பத்திரத்தை எடுத்துப் பாருங்கள்! அதில், மலையக மக்களுக்கு 10 பேர்ச்சஸ் வீதம் காணி வழங்குவதற்கு 5,000 மில்லியன் ரூபாய் நிதி ஒடுக்கீடு செய்யப்பட்டு இருக்கின்றது. அன்றைய தினம் மாண்புமிகு சனாதிபதி அவர்கள் சொன்னார், “அவ்வளவு நிலம் அங்கு இருக்கிறதா, இல்லையா என்பது எங்களுக்குத் தெரியாது” என்று. ஆனால், உண்மையான விஷயம், பெருந்தோட்டப் பகுதிகளிலுள்ள மொத்த நிலப்பரப்பு 204,000 ஹெக்டெயார்.

அதில், மலையக மக்களுக்கு 10 பேர்ச்சஸ் வீதம் காணி வழங்குவதற்கு 5,777 ஹெக்டெயார்தான் தேவைப்படும். இது சாத்தியமான ஒரு விஷயம்! நாங்கள் இரண்டாவது முறையும் ஓர் அமைச்சரவைப் பத்திரத்தைச் சமர்ப்பித்தோம். மலையக மக்களுக்குக் காணி உரிமை கொடுப்பதில் பல்வேறு தரப்பினரிடத்தில் மாற்றுக் கருத்துகள் இருக்கின்றன. மலையக மக்கள் பெருந்தோட்ட நிறுவனங்களுக்குச் சொந்தமானவர்கள் அல்லர். அவர்கள் இலங்கை நாட்டின் பிரஜைகள்! ஆகவே, இவர்களை இலங்கை அரசாங்கம்தான் பொறுப்பேற்க வேண்டும். இன்று NGOsஆக இருக்கட்டும், அரசாங்க நிறுவனங்களாக இருக்கட்டும், தனியார் அமைப்புகளாக இருக்கட்டும், civil societiesஆக இருக்கட்டும், பெருந்தோட்ட நிறுவனங்களுக்கு ஊடாகச் சென்றால், அங்குள்ள முகாமையாளர்கள் அவர்களுக்குப் பாரிய தடையை விதிக்கின்றார்கள். முகாமையாளர்கள் எப்படி அனுமதி கொடுக்க முடியும்? அதனால்தான் நாங்கள் ஒரு கோரிக்கையை முன்வைத்தோம். அனுமதி கிடைத்த அமைச்சரவைப் பத்திரமொன்று இருக்கின்றது. நாங்கள் முன்வைத்த கோரிக்கை என்னவென்றால், பெருந்தோட்டப் பகுதியில் மக்கள் வாழ்கின்ற இடங்களை - human habitable zonesஐ - அரசாங்கம் பொறுப்பேற்க வேண்டும் என்றுதான். அவற்றை அரசாங்கம் பாரமெடுத்தால், எதிர்காலத்தில் பெருந்தோட்டத்தில் வாழுகின்ற மக்களுக்கு அரசாங்கத்தின் ஊடாக நேரடியாகவே அபிவிருத்தித் திட்டங்களைக் கொண்டுபோய்ச் சேர்க்க முடியும்.

கல்வி அமைச்சாக இருக்கட்டும்; சுகாதார அமைச்சாக இருக்கட்டும்! இவ்வாறான தேசிய அமைச்சுகள் ஏன் பெருந்தோட்டங்களில் வேலை செய்வதில்லை? ஏன் பெருந்தோட்டத்துக்கென தனியாக தோட்ட உட்கட்டமைப்பு அமைச்சு? ஏன் அங்கு trust நிறுவனத்தின் ஊடாக வேலைசெய்ய வேண்டும்? ஏன் தோட்ட உட்கட்டமைப்பு அமைச்சுக்கு மட்டும் ஒவ்வொரு வருடமும் மூன்று பில்லியன் ரூபாய் நிதி ஒதுக்கீடு செய்யப்படுகின்றது? மூன்று பில்லியன் ரூபாயை வைத்து என்ன செய்ய முடியும்? இதுதான் மலையகத்தில் இருக்கின்ற பிரச்சினை! நான் இங்கு பேசுவது எதிர்க்கட்சிக்காகவோ, இலங்கைத் தொழிலாளர் காங்கிரஸுக்காகவோ கிடையாது. ஆளும் கட்சியில் இருக்கின்ற மலையகத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் உறுப்பினர்களுக்காகவும் அமைச்சர்களுக்காகவும்தான் நான் பேசிக் கொண்டிருக்கிறேன். மலையகத்துக்கான நிதி ஒதுக்கீட்டை கட்டாயம் அதிகரித்தாக வேண்டும். அப்படி நிதி ஒதுக்கீட்டை அதிகரிக்காமல் வேலைத்திட்டங்களை முன்னெடுப்பது மிகவும் கஷ்டம்!

சமீபத்தில் இன்னொரு பிரச்சினையும் நடந்தது. அதை கௌரவ பிமல் ரத்நாயக்க அவர்களுடைய கவனத்துக்குக் கொண்டு வர விரும்புகின்றேன். அவருடைய கட்சியைச் சார்ந்த பாராளுமன்ற உறுப்பினர்கள் அல்லர்; ஆனால், அவருடைய கட்சியைச் சார்ந்த சில தோழர்களாக இருக்கலாம்! அவர்கள் பத்திரிகையாளர்களை மிரட்டி, தோட்டத்துக்குள் வரவிடாமல் தடுத்திருக்கிறார்கள். அது பற்றி கேட்டால் சொல்கிறார்கள், "அவர்களை தோட்டத்துக்குள் விடாமைக்குக் காரணம், அவர்கள் ஜீவன் தொண்டமானின் கைக்கூலிகள்" என்று. நான் உங்களிடத்தில் வெளிப்படையாகச் சொல்கின்றேன், என்னை அதிகமாகத் திட்டி, உங்களை அதிகமாகப் பாராட்டியது ஊடகத்துறையில் இருக்கின்ற அதே பத்திரிகையாளர்கள்தான். ஏன் நான் இதைச் சொல்கின்றேன் என்றால், எதிர்காலத்தில் ஊடகத்துறையினர் தோட்டத்துக்குள் போக முடியவில்லை என்றால், எப்படி பிரச்சினைகள் வெளியே வரும்? என்பதற்காகத்தான்.

மற்றவர்கள் என்ன சொல்கிறார்களோ இல்லையோ, நான் இந்த இடத்தில் வெளிப்படையாகச் சொல்கிறேன், மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்கள் අරගළයவுக்குப் பிற்பாடுதான் சனாதிபதியானார். பிடிக்கின்றதோ, இல்லையோ இதுதான் உண்மை! අරගළය முழுக்க முழுக்க கௌரவ ராஜபக்ஷ அவர்களுக்கு எதிரான ஒரு போராட்டமாக இருக்கலாம் அல்லது ஓர் அரசியல் புரட்சியாக இருக்கலாம்! அதே வெறுப்பையும் அதிருப்தியையும் மலையகத்தில் தொண்டமானுக்கு எதிராகவும் ஏற்படுத்தி, நாங்கள் ஏதோ வேலை செய்யாத மாதிரி காண்பித்து இருக்கிறார்கள். நான் இன்றைக்குச் சொல்கின்றேன், நான் அமைச்சராக இருக்கும்பொழுது, 26,000 குழந்தைகளுக்கு இலவச காலை உணவுத்திட்டத்தைக் கொண்டுவந்தேன். அது தப்பா? யாராவது ஒருவர் சொல்லட்டும், சௌமியமூர்த்தி தொண்டமான் ஐயா அவர்கள் மலையக மக்களுக்குச் சேவை செய்யவில்லை என்று. அவர்தான், மலையக மக்களுக்குப் பிரஜாவுரிமையைப் பெற்றுக்கொடுத்தார்; ஸ்ரீபாத தேசிய கல்வியியற் கல்லூரியை நிறுவினார்; தோட்ட நிருவாகத்தின்கீழ் இருந்த 864 பாடசாலைகளை அரசாங்கத்துக்குக்கீழ் கொண்டுவந்தார். நாங்கள் என்றைக்குமே இலங்கையர்களாக இருக்க வேண்டும் என்றுதான் நினைக்கின்றோமே ஒழிய, யாருக்கும் இடையூறாக இருக்க வேண்டுமென நினைக்கவில்லை. மலையகத் தலைவர் ஆறுமுகம் தொண்டமான் ஐயா அவர்கள், உதவி ஆசிரியர் நியமனம் உட்பட பல்வேறு வேலைத்திட்டங்களைச் செய்தார். நாங்கள் இவை எல்லாவற்றையும் செய்தோம் என்று சொன்னால், உடனே சொல்கின்ற விஷயம் குடும்ப அரசியல்! அதற்காக நான் பிரச்சினைகளைப் பேசக் கூடாதா?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

Hon. Presiding Member, please give me one more minute.

மக்கள் எனக்கு வாக்களித்து இருக்கின்றார்கள். வாக்குகளைப் பெற்று ஜெயித்து இந்தச் சபைக்கு வந்திருக்கும் கடந்த அரசாங்கத்தில் இருந்த ஒரேயோர் அமைச்சர் நான் மட்டும்தான். அப்படியென்றால், எனது மக்கள் இன்னும் என்மீது நம்பிக்கை வைத்திருக்கிறார்கள். அந்த நம்பிக்கையைக் காப்பாற்ற வேண்டியது என்னுடைய பொறுப்பு! இரண்டு வருட கால அவகாசம் கொடுத்தோம், சனாதிபதி அவர்கள் வேலைத்திட்டங்களைக் கொண்டுவரட்டும் என்று. கௌரவ அமைச்சர் அவர்களே, உண்மையான விஷயம் என்னவென்றால், இன்றைக்கு மலையகத்துக்கு வேலைத்திட்டங்கள் சரியான முறையில் சென்றடைவதில்லை. உதாரணத்துக்கு சம்பளப் பிரச்சினையை எடுத்துக் கொள்ளுங்கள்! நீங்கள் தேர்தலுக்கு முன்னர், 2,000 ரூபாய் வழங்குவதாகச் சொன்னீர்கள். அது ஒரு பக்கம் இருக்கட்டும். நீங்கள் சொன்ன சம்பளத்தை ஜீவன் தொண்டமான் கொடுத்திருந்தால் என்னவாகி இருக்கும்? அப்படிக் கொடுத்திருந்தால் இந்த நேரம் நீங்களே சொல்லியிருப்பீர்கள், "ஜீவன் தொண்டமான் பெட்டி வாங்கி விட்டார்" என்று. இதுதான் உண்மை! ஆனாலும், நாங்கள் சம்பளப் பிரச்சினையை அரசியல்மயமாக்காமல் அதனைத் தீர்ப்பதற்கு முழுமையான ஆதரவு கொடுத்தோம். வரவு செலவுத்திட்டமாக இருக்கட்டும், உள்ளூராட்சிச் சபைகளில் ஆட்சியமைப்பதாக இருக்கட்டும், அனைத்து விடயங்களிலும் அரசாங்கத்தைத் தோற்கவிடாமல் ஜெயிக்க வைத்தேன். ஏனென்றால், நான் கொடுத்த வார்த்தை அப்படி! இறுதியாக, ஒரேயொரு விஷயத்தைச் சொல்ல விரும்புகின்றேன். மலையகத்திலுள்ள civil societies உட்பட அனைத்துத் தரப்பினருடனும் சேர்ந்து 'மலையக சாசனம்' என்ற ஓர் ஆவணத்தை 2023இல் நாங்கள் தயாரித்தோம். அதனை அமுல்படுத்தினாலே கட்டாயம் தீர்வு வரும்.

Sir, there was a Cabinet Paper passed. It was not done by me, though I was the Minister in charge; it was done by civil societies and people who were interested in uplifting the lives of the workers of the plantation sector. It is called the Upcountry Charter, a short-term, mid-term and long-term plan in relation to their development, education and healthcare. And, I am just asking you to implement that. You can accuse me of nepotism and everything later on. But, right now and for the past two years, I am sorry to say, there has been a severe lack of representation in the upcountry side and increasing their wages would not solve that matter. We have to look beyond wages. Wages cater to only 10 per cent of the upcountry community. The remaining 90 per cent are from the informal sector. They do not have any right to land.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

Hon. Minister, I have just one last request in relation to healthcare facilities at Maskeliya and Bogawantalawa Hospitals. I believe your Hon. Member representing the area has also gone and visited those places. There is a severe shortage of doctors in the Bogawantalawa Hospital and in the Maskeliya Hospital, there is no scanning machine for pregnant mothers. So, they have to travel to private hospitals in Glencairn. I am sure you are aware of the condition of the roads in the upcountry and it is causing a great deal of inconvenience to them. Therefore, I humbly request you to look into that.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න නියෝජ්‍ය අමාත්‍යතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.03]

**ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ විවාදයට ගනු ලබන මාතෘකාවට පෙර, ඊයේ දවසේ මාධ්‍යවල පළ වූ වාර්තාවකට කිසියම් ප්‍රතිචාරයක් දක්වන්න මම කැමැතියි. ඊයේ දවසේ මාධ්‍යවල වාර්තා කරලා තිබුණා, තොරතුරු දැන ගැනීමේ අයිතිය කප්පාදු කිරීමට සහ තොරතුරු කොමිසම අකර්මණ්‍ය කිරීමට රජය දරන උත්සාහයට ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය කියන ආයතනය විසින් බලවත් විරෝධය දක්වනවා කියලා. නියෝජ්‍ය ඇමතිවරිය ලෙස ඒ පිළිබඳව කිසියම් ආකාරයකට ප්‍රතිචාර දැක්විය යුතුයි කියලා මම විශ්වාස කරනවා.

වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය සමඟ පැවැති සාකච්ඡාවක් ගැන නොවෙයි මම මේ කථා කරන්නේ, වෙනත් ආයතනයක් එක්ක මම කරපු සාකච්ඡාවක් පිළිබඳවයි. ඒ සාකච්ඡාවට එම සංගමයේ නියෝජිතයෙකුත් සම්බන්ධ වුණා. එහිදී ඒ ගොල්ලන්ගේ අරමුණ වුණේ, ලංකාවට ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක් එපා කියන ඉල්ලීම කිරීමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ඒ ගැන නියෝජ්‍ය ඇමතිවරිය ලෙස මම ටිකක් මවිතයට පත් වුණා. සාමාන්‍යයෙන් සිවිල් සමාජය රජයෙන් ප්‍රතිපත්ති ඉල්ලා සිටිනවා. මොකද, මාධ්‍ය නිදහස සහ මාධ්‍ය දෙස අපි රජයක් විධියට බලන්නේ කොහොමද, ඒ වාගේම මාධ්‍ය නිදහස, මාධ්‍ය අයිතිවාසිකම් සුරක්ෂිත කරන්නේ කොහොමද කියන එකට ප්‍රතිපත්තියක් විසින් කිසියම් රාමුවක් සපයනවා. ඉතින්, ප්‍රතිපත්ති එපා කියන ඉල්ලීම කරන්න තමයි ඒ නියෝජිතයා ඇවිල්ලා තිබුණේ. කොහොම වුණත්, ඒ පැමිණි නියෝජිතයාට මම ප්‍රකාශ කළා, ඔබ ඒක එපා කියන්නේ කුමන තාත්වික පදනමකින් යුක්තවද කියලා මට ලිඛිතව දන්වන්න කියලා. මොකද, මාධ්‍ය ප්‍රතිපත්තියක් ඕනෑ කියන ඉල්ලීමත් අපි කරපු එකක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ජනමාධ්‍ය සමාජය විසින් ඒක කාලාන්තරයක් තිස්සේ රජයෙන් කරපු ඉල්ලීමක්. ඒක මාධ්‍ය සමාජයෙන් එන එකක්. ඒ නිසා, ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක් එපා කියන ඉල්ලීම ලිඛිතව දෙන්න කියලා එම නියෝජිතයාගෙන් මම ඉල්ලීමක් කළා.

ඒකත් එක්කම සහනියාමන යාන්ත්‍රණයක් ගැනත් කථා කළා. ඒ වාගේම තොරතුරු දැන ගැනීමේ කොමිසම ගැනත් කථා කළා. එහිදී මම පැමිණ සිටි ඒ අදාළ නියෝජිතයන්ට පැහැදිලි කළා,

තොරතුරු දැන ගැනීමේ අයිතිය දැන් වසර 10ක් තිස්සේ ක්‍රියාත්මක වන එකක් කියලා. නමුත්, කොමිසම සම්බන්ධයෙන් විශාල ප්‍රශ්න ටිකක් තිබෙනවා. පසුගිය අය වැය විවාදය වෙලාවේ ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා නඟපු ප්‍රශ්න දෙකකටත් මම පිළිතුරු දුන්නා. එකක් තමයි, නිලධාරි හිඟය. අපි දැන් නිලධාරින් බඳවා ගනිමින් සිටිනවා. ඒ වාගේම එතුමා කිව්වා, තාක්ෂණිකව - ඩිජිටල්කරණය තුළින් - අයදුම් පත්‍රයක් ඉදිරිපත් කරපු කෙනෙකුට අදාළ තොරතුරු ලබා ගැනීමේදී track කරන්න පුළුවන් විධියට ඒ ඩිජිටල්කරණය කරන්න කියලා. දැන් ඒ දෙකම ක්‍රියාත්මක වෙමින් පවතිනවා කියන එකත් මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කොමසාරිස්වරුන්ගේ දීමනාව සම්බන්ධව ප්‍රශ්නයකුත් තිබෙනවා. එම දීමනාව වැඩි කරන්න අපි පොරොන්දු වුණා. අපි ඒකත් කරනවා. ඒ වාගේම කොමසාරිස්වරයෙක් ඉල්ලා අස් වුණා. ඒ වෙනුවෙන් දැන් අලුත් කොමසාරිස්වරයෙක් පත් කරලා තිබෙනවා. එමෙන්ම, ගොඩනැඟිල්ල පිළිබඳවත් ප්‍රශ්න තිබෙනවා. අපි පසුගිය කාලය පුරාම සොයා බලමින් ඉන්නවා, ජනතාවට පහසුවෙන් ප්‍රවේශ විය හැකි හොඳ ගොඩනැඟිල්ලකට මේක අරගෙන යන්නේ කොහොමද කියලා.

ඒ වාගේම cadre positions ගැන කථා කළොත්, දැනට සිටින සේවක සංඛ්‍යාව revise කරලා cadre positions සඳහා අලුතින් බඳවා ගැනීම ටිකක් දීර්ඝ ක්‍රියාවලියක්. ඒ පිළිබඳව සාකච්ඡා පැවැත්වුණා. ඒ විතරක් නොවෙයි, proactive disclosure, ඒ කියන්නේ තොරතුරු ඉල්ලන්නටත් කලින්, තාක්ෂණය පාවිච්චි කරලා සියලු ආයතනවල තොරතුරු අපි සක්‍රියව ලබා දෙන්නේ කොහොමද කියන එක ගැනත් සාකච්ඡා වුණා. ඒ වාගේම අවශ්‍ය නම් තොරතුරු දැන ගැනීමේ අයිතිය ලබාගෙන වසර 10කට පසුව වුවත්, තොරතුරු කොමිසම ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදන තිබේ නම්, එබඳු ඉල්ලීමක් ජනමාධ්‍ය සමාජය වෙතින් හෝ යම් පාර්ශ්වයක් වෙතින් ආවොත් ඒක කරන්නත් රජය ලැහැස්තියි කියලා මම සඳහන් කළා.

ඇත්තටම මෙන්න මේ කාරණා ටික අහගෙන ඉඳලා නැතුව හෝ ඒවා නොතේරී හෝ එම නියෝජිතයා විසින් අදාළ ආයතනයට ගොස් වැරදි තොරතුරක් දීම නිසා මේ ප්‍රකාශය හෝ මේ මාධ්‍ය නිවේදනය නිකුත් කළා කියලා මම හිතන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කථාවක් තිබෙනවා, "ඇත්තට නිදාගෙන සිටින අය ඇහැරවන්න පුළුවන්, හැබැයි බොරුවට නිදාගෙන සිටින අය ඇහැරවන්න බැහැ" කියලා. අපි පොදුවේ සිවිල් සමාජය ගත්තත්, ජනමාධ්‍ය අයිතිවාසිකම් පිළිබඳව වැඩ කරන සංවිධාන ගත්තත්, එහි තිබෙන ලොකු චිත්‍රය අරගෙන බැලුවොත්, මේක විසින් නියෝජනය කරන්නේ වෙනත් තැනක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පසුගිය කාලයේ තොරතුරු කොමිසම වෙනුවෙන් අපි ගනිමින් සිටි සියලු තීරණ, ඒ වාගේම ජනමාධ්‍යවේදීන් වෙනුවෙන් කරමින් සිටි සියලු වැඩ ඇතුළු සියලුම කාරණා දැන ගනිමින් තමයි මේ ප්‍රකාශය කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කියන්නේ සිවිල් සංවිධාන සහ ජනමාධ්‍ය අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින සියලු සංවිධාන ගැන නොවෙයි. මේ කථා කරන්නේ සමහර සංවිධාන ගැනයි. සමහර සංවිධානවලට ප්‍රචණ්ඩ, මර්දනකාරී රාජ්‍යයකින් තොරව පැවැත්මක් නැහැ. මම එහෙම කියන්නේ ඇයි? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සතියෙන් සතිය මාධ්‍ය ප්‍රකාශ නිකුත් කරන්න වෙච්ච සමහර කාල තිබුණා. සමහර මාධ්‍යවේදීන්ට මහ මඟ දවාලේ ගැහුවා; සමහර මාධ්‍යවේදීන් සුදු වෑන් ඇවිල්ලා පැහැරගෙන ගියා; මාධ්‍ය ආයතනවලට ගිනි තැබුවා; සමහර මාධ්‍යවේදීන් රට අතහැර ගියා. ඝාතන, පැහැර ගැනීම්, ප්‍රචණ්ඩ ක්‍රියා, බාධා කිරීම්, CID එකට කැඳවීම් වැනි සියලු මර්දනකාරී පසුබිමක තිබුණු, මාධ්‍ය මර්දනය කරපු අතීතයක මේ ආයතනවලට වැඩක් තිබුණා. හැබැයි, 2024දී ආණ්ඩුව වෙනස් වුණා. ආණ්ඩුව විතරක් නොවෙයි වෙනස් වුණේ. සාමාන්‍ය මහජනතාවගෙන් එන නිර්ප්‍රභූ ආණ්ඩුවක් දැන් බලයට පත් වෙලා ඉන්නවා. ඒ නිසා අර ප්‍රචණ්ඩත්වය, එහෙම නැත්නම් මර්දනය මත තමන්ගේ පැවැත්ම තීරණය කරගෙන හිටපු සමහර සංවිධානවලට අනන්‍යතා අර්බුදයක් හෝ පැවැත්ම පිළිබඳ අර්බුදයක් එන්න පුළුවන්. අපි ඒක දන්නවා. ඒ නිසා මේ සංවිධානවලට අපි කියනවා, ඔබ ඉල්ලා සිටින්නේ ප්‍රචණ්ඩකාරී මාධ්‍ය මර්දනය කරන ත්‍රාඩ, ජඩ, දූෂිත රාජ්‍යයක් නම්, NPP ආණ්ඩුවක් යටතේ ඔබට එහෙම රාජ්‍යයක් හම්බ වෙන්නේ නැහැ කියලා. සමාවෙන්න, අපි මහජන ආණ්ඩුවක්.

අද දවසේ මාතෘකාවට මම ආවොත්, 2025 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව තමයි අද දවසේ සාකච්ඡාවට ගනු ලබන්නේ. අද උදේ ඉඳලාම අපේ සාර්ව ආර්ථික වර්ධනය ගැන කථා කළා. විශේෂයෙන්ම සියයට 5කට එහා ගිය ආර්ථික වර්ධන වේගයක් පවත්වාගෙන යෑම, අපේ විදේශ වෙළෙඳ පොළ ශක්තිමත්ව පවත්වාගෙන යෑම, අපනයන ආදායම, විදේශ ප්‍රේෂණ, සංචාරක ව්‍යාපාරය ගැන අපි උදේ ඉඳලා ගොඩක් කථා කළා. ඒ වාගේම, මේ අභියෝග මධ්‍යයේ වුණත් අපි මාර්කට් එක හකුළන්නේ නැතිව වෙළෙඳ පොළ ප්‍රසාරණය කරමින්, ආර්ථිකය ප්‍රසාරණය කරමින්, ආර්ථිකය පවත්වාගෙන යෑම පිළිබඳව සාකච්ඡා කරනවා. විශේෂයෙන්ම ලෝකයේ ගෝලීය අර්බුදයක් තිබෙනවා. ඒ කියන්නේ, අපි දන්නවා මේ අර්බුදය නිසා ලෝකයේ සැපයුම් දාම කඩාගෙන වැටිලා තිබෙනවා. අතිවිශාල රටවල් ප්‍රමාණයක මුදල් අවප්‍රමාණය වෙමින් පවතිනවා. විශේෂයෙන් ඉන්ධන සහ තෙල් අර්බුදය නිසාම උද්ධමනය ඉහළ යමින් පවතිනවා. මේ හැම ආර්ථික අර්බුද අවස්ථාවකම එහි සම්පූර්ණ බර ජනතාවට නොදැනෙන්න ආර්ථිකය නිසි ලෙස කළමනාකරණය කර ගනිමින් සිටින බව උදේ ඉඳලා සිදු කළ කථාවල කියපු නිසා මම නැවතත් එය අවධාරණය කරන්නට යන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් මේ හැම එකටම දායකත්වය දෙන්නේ කවුද? ඒ, වැඩ කරන පන්තියේ ජනතාව. අපේ මේ සාර්ව ආර්ථිකයේ වර්ධනය වැඩ කරන ජනතාවට බලපාන්නේ කොහොමද? මහ බැංකු වාර්තාව අනුව ශ්‍රම බලකායේ සහභාගිත්ව අනුපාතය 2024දී සියයට 47.4යි. ඒක 2025දී සියයට 49.4ක් වෙලා තිබෙනවා. ශ්‍රම බලකායට ස්ත්‍රීන්ගේ තිබෙන දායකත්වය 2024දී සියයට 29.8යි. එය 2025දී සියයට 32.5ක් ලෙස වර්ධනය වෙලා තිබෙනවා. විරැකියා අනුපාතය 2024දී සියයට 4.4ක්. නමුත්, 2025දී අපි එය සියයට 3.9ක් දක්වා අඩු කරගෙන තිබෙනවා. විශේෂයෙන්ම කාන්තාවන්ගේ විතරක් නොවෙයි, සමස්තයක් හැටියට ගත්තත් ශ්‍රම දායකත්වය තවත් ඉහළ නංවන්න අවශ්‍යයි කියලා අපි දන්නවා. ඒ වෙනුවෙන් අපි වැඩ කරගෙන යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකද, අපේ ප්‍රතිපත්තිය තිබුණේ නිෂ්පාදන ආර්ථිකයක් සෑදීමයි. ඒ නිෂ්පාදන ආර්ථිකයට සියලු කොටස් සම්බන්ධ කර ගැනීම; එහි ප්‍රතිලාභ සාධාරණව සියලු සමාජ කණ්ඩායම් අතර බෙදී යෑමට අවශ්‍ය ආකාරයට කටයුතු කිරීම තමයි අපේ ප්‍රතිපත්තිය.

ඒ නිසා මේ සක්‍රිය ශ්‍රම බලකායේ ප්‍රමාණය විතරක් නොවෙයි, ඔවුන්ගේ ධාරිතාව, ඵලදායිතාව වැඩි කර ගනිමින් මේ නිෂ්පාදන ආර්ථිකයේ ඵලදායිතාව සාධාරණ ලෙස ජනතාව අතට බෙදා දීම තමයි අපේ දීර්ඝ කාලීන ආර්ථික දැක්ම සහ අපේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ. ඒ නිසා අපේ කර්මාන්ත ක්ෂේත්‍රය සියයට 7.8කින් වර්ධනය වෙලා තිබෙනවා. කෘෂි කර්මාන්තය සහ ධීවර කර්මාන්තය සියයට 1.4කිනුත්, සේවා අංශය සියයට 3.3කිනුත් වර්ධනය වෙනවා කියලා මහ බැංකු වාර්තා අපට පෙන්වා දෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ සාර්ව ආර්ථික

[ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය]

වර්ධනයත් අනෙක් අතට return එකක් විධියට වැඩ කරන ජනතාවට අපි ලබා දීලා තිබෙනවා. විශේෂයෙන්ම වැටුප් වැඩි කිරීම සහ resilience එක බලන්න. වැටුප් වැඩිවීම හරහා මේ වාගේ අර්බුදකාරී අවස්ථාවකදී පවා වැඩ කරන ජනතාව තුළ භාණ්ඩ හා සේවා ලබා ගැනීමට ඇති හැකියාව වැඩි කිරීම වාගේම ආර්ථිකව දුෂ්කර තැනක ඉන්න ජනතාවට ලබා දීලා තිබෙන සහනවලිනුත් ඔවුන්ට අවශ්‍ය ආරක්ෂාව අපි සපයා තිබෙනවා. විශේෂයෙන් ආන්තික කණ්ඩායම්වලට - vulnerable groupsවලට - සහන සැලසීම මඟින් අපි ඔවුන්ව ආරක්ෂා කරගෙන තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමියනි, ඔබතුමියට නියමිත කාලය දැන් අවසානයි.

**ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊට අමතරව ඉතිහාසයේ කවදාවත් නැති තරම් මුදල් ප්‍රමාණයක් නිදහස් සෞඛ්‍ය වෙනුවෙන්, නිදහස් අධ්‍යාපනය වෙනුවෙන්, පොදු ප්‍රවාහනය වෙනුවෙන් අපි වෙන් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මෙහෙම තමයි අපි ආර්ථිකය ඉදිරියට අරන් යන්නේ. අපේ මධ්‍ය කාලීන ආර්ථික වර්ධන ඉලක්කය වන සියයට 7 අපි වෙනස් කරගෙන නැහැ. අපි විශ්වාස කරනවා, ඒ ඉලක්කයට ළඟා වෙන්න අපට පුළුවන් කියලා. ඒ නිසා අපි විපක්ෂයෙනුත් බලාපොරොත්තු වන දෙයක් තිබෙනවා. මොකද, දවසින් දවස ඒ අය මොකක් හරි එකක් අල්ලාගෙන කථා කරනවා. වාහන ගෙන්වන්න LCs 4,000ක් විවෘත කළා කියලා දැන් ලොකු බොරුවක් කියාගෙන යනවා. ඒ වාගේ මොනවා හරි කියමින් එදා වේල දේශපාලනය කරන්නේ නැතිව, මෙහි ප්‍රතිලාභ ජනතාවට ලබා දෙන්න දීර්ඝ කාලීනව අපි කරගෙන යන වැඩේ දිහා බලන්න. එහෙම නැතිව දවසින් දවස බොරු වැල්වටාරම්වල එල්ලිලා දේශපාලන විවේචන ගේන්න එපා. සාධාරණ තාර්කික විවේචන හැම එකටම අපි සවන් දෙනවා. ඒ බවත් ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත පුෂ්ප කුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.14]

**ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා**
(மாண்புமிகு வசந்த புஷ்ப குமார)
(The Hon. Wasantha Pushpa Kumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ආදායම් සමාලෝචන වාර්තාව පිළිබඳව ආණ්ඩු පක්ෂය ලෙස අප විසින් ඉදිරිපත් කරන ලද මේ සභාව කල් තැබීමේ විවාදයට එක්වීමට ලැබීම භාග්‍යයක් කොට මා සලකනවා. ඒ වාගේම අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු මන්ත්‍රීවරයකු වන ඔබතුමා මූලාසනයේ ඉන්න වෙලාවේදී මට කථා කරන්න අවස්ථාව ලැබීම ගැනත් මා ගොඩක් සතුටු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා විසින් මේ සභාවේදී මොන අවලාද, මඩ ප්‍රහාර අපට එල්ල කළත්, මේ මහ බැංකු වාර්තාව කියන්නේ දේශපාලන ලියවිල්ලක් නොවෙයි. මෙහි තිබෙන කරුණු, ඒ වාගේම සංඛ්‍යා ලේඛන අපේ රටේ සැබෑ ආර්ථිකයේ හැරවුම් ලක්ෂ්‍ය සනිටුහන් කරනවා. පසුගිය කාලයේ අපේ රටේ පැවති ස්ථාවරත්වය, විනිවිදභාවයෙන් යුත් සහ දූරදර්ශී ආර්ථික ප්‍රතිපත්තිවල සාර්ථකත්වය මේ ලියවිල්ල මඟින් මැනවින් තහවුරු කරනවා. මම මෙතැනදී කරුණු 5ක් ගැන අවධානය යොමු කරවන්න කැමැතියි. ඒකේ පළමුවැනි එක තමයි, අපේ රටේ GDP එක. මේක සියයට 5ක ප්‍රමාණයක තබාගන්න අපට පුළුවන් වුණා. අපි මේ රට බාර ගත්තේ මීට මාස 18කට කලින්. කඩා වැටුණු ආර්ථිකයක් නැවත ගොඩ ගැනීම කියන්නේ ලෙහෙසි පහසු දෙයක් නොවෙයි. නමුත් මේ වාර්තාවෙන් පැහැදිලිවම පෙන්වා දෙනවා, 2025 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය - GDP එක - සියයට 5ක් වැනි ඉහළ මට්ටමක පවතින බව. මෙය අඛණ්ඩව දෙවැනි වර්ෂයටත් පවත්වාගෙන යමින්, අපේ රට ධනාත්මක ආර්ථික වර්ධනයක් කරා අපි අරගෙන ඇවිල්ලා තිබෙනවා.

2025 වර්ෂයේ අග භාගයේදී අපේ රටට ඉතාම දරුණු කාලගුණික තත්ත්වයකට මුහුණ දෙන්න සිදු වුණු බව අප සියලුදෙනාම දන්නවා. ඒ වාගේම වර්ෂයේ අග භාගය වනකොට ලෝක දේශපාලන තත්ත්වයේත් විශාල වෙනස්කමක් සිද්ධ වුණා. නමුත් ඒ සියලු දේවල් මධ්‍යයේ වුවත්, අපේ රටේ ආර්ථිකය ඉතාම හොඳ, සාර්ථක තැනකට අරගෙන එන්න, කළමනාකරණය කරන්න අපට පුළුවන් වුණා. ඇත්තටම අපට ඒක කරගන්න පුළුවන් වුණේ, අපි හදපු දේශපාලන ස්ථාවරත්වය නිසා සහ අපේ රටේ මූල්‍ය කළමනාකරණය අපි ඉතාම හොඳින් කරපු නිසා බව මම මේ සභාවට කියන්න කැමැතියි.

ඒ වාගේම තමයි උද්ධමනය පාලනය කිරීම සහ මිල ස්ථාවරත්වය. විපක්ෂය හැමදාම කිව්වා, අපේ රටේ බඩු මිල වැඩියි කියලා. නමුත් මෙම මහ බැංකු වාර්තාව දිහා බැලුවාම පෙනෙනවා, 2025 වර්ෂයේ මුල් භාගයේදී අපේ depreciation තත්ත්වයක් තිබුණත්, අගෝස්තු මාසයේ සිට උද්ධමනය සාධනීය මට්ටමකින් පවත්වාගෙන යමින්, සියයට 5ක ඉලක්ක සහගත සීමාවක් තුළ රඳවා ගන්න මහ බැංකුව සමත් වෙලා තිබෙන බව. ඒ වාගේම 2025 වර්ෂයට අදාළව බලශක්ති මිල ගණන් සහ ආහාර ද්‍රව්‍යවල මිල ගණන් ස්ථාවර මට්ටමක තබාගන්න අපට පුළුවන් වුණා. නමුත් මේ අවස්ථාව වනකොට ලෝක යුද තත්ත්වය හමුවේ, නැත්නම් මේ අලුත් දේශපාලන තත්ත්වය හමුවේ අපේ රටේ බලශක්ති මිල ගණන්වල යම් වෙනසක් වෙලා තිබෙනවා. ඒක අපේ රටේ අනෙකුත් භාණ්ඩවල මිල කෙරෙහි යම් බලපෑමක් ඇති කරමින් තිබෙනවා. නමුත් ලෝකයේ බොහෝ රටවල තෙල් පෝලිම්, ඒ වාගේම ආර්ථික අර්බුද නිර්මාණය වෙද්දි මේ ලෝක යුද තත්ත්වය හමුවේ වුවත් අපේ රට ඉතාම හොඳ මට්ටමකින් පවත්වාගෙන යනවාය කියලා අපි හැමදෙනාම දන්නවා.

තුන්වැනි කාරණය තමයි, පොලී අනුපාතය පහළ යෑම සහ පෞද්ගලික අංශයේ පිබිදීම. මහ බැංකුව විසින් අනුගමනය කරන ලද ලිහිල් මුදල් ප්‍රතිපත්තිය නිසා රටේ පොලී අනුපාතය සැලකිය යුතු මට්ටමකට පහළට ගෙන එන්න අපට පුළුවන් වුණා. වාර්තාවලට අනුව එහි ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය කැපී පෙනෙන ලෙස ඉහළින් තබන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ඒ වාගේම වාහන ආනයන සීමා ලිහිල් කරන්නත් අපට පුළුවන් වුණා, පසුගිය වසරට අදාළව. ඒ හරහා ව්‍යාපාරික ක්ෂේත්‍රයට, ඒ වාගේම වෙළෙඳ පොළට අලුත් ජවයක් ලැබිලා, වෙළෙඳ පොළ යළි සක්‍රිය වෙන්න පටන් ගත්තා. අපි දැක්කා, ඉතිහාසයේ වෙළෙඳ පොළ හැකිළීමක් කරලා තිබුණු

බව. ඒ නිසා අපේ රටේ ආර්ථිකය හැකිළිලා තිබුණේ. අඩපණ වෙලා තිබුණු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර - SMEs - යළි නැඟිටින තත්ත්වයට පත් කරන්න පුළුවන් වුණා, අපි කරපු ඒ වැඩසටහනත් එක්ක.

ඒ වාගේම මැයි 15 සිට මාස තුනක කාලයකට අදාළව තීරු බදුවල යම් වෙනසක් කරන්න අපට සිද්ධ වුණා, වාහන ආනයනයේදී. ඒක කරන්න අවශ්‍ය වුණේ යම් සීමාසහිත කාලයකටයි. ඒ, පවතින ලෝක තත්ත්වයන් ගැන සංසන්දනය කරමින්. එහෙම නොකර ආණ්ඩුවක් කරන්න බැහැ. නමුත්, සියයට 50කින් තීරු බදු වැඩි කළා වාගේ වෙන පණිවුඩයක් සමාජයට යන විධියට තමයි අද උදේ අදහස් දක්වපු සමහර මන්ත්‍රීවරුන් ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීම් කළේ. මම කියනවා, ඒක වැරදියි කියලා. ඇත්තටම ඒ විධියට ජනතාව නොමඟ යැවීමක් කරන්න හොඳ නැහැ.

හතරවැනි කාරණය, විදේශ සංචිත වර්ධනය. මේ වෙලාව වනකොට අපි ශක්තිමත් බාහිර අංශයක් හදලා තිබෙනවා. අපේ රටේ ජංගම ගිණුමේ අතිරික්තයක් අඛණ්ඩව ඉතාම හොඳ තත්ත්වයෙන් පවත්වාගෙන යන්න 2025 වර්ෂයේදී අපට හැකි වුණා. ඒ වාගේම මෙහි ප්‍රධාන සාධක කිහිපයක් මහ බැංකුව මඟින් අපට පෙන්වා දීලා තිබෙනවා. ලංකා ඉතිහාසයේ වාර්තාගත ඉහළම විදේශ ප්‍රේෂණ ප්‍රමාණය 2025 වර්ෂයේදී රටට ගලාගෙන ඇවිල්ලා තිබෙනවා. එය ඇමෙරිකානු ඩොලර් බිලියන 8.1ක් වාගේ ප්‍රමාණයක්. ඒ වාගේම සංචාරක ව්‍යාපාරයෙන් හා සේවා අපනයන ක්ෂේත්‍රයෙන් ඉහළ ප්‍රගතියක් ලබා ගන්නත් අපට පුළුවන් වුණා. විදේශ ණය සේවාකරණය මධ්‍යයේ වුවත්, විදේශ වෙළෙඳ පොළෙන් ඩොලර් මිලදී ගනිමින් අපේ රටේ විදේශ සංචිත ශක්තිමත් කිරීමට මහ බැංකුව සමත් වුණා. නම්‍යශීලී විනිමය අනුපාත ක්‍රමවේද යටතේ රුපියලේ අගය ඉතාම ස්ථාවර තත්ත්වයකට පත් කර ගන්නත් අපට පුළුවන් වුණා, 2025 වර්ෂයට අදාළව.

පස්වැනි කාරණය, රාජ්‍ය මූල්‍ය විනය හා මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථාවරත්වය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ විනිවිදභාවයකින් යුතුව කටයුතු කරමින්, රාජ්‍ය ආදායම් ප්‍රවර්ධනය කරගෙන, අඛණ්ඩව මේ වසරට අදාළවත් ප්‍රාථමික අය වැයේ අතිරික්තයක් පවත්වාගෙන යන්න අපට පුළුවන් වුණා. ඒ වාගේම අපේ බැංකු හා මූල්‍ය පද්ධතියේ ලාභදායීත්වය සහ ප්‍රාග්ධන සංචිත නීත්‍යානුකූල මට්ටමට වඩා ඉහළින් පවතින බව මහ බැංකුව මේ වනකොට සහතික කර තිබෙනවා. එමෙන්ම අපේ මූල්‍ය පද්ධතිය ඉතා සුරක්ෂිත තත්ත්වයට පත් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම ප්‍රකාශ කරන්න කැමැතියි, 2025 වර්ෂය කියන්නේ, ශ්‍රී ලංකා ආර්ථිකය සරල ස්ථායීකරණයෙන් ඔබ්බට ගිහිල්ලා තිරසර සහ ඔරොත්තු දෙන වර්ධනයක් කරා පරිවර්තනය කරපු ඓතිහාසික වර්ෂයක් බව. ඒ වාගේම දේශපාලන වාසි තකා බොරු, මඩ ප්‍රචාර පතුරු වන විපක්ෂය හැම වෙලාවේදීම අපට අභියෝග කරමින්, උපදෙස් දෙමින් ඉන්නවා, රට කරන්න දන්නේ ඒ පිරිස විධියට. ඔබතුමන්ලාට පුළුවන් නම් මේ මහ බැංකු වාර්තාවේ තිබෙන නිල සංඛ්‍යාලේඛන සහ තොරතුරු බොරු කියලා ඔප්පු කරන්න. මම හිතන විධියට, ඒ ගැන කිසිම කෙනෙක් සඳහනක්වත් කළේ නැහැ. අපේ රජය ගත් නිවැරදි, විද්‍යාත්මක සහ දූරදර්ශී තීරණ නිසා අද දවස වනකොට අපේ රට ඉතාම හොඳ තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා. එබැවින්, රටේ ආර්ථිකයේ සැබෑ ප්‍රගතිය මනාව පිළිබිඹු කරන 2025 වර්ෂයට අදාළ මහ බැංකුවේ වාර්ෂික ආර්ථික සමාලෝචන වාර්තාවට ආණ්ඩු පක්ෂය වෙනුවෙන් මගේ පූර්ණ එකඟතාව සහ සහයෝගය පළ කරන බව සඳහන් කරමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අසෝක සපුමල් රන්වල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.22]

**ගරු අසෝක සපුමල් රන්වල මහතා**
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 වර්ෂයට අදාළව මහ බැංකුව ඉදිරිපත් කර තිබෙන වාර්ෂික ආර්ථික සමාලෝචන වාර්තාව පිළිබඳව අද දින පවත්වන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව සම්බන්ධ විවාදයේදී අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම සතුටට කරුණක්. නමුත් මේ අවස්ථාවේදී විපක්ෂය නියෝජනය කරන එක මන්ත්‍රීවරයෙක්වත් මේ සභාව තුළ නොසිටීම ඉතා බරපතළ අභාග්‍යයක් කියා මා සිතනවා. අපට මේ විධියට සමාලෝචනයක් කරන්න සිද්ධ වෙන්නේ පවතින අර්බුදකාරී තත්ත්වයෙන් පියමං කරන්නයි. අර්බුදයෙන් එහාට පියමං කරන්න නම් අනිවාර්යයෙන්ම ඒ අර්බුදය අපි තේරුම් ගන්න ඕනෑ. 2024 සහ 2025 කියන වර්ෂ දෙක ඉතාම වැදගත් වෙනවා, මේ රටේ ආර්ථිකය තිබුණු තත්ත්වය පිළිබඳව සමාලෝචනය කරන්න සහ අධ්‍යයනය කරන්න. ඒ සඳහා 2024 වර්ෂය තුළත්, 2025 වර්ෂය ආරම්භ වෙනකොටත් ලංකාව මුහුණ දුන් ආර්ථික අර්බුදයේ ගැඹුර පැහැදිලිව තේරුම් ගන්න වුවමනාව තිබෙනවා.

ඒ වාගේම අපට චෝදනාවක් එල්ල වෙනවා, අපි දිගින් දිගටම ඉතිහාසය තුළ සිදු වුණු දේවල් ගැන කථා කරනවා කියලා. හැබැයි, අර්බුදයක් සම්බන්ධයෙන් විග්‍රහ කිරීමේදී එවැනි තක්සේරුවක් නොමැතිව යෙදෙන සමාලෝචනයකින් ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ. අපි දන්නවා, 2015 වර්ෂය වෙනකොට අපේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 5.2කට ආසන්න වෙලා තිබුණු බව. හැබැයි, ඉතාම කෙටි කාලයක් ඇතුළත ඒ වර්ධන වේගය සියයට 2.2 දක්වා ක්‍රමානුකූලව ඇද වැටුණා. ඒක ඉතාම ශෝචනීය තත්ත්වයක්. රටේ ආර්ථික වර්ධන වේගය එකවරම බිඳ වැටීමට ලක් වුණා. ඒ සඳහා බලපෑ කාරණා ගණනාවක්ම තිබෙනවා. ඒ සම්බන්ධයෙන් සොයා බලනකොට දකින්න ලැබුණු කාරණයක් තිබෙනවා. අපේ රටේ ආර්ථික විනාශය ඇති වෙන්න බලපෑවේ ඒ රාජ්‍ය ව්‍යුහය තුළ රාජ්‍ය ආයතන බිඳ වැටීම සහ රාජ්‍ය ආයතනවල තිබෙන දේශපාලනීකරණය කියන එක පැහැදිලිව දකින්න පුළුවන්. එලෙස දේශපාලනීකරණය වීම තුළ ගෝඨාභය රාජපක්ෂ, බැසිල් රාජපක්ෂ, නාමල් රාජපක්ෂ කියන කණ්ඩායමක් විසින් රජය ක්‍රමානුකූලව ඒ කටයුතු මෙහෙයවද්දී ඒ තුළට විවිධ සේවක කොටස් අනියම් කම්කරුවන් විධියට දැමීම නිසා රජයට අපහසුකම්වලට මුහුණ දෙන්න සිදු වුණා. එම නිසාම ඒ රාජ්‍ය පරිපාලනය සම්පූර්ණයෙන්ම බිඳ වැටීමකට ලක් වුණා. ඒ වාගේම ඒ රජයේ ආර්ථික ප්‍රතිපත්තිය නිසි පරිදි තක්සේරු නොකර ඉදිරියට යෑම නිසාත් බිඳ වැටීමකට ලක් වුණා. ඒ සඳහා එම අවධිය තුළ අත්සන් කළ හෙජින් ගිවිසුම වාගේ විවිධ ගිවිසුම්, රජයක් විධියට මුහුණ දුන් දේශපාලන තත්ත්වය, කොවිඩ් වසංගතය වාගේම පාස්කු ප්‍රහාරයත් බලපා තිබෙනවා. කොවිඩ් වසංගතය හැරුණුකොට අනෙක් සියලු දෙයක්ම දේශපාලනික මැදිහත් වීම තුළ උග්‍ර වෙලා තිබෙන බවත් අපට දකින්න ලැබෙනවා. මේකේ අවසාන ප්‍රතිඵලය විධියට මේ කාල සීමාව තුළදී අපේ රට දැවැන්ත ණය කන්දකට හිර වුණා. මේ ණය කන්දට හිර වීම තුළ රට ඉදිරියට ගෙනියන්න බැරි වුණා වාගේම ණය වාරිකය, පොලී වාරිකය ගෙවා ගන්න බැරි වුණා. ඒ අනුව, අපේ රට බංකොලොත් රාජ්‍යයක් විධියට නම් කෙරුණා. ජාත්‍යන්තරය තුළ අපේ රටේ ස්වාධීනත්වය, ස්වෛරීත්වය

[ගරු අසෝක සපුමල් රන්වල මහතා ]

ආර්ථික වශයෙන් අපි අහිමි කර ගත්තා. මේ සියලු කාරණාවල අවසාන ප්‍රතිඵලය විධියට අපේ රටට අත්‍යවශ්‍ය ඉන්ධන ටික, ගෑස් ටික ගෙන්වා ගන්න බැරි වුණා. ඉදිකිරීම් ක්ෂේත්‍රයට අවශ්‍ය සිමෙන්ති ටික, යකඩ ටික අපට ගෙන්වා ගන්න බැරි වුණා. ළදරුවන්ට අවශ්‍ය කිරි පිටි ටික වාගේම කෘෂි කර්මාන්තයට අත්‍යවශ්‍ය පොහොර ටික අපේ රටට ගෙන්වා ගන්න බැරි වුණා. විශේෂයෙන්ම සංවර්ධනයට බලපාන වාහන ටික අපේ රට තුළට ගෙන්වා ගන්න බැරි වුණා. මෙවැනි තත්ත්වයක් තුළ ජනතාවට තවදුරටත් මේ පීඩාව උහුලා ගන්න බැරිව ඔවුන් විවිධ ප්‍රශ්නවලට මුහුණ දුන්නා. තමන්ගේ ආයතනය තුළ පඩි වැඩි කර ගන්න විවිධ වුවමනා පෙරදැරි කරගෙන වෘත්තීය සමිති විධියට ඉස්සරහට ඇවිල්ලා ඔවුන් අරගළ කරන්න පටන් ගත්තා. මේවා පාලනය කරන්න දැඩි මර්දනකාරී ස්වරූපයන් ක්‍රියාත්මක වුණා. ඒ නිසාම කම්කරුවන් තුළ, ශිෂ්‍යයන් තුළ දැවැන්ත අරගළ ඇති වුණා. ඒ අරගළවල ප්‍රතිඵලයක් විධියට රට තව තවත් ආර්ථික අවපාතයකට මුහුණ දුන්නා. මෙවැනි තත්ත්වයක් තමයි 2015 වර්ෂයේ සිට ශීඝ්‍ර ලෙස රට තුළ වර්ධනය වෙලා තිබුණේ. එවැනි තත්ත්වයක් හමුවේ 2024 වර්ෂය තුළ අපට ක්‍රමානුකූලව වැඩ පිළිවෙළක් හදා ගන්න සිද්ධ වුණා. ඒ අනුව එම ආර්ථික අර්බුදයෙන් පියමං කිරීම සඳහා අවශ්‍ය මූලික න්‍යායාත්මක කරුණු ටිකක් අපි රජයක් විධියට සමාලෝචනය කර ගත්තා.

ඒ සමාලෝචනයේදී දකින්න ලැබුණු ප්‍රධාන කාරණයක් තමයි, මහ බැංකුව තුළ, භාණ්ඩාගාරය තුළ ස්ථායීකරණය සම්බන්ධයෙන් මූලිකත්වයක් දී තිබීම. රටක ආර්ථිකය බිඳ වැටිලා තිබෙන බව තේරුම් ගත් පසු ඒ ආර්ථිකයෙන් පියමං කරන්න නම් රටට ස්ථාවරත්වයක් අවශ්‍ය වෙනවා. ඒ ස්ථාවරත්වය පදනම් කරගෙන තමයි මේ වැඩ පිළිවෙළ අපි සමාලෝචනය කර ගන්න ඕනෑ. මේ ස්ථාවරත්වයත් එක්කම විශ්වසනීයත්වයත් රටේ ඇති වෙන්න ඕනෑ. රටේ ජනතාව තුළ කර්මාන්ත ක්ෂේත්‍රය ගැන, සේවා ක්ෂේත්‍රය ගැන, විශේෂයෙන්ම කෘෂි කර්මාන්තය ගැන, අධ්‍යාපනය ගැන වාගේම සෞඛ්‍යය ගැනත් විශ්වාසයක් තිබිය යුතුයි. වැඩ කරන ජනතාව සම්බන්ධවත්, ඒ ආයතනවල සිටින සේවක සේවිකාවන් සම්බන්ධවත් ජාත්‍යන්තරයේ විශ්වාසය දිනා ගැනීමේ වැඩ පිළිවෙළක්ද සකස් කළ යුතුයි. මේ විශ්වාසය, ස්ථාවරත්වය වාගේම රටේ වර්ධනය සම්බන්ධයෙන් උපාය මාර්ගික වැඩ පිළිවෙළක්ද අවශ්‍ය වෙනවා.

මහ බැංකුවේ වාර්ෂික ආර්ථික සමාලෝචන වාර්තාව අධ්‍යයනය කරද්දී ඉතාම පැහැදිලිව, නිරවුල්ව දකින්න ලැබෙනවා, ඒ ස්ථාවරත්වය සහ විශ්වසනීයත්වය පදනම් කරගෙන වර්ධනය සැලසුම් කර තිබෙන්නේ කොහොමද කියලා. ඒ අනුව කෘෂි කර්මාන්තය තුළ සියයට 1.4ක වර්ධන වේගයකුත්, කර්මාන්ත ක්ෂේත්‍රය තුළ සියයට 7.8ක දැවැන්ත වර්ධන වේගයකුත්, සේවා ආර්ථිකය තුළ සියයට 3.3ක වර්ධන වේගයකුත් අපට දකින්න ලැබෙනවා. කෘෂි කර්මාන්තයේ ප්‍රමාණාත්මකභාවය වැඩි කර ගන්න නම් ඉඩම් ප්‍රමාණය වැඩි කර ගන්න ඕනෑ. ඉඩම් ප්‍රමාණය සම්බන්ධයෙන් ගොවියාට අවිනිශ්චිත තත්ත්වයක් තිබුණා; ගොවීන් තුළ විශ්වාසවන්තභාවය බිඳිලා තිබුණා. ගොවීන් සතු ඉඩම් විවිධ ආකාරයෙන් වෙනත් තැන්වලට කොටු වෙලා තිබුණේ. ඇත්ත ඉඩමේ අයිතිය ගොවීන්ට තිබුණේ නැහැ. මේක වෙනස් කරන්න "උරුමය" වැඩසටහන යටතේ කෘෂි කර්මාන්තය ශක්තිමත් කරන වැඩ පිළිවෙළක් යොදා තිබෙනවා. ඒකේ ප්‍රතිඵලයක් විධියට කෘෂි කර්මාන්තයේ යෙදෙන ප්‍රමාණය වැඩි කර ගන්න ලැබුණා විතරක් නොවෙයි, අක්කරයකින් ලබා ගන්නා අස්වැන්න වැඩි කර ගන්නත් තාක්ෂණය අවශ්‍ය වෙලා තිබෙනවා.

මේ බැංකු වාර්තාවල පැහැදිලිව පෙන්වනවා, ඒ තාක්ෂණය වැඩි කර ගන්න මූල්‍යමය ප්‍රතිපාදන කොතරම් ප්‍රමාණයක් එකතු කරලා තිබෙනවාද කියන එක. ඒ නිසා තමයි සියයට 1.4ක ආර්ථික වර්ධනයක් අත්පත් කරගන්න පුළුවන් වෙන්නේ. මේක සෘජුවම රටේ ආහාර සුරක්ෂිතතාවට බලපානවා. ඒ වාගේම රටේ කර්මාන්ත ක්ෂේත්‍රය තුළ සිදු වන මේ දැවැන්ත වර්ධනය සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන්ටත් බලපානවා. ඔවුන් දැඩි අවිනිශ්චිත තත්ත්වයකයි හිටියේ. ඔවුන්ට රජය සම්බන්ධයෙන් තිබෙන විශ්වාසය බිඳිලා තිබුණා; බැංකු සම්බන්ධයෙන් තිබෙන විශ්වාසය බිඳිලා තිබුණා. මේ තත්ත්වය වෙනස් කරන්න යොදපු ශීඝ්‍ර වැඩ පිළිවෙළක ප්‍රතිඵලයක් විධියට තමයි කර්මාන්ත ක්ෂේත්‍රය තුළ සියයට 7.8ක වර්ධන වේගයක් අත්පත් කර ගන්නේ. කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයටත්, කර්මාන්ත ක්ෂේත්‍රයටත් සේවා ක්ෂේත්‍රයේ විශාල සම්බන්ධතාවක් තිබෙනවා. සේවා ක්ෂේත්‍රය තුළ සියයට 3.3ක වර්ධනයක් අත්පත් වීම මේ සියල්ලගේම වර්ධනයට සෘජුවම බලපා තිබෙනවා. මේ සියල්ලගේම අවසාන ප්‍රතිඵලය විධියට 2024දී රුපියල් ට්‍රිලියන 30.1ක්ව තිබුණු දළ දේශීය නිෂ්පාදිතය ට්‍රිලියන 32.8 දක්වා වැඩි කර ගන්න අපට පුළුවන්කම ලැබුණා.

ඒක ඩොලර්වලින් ගත්තොත්, 2024දී ඩොලර් බිලියන 99.6ක ප්‍රමාණය ඩොලර් බිලියන 108.8 දක්වා වැඩි කර ගන්නවා. මේක ඉතිහාසය තුළ වැඩිම වර්ධනයක් විධියට හඳුන්වන්න පුළුවන්. ඒක රටේ ආර්ථිකයේ ස්ථාවරත්වයට ඉතාම වටිනා සේවාවක් ඉෂ්ට කරලා තිබෙනවා. ඒ වාගේම 2024 වෙනකොට රටේ ඒක පුද්ගල ආදායම ඩොලර් 4,596යි. එය 2025 වෙනකොට ඩොලර් 5,003 දක්වා වර්ධනය කර ගන්න අපට පුළුවන්කම ලැබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න. කාලය අවසානයි.

**ගරු අසෝක සපුමල් රන්වල මහතා**
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

රටේ ආර්ථිකය සම්බන්ධව අපි කථා කරද්දී, වර්ධන වේගයේ අනුපාතයන් ගනිද්දී, 2024දී රාජ්‍ය ආදායම සියයට 13.6 ඉඳන් 2025 වෙනකොට එය සියයට 16.7ක විශාල වැඩිවීමක් දක්වා වර්ධනය කරනවා. ඒ වාගේම අය වැය පරතරය ඉතිහාසයේ කවදාවත් නොවූ විරූ විධියට වෙනස් වෙලා තිබෙනවා. සියයට 6.8ක තිබුණු අය වැය පරතරය 2025දී සියයට 2.3ක් දක්වා වෙනස් වෙනවා. ඒ වාගේම ප්‍රාථමික ශේෂය ගත්තොත්, එක මන්ත්‍රීතුමෙක් පැහැදිලි කළා, ප්‍රාථමික ශේෂය හයයි දශම ගාණක් කියලා. ඒක වැරදියි. ප්‍රාථමික ශේෂය සියයට 2.2 ඉඳන් සියයට 5.4 දක්වා වූ වර්ධනයක් පෙන්නුම් කරනවා. මේ සියලු කාරණා එකට ගත්තාම අපට රටක් විධියට වසන්තය උදා වෙමින් පවතිනවා කියලා ඉතාම පැහැදිලිව, නිරවුල්ව පෙනෙනවා. ඉතාම දුෂ්කර තත්ත්වයන් පසුකරගෙන, ඒ දුෂ්කර තත්ත්වයන් තුළ විධිමත් ක්‍රමෝපාය සකසා ගෙන අද වෙනකොට ඒ වසන්ත කාලය මේ රටට උදාවෙමින් පවතිනවා. ඒකට බාධා කිරීම කියන්නේ අපේ අනාගත පරම්පරාවට කරන ඉතාම බරපතළ විනාශකාරී තත්ත්වයක්. ඒ වාගේම රටේ ජනතාවත් - ගොවි ජනතාව ඇතුළු රටේ සමස්ත වැඩ කරන ජනතාවත් - මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න අත්වැල් බැඳගෙන ඉදිරියට යන මොහොතක ඒ සම්බන්ධව අපි පාර්ලිමේන්තුව තුළ මේ සමාලෝචනය කරද්දී, අද විපක්ෂයේ කිසිදු මන්ත්‍රීවරයෙක් නොමැතිවීම බරපතළ අභාග්‍යයක් බවත් පෙන්වා දෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.33]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදය තුළ තිබෙන්නේ, ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳව මහ බැංකුව විසින් ඉදිරිපත් කරන ලද විමර්ශන වාර්තාව පාදක කරගෙන 2025 වසරේ ආර්ථික ප්‍රගතිය මොන ආකාරයෙන්ද කියන සාකච්ඡාවයි. නමුත් මේ මොහොත වන විට විපක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙක් සභා ගර්භයේ නැහැ. කෙසේ වෙතත්, මම පළමුකොට මේ ආර්ථික ප්‍රගතිය පිළිබඳ සාරාංශයක් සභාවට ඉදිරිපත් කරන්න කැමැතියි. මොකද, අපට තිබිච්ච අභියෝගය හමුවේ රට ස්ථාවර කරලා තිබෙනවා. ඒ ස්ථාවර කිරීම විතරක් නොවෙයි, 2025 වර්ෂයේදී සිද්ධ කර ගන්නේ. 2025 වර්ෂයේදී ස්ථාවරත්වයෙන් ඔබ්බට ගිහිල්ලා සියලු ආර්ථික දර්ශක ඉහළ මට්ටමකට ළඟා කරගන්න අපි සමත් වුණා. සමහර ආණ්ඩු කරන කාලවල සමහර වර්ෂ තිබෙනවා, සමහර ආර්ථික දර්ශක හොඳයි. සමහර ඒවා හොඳ නැහැ. හැබැයි, මේ ආර්ථික දර්ශක ගත්තාම, ඒ සියලු ආර්ථික දර්ශක ඉතාම ඉහළ මට්ටමක තිබෙනවා. සාරාංශයක් විධියට ගත්තාම, රටක ආර්ථික වර්ධනය -economic growth එක - ඉතාම වැදගත් වෙනවා. 2025ට පුරෝකථනය කළේ 3.5ක ආර්ථික වෘද්ධියක් ලබා ගත්තොත් ඇති කියන මට්ටම. මොකද, අපි අර්බුදයකින් ගොඩට එමින් හිටියේ. හැබැයි, අපට පුළුවන් වුණා, සියයට 5ක ආර්ථික වර්ධනයක් අත්පත් කර ගන්න. අඛණ්ඩව හැම කාර්තුවේම ඒ වර්ධනය අත්පත් කරගෙන තිබුණා.

ඒ වාගේම තමයි ඒකපුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඩොලර් 5,000 ඉක්මවා තිබෙනවා. එතකොට විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් සඳහන් කළා, මේ ඩොලර් 5,000 දැන් තියෙන rate එකට ගණන් හදලා බැලුවාම අඩු වෙනවා කියලා. සමහර අංක ගණිතමය දේවල් සංකල්ප විධියටත් වැරදියි. මොකද අද තියෙන අනුපාතයට 2025 වර්ෂයේ තිබුණ දළ දේශීය නිෂ්පාදිතය ආපසු ගණන් හදලා බෙදන එක වැරදියි. ඇත්තටම මේ ගණන් අනුපාතයට ගණන් හදලා බලන්න ඕනෑ නම්, මේ මාස හතරේ දළ දේශීය නිෂ්පාදිතය මේකට එකතු කරන්න ඕනෑ. ඒ නිසා ගොඩක්දුරට වැරදි අදහස් සමාජගත කරනවා.

ඒ වාගේම තමයි මුදල් ප්‍රතිපත්තිය ඉතාම වැදගත් ආර්ථික ස්ථාවරත්වයකදී. අපි මුල සිටම කිව්වා, මේ වර්ෂය පුරාවටම අපි මූල්‍ය වෙළඳපොළේ ස්ථාවරත්වය අත්පත් කර ගන්න ප්‍රතිපත්ති පොලී අනුපාතය, තැන්පතු සඳහා සියයට 7.25ක්, ණය සඳහා සියයට 8.25ක් කියන එක. ඒ අනුපාතයන් මේ වර්ෂයේ ස්ථාවර වෙලා තිබෙනවා. එහි ප්‍රතිඵලයක් විධියට ණය දීමේ අනුපාතය, සාමාන්‍ය ණය අනුපාතය සියයට 10ට වඩා අඩු මට්ටමකින් පවත්වාගෙන යන්න අපට පුළුවන් වෙලා තිබෙනවා.

ඒ වාගේම විදේශ අංශයේ ක්‍රියාකාරිත්වය ඉතාම වැදගත්, ජාත්‍යන්තරව අපි ගනුදෙනු කරනකොට. මොකද, අපට අවශ්‍ය කරන ආනයන ටික ගෙන්වා ගන්න ඕනෑ. අපි යම් ආයෝජනයක් කරනවා නම්, ඒ සඳහා ඩොලර් අවශ්‍ය කරනවා. ඒ වාගේම ලබා ගත්ත ණය අපි ආපස්සට ගෙවන්නට ඕනෑ. ඒ සඳහා ශක්තිමත් පදනමක් අපට සපයන්නේ අපනයන වර්ධනයෙන්. ඒ නිසා 2025දී විදේශ අංශයෙන් සැලකිය යුතු අපනයන වර්ධනයක් අත් පත් කරගෙන තිබෙනවා.

ඒ වාගේම සංචාරකයන්ගෙන් ඩොලර් ඉපැයීම අපට ඉතාම වැදගත්. 2025 වර්ෂයේදී සංචාරකයන්ගේ පැමිණීම 2,360,000ක් දක්වා වැඩි වෙලා, සැලකිය යුතු ආකාරයට සංචාරකයන්ගෙන් ඩොලර් ඉපැයීම වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි, කැපී පෙනෙන ලෙස විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඩොලර් බිලියන 8.1 දක්වා වැඩි වෙලා තිබෙනවා. මේ ඉපැයීම් - ඩොලර් වැඩිවීම - ප්‍රධාන වශයෙන් මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න දායක වෙලා තිබෙනවා. එහි ප්‍රතිඵලයක් විධියට 2025 වර්ෂය වාර්තාගත වෙනවා, ඉතිහාසයේ විදේශ අංශයේ ජංගම ගිණුමේ වැඩිම ශේෂය තිබුණු වර්ෂය හැටියට. අපි ඒකට සාමාන්‍යයෙන් කියනවා, ගෙවුම් ශේෂ තුලනය කියලා. ඒ ගෙවුම් ශේෂ තුලනයේදී කරන්නේ රටක් විධියට බාහිර ලෝකයත් එක්ක කරන ලද ඩොලර් ලැබීම් හා ඩොලර් ගෙවීම් තුලනය කර ගැනීම. ඒ තුලනය කර ගැනීමට පාදක වෙන ප්‍රධානම දේ තමයි ජංගම ගිණුම. ජංගම ගිණුමේ අතිරික්තයක් එනවා නම්, අපට අතිරික්ත ඩොලර් ප්‍රමාණයක් ඉතිරි වෙනවා. ඒ ඩොලර් ප්‍රමාණය පාවිච්චි කරලා අපට ආයෝජනය කරන්න පුළුවන්, වැඩිපුර ආනයනය කරන්න පුළුවන්, ඊළඟ අවුරුද්දේදී ණය ගෙවීම් සිද්ධ කරන්න පුළුවන්. 2025 වර්ෂයේදී ඩොලර් බිලියන 1.73ක ජංගම ගිණුමේ අතිරික්තයක් ඇති වෙලා තිබෙනවා. ඒක ඉතිහාසයේ වාර්තාගත වැඩිම ප්‍රමාණය වෙනවා. ඒ තත්ත්වය ඉදිරියට ගෙනියන්න තමයි, අපි මේ ස්ථාවරත්වය ඇති කරගෙන ඇවිල්ලා තිබෙන්නේ.

ඊළඟට, අපි පෞද්ගලික අංශයට ලබා දුන් ණය පිළිබඳව අවධානය යොමු කරමු. අපි ආර්ථික ප්‍රගතියක් පිළිබඳව සාකච්ඡා කරනකොට, ආණ්ඩුව පැත්තෙන් අපට දුන්නු රාජ්‍ය මූල්‍ය, ඒ බදු මුදල් ටික හරියට කළමනාකරණය කරලා, ආණ්ඩුව පවත්වා ගෙන යන්න, රාජ්‍ය ආයතන පවත්වා ගෙන ගිහිල්ලා හොඳ සේවයක් කරන්න වියදම් ප්‍රමාණයක් කරනවා. ඒ තමයි පුනරාවර්තන වියදම්. මිනිස්සුන්ගේ පඩි-නඩි වැඩි කරලා තිබෙනවා. දැන් කවුරුවත් කථා කරන්නේ නැහැ, පඩි වැඩිවීම පිළිබඳව. 2025, 2026 හා 2027 දක්වාම අවුරුද්දකට රුපියල් බිලියන 110ක් අපි අය වැයට අලුතින් එකතු කරනවා ඒ වෙනුවෙන්. ඒ ආකාරයට ආණ්ඩුවෙන් ජාතික ආර්ථිකයට දෙන්න ඕනෑ තල්ලුව උපරිම ආකාරයට දීලා තිබෙනවා.

ඒ වාගේම ප්‍රාග්ධන වියදම් ගැනත් කථා කරන්න ඕනෑ. මුල ඉඳලාම විපක්ෂයෙන් චෝදනා කළා, ප්‍රාග්ධන වියදම් වෙන්නේ නැහැ, සියයට 10යි, 15යි වෙන්නේ කියලා. අපට සියයට 76ක ප්‍රාග්ධන වියදම් සිද්ධ කරන්න පුළුවන් වුණා. ආණ්ඩුවෙනුත් ජාතික නිෂ්පාදනයට විශාල දායකත්වයක් දුන්නා. පෞද්ගලික අංශයේ දායකත්වයේ කැපී පෙනෙන වර්ධනයක් තිබෙනවා. 2024 වර්ෂයට සාපේක්ෂව පෞද්ගලික අංශයේ ණය ලබා ගැනීම් වැඩි වෙලා තිබෙනවා. බැංකු පද්ධතියෙන් ණය ලබා ගන්නවා කියලා කියන්නේ, බැංකු නිකම් සල්ලි දෙන්නේ නැහැ. ඔවුන් බලනවා, ඒ ණය ආපසු ගෙවන්න පුළුවන්ද, ඒ ණය ආපසු ගෙවන්න ඔවුන්ට ඉපැයීම් ශක්තියක් තිබෙනවාද, ආර්ථික ක්‍රියාවලියක් තිබෙනවාද කියලා. එහෙම තිබෙනවා නම් තමයි ණය දෙන්නේ. 2025 වර්ෂයේදී රුපියල් බිලියන 2,056ක්, ට්‍රිලියන 2කට වැඩි ප්‍රමාණයක් ණය දීලා තිබෙනවා. ඒ ප්‍රවණතාවත්, ඒ ණය ලබා ගැනීමත් පසුගිය මාස තුනේ ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. එහෙම නම් පෞද්ගලික අංශයත් මේ ආර්ථික වර්ධනයට ඉතා විශිෂ්ට ලෙස දායක වෙලා තිබෙනවා.

ඒ වාගේම තමයි, රාජ්‍ය මූල්‍ය අංශය පවත්වා ගැනීමට අපි නිරන්තරයෙන්ම කියපු විධියට, අපි සැලසුම් කරපු ආකාරයට බදු

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා ]

මුදල් එක්රැස් කර ගත්තා, කළමනාකරණය සහිතව වියදම් කර ගත්තා. අපට පුළුවන් වුණා, අය වැය පරතරය ඉතිහාසයේ අඩුම අය වැය පරතරය බවට පත් කරලා, අපේ අතිරේක ණය ගැනීම් අඩු කර ගන්න. මෙවැනි ස්ථාවරත්වයක් අත්පත් කරගෙන තමයි, අපි 2026 වර්ෂයට පිවිසුණේ. ඒ පිවිසෙන කොටම අපට අනපේක්ෂිත විධියට අභ්‍යන්තරව පැන නැඟුණු "දිට්වා" සුළි කුණාටුව ආවා. ඒක බාහිර සාධකයක්. ඒක රටේ පරිපාලනය විසින් ගත්ත තීන්දුවක් නොවෙයි. "දිට්වා" සුළි කුණාටුවෙන් අභියෝගයක් ආවා. ඒ අභියෝගයටත් අපි නිසි පරිදි මුහුණ දීලා, මූල්‍ය විනය, මූල්‍ය කළමනාකරණය නිසා අතිරේකව ඉතිරි කර ගත්ත මුල් සංචිත භාවිත කරලා, රුපියල් බිලියන 500ක් ඒ සඳහා යොදවලා ඒ ජනතාව බේරා ගැනීම සඳහා විශාල වැඩ පිළිවෙළක් කළා. ඒ තත්ත්වයට මුහුණ දෙනකොට ලෝකයටම බලපාන තත්ත්වයක් වශයෙන් යුද තත්ත්වයක් නිර්මාණය වුණා. ඒ යුද තත්ත්වයේදී තමයි, සැලසුම් සහගත ආර්ථික වෘද්ධි තත්ත්වයන්ට යම් බලපෑමක්, ඒ වාගේම විදේශ විනිමය පිළිබඳ යම් බලපෑමක් පිළිබඳ සාකච්ඡාව එන්නේ. එය හුදෙක්ම අපේ පාලනයෙන් තොර කාරණයක්.

ඒ වාගේම උදේ වරුවේ අදහස් දක්වපු විපක්ෂයේ මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන්ගෙන් මතු වෙච්ච කරුණු කිහිපයකටත් මම පිළිතුරු දෙන්න කැමැතියි. එහිදී විශේෂයෙන් හයක් හදනවා, මේ ආණ්ඩුව බිඳ වැටෙයි, ඩොලරය පාලනය කර ගන්න බැහැ, ණය විශාල ප්‍රමාණයකින් වැඩි වෙලා තිබෙනවා කියලා. විපක්ෂයේ මන්ත්‍රීවරුන් සඳහන් කළා, රුපියල් ට්‍රිලියන 5කට වැඩි ප්‍රමාණයකින් ණය වැඩි වෙලා කියලා. මම විපක්ෂයේ රවී කරුණානායක මන්ත්‍රීතුමාගෙන් ප්‍රශ්න කළා, ඒ දත්ත ලබා ගත්තේ කොහෙන්ද කියලා. බොහෝදුරට ඒ දත්ත වැරැදි මාර්ගවලින් ලබා ගන්නවා වෙන්න පුළුවන්. අපි දන්නේ නැහැ. අපට විශ්වාසය තබන්න පුළුවන් වෙන්නේ, නිල වශයෙන් ලබා දෙන දත්ත පිළිබඳවයි. මේ දත්ත ලබා ගෙන තිබෙන්නේ, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරියගෙන්. ඒ දත්ත අනුව ඉතා පැහැදිලිව පෙන්නුම් කරනවා, මේ ස්ථාවරත්වය සඳහා අපේ මධ්‍ය කාලීන ණය ලබා ගැනීමේ උපාය මාර්ගය කොයි විධියටද සකස් වෙලා තිබෙන්නේ කියලා. 2024 වර්ෂය අවසාන වනකොට සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 29,620යි; ට්‍රිලියන 29යි. ඒක ට්‍රිලියන 31 දක්වා වැඩි වෙලා තිබෙනවා 2025 දෙසැම්බර් 31 වනකොට. එය සැලකිය යුතු ප්‍රමාණයක්. හැබැයි ණය වර්ධනය කර ගන්න වෙනවා, සැලසුම්සහගතව. නමුත් අපි පාලනය වෙලා තිබෙනවා. 2026 අප්‍රේල් 30වන දා වනකොට ඒ ණය ප්‍රමාණය ට්‍රිලියන 30.82 දක්වා අඩු වෙලා තිබෙනවා. සමස්තයක් වශයෙන් ගත්තාම මේ මුළු කාල පරිච්ඡේදයේම ණය වැඩි වෙලා තිබෙන්නේ රුපියල් ට්‍රිලියන 1.2කින්. එහෙම නම් අපි දන්නේ නැහැ ණය ට්‍රිලියන 5ක් කියලා බොරු කියන්නේ ඇයි කියා.

අනෙක් පැත්තෙන්, ඔවුන්ටම තර්ක කර ගන්න පුළුවන්. මොකද, රාජ්‍ය මූල්‍යය වග කියනවා මේ පාර්ලිමේන්තුවට. අපට ණය ගන්න පුළුවන් කොයි සීමාවකද? මේ ණය ගෙවමිනුයි ආපහු ණය ගන්නේ. අප ආපහු ණය ගෙවන්නේ නැතිව උපරිම ණය ගත්තත් අපට 2025 වර්ෂයේදී ගන්න පුළුවන් වන්නේ රුපියල් බිලියන 3,740යි. ඒ ප්‍රමාණය තමයි පාර්ලිමේන්තුව අය වැයේදී අනුමත කළේ. අඩුම ගාණේ ඒ සංඛ්‍යාව දිහාවත් බැලුවා නම් කිසි කෙනෙක් මේ වැරැදි ප්‍රවෘත්තිය මතු කරලා ට්‍රිලියන 5ක් -බිලියන 5,000ක්- ණය ගත්තා කියන්නේ නැහැ. එහෙම කියන එක වැරැදියි. මොකද, එහෙම ණය අරගෙන තිබෙනවා නම් අපි වැරැදි වැඩක් කරලා තිබෙන්නේ, පාර්ලිමේන්තුව ණය අනුමත කළ සීමාවට එහා ගිහිල්ලා. විපක්ෂයේ සමහරුන් මේ ඉදිරිපත් කර තිබෙන්නේ හිතාමතාම නොමග යවන දත්ත.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ණය සම්බන්ධයෙන් කථා කරද්දී විශේෂ කාරණයක් කෙරෙහි අවධානය යොමු කරන්න ඕනෑ. අපේ උපක්‍රමය තමයි විදේශීය ණය පංගුව අඩු කර ගැනීම. ඒ බව දත්තවලින් පෙනෙනවා. විදේශීය ණය පංගුව ඩොලර්වලින් 2024 දෙසැම්බර් 31වන දා වන විට තිබෙන්නේ, බිලියන 36.68යි. 2025දී එය බිලියන 37.46ට වැඩි වෙලා නැවත 2026 අප්‍රේල් වනකොට බිලියන 35.64කට අඩු වෙලා තිබෙනවා. සමස්තයක් වශයෙන් ගත්තාම ඩොලර් ණය ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා, මේ කාල පරිච්ඡේදයේදී. එහි අපේ උපක්‍රමය මොකක්ද? අපේ උපාය මාර්ගය මොකක්ද? දේශීය ණය තුළත් ප්‍රධාන ණය වර්ග දෙකක් තිබෙනවා. ඒවා තමයි, භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර. භාණ්ඩාගාර බිල්පත් කියන්නේ කෙටි කාලීන ණය. අපි තිරසාරත්වයට යන්න නම් කෙටි කාලීන ණය ප්‍රමාණය අඩු කර ගනිමින් ස්ථාවර පොලී අනුපාත යටතේ, පාලනය කළ පොලී අනුපාත යටතේ දිගු කාලීන ණය ලබා ගන්න ඕනෑ. අපි ඒ වැඩ පිළිවෙළත් මේ කෙටි කාල පරිච්ඡේදයේදී යොදා තිබෙනවා. මම එය පෙන්වන්නම්. භාණ්ඩාගාර බැඳුම්කර 2024දී තිබුණා ට්‍රිලියන 14.14ක්. 2025දී අපි එය වැඩි කරගෙන තිබෙනවා ට්‍රිලියන 15.57කට. 2026 අප්‍රේල් වනකොට එය වැඩි කරගෙන තිබෙනවා, ට්‍රිලියන 15.9කට. ක්‍රමිකව දිගු කාලීන බැඳුම්කර වැඩි කර ගන්නවා. හැබැයි ඒකට ප්‍රතිපක්ෂව කෙටි කාලීන බිල්පත් අඩු කර ගන්නවා. එය 2024දී තිබුණේ ට්‍රිලියන 4.07යි; 2025දී 3.214යි; 2026 අප්‍රේල් වනකොට 2.8යි. අඩුම වශයෙන් මේ සංඛ්‍යා දත්ත ලේඛනයවත් බැලුවා නම් පෙන්නුම් කරනවා, අප කොහොමද ණය තිරසරභාවයෙන් යුතුව ඉදිරියට ගමන් කරමින් ඉන්නේ කියන එක. ඒ වාගේම මේ ණය තිරසරභාවය අපට වැදගත් වෙනවා, වැඩසටහනක් ඇතුළේ අප ඉන්න නිසා.

2032 වනකල් අපට සැලැස්මක් තිබෙනවා. ඒ සැලැස්ම තුළ 2032 වනකොට දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට අපේ ණය ප්‍රමාණය සියයට 95ක් විය යුතුයි. දැන්මම - 2026දීම - අපි ඒ ඉලක්කය සම්පූර්ණ කර ගන්නවා. 2032 වනකල් ඉන්නේ නැහැ 2026දීම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට අපේ ණය ප්‍රමාණය සියයට 94.5ට ගෙන ඒමේ සැලැස්ම තිබෙනවා. ඒ වාගේම 2027, 2028, 2029 සහ 2030 වනකොට - 2032ට කලින් - එහි පුරෝකථනය තිබෙන්නේ සියයට 86.4ක් ලෙසයි. මේ පෙන්නුම් කර තිබෙන්නේ ණය කළමනාකරණය කර ගැනීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ඉදිරිපත් කළ ගොඩක් විවේචන තුළ විනිමය අනුපාතය අවප්‍රමාණ වීම පිළිබඳ ගැටලු ගණනාවක් කිව්වා. එහිදී සමාජය නොමඟ යවන වැරැදි තොරතුරු කිව්වා. එකක් තමයි, වාහන 4,000ක් ගෙන්වූවා කියපු එක. මම ඒ දත්ත ඉදිරිපත් කරන්නම්. මැයි මාසයේ 15වන දා වාහන 4,000ක් ගෙන්වූවා කිව්වා. වාහන 4,000ක් ගෙන්වන්නේ කොහොමද? නිල දත්ත ලේඛනවලට අනුව තිබෙනවා ආපු සමස්ත වාහන ප්‍රමාණය 1,782යි කියලා. ඒ අනුව සම්පූර්ණයෙන්ම වැරැදි ප්‍රවෘත්තියක් තමයි එතුමන්ලා ඉදිරිපත් කළේ. එය සමාජය නොමග යවනවා. එතුමන්ලා කිව්වේ මොකක්ද? මැයි 15වන දා වාහන 4,000ක් ගෙනාවා, කාට හරි insider information දීලා ලාභයක් සොයා ගත්තා කියලා. එය සම්පූර්ණයෙන් වැරැදියි. ගෙනැල්ලා තිබෙන්නේ වාහන 1,782යි. හැබැයි, ඊට කලින් වාහන 7,000 ගණන් ගෙනැල්ලා තිබෙනවා. ඒ කියන්නේ සාමාන්‍ය තත්ත්වයේදී. ඒ විතරක්ම නොවෙයි, හාස්‍යයට කාරණය මේකයි. අදාළ බදු වැඩි කළාට පස්සේ මැයි මාසයේ 18වන දා ගෙන්වා තිබෙනවා, වාහන 9,429ක්. බදු වැඩිපුර ගෙවන්නයි ඒවා ගෙනැල්ලා තිබෙන්නේ. ඒ 1,782 පවා සාමාන්‍ය ක්‍රියා පටිපාටිය තුළ ගෙනාවා මිස කිසිදු ආකාරයකට තොරතුරු යවලා ගෙන්වපු ඒවා නොවෙයි. විපක්ෂයේ අයට සමහර විට සැකයක් ඇති. මොකද, ඒගොල්ලන්ගේ ආණ්ඩු කාලයේ insider information පාවිච්චි කරලා කරපු දේවල් ගොඩක් තිබෙනවා. ඒ නිසා හිතනවාද දන්නේ නැහැ, අපේ ආණ්ඩුවත් එහෙම ක්‍රම භාවිත කරනවා කියලා. කිසිදු ආකාරයකට ඒක වෙන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු අමාත්‍යතුමා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉක්මනින් කථාව අවසාන කරන්නම්.

මෙයින් පෙන්නුම් කරනවා, අපේ ආණ්ඩුව 2025 වර්ෂයේදී අත්පත් කර ගත් ස්ථාවරත්වය. ඒ විතරක් නොවෙයි. අපි ඒ ස්ථාවරත්වයෙන්ම 2026 වර්ෂයේදීත් දිගින් දිගටම පැමිණෙමින් සිටියා. අපට පාලනය කරන්න බැරි බාහිර සාධකයක් නිසා ඇති වුණු බලපෑම පවා සම්බන්ධ වෙලා තිබෙන්නේ විදේශ විනිමය අනුපාතයටයි. එය පාලනය කිරීමට අපි යම් යම් ආකාරයෙන් ක්‍රියාමාර්ග ගනිමින් සිටිනවා. නමුත්, අපි කලබල විය යුතු නැහැ. මොකද, විදේශ විනිමය අනුපාතය කියන්නේ, සමස්ත ආර්ථිකයේ සියලු දේවල් විනිශ්චය කරනු ලබන, නිර්ණය කරනු ලබන දර්ශකය නොවෙයි. එහි අඩු වැඩි වීමේ වාසි අවාසි දෙපැත්තම තිබෙනවා. අපි උපක්‍රමශීලීව වෙළෙඳ පොළ කළමනාකරණය කරමින් අවශ්‍ය පරිදි තොරතුරු මත පාදක වෙලා මේ ගමන අඛණ්ඩව ඉදිරියට යනවා කියන කාරණය සඳහන් කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.47ට, 2026 මැයි 21වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.47க்கு, பாராளுமன்றம் 2026 மே 21, வியாழக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.47 p.m. until 9.30 a.m. on Thursday, 21st May, 2026.*

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

### ලංකා සතොස විසින් අළෙවි කරන ලද අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ: 2026.03.20 දින මිල අඩු කිරීම
### லங்கா சதொச நிறுவனத்தால் அத்தியாவசிய நுகர்வுப் பொருட்கள் விற்பனை: 2026.03.20ஆம் திகதி விலைக்குறைப்பு
### ESSENTIAL CONSUMER GOODS SOLD BY LANKA SATHOSA: PRICE REDUCTION ON 20.03.2026

1995/2026

**1. ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) 2026.03.20 දින ලංකා සතොස ආයතනය විසින් අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ 100ක් සඳහා ප්‍රකාශයට පත් කළ මිල අඩු කිරීම් සම්බන්ධව -

(i) පාලිත වෙළෙඳ පොළ අනුපාතවලට අඩුවෙන් විකිණීමට හැකි වන පිරිවැය ව්‍යුහය සහ ප්‍රසම්පාදන මිල ගණන් කවරේද;

(ii) එම අඩු කිරීම් සඳහා භාණ්ඩාගාර සහනාධාර, හරස් -සහනාධාර හෝ සැපයුම්කරු ණය විධිවිධාන මඟින් සහාය ලබා දී තිබේද;

(iii) එම වැඩසටහනෙන් පැන නගින මුළු මූල්‍ය පිරිවැය හෝ අවිනිශ්චිත වගකීම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මෙවැනි මිලකරණය හේතුවෙන් පුළුල් සිල්ලර වෙළෙඳ පොළ විකෘති වීම හෝ පෞද්ගලික වෙළෙඳුන්ට අවාසිදායක තත්ත්වයක් ඇති වීම වැළැක්වීමට පියවර ගෙන තිබේද;

(ii) මුදල් ප්‍රවාහ තත්ත්වය සහ සැපයුම්කරුවන්ට සහ ණයහිමියන්ට ඇති මුළු හිඟ බැරකම් ඇතුළුව, 2024 සිට මේ දක්වා ලංකා සතොස ආයතනයේ විගණනය කරන ලද ලාභය/ අලාභය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ක්‍රියාත්මක වන අළෙවි සැල් සංඛ්‍යාව, ඒවායේ භූගෝලීය ව්‍යාප්තිය සහ අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සම්බන්ධයෙන් ඇස්තමේන්තුගත වෙළෙඳ පොළ කොටස, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரிடம் கேட்ட வினா:

(அ) 2026.03.20ஆம் திகதி லங்கா சதொச மூலம் அறிவிக் கப்பட்ட 100 அத்தியாவசிய நுகர்வுப் பொருட்களுக் கான விலைக்குறைப்பு தொடர்பாக -

(i) சந்தைக் கட்டுப்பாட்டு வீதங்களுக்குக் குறைவாகப் பொருட்களை விற்பனை செய்வதற்கு இயலச்செய்த செலவுக் கட்டமைப்பு மற்றும் கொள்வனவு விலைகளையும்;

(ii) இந்தக் குறைப்புக்களுக்குத் திறைசேரி மானியங்கள், குறுக்கு மானியமளிப்பு அல்லது வழங்குநர் கடன் ஏற்பாடுகள் ஆகியவற்றின் மூலம் ஆதரவளிக்கப்படுகிறதா என்பதையும்;

(iii) இந்த நிகழ்ச்சித்திட்டத்திலிருந்து எழுகின்ற மொத்த நிதிச் செலவு அல்லது வருநிகழ்வுக் கடப்பாட்டையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அத்தகைய விலையிடல்மூலம் பரந்த சில்லறை சந்தை திரிபடைவதை அல்லது தனியார் வர்த்தகர்கள் பாதிப்படைவதைத் தடுப்பதற்கான நடவடிக்கைகள் எடுக்கப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) லங்கா சதொசவின், காசுப் பாய்ச்சல் நிலை மற்றும் வழங்குநர்கள் மற்றும் கடன் கொடுநர்களுக்கான மொத்த நிலுவையிலுள்ள பொறுப்புகள் ஆகியவற்றின் வெவ்வேறான

[ගරු රවී කරුණානායක මහතා]

விபரங்களுடன் 2024ஆம் ஆண்டிலிருந்து இற்றை வரையான கணக்காய்வுக்கு உட்படுத் தப்பட்ட இலாபம்/நட்டம்;

(iii) இயங்கி வருகின்ற லங்கா சதொச விற்பனை நிலையங்களின் எண்ணிக்கை, அவற்றின் பூகோள ரீதியான பரம்பல் மற்றும் அத்தியா வசிய நுகர்வுப்பொருட்கள் அடிப்படையில் அவை கொண்டிருக்கின்ற மதிப்பிடப்பட்ட சந்தைப் பங்கு ஆகியவற்றை வெவ்வேறாகவும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House in relation to the price reductions announced by Lanka Sathosa on 20.03.2026 for 100 essential consumer goods-

(i) the cost structure and procurement prices that enable it to sell below controlled market rates;

(ii) whether these reductions are supported by Treasury subsidies, cross-subsidization or supplier credit arrangements; and

(iii) the total fiscal cost or contingent liability arising from this programme?

(b) Will he also inform this House -

(i) whether measures have been taken to prevent such pricing from distorting the broader retail market or disadvantaging private traders;

(ii) the audited profit/loss of Lanka Sathosa from 2024 to date, with details of its cash flow position and total outstanding liabilities to suppliers and creditors, separately; and

(iii) the number of Lanka Sathosa outlets in operation, their geographical distribution and the estimated market share held in respect of essential consumer goods, separately?

(c) If not, why?

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

(අ) (i) • **ඇමුණුම 01හි*** දක්වා ඇත.

(ii) • භාණ්ඩාගාර සහනාධාර, හරස්-සහනාධාර නැත.

• දින 30ක ණය කාල සීමාව ඇතුළත සැපයුම්කරුවන්ට ගෙවීම් සිදු කරනු ලැබේ.

(iii) ඔව්.

<u>මුළු මූල්‍ය පිරිවැය</u>

• මූල්‍ය අලාභයක් නොවන පරිදි ලාභාංතිකය නොවෙනස්ව පවත්වා ගනිමින් සැපයුම්කරුවන් සමඟ සාකච්ඡා කර විශේෂ මිල අඩු කිරීමක් ලබාගෙන ඒ මත විකුණුම් මිල තීරණය කරන ලදී.

<u>අවිනිශ්චිත වගකීම්</u>

• ගොවීන්ගේ ගොවි බිම්වලට ගොස් සෘජුවම අස්වනු මිල දී ගැනීම.
(කැබිනට් අනුමැතිය යටතේ)

• "දිට්වා" වැනි ස්වාභාවික ආපදා හේතුවෙන් අගතියට පත් ජනතාව වෙත සහනාධාර ලබා දීම සඳහා මැදිහත් වීම.

(ආ) ඔව්.

(i) • ජාතියේ මිල තීරක ලෙස සෑම විටම අවම මිලට ගුණාත්මක තත්ත්වයේ භාණ්ඩ ලංකා සතොසට අලාභයක් නොවන පරිදි පාරිභෝගිකයන්ට ලබා දීම සහ පාරිභෝගිකයන්ට ලබා දෙන අපගේ මිල සහනය හේතුවෙන් පෞද්ගලික වෙළෙඳුන්ට අලාභයක් නොවන පරිදි ඔවුන්ගේ භාණ්ඩ අලෙවි කරගත හැකි වීම.

(ii) ඇමුණුම 02 මඟින් පහත පරිදි දක්වා ඇත.

ඇමුණුම - 02

• කාලච්ඡේදය අවසානයේ මුදල් සහ මුදල් සමානතා (2024):
(රුපියල් 4,704,876,716.70) *(සෘණ අගයකි/ බැංකු අයිරාවකි)*

• වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතුදෑ:
රුපියල් 2,724,251,700.06

• කාලච්ඡේදය සඳහා මුළු සර්වග්‍රාහී ආදායම/ (වියදම) - 2024 (කෙටුම්පත්) :
(රුපියල් 842,327,600.00) *(ශුද්ධ අලාභයකි)*

• කාලච්ඡදය සඳහා මුළු සර්වග්‍රාහී ආදායම/ (වියදම) - 2025 (කෙටුම්පත්) :
(රුපියල් 535,915,346.00) *(ශුද්ධ අලාභයකි)*

(iii) • ක්‍රියාත්මක වන අලෙවිසැල් සංඛ්‍යාව - 427
**ඇමුණුම 03***හි දක්වා ඇත.

• ඒවායේ භූගෝලීය ව්‍යාප්තිය ඇමුණුම 04හි දක්වා ඇත. (ඉංග්‍රීසි පිළිතුරේ ඇමුණුම 04 බලන්න. )

• අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සම්බන්ධයෙන් ඇස්තමේන්තුගත වෙළෙඳ පොළ කොටස - 10% - 15%

(ඇ) අදාළ නොවේ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(அ) (i) ***இணைப்பு 01**இல் காட்டப்பட்டுள்ளது.

(ii) திறைசேரி உதவுதொகைகள், குறுக்கு உதவு தொகைகள் - இல்லை.

வழங்குநர்களுக்கு கொடுப்பனவுகள் 30 நாள் கடன் கால எல்லையினுள் செலுத்தப்படுகிறது.

(iii) **மொத்த நிதிச் செலவுகள்:**

நிதி இழப்பு ஏற்படாதவாறு, இலாப வரம்பு மாற்றமின்றி பராமரிக்கப்பட்டதுடன், வழங்குநர்களுடன் பேச்சுவார்த்தை நடத்தப்பட்டு, விசேட விலைக் குறைப்பொன்று பெறப்பட்டு, அதன் அடிப்படையில் விற்பனை விலை நிர்ணயிக்கப்படுகிறது.

**எதிர்பாராத பொறுப்புகள்:**

விவசாயிகளின் வயல்களுக்கு நேரடியாகச் சென்று அறுவடைகளை கொள்வனவு செய்தல். (அமைச்சரவை அங்கீகாரத்தின் கீழ்)

தித்வா போன்ற இயற்கைப் பேரழிவுகளால் பாதிக்கப்பட்ட மக்களுக்கு நிவாரணம் வழங்குவதற்கான தலையீடு.

(ஆ) (i) நாட்டின் விலை நிர்ணய அமைப்பாக, எப்போதும் குறைந்த விலையில் தரமான பொருட்களை லங்கா சதொசவுக்கு எந்த நஷ்டமும் ஏற்படாதவாறு நுகர்வோருக்கு வழங்குதல் மற்றும் நுகர்வோருக்கு நாம் வழங்கும் விலைச் சலுகைகளின் காரணமாக தனியார் வர்த்தகர்கள் தங்களது பொருட்களை எவ்வித நட்டமும் இன்றி விற்க முடிந்தமை.

(ii) பின்வருமாறு காட்டப்பட்டுள்ளது.

இணைப்பு 02

- 2024 காலப்பகுதியின் இறுதியில் காசும் காசுக்குச் சமமானவையும்:
(ரூ. 4,704,876,716.70) (எதிர்மறைப் பெறுமதி/ வங்கி மிகைப்பற்று)
- வர்த்தக மற்றும் ஏனைய கொடுக்கத் தக்கவைகள்:
(ரூ. 2,724,251,700.06)
- 2024 காலப்பகுதியின் மொத்த விரிவான வருமானம்/ (செலவினம்) - வரைவு:
(ரூ. 842,327,600.00) (தேறிய நட்டம்)
- 2025 காலப்பகுதியின் மொத்த விரிவான வருமானம்/ (செலவினம்) - வரைவு):
(ரூ. 535,915,346.00) (தேறிய நட்டம்)

(iii) செயற்படும் விற்பனை நிலையங்களின் எண்ணிக்கை - 427. ***இணைப்பு 03இல்** காட்டப்பட்டுள்ளது.

அவற்றின் புவியியல் பரவல் - **இணைப்பு 04இல்** காட்டப்பட்டுள்ளது. (ஆங்கில விடையின் இணைப்பு 04ஐப் பார்க்கவும்.)

அத்தியாவசிய நுகர்வோர் பொருட்கள் சம்பந்தமான மதிப்பிடப்பட்ட சந்தைப் பங்கு - 10% - 15 %

(இ) ஏற்புடையதன்று.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(a) (i) Relevant Information is provided in Annex 01*.

(ii)

- Treasury subsidies, cross-subsidies - No.
- Payments are made to suppliers within a 30-day credit period.

(iii) Total financial cost

- The selling price was determined by negotiating a special price reduction with suppliers while maintaining the profit margin unchanged, ensuring no financial loss.

Contingent liabilities

- Direct procurement of harvests by visiting farmers' fields (under Cabinet approval).
- Intervention to provide relief to people affected by natural disasters such as floods.

(b) (i)

- As the price setter of the nation, Lanka Sathosa always provides quality goods to consumers at the lowest price without incurring a loss to the institution, and due to the price relief we provide to consumers, private traders are also able to sell their goods without incurring a loss.

(ii) Given in Annex 02 below.

Annex 02

| | |
|---|---|
| Cash and Cash Equivalents at End of the Period 2024 | (4,704,876,716.70) |
| Trade and Other Payables | 2,724,251,700.06 |
| Total Comprehensive Income / (Expense) for the Period 2024 - Draft | (842,327,600.00) |
| Total Comprehensive Income / (Expense) for the Period 2025 - Draft | (535,915,346.00) |

(iii)

- Number of operational outlets - 427. Relevant information is provided in Annex 03*.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු වසන්ත සමරසිංහ මහතා]

- Their geographical distribution - Relevant information is provided in Annex 04.

Annex 04

Lanka Sathosa – Branch Network Summary

Total Lanka Sathosa Branches

427 Branches nationwide.

| Region | Area | District | Province | No. of Branches |
|---|---|---|---|---|
| Western Region | Colombo 01 | Colombo | Western Province | 18 |
| Western Region | Colombo 02 | Colombo | Western Province | 14 |
| Western Region | Colombo 03 | Colombo | Western Province | 14 |
| Western Region | Colombo 04 | Colombo | Western Province | 17 |
| Western Region | Gampaha 01 | Gampaha | Western Province | 15 |
| Western Region | Gampaha 02 | Gampaha | Western Province | 16 |
| Western Region | Gampaha 03 | Gampaha | Western Province | 15 |
| Western Region | Kalutara | Kalutara | Western Province | 21 |
| Southern Region | Galle 01 | Galle | Southern Province | 14 |
| Southern Region | Galle 02 | Galle | Southern Province | 15 |
| Southern Region | Matara | Matara | Southern Province | 18 |
| Southern Region | Hambantota | Hambantota | Southern Province | 18 |
| Uva Region | Monaragala | Monaragala | Uva Province | 15 |
| Uva Region | Badulla | Badulla | Uva Province | 19 |
| Central Region | Nuwara Eliya | Nuwara Eliya | Central Province | 21 |
| Central Region | Kandy | Kandy | Central Province | 15 |
| Central Region | Matale | Matale | Central Province | 19 |
| Sabaragamuwa Region | Ratnapura 01 | Ratnapura | Sabaragamuwa Province | 14 |
| Sabaragamuwa Region | Ratnapura 02 | Ratnapura | Sabaragamuwa Province | 16 |
| Sabaragamuwa Region | Kegalle | Kegalle | Sabaragamuwa Province | 15 |
| North Western Region | Kurunegala 01 | Kurunegala | North Western Province | 12 |
| North Western Region | Kurunegala 02 | Kurunegala | North Western Province | 14 |
| North Western Region | Puttalam | Puttalam | North Western Province | 12 |
| North Central Region | Anuradhapura | Anuradhapura | North Central Province | 18 |
| North Central / Eastern Region | Polonnaruwa & Trincomalee | Polonnaruwa / Trincomalee | North Central / Eastern Provinces | 15 |
| Eastern Region | Ampara & Batticaloa | Ampara / Batticaloa | Eastern Province | 15 |
| Northern Region | Jaffna | Jaffna | Northern Province | 12 |

- Estimated market share concerning essential consumer goods - 10 per cent - 15 per cent.

(c) Not applicable

## පසුගිය වසර දෙක තුළ සංචාරක පැමිණීම්: විස්තර
## கடந்த 2 ஆண்டுகளுக்கான சுற்றுலாப் பயணிகளின் வருகை: விபரம்
## TOURIST ARRIVALS FOR LAST TWO YEARS: DETAILS

1996/2026

**2.** ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පසුගිය වසර 02 තුළ සංචාරක පැමිණීම්, වසරින් වසර සිදු වූ වර්ධනය/ පහත වැටීම ඇතුළත්ව එක් එක් ප්‍රධාන සංචාරක ප්‍රභව වෙළෙඳ පොළවල ප්‍රතිශතයක් ලෙස, රට අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම කාලය තුළ, අලුතින් එක් කළ, නැවත ස්ථාපිත හෝ නතර කරන ලද, සෘජු සංචාරක ගුවන් ගමනාන්ත සංඛ්‍යාව, එක් එක් ආරම්භක රට සහ ගුවන් සේවය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මැනිය හැකි වර්ධනයක් පෙන්නුම් කර ඇති නව දිගු දුර ගමනාන්ත සහ ඒවායෙන් වාර්තා වූ වර්ධන ප්‍රතිශත වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) නව වෙළෙඳ පොළවලට ඇතුළු වීමට පහසුකම් සැලසීම සඳහා, සංශෝධනය කරන ලද, පුළුල් කරන ලද හෝ අලුතින් සාකච්ඡා කරන ලද ද්විපාර්ශ්වික ගුවන් සේවා ගිවිසුම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) MICE, සුඛෝපභෝගී, සුවතා සහ නෞකා සංචාරක ව්‍යාපාර ඇතුළු ඉහළ ආදායම් ජනනය කරන සංචාරක ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා ව්‍යුහගත වෙළෙඳ පොළ පර්යේෂණ සිදු කර තිබේද;

(vi) අලුත් වෙළෙඳ පොළට ප්‍රවේශ වන හෝ සේවාවන් පුළුල් කරන ගුවන් සමාගම් සහ සංචාරක ක්‍රියාකරුවන්ට, දැනට ලබා දෙන මූල්‍ය, නියාමන හෝ අලෙවිකරණ දිරිගැන්වීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த 2 ஆண்டுகளுக்கான சுற்றுலாப் பயணிகளின் வருகை குறித்த நாடு ரீதியான விபரம், ஒவ்வொரு முக்கிய மூலச் சந்தையின் சதவீதப் பங்கு மற்றும் ஆண்டிலிருந்து ஆண்டுக் கான வளர்ச்சி/வீழ்ச்சி எவ்வளவு என்பதையும்;

(ii) இக்காலகட்டத்தில், ஒவ்வொரு மூல நாடு மற்றும் விமான நிறுவனத்துக்கும் சேர்க்கப்பட்ட, மீண்டும் தொடங்கப்பட்ட அல்லது நிறுத்தப்பட்ட நேரடி விமான இணைப்பு வழிகளின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) அளவிடக்கூடிய வளர்ச்சியை வெளிப்படுத்திய புதிய நீண்ட தூரச் சந்தைகள் மற்றும் ஒவ்வொன்றிலிருந்தும் பதிவுசெய்யப்பட்ட சதவீத அதிகரிப்பு வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) புதிய சந்தைகளில் நுழைவதை எளிதாக்கும் பொருட்டு திருத்தப்பட்ட, விரிவாக்கப்பட்ட, அல்லது புதிதாகப் பேச்சுவார்த்தை நடத்தப்பட்ட இருதரப்பு விமான சேவை ஒப்பந்தங்கள் வெவ்வேறாக யாது என்பதையும்;

(v) MICE, ஆடம்பர, ஆரோக்கிய மற்றும் கப்பல் சுற்றுலா உள்ளிட்ட அதிக செலவு செய்யும் சுற்றுலாப் பிரிவுகளை அடையாளம் காண்பதற்கு கட்டமைக்கப்பட்ட சந்தை ஆராய்ச்சி நடத்தப்பட்டுள்ளதா என்பதையும்;

(vi) புதிய சந்தைகளிலிருந்து சேவைகளைத் தொடங்கும் அல்லது விரிவுபடுத்தும் விமான நிறுவனங்கள் மற்றும் சுற்றுலா நடத்துநர்களுக்கு தற்போது வழங்கப்படும் குறிப்பிட்ட நிதி, ஒழுங்குமுறை அல்லது சந்தைப்படுத்தல் சலுகைகள் வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House -

(i) the country-wise breakdown of tourist arrivals for the last two years, separately, indicating the percentage share of each major source market and the year-on-year growth/decline;

(ii) the number of direct air connectivity routes added, reinstated or discontinued during this period, for each source country and airline, separately;

(iii) the new long-haul markets that have shown measurable growth together with the percentage increase recorded from each such market, separately;

(iv) the bilateral Air Service Agreements revised, expanded, or newly negotiated to facilitate entry into new markets, separately;

(v) whether a structured market research has been conducted to identify high-spending tourist segments, including MICE, luxury, wellness and cruise tourism; and

(vi) the specific fiscal, regulatory or marketing incentives currently offered to airlines and tour operators entering or expanding services from new markets, separately?

(b) If not, why?

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)

(i)

| | | 2024 | 2025 | වර්ධනය/ පහත වැටීම 24/25 |
|---|---|---|---|---|
| 1 | ඉන්දියාව | 416,974 | 531,511 | +27 |
| 2 | එක්සත් රාජධානිය | 178,339 | 212,277 | +19 |
| 3 | රුසියාව | 201,920 | 186,580 | -8 |
| 4 | ජර්මනිය | 136,084 | 147,966 | +9 |
| 5 | චීනය | 131,681 | 132,035 | +0.27 |
| 6 | ඕස්ට්‍රේලියාව | 89,573 | 109,487 | +22 |
| 7 | ප්‍රංශය | 88,775 | 109,041 | +23 |
| 8 | එක්සත් ජනපදය | 59,532 | 65,973 | +11 |
| 9 | නෙදර්ලන්තය | 50,116 | 64,164 | +28 |
| 10 | බංග්ලාදේශය | 39,555 | 59,563 | +51 |
| 11 | ඉතාලිය | 38,709 | 50,430 | +30 |
| 12 | පෝලන්තය | 44,165 | 49,989 | +13 |
| 13 | කැනඩාව | 42,212 | 46,133 | +9 |
| 14 | ස්පාඤ්ඤය | 37,928 | 46,038 | +21 |
| 15 | ජපානය | 30,429 | 38,153 | +25 |
| 16 | ස්විට්සර්ලන්තය | 29,829 | 33,624 | +13 |
| 17 | ඊශ්‍රායලය | 24,845 | 24,591 | -1 |
| 18 | මැලේසියාව | 18,259 | 23,684 | +30 |
| 19 | පාකිස්තානය | 13,451 | 22,296 | +66 |
| 20 | ඩෙන්මාර්කය | 14,952 | 17,378 | +16 |

(ii) මෙම ප්‍රශ්නයට අදාළ තොරතුරු සඳහා ඉංග්‍රීසි පිළිතුරේ ඇමුණුම බලන්න.

(iii)

| | රට | පැමිණීම් සංඛ්‍යාවේ වැඩිවීම 2025/2026 (මාර්තු - අප්‍රේල්) | පැමිණීම් සංඛ්‍යාවේ වැඩිවීම ප්‍රතිශතාත්මකව 2025/2026 (මාර්තු - අප්‍රේල්) |
|---|---|---|---|
| 01 | ඉන්දුනීසියාව | 444 | 58.5 |
| 02 | වියට්නාමය | 539 | 49.4 |
| 03 | චීනය | 4,827 | 24.4 |
| 04 | ජපානය | 1,142 | 18.8 |
| 05 | පිලිපීනය | 115 | 10.0 |
| 06 | ඕස්ට්‍රේලියාව | 4,384 | 7.0 |
| 07 | නවසීලන්තය | 121 | 5.0 |

[ගරු විජිත හේරත් මහතා ]

(iv)

| අත්සන් කරන ලද ගිවිසුම් | අලුතින් සාකච්ඡා කරන ලද ගිවිසුම් | සංශෝධනය / අලුත් කරන ලද ගිවිසුම් |
|---|---|---|
| 1. නෙදර්ලන්තය (2023.02.22)<br>2. තායිලන්තය (2024.02.03)<br>3. ඊශ්‍රායලය (2024.02.15)<br>4. බෙලරුස් (2026.05.13) | 1. ආමේනියාව<br>2. හංගේරියාව<br>3. භූතානය<br>4.උස්බෙකිස්තානය<br>5.කසකස්තානය<br>6. ඩොමිනිකන් රිපබ්ලික්<br>7. ගයනාව | 1. මියන්මාරය<br>2. මාලදිවයින<br>3. ඉතාලිය<br>4. සීෂෙල්ස්<br>5. වියට්නාමය<br>6. තුර්කිය<br>7. දකුණු කොරියාව<br>8. කැනඩාව |

(v) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ පර්යේෂණ අංශය විසින් පසුගිය වර්ෂවල විශ්ලේෂණ සහ දත්ත පදනම් කර ගනිමින් MICE සංචාරක ප්‍රවර්ධනය සඳහා ඉලක්කගත ගමනාන්ත රටවල් 5ක් හඳුනාගෙන ඇත. ඒ අනුව, ඉන්දියාව, චීනය, රුසියාව, බංග්ලාදේශය සහ පාකිස්තානය යන රටවල විශේෂ ප්‍රවර්ධන වැඩසටහන් ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබයි.

සුවතා සංචාරක ව්‍යාපාරය

<u>මීට අදාළ වෙළෙඳ පොළ පර්යේෂණවලින් පසු,</u>

- දැනට සංචාරක සුවතා ව්‍යාපාරය සඳහා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය හා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධ වී සුවතා සංචාරක ව්‍යාපාරවලට අදාළ ආයතන ලියාපදිංචි කිරීම සඳහා මාර්ගෝපදේශන සකස් කිරීම අවසාන අදියරේ පවතී.
- සුවතා සංචාරක ව්‍යාපාර සඳහා වෙබ් අඩවිය (website) නිර්මාණය කර ඇත.
- සුවතා සංචාරක ව්‍යාපාර සඳහා ප්‍රවර්ධන වීඩියෝව සකස් කරන ලදී.

<u>නෞකා සංචාරක ව්‍යාපාරය</u>

මීට අදාළ වෙළෙඳ පොළ පර්යේෂණවලින් පසු,

- නෞකා සංචාරක ව්‍යාපාර සඳහා වෙබ් අඩවිය (website) නිර්මාණය කර ඇත.
- නෞකා සංචාරක ව්‍යාපාර සඳහා ප්‍රවර්ධන වීඩියෝව සකස් කරන ලදී.
- නෞකා සංචාරක ව්‍යාපාර සඳහා විද්‍යුත් ප්‍රචාරක පත්‍ර (e-brochures) සකස් කරන ලදී.
- නෞකා සංචාරක ව්‍යාපාර සඳහා නගර සිතියම (city map) සකස් කිරීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී.

(vi) කර්මාන්ත සහයෝගිතා යෝජනා ක්‍රමය යටතේ සංචාරක පැමිණීම් සහ ප්‍රතිලාභ

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය -Sri Lanka Tourism Promotion Bureau -SLTPB- විසින් දැනුම් දෙනු ලබන්නේ, ගෝලීය සංචාරක මෙහෙයුම්කරුවන් සහ චාටර් ගුවන් සේවා - charter flights- සඳහා යෝජිත කර්මාන්ත සහයෝගිතා යෝජනා ක්‍රමය යටතේ, රුපියල් මිලියන 750ක ප්‍රතිපාදනයක් විශේෂ අළෙවිකරණය වෙනුවෙන් 2026 වසරේදී වෙන් කර ඇති අතර, කර්මාන්ත පාර්ශ්වකරුවන් සමඟ එක්ව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී.

මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වන්නේ, ගුවන් සම්බන්ධතා ශක්තිමත් කිරීම සහ නව හා උද්ගත මූලාශ්‍ර වෙළෙඳ පොළවල -Emerging Markets- ජාත්‍යන්තර සංචාරක මෙහෙයුම්කරුවන්ගේ සහභාගිත්වය පුළුල් කිරීම මඟින් ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන්ගේ සංඛ්‍යාව වැඩි කිරීමයි.

<u>සංචාරක පැමිණීම් සඳහා අපේක්ෂිත බලපෑම</u>

මෙම වඩසටහනට අනුව පහත සඳහන් පරිදි සංචාරක පැමිණීම්වල ස්ථාවර වර්ධනයක් ඇති කිරීමට සැලසුම් කර ඇත.

- ශ්‍රී ලංකාවට නව ගුවන් මාර්ග ආරම්භ කිරීමට හෝ දැනට පවතින මාර්ග පුළුල් කිරීමට නව ගුවන් සේවා සහ චාටර් - charter- මෙහෙයුම් ආකර්ෂණය කිරීමට සැලසුම් කිරීම.
- ප්‍රධාන වෙළෙඳ පොළවල සංචාරක මෙහෙයුම්කරුවන්ට ආධාර ලබා දී සංචාරක මගී සංඛ්‍යාව වැඩි කිරීම.
- වසර පුරා ගුවන් සම්බන්ධතා ශක්තිමත් කර සංචාරක පැමිණීම්වල කාලානුරූප අඩුවීම් අවම කිරීම.
- යුරෝපය, ස්කැන්ඩිනේවියානු රටවල්, මධ්‍යම හා නැඟෙනහිර යුරෝපය සහ ආසියා-පැසිෆික් කලාපය ඇතුළු ඉහළ විභවතාව සහිත වෙළෙඳ පොළ වෙත ප්‍රවේශය පුළුල් කිරීම.

<u>අපේක්ෂිත වර්ධන ප්‍රවණතාව</u>

- කෙටි කාලීනව, මෙම යෝජනා ක්‍රමය යටතේ නව සහ නැවත සක්‍රිය කරන ලද වෙළෙඳ පොළවලින් සංචාරක පැමිණීම් වේගයෙන් ඉහළ නැංවීමට, විශේෂයෙන් චාටර් ගුවන් සේවා -charter flights- සහ ප්‍රවර්ධන වැඩසටහන් හරහා ඉමහත් දායකත්වයක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- මධ්‍ය කාලීනව, නියමිත ගුවන් සේවා මෙහෙයුම් සහ සංචාරක මෙහෙයුම්කරුවන් මඟින් මෙහෙයවන සංචාරක ගමනාගමනයේ ස්ථාවර සහ තිරසාර වර්ධනයක් ඇති වනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- දිගු කාලීනව, මෙම වැඩසටහන සංචාරක පැමිණීම්වල අඛණ්ඩ ඉහළ යාමක් සහ වෙළෙඳ පොළ විවිධාංගීකරණය වැඩිදියුණු කිරීමට දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

<u>කර්මාන්ත පාර්ශ්වකරුවන්ට ලැබෙන ප්‍රතිලාභ</u>

ගුවන් සේවා සමාගම් සඳහා සංවිධානාත්මක ගමනාන්ත අළෙවිකරණය මඟින් මගී පිරවීම් අනුපාත ඉහළ යාම, වෙළෙඳ පොළ පිවිසීමේ අවදානම් අඩු කිරීම සහ ගුවන් මාර්ගවල තිරසාරභාවය ශක්තිමත් කිරීම වැනි ප්‍රතිලාභ ලැබෙනු ඇත.

සංචාරක මෙහෙයුම්කරුවන් සහ ගමනාන්ත කළමනාකරණ සමාගම් -DMCs- සඳහා වෙන් කරවා ගැනීම් ප්‍රමාණය වැඩි වීම, නිෂ්පාදන පරාසය පුළුල් වීම සහ නව මූලාශ්‍ර වෙළෙඳ පොළවල හවුල්කාරිත්ව ශක්තිමත් වීම වැනි ප්‍රතිලාභ හිමි වනු ඇත.

<u>ජාතික මට්ටමේ ප්‍රතිඵල</u>

මෙම වැඩසටහන මඟින් පහත කරුණු සඳහා දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- සංචාරක කර්මාන්තයෙන් ලැබෙන විදේශ විනිමය අදායම වැඩි වීම
- සංචාරක වටිනාකම් දාමය පුරා රැකියා අවස්ථා නිර්මාණය වීම
- සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ ගෝලීය තරගකාරිත්වය වැඩිදියුණු වීම
- සංචාරක සංවර්ධනය සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශ අතර සහයෝගිතාව ශක්තිමත් කිරීම

(ආ) අදාළ නොවේ.

(அ) (i)

| | | 2024 | 2025 | வளர்ச்சி/ வீழ்ச்சி 24/25 |
|---|---|---|---|---|
| 1 | இந்தியா | 416,974 | 531,511 | +27 |
| 2 | ஐக்கிய இராச்சியம் | 178,339 | 212,277 | +19 |
| 3 | ரஷ்யா | 201,920 | 186,580 | -8 |
| 4 | ஜேர்மனி | 136,084 | 147,966 | +9 |
| 5 | சீனா | 131,681 | 132,035 | +0.27 |
| 6 | அவுஸ்தி ரேலியா | 89,573 | 109,487 | +22 |
| 7 | பிரான்ஸ் | 88,775 | 109,041 | +23 |
| 8 | ஐக்கிய அமெரிக்கா | 59,532 | 65,973 | +11 |
| 9 | நெதர்லாந்து | 50,116 | 64,164 | +28 |
| 10 | பங்களாதேஷ் | 39,555 | 59,563 | +51 |
| 11 | இத்தாலி | 38,709 | 50,430 | +30 |
| 12 | போலாந்து | 44,165 | 49,989 | +13 |
| 13 | கனடா | 42,212 | 46,133 | +9 |
| 14 | ஸ்பெயின் | 37,928 | 46,038 | +21 |
| 15 | யப்பான் | 30,429 | 38,153 | +25 |
| 16 | சுவிட்சர்லாந்து | 29,829 | 33,624 | +13 |
| 17 | இஸ்ரேல் | 24,845 | 24,591 | -1 |
| 18 | மலேசியா | 18,259 | 23,684 | +30 |
| 19 | பாகிஸ்தான் | 13,451 | 22,296 | +66 |
| 20 | டென்மார்க் | 14,952 | 17,378 | +16 |

(ii) இவ்வினா தொடர்பான தகவல்களுக்காக ஆங்கில விடையின் இணைப்பைப் பார்க்கவும்.

(iii)

| | Country | Increase in number of arrivals during March-April 2025/2026 | Percentage growth in arrivals during March-April 2025/2026 |
|---|---|---|---|
| 01 | Indonesia | 444 | 58.5 |
| 02 | Vietnam | 539 | 49.4 |
| 03 | China | 4.827 | 24.4 |
| 04 | Japan | 1,142 | 18.8 |
| 05 | Philippines | 115 | 10.0 |
| 06 | Australia | 4,384 | 7.0 |
| 07 | New Zealand | 121 | 5.0 |

(iv)

| Agreement signed | Newly Negotiated Agreements | Amended/ Renewed Agreements |
|---|---|---|
| 1. நெதர்லாந்து (2023.02.22)<br>2. தாய்லாந்து (2024.02.03)<br>3. இஸ்ரேல் (2024.02.15)<br>4. பெலாரஸ் (2026.05.13) | 1. ஆர்மேனியா<br>2. ஹங்கேரி<br>3. பூட்டான்<br>4. உஸ்பெகிஸ்தான்<br>5. கஜகஸ்தான்<br>6. டொமினிக்கன் குடியரசு<br>7. கயானா | 1. மியன்மார்<br>2. மாலைதீவு<br>3. இத்தாலி<br>4. சீஷெல்ஸ்<br>5. வியட்நாம்<br>6. துருக்கி<br>7. தென்கொரியா<br>8. கனடா |

(v) இலங்கை சுற்றுலா அபிவிருத்தி அதிகார சபையின் ஆய்வுப் பிரிவானது, கடந்த ஆண்டுகளின் பகுப்பாய்வு மற்றும் தரவுகளின் அடிப்படையில், MICE சுற்றுலாவை அபிவிருத்தி செய்வதற்காக 5 இலக்கு நாடுகளை அடையாளம் கண்டுள்ளது. அதன்படி இந்தியா, சீனா, ரஷ்யா, பங்களாதேஷ், பாகிஸ்தான் ஆகிய நாடுகளில் இலங்கை மாநாட்டுப் பணியகத்தால் சிறப்பு அபிவிருத்திப் பிரசாரங்கள் மேற் கொள்ளப்பட்டு வருகின்றன.

<u>நலன்சார் சுற்றுலா</u>

தொடர்புடைய சந்தை ஆய்வைத் தொடர்ந்து:

- சுற்றுலா மேம்பாட்டுப் பணியகம் மற்றும் இலங்கை சுற்றுலா அபிவிருத்தி அதிகார சபையுடன் இணைந்து நல்வாழ்வு சுற்றுலா தொடர்பான நிறுவனங்களின் பதிவுக்கான வழிகாட்டுதல்களைத் தயாரிக்கும் பணி தற்போது இறுதிக் கட்டத்தில் உள்ளது.
- நலன்சார் சுற்றுலாவுக்காக ஓர் இணையத் தளம் உருவாக்கப்பட்டுள்ளது.
- நலன்சார் சுற்றுலாவுக்காக ஓர் அபிவிருத்திக் காணொளி தயாரிக்கப்பட்டுள்ளது.

கப்பல் <u>சுற்றுலா</u>

தொடர்புடைய சந்தை ஆய்வைத் தொடர்ந்து:

- கப்பல் சுற்றுலாவுக்காக ஓர் இணையத்தளம் உருவாக்கப்பட்டுள்ளது.
- கப்பல் சுற்றுலாவுக்காக ஓர் அபிவிருத்திக் காணொளி தயாரிக்கப்பட்டுள்ளது.

[ගරු විජිත හේරත් මහතා ]

- கப்பல் சுற்றுலாவுக்காக இலத்திரனியல் கையேடுகள் தயாரிக்கப்பட்டுள்ளன.
- கப்பல் சுற்றுலாவுக்கான நகர வரைபடத்தை தயாரிக்கும் பணி தற்போது நடைபெற்று வருகிறது.

(vi) தொழிற்றுறைசார் ஒத்துழைப்புத் திட்டத்தின்கீழ் சுற்றுலாப் பயணிகளின் வருகை மற்றும் நன்மைகள்

உலகளாவிய சுற்றுலா நடத்துநர்கள் மற்றும் விசேட விமானங்களுக்கான முன்மொழியப்பட்ட தொழிற்றுறை ஒத்துழைப்புத் திட்டத்தின்கீழ், 2026ஆம் ஆண்டுக்காக ரூ. 750 மில்லியன் சிறப்பு சந்தைப்படுத்தல் பிரசாரத்துக்காக ஒதுக்கீடு செய்யப்பட்டுள்ளதாகவும், தொழிற் றுறைசார் பங்குதாரர்களுடன் இணைந்து இந்நிகழ்ச்சித்திட்டத்தைச் செயற்படுத்த அமைச்சரவை ஒப்புதலைப் பெறுவதற்கான நடவடிக்கைகள் தொடங்கப்பட்டுள்ளதாகவும் இலங்கை சுற்றுலா மேம்பாட்டுப் பணியகம் (SLTPB) தெரிவிக்கின்றது.

விமான இணைப்பை வலுப்படுத்துவதன் மூலமும், புதிய மற்றும் வளர்ந்துவரும் மூலச் சந்தைகளில் சர்வதேச சுற்றுலா நடத்துநர்களின் பங்களிப்பை விரிவுபடுத்துவதன் மூலமும் இலங்கைக்கு வரும் சுற்றுலாப் பயணிகளின் எண்ணிக்கையை அதிகரிப்பதே இத்திட்டத்தின் முக்கிய நோக்கமாகும்.

**சுற்றுலாப் பயணிகளின் வருகையில் எதிர்பார்க்கப்படும் தாக்கம்**

பின்வரும் வழிகளில் சுற்றுலாப் பயணிகளின் வருகையில் வலுவான வளர்ச்சியை உருவாக்கும் வகையில் இத்திட்டம் வடிவமைக்கப்பட்டுள்ளது.

- இலங்கைக்குப் புதிய வழித்தடங்களைத் தொடங்க அல்லது தற்போதுள்ள வழித் தடங்களை விரிவுபடுத்த புதிய விமான நிறுவனங்களையும் வாடகை விமானச் செயற்பாடுகளையும் ஈர்ப்பது.
- முக்கிய சந்தைகளிலுள்ள சுற்றுலா நடத்துநர் களுக்கு ஆதரவளிப்பதன்மூலம் சுற்றுலாப் பயணிகளின் எண்ணிக்கையை அதிகரிப்பது.
- சுற்றுலாப் பயணிகளின் வருகையில் ஏற்படும் பருவகால சரிவுகளைக் குறைப் பதற்காக ஆண்டு முழுவதும் விமான இணைப்பை வலுப்படுத்துவது.
- ஐரோப்பா, ஸ்காண்டிநேவியா, மத்திய மற்றும் கிழக்கு ஐரோப்பா மற்றும் ஆசிய - பசிபிக் பிராந்தியம் உள்ளிட்ட அதிக ஆற்றல் வாய்ந்த சந்தைகளுக்கான அணுகலை விரிவுபடுத்துதல்.

**எதிர்பார்க்கப்படும் வளர்ச்சிப் போக்குகள்**

- குறுகிய காலத்தில் இத்திட்டம், குறிப்பாக சிறப்பு விமானப் பயணங்கள் மற்றும் விளம்பரப் பிரசாரங்கள்மூலம் புதிய மற்றும் புத்துயிர் பெற்ற சந்தைகளிலிருந்து சுற்றுலாப் பயணிகளின் வருகையை விரைவாக அதிகரிக்கப் பங்களிக்குமென எதிர்பார்க்கப்படுகின்றது.
- நடுத்தர காலத்தில், திட்டமிடப்பட்ட விமானச் செயற்பாடுகள் மற்றும் சுற்றுலா நடத்துநர் களால் இயக்கப்படும் சுற்றுலாப் பயணிகளின் போக்குவரத்தில் நிலைபேறான மற்றும் நீடித்த வளர்ச்சி எதிர்பார்க்கப் படுகிறது.
- நீண்ட காலத்தில், இந்தத் திட்டம் சுற்றுலாப் பயணிகளின் வருகையில் தொடர்ச்சியான அதிகரிப்புக்கும், மேம்பட்ட சந்தை பல்வகைப் படுத்தலுக்கும் பங்களிக்குமென எதிர்பார்க்கப் படுகின்றது.

**தொழிற்றுறை பங்குதாரர்களுக்கான நன்மைகள்**

விமான நிறுவனங்களுக்கு ஒழுங்கமைக்கப்பட்ட இலக்கு சந்தைப்படுத்தல் அதிக பயணிகள் சுமை விகிதங்கள், குறைந்த சந்தை நுழைவு அபாயங்கள் மற்றும் பாதைகளின் வலுப்படுத்தப் பட்ட நிலைபேறான தன்மை போன்ற நன்மை களைக் கொண்டுவரும். \

சுற்றுலா நடத்துநர்கள் மற்றும் தள முகாமைத் துவ நிறுவனங்களுக்கு (DMCs), அதிகரித்த முன்பதிவுகள், விரிவாக்கப்பட்ட தயாரிப்பு வரம்புகள் மற்றும் புதிய மூலச் சந்தைகளில் வலுப்படுத்தப்பட்ட கூட்டாண்மைகள் போன்ற நன்மைகளைக் கொண்டுவரும்.

**தேசிய அளவிலான விளைவுகள்**

- இந்தத் திட்டம் பின்வருவனவற்றுக்குப் பங்களிக்குமென எதிர்பார்க்கப்படுகின்றது:
- சுற்றுலாத் துறையிலிருந்தான அந்நியச் செலாவணி வருவாயில் அதிகரிப்பு
- சுற்றுலா பெறுமதிச் சங்கிலி முழுவதும் வேலைவாய்ப்புகளை உருவாக்குதல்
- ஒரு சுற்றுலாத் தளமாக இலங்கையின் உலகளாவிய போட்டித் தன்மையை மேம்படுத்துதல்
- சுற்றுலா அபிவிருத்திக்காக பொது - தனியார் துறை ஒத்துழைப்பை வலுப்படுத்துதல்

(ஆ) ஏற்புடையதன்று.

(a)

(i)

| | | 2024 | 2025 | Growth/ Decline 24/25 |
|---|---|---|---|---|
| 1 | India | 416,974 | 531,511 | +27 |
| 2 | United Kingdom | 178,339 | 212,277 | +19 |
| 3 | Russia | 201,920 | 186,580 | -8 |
| 4 | Germany | 136,084 | 147,966 | +9 |
| 5 | China | 131,681 | 132,035 | +0.27 |
| 6 | Australia | 89,573 | 109,487 | +22 |
| 7 | France | 88,775 | 109,041 | +23 |
| 8 | United States | 59,532 | 65,973 | +11 |

| | | 2024 | 2025 | Growth/ Decline 24/25 |
|---|---|---|---|---|
| 9 | Netherlands | 50,116 | 64,164 | +28 |
| 10 | Bangladesh | 39,555 | 59,563 | +51 |
| 11 | Italy | 38,709 | 50,430 | +30 |
| 12 | Poland | 44,165 | 49,989 | +13 |
| 13 | Canada | 42,212 | 46,133 | +9 |
| 14 | Spain | 37,928 | 46,038 | +21 |
| 15 | Japan | 30,429 | 38,153 | +25 |
| 16 | Switzerland | 29,829 | 33,624 | +13 |
| 17 | Israel | 24,845 | 24,591 | -1 |
| 18 | Malaysia | 18,259 | 23,684 | +30 |
| 19 | Pakistan | 13,451 | 22,296 | +66 |
| 20 | Denmark | 14,952 | 17,378 | +16 |

(ii) Relevant information is provided in Annex below.

| S.No. | Country | New Airline Connections | Discontinued Airline connections | Resumed Airline Connections | Remarks |
|---|---|---|---|---|---|
| 01 | Switzerland | - | - | Edelweiss Air resumed direct scheduled flights between Zurich and Colombo on October 31, 2024. | operated throughout the winter season until May 9, 2025 |
| 02 | Lithuania | Sky Up Airlines launched charter flights in January 2024. | Sky Up charter flights operated only until April 30, 2024, and were subsequently discontinued | - | - |
| 03 | Estonia | Skyup Airlines | Sky Up charter flights operated only until April 30, 2024, and were subsequently discontinued | - | - |
| 04 | Russia | - | Azur Air (Charter operation) | Aeroflot and Red Wing (charter flights( | Operates during the winter season |
| 05 | Kazakhstan | - | - | Air Astana | Operates during the winter season |
| 06 | Uzbekistan | - | Uzbekistan Air | - | - |
| 07 | Moldova | Vision Air | - | - | - |
| 08 | Turkey | - | - | Turkish Airlines | - |
| 09 | Kuwait | - | - | Kuwait Airways resumed direct flights to Colombo in October 2025 | - |
| 10 | Oman | - | In January 2024, Oman Air announced that it would suspend its Muscat–Colombo route under a network restructuring and financial reorganization plan. | SalamAir (Oman) launched direct flights between Muscat and Colombo in 2024. | - |
| 11 | UAE | Air Arabia Abu Dhabi launched its first route to Sri Lanka in 2024, introducing a direct air service between Abu Dhabi and Colombo. | - | - | - |
| 12 | Israel | Arkia Israeli Airlines launched scheduled flights from Tel Aviv to Colombo in 2025 | - | - | - |
| 13 | Malaysia | -Sri Lankan Air lines<br>-Malaysian Air Lines<br>-Fits Air<br>Batik Air | - | - | - |
| 14 | China | • China Eastern from Shanghai and Kunming in 2023 & 2024 respectively<br>• Cathay Pacific from Hong Kong in January 2025<br>• Air China from Chengdu in July 2024<br>• Chongqing Air Lines in January 2025<br>Beijing Capital Air lines from Beijing in January 2026 | Chongqing Airlines in April 2025 | Chongqing Airlines re-connected in January 2026 | - |

[ගරු විජිත හේරත් මහතා ]

| | | | | | |
|---|---|---|---|---|---|
| 15 | Singapore | Singapore Air lines<br>-Sri Lankan Air lines | - | - | - |
| 16 | Vietnam | - | - | - | Vietjet Air is scheduled to launch services on the Colombo–Ho Chi Minh route in August 2026, operating four flights per week. |
| 17 | CZECH Republic | LOT Polish Airlines | LOT Polish charter flights operated only until March 31, 2024, and were subsequently discontinued | - | - |
| 18 | South Korea | SriLankan Airlines and Korean Air officially launched a new codeshare partnership effective 15 March 2024, strengthening Colombo (CMB) – Seoul Incheon (ICN) connectivity. The agreement enabled seamless single-ticket travel via Singapore and expanded Korean Air access to SriLankan Airlines' regional network. | | SriLankan Airlines continued operating direct Colombo–Seoul Incheon services during 2024–2025, including twice-weekly direct flights. Korean Air also added its "KE" code on SriLankan-operated Colombo–Seoul services under the new codeshare arrangement | The partnership marked the first-ever codeshare agreement between SriLankan Airlines and Korean Air. Passenger demand between Colombo and Seoul reportedly exceeded expectations, helping strengthen tourism and business travel between Sri Lanka and South Korea. The agreement also improved onward connectivity to Maldives, Chennai, and Singapore through Colombo. |

(iii)

| | Country | Increase in number of arrivals during March-April 2025/2026 | Percentage growth in arrivals during March-April 2025/2026 |
|---|---|---|---|
| 01 | Indonesia | 444 | 58.5 |
| 02 | Vietnam | 539 | 49.4 |
| 03 | China | 4827 | 24.4 |
| 04 | Japan | 1,142 | 18.8 |
| 05 | Philippines | 115 | 10.0 |
| 06 | Australia | 4,384 | 7.0 |
| 07 | New Zealand | 121 | 5.0 |

(iv)

| Agreement signed | Newly Negotiated Agreements | Amended/ Renewed Agreements |
|---|---|---|
| 1. Netherlands (2023.02.22)<br>2. Thailand (2024.02.03)<br>3. Israel (2024.02.15)<br>4. Belarus (2026.05.13) | 1. Armenia<br>2. Hungary<br>3. Bhutan<br>4. Uzbekistan<br>5. Kazakhstan<br>6. Dominican Republic<br>7. Guyana | 1. Myanmar<br>2. Maldives<br>3. Italy<br>4. Seychelles<br>5. Vietnam<br>6. Turkey<br>7. South Korea<br>8. Canada |

(v) The Research Division of the Sri Lanka Tourism Development Authority has identified five target destination countries for promoting MICE tourism based on analysis and data from previous years. Accordingly, special promotion campaigns are being implemented by the Sri Lanka Convention Bureau in India, China, Russia, Bangladesh and Pakistan.

**Wellness Tourism**

Following relevant market research:

- The preparation of guidelines for the registration of establishments related to wellness tourism in collaboration with the Tourism Promotion Bureau and the Sri Lanka Tourism Development Authority is currently in the final stage.
- A website has been created for wellness tourism.
- A promotional video has been prepared for wellness tourism.

**Cruise Tourism**

Following relevant market research:

- A website has been created for cruise tourism.
- A promotional video has been prepared for cruise tourism.
- E-brochures have been prepared for cruise tourism.
- The process of preparing a city map for cruise tourism is currently underway.

(vi)

**Tourism Arrivals and Benefits under the Industry Collaboration Scheme**

The Sri Lanka Tourism Promotion Bureau - STTPB - informs that a special marketing campaign of Rs. 750 million has been allocated for 2026 under the proposed Industry Collaboration Scheme for Global Tourism Operators and Charter Flights, and that measures have been initiated to obtain Cabinet approval for implementing this programme together with industry stakeholders.

The main objective of this programme is to increase the number of tourists arriving in Sri Lanka by strengthening air connectivity and expanding the participation of international tourism operators in new and emerging source markets.

**Expected Impact on Tourism Arrivals**

The programme is designed to create steady growth in tourism arrivals in the following ways:

- Attracting new airlines and charter operations to launch new routes to Sri Lanka or expand existing routes.
- Increasing tourist passenger numbers by providing support to tourism operators in key markets.
- Strengthening year-round air connectivity to minimize seasonal declines in tourist arrivals.
- Expanding access to high-potential markets including Europe, Scandinavia, Central and Eastern Europe and the Asia-Pacific region.

**Expected Growth Trends**

- In the short term, this scheme is expected to contribute to rapidly increasing tourism arrivals from new and reactivated markets, particularly through charter flights and promotional campaigns.
- In the medium term, stable and sustainable growth in tourism traffic driven by scheduled airlines operations and tourism operators is expected.
- In the long term, it is expected that this programme will contribute to a continued increase in tourist arrivals and improved market diversification.

**Benefits to Industry Stakeholders**

For airlines, organized destination marketing will bring benefits such as higher passenger load factors, reduced market entry risks and strengthened sustainability of the routes.

For tour operators and Destination Management Companies - DMCs, it will bring benefits such as increased bookings, expanded product ranges and strengthened partnerships in new source markets.

**Outcomes at the National Level**

It is expected that this programme will contribute to the following:

- Increase in foreign exchange earnings from the tourism industry.
- Creation of employment opportunities throughout the tourism value chain.
- Improving the global competitiveness of Sri Lanka as a tourism destination.
- Strengthening of public-private sector collaboration for tourism development.

(b) Not applicable.

## ඉලක්කගත සංචාරක වෙළඳපොළවල්: විස්තර

திட்டமிட்ட சுற்றுலா சந்தைகள்: விபரம்

TARGETED TOURIST MARKETS: DETAILS

1997/2026

**3. ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වන විට පවතින මුළු හෝටල් කාමර ධාරිතාව සහ ප්‍රාදේශීය මට්ටමින් සංචාරක නවාතැන් ගැනීමේ අනුපාත කවරේද;

(ii) වර්තමානයේ සංචාරකයන් පැමිණීම වැඩි වෙමින් පවතින ප්‍රධාන රටවල් කවරේද;

(iii) ඉන්දියාව, රුසියාව සහ එක්සත් රාජධානිය වැනි සීමිත වෙළඳ පොළ සංඛ්‍යාවක් මත ශ්‍රී ලංකාව තවදුරටත් යැපෙන්නේද;

(iv) ඉහත සඳහන් කළ එක් එක් රටවලින් පැමිණෙන සංචාරකයන්ගේ ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) සක්‍රියව ඉලක්ක කර ගනිමින් සිටින නව වෙළඳපොළ (උදා: මැද පෙරදිග, නැඟෙනහිර යුරෝපය සහ නැඟෙනහිර ආසියාව) කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2024-2025 කාලසීමාව තුළ අනුමත කර ඇති නව සංචාරක ආයෝජන සංඛ්‍යාව සහ ඒවායේ වටිනාකම කොපමණද;

(ii) වෙළඳ පොළ සංකේන්ද්‍රණ අවදානම අඩු කිරීම සඳහා විවිධාංගීකරණ උපාය මාර්ගයක් අනුගමනය කර තිබේද;

(iii) රට තුළ අලුතින් එක් කිරීමට සැලසුම් කර ඇති හෝටල් කාමර සංඛ්‍යාව කොපමණද;

(iv) එම හෝටල් ඉදි කිරීමට නියමිත ස්ථාන සහ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාල රාමු කවරේද;

(v) එම නව සංවර්ධන ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තුගත ආයෝජන වටිනාකම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நாட்டிலுள்ள ஹோட்டல்களிலுள்ள மொத்த ஹோட்டல் அறைகளின் எண்ணிக்கையையும் பிராந்திய ரீதியில் அவற்றில் சார்ந்திருக்கும் விகிதத்தையும்;

[ගරු රවි කරුණානායක මහතා ]

(ii) தற்போது எந்தெந்த முதன்மை நாடுகளிலிருந்து சுற்றுலாப் பயணிகளின் வருகை அதிகரித்து வருகின்றது என்பதையும்;

(iii) இந்தியா, ரஷ்யா மற்றும் ஐக்கிய இராச்சியம் போன்ற நாடுகளின் வரையறுக்கப்பட்ட எண்ணிக்கையில் இலங்கை இன்னும் சார்ந்துள்ளதா என்பதையும்;

(iv) மேற்குறிப்பிடப்பட்ட ஒவ்வொரு நாட்டிலிருந்தும் வருகைதரும் சுற்றுலாப் பயணிகளின் சதவீதப் பங்கு யாது என்பதையும்;

(v) தீவிரமாகக் கவனம் செலுத்தப்பட்டுக்கொண்டு இருக்கின்ற (உதாரணம்: மத்திய கிழக்கு, கிழக்கு ஐரோப்பா மற்றும் கிழக்கு ஆசியா) புதிய சந்தைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2024-2025 காலப்பகுதியில் அங்கீகரிக்கப்பட்ட புதிய சுற்றுலா முதலீடுகளின் எண்ணிக்கை மற்றும் அதன் பெறுமதியையும்;

(ii) சிறிய எண்ணிக்கையிலான நாடுகளில் அளவுக்கதிகமாகச் சார்ந்திருப்பதால் ஏற்படும் இழப்புகளைக் குறைப்பதற்கு பல்வகைப்படுத்தல் உபாயமொன்று பின்பற்றப்பட்டுள்ளதா என்பதையும்;

(iii) நாட்டில் புதிதாகச் சேர்த்துக்கொள்ளப்படுவதற்குத் திட்டமிடப்பட்டுள்ள ஹோட்டல் அறைகளின் எண்ணிக்கையையும்;

(iv) அத்தகைய ஹோட்டல்கள் தாபிக்கப்படவுள்ள இடங்கள் மற்றும் அவற்றை அமுல்படுத்துவதற்காக எதிர்பார்க்கப்படும் காலவரம்பையும்;

(v) அந்தப் புதிய அபிவிருத்தித் திட்டங்களுக்காக மதிப்பிடப்பட்டுள்ள முதலீட்டுப் பெறுமதி யாது என்பதையும்?

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House -

(i) the current national room capacity and regional occupancy rates;

(ii) the principal countries from which tourist arrivals are presently increasing;

(iii) whether Sri Lanka remains dependent on a limited number of markets, such as India, Russia and the UK;

(iv) the percentage share of tourist arrivals from each of the aforesaid countries, separately; and

(v) the new markets (e.g. Middle East, Eastern Europe and East Asia) that are being actively targeted?

(b) Will he also inform this House -

(i) the number and value of new tourism investments approved during 2024-2025;

(ii) whether a diversification strategy has been adopted to reduce market concentration risk;

(iii) the number of hotel rooms planned to be added in the country;

(iv) the locations where such hotels are to be established and the expected timelines for their implementation; and

(v) the estimated investment value for these new developments?

(c) If not, why?

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

(අ) (i) මුළු ඒකක සංඛ්‍යාව : 8,322 (2026 මාර්තු දක්වා)

මුළු කාමර සංඛ්‍යාව : 58,411 (2026 මාර්තු දක්වා)

ප්‍රාදේශීය මට්ටමින් සංචාරක නවාතැන් ගැනීමේ අනුපාත පිළිබඳ තොරතුරු නොමැත.

(ii)
- ඉන්දියාව
- එක්සත් රාජධානිය
- රුසියාව
- ජර්මනිය
- චීනය
- ඕස්ට්‍රේලියාව
- ප්‍රංශය
- එක්සත් ජනපදය
- නෙදර්ලන්තය
- බංග්ලාදේශය

(iii) නැත.

සාම්ප්‍රදායික ප්‍රචාරණ ක්‍රියාකාරකම්වලට අමතරව මහජන සම්බන්ධතා ප්‍රවර්ධන වැඩසටහන්, ඩිජිටල් ප්‍රචාරණය හා නවෝත්පාදනශීලී ක්‍රියාමාර්ග මඟින් නව සංචාරක වෙළෙඳ පොළ මෙන්ම ඉහළ යමින් පවතින සංචාරක වෙළෙඳ පොළවල - emerging marketsවල - විභවතා වර්ධනය කරමින් සංචාරක ප්‍රභව විවිධාංගීකරණය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත.

ඒ අනුව, විවිධ රටවල් සහ කලාප ආවරණය කරමින් සංචාරක පැමිණීම් තවදුරටත් වර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කරමින් පවතී.

(iv)

| රට | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|
| ඉන්දියාව | 17.1 | 20.4 | 20.3 | 22.5 |
| එක්සත් රාජධානිය | 11.8 | 8.7 | 8.7 | 9.0 |
| රුසියාව | 12.7 | 13.3 | 9.8 | 7.9 |

(v) පෝලන්තය, රුමේනියාව, ස්පාඤ්ඤය, ඩෙන්මාර්කය, නෝර්වේ, ලිතුවේනියාව, ලක්සම්බර්ග්, කසකස්තානය, බෙලරුස්, යුක්රේනය, ආර්මේනියාව, උස්බෙකිස්තානය, පෝර්ජියාව, තුර්කිය, ඊජිප්තුව, බංග්ලාදේශය, පකිස්තානය, නේපාලනය, පෝර්දානය, කටාර්, සෞදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඊශ්‍රායලය, ඔස්ට්‍රියාව, චෙක් ජනරජය, නවසීලන්තය, දකුණු කොරියාව, ඕස්ට්‍රේලියාව.

(ආ) (i)

| | අනුමත ව්‍යාපෘති | | |
|---|---|---|---|
| වර්ෂය | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | කාමර සංඛ්‍යාව | ආයෝජන වටිනාකම (ඇ.ඩො.මිලියන) |
| 2024 | 29 | 576 | 41.723 |
| 2025 | 42 | 1,205 | 196.18 |

(ii) අනුගමනය කර ඇත.

පළමුවැන්න ලෙස වෙළෙඳ පොළ සංකේන්ද්‍රණ අවදානම අඩු කර ගැනීම වෙනුවෙන් මහජන සම්බන්ධතා ප්‍රවර්ධන හා ඩිජිටල් ප්‍රචාරණ වැඩසටහන් - PR and digital marketing - හා නවෝත්පාදනශීලී ක්‍රියාමාර්ග දියත් කිරීම තුළින් සාම්ප්‍රදායික ප්‍රචාරණ ක්‍රියාකාරකම්වලට අමතරව ඉහළ යමින් පවතින සංචාරක වෙළෙඳ පොළවල - emerging marketsවල - විභවතා තවදුරටත් වර්ධනය කර නව සංචාරක ප්‍රභව ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම් සකස් කර මේ වන විට ක්‍රියාත්මක කරමින් සිටී.

එමෙන්ම නව නිෂ්පාදන වැඩිදියුණු කිරීම - new product development - මඟින් ද විවිධාංගීකරණ උපාය මාර්ග අනුගමනය කර වෙළෙඳ පොළ සංකේන්ද්‍රණ අවදානම අඩු කර ගැනීම සඳහා කටයුතු කරනු ලබයි. එනම්, නෞකා සංචාරක ව්‍යාපාරය - cruise tourism, සුවතා සංචාරක ව්‍යාපාරය - wellness tourism, බෞද්ධ සංචාරක ව්‍යාපාරය - Buddhist tourism, විවාහ

සංචාරක ව්‍යාපාරය - wedding tourism - යන අංශවල වැඩිදියුණු කිරීම සඳහා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. වර්තමානයේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් කේබල් කාර් ව්‍යාපෘති, ජලය යට ස්ථාපන - underwater installations, පාවෙන කබානා- floating cabanas - ඇතුළු අත්දැකීම්මය සංචාරක ආකර්ෂණ හඳුන්වාදීම තුළින්

නවෝත්පාදනශීලී සංචාරක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාශීලීව පහසුකම් සලසමින් පවතී.

(iii) 2025 ආයෝජන දත්ත අනුව, නවාතැන් කාමර සංචිතයට එකතු කිරීමට අපේක්ෂිත මුළු කාමර සංඛ්‍යාව 3,413කි. වෙන් කිරීම පහත පරිදි වේ.

| පළාත (Province) | දිස්ත්‍රික්කය (District) | මුළු ව්‍යාපෘති ගණන (Total projects) | කාමර සංඛ්‍යාව (Rooms) | ආයෝජන වටිනාකම - ඇ.ඩො. මිලියන (Investment value - USD Mn) |
|---|---|---|---|---|
| බස්නාහිර පළාත | කොළඹ | 5 | 77 | 5.19 |
| | ගම්පහ | 7 | 174 | 25.03 |
| | කළුතර | 1 | 214 | 25 |
| මධ්‍යම පළාත | මහනුවර | 6 | 322 | 21 |
| | මාතලේ | 17 | 273 | 14.95 |
| | නුවරඑළිය | 2 | 64 | 5.19 |
| දකුණු පළාත | ගාල්ල | 9 | 267 | 35.14 |
| | මාතර | 29 | 475 | 24.725 |
| | හම්බන්තොට | 4 | 69 | 7.63 |
| උතුරු පළාත | යාපනය | 5 | 85 | 4.65 |
| | මන්නාරම | 0 | 0 | 0 |
| | මුලතිව් | 0 | 0 | 0 |
| | වවුනියාව | 0 | 0 | 0 |
| | කිලිනොච්චිය | 0 | 0 | 0 |
| නැගෙනහිර පළාත | අම්පාර | 4 | 142 | 36.31 |
| | මඩකලපුව | 1 | 14 | 0.4 |
| | ත්‍රිකුණාමලය | 11 | 363 | 25.436 |
| ඌව පළාත | බදුල්ල | 13 | 544 | 70.6 |
| | මොනරාගල | 2 | 75 | 13.38 |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | 2 | 32 | 1.38 |
| | පොළොන්නරුව | 0 | 0 | 0 |
| වයඹ පළාත | කුරුණෑගල | 1 | 85 | 8.8 |
| | පුත්තලම | 2 | 37 | 2.32 |
| සබරගමුව පළාත | රත්නපුරය | 2 | 13 | 0.306 |
| | කෑගල්ල | 3 | 88 | 11.85 |
| එකතුව (Total) | | 126 | 3,413 | 339.287 |

(iv) එම හෝටල් ඉදි කිරීමට නියමිත ස්ථාන ඉහත ආ (iii) පිළිතුර යටතේ ඇති වගුවේ දැක්වේ.

කෙසේ වෙතත්, එක් එක් ව්‍යාපෘතියේ ස්වභාවය (ප්‍රමාණය සහ සංවේදීතාව) අනුව එම ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ කාල රාමුව වෙනස් වේ. සාමාන්‍යයෙන්, සංවර්ධන අවසර පත්‍රය වසර 1-2ක කාලයක් සඳහා ලබා දෙන අතර, එය දිගු කළ හැකි වේ.

(v) ඉහත ආ (iii) පිළිතුර යටතේ ඇති වගුවේ දක්වා ඇති පරිදි ඇමෙරිකානු ඩොලර් මිලියන 339.287යි

(ඇ) අදාළ නොවේ.

[ගරු විජිත හේරත් මහතා]

(அ) (i) மொத்த அலகுகளின் எண்ணிக்கை: 8,322 (மார்ச் 2026 நிலவரப்படி)

மொத்த அறைகளின் எண்ணிக்கை: 58,411 (மார்ச் 2026 நிலவரப்படி)

பிராந்திய ரீதியில் சார்ந்திருக்கும் விகிதங்கள் குறித்த தகவல் எதுவும் கிடைக்கவில்லை.

(ii)
- இந்தியா
- ஐக்கிய இராச்சியம்
- ரஷ்யா
- ஜேர்மனி
- சீனா
- அவுஸ்திரேலியா
- பிரான்ஸ்
- ஐக்கிய அமெரிக்கா
- நெதர்லாந்து
- பங்களாதேஷ்

(iii) இல்லை.

பாரம்பரிய விளம்பர நடவடிக்கைகளுக்கு மேலதிகமாக, மக்கள் தொடர்பு ஊக்குவிப்புப் பிரசாரங்கள், டிஜிட்டல் விளம்பரப் பிரசாரங்கள் மற்றும் புத்தாக்க மூலோபாய யுக்திகள்மூலம் புதிய சுற்றுலாச் சந்தைகள் மற்றும் வளர்ந்துவரும் சந்தைகளின் ஆற்றலை வளர்த்து, சுற்றுலா ஆதாரங்களைப் பன்முகப்படுத்த நடவடிக்கைகள் எடுக்கப்பட்டுள்ளன.

அதன்படி, பல்வேறு நாடுகள் மற்றும் பிராந்தியங்களை உள்ளடக்கி சுற்றுலாப் பயணிகளின் வருகையை மேலும் அதிகரிக்க செயற்பாட்டுத் திட்டங்கள் அமுல்படுத்தப்பட்டு வருகின்றன.

(iv)

| நாடு | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|
| இந்தியா | 17.1 | 20.4 | 20.3 | 22.5 |
| ஐக்கிய இராச்சியம் | 11.8 | 8.7 | 8.7 | 9.0 |
| ரஷ்யா | 12.7 | 13.3 | 9.8 | 7.9 |

(v) போலந்து, ருமேனியா, ஸ்பெயின், டென்மார்க், நோர்வே, லிதுவேனியா, லக்சம்பர்க், கஜகஸ்தான், பெலாரஸ், உக்ரைன், ஆர்மேனியா, உஸ்பெகிஸ்தான், ஜோர்ஜியா, துருக்கி, எகிப்து, பங்களாதேஷ், பாகிஸ்தான், நேபாளம், ஜோர்தான், கட்டார், சவூதி அரேபியா, ஐக்கிய அரபு அமீரகம், இஸ்ரேல், ஆஸ்திரியா, செக்குடியரசு, நியூசிலாந்து, தென்கொரியா, அவுஸ்திரேலியா.

(ஆ) (i)

| | அங்கீகரிக்கப்பட்ட திட்டங்கள் | | |
|---|---|---|---|
| **ஆண்டு** | **அங்கீகரிக்கப்பட்ட செயற்றிட்டங்களின் எண்ணிக்கை** | **அறைகளின் எண்ணிக்கை** | **முதலீட்டுப் பெறுமதி (அமெரிக்க டொலர் மில்லியன்)** |
| 2024 | 29 | 576 | 41.723 |
| 2025 | 42 | 1,205 | 196.18 |

(ii) ஆம்.

பல்வகைப்படுத்தல் உபாயமொன்று பின்பற்றப்பட்டுள்ளது.

முதல் நடவடிக்கையாக, சந்தை ஒருமுகப் படுத்தலின் அபாயத்தைக் குறைப்பதற்கான திட்டங்கள் வகுக்கப்பட்டுள்ளன. பாரம்பரிய விளம்பர நடவடிக்கைகளுக்கு மேலதிகமாக, மக்கள் தொடர்பு ஊக்குவிப்புப் பிரசாரங்கள், டிஜிட்டல் விளம்பரப் பிரசாரங்கள் மற்றும் புத்தாக்க மூலோபாய உக்திகளைத் தொடங்குவதன் மூலம் வளர்ந்துவரும் சந்தைகளின் ஆற்றலை மேலும் மேம்படுத்தவும் புதிய சுற்றுலாத்துறை மூலங்களை ஊக்குவிக்கவும் அத்திட்டங்கள் தற்போது செயற்படுத்தப்பட்டு வருகின்றன.

மேலும், புதிய உற்பத்தி அபிவிருத்திமூலம் சந்தை ஒருமுகப்படுத்தலின் அபாயத்தைக் குறைப்பதற்காக பல்வகைப்படுத்தல் உபாயங்கள் பின்பற்றப்படுகின்றன. அதன்படி, உல்லாசக் கப்பல் சுற்றுலா, நலன்சார் சுற்றலா, பௌத்த யாத்திரைகள் மற்றும் திருமணச் சுற்றுலாத் துறைகளை மேம்படுத்துவதற்காக ஊக்குவிப்புப் பிரசாரங்கள் செயற்படுத்தப்பட்டு வருகின்றன.

தற்போது, இலங்கை சுற்றுலா அபிவிருத்தி அதிகாரசபையானது, 'கேபல்' மோட்டார் கார் செயற்றிட்டங்கள், நீருக்கடியில் நிறுவல் செயற்றிட்டங்கள், மிதக்கும் குடில்கள் போன்ற அனுபவபூர்வமான சுற்றுலா ஈர்ப்புகளை அறிமுகப்படுத்துவதன்மூலம் புத்தாக்க சுற்றுலாத் திட்டங்களைச் செயற்படுத்துவதற்குத் தீவிரமாக வழிவகுத்து வருகிறது.

(iii) 2025ஆம் ஆண்டு முதலீட்டுத் தரவுகளின்படி, தங்குமிடத் துறையில் மேலதிகமாகச் சேர்க்கப்படுமென எதிர்பார்க்கப்படும் மொத்த அறைகளின் எண்ணிக்கை 3,413 ஆகும். அதன் விநியோகம் பின்வருமாறு:

| **மாகாணம்** | **மாவட்டம்** | **மொத்த செயற்றிட்டங்கள்** | **அறைகளின் எண்ணிக்கை** | **முதலீட்டின் பெறுமதி அமெரிக்க டொலர் மில்லியனில்** |
|---|---|---|---|---|
| மேல் மாகாணம் | கொழும்பு | 5 | 77 | 5.19 |
| | கம்பஹா | 7 | 174 | 25.03 |
| | களுத்துறை | 1 | 214 | 25 |

| மாகாணம் | மாவட்டம் | மொத்த செயற்றிட்டங்கள் | அறைகளின் எண்ணிக்கை | முதலீட்டின் பெறுமதி அமெரிக்க டொலர் மில்லியனில் |
|---|---|---|---|---|
| மத்திய மாகாணம் | கண்டி | 6 | 322 | 21 |
| | மாத்தளை | 17 | 273 | 14.95 |
| | நுவரெலியா | 2 | 64 | 5.19 |
| தென் மாகாணம் | காலி | 9 | 267 | 35.14 |
| | மாத்தறை | 29 | 475 | 24.725 |
| | ஹம்பாந்தோட்டை | 4 | 69 | 7.63 |
| வட மாகாணம் | யாழ்ப்பாணம் | 5 | 85 | 4.65 |
| | மன்னார் | 0 | 0 | 0 |
| | முல்லைத்தீவு | 0 | 0 | 0 |
| | வவுனியா | 0 | 0 | 0 |
| | கிளிநொச்சி | 0 | 0 | 0 |
| கிழக்கு மாகாணம் | அம்பாறை | 4 | 142 | 36.31 |
| | மட்டக்களப்பு | 1 | 14 | 0.4 |
| | திருகோணமலை | 11 | 363 | 25.436 |
| ஊவா மாகாணம் | பதுளை | 13 | 544 | 70.6 |
| | மொனராகலை | 2 | 75 | 13.38 |
| வடமத்திய மாகாணம் | அநுராதபுரம் | 2 | 32 | 1.38 |
| | பொலன்னறுவை | 0 | 0 | 0 |
| வடமேல் மாகாணம் | குருநாகல் | 1 | 85 | 8.8 |
| | புத்தளம் | 2 | 37 | 2.32 |
| சப்ரகமுவ மாகாணம் | இரத்தினபுரி | 2 | 13 | 0.306 |
| | கேகாலை | 3 | 88 | 11.85 |
| மொத்தம் | | 126 | 3,413 | 339.287 |

(iv) ஹோட்டல்கள் நிறுவப்பட வேண்டிய இடங்கள் மேலே உள்ள அட்டவணை (i i i )இல் காட்டப்பட்டுள்ளன.

இருப்பினும், ஒவ்வொரு செயற்றிட்டத்தையும் முடிப்பதற்கான காலக்கெடு, செயற்றிட்டத்தின் தன்மை (அளவு மற்றும் முக்கியத்துவம்) ஆகியவற்றைப் பொறுத்து ஒன்றுக்கொன்று மாறுபடும். பொதுவாக, அபிவிருத்தி அனுமதிகள் 1 - 2 வருட காலத்துக்கு வழங்கப்படுகின்றன. அவை நீடிக்கப்படலாம்.

(v) மேலே உள்ள அட்டவணை (ஆ) (iii)இன்படி, மதிப்பிடப்பட்ட முதலீட்டின் பெறுமதி அமெரிக்க டொலர்களில் 339.287 மில்லியன் ஆகும்.

(இ) ஏற்புடையதன்று.

(a) (i) Total number of units: 8,322 (as of March, 2026)
Total number of rooms: 58,411 (as of March, 2026)
Information on regional occupancy rates is not available.

(ii)
- India
- United Kingdom
- Russia
- Germany
- China
- Australia
- France
- United States
- Netherlands
- Bangladesh

(iii) No.

Measures have been taken to diversify tourism sources by developing the potential of new tourism markets as well as emerging markets through public relations promotion campaigns, digital advertising campaigns and innovative strategies in addition to traditional promotional activities.

Accordingly, action plans are being implemented to further increase tourist arrivals by covering various countries and regions.

(iv)

| Country | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|
| India | 17.1 | 20.4 | 20.3 | 22.5 |
| United Kingdom | 11.8 | 8.7 | 8.7 | 9.0 |
| Russia | 12.7 | 13.3 | 9.8 | 7.9 |

(v) Poland, Romania, Spain, Denmark, Norway, Lithuania, Luxembourg, Kazakhstan, Belarus, Ukraine, Armenia, Uzbekistan, Georgia, Turkey, Egypt, Bangladesh, Pakistan, Nepal, Jordan, Qatar, Saudi Arabia, United Arab Emirates, Israel, Austria, Czech Republic, New Zealand, South Korea, Australia.

(b) (i)

| Year | Approved Projects | | |
|---|---|---|---|
| | Number of Approved Projects | Number of Rooms | Investment Value (USD Million) |
| 2024 | 29 | 576 | 41,723 |
| 2025 | 42 | 1,205 | 196.18 |

(ii) Yes. A diversification strategy has been adopted.

As a first measure, plans have been formulated to reduce the risk of market concentration and are currently being implemented to further develop the potential of emerging markets and promote

[ගරු විජිත හේරත් මහතා]

new tourism sources through the launch of public relations promotion campaigns and digital advertising campaigns and innovative strategies, in addition to traditional advertising activities.

Also, diversification strategies are being pursued to reduce the risk of market concentration through new product development. Accordingly, promotional campaigns are being implemented to improve cruise tourism, wellness tourism, Buddhist tourism and wedding tourism sectors.

Currently, the Sri Lanka Tourism Development Authority is actively facilitating the implementation of innovative tourism projects by introducing experiential tourism attractions including cable car projects, underwater installation projects, floating cabanas, et cetera.

(iii) As per the 2025 investment data, the total number of rooms expected to be added to the accommodation sector is 3,413. The distribution is as follows:

| Province | District | Total Projects | Number of rooms | Investment value - USD Mn. |
|---|---|---|---|---|
| Western Province | Colombo | 5 | 77 | 5.19 |
| | Gampaha | 7 | 174 | 25.03 |
| | Kalutara | 1 | 214 | 25 |
| Central Province | Kandy | 6 | 322 | 21 |
| | Matale | 17 | 273 | 14.95 |
| | Nuwara Eliya | 2 | 64 | 5.19 |
| Southern Province | Galle | 9 | 267 | 35.14 |
| | Matara | 29 | 475 | 24.725 |
| | Hambantota | 4 | 69 | 7.63 |
| Northern Province | Jaffna | 5 | 85 | 4.65 |
| | Mannar | 0 | 0 | 0 |
| | Mullaitivu | 0 | 0 | 0 |
| | Vavuniya | 0 | 0 | 0 |
| | Kilinochchi | 0 | 0 | 0 |
| Eastern Province | Ampara | 4 | 142 | 36.31 |
| | Batticaloa | 1 | 14 | 0.4 |
| | Trincomalee | 11 | 363 | 25.436 |
| Uva Province | Badulla | 13 | 544 | 70.6 |
| | Monaragala | 2 | 75 | 13.38 |
| North Central Province | Anuradhapura | 2 | 32 | 1.38 |
| | Polonnaruwa | 0 | 0 | 0 |
| North Western Province | Kurunegala | 1 | 85 | 8.8 |
| | Puttalam | 2 | 37 | 2.32 |
| Sabaragamuwa Province | Ratnapura | 2 | 13 | 0.306 |
| | Kegalle | 3 | 88 | 11.85 |
| Total | | 126 | 3,413 | 339,287 |

(iv) The locations where the hotels are to be established are given in Table in (b) (iii) above.

However, the timeframe for completion of each project varies depending on the nature (size and sensitivity) of the project. Typically, development permits are granted for a period of one to two years, which can be extended.

(v) As per Table in (b) (iii) above, the estimated investment value is US Dollars 339,287 million.

(c) Not applicable.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.